1715

# හතුරු ගීතක්

For E-Pusthakalaya



Buddhika 15

කරුණාසේන ජයලත්

For E-Pusthakalaya

අම්මා මෙන් හැම කාන්තාවක් ම පතිවතක් ය. කුසුම් මෙන් හැම යුවතියක් ම කාන්‍යාවක් ය. සියලු වනිතාවෝ සීතාවෝ ය. ඔව්හු පවිත්‍ර ය. නොකලැල් ය. නො කිලිටි ය.

එක් වයසක දී පොදුවේ ගැහැනිය පිළිබඳ මගේ දර්ශනය වූයේ එය යි. ලෝකය හා ජීවිතය ගැන සිතන්නටත් කිසියම් අවබෝධයක් ලබන්නටත් පටන් ගත් අවදියේ මා ඇය දෙස බලන්නට පුරුදු වූයේ එබඳු ඇසකිනි.

මගේ මේ මතය සැකයට භාජනය වන ආකාරයකින් ස්ත්‍රිය ගැන සිතන්නට කුඩු දුන් සිද්ධියක දී හෝ ප්‍රවෘත්තියක දී හෝ මම අතිශයින් සසල වීමි. එහි දී සැබෑ ජීවිතය ය ප්‍රබන්ධයක් ය යි වෙනසක් නොවුණා තරම්. නව කතාවක් නාට්‍යයක් හෝ චිත්‍රපටියක් වැනි කලාත්මක නිර්මාණයක වුව ද ස්ත්‍රියක වරදක අසුවන්නට යන තැන දී මම දැඩි ලෙස නොසන්සුන් වීමී. ඇය අන්තිමට නිරුපද්‍රිත වුණා නම් මට ඇති වූ සැනසීම ඉමහති. ඉදින් යම් ලෙසකින් ඇය පාපයට ගොදුරු වුණු කල මම වේදනාවකට මෙන් ම කලකිරීමකට ද පත් වීමි.

අතවරයකට පත් යුවතියක ගැන පොතපතකින් හෝ කියවන කල මා තුළ ලොකු බියක් - මේ විපත ම තවත් කෙනෙකුටත් වීමට ඉඩ ඇද්දැයි අනියත බියක් - පහළ විය. මා බිය වූයේ කවරකු සඳහා දැ යි මම නොදත්තෙමි. ඕ මා දැන සිටි කිසියම් තැනැත්තියක් නොවුවා ය. ආරක්ෂා කර ගත යුතු ය යි මා විසින් සිතන ලද අදෘෂ්‍යමාන අජීවමාන යුවතිය මුළු ස්ත්‍රී වර්ගයාගේ ම සංකේතයක් - සංකල්පයක් පමණි.

ළමා වියේ සීමාවන් පසු කරන අපි එක් අවධියක දී ලෝකය හා ජීවිතය ගැන සිතන්නට මෙන් ම කතා කරන්නට ද පටන් ගනිමු. වැඩිහිටි ලෝකයේ අභ්‍යන්තරය පිළිබඳ ව ඉවක් විනා අවබෝධයක් නො වුණු ඒ නො මේරූ සිතින් අප ගැහැනිය දෙස බැලුවේ ඇය ගැන අප විසින් කලින් ඇති කර ගන්නා ලද ආකල්පයන් පදනම් කරගෙනය.

ගැහැනිය පිරිමියාගේ කාමාශාවන් සන්තර්පනය කිරීම සඳහා

For E-Pusthakalaya

මැවුණා පමණක් නොව ඇය ඒ සඳහා අවස්ථාව එන තුරු නිරන්තර ව රහසින් බලාගෙන - පතාගෙන සිටින්නී ය යන මතය දූරු අය අප අතර වූහ.

එවැනි තැනක දී ඇයගේ නිර්දෝෂත්වයත් පවිත්‍රතාවත් ගැන කතා කිරීමට මම පසුබට නොවීමි. මගේ සමහර මිත්‍රයන් මා හා වාදයට ආවේ පාසලෙන් පිට සැබෑ ලොවේ දී ගැහැනුන් ඇසුරු කිරීමෙන් ලද පළපුරුද්ද හා අත්දැකීම උඩ කතා කරන බවක් ඒත්තු ගන්වන උත්සාහයෙනි. ඔවුන් තම අත්දැකීම ගැන විස්තර කළේ අභිරුචියකින් හා උඩඟුකමකින් යුක්තව ය.

තතාවෙන් ජය ගන්නට බැරි වූ අවස්ථාවෙක වුව ද ඔවුන් කියන්නේ පම්පෝරියට සිතින් මවාගත් වික්‍රමයන් විනා ඇත්තක් නොවේ ය. නැතහොත් වැඩිහිටියෙකුගෙන් අසා ගත් පුවතක් විනා තමන්ගේ අත්දැකීමක් නොවේ ය යි මම සිතින් තීරණය කර ගතිමි.

අවසාන කාලය වන විට මුළු පාසලේ හැම දෙනා ම වාගේ මා හා ළෙන්ගතුකමක් ඇති කර ගන්නට තරම් ජනප්‍රිය ව සිටියත් මා යහළුවනට වඩා යෙහෙළියනට ළං කළ එක හේතුවක් වූයේ ගැහැනිය ගැන නො කන්කලු පුවත් අසන්නට ඇති නො සතුට ය යි මම දූන් සිතමි.

ස්ත්‍රිය පිළිබඳ මගේ මනැසේ ඇඳී ගිය ඒ පවිත්‍ර මෙන් ම චමත්කාරජනක රූපය කැලැල් කළ යුවතියන් මට සැබෑ ලෝකයේ දී මුණ නො ගැසුණා නොවේ. පෙම්වතකු ලෙස කීප දෙනකු එක වර ඇසුරු කළ ගිෂෙහාවෝ අපේ පාසලේ ද ගමේ ද සිටියහ. එවැනි දූරියක සිතාසි පිටු දැකිය යුතු ය යි මතයක් මවිසින් දරණ ලදැයි මම මෙයින් අදහස් නොකරමි. ස්ත්‍රිය මෙන් ම ප්‍රේමය ද පවිත්‍ර වූ දෙයකි. ඒ පවිත්‍ර දෙය පිරිනැමිය හැකි වන්නේ එක අයකු වෙත පමණි. අද එක් අයකුට ආලය කර හෙට තව අයකුගේ හදවතට මාරු විය හැකි වන්නේ චපල, වංක සිත් ඇත්තනට පමණක් ය යනු මේ විෂයය සම්බන්ධ ව මා දූරූ මතය ය.

දූරියක කීප දෙනෙකුට පෙම් පත් දීමත් ගැහැනිය කීප දෙනෙකුට සිය කුණුසපුව පිදීමත් ඉරක් ඇඳ වෙන් කළ නො හැකි තරමට එක හා සමාන බරපතළකමක් ඇති වරදක් ලෙස මම සැලකුවෙමි. තමා ඇත්ත වශයෙන් ම නරක එකියකැ යි ඒත්තු ගැන්වීමට සමත් වූවන් ගැන මට ඇති වූයේ අනුකම්පාවක් නොව පිළිකුලක් හා තරහකි. මා සිතුවේ එවැනි දූරියන් සිය පරපුර අපකීර්තියට පත් කිරීමට පහළ වූවන් ලෙස

සිතාගෙන පමණක් නොවේ. ඔවුන් ස්ත්‍රියගේ පවිත්‍රත්වය කෙරෙහි මා ඇතිකර ගන්නට උත්සහ කළ - ආශා කළ - විශ්වාසය බිඳ හෙළන්නට ආ බැවිනි.

මා කුසුම්ගේ ම නැගණිය වූ සෝමා අප්‍රිය කළේ ඒ පිළිවෙත උඩ ය. සෝමා හා පද්මිනී අතර කවර නම් වෙනසක් විණි ද යි මා සිතන්නට වූයේ පසු කාලයක ය.

හැම කාන්තාවක් ම අම්මා වැනි පතිවතක් ය. හැම යුවතියක් ම කුසුම් වැනි කන්‍යාවක් යැ යි මා සිතූ බව සැබැවි. මගේ බිරිඳ පද්මිනී විවාහයට කලින් කුමරි බඹසර වත් විවාහයට පසු ව පතිවත වත් රැකි එකියක් නො වූවාය.

අම්මා, කුසුම්, පද්මිනී

මගේ ඉරණම සකස් කළ නොහොත් වෙනස් කළ ස්ත්‍රිහු තිදෙනා මොවුහු ය. ඔවුන් විසින් මා කෙරෙහි ඇති කරන ලද බලපෑම කෙතරම් විශාල ද ප්‍රබල ද යත් මේ ත්‍රිමූර්තිය ඉවත් කළ හැකි නම් ජීවිතය යනුවෙන් දෙයක් මට තවදුරටත් ඉතිරි නොවනු ඇත.

කුසුම්, සිය වතගොත කිසිවකුට කියා ඇත්නම් නිසැකයෙන් ම ඇයගෙන් මා ගැන තොරතුරුත් ඕනෑ තරම් විස්තර වන්නට ඇත. ඒ අනුව මා පිළිබඳ ව කතා කරන්නට ගියොත් ඇයගෙන් කියැවුණු සමහර දෙයක් ම මගෙන් ද නැවත නැවතත් සඳහන් වන්නට ඉඩ තිබේ. එක පැත්තකින් බලන කල අප දෙදෙනාටම කියන්නට ඇත්තේ එකම කතාවක් බැවිනි. එහෙත් අනෙක් අතට මේ එකම දෙය දෙස වුව ද ඇයත් මාත් බැලුවේ එකම ඇසකින් නොවේ. කුසුම් හා මා බෙදවාචකයක් බවට පත්වූණේත් අපේ කතාව ඇයගේ හා මගේ කතා දෙකක් වන්නේත් ඒ නිසාය.

Buddhika 15

For E-Pusthakalaya

# I

බාල කාලයේ දී අපත් තාත්තාත් අතර පැවතියේ දුරස්තර ගතියකි. මේ තත්ත්වය අන් බොහෝ පවුල්වලට ද සාධාරණ වන්නක් විය යුතු ය.

දවල් දවසේ තාත්තා ගෙදර සිටියේ නැත. ඕමට එළිය වැටෙන්නට කලින් පිටත්ව ගිය ඔහු ආපසු ආවේ රෑ බෝවී - බීගෙන ය. ගමනා ගමන සේවය පෞද්ගලික කොම්පැනිකාරයන්ගේ ඒකාධිකාරයක් ව පැවැති ඒ කාලයේ දැන් මෙන් සේවකයනට නිවාඩු ඇතුළු නොයෙකුත් පහසුකම් නො තිබුණු බව ඇත්තකි. එහෙත් තාත්තාට ඕනෑ කළා නම් ගෙදර නතර වන්නට පුළුවන් දවස් තිබිණි. නියමිත බස් රිය අබලන් වුණු කල ඔහුට අන් රියක් නො ලැබිණි. සමහර විට එසේ වැඩ නැතිව සතිය හමාර ගත විය. එකල පඩි ද නැත එහෙත් වැඩ ඇතත් නැතත් සිව්ස් පරිදි උදය පිටත් වන තාත්තා ගරාජයට ගොස් තමාට රථයක් නො ලදහොත් අන් කෙනෙකුගේ බසයක පා පුවරුවේ නැගී කොළඹ ගොස් රස්තියාදු වී ආපසු ආවේ මහ රෑ ය. පඩි නැති දට තාත්තා වියදමට මුදලක් ඉල්ලා ගත්තේ අම්මාගෙනි.

ඔහු සිහි බුද්ධියෙන් සිටින කිසි කලෙක අපේ ඉගෙනුම ගැන හෝ අනෙක් අවශ්‍ය දෙයක් ගැන හෝ සොයා බැලුවේ නැත.

බී මත් වූ දවස්වලට ඉල්ලුවොත් - ළඟ තිබුණොත් - ඔහු නොමසුරු ව අපට මුදල් දුන්නේ ය. තාත්තාගේ ස්වභාව දත් රෝහණ අවශ්‍ය වුණත් නැතත් බොහෝ විට ඔහුගෙන් සල්ලි ඉල්ලා ගත්තේ ය. එසේ ඉල්ලීමක් නො කළත් පඩි දට තාත්තා රුපියල් දෙක තුනක මාරු කාසි දෝතට ගෙන, "වරෙල්ලා පුතේ වරෙල්ලා" යි උඩ විසි කළේ ය. බිම වැටී රෝදේ යන කාසි එකතු කර ගන්නට මල්ලිලා පොරකන සැටි බලා ඔහු සොම්නස පිරුණු ඇස් ඇති ව හඬ නගා සිනාසුණේ ය.



අර්ථයක් ඇති ව හෝ නැතිව හෝ යමක් කීමට කලින් හෝ පසු ව හෝ උස් හඬින් සිනාවක් නැගීම තාත්තාගේ පුරුද්දක් විය. කියන දෙයින් පළ වන අර්ථයට ගැලපුණත් නැතත් තාත්තාගේ සිනාව අව්‍යාජ ය යි දැන් මට සිතෙයි.

මා තාත්තාගෙන් මුදලක් ඉල්ලන්නට වත් ඔහු විසි කරන කාසි අහුලන්නට වත් ගියේ නැත.

බීමට වැටීම ගැන, නො කත්කලු බසින් නො වුණත් අම්මා ඉඳහිට තාත්තාට අවවාද කළා ය.

"මම දුරාචාරේ යනව ද කම්ලාවති?" තාත්තා ඇසී ය. "........නෑ මම සුදුවට යනව ද? නෑ මම කෙනෙකුගෙන් හුණු විටක දෙයක් වංචා කරලා තියෙනව ද? නෑ.......මම ඔය ටිකක් බොන එක විතරයි."

"ඇති ඇති. ඒ ටික තිබුණම හොඳටම ඇති." යි කියන අම්මා ඉන් එහා යන්නේ නැත.

"ඇත්තට ඉතින් ඩැයිවර උන්නැහෙගෙ ඔය බීම නවත්තන්න බැරි හැටි" යි පිට කෙනෙකු කීවොත් අම්මාගේ මුහුණ නරක් වෙයි. එකල ඇයගෙන් පිට වන්නේ කලින් තාත්තාගෙන් පිට වුණු වචන ම ය. නැතහොත් ඒ අදහස් ය.

"ඒ වුණාට ඔය රස්සාව කරන අනිත් මිනිස්සු වගෙ ද අපේ ඩැයිවර උන්නැහෙ? බස්කාරයෙක් ය කියලා කිව්වැකි ද? සීලාචාරකම අතින් දහකින් හොයන්න බෑ. හොරයක් බොරුවක් කියලා දෙයක් දන්නෙත් නෑ. සුදුවකට යනව කියල ද ? ඔය ටිකක් බොන එක විතරයි. බිව්වය කියල වුණත් ඉතින් උඹ නො දකින් කියල තියෙනව ද තරහ කාරයෙකුටවත්".?

අම්මාගේ මේ පිළිවෙත තේරුම් ගත් පසු, තාත්තාගේ බීමට විරුද්ධ ව කතා කරන්නට මම පවා පසුබට වීමි.

මෙසේ තාත්තාගෙන් අතපසු වුණු යුතුකම් හා වගකීම් සම්භාරයක් කෙඳිරිල්ලක් නොමැති ව කරට ගත් අම්මා ඒ සියල්ල ඉටු කරනු පිණිස පදිංචි නිවස ඉදිරිපිට ගුරුපාර අයිනේ වෙලට මුහුණ ලා පිහිටි කුඩා ගොඩනැගිල්ලේ පවත්වාගෙන ආ සිල්ලර හා තේ කඩයේ දවසට පැය දහ අටක් වැඩ කළා ය. කී දෙනෙකු ආවත් ප්‍රමාදයක් නොදැනෙන්නට ප්‍රියම්නාප අල්ලාප සල්ලාපයට ඇදගෙන, කාගේත් සිත් දිනාගෙන සියලු වැඩ නිම කර ගැනීමේ හපන්කමක් ඇය වෙත පැවැතිණි. එසේ ම ඕනෑම කෙනෙකු ලවා වැඩ කරවා ගැනීමේ පුළුවන්කමක් ඇයට

Buddhika 15

For E-Pusthakalaya

පිහිටා තිබුණේ ය.

කඩයේ හැම දෙයක් ම තුලව කරන - කරවන අම්මා ගෙදර වැඩ අතින් නම් කිසි ක්‍රමවත් පිළිවෙළක් අනුගමනය කළේ නැත. බඩුවක් මිල දී ගැනීමට එන දැරියක හෝ තරුණියක හෝ ලවා හාල් ටික ළිප තබවාගෙන, තවත් එකියක ලවා මිරිස් ටිකක් අඹරවා ගෙන, පොල් ටිකක් ගාවාගෙන කෑම වේල වශයෙන් යම්තම් බතක් හා එළවලුවක් සාදවා ගත්තා ය. ඇය කුලියට කරවා ගත්තේ පිටි කෙටීම වැනි බර ම වැඩක් පමණකි.

මේ අතින් තමාගෙන් වුණු අතපසු වීම පිරිමසන්නට මෙන්, අම්මා ඕනෑ විටෙක ඕනෑ තරම් කඩයප්පන් කන නිදහස මල්ලිලාට දුන්නා ය. සෙල්ලම් කරමින් සිටි ඔවුහු බඩගිනි දැනෙත් ම දුවගෙන ගොස් වීදුරු පෙට්ටිය ඇර අතට අසු වුණු කෑමක් ඩැහැගෙන ගියහ. ඔවුනට කඩයත් ගෙයත් දෙක ම ගෙදරය.

සැන්දෑ සමයේ තේ කෝපි බීමට කඩය වෙත එන සමහරෙක් වහා ආපසු නො යති. ඒපාදප කතාවේ යෙදී - නැතහොත් දාම් අදිමින් ගෙවල බත ඉදෙන තුරු කල් මරන ඔවුන් දොඩන සිනාසෙන හඬ රෑ අට වන තුරු දිගට ම ඇසෙයි. අනතුරුව කතා බස් අඩු වීමෙන් පසු කඩය දෙසින් ඇසෙන්නේ දොර ලෑලි එක දෙක වැසෙන ශබ්දය ය.

වේලාසනින් කෑම කෑවත් මා මල්ලිලා මෙන් නින්දට යන්නේ නැත. අම්මා කඩය පිටුපසට අවුත්,

"ලොකු පුතේ" යි කතා කරන තුරු මා බලා සිටියේ තරමක ආශාවක් ද ඇති ව ය.

කඩය වසා දැමීමෙන් පසු ව, කෙතරම් රෑ බෝ වුණත් තාත්තා එන තුරු කෑමත් නොකා මග බලා සිටීම අම්මාගේ දෛනික වැඩ සටහනේ අන්තිම කොටස ය. මතක ඇති කාලයේ සිට අවුරුදු ගණනක් එක දිගට මේ සිරිත නො කඩවා පැවැතිණි.

මෙහි දී අම්මා තනි නොතනියට කතා කරන්නේ මට ය. මා මේ අවස්ථාව එනතුරු ඕනෑකමින් බලා සිටියේ අම්මා සමග දවල් දවසේ වචනයක් වත් කතා කරන්නට වේලාවක් නොවූ බැවිනි. අම්මා වෙසෙසින් මට ම කතා කරන්නේ ඇයටත් මා නැති පාළුව දැනෙමින් තිබුණු නිසා විය යුතු ය.

"ලොකු පුතේ" යි දෙවරක් කතා කරන්නට නොතබා මම පොතක් ද රැගෙන, දොර වසා, කඩය වෙත යමි.

Buddhika



අම්මා පුරුද්දක් වශයෙන් මට කඩයට භාර කළේ වීදුරු පෙට්ටිය හා කෙසෙල් කැන් ද අල බතල, පොල් , කොහු ලණු හා ඉදල් මිටිය ආදී වශයෙන් වෙළඳාම සඳහා ඉස්තෝප්පුවේ තබා තිබුණු අනෙක් බඩුමුට්ටු සියල්ල ද ඇතුලතින් තැබුවාට පසුවය. ඒ සමහර කටයුත්තකදී ඇය, කඩයට පැමිණ සිටි කිසිවකුගේ උදව් ලබා ගන්නට ඇත. ඈ කිසි විටෙක මට මෙවැනි වැඩක් නියම නොකළාය.

බාර් එක මත කුප්පි ලාම්පුව දැල්වෙමින් තිබිණි. මම ලොව් බංකුව ඒ අසලට ඇදගෙන පොත කියවන්නට වීමි. අම්මා බිම අතු ගා, ලිපේ අළු ඉවතට විසි කර, ඊ ළඟට පනිට්ටුවකට වතුරගෙන මුහුණ සෝද ගත්තාය. ඇය ගණන් හිලව් බැලුවේ අන්තිමට ය. කාසි ගැටෙන හඬ පමණක් නොව හොඳින් කන් දුන්නොත් ඇය ඉලක්කම් එකතු කරමින් මුමුනන හඬ ද ඇසිය හැකි විය. චිම්නි ලාම්පුවේ එළිය අඩු කර පිටතට ආ ඇය ඉතිරි දොර ලෑලි දෙකත් වසා දැමුවේ තමාගේ ප්‍රමාදයක් දැක බල්ලකු බළලකු කඩය ඇතුළට රිංගා ගනීයයි සැකයෙනි.

සොර සතුරන් ගැන නම් බියක් අප වෙත නොවිය. ගමේ කවුරුන් තුළත් අම්මා හා තාත්තා කෙරෙහි හිතවත්කමක් විය. සොරකම් කළේත් බුරු ගැසුවේත් එකම පිරිසකි. මේ වැඩි දෙනෙකු තේ බීවේත් අපේ කඩයෙනි. තවද දූ කෙළියේ යෙදී පරාද වුණු කෙනෙකු හවඩියක් මුද්දක් හෝ සුරයක් උගසට තබා මුදල් ලබා ගත්තේ අම්මාගෙනි. අම්මා බඩුමුට්ටු තබාගෙන ණයට මුදල් දුන් නමුත් සුදු අත්තුවත් ගෙනෙන ස්ත්‍රී ආභරණ නම් බාර ගත්තේ නැත.එය ඇයගේ ප්‍රතිපත්තියක් විය.

සියලු වැඩ අවසන් කළ අම්මා පඩිය උඩට පැමිණ ලී කණුවට හේත්තු වුණාය. අනතුරුව ඈ සුසුමක් හෙළා එහෙමම බිම වාඩි වුණාය. ඒ සුසුම ඇයගේ දින චරියාවේ එක කොටසක් නිම වූ බව ප්‍රකාශයට පත් කිරීමක් වැන්න.

වෙලෙන් නැගුණු මැඩියන්ගේ ඝෝෂාව ටික වේලාවක දී කණට හුරුපුරුදු විය. ඒ හැරුණු විට සැම තැන පැවතියේ නිශ්ශබ්දතාවයකි.

පොතෙන් දෙ නෙත් ඉවතට ගත් වරෙක මා දුටුවේ අම්මා දෙ අතින්ම දකුණු කකුලේ බත්කෙණ්ඩ ඉහළටත් පහළටත් පිරිමදිමින් සිටි සැටිය. මෙය ව්‍යායාමයක් මෙන් ඇයගෙන් බොහෝ දවසක කෙරෙන්නෙකි. ඇය කඩය ඇතුලේම දවසකට එහාටත් මෙහාටත් සැතපුම් කීයක දුරක් ගෙවනු ඇද්දැයි මම නිකමට සිතිමි.

For E-Pusthakalaya



"නිදිමත නම් ලොකු පුතේ උඹ ගිහින් නිදාගනින්. මමත් තව ටිකක් බලල එන්නම්." අම්මා කීවාය.

අම්මා එසේ කීවේ ඇත්ත වශයෙන්ම තමාටත් නිදිමත දැනීගෙන ආ නිසා බව ඇයගේ කට හඬින් පමණක් නොව ඊලඟ ක්‍රියාවෙන් ද සිතා ගත හැකි විය. වාඩි වී වුන් තැනින් සිට ගත් ඇ මිදුලට බැස එහා මෙහා ඇවිදින්නට වුණාය. නිදි මතටත් වඩා ඇය වෙත තිබිය හැක්කේ වෙහෙසකි. දැන්වත් ඇයට පැදුරට වැටෙන අවසරය තිබිය යුතුය. මේ ගැන සිතන කල මා තුල තාත්තා කෙරෙහි තරහක් උපදී.

"මමත් තව ටිකක් බලල එන්නම්" යයි කී නමුත්, මා ගෙට ගියත්, සිය වනතුරු හෝ තාත්තා එන තෙක් ඇය මග බලා සිටින බව මම දනිමි.

අහස ගුගුරවමින් විදුලි කොටමින් මහ වැසි වැටෙන රැයක වුවද අම්මා ලොව් බංකුව මත ගුලි වී බලා සිටියාය. සිය දින චරියාවේ මේ අන්තිම අංකය ඇයගේ ජීවිතයේ ම කොටසකි.එය වෙනස් කරන්නට ඇ අසමත් ය.

මිදලේ මඳ වේලාවක් සක්මන් කරන අම්මා, මල්ලී කෙනෙකු කළ දඟකාරකමක් ගැන මතක් කරයි. නැතහොත් ගමේ වූ සිද්ධියක් ගැන කියයි. පොත දෙස බලාගෙන ම ඒ කතාවට හවුල් වන මම ටිකකින් ලොව් බංකුවෙන් නැගිට පොත තබා මිදුලට බසිමි.

ඇ කතාවෙන් කතාවෙන් ම පාරට බැස්සාය.මමත් ඇයගේ සිත දැනගෙන ඒ අනුව පිය නැගීමි. අපි පාරේ බඹ පහක් හයක් එහායින් වූ බෝක්කුව වෙත ගොස් වාඩි වුණෙමු.

පවුලේ හෝ ගමේ හෝ, අන් මගකින් දැනගත නො හැකි තොරතුරක් මා අම්මාගෙන් ලබා ගත්තේ මේ අන්දමිනි. ඇ ඉතාම කුළුපග ව , ළෙන්ගතුව කථා කරගෙන ගියාය. වැඩ පළ අතපසු වෙතැයි බියක් නැතිව ඇයට නිදහසේ දොඩන්නට ලැබෙන එක ම අවස්ථාව මෙයයි. ඊ, කඩය අස්පස් කර අවසානයේ අම්මා මට කතා කරන තුරු මා එක්තරා බලාපොරොත්තුවකින් සිටියේද එබැවිනි. ඇයගෙන් මිපාලුප අසන රිසියෙන් ම නොව ඇය සමීපයෙහි පසු වන ආශාවෙනි.

අම්මා වෙතින් සුවඳක් නික්මිණි. ඇයගේ උරතලය හෝ උකුළ හෝ මත හිස තබා ගැනීමට තරම් ලාමක ආශාවක් මා තුළ උපන්නේ ය. තාත්තා තවත් ප්‍රමාද වුණොත් හොඳ ය යි මට මෙහිදී සිතිණි.



මට කුඩා කාලයේ අම්මාගේ ඇසුර වැඩිපුර නො ලැබුණේ ළඟ ළඟ උපන් දරුවන් සය දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමලා වූ නිසා පමණක් නොවේ. මල්ලිලා මා තරම්වත් අම්මාට සමීප නොවූවාය. තමා යෙදී සිටි වෘත්තිය අනුව දරු සුරතල් කරමින් අතට පුරුදු කරගෙන ඇති දැඩි කිරීමේ පුළුවන් කමක් ඇයට නොවිණි.

හන්දියේ සිට අතර මග දී මුණ ගැසුණු තවත් කෙනෙකු සමග එන තාත්තා උස් හඬින් කරන කතාව ඇසෙත්ම මම කඩය දෙසට ගියෙමි. මට වුවමනා කරන්නේ ඔහුට අසු නොවී ගෙට යා ගන්නට ය. වෙරි වූ කළ තාත්තා නැවත නැවතත් අසන එකම ප්‍රශ්නවලට පිළිතුරු දීම වධයකි. මම කලින් ම ගෙට ගොස් ඇඳට වෙමි.

"ළමයි නිදි ද?" යි අසාගෙන තාත්තා නිවසට ගොඩ වන කළ මම ඇඳේය.

"ළමයි නිදි නැද්ද ඊ වුණාම ?"

"නෑ මම කිව්වේ ලොකු පුතා ?"

"ඒ ළමයත් නිදි ඇති"

"දැන් ඔහෙත් එක්ක හිටියෙ. කොහෙ නිදගන්නද මේ පොඩ්ඩට ?" යයි කී තාත්තා දොර ළඟට අවුත් උළුවස්සට දෑ අත් තබා , "ලොකු පුතේ පුතේ ඒ..."යි කතා කලේය.

මත් ගතිය පළ කළත් ඒ වචන සෙනෙහෙබර ය. එහෙත් මම නින්ද ගිය විදියට ම සිටියෙමි. තාත්තා ආපසු හැරී කමිසයත් බැනියමත් ගලවා ඉවතට වීසි කර කෑම මේසය අසල පුටුවේ වාඩි වුණේය.

ඒ මොහොතට තාත්තාගේ පිටේ උර තලයේ සිට ඉගටිය දෙසට විහිදුනු අඟල් අටක් පමණ දිග කැළැල මගේ නෙත ගැසිණි. කිනිස්සකින්, කඩුවකින් හෝ පිහියකින් ලද පහරකින් ඇති වූ එවැනි කැළැලක් කෙනකුගේ සිරුරේ දකිත්ම ඒ පුද්ගලයාගේ චරිතය පිළිබඳ එක්තරා හැඟීමක් නිරායාසයෙන්ම වාගේ අප තුළ පහළ වෙයි. බොහෝ විට ඒ හැඟීම ප්‍රසන්න ජනක එකක් විය නොහැකිය ය.

බීමට වැටීම ගැන තාත්තා කෙරෙහි නො මනාපයක් පැවැති නමුත් තරුණ කාලයේ දී, එවකට බස් කොන්දොස්තර කෙනෙකු ව සිටියදී ලද කිනිසි පහරක් වූ මේ ලකුණ දකින කළ මා තුළ ඇති වන හැඟීම නොමනාපය වර්ධනය කිරීමට කිසි ලෙසකින් වත් හේතු වුණේ නැත. දවසකට වරක් නැත්නම් සතියකට කීප වතාවක් තාත්තාගේ

For E-Pusthakalaya

පිටවී වූ තැලල අපේ නෙතට අසු වෙයි. එහෙත් ඒ ගැන සිත දුවන්නේ නලාභුරකිනි.

මිනා මාර්ගයන්හි ආධිපත්‍යයන් තහවුරු කර ගැනීමට බස් මුදලාලිලා අතර උග්‍ර තරගයක් පැවැති කාලයක් ගැන මම අසා ඇත්තෙමි. ඇත්ත වශයෙන්ම ඔවුන් අතර තරගය පැවතියේ තම තමන් යටතේ සේවය කළ බස් කොන්දොස්තරවරුන් හා රියදුරන් අතර සිය හාම්පුතුන් වෙනුවෙන් ගෙන ගිය ආරවුල් වශයෙනි. නිතර පැවැති මේ ගැටුම් මිනීමැරීම් වලින්ද අනපය කඩා ගැනීම් වලින්ද කෙළවර වී ඇත. තාත්තාට කිසිසි පහරක් වැදී ඇත්තේ තම හාම්පුතා හා තරගයට බස් සේවයක් පවත්වාගෙන ගිය තවත් මුදලාලි කෙනෙකුගේ සේවක පිරිසක් සමග හට ගත් එබඳු ගැටුමකි. මත්පැනට පුරුදු වී සිටියත් තාත්තා කවර කලෙක හෝ කලකෝලාහල වලට ගිය කෙනෙක් දැයි දූන් කල්පනා කරන කල මට පුදුම සිතෙයි.

අම්මා කෑම බෙදන තුරු තාත්තා නැවත වරක් පුටුවෙන් නැගිටියේය. කෙළින් සිට ගන්නටත් අසමත් ඔහුට එක තැන වාඩි වී සිටින්නට බැරි වන්දැයි මම සිතුවෙමි. සාලයේ ම එහා ඇඳක නිද සිටි මල්ලිලා ළඟට ගොස් මඳ වේලාවක් බලා සිටි තාත්තා,

"පුතේ උඹල නිදිද ?" යි ඇසිය.

මා සිටි තැනට පෙනුණේ මුහුණේ එක පැත්තක් පමණි. මත් පැනින් මිලාන ගතියට පත් එක ඇසක් දරු සෙනෙහසින් දීප්තිමත් වී තිබෙනු දකිත් ම මගේ සිත මොලොක් විය. අප කිසිවකු සමග කතා කිරීමේ වුවමනාවක් ඔහු තුළ තදින් බලපාමින් තිබෙන්නට ඇත.

තවත් මඳ වේලාවක් බලා සිටි තාත්තා නැඹුරු වී මල්ලි කෙනකුගේ හිස සිඹිවේ ය. තාත්තාගෙන් එබඳු සුරතලයක් දිනා ගැනීමේ නිදහසක් ලබා දීමේ ආශාවකින් මගේ සිත තවත් තෙත් විය.

"ඔය පොඩි එවුන් ඇහැරවන්නෙ නැතිව ඇවිත් කෑම කන්න" යි අම්මා තාත්තාගේ උර හිසින් අල්ලා ඔසවන්නට තැත් කරමින් කිවේ අප්‍රාණික ගතියෙන් සිටි ඔහු මල්ලිලා මත ඇද වැටෙතැ යි බියෙන් ද විය යුතු ය.

තාත්තා නැවත පුටුවේ වාඩි වුණේ මට පිටු පාගෙනය.

"පුතේ........ ලොකු පුතේ"

"කෑම කන්න යි වුණා"



අම්මා ගැන නො දන්නා කෙනෙකු නම් ඇයගේ මුහුණ පුරා පැතිර ගිය නිදි මත ගතියත් වෙහෙසත් දැක දැඩි කෝපයකැ යි වරදවා තේරුම් ගනු නිසැක ය.

තාත්තා කෑම කන්නට පටන් ගත් පසු, අම්මාත් පිගානට බත් ටිකක් ගෙන - අත්ල මත තබාගෙන එළි පත්ත උඩ වාඩිවුණාය. එක ම වෙලාවට මිස ඇ කිසි විටෙක තාත්තා සමග එකට වාඩි වී ආහාර නො ගත්තා ය.

"බඩගිනිත් ගිහින් මගෙ නම්"

"ලොකු පුතේ, උඹ කීවෙනියද පුතේ විභාගෙන් ?"

මම තව දුරටත් නිශ්ශබ්ද ව ම සිටියෙමි.

"පුතේ උඹ පළවෙනිය නේද ?"

"ලොකු පුතා නිදි" අම්මා කීවා ය.

එහෙත් මා නින්ද ගිය විදියට සිටින්නේ බොරුවට බව වෙරි මරගාතේ වුවද තාත්තාත් දැන සිටියේ ය.

" උඹ ඉගෙන ගනින් පුතේ. උඹ හොඳ එකා."

වාර විභාගය කවද තිබුණත් කමක් නැත. වෙරි වී සිටින කල මතක් වුණු වෙලාවට මා කී වෙනියා වුණා ද යි දැන ගැනීමට තාත්තාට ඕනෑ කළේය.

" මම එකක් කියන්නද ? ඔහේගෙ ලොකු පුතා වගේ නෙවෙයි.

දෙවනිය උඹ අංඩය. උඹ ලෝකෝත්තරය. දෙවනිය සැරයි."

"මොකා වුණත් කමක් නෑ බිමට නො වැටුණොත්. මට ඕනෑ එච්චරයි.

අම්මා හැට්ට අතින් ඇස් පිසද ගත්තාය. ඇයගේ දෙ නෙත් කඳුළෙන් පිරී ගියා නම් ඒ කිසියම් ශෝකයකින් ද, කෑමට මිරිස් වැඩි නිසාදැයි තීරණය කර ගන්නට මම අසමත් වීමි. තාත්තාට මිරිස් වැඩිපුර ඕනෑ කළේය.

"ඔහේ බොන්නෙ නෑ නෙ. ඔහේගෙ දරුවො නරක් වෙන්නෑ කවදවත්."ය යි කී තාත්තා පුරුදු පරිදි හඬ නගා සිනාසුනේය.

අවිනිශ්චිත ගතියකට පත්ව තිබුණු මගේ සිතෙහි තාත්තා කෙරෙහි

Buddhika 55

Free E-Pusthakalaya

යළි මෝරන්නට වූ කෝපය ඔහුගේ ඒ වචන වලින්ම මහාව සිනාවෙන් පහව් අනුකම්පාවක්ද ජනිත කරවිය. ඊළඟට පැවතියේ නිශ්ශබ්දතාවයකි. නිශ්ශබ්දතාවය බිඳීමට ම උචිත හඬකින් කතා කළ තාත්තා, බලාපොරොත්තු සුන් වූ ගතියකින් හා පසුතැවිලිකින් යුක්තව, මෙසේ කීවේය.

"මම අරකිට අදත් කතා කළා. ඒකි එන්නෙ නෑ."

අවුරුදු කිහිපයක් තිස්සේ කලින් කලට, මහ රෑ බීමත් ව ගෙදර පැමිණ කෑම කන අතර, තාත්තාගෙන් මේ වචන ම හෝ මේ අදහස රැගත් වචන කියවී ඇත. ඒ හැම විට ම වාගේ මගේ හදවත තිගැස්මක් ඇති විය.

ඇඳට තාත්තා හර හැටි නො පෙනුණත් මම වහා සාලය පැත්තට හැරුණෙමි. තාත්තාගේ මුහුණ නො දැකම එහි රැඳුණු ශෝකය හා වේදනාව සටහන් කර ගැනීමට මම සමත් වීමි.

"මෙකි එන්න බෑ කියන හැටි?" තාත්තා ඒ පරාජිත ස්වරයෙන් ම නැවතත් කිවේය.

අම්මා ඊළඟට නගන ප්‍රශ්නය කුමක්දැයි මම හොඳින්ම දැන සිටියෙමි. එහෙත් හැම අවස්ථාවක ම දඩි උනන්දුවකින් හා කුහුලකින් මා සවන් දුන්නේ අම්මා අදවත් සිය අදහස වෙනස් කරගෙන ඇද්දැයි අලුත් කර ගත් බලාපොරොත්තුවක් ඇති ව ය. නැවත නැවතත් තාත්තා මේ කථාව මතු කරන්නේ ඔහු තුළ ද මාගේ හැඟීම ම- අම්මා දැන්වත් අදහස් වෙනස් කර ඇද්දැයි සිතිවිල්ල ම - බල පෑ නිසා විය යුතුය.

"මොන එකියක් ද?" අම්මා උදාසීන ලෙස ඇසුවා ය.

"මොන එකියක් ද අහන්නේ? ජේන් අක්කගෙ ලොකු එකී කුසුම් මම ඒකිට කතා කළා. ඒකි එන්නෙ නෑ"

"ඒකි මේ හවසත් ඇවිල්ලා හිටියේ මෙහෙ. මට දර පොල් කොළ ටිකකුත් හොයල දීල ගියේ?"

"මම කියන්නේ එහෙම නෙවෙයි. ඔමෙහට තේරෙන්නෙ නෑ නෙ මම කියන එක. ඒකනෙ වැරැද්ද. ඔහෙට මම කියන එක තේරෙන්නෙ නෑ."

"මේ රෑ වෙලා වෙරිකාරයෝ කතා කළාම ඒ පුංචි එකී එයි යැ.?"

"හොඳයි.........හොඳයි මම හෙට බෙන්නෙ නැතුව ගිහිල්ල කතා



කළොත් මම අහන්නෙ. ඔහේ කියන්නෙ එයි යි ද? ඒකයි මගේ පුස්සෙ......එයි ද?"

තාත්තා කතා කළ ආකාරයට, සියලු හැඟීම් යටපත් කර, මගේ මුවග මොහොතකට සිනාවක් නැඟිණි.

"මොකද නේන්නෙ? යසට එයි"

"හොඳයි මම අහන්නෙ ඔහේ කැමති ද මම කුසුමේ එක්ක එනවට ? ඔහේ කැමතිද ?"

අම්මා එක වර පිළිතුරක් දුන්නේ නැත. ඇය වාඩි වී සිටි තැනින් නැගිට අඩුපාඩුවක් බෙද ගන්නට මේසයට ළඟට ගියා විය හැකිය. ඇති වූ ප්‍රමාදයේ දී මා තුළ තුළ හටගත් හැඟීම් අනුව, තාත්තාගේ සිත්හි කුමක් බලපාමින් ඇද්දැයි සිතා ගැනීමට මම සමත් විමි.

"ඔහේ කැමතිද ?"

"ඒක නේන්නම් මම කිව්වේ ඉස්කෝලෙ ඇරිල යනකොට හැමද ම වගේ මම ඒකිව නවත්ත ගන්නව.......... සමහර දට රෑ වෙනකල් ඉන්නෙ. ජේන් අක්ක වෙළඳාමෙ ගිහිල්ල එනකනුත් ?"

"ඕකනෙ මම හැමදමත් කියන්නෙ ඔහෙට තේරෙන්නෙ නැත කියල.......මම කියන්නෙ රෑ වෙනකම් නවත්ත ගන්න එක නෙවෙයි නෙ. මම අහන්නෙ ජේන් අක්කගෙ ලොකු කෙලී ඉන්නව නේද? කුසුමේ ? අපි ඒකි දරුකමට හද ගන්න ඔහෙ කැමතිද කියන ඒකනෙ. මම මේ අහන්නෙ. ජේන් අක්ක දෙන්න කැමතියි. ඔහෙ මොකද කියන්නෙ ?"

"මෙ හය දෙනෙක් ඉන්නව මදිද ?"

"ඔය කිව්වේ ? ඕන්න කිව්වා ! ඕක තමයි ඔහෙට තේරෙන්නෙ නැතනෙ."

කතාව එතැනින් නතර කරන්නට යන බවක් පෙන්වා මඳක් සිටි තාත්තා යළි පටන් ගත්තේ වෙනස් වූ හඬයකිනි.

"මම කියන්නේ කෙල්ලෙක් නැති ගෙදර එළියක් නෑ. දුන් ඔහේම කියන්නෙ ඒකි පුංචිකමට කඩිය වගෙ වැඩපළ කර දෙනවය කියල.ඔහෙට උනත් කොයිතරම් අත් උදව්වක්ද ?"

"කෙල්ලො නැතුවට කමක් නෑ. මේ කොල්ලො ටික හද

Buddhika 15

For E-Pusthakalaya

ගනිමුනෙ. උන් කවදාහරි එක එක කෙල්ල ගානෙ නොගෙනතෑ."

"කවදා හරි ඔහෙට තේරෙයි. ඒ පිටවුන් පිටම තමා"

"ඉතින් කුසුමෙත් පිට නෙ ?"

"ඒකි එහෙම නෑ. ඒකි අපේම දරුවෙක වගේයි." "ඒකි එහෙම නෑ. ඒකි අපේ සරුවෙක වගේයි."

"ඔය කෙල්ලො හදුගෙන බෑ"

නිමක්ව සිටි තාත්තාටත් වෙහෙස වී සිටි අම්මාටත් නින්ද යන්නට විනාඩි ගණනකට වඩා ගත නොවීය.

මම බොහෝ වේලා යනතුරු අවදියෙන් ගත කළෙමි.

ළමා වියේදී තාත්තා හා මා අතර එකඟත්වයක් හදවතින් හදවතට එකඟත්වයක් ඇති වූ එකම කරුණ මෙයයි මම සිතමි. පවුලට ගැහැණු දරුවකු නො සිටීම ගැන තාත්තා මෙන් මම ද බෙහෙවින් කනස්සල්ලෙන් දුකින් පසුවීමි.එහෙත් මා තාත්තා මෙන් මගේ හැඟීම් එළිපිට පළ කරන්නට ගියේ නැත. බොහෝ විට එවැනි ප්‍රශ්නයන්හි දී ළමයින් පීඩා විඳින්නේ හුදකලාවමය. සිහින තුළය. මම ද සිහින තුළ දුකට මෙන් ම සතුටට ද පත් වීමි.

රෝහණ හා විජය උපදිනු මට මතක නැත. සෙනරත්, ගාමිණී හා තිස්ස උපන්නේ මට මතක ඇති කාලයේය. මේ තිදෙනා ම සම්බන්ධ ව මෙවර වත් අම්මාට ගැහැණු දරුවකු උපදිනු ඇතැයි මම ලොකු ආශාවකින් බලා සිටියෙමි. මට වූ ඒ ආශාව ම තාත්තාට ද වූ බව මම දැන ගතිමි.

බාල ම මලණුවන් බිහි වීමට සතියකට හමාරකට පෙර,

"දුන් ඔහේ ඉස්පිරිතාලෙට ම යන්න ද කල්පනාව ?" ය යි තාත්තා අම්මාගෙන් ඇසුවාය.

"ඉස්පිරිතාලෙ යනව මිසක් ගෙදර ඉඳලා බෑ" යි අම්මා කීවාය.

"එහෙනම් මේ පාරවත් කෙලි පොඩිත්තියක් අරගෙන එන්න බලනවා"යි තාත්තා හඬ නගා සිනාසුණේය.

"මට තව කොල්ලෙක් හොඳයි." යනුවෙන් අම්මා කීවේ තම ගැබ මෝරණ දරුවා පුතකු බව සහතික වශයෙන් දන්නා තරම් ස්ථිර භාවයිනි.



තාත්තාත් මමත් අම්මා හා තිස්ස බලන්නට රෝහලට ගොස්, ආවෙමු.

බස් රියෙන් බැස පයින් එමින් සිටි අප අතර කිසි කතා බහක් නො වුණා තරම්. පිට අය සමඟ හොඳින් කතා බස් කළත් මුළු ගමන දිගටම ඔහුගේ මුහුණේ කිසියම් ශෝකයක් වේදනාවක් රැඳී තිබිණැයි මම සිතමි.

අප ජේන් නැන්දලාගේ ගෙය කරා ළං වන කල ඈ මිදුලට බැස,

"කොහොම ද ඩ්‍රයිවර් උන්නැහෙ. තුරුණුවන්ගෙ සරණෙන් කරදරයක් කාරිය නැතුව ඇති නේද ?" යි ඇසුවාය.

"කරදරයක් නම් මොකක් ද දෙයියන්ගෙ පිහිටෙන් ......? මේ පාරත් කොල්ලෙක් ජේන් අක්කේ." යි කී තාත්තා පාරේ නතර වී හඬ නගා සිනාසුණේය.

තාත්තා සිණාසුණේ නඩන්නට බැරිකම විය යුතුය. ඔහු වෙනුවෙන් මටත් හැඬිය හැකි තරම් සියුම් වේදනාවක් වහා දැනෙන්නට විය. මා තුළ ද මාස ගණනක් තිස්සේ තිබී සුන් වී ගිය බලාපොරොත්තු තාත්තාගේ කටින් පිටවුණු බැවිනි. අම්මා මේ වරත් ලැබුවේ පුතෙක් යැයි යන ආරංචිය ලද අවස්ථාවේ පටන් නියම මුහුණුවරක් නැතිව ඇති වෙමින් තිබුණු හැඟීම් මා හඳුනා ගත්තෙ ඒ "මොහොතේය.
"අනේ හොඳ නෙ මොන තරම් හොඳ ද පිරිමි පුතෙක් නම්"

"මොන හොඳක් ද ජේන් අක්කේ.......... මහ මෙරට හිතාගෙන හිටිය මේ පාරවත් කෙල්ලෙක් ලැබෙයි කියලා."

"ඩ්‍රයිවර් උන්නැහෙ විටක් වත් කන්න එන්නේ නැද් ද ?" යි ජේන් නැන්ද ඒ ළඟට ඇසුවේ තාත්තාගේ සිත් තැවුල තුනී කරනු පිණිස කළ යුතු අන් දෙයක් ගැන සිතා ගත නොහැකි වූ කෙනෙකු මෙනි. අපි ඔවුන්ගේ ගෙට ගොඩ වුණෙමු.

"මට ඉතිං ජේන් අක්කාගෙන් එකෙක්වත් නො දුන්නොත් ගෑණු දරුවකුගේ හුරතල් බලන්න වෙන්න නෑ" යි තාත්තා පුටුවේ වාඩිවෙමින්, සිනාසීගෙන වුවද කීවේ වඩාත් විචාරණ සංවේගය පළ කරන ඇස් ඇතිවය.

කුසුම් හා සෝමා උළුවස්ස ළඟට පැමිණ එබීගෙන වුන්හ.

"අනේ ඔය ඉන්නෙ. එක්ක යන්නකෝ." පුවක් ගෙඩියක් කපන්නට ගත් ජේන් නැන්ද කීවාය.

Buddhika-55

For E-Pusthakalaya

තාත්තා දුරියන් දෙ දෙනා දෙස මඳ වේලාවක් බලා සිටියේය. මෙයින් තවරකු තෝරා ගනිම්ද තීරණය කරගත නො හැකිව මෙන් එසේ බලා සිටි තාත්තාගේ දෙ නෙත් හි සෙනෙහසත් ශෝකයත් දෙකම මිශ්‍රව පිරී තිබිණි.

"වරෙන් දුවේ උඹ........ උඹ අපිට හොඳයි." ඔහු ඊ ළඟට අත දිගු කළේ කුසුම් වෙතටය.

කුසුම් වහා පස්සට පැන ගත්තාය. ඇයගේ ඒ ක්‍රියාවෙන් ම තාත්තාගේ ආදරය තවත් වැඩෙන්නට ඇත. තාත්තා සිනාසෙමින් සිට ගත් කළ තව තවත් පස්සට වෙමින් ගිය දුරිය නතර වුණේ ගෙයි මුල්ලකය.තාත්තා ගේ ඇතුළටම ගොස් ඇ අල්ලා ගත්තාය.

"අතාරින්න.......... අනේ ඩැයිවර් මාමෙ අතාරින්නකෝ." යි ඇ සිනාසෙමින් ම එහෙත් බොරු බියක් පෙන්වමින් කෑ ගැසුවාය.

දුරිය ඔසවා ගත් තාත්තා එළියට ආවේ ඇය හරහට වඩාගෙන ය. ඇ දිගටම කෑ ගසන්නවත් දඟලන්නටත් වූවාය. කුසුම් උකුලේ රඳවා ගනිමින් ම පුටුවේ නැවත වාඩි වුණු. තාත්තා දුවක සිටියා නම් හුරතල් කරන්නේ මෙහෙම යයි සිතාගෙන මෙන්.

"ඔහොම හිටපන් කෙල්ල ටිකකට දඟලන්න නැතුව " යි කියා ඇයගේ හිස තම නිකටටත් බෙල්ලටත් හිර කර ගත්තේය. විදෙන තරමට තරයේ තිකට අල්ලා මුහුණ තමා වෙත හරවා ගත් ඔහු,

"දුවේ උඹ එනව නේද ?" යි ඒ වර ඇසුවේ මුදු මොලොක් ලෙසිනි.

"අතාරින්න කො මාමෙ ඒ "යි කීවා මිස ඇය පිළිතුරක් දුන්නේ නැත.

"මේ මුළු කාලය තිස්සේ සෝමා තාත්තාගේ ඇඟේ ගෑවෙන තරමට ළංවී ඔහුගේ ග්‍රහණයට පත් අක්කා විඳින වධය දෙස බලා සිටියේ තමාත් ඔහුට අසුවේ ද යි බියකින් නොව මම එන්න දැයි අසන ඊර්ෂ්‍යාවකින් ද පිරුණු ඇස් ඇතිවය. අප කිසිවෙකුගේ අවධානය ඇය වෙත යොමු නොවිණි.

"ලොකු පුතේ උඹ ඔය ගෙනාවයින් ටිකක් දීපන් නංගීටත්. මෙහෙට ගනින්......" තාත්තා මට කීවාය.

සෝමා තාත්තා හා මාත් සිය මවත් දෙස මාරුවෙන් මාරුවට බලා මුහුණ තවත් ඇඹුල් කර ගත්තාය. තාත්තා රටි ඉදි මුලෙන්



භාගයක් ම පමණ කුසුම් අත තැබුවාය. ඊට පසුව දඟලිල්ල අඩු වු නමුත් ඇය තාත්තාගේ උකුලේ තවදුරටත් රැඳී සිටියේ නොසන්සුන් ගතියකිනි.

"හුරතල් වුණා ඇති ලොකු එකියෙ. මාමට මේ විට කන්න එහාට වෙයන්" ය යි බුලත් විට සූදනම් කර ඔහුට පිළිගන්වමින් ජේන් නැන්ද කීවාය.

කුසුම් එවැනි නියමයක් කරන තුරු බලා සිටියා තරම්. ඇ වහා ගෙට ගියාය. සෝමා ද ඒ අනුව ගේ ඇතුළට ගියාය. අක්කා නගෝ අතර කිසිවක් කතාවිණි. රට ඉඳි ටික බෙද ගන්නට ඔවුන් පොර කැවා විය යුතුය."එහෙනම් අපි යනවා" යි කියාගෙන තාත්තාත් මාත් මිදුලට බසිත්ම ජේන් නැන්දත් අප සමඟ පාර තෙක් ම ආවා ය.

තාත්තාගේ ග්‍රහණයට පත් වූ කල බොරුවට දඟලූ නමුත් කුසුම් ද සිය මවගේ අත අල්ලාගෙන අප පස්සේ පිය නැගුවේ සුපුරුදු සිනාව ඇතිවය.

මම හැරි හැරී කීප වරක්ම ආපසු බැලුවෙමි. මව ගෙට යමින් සිටි නමුත් කුසුම් අප දෙස බලාගෙන වුන්නාය.

කුසුම් දරු කමට හදගන්න ගෙනෙමු යි තාත්තා යෝජනා කළ නොයෙක් අවස්ථාවල "අම්මෙ අපි කුසුම් අපේ ගෙදර නතර කර ගනිමු ද"යි කියන්නට මට සිතුණත් මා තුළ එතරම් ධෛර්යක් නො විය. එහෙත් ඇය ගැන දෙමාපියන් දෙ දෙනා අතර කතා බස් වුණු නොයෙන් රැයක නිදි නැතිව බොහෝ වේලා ගත කළ මම ඇය සම්බන්ධ කර විවිධ විසිතුරු දේවල් සිතින් මවා ගතිමි.

කුසුම් අපේ ගෙදර අපේ ම පවුලේ කෙනෙකු වශයෙන් ඇති දූඩි වන අන්දම මම සිහින තුළ සිතුවම් කළෙමි. මල්ලීලා හැම කෙනෙකුටත් වඩා දූඩි ලෙස ඇය මගේ සෙනෙහස දිනා ගන්නවා ඇත. මට ඇය අතින් අල්ලා පාසල් කැඳවා ගෙන යා හැකි ය. තාත්තා නිසැකයෙන් ම ඇයට ලස්සන ඇඳුම් ද විදුරු වළලු හා කොණ්ඩා කටු ද ගෙනවිත් දෙනු ඇත.

මෙසේ සිහීමෙන් මම මහත් ආශ්වාදයක් ලැබුවෙමි. ඇය මගේ ම නැගණිය ලෙස හැදෙන වැඩෙන සැටි දකින කල තුනී සිනාවක් මගේ මුවගට නැගුණු අතර මා දකින්නේ කිසි කලෙක සැබෑ නොවන සිහිනයක් නොවන්නේද යි මතක් වුණු පසු මගේ දෙනෙත් තෙත් විය.

ඒ සිනාව මෙන්ම ඒ කඳුළු ද විසින් ඇති කරවන ලද සතුට හා

Buddhika 13

For E-Pusthakalaya

දුක මගේ සිත්හි කුසුම් මගේම නැගණියක නොවේ යයි සිතිය නො හැකි තරම් දැඩි බැඳීමක් ද සෙනෙහසක් ද ජනිත කරවිය.

මා මධ්‍ය මහා විද්‍යාලයේත් කුසුම් ගමේ සිංහල පාසලේත් ඉගෙන ගත්තා කාලයේ, මා නගරයේ සිට සවස ආපසු එන බොහෝ දවසක කුසුම් අපේ ගෙදර හෝ කඩයේ හෝ සිටියාය.

අම්මා, කඩයේ පැත්තක බිම පැදුරක් එළා දී නිස්ස කුසුම්ගේ උකුලේ තැබුවාය. ඇය සුරතල් කට හඬකින් කවි කියමින් මල්ලී නළවනු මම ගෙයි සිට අසාගෙන සිටියෙමි. මල්ලී නිද ගත් විගස ඈ මා වෙත දුවගෙන ආවාය. එහෙත් එහි වැඩි වේලාවක් ගත කරන්නට ඇයට අම්මාගෙන් ඉඩක් නො ලැබිණි.

"කුසුමෙ වරෙන් දුවේ" යි අම්මා කෑ ගැසුවාය.

දුවිය කඩයට දුවගෙන ගියේ ඉඩක් ලද වහාම ම නැවත මා වෙත එන අදහසින් වුව ද ඒ හැම අවස්ථාවක ම "ලොක්කයියෙ මම යනවා" යි හාලයට කියන්නට අමතක කළේ නැත.

කුසුම් සිටි දිනවල අම්මා මට සවස තේ එව්වේ ඇය අතේය. අම්මා ඇයට අඩුව සහිත බෙලෙක් කෝප්පයකට තේ වත් කර දුන්නේ අත පිළිස්සෙන බැවිනි. එසේ නැතිව මා බෙලෙක් කෝප්පයේ බීමට නො කැමති බව ඇය නොදන සිටි නිසා නොවේ.

කුසුමෙ ඔය අයියගෙ විදුරුව හොයල හොඳට හෝදල දීපන්, ය යි අම්මා කඩයේ සිට ම කෑ ගසා කීවාය.

මා කිසිවක් කර කියා ගත නොහැකි පොඩි දරුවකු ලෙස සිතන අම්මා කුසුම් දකින්නේ පැසුනු ගෑහැණියක ලෙසිනි.

කුසුම් ආවේ මිදුලේ දී ම "ලොක්කයියේ" කියාගෙන ය. කාමරයට වී පොතක් බලමින් සිටි මම කතා නො කළෙමි.

"ලොක්කයියා කොහෙද? සාලයේ නතර වී වටපිට බලමින් ඈ කෑගැහුවාය. මගේ අත පිච්චෙනවා"

"කව්ද මේ කෑ ගහන්නෙ ?" යි මම තරහෙන් මෙන් ඇසීමි.

ඇගේ විසිරෙතැයි බියෙන් උණු තේ භාජනය ඈතට කර අල්ලාගෙන කාමරයට පැමිණි ඈ එයත් අනෙක් අතේ තිබුණු කෑමක් මේසය උඩ තැබුවේය.

"හොරා වගෙ කතා නොකර හිටිය" යි නෝක්කඩු කියමිනි.



"ඉතින් කන්න" යයි කියාගෙන කුස්සිය දෙසට ගිය ඇය මගේ විදුරුවත් සෝදාගෙන ආපසු ආවාය.

කුසුම් හිස මදක් පැත්තට ඇළ කරගෙන හිමින් සිරුවේ, බෙලෙක් කෝප්පයෙන් විදුරුවට තේ වත් කරනු මම බලා සිටියෙමි. අපේ ඇස් මුණ ගැහෙත්ම ඈ අලුතින් සිණාසුණාය.

උඩු ඇන්දේ ඉස්සරහ කිරි දත් දෙකක් හැලීමෙන් ඇති වූ හිදැසකින් යුක්ත එක කාලයකදී ඇයගේ මේ සිනාව අමුතුම සුන්දරත්වයක් - අහිංසක කමක් - පළ කළා මට මතකය."තේ නිවෙන්න ඉස්සර වෙලා කන්න. " ඈ යළි කීවාය.

ගවුම් සායේ දෙ අත් පිසදාගෙන ඈ මේසයට ළං වූවාය. එහි පොත් පත් රාශියක් නොවීය. එහෙත් තිබෙන ටික මම පිළිවෙළකට තබා ගතිමි. මල්ලිලා හැම දෙනාටම හවුලේ වෙනම මේසයක් විය. ඔවුන් මගේ පොත් අතපය ගෑමට ඒම මගේ සතුටට කරුණක් නොවිණි. මේ කරුණ ගැන මා ඔවුනට සැරවැර කරන අවස්ථාද විය. මා හා අමනාපයක් ඇතිකර ගත් කල රෝහණ කළේ මගේ පොත් අවුස්සා දැමීම ය.

කුසුම් සම්බන්ධව මා තුළ එවැනි බියක් තිබුණේ නැත. ඇය පොත්පත් ඇල්ලුවේ මා මෙන් ම දැඩි පරිස්සමිනි. ආදරයෙනි.

"ලොකයියට පොත් ගොඩක් තියෙනව " ඇය නිතර කීවාය.

"නංගිත් මෙයින් කෙසෙල් ගෙඩියක් කන්න."

"මට එපා"

"මට දෙකක් වැඩියි"

"ඩැඩි නෑ. මට පැන්ද දෙයි"

මා කෙතරම් පෙරැත්ත කළත් කුසුම් මට අම්මා එවන කිසිවක් කැවේ නැත.

"මෙක කන්න" ය යි මා නැවතත් බල කළොත් ඈ අමුතු විදිහට සිනාසෙමින් "එපා එපා" යි කියාගෙන දොර තෙක්ම පස්සෙන් පස්සට ගියාය. සමහර විට මම ඇය දෙඅතින් අල්ලා "එපා" යි කෑගසද්දී ම බනිස් හෝ හැලප හෝ කෑල්ලක් බලෙන් ම ඇයගේ කටේ එබුවෙමි. ඇය මගෙන් ඈතට වූණේ එබැවිණි.

එසේ නැත්නම් මා තේ බොන තුරු ඈ පොතක් අතට ගත්තාය.

Boddhika 25

For E-Pusthakalaya

ඇතැම් විට කැම ඔතාගෙන ආ පත්තර කෑල්ල බිම හිඳී අහුලාගෙන, මගේ ඇඳ පාමුල හාඩි වී තියෙව්වාය.

ඇයට වැඩි වෙලාවක් එහි රැඳෙන්නට ඉඩක් ලැබුනේ නැත. අම්මා කතා කරන බැවිනි. ඇය විසින්ම නියම කරනු ලබන කිසිවක් නැති ඉක්මනින් නිම කළ කුසුම් නැවත නැවතත් මා වෙත දුවගෙන ආවාය.එත්තෙත් දර පොල් කොළ එකතු කරමින් සිටි කුසුම් ජනේලය ළඟට පැමිණ මා හා සිනාසුණාය. මම ද පාඩම් කිරීම නතර කර පිටතට ගියෙමි. අප අතර වූ වයස පරතරය නොතකා - මා ඇයගේ තත්වයට බැස - අපි මගේ දිගටම කතා කළෙමු.

රබර් කටු ආප්ප තබලට හොඳ දරකි. ඇට වැටෙන කාලයට කුසුම් ලවා අම්මා රබර් කටු එකතු කරවා ගත්තාය. අපේ ගෙය පිටුපස අනුන්ගේ රබර් වත්තක් විය. එහි යන්නට නියම වුණු හැමදා ම කුසුම්,

"ලොකයියෙ වැඩක් නැත්නම් එන්නකෝ" යි මට කතා කළාය.

" මම වැඩක්" ඇයගේ අදහස දැනගෙන ම මම බොරුවට කීමි.

"අනේ එන්නකෝ"

"මට වැඩ තියෙනවා කිව්වම"

"මම කියන්නද ? ලොකයියා පොතක් අරගෙනම එන්න. මම රබර් කටු ඇහිඳ ගන්න කල් අයියා ගලක් උඩට වෙලා පාඩම් කරන්න"

"නෑ ඔය මදුරුවෝ කකා ගල් උඩට නොගියට මට හොඳයි ගෙදර ඉඳල පාඩම් කරන එක"

"මම තනියෙන් යන්න බයයිනෙ ඒකයි නෙ කියන්නෙ."

"මහ ලොකුවට කට නම් ඒකට මොකද ?"

මා ඇය හා තනිවට ගියේ පොතක් රැගෙන නොවේ.මමත් පොඩි ළමයකු මෙන් ඇය සමග බිම් පොල් ද පේර තඹල හා කොම්පිඤ්ඤ ද කැවෙමි. මම ඇයට රත්මල් කිනිත්තක් කඩා දුනිමි.

දුව පැන ඇවිදින කාලයේ දී තිස්ස බලා කියා ගැනීම කුසුම්ට පැවරිණ. කඩයේ නො රැඳී ඈ මල්ලිත් වඩාගෙන ගෙදරට ආවාය. මල්ලී ඇයගේ අතේ තිබුණු මගේ පොතක් අදින්නට යෑමෙන් කොළයක් ඉරිණි. මම කුසුම්ට සැර කළෙමි. එදා ආපසු යන තුරුත් ඇය මා සමග කතා කළේ නැත. ඇය සවස මට නො කියා ගෙදර යෑම ගැන මා තුළ වේදනාවක් ඇති විය. එහෙත් පසු දා පුරුදු පරිදි පාසල් යන

Buddhika 15



අතර වෙල හරියෙ දී ඈ මුණ ගැසුණා ය. මාරු වෙද්දී මම ඇයගේ කොණ්ඩයෙන් අදින්නට ගියෙමි.

"අනේයිය" යි කියාගෙන ඈ ඉවතට පැන ගත්තාය.

මා ගැටවර වියට පත් වන විටත් කුසුම් අවුරුදු අටක නවයක දැරියකි. අප අතර ඇසුර කෙමෙන් වැඩෙත්ම මට ඇය දවසක් දක්නට නො ලැබීම පවා පාළුවක් ඇති වීමේ හේතුවක් විය.

සෙනසුරාදා හා ඉරිදා දවස්වල ඇය නියත වශයෙන් ම අපේ ගෙදරට ආවාය. මා ඇය බලාපොරොත්තුව සිටියේ කිසියම් නො සන්සුන් කමකින් තරමක් අවුල් වූ සිතිනි. අපේ ගෙවල් පැත්තට ගුරු පාරේ එන කෙනෙකු වෙලේ ඈතදී ම පෙනෙයි. ගස් අතරින් ඇයගේ ඡායාව දකිත්ම මගේ මුවගට සිනාවක් නැගිණි. ඇයට ද එසේ ම මා පෙනෙනු ඇත. ඇයගේ ගමන ඉක්මන් විණැයි මම සිතුවෙමි.

බටහිර අහසේ රත් පැහැය පැතිරෙමින් හිරු බැස යමින් තිබුණු හැන්දෑවක අපි දෙපැත්තෙන් තිස්ස අල්ලාගෙන වෙලේ මහ නියර දිගේ එහා කෙලවරටම ගියෙමු. වක්කඩක් අසල නතර වී වතුරේ නටන දංඩි පැටවුන් දෙස බලා සිටින්නට තිස්ස ආශා කළේය.

අම්මාගෙන් කලින් නියමයක් ලැබී නොතිබුණත් කුසුම් වෙල අද්දර රබර් ඉඩමට පැන දර කෝටු ටිකක් අහුලා ගත්තාය. ඇතැම් විට ගාමිණීත් අප හා එකතු විය. අප අතර කතා වන්නට කිසිම රහසක් නො වුණත් මා වඩාත් ප්‍රිය කළේ කුසුම් සමග තනිවම හැසිරෙන්නට ය.

කුසුම් දරුකමට හදා ගැනීමේ අදහස තාත්තා වෙතින් ඉවත් වූයේ නැතහොත් ඒ අදහස අත්හැර දමන්නට ඔහුට සිදුවූයේ කුමන වකවානුවක දී ද යි මම නො දනිමි. කෙසේ වුවද ඔහු එක්තරා කාල සීමාවක දී මේ ගැන කතා කිරීම නතර කළේය.

එහෙත් මා තුළ කුසුම් මගේ ම නැගණියක ය යන හැඟීම එලෙස ම පැවතිණි. ඇය මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළුවීමේ ශිෂ්‍යත්වයට ඉදිරිපත් කරන්නැයි මා ජේන් නැන්දා පෙලැඹ වූයේද ඒ අදහසිනි.

එහිදී, මැදි විදුහලේ දී,

"නිමල්, ඒ ඔයාලගෙ නංගි වෙන කෙනෙක් ද ?"යි දැරියක ඇසූ කල මා "ඔව්" ය යි කීවේ එක්තරා ප්‍රමාණයකට ආඩම්බරකමින් ද යුතුව ය යි මම සිතමි.

For E-Pusthakalaya

## 2

ග්‍රීෂ්මහාන සමයේ සඳ එළිය සහිත ඒ රාත්‍රියේ අම්මාත් මමත් තාත්තාත් එක තුරු වෙලේ බෝක්කුව මත වාඩි වී කතා කරමින් සිටියෙමු.

"ඉඩෝර කරන්න වගෙයි. නියං කොබෙයියෙක් කෑ ගහනව" යි අම්මා කීවාය.

නියං කොබෙයියා යි අමුතු වර්ගයේ කුරුල්ලෙකු නැතැයි මම සිතමි. කොබෙයියා යළි කෑ ගසන විට ගැමියන් විසින් ඌ හඳුන්වනු ලැබුවේ නියං කොබෙයියා යනුවෙනි. ඒ කාලයට උගේ හඬ ඇසෙන්නේ නියගයක් ආසන්න වීමේ ලකුණු වශයෙනැයි ඔවුහු සිතූහ. ශෝකී රාවයක් ගැබ් වී තිබුණේ වී නමුත් උගේ නාදය කන්කලුය. චන්ද්‍ර රශ්මියේ චමත්කාරයෙන් කිසියම් මෝහනයකට පත් වී නින්ද නොයන බැවින් පක්ෂියා ගී ගයතැයි සිතන්නට මම උත්සාහ කළෙමි.

"ඉඩෝර කරන්න තමයි" අහස දෙස යොමු කර ගත් දෙනෙත් ඇතිව අම්මා යළි කීවාය. "..........හඳ මඬලත් තියෙන්නෙ."

හඳ මඬල හා මීදුම ඉඩෝරයක නවත් ලකුණුය.

අම්මා කිසි විටෙකත් දුක් දොම්නසක් පිටව දුන් කාන්තාවක් නොවූවාය. තාගේත් සිත් දිනා ගන්නට නිතර මතු කර ගත් සිනාවකින් යුත් ඒ මුහුණ දුකක් වේදනාවක් ඇත්තියකගේ යයි කිසිවකුට කිව නොහැකිය. එහෙත් ඇයගේ සිත්හි නිරන්තර ව පැවති බරක් නිසා ඇතිවූ වෙනෙස ගතියක් අර සිනාව යටින් ඇදී තිබුණු බවක්ද කිව යුතුය.

මේ තියන රාත්‍රියේ අප අවට පුරා පැතිර ගත් සොබා දහමේ සිරියාවෙන් අම්මාගේ සිත ද සැහැල්ලු වී තිබිණැ යි ඇයගේ මුහුණ වසා ගත් ප්‍රසන්න භාවය අනුව මම සිතා ගතිමි. අම්මා සඳ මඬල දෙස බලා සිටි අතර මම ඒ ප්‍රසන්න - ආදරණීය මුහුණ දෙස බලා සිටියෙමි. අම්මා විළඟට, පින්නෙන් තෙමී, මීහිදුම් පටළය අතරින් පෙරීගෙන ආ සඳ රැසින් නැවී ගිය ගොයම සහිත වෙල් යාය අවට බැලුවාය. අප අතර මඳකට පැවති නිශ්ශබ්දතාව බිඳිමින් කතා කළ අම්මා,

"කුසුමෙට මොනව දෙනවද මම දන්නෙ නෑ"යි හදිස්සියේ කීවාය.

Buddhika



මා තුළ එක වර ඇති වුණේ අහේතුක, අනියත තැති ගැන්මකි. මා තිගැස්සී මෑණියන් දෙස හැරුණේ එබැවිනි. ඇයට ඒ කිසිවක් දක ගන්නට හෝ අවස්ථාවක් වුනා ද නැද්දැයි මම නො දනිමි. අම්මා මගේ සිත දන හෝ නොදන - මගේත් විස්තර පතා ප්‍රශ්නයක් නැගෙන්නට කලින්.

"කුසුමෙ ගෙට වෙලාහෙ. නැකත අනිද්දා ද කොහෙද කියලයි ජේන් අක්ක කිව්වෙ." යි නෙපලා ය.

මා තුළ උපන් ක්ෂණික හැඟීම් එකවර ඇති වූයේ කිසියම් නියත නිශ්චිත ස්වරූපයක් ගත්තේ නැත. මුලින්ම මට දනුණේ අම්මාගේ මුහුණ බැලීමේ ලැජ්ජාව පමණි. වෙල පැත්තට දෙ පා වැටෙන සේ බෝක්කු කාංඩිය මත වාඩි වී සිටි මම වතුර පාර දෙස නෙත් යොමු කර ගතිමු.

"කරාබු කුට්ටමක් වත්තොදී හොඳ නෑ" අම්මා කීවාය.

එක අතකට මා තුළ හට ගත් චකිතය තේරුම් ගැනීමට ඇයට පුළුවන්කමක් මෙන්ම ඕනෑකමක් ද නොවීම පුදුමයට කරුණක් නොවේ. අම්මා කුසුම් ගැන කතා කළේ හඳ මඬල, නියං කොබෙයියාගේ නාදය, ළඟදී එනැයි කියන ඉඩෝරය ආදී සොබා දහමේ කොටස් ගැන කතා කළ හඩින්මය. හඳ මඬල, මීදුම හා කොබෙයි හඬ ආදී සියල්ල සහිත සොබා දහමට කුසුම් ද අයත්ය. කුසුම් ගෙට වීම ඒ සොබා දහමේ අංගයකි. ඉදින් මෙහි ඇති විශේෂත්වය කුමක් ද ? චකිතයට පත් වීමේ හේතු කවරේද?

"......... සෝමෙට නම් මම දුන්නෙ සබනුයි පියරු පෙට්ටියකුයි විතරයි ඒත් අර ජේන් අක්ක නිසා. කුසුමෙට එහෙම බෑ. ඒකි මට දරුවෙක් වගේ."

කුසුමට වැඩිපුර වටිනා දෙයක් දීමට අම්මා තුළ වූ වුවමනාව තේරුම් ගැනීම අපහසු නොවීය. එහෙත් අක්කාට කලින් නංගීට තෑගි දෙන්නට වුණේ ඇයි දැයි කුතුලක් ප්‍රථම වරට මගේ සිතට නැඟී, මොහොතකට එහි රැඳී තිබී පහ වී ගියේය.

මා සෝමා ගැන සිතන්නේ වත් කුමටද ?

"කරාබු කුට්ටමක් දුන්නත් මගෙ හිතට මදි. ඒ වුණාට ඉතින් දැනට ඔහෙ මදෑ. තව තියෙන්නෙ උදව්පදව් කරන්න වෙලාවල් ඉස්සරහට......" මම අම්මාගේ මුහුණ අත හැර, වතුර පාර දෙසම බලා සිටියෙමි. සඳ මඬල ද අප්‍රමාණ තරු පෙළ ද සහිත පැහැදිලි අහස

For E-Pusthakalaya

පිලිඹිලු තර ගත් වතුර පාර අප වාඩිවී සිටි බෝක්කුව යට වූ අඳුරින් මිදී හිමින් හිමින් පහළට ගලා ගියේය. මම අවට බැලීමි. සොබා දහමේ කිසි විශේෂත්වයක් හෝ චකිතයට කාරණයක් හෝ නොවුණත් චමත්කාරයේත් සෞන්දර්යයේත් අමුත්තක් විය.

මේ කාලය වන විට මා සිටින තැනක දී තාත්තා උත්සාහ ගත්තේ වෙරි වී නැති බවක් පෙනෙන පරිදි හැසිරෙන්නට ය. එහෙත් වෙන දා මෙන්ම එද රැයෙත් ඔහුගේ මේ තැත නිෂ්ඵල එකක් විය.

"දැන් ඔහේ කුසුමෙට මොකවද දෙන්න හිතාගෙන ඉන්නෙ ?" යි ඇසූ අම්මාගෙන් විමසනු මට ඇඳට ඇසිණි.

"තමන් කැමති දෙයක් තමන් දෙන එකනෙ තියෙන්නෙ. මගෙ එකක් ඕනෑ යෑ ?"

"ඒක හරි! නම තමන්ගෙ කැමැත්ත........ මම නෑනෙ කවදාවත් අනුන්ගෙ කැමැත්තට හරස් වෙලා. ඔහේ දන්නව නෙ ඒක." යයි තාත්තා කීවේ ඇනුම් පදයක නැතහොත් කිසියම් දුක් ගැනවිල්ලක හඬිනි. එය මෙතැනට නො ගැළපෙන එකකැයි මට සිතිණි.

මම ඔය සබන් කැලි දෙකකුයි පියරු පෙට්ටියකුයි දෙනව" අම්ම ගණනකට නැතිව කීවාය.

මම හිත යටින් සිනාසුණෙමි.

"සබන් කැලි දෙකකුයි පියරු පෙට්ටියකුයි ?" එය ම කී තාත්තා හඬ නගා සිනාසී මොහොතක් නිහඬ ව සිටියේය.

"ඔහේ එහෙනම් හිතාගෙන ඉන්නෙ සබන් කැල්ලකුයි පියරු පෙට්ටියකුයි දීල නිකන් ඉන්න?"

"නිකා ඉන්න නෙවෙයි. තව ඉස්සරහට තියෙන්නෙ තෑගි දෙන්න ඕන තරම් වෙලාවල්. මඟුලකදී තුලාවකදී. මම සෝමෙට දුන්නෙත් එච්චරයි."

"ඒක හරි. සෝමෙට මොනව දුන්නත් කමක් නෑ. ඒකි කවදහරි ඔකේලගෙ තෑගි බෝග ගන්න ආයිත් බල බලා ඉන්න එකක් නෑ ! ජේක් අක්කගෙ දෙවනි දූ වගෙ නෙවෙයි කුසුමෙ. කුසුමෙට සබන් පියරු ඕනැ නෑ. ඒකි මෝස්තර කාරියෙක් වෙන්නෙ නෑ. "

"කෙල්ලො පියරු සබන් ගාන්නෙ මෝස්තරේට ද? දැන් අපිය කියල මේ වයසට වුණත් පියරු ටිකක් හෙම දාගන්නෙ පත්සලකට

Buddhika15



යනත් ? උන්ට ඔය වයසට ඕව නැතුව පුළුවනෑ"

"මම කියන්නෙ ගෑනු ළමයි පියරු සබන් ගෑවට එපා කියලැයි ? මම මේ කතා කරන්නෙ කුසුමෙ ගැන නෙ. මම කියන්නෙ - අද කිව්වය කියල ඔහේ මතක තියා ගන්න - ඒකිව තුරුණුවන්ගෙ පිහිටෙන් කවද හරි හරියනව. කවද හරි බලමු. ඒකි ගුණයහපත්කමට හැදෙන ගෑණු දරුවෙක්."

"මම නැතෙයි කිව්වයෑ ? කවදාවත් මම කුසුමෙගෙ වැරැද්දක් කියල තියනව ද අබමල් රේණුවක?" යි අම්මා කීවේ ද ප්‍රශ්නයට මොන විදිහකින් වත් උචිත හෝ අදාල හෝ නොවන තරමේ වේගයකිනි. ඇයගේ ස්වරයේ කෝපයක් මෙන්ම ශෝකයක් ගැබ් වී තිබිණි.

තාත්තා වහා පිළිතුරක් දුන්නේ නැත. ගත වූ නිහඬතාව තුළ ආවේගය අඩු කර ගත් නිසාදෝ වඩාත් සංවේගයට බර වූ හඬකින් අම්මා මෙසේ කීවාය.

"කුසුමෙ ගැන අහිතක් මම කවදාවත් කියල නෑ. කුසුමෙ සීලාචාර ගෑනු ළමයෙක් වෙන්නෙ නැතෙයි කියල මම කිසි දවසක කියල නෑ" යි කීය.

තව දුරටත් මේ ගැන කතා කිරීම නිෂ්ඵලය යන අදහස ගැබ් වුණු දුක්මුසු ගතියකින් කථා කළ තාත්තා "නැතෙයි කිව්වෙ නෑ නමුත් කවදාවත් ඔහේ ඒක පිළිගත්තෙ නෑ" යි කීය.

කෑම කා නින්දට යන තුරු ගත වන කාලය ඇතුළත අම්මා සහ තාත්තා අතර ඇති වුණු කතාබස් වල දී තර්ක - විතර්කයනට තුඩු දෙන කරුණක් මතු වීම චාරිත්‍රයක් තරමට සාමාන්‍ය දෙයක් විය. වාදයක ස්වරූපයක් ගත්තේ වී නමුත් ඔවුනතර බහින් - බස් වීමක් හෝ අමිහිරි අප්‍රසන්න දර්ශනයක් හෝ කිසි විටෙක ඇතිවී නැත. මාතෘකාව කුමක් වුවත් ඒ ගැන එකිනෙකාගේ මති - මතාන්තර හා අදහස් උදහස් මොනවා වුණත් වචනවලින් මොනවා පිට වුණත් ඒ යටින් ගලා ගියේ දෙදෙනා අතර එකිනෙකා කෙරෙහි පවත්නා දැඩි බැඳීමක් හා අන්‍යෝන්‍ය අවබෝධයකි. ඔවුන් එකිනෙකා වෙත පැවති සිය ආදරය, භක්තිය හා විශ්වාසය ප්‍රකාශ කර ගත් ආකාරය, අසා සිටි නොදන්නා කෙනෙකුට බහින්බස් වීමකැයි සිතෙන්නට ඉඩ ඇත.

එහෙත් කුසුම් මාතෘකා කොටගෙන මෙ දින ඇති වූ කතාව අන් කිසි දවසක නො වුණු මුහුණුවරක් නැතහොත් ගැඹුරක් ගත් එකක් විය. දෙමාපියන් අතර අසමගියක් පිළිබඳ දරුවකු තුළ ඇති වන

For E-Pusthakalaya



මේ සිය මගේ සිතට එතෙම පිවිත්ම අලුත්ය. ඇත්ත වශයෙන් ගැටුම් ඇති වූයේ ඔවුන්ගෙන් පිට වුණු වචනවල නොවේ. වචන විසින් පළ කරන ලද අර්ථය හෝ ස්වරූපය හෝ තුළය.

දෙදෙනාම තම තමන්ගේ සිත් තුළ කාලයක් තිස්සේ සඟවාගෙන තිබුණු, එහෙත් එකිනෙකා හොඳනැටි දනිතැයි අවබෝධය ඇතිව සිටි රහසක් බරක් වසං කරගෙන කතා කරන බවක් වසං කරගෙන කතා කරන බවක් මට සිතිණි.

මට තරමක් ප්‍රහේලිකාවක් වුණු තවත් කරුණක් විය.

කුසුම් සිය කතාවට මාතෘකා වුණු බොහෝ අවස්ථාවන්හි තාත්තා ඇයගේ ගුණ වර්ණනා කරනු මම මීට කලින් අසා ඇත්තෙමි. එහෙත් ඇය යම් දවසක මෝස්තරකාරියක නොවී යහපත් චාම් යුවතියක ලෙස හැඩ ගැසෙන බවට තමා තුළ තිබුණු විශ්වාසය වත් ඇයගේ අනාගතය හැඩ ගැසෙනු ඇත්තේ මේ අන්දමින් විය හැකි ය යි අනාවැකියක් වන අන් කිසිවක් වත් ඔහුගෙන් පිට වී නැත.

තමාගේ පියෙහි තව දුරටත් ඉතිරි වුණු සංවේගය හා පීඩනය අවසන් කර දමන්නට තවත් අවස්ථාවක් ලැබෙන එකක් නැතැයි අදහසින් මෙන් තාත්තා,

"කුසුමේ ගුණ යහපත්කමට නැදෙන ගෑනු ළමයෙක් බව මම කවදත් දනගෙන හිටියා." යනුවෙන් කිවා මිස, "මම ඒක තමයි එදා ඉඳලම කිව්වේ ඒකිව දරුකමට හදා ගනිමුය කියල." යන අදහස වචනයෙන් පිට කළේ ද නැත.

අම්මාගෙන් තවත් ඔමක් කියැවුණේ විනාඩි කිපයකට පසු ව, මේ සිසිවකට කිසි සම්බන්ධයක් නැති දෙයක ලෙසිනි.

හිතේ තියන හැම දෙයක් ම ඉෂ්ට කරගන්න බෑ. කොයි තරම් හිතුවත් ලබන්න බැරි දේ තැරුවමයි."

අවුලට නැතැණු දරුවකු නොවීමේ පාළුව හා පාඩුවත් තාත්තා සහ මා තුළ මෙන්ම අම්මා තුළද පැවැති බව මම ජීවිතයේ ප්‍රථම වරට එදා ය දැන ගතිමි.

අම්මා කුසුම්ට දරුවකු මෙන් ආදරය නො කළාම නොවේ. අම්මා ඇයට කරුණාවක් දක්වූයේ වැඩක්පලක් කරවා ගැනීමේ උපාය මාර්ගයක් වශයෙන් ආත්මලාභය පිළිබඳ සිතින් ද නොවේ. එහෙත් තමාගේ මසින් ලෙයින් ජනිත නොවූ එකියක දියණියක වශයෙන්



බාර ගන්නට බැරිකමක් ඇයට තිබෙන්නට පුළුවන.බැරිකම, හේතුව කුමක් වුවත් එය ඇයගේ හදවතට ම සීමා වුණු අදහසක් විය. ගැහැනු දරුවකු නැති වේදනාව අම්මා පිට කර ගත්තේ, "මට කෙල්ලන් ඕන නැ"යි පිට අයට ඇසෙන්නට කීමෙනි.

මවගේ අන්තිම වචනවලින් තාත්තා ද මෙල්ල වූ බවක් ඔහු ඊළඟට කී දෙයින් සිතා ගත හැකි විය.

"ඒවයින් වැඩක් නෑ දැන් ඒකිට මොනව හරි හොඳ දෙයක් දෙන්න ඕනෑ."

"කරාබු පොඩි දෙකක් වත් දෙමු.නේද" යි එකඟත්වයට පැමිණීමේ හඬකින් හා ලතාවකින් අම්මා කීවාය.

"ඒක හොඳයි" යනුවෙන් අනුමත කළ තාත්තා, ".........ඒකි කණේ දෙහි කටු ගහගෙන ඉන්නව දැකල අම්මිප කීප දවසක් ම මගෙ පපුව ඇල ගියා" යි යළි සංවේගයට බර වෙමින් කීය.

තාත්තාගේ පපුව ඇගෙන යන්නට ඇත්තේ කන් සිදුරුවල දෙහි කටු ගසාගෙන සිටි කුසුම්ගේ අසරණකම නිසා පමණක් නොවේ. ඇයට කර්ණාභරණයක් හැඟි කරන්නට ඒ වෙලාවේ අතමිට නොතිබුණු නිසාද වන්නට ඇත.

බාහිර ලෝකය වසා ගත් සඳැසට සාධකයක් වශයෙන් එහි තුනී සෙවණැල්ලක් හැරුණු විට නිවස ඇතුළත පැවතියේ අඳුරකි. වෙලේ දී ඇසටත් සිතටත් දැනුණු සුන්දරත්වය විසින් අවුල් කරන ලද මගේ සිත නන්නත්තාරේ යැමෙන් වළකා කුසුම් පිළිබඳ ව කුඩා දවස සිට මා තුළ පැවැති හැඟීම් වෙත යළි ඇවිළෙනු තරවනු ලැබුවේ අම්මාත් තාත්තාත් අතර කතාබහ විසින් මා කෙරෙහි ඇති කරන ලද බලපෑම විසිනි.

# 3

අ මිමා අප බඩගින්නේ තැබුවේ නැත. එසේ ම පොත්පත් හා ඇඳුම් පැළඳුම් ආදී අනෙකුත් අවශ්‍යතාවන් අතින් අපේ ආර්ථික තත්ත්වයේ අන් බොහෝ ළමයිනට තිබුණු අඩුපාඩුකම් අපට නොවිණි. අපට මේ සියල්ල සලසා දී අනාගතය වෙනුවෙන් කීයක් හෝ ඉතිරි

Buddhika 13

For E-Pusthakalaya



සර තබන්නටත් අම්මා දවසකට පැය දහ අටක් වෙහෙසෙන බව, ගෙන්නට් ගය හතර දහ ගත් දා සිටම මම අවබෝධ කර ගතිමි.

ඉගෙනීම සම්බන්ධ ව මුලින්ම මා තුළ වූයේ දක්ෂකමක් පමණකි. මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළු වී අලුත් පරිසරයකට පත් වීමත් සමඟ ලද අලුත් පහසුකම් හා චිරප්‍රසාද නිසා ඒ දක්ෂකමට ආශාවක් ද එකතු විය. ඒ වනාහි ඉහළට ඉගෙන ගැනීම කෙරෙහි හුරු පුරුදු ශිෂ්‍යයකු තුළ පහළ වන නිරායාස අභිංසක ආශාවක් පමණි.

ගමේ පාසලේ ඉගෙන ගත් මා කළේ අනාගතය ගැන පැහැදිලි බලාපොරොත්තු හා සැලැස්මක් සකස් කර ගැනීමට තරම් වයසක නොවේ. අප මුහුණ දුන් අගහිඟකම් හා නැතිබැරිකම් ආදියෙන් තොර මීට වඩා සැපවත් ජීවිතයක් ගත කිරීමේ නො පැහැදිලි වුවමනාවක් යටි හිතේ තිබෙන්නට ඇතත් ශිෂ්‍යත්වය දිනා ගැනීමේ දී උසස් වීමේ ආශාවෙන් පොහොර ලැබීම වෙනුවට ඇත්ත වශයෙන් සිදු වූයේ ඉහළට ඉගනීමේ අවස්ථාව ලැබීමේ ගැන සතුටට පත්වීමයි. ඉහළට යෑමේ ඒ සීමාව කුමක් ද යි අප ඉදිරියේ නිරවුල් ලෙස සටහන් වී තිබුණේ නැත. එසේ ම අපගේ සතුටට හවුල් වනු විනා අනාගතය ගැන නියත මඟ පෙන්වීමක් හෝ අවවාදයක් හෝ දීමට අපගේ දෙමව්පියෝ ද අසමත් වූහ. ඔවුන් අප ගැන බලාපොරොත්තු වන්නට ඇත්තේ අප විසින් යා යුතු ඒ උසස් තත්වයට ළඟා වීම පමණකි. ලොකු තැන් වශයෙන් දෙමාපියන්ගේ සිත් සතන්හි මූර්තිමත් වූණා නම්, තමන් දන්නා සිටි පාසල් ගුරුවරයකු, රජයේ ලිපිකරුවකු හෝ උසස් ය යි ඔවුන් විසින් සිතන ලද එවැනි අන් කෙනෙකු වන්නට ඇත.

වැඩිහිටියකුගේ මඟ පෙන්වීමක් නො ලැබුණත්, උපයන හැම සතය ම බීමට නාස්ති කරන බස් රියැදුරෙකුගේත් හම්බ කරන්නට මෙහෙම කියක් හෝ ඉතිරි කරන්නටත් දවසට පැය දහ අටක් වෙහෙසෙන කඩකාරියකගේත් දරුවන් හය දෙනෙකු අතරින් වැඩිමලා වීමේ වගකීම මම ඉක්මනින් අවබෝධ කර ගතිමි. මෙහි දී ද මා කෙරෙහි මූලික වශයෙන් බලපෑවේ අම්මා වෙත මා තුළ පැවැති බැඳීමයි. හැකි ඉක්මනින් හැකි තරමින් අම්මාගේ බර සැහැල්ලු කිරීම මගේ වුවමනාව විය. ඉගෙනීමට ඇති දක්ෂකම හා ආශාව එකතු කර ගත් මම ඉක්මනින් ම අධිෂ්ඨානයක් ද තීරණයක්ද ගොඩ නංවා ගතිමි.

අප සිව දෙනෙකුවත් අඩු තරමින් ජ්‍යෙෂ්ඨ විභාගය සමත් වී රක්ෂාවකට ගියොත් අම්මාට මේ තරම් දුක් විඳින්නට සිදු නොවන බව මට පෙනී ගියේය.



අම්මාගේ යහපත මුල් කරගෙන අනාගතය දෙස බැලීමේ දී රෝහණ මා වේදනාවට පත් කළේය. රෝහණ හැසුරුණේ වගකීමක් තේරුම් ගත් එකකු මෙන් නොවේ. බාල වියේ දී ම රෝහණ හා මා අතර නො ගැළපෙන තැන් එමට තිබිණි. පවුලට නැහැනු දරුවකු නොමැති වීම ගැන ඔහු සතුටට පත් වුණා තරම්. පවුලම ගැහැණු දරුවකු නො මැති වීම ගැන ඔහු සතුටට පත් වුණා තරම්. මා ඔහු අප අප්‍රිය කළ ප්‍රධාන හේතුව එයයි.

කුඩා දවස් වල කුසුම් අපේ ගෙදර පැමිණි අවස්ථාවල රෝහණ ඇයට වධ හිංසා කමළත් දරුකමට හද ගනු පිණිස නාන්නා ඇය නතර කර ගනිති යැයි බියකින් හා ඊර්ෂ්‍යාවකින් විය යුතුය.

බාල කාලයේ පටන්ගෙන අවුරුදු ගණනක් යන තුරු රෝහණ හා මා අතර හදවතින් හදවතට බැඳීමක් නො පැවතියේ එද එසේ කුසුම්ට හිරිහැර කළ නිසා පමණක් ම නොවේ. රෝහණ කළ කොයෙකුත් ක්‍රියාවන් අනුමත නො කළ මා තුළ පැවතියේ කොහොමටත් ඔහු නරක ළමයෙක් ය යන හැඟීම ය. ඔහු අවස්ථාවක් ලැබුණු විගස කඩයේ ලාච්චුවෙන් ද නාත්තාගේ පොකැට්ටුවෙන්ද මුදල් සොරකම් කළේය. ඔහු මේ මුදල් නාස්ති කළේය. ඔහුට මිත්‍රයෝ බොහෝ වූහ. පාසල් ගිය සම වයස් ළමයින් පමණක් නොව ගමේ රස්තියාදු වෙමින් සිටි තමාට වඩා අවුරුදු දෙක තුන වැඩිමල් ගැටවරයන් පවා ඔහු ආශ්‍රය කළේය. ඒ හැම දෙනා ම වාගේ බීඩි සිගරැට් බීවේ ඔහුගේ මුදලින් විය යුතුය යි මම සිතා සිටියෙමි.

අම්මා මේ තරම් වෙහෙස වී උපයන මුදල් නාස්ති කිරීම පාපයකැ යි මම දුක් වීමි.

ඔහු ඉගෙනුම ගැන කිසි ම උනන්දුවක් නො දැක්විය. මා අධ්‍යාපනය ගැන මහන්සි වන නිසා, පාඩම් කිරීම අතපසු කරන තමා වැඩිහිටියන්ගේ දෝෂාරෝපනයට ලක්වෙතැයි නො මනාපයෙක් ඔහු තුළ මා කෙරෙහි නො තිබුණු බව නම් මම දනිමි.

ඇත්ත කියතොත් වයස දහය දෙළහේදී ඔහු හැසුරුණේත් මා පවුලේ වැඩිමලා වශයෙන් ගණන් නොගෙනය. මා කෙරෙහි අනෙක් මල්ලිලා දක්වුණු කීකරුකම, යටහත් පහත්කම හා ගෞරවය ඔහුගෙන් ළමා කාලයේ කිසි විටෙක පළ වූණේ නැත.

මා මධ්‍ය මහා විද්‍යාලයට ශිෂ්‍යත්වය දිනාගත් අලුත ම රෝහණ හා විජය ද නගරයේ වෙනත් විද්‍යාලයකට ඇතුළු කරනු ලැබූහ. ඉන්

For E Pusthakalaya

පසු ව ඔහුට තව තවත් නිදැල්ලේ හැසිරෙන ඉඩ කඩ ලැබිණ. ඔහු ගෙදර ආවේ ඇඳිරි වැටෙන්නටත් ආසන්නයේය. ඔහු නිවාඩු දවස ද මුළුමනින්ම ගත කළේ නිවසින් බැහැරවය. ඔහු ගමේ හැම ගෙදරකම පාගේ ගියේය. වැඩිහිටියන් අතර පවා ඔහු ජනප්‍රිය විය. මේ ගැන මා ඊර්ෂ්‍යා කළා නොවේ. ඔහු කල්තියා ම ළමා ලෝකයේ සීමාවන් බිඳගෙන තාත්තාගේ යන කෙනෙකු ලෙස තරක් වෙතැයි බියක්, ජීවිතය ගැන එතරම් අවබෝධයක් නො වුණු මේ කාලයේ පවා මා තුළ පහළ වූ අවස්ථා විය.

කලින් අවුරුද්දකට වරක් සංචාරක සිනමා ශාලාවක් නගරයට එන පුරුද්දක් පැවතිණි. පසුව ස්ථිර ගොඩනැගිල්ලක නිත්‍ය සිනමා ප්‍රදර්ශන ආරම්භ විය. රෝහණ මුලින් චිත්‍රපට බලන්නට යන්නට පුරුදු වන්නට ඇත්තේ සති අන්තයේ පැවැති මැටිනි දර්ශන වලින් විය යුතුය.

අම්මා හෝ තාත්තා හෝ ඔහුගේ මේ හැසිරීම් හා ගමන්බිමන් සම්බන්ධව සෙවුම්බැලුම් නො කිරීම ගැන මම සමහර විට කලකිරීමටත් කණගාටුවටත් පත් වීමි. මම ද ඔහුට අවවාද කරන්නට ගොහියෙමි.අවවාද කරන්නට යෑම බහින්බස් වීමක මුල පිරීමකි. සමහර විට අපි අතින් පයින් පවා ගහ ගතිමු. ඒ වයස ඉක්මවා ගියාට පසුව වත්, මම ඔහු කළ සියල්ල සිත් රිදීමකින් යුක්ත ව වුව ද ඉවසන්නට පුරුදු වීමි.

මා වඩාත් කණගාටු වුණේ බාල සහෝදරයන් රෝහණ ආදර්ශයට ගෙන නොමඟට යතැ යි හැඟීමක් වරෙක මා තුළ පැවති බැවිනි. වාසනාවකට මෙන් අපගේ පවුලේ සහෝදරයන් බෙදී ගිය ආකාරය අනුව එවැන්නකට ඉඩකඩ නොවුණු බව දැන් මට සිතා ගත හැකිය.

මුලින් ම අන්දමට රෝහණ දවස තිස්සේ වැඩි කොටසක් නිවසින් බැහැර ව සිටි අතර විජය ගෙදරටත් හොඳ කමිසයක් ඇඳ ගෙන, ජේන්තුව හිස පීරා, හැඩ වී කඩයට වී බලා සිටියේය. ඔහු කොණ්ඩය අවුල් වෙතැයි බියෙන් දුව පැන සෙල්ලමට ගියේ වත් නැති තරම්. සැහැල්ලු සිතින් පසු වූ සමහර විටෙක මම විජය අල්ලා හිස කෙස් අවුල් කළෙමි. ගාමිණී, සෙනරත් හා තිස්ස එක කණ්ඩායමක් බවට පත් වූහ.

හැට්ටවර වියේ දී රෝහණ තව තවත් මගෙන් ඈත් විණැ යි මම සිතමි. ඔහුගේ ඇඳුම් පවා මගේ නො සතුටට කරුණක් විය. රෝහණ ඇන්දේ තද පාට කමිසය. ඔහුට විසිතුරු පටි ද පදක්කම් වැනි බොත්තම්



ද, වෙව්වරණ ලේන්සු හා මේස් ද විය. රුචිකත්වය අතින් වූ පරතරයට අමතර ව ඔහුගේ විලාසිතා මා කෝපයට පත් කළේ. ඒවා සියල්ලට තුවුම්නා ලෙස නාස්ති වන්නේ අම්මාගේ මුදල් - මහන්සියෙන් හම්බ කරන මුදල් - බව සිතුණ බැවිනි. ඔහු නාසය කාගෙන යන සුවඳති විලවුන් භාවිච්චි කළේය.

මගෙන් අනුමැතියක් ලද නො හැකි තවත් බොහෝ ලක්ෂණයන් හා කරුණු ඔහු වෙත පිහිටා තිබිණි. ඔහුට මිතුරන්ගෙන් පමණක් නොව මිතුරියන්ගෙන් ද අඩුවක් තිබුණේ නැත.

මම ද වැඩිපුර ගැහැණු ළමයින් ආශ්‍රය කළෙමි. එහෙත් රෝහණ ඔවුන් දෙස බැලුවේ මා මෙන් නොව හාත්පසින් වෙනස් ආකාරයකින් බව මගේ සිත එකහෙලා මට කීය.

උදය පාසල් ගිය ඔහු ගෙදර ආවේ ඇඳිරි වැටෙන්නටත් කිට්ටුව ය යි මා කලින් කියා ඇත. සවස පංතියකට හෝ ක්‍රීඩාවලට හෝ නතර වී මම ද සමහර විට ප්‍රමාද වීමි. එවැනි දවසක හතරට හෝ පහට නගරයට එන කල රෝහණ, බස් පෝලිමක කෙළවර හෝ බස් රියක පිටුපස හෝ සිට දැරියක හා කතා කරමින් සිටිනු නොයෙක් විට දුන ඇත්තෙමි. හැමදා මත්, නැතහොත් වැඩිපුර, ඔහු සමඟ සිටියේ එක ම ගැණු ළමයෙකු නම් මට ඒ ගැන වැඩිපුර සිතන්නට වුවමනාවක් නො තිබෙන්නට පුළුවන.

ඔහු භාවිත කළ කමිස, මේස්, ලේන්සු හා පටි මෙන්ම ඔහු ඇසුරු කළ යුවතියෝද විවිධය. දෙක තුන වන විට නගරයේ නිත්‍ය පාසල්වල වැඩි දෙනෙක් විසිර ගොස් හමාර වී සිටියහ. ඉන් පසු ගැවසුණේ, ටයිප් ගැසීම පුරුදුවීමට හෝ අමතර පංතිවලට හෝ ඇකඩැමිවලට හෝ ගිය දැරියෝය.

ඇල්බර්ටෝ මොරාවියා නම් ඉතාලි ගත්කරුගේ "රෝම පුරඟන" නම් නවකතාවේ ජිනෝ බොරු ආදරය පා වසඟ කර ගනු පිණිස අද්‍රියානා දෙස බලන්නට ඇත්තේත් රෝහණ ඒ දැරියන් දෙස බලාගෙන සිටින ඇස්වලින්ම ය යි මට සිතිණි. ඔවුන් ද ඔහු දෙස බලාගෙන කතා කරමින් සිටින කල දෙ නෙත් හි ගැබ් වූ ස්වභාවය මම, කොතෙක් ගැහැනු ළමයින් ඇසුරු කර ඇතත් ඒ එකියක වෙතින් වත් දැක නොමැත්තෙමි.

අපගේ පාසලේ කීප දෙනෙකු සමඟ ද ඔහු වරින් වර කතා කරමින් සිටිනු මට අසුවී ඇත. ඉන් සමහරෙක්, "නිමලයියගෙ මල්ලි

Buddhika 25

ත් ද රෝහණ හකුරුසිංහ " යයි අසාගෙන මා සමග අමුතු හැඳුනුම්කමක් ඇතිව කතාවට එන්නට උත්සාහ කළහ." මා දන්නා රෝහණයෙක් නැහැ" යි ඔවුන් එළවා ගන්නට මට සිතිණි. ඒ හැම දෙනාට ම අපේ පාසලේත් යාළුවෝ සිටියහ.

නිවාඩු කාලයන්හි දිනපතා ම වාගේ ඔහුට තැපෑලෙන් ලියුම් ආවේය. තැපැල්කාරයා එන කල වැඩි වශයෙන් ගෙදර සිටියේ මා පමණකි. වටකුරු ලස්සන අකුරින් ලිපිනය ලියන ලද ඒවා කෙල්ලන්ගෙන් බව සිතා ගැනීම දුෂ්කර නොවීය. සාමාන්‍ය එකකට වඩා වැඩියෙන් බරට දැනුණු මේ ලියුම් මා බාර ගත්තේ පිළිකුලක් ඇතිවය. එහෙත් ඒවා ඇතුළත කුමක් විණි දැයි බලන කුහුලක් ද මා තුළ පහළ නොවුණා ම ය යි මම නොකියමි. මට වඩාත් වුවමනා කරන්නට ඇත්තේ කෙල්ලන්ගේ ලියුම් කියවා එමගින් වත් රෝහණගේ අභ්‍යන්තර ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ ආශාව මුදුන් පමුණුවා ගැනීම වන්නටත් ඇත. එක කුස ඉපිද, එක වහල යට, එකට ගත කළත් අපේ හදවත් අතර වූයේ විශාල පරතරයකි.අපි එකිනෙකා ගැන කුමක් නම් දැන සිටියෙමු ද?

කිසිවක් නැත.

කෙල්ලන්ගෙන් නෙතෙක් ලියුම් ආවත් රෝහණ ඒවාට පිළිතුරු ලියන බවක් නම් මම නො දන්නෙමි.

කුසුම් සමග සෝමාත් කලාතුරකින් දවසක අපේ නිවසට ආවා ය. දවල් දවස වැඩිපුර බැහැර ගත කරන රෝහණ සෝමා එන බොහෝ අවස්ථාවන ගෙදර යැදී සිටියේය. ඔවුනතර කලින් ඇති කරගත් කිසියම් සම්මුතියක් විණැ යි මා සිතා ගත්තේ මේ නිසා පමණක් ම නොවේ.

සෝමා හා සමගත් ඉතා කුළුපගව කතා බස් කළාය. එහෙත් ඇය හා රෝහණ අතර විශේෂත්වයක් විය. පත්තරයක් හෝ සඟරාවක් හෝ ඇතැතිව මල්ලිලා සමඟ සතුටු සාමීචියේ යෙදී සිටි සෝමා ඔවුනට මුහුණ මුවා කරගෙන රෝහණ සමග කතා කළේ ඇස්වලින් හා දිවෙන් කළ ඉඟියෙනි. අනෙක් අයට ලක් නොවන අවස්ථාවක් ලදොත් ඇගේ ගෑවෙන තරම් සමීප ව එකිනෙකා වෙත යොමා ගත් බැල්ම ඇති ව වචනයක් දෙකක් රහසින් කතා කරන ඔවුන් වහා යළි ඈත් වනු මට කීප වරක් අසු වී ඇත. ජීනෝ අලියානා දෙස බලන්නට ඇත්තේ රෝහණ සෝමා දෙස බැලූ ඇසින් ම විය යුතුය යි මතක් වී මම අභ්‍යන්තරයෙන් තැති ගතිමි. සෝමා ඔහුට පිළිතුරු දුන්නේ තිලිටි ගතියකින් මිලාන වූ ඇස්වලිනි.



ඔහු ඇයට ආලය කරතැ යි හිත හදාගන්නට මම උත්සාහ කළෙමි. ඔවුනතර ඇත්තේ අව්‍යාජ ප්‍රේමයක් නම් පෙම්වතකුගෙන් පෙම්වතියකට කිසිම අහිතක් නොවන බව මගේ දැඩි විශ්වාසය වූ බැවිනි. එහෙත් රෝහණ සෝමාට ආලය කරතැ යි සිතන්නට ඉඩක් ද නොවිණි. බස් පොළේදී ඔහු අත් ඔතාම දුරියක දෙස බැලුවේ ද රහසින් කතා කළේ ද මේ අයුරින් මය.

රෝහණ නො සිටියොත් සෝමා වැඩිපුර ළං වූයේ විජයටය. ඔහුගේ කුළුටි ගතියක්ද දක්නට තිබුණත් ඇයට නම් මේ රෝහණය. මේ විජය යයි වෙනසක් නොවිණි.

සෝමා මා මඟ හරින්නට උත්සාහ කළාද මම ඇය මඟ හරින්නට උත්සාහ කළෙම්ද යි මම නො දනිමි. කුසුම් මෙන්ම ඇයත් ලොකයියේ කියාගෙන ගෙට ගොඩ වුණාය. එහෙත් එල්ලිගෙන ඉන් එහා මා හා කතාවට ආවේ නැත.එක අතකට මම ඒ ගැන සතුටු වීමි. පාසලේ දී ගැහැනු ළමයින් සිය ගණනක් සමග වචන ලක්ෂ ගනණක් කතාකර එයින් සමහරක් දෙනා ඉතා සමීපව ඇසුරු කර ඇතත් මම සෝමා ඉදිරියේ දුර්මුඛ වුණෙමි. ඇය හැම දෙනෙකු වෙතම එල්ල කරන්නේ එකම බැල්මක් වන්නට ඇත. එහෙත් ඉල්ලීමක් හා යෝජනාවක් ද තේරුම් ගැනීමට බැරි අර්ථයක්ද පළ කළ ඒ ඇස් මා තුළ තැතිගැන්මක් ඇති කළේ එහි මා බිය පත් කළ මට බාර ගත නොහැකි අභියෝගයක් හා තර්ජනයක් ඇතැ යි මගේ හදවතට දැනුණු බැවිනි.

ආපසු පිටත් ව යන්නට කලින් කිසියම් උපායකින් මා සමඟ තනි ව වචනයක් හෝ කතා කිරීමේ අවස්ථාව ලබා ගැනීමට කිසි දිනෙක අසමත් නොවුණු සෝමා මා බියපත් කරවන අර අර්ථවත් දෙනෙතින් බලාගෙන "උපාසක මහත්තය අපි ගිහිල්ල එන්නම්" ය යි කීවාය.

කෝපය සඟවා ගන්නට ගත් උත්සහයේ දී ඇයට දිය යුතු පිළිතුරක් ගැන කල්පනා කරන්නට මට අමතක විය.

# 4

පංතියෙන් පංතියට උසස් වෙමින් ඉගෙනගෙන යන කල එක්තරා වයසකදී අපගේ සිතට නිරායාසයෙන්ම නැගෙන ආශාව විශ්ව

Pusthakalaya
Buddhika 15

E-Pusthakalaya

විද්‍යාලයට ඇතුළු වීමයි. අද්භූත ජනක හා ගුප්ත - එහෙත් චමත්කාරයෙන් බලාපොරොත්තුවන් හා ආස්වාදයන් ගෙන දුන් නාම රූපයක් ඇතිව විශ්ව විද්‍යාලය යන මේ සංස්ථාව කෙරෙහි මුලින්ම අප බලන්නට ගත්තේ එතැන සිට පැමිණි ගුරුවරුන් කෙරෙහි අප වෙත පහළ වූ ආකල්ප පිළිබඳ කවුළුව තුළිනි.

පේරාදෙණියේ සිට ආ උපාධිධාරී තරුණ ගුරුවරු ගුරුවරියෝ වහා අපේ සිත් ගත්හ. ඔවුන් කතා බස් කළේ ප්‍රියමනාප අන්දමිනි. ඔවුන් ඉදිරියේ නිදහස පිළිබඳ සැහැල්ලුවක් අපට දැනිණ. පොත වෙත ම දැඩි ලෙස එල්බ නොයන ඔවුහු බාහිර කරුණු කියා දුන්නා පමණක් නොව අවට ලෝකය දෙස විචාරාත්මක ලෙස බලන්නට අපට අනුබලයක් දුන්හ. දැඩි නීති රීතින් ගතානුගතිකත්වය හා සම්ප්‍රදායයන් ගරු නො කළ ඔව්හු අප අතර ගුරු ගෝල පරතරය බොහෝ දුරට තුනී කළහ. පාඩමක් අතර දී ඔවුහු විහිළු තහළු කළහ.

මේ තරුණ තරුණියන් පංතියේදීත් පිටතදීත් අප හා හැසුරුණේ යහළු යෙහෙළියන් ලෙසිනි. ඔවුහු ඉහළ පංතිවල අප සමඟ සවස් වරුවේ එකට සෙල්ලම් කළහ. අනතුරුව අපි එකට තේ බීවෙමු. ඇතැම් විට පාසලෙන් පිට දී පිරිමි ළමයිනට සිගරට් එකක් අරගෙන දුන් කෙනෙක් ද වූහ. ඔවුන් අපේ පෞද්ගලික ජීවිත ගැන ඇඟිලි ගසන්නට ආවේ නැත. පෙම් සබඳකම්වලට බාධා නොකළහ. අපගේ වැරදි ගැන විදුහල්පතිට කේලාම් කියන්නට ගියේ නැත.

අපි කලින් කලට මෙයින් එකිනෙකා සිතින් මවාගෙන ඒ විදිහට සිතන්නට, කතා කරන්නට, හිස පීරන්නට හා හිනාවෙන්නට පවා උත්සාහ ගතිමු.

අපගේ සිත් ගත් මේ ලක්ෂණයන් හා ගුණාංගයන් තුන් අවුරුදු විශ්ව විද්‍යාල ජීවිතයේ ප්‍රතිඵලය වශයෙන් අපි සිතමු. ඒ අසිරිමත් ආයතනය ගැන බලාපොරොත්තු හා අධිෂ්ඨානයන් අප තුළ වගා කරන්නට ඔවුන් සමත් වූයේ එබැවිනි.

අංග සම්පූර්ණත්වයට - පරිසමාප්තියට පත් වූ බවට චරිත සහතිකයන් විනා මුදල් ඉපයීමේ - ඉහළට ඉහළට නැගීමේ - බලපත්‍රයක් ලෙස උපාධිය අපගේ සිත්වලට ඇතුළු වූයේ නැත.

මේ ආශාව මෙසේ ම මගේ සිතේ එක පැත්තක පැවති නමුත් අනෙක් අතට මට වුවමනා කළේ - මා වැඩිපුර බර දැමුවේ - ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වී රැකියාවක් ලබා ගැනීමටය. අම්මාට සහනයක් ලබා දිය හැක්කේ එමගින් පමණකි. ජ්‍යෙෂ්ඨ ප්‍රතිඵල නිකුත් වන තුරු



මා විශ්ව විද්‍යාල පූර්වාංග පංතියට ඇතුළු වූයේ ගුරුවරුන් ඒ සඳහා මා තෝරා ගත් නිසා මිස මගේ අදහස වෙනස් වූ නිසා නොවේ.

අන්තිමට දෙවු පෙළ සමත් වූ පසුත් මම ඒ ජයග්‍රහණයේ සතුට විඳිමින් ඊළඟ පියවරක් ගැන සිතෙහි මතුවන්නට ඉඩ නොදී දින ගණනක් ගත කළෙමි.

අනාගතය සම්බන්ධ ව මුහුණ ලා සිටින දෙගිඩියාව ගැන මම දවසක් අම්මාට ඇසෙන්නට කීවෙමි. මා මගේ අදහස් ඇය ඉදිරියේ තැබුවේ මා ගත යුතු පියවර පිළිබඳ ව උපදෙසක් හෝ මග පෙන්වීමක් හෝ දීමට ශක්තියක් ඇය වෙත ඇතැයි දැඩි විශ්වාසයකින් ම නොව යුතුකමක් වශයෙනි.

රෝහණ ද මෙහි සිටියේය.

"ඉස්කෝලෙන් විතරක් නෙවි අම්මෙ අපේ පළාතකින් නෑ බී. ඒ. පාස් කළ කෙනෙක්......... තමුසෙට තියෙන්නෙ පිස්සු නැතුව තව ඉගෙන ගන්න." රෝහණ කීවේය.

"ඇයි මට කියන්නෙ තමුසෙට නරකද ඉගෙන ගත්තම ?" මම නරහෙන් කීමි.

"කෝ ඉතින් මම නාම විභාගෙ ගත්තෙත් නැතෙ. මම කිව්වෙ.......
"

"ගන්න නම් බැරියැ රස්තියාදු ගහ ගහ"

"මම ඉතින් රස්තියාදුකාරයනෙ. මා ගැන බලන්න ඕනෑ නෑ. තමුසෙ ඉගෙන ගන්න දක්ෂයි. අපිටත් නම්බුවක් එන්න ඉගෙන ගන්නව. ඒකනෙ මම කියන්නෙ."

රෝහණ කතා කළේ එකටෙක කියන හඬකින් නොවේ. හිතවත්කමකිනි. එහෙත් මගේ කෝපය අඩු නොවීය. කලක් තිස්සේ ඔහුට කිව යුතුව තිබී යටපත් කරගෙන සිටි අදහස් වැලක් මගෙන් පිට විය.

" දක්ෂ කමම විතරක් මදි දෙවනි ඉගෙන ගන්න. තව දේවල් ඕනෑ. මෙතන අවුරුදු දෙකක් ඉගෙන ගෙන එක පාරින් ම පාස් වුණත් ........"

"තමුසෙට ඕක දෙපාරක් කරන්න දෙයක් නෑ. එක සැරෙන් පාස් වෙනව. ඒකනෙ මම කියන්නෙ.

Bodhika 55

For E-Pusthakalaya

මගේ දක්ෂම ගැන ම නොව තීරණයක් ගැනීමේ දී තමා තුළ ආත්ම විශ්වාසය හා ආත්ම ශක්තිය ඇතිව මෙන් මලානිකව වෙතින් පිට වුණු ඒ වචන මවගේ මුහුණට එළියක් නැංවිය.

"ඒ වුණත් දෙවෙනි අවුරුදු තුනක් වාසිට්යෙ ඉන්න ඕනෑ. වාසිට් යනව කියවම සෙල්ලමක් නෙවි. දෙවෙනිල මේ වගෙ නාස්ති කරන කොට පුළුවන් වෙයි සේරම කරන්න. තව ඉගෙන ගන්නත් හතර දෙනෙක් ඉන්නව. පවුල්වල වැඩිමල්ලු වුණා ම වගකීමක් කියල එකකුත් තියෙනව."

මා කතාව පටන් ගත්තේ වේදනාවක් පිලිබඳ හැඟීමකින් තොරවය. එහෙත් වචනයෙන් වචනයෙන් මා තුළ ආත්මානුකම්පාව වැඩෙන්නට විය. එය මා වෙනුවෙන් ද මුළු පවුල වෙනුවෙන් ද උපන් එකකි.

රෝහණ තමා ගැන මා කී සියල්ල සතුටින් බාර ගත්තකු පිළිගත්තකු මෙන් කරබාගෙන සිටියේය. ඔහුගේ මුහුණ පුරා පැතිර ගිය ශෝකය හා පසුතැවිල්ල එහි වූ යොවුන් බවේ පුෂ්ටිමත් ගතිය නිසා විශේෂ අමුත්තක් ලෙස පෙනිණි.

"මොකද තාත්තා වියදම් කරාය කියල බලාගෙන ඉන්නයැ ?"

මා අන්තිමට කී දෙය නො ඇසුණු නැතහොත් නො තැකූ එකකු මෙන් රෝහණ.

"තමන්ගෙ හැකියාවක් ගැන ස්ථිර විශ්වාසයක් තියෙද්දී අවස්ථාවක් මතු වුණා ම ඊට මූණ දෙන එකත් එක විදිහට වග කීමක් අම්මේ." යි කීය.

රෝහණ මේ දර්ශනිකභාවය ලබා ගත්තේ කෙසේදැයි මම පුදුම වීමි. ඔහු අඩු තරමේ එවැනි අදහසක් ගැබ් වුණු පොතක්වත් කියවන කෙනෙකු නොවෙතැයි මම සිතාගෙන සිටියෙමි.

"මේ තරම් දුරට කලේ තාත්ත නෙවෙයි. උඹට තාත්තගෙ වගක්වත් තව හතර දෙනෙක් හිටිය කියල ඒ වගක්වත් ඕනෑ නැනෙ. උඹට තියෙන්නෙ පුළුවන් තරම් ඉගෙන ගන්න එකනෙ." යි අම්මා කීවේ දෙ පැත්තේ කරුණු සසඳා තීන්දුව දෙන විනිශ්චයකාරියගේ තීරණාත්මක හඬකිනි. මා ගත යුතු පියවර ගැන වැඩිදුරටත් සාකච්ඡාවට ඉඩ නොතබා අම්මා ඊළඟට කතා කළේ අප දෙදෙනාටමය.

"දෙවෙනි උඹටත් එක්කලයි මම මේ කියන්නෙ. මම කවදාහරි මේ ගමට ආව නම් වද ඉදල කවුරු හරි කරපු හොඳයි තරකයි දෙකම

Boddhika 15



මට මතකයි. අබමල් රේණුවක් නැතුව මම ඕව සේරම මතක තියා ගෙනයි ඉන්නෙ.......... උඹලගෙ තාත්තට, මම කියන්නෙ කාල බීල නාස්ති කරනවට නෙවි. තාත්තට මතක නෑ ඕව මොකුත්. කටේ පොඩ්ඩක් ගා ගත්තම බඩ බැඳ ගන්න වගෙ. ඔච්චර අත හෝදන්න කී දෙනෙක් ඉන්නවද කියල උඹල දන්නෙත් නෑ......"

එතැන් සිට අම්මාගෙන් කියැවුණු බොහෝ දේවල් රෝහණට අලුත් ම ආරංචි වන්නට ඉඩ තිබුණත් මම නම් මේවා අසා තිබුණෙමි. රෑට තාත්තා එන තුරු මඟ බලාගෙන සිටි සමහර අවස්ථාවක අම්මා මට මේවා කියා ඇත.

නොයෙක් දෙනා විසින් තමාට කරන ලද මදි පුංචිකම්, වෛතස් කම්, අපහාස උපහාස ආදී සියල්ල සිතෙහි සඟවාගෙන සිටි අම්මා සතුටට මෙන් ම දුකටද හේතු වූ අවස්ථාවක දී ඒවා එකින් එක එළියට ගෙනමතක අලුත් කර ගත්තා ය.

උගසට ගත් ඉඩම් කෑල්ලක් සින්නවි තමාගේ වත්කම වැඩි වීමේ ප්‍රීතිය අම්මා පළ කළේ නැති බැරි කාලයේ අර විදිහට ගමේ යමක්කමක් තිබුණු කෙනෙකුගෙන් ණයක් ඉල්ලා ගන්නට ගොස් එළවා ගැනීමේ සිද්ධියක් මතක් කරමිනි.

එසේම තමා අතට පත් වන්නට ඔන්න මෙන්න කියා තිබුණු ඉඩම් අක්කර කාලක් හෝ බාගයක් හෝ අන් කෙනෙකු හොර රහසේ වැඩි මුදලකට ගත් බව ආරංචි වී ඇති වූ සිත් තැවුල ඇය පිට කර ගත්තේද ඒ අන්දමිනි.

"කෙනෙක් හැදෙනවට කී දෙනෙක් බලා ඉන්නව ද ඉරිසියාවෙ ? මම මුලින් ම මේ කඩේ දන්න බඩු ටිකක් ගෙනාවෙ ගෙදරින් එද්දී තිබුණු මාලයක් උගස් තියල. ඒක බේරගන්න ගියාම ඔය රතුගොයියගෙ ගැණි දූනනෙ නෑ, ඔය අදත් ගමනක් බිමනක් යන කොට දාගන යන්නෙ ඒ මාලෙ. මගෙ මාලෙ. කෙල්ලෙක් නොහිටියට පිටින් එන එකියකට හරි මමත් රත්තරන් පොරෝනව...... මට මතකයි ඕව." යි ඇය කියාගෙන ගියාය.

මේ අන්දමින් ජය - පරාජය දෙකේදී අම්මා අතීතයේ මුහුණ දුන් දුක් කම්කටොළු මතක් කර ගත්තේ කෙසේ හෝ උත්සාහයෙන් දියුණුවක් ලබාගෙන ඉහළ යෑමේ සිය අධිෂ්ඨානය තව තවත් ශක්තිමත් කර ගනු පිණිසය. මෙබඳු කතාවල දී ගමේ අපට වඩා හොඳින් සිටි පවුලක් නිදසුන් කොට දක්වූ අම්මා,

Free E-Pusthakalaya

" ඔය කොල්ලො සිඟනාමයි මට කළේ. මට මතකයි, මමත් හිත්ගරහ විඳින්න විඳින්න හිත දැඩි කර ගන්න පුළුවන් වුණොත් මමත් වසට උස්සන්නම් කියලා...." යි කීවාය.

මෙවා කියන කල සාමාන්‍ය අවස්ථාවන්හි දී කිසි විටෙක දක්නට නොවුණු ද්වේෂයකින් ඇයගේ ඇස් දැවෙමින් තිබිණි.

" මට මේ මේ දේ කළා. මේ මේ අය ගැන මතක තියාගනිල්ලා" යි අම්මා කිසි විටෙක කීවේ නැත. එහෙත් මගේ අනාගතය ගැන කතා වුණු මේ කියන අවස්ථාවේ අම්මා මටත් රෝහණටත් මෙසේ කීවාය.

"මතක තියා ගනිල්ල එකක්. මම මේ කියන්නෙ දෙවෙනි උඹටත් එක්කලයි. උඹලට නෑයො හෙම නෑ. අම්මගෙ පැත්තෙනුත් නෑ. තාත්තගෙ පැත්තෙනුත් නෑ. තමට ඕනෑ තරම් ඇති. තව ටිකක් කල් යනකොට අලුත් නෑකම් හදාගෙන එන්නත් පුළුවන්. නමුත් නෑයෝ කියන්නෙ සැපතේදී මඟුල් කන්න එන කෙනෙකුට නෙවෙයි. විපතේදී පිහිට වෙන්න එන්නේ කවුද, එය යි නෑය."

අපට පෙරකදොරුවකු ළඟ ලිපිකාරකමක් කළ මාමා කෙනෙක් ද, වෙළෙන්දකු සමඟ විවාහ වූ පුංචි අම්මා කෙනෙක්ද වූහ. ඔවුහු වත්කම් අතින් කෙසේ වෙතත් කුළවළියෙන් අපිට වඩා ඉහළය. තනි කැමැත්තට වස් පියැදුරකු සමඟ විවාහ වූ සොහොයුරිය ගැන එතරම් සැලකිල්ලක් ඔවුන්ගෙන් ද නොවිණි.

මඟුලක් තුලාවක් වැනි තැනකදී මුණ ගැසීමත් අවුරුදු කීපයකට වරක් එහා මෙහා යෑමත් හැර අප අතර සම්බන්ධයක් තිබුණේ නැත.

මා තුළ නම් ඇති වුණේ ඒ කිසිවකු කෙරෙහි වෛරයක් ද්වේෂයක් නොව නැම අතවරයක්ම විඳගෙන හිස එසවීමට තැත් කළ අම්මා කෙරෙහි කණගාටුවක් හා අනුකම්පාවක් පමණි. දිගට ම ඉගෙන ගැනීමේ අධිෂ්ඨානය තවත් දැඩි කර ගත්තේ එ මගින් ඉහළ තැනකට ගොස් සතුරන්ගෙන් පළිගන්නා චේතනාවේ සෙවණැල්ලක් වත් ඇති ව නොව, අම්මාගේ බලාපොරොත්තු සඵල කර ඇයගේ තෘප්තිය ලබා දෙන අදහසිනි.

විශ්ව විද්‍යාලය ප්‍රවේශ පංතියට ඇතුළු වී තව දුරටත් ඉගෙන ගැනීමට බැස ගත් තීරණය ක්‍රියාත්මක වන්නට පටන් ගැනීමෙන් පසු ව මා කෙරෙහි රෝහණ තුළ හට ගත් කිසියම් වෙනසක් මතුපිටින් ද ප්‍රදර්ශනය වීමට වැඩි දවසක් ගත වුණේ නැත.

තමා හමු වීමට මිතුයකු පැමිණි කළ, මා පාඩම් කරමින් සිටි

පුස්තකාලය
වර්ග අංකය
පරිග්‍රහණ අංකය 1715 45
දිනය 2011.10.11

අවස්ථාවක නම්,

"යමු අර පාර පැත්තට" ය යි ඔහු මිදුලට බැස්සේය.

මා සමඟ නිතර සුහද කතා බහට ආවේය. හෙම්බිරිස්සාවකදි පවා මා ගැන සොයුම් බැලුම් කළේය.

විශ්ව විද්‍යාලයයට ඇතුළුවීමේ වරප්‍රසාද ලැබෙතැ යි මුල දී මා තුළ ස්ථිරවම විශ්වාසයක් තිබුණේ දැයි කිව නො හැකිය. මහා පැත්තේ විසිතුරු තැනක් ඇතැය යන හැඟීම මාත්‍රයක් ඇතිව තාප්පයකින් පැන ගන්නට දරන තැතක් මෙන් විභාගයට පෙනී සිටි අප තුළ පැවැති ක්ෂණික බලාපොරොත්තුව හා පැතුම් තරඟයකින් ජය ගැනීම පමණක් වන්නට ඇත.

අපගේ පාසලෙන් පමණක් නොව ගම් අවටින් ද පළමු වැනියා වශයෙන් විශ්ව විද්‍යාලයට ඇතුළු වීමේ භාග්‍ය ලද මා තුල උපන් උතුරන සතුට, සොම්නස හා තෘප්තිය යටින් බියක් හා බරක් නො දැණුනේ නොවේ. විභාග ප්‍රතිඵල නිකුත් වූ ද ම රෑ කඩයේ දී මම මේ හැඟීම අම්මා ඉදිරියේ අනාවරණය කළෙමි.

"අම්මෙ ඉතින් අවුරුදු තුනක් හතරක් ඉන්න කොට මීහක් වියහියදම් වැඩියෙන් යයි" මම කීවෙමි.

"වියදම් නැතුව පුළුවනෑ ඉතින්" ය යි අම්මා කීවේ නො සැලෙන හඬකිනි.

අම්මා සතු මුදල් තත්වය ගැන මා තුළ හැඟීමක් නොවීය. සමහර විට ඇය කතා කරන්නේ කාරණාවෙහි බරපතළකම ගැන අවබෝධයක් නැතිව වන්නට ඇත. කෙසේ වුවද සියලු සැකයෙන් තොරව පිටවුණු ඇයගේ වචන මා ධෛර්යයවත් කළේය.

විශ්ව විද්‍යාල ශිෂ්‍යයකුට මසකට අවශ්‍ය වන වියහියදම් සියල්ල කල්තියා විමසා ගණන් බලා අධ්‍යයනය කර ලබා ගත් අවබෝධයක් ඇත්තියක සේ ස්ථිර සාර හඬකින් අම්මා දිගටම කතා කළාය. එසේ නැත්නම් වියහියදම් පිළිබඳ බරපතළකම වඩාත් ලොකු කර අම්මා කල්තියා හිතටගෙන තිබෙන්නට ඇත.

අම්මා මට වියදම් කරන්නට බලාපොරොත්තුව ඇත්තේ තමා සතු මුළු සේසතම විය යුතුය. එහෙමත් කර බැරිය. තව පවුලේ පස් දෙනෙක් සිටිති. මම මේ ගැන ද ඇයට කීවෙමි.

එහි දී හැඟීම් බර වූයෙන් මගේ කටහඬ මට අඳුනා ගන්නට

Buddhika S

For E-Pusthakalaya



— හැරී තරම් ගැඹුරු විය. ඔහුගේ සිතෙන් හඳුලින් පතමිණි.

"ඔය පේරම බර ඔළුවට ගන්නෙ නැතුව උඹ උඹේ වැඩ ටික බලා ගනින් මම ඉන්න කල් බය වෙන්න දෙයක් තියනව යැ" යි ඈ මගේ සිත තේරුම් ගත්තියක මෙන් නැළැවිලි හාලයකින් කීවාය.

ඒ වචනවලින් මගේ ශෝකය මැඩී වුණා පමණි.

විභාගයකින් සමත් වී පේරාදෙණි යන අතරතුර කාලය මම ගෙදර ගත කළෙමි. ඉඳහිට පාසලට ද ගියෙමි. විශ්ව විද්‍යාලය ය දැක බලා ගැනීමේ ආශාවක් මාගේ සිතේ නැඟෙන්නට විය. රාමනාදන් අරුණාචලම් ජයතිලක, හිල්ඩා ඔබේසේකර, සංඝමිත්තා ඔම මේවා නලින් අසා සිටියෙමි. ඉස්සර ගුප්ත අර්ථයක් ගෙන දුන් මේ නම් දැන් මගේ ජීවිතයේ කොටසක් බවට පත්විමට යයි. සරසවියේ ශාලාවන් ඈත සිතන කල මා ඉදිරියේ ඇඳී යන්නේ මධ්‍ය මහා විද්‍යාලයේ නේවාසිකාගාරයය. එහි නිදන්නට ඇත්තේ ශාලාවකි. විශ්ව විද්‍යාලයේ දී අපට කාමර ලැබෙනු ඇත. සමහරවිට එකම ශාලාවක් ලැලි ගසා කාමර ලෙස වෙන් කර තිබෙනු විය හැකිය. වීඩී මාවත ඔස්සේ බස් රියෙන් ගමන් කරන කල දකින කොළඹ විශ්ව විද්‍යාලය ය මට මතක් වෙයි. පේරාදෙණියත් එලෙස ම විය යුතුය. වෙනසක් ඇත්නම් කඳු පමණක් වනු ඇත. කොයි තරම් සිතුවත් මගේ සිතට එන්නේ ම කොළඹ සරසවියත් ඇඳී විදුහලේ නේවාසිකාගාරයත්ය.

මගේ ගමන ගැන රෝහණ මටත් වඩා උනන්දුවක් ගෙන ක්‍රියා කළේය. අඩු පාඩු සියල්ල මතක් කරමින් කටයුතු යෙදුවා පමණක් නොව පේරාදෙණි යනු පිණිස ගාස්තුවක් නො මැතිව තමාගේ මිත්‍රයකුගෙන් මෝටර් රියක් ඉල්ලා ගත්තේ ඔහු විසිනි.

"ආතරයියා" යනුවෙන් හැඳින් වුණු මේ මිත්‍රයා විශ්ව විද්‍යාලයට කුලී ගමන් දෙක තුනක් ගොස් පුරුදුකම් ඇත්තෙක් විය. තෙල්දෙණිය පැත්තේ ඔහුගේ නෑයෝ වූහ.

ආතරයියා මේ ගමන් ම සිය නෑයන් ද බැලීමට යොදගෙන තිබුණු බැවින් දවසක් කලින් ගමින් පිට වීමට අපට සිදු විය.

"දැන් ලොකු පුතා පේරාදෙණි යනකොට මමත් එන්න ඕනැද ?" යි තාත්තා සති තුනකට කලින් ම ඇසීය.

"තාත්තා ඉතින්......" මම අවිනිශ්චිත ලෙස යමක් කියන්නට උත්සාහ කළෙමි.



"ඉත්තා ඔහෙ මම මොටා ද එන්නෙ ? මම ගියා ය කියල මොකද අපිට ඔච්චය තේරුමක්වත් තියෙන එකක් යැ" යි තාත්තා ඉහෙන් අතට ගියා හැහැල්ලු ලෙස සිනාසුණේය.

මගේ මේ මංගල ගමනට හවුල් වීමේ දැඩි ආශාවක් තාත්තා තුළ තිබුණු බවට සැකයක් නොවිය. එසේ ම, උපාධි අපේක්ෂක නිමල් හතුරුසිංහගේ පියා ලංගම රියැදුරකු වන තමා යම් සභාවක් ඉදිරියේ පෙනී සිටීම පුතාට කරන මදි පුංචිකමක් ය යන හැඟීම ද ඔහු තුළ බලපාමින් තිබිණි. තමාත් මේ ගමනට එකතු විය යුතුද යි නිතර නිතර තාත්තා ප්‍රශ්න කළේ ඒ හැඟීමෙන් මුල් ආශාව යටපත් කර ගන්නට අසමත් වූ බැවින් විය යුතුය.

මා පේරාදෙණිය බලා පිටත්ව ගිය ඒ ඉරිද උදේ ළා රෝස පැහැයෙන් යුත් අහස ඉතා පැහැදිලිව තිබිණැ යි කුසුම්, පසු දිනෙක එව් ලිපියක සඳහන් කළා ය.

අප ගමන් ගත් මෝටර් රිය සිය නිවස පසු කරද්දී පාර අද්දරට වී සිටි කුසුම් සිනාවෙන් සරසා ගත් මුහුණ ඇතිව දිගට ම අත වනන්නට වූ බව දුටු නමුත්, පරිසරය පිළිබඳ කල්පනාවක් මට නොවිණි. අවට ලොකයේ බලපෑමක් මගේ අභ්‍යන්තරය කෙරෙහි ඇති වන්නට පටන් ගත්තේ පසුවය.

දවසක් ම ඇවිද තෙල්දෙණියේ රැයක් ගත කිරීම නිසා තරමක් සන්සුන්ව සිටි මම ඊළඟ උදේ ඇතුළතින් යළි කලබල වන්නට වීමි.

ආතරයියා රිය පැදවී ය. ඔහු අසල වාඩි වී සිටි මා කලේ ඉදිරියට නැඹුරුව අපේ අසුනේ ඇන්දට දෙ අත් තබාගෙන ආ රෝහණ දිගටම කළ කතාවට හූමිටි තැබීම පමණකි.

මහනුවර පැත්තෙන් පැමිණ රජමල්වත්ත අසල හන්දියෙන් ගලහ පාරට වැටෙන්නට යද්දී කොළඹ දෙසින් පිවිසි තවත් රථයක් ද වට රවුමෙන් හැරී අප ඉදිරියට වැටුණෙන් වේගය මඳක් බාල කරන්නට ආතරයියාට සිදු විය.

"දැක්ක ද දම්ම හැටි" යි ගියරය මාරු කරමින් මා දෙස බලා කී ඔහු "මේ සේරම යන්නෙ එහාට" ය යි අනතුරුව පැවසුවේ තමා කෝඩුකාරයකු නොවන බව අපට ඒත්තු යන අන්දමේ හඬකිනි.

මෝටර් රථ ගණනක් අප ඉදිරියේන් ගමන් කරමින් තිබිණි. මම ආපසු හැරී බැලිමි. කලින් කතා කරගෙන නියමිත තැනකදී - නියමිත වේලාවකදී - මුණ ගැසෙන ලෙසින් නව නවත් කාර් අපේ පෙළට

Buddhika-22

For E-Pusthakalaya



සතඹු වන්නට විය. රුක්ස ගස් දෙපළින් සෙවණ ලද මහ මඟ දිගේ මංගල ගමනක යෙදුණු රථ පෙළ ඉදිරියට ඇදුණේ හිමිනි. සමූහ ගත වීමේ සතුටක් මෙන් ප්‍රමෝදයක් වෙදෝ තියක් ද මට ඇති විය.

"මෙතැනින් ඉඳල වැඩි දුරක් නැතුව ඇති" යි රෝහණ සැකයෙන් යුතුව කිය.

"ඔව් දැන් ඉතින් යුනිවර්සිටිය තමයි" තමාගේ පලපුරුද්ද හඟි ඉස්මතු කරමින් ආතරයියා කීය.

මට නම් ඒ වචනවල බරක් දැනුණේ නැත. අක්කර පනහක් පමණ යැයි මට එවේලේ සිතුණු මේ භූමි භාගය එහෙම පිටින්ම විශ්ව විද්‍යාලයය වන්නේ කෙසේද?

මේ ගොඩනැගිලි අතරින් අප යා යුතු නියම තැන කොතැන ද යි සොයන කුතුහල ඇති ව, විඩ මාවතේ දී මා දුටු දෙය වැනි ... අතිත අදහසින්, මම වටපිට බැලීමි.

ජයතිලක ශාලාව යන අකුරු පෙළ පැහැදිලිව ම කියවා ගැනීමට මම සමත් වීමි. මගේ සිත තිගැස්සී ගියේය. එය නම් මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය නිවාසය හා මොන ලෙසකින් වත් සැසඳිය හැකි තැනක් නොවේ. ජයතිලක ශාලාව විශ්ව විද්‍යාලයයේ එක කොටසක් පමණක් විය යුතුය. එක ශාලාවක් මේ තරම් විශාල නම් විශ්ව විද්‍යාලයය මුළුමනින් ගත් කළ පරිමාණය සිතා ගැනීම මට තව තවත් දුෂ්කර විය.

"කාර් එක දාගන්නවත් තැනක් නැතුව වගෙ" ආතරයියා කීය.

අතුරු පාරවල් අසිනේ. ගස් යට හා අංගනවල රිය නතර කර තිබිණි. කාරය තවත් ඉදිරියට යන්ම.

"අපි මෙහෙන් නවත්ව ගනිමු." යි රෝහණ කලබලෙන් පැවසීය.

"යන්න තියෙන්නෙ අන්න අතෙන්ට"

රථවලින් බට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ද දෙමාපියෝ ද එක පැත්තට ඇදෙමින් වුන්හ. අපි ද ඔවුනට එකතු වුණෙමු. මනස්කාන්ත කඳුකරයෙන් වටවුණු නිම්නයක් බඳු මුළු සරසවි බිම ම අප පිළිගනු පිණිස සැදී පැහැදී සැරසී සිටියා වැන්න. වසන්තයේ වැස්සෙන් උකා ගත් තද තිල්ලකින් යුත් ගස්වැල් මලින් බර ව උයනක සිරි ඉසිලී ය. මේ සුන්දරත්වය පසුබිම් කොටගෙන, පියකරු මුහුණ ඇති යුවතියන් පාට පාට සාරියෙන් ද ඔසරියෙන් ද සැරසී පිය නගන්නට වූයේ අපිසරණ

Boddhika



තව තවත් වර්ණවත් කරමිනි.

සිත තො සන්සුන් වීමෙන් ගතට දැණුන රස්න ගතිය කඳු හිස් පිසගෙන හමා ආ සිසිල් සුළං රැල්ලෙන් පහ ව ගියේය.

කලාගාරය, පුස්තකාලය හා සනාතන ශාලාව යා වීමෙන් සැදුණු මහ ගොඩනැගිල්ල හිරුඇස් හාමින් විරාජමාන ව පිහිටියේ අභිමානවත් පෙනීමක් ද සළ කරමිනි.

අපේම ජීවිතවලට සම්බන්ධ වීමට යන තැනක් ය යන අදහස් නොවුණත් ගොඩනැගිල්ල කරා පිය නගන කල මේ නම් ජාතියේ දායාදය නැයි ආඩම්බරයත්, අනෙක් අතට බුදු ගෙයකට, දෙවොලකට වදින කල උපදින භක්තිය හා ගෞරවයක් අප තුළ පහළ විය. යෝධ පුන් කලස්, කලාව හා සංස්කෘතිය පමණක් නොව ශිල්ප ශාස්ත්‍රයත් ඥාණයත් නිධන්ගතව ඇත්තේ මෙතැන්හි ය යි මූර්තිමත් කොට දක්වූවා මෙනි.

සියල්ල එකතු වුනු කල සිතේ මැවුණේ පොළොන්නරුව අනුරාධපුරය වැනි නටබුන් නගරයකට නව පණක් දීමෙන් ජනිත වන ආකාරයේ නිර්මාණයකි. සිංහරූප හා සනාතන ශාලාව උසුලා ගැනීමට නැගී සිටි මහ ගල් කුළුණු වර්තමානයට නොව පොඩි අතීතයකට අයත් ශ්‍රී විභූතියක ස්මාරකයන් මෙන් පෙනිණි.

ලියාපදිංචි සඳහා කෙළවරක වුණු මේසයක් වෙත යනු පිණිස අප ඒ ගල්කණු අතර පෙළ ගැසුණෙමි.

කොතනකින් පැමිණියවුන් දැයි නොදන්නා පිරිසක් මැදට වැටී පියවරෙන් පියවර ඇදෙන අතරේත් අරමුණක් පිළිබඳ හැඟීමක් නොවුණා තරම්. මට සියල්ල පෙනුණේ තවත් මොහොතකින් මා ද ඇතුළු වන ලෝකයේ කොටස් වශයෙන් නොව පිටින් ඈතින් සිට බලා සිටින බාහිර තැනක් වශයෙනි.

චංචලත්වය පිළිබිඹු කරගත් මුහුණින් පමණක් නොව චාම් ඇඳුමින් පවා අපේ නුහුරු නුපුරුදු ගතියත් සබකෝලයත් කියැවෙන්නට ඇත.

සමහරකු බුවමනා වෙන්ම හිමින් කතා කළ අතර තවත් සමහරකු බුවමනාවෙන් ම හඬ නගා කතා කළේත් සිතේ චකිතය යටපත් කරනු පිණිස විය යුතුය.

මට ලැබුණේ ජේම්ස් පීරිස් ශාලාවය. අපි එහි ගොස් ලිපිකරු

For E-Pusthakalaya



අතින් කාමරයේ යතුර බාර ගතිමු.

අතර මග දී ජයතිලක ශාලාව දුක තිබුණත්, අලුත් ස්ථානය වෙත පැමිණීමේ දී ද මවිතයක් කුහුලක් මැඩ ගැනීමට මම අසමත් වීමි.

රෝහණ පුවක්කේසය ද එල්ලාගෙන මා අසල ම විය. පිටතින් විනා ඇතුළතින් සරසවිය ගැන පුරුදුකමක් තමාට නැති බව ආතරයියාගෙ මුහුණේ වූ පෙනීමෙන් ම සිතා ගත හැකි විය.

ජේම්ස් පීරිස් ශාලාවත් මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය නිවාසයත් සසඳා බැලීමේ උත්සාහය මගේ සිතින් ටිකින් ටික ගිලිහී යද්දී, අපි ලේත්ත ලීයෙන් සැදුණු අත්වැල සහිත පඩි පෙළ නැංගෙමු.

කාමරය සොයාගෙන යැමේදී අනන්තය තෙක් විහිදී ගිය බවක් පිහුණු කොරිඩෝ කීපයක් පසු කර යන්නට අපට සිදු විය. අංකය අනුව අපි කාමරය සොයා ගතිමු. වසන ලද දෙරේ "සරත් විජේ නායක යන්න සුදු හුණුවලින් ලියැවී තිබිණි. අනුන්ගේ තැනකට අනවසරයෙන් ඇතුළුවීමේ බියක් මා තුල පහළ විය.

"කාමරේ හරිද ?" බියෙන් ම ආතරයියා ඇසීය.

"හොඳීමෙන් හරිනෙ. ඇරල බලමු." යි කියාගෙන මා අතින් යතුර ගත් රෝහණ දෙරේ විවෘත කළේ ය. ඇඳ, ලියන මේසය, බිත්ති අල්මාරිය හා පණ්ණාඩිය යන පහසුකම්වලින් යුත් කාමරය එක් පුද්ගලයකුට විශාල වැඩි ය යි මට සිතිණි.

"ඉඩකඩ තියෙන්නෙ ඕනෑ තරම්." වට පිට බැලූ ආතරයියා බිත්තිවලට පැන්සලෙන් ලියවුණු වාසගම් දුක, "......... මෙච්චරය ඉඳල තියෙන්නෙ හරි මිනිස්සු" යි කීය.

රෝහණ කාමරයේ ඇතුළත දොරක් ඇරියේ ය. එයින් සඳළු තලයකට පිවිසිය හැකිය. එහි ගිය රෝහණ මිටි තාප්පයට අත තබා අවට බැලීය. තමා දුටු දර්ශනයෙන් ඔහු කුල්මත් වුණා විය යුතුය.

"දාත්තමු මටත් හිතෙනව, වාසිටි නාවොත් වැඩක් කියල"

"හිතල බඳි, අයිය වගෙ එන්න ම මහන්සි ගන්න ඕනෑ"

සහෝදරයා හා මිත්‍රයා සමඟ පහළට අවුත් ඔවුනට ආයුබෝවන් කීමෙන් පසුවු මා මෙ වන විට කාමරය වෙත ගමන් කළේ මේ මගේ ම තැනක් ය යන හැඟීම සිතට කාංවා ගැනීමට තැත් කරමිනි. ඒ හැඟීම



අනෙත් අය තුළද හැඩෙමින් තිබුණු නිසාදෝ ගොඩනැගිල්ල තුළ ගැබ්වුණු නිහඬතාවය කෙමෙන් බිඳෙන්නට පටන්ගෙන තිබිණි.

හැම කෙනෙකුගේ ම බැල්මෙහි හැසිරීමෙන් පිලිබිඹු වී තිබුණේ පරිසරයට පුරුදු වීමේ වුවමනාවකි.

ඒ කැමෙන් පසු වෝඩින් තැන අප හැසිරිය යුතු ආකාරය ගැන උපදෙස් දුන්නේය. ශාලා වෝඩින් තැන උප කුලපතිටත් වඩා බලගතු කෙනෙකු අපට සිතිණි. අප එතැනින් පිටව ගියේ ඔවුනොවුන් හා දුන හැඳුනුම්කම් ඇතිකර ගැනීමට තුඩුදෙන කතාබස් වලට මුල පුරමිනි.

සුන්දරත්වය විඳ නිම කරන්නට බැරි තරම් ය. ශාලාවේ අතු දෙකක් යා කළ පාලමක් බඳු පටු සඳළු තලයට ගිය කල කඳිමට අවට සිරිය දුක බලා ගත හැකිය. රතු, නිල් හා කහ ආදී විවිධ වර්ණයෙන් සැරසුණු බටහිර අහස අතිශයින්ම සුන්දරය. බැලූ බැලූ අත ඇස හමුවුයේ මලින් බර අතුපතර ය. ඒ අතරින් ඈත පෙණුණු තණ බිමක ද තැන තැන මල් පඳුරු හා ලිය ගොමුය.

පහළ වංගුවකින් බෙරී ගලහ පාර ඈතට විහි දී ගියේ ය. ඉනුත් පහළ වූයේ හිල්ඩා ඔබේසේකර ශාලාවය. ඉන් ඔබ අපේ වම් අත පැත්තෙන් සංඝමිත්තාවය.

දෙවන හා තුන් වන වර්ෂවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් පැමිණීමට නියමිත ව සිටියේ අපට වඩා දෙ දිනකට පසුවය. එක්තරා නැති ගැන්මකින් ද යුතුව අපි ඔවුන් ගැන බලාපොරොත්තුව සිටියෙමු. නවක වධය කුමන අන්දමේ එකක් විය හැකිදැයි කුහුලක් හා චකිතයක් අප සා තුළත් පැවැති නමුත් කිසිවෙක් ඒ ගැන වැඩිපුර කතා නො කළහ. ආනන්ද ජනක වටාපිටාවේ සුන්දරත්වය විඳිමින් අපි ඒ කාලය අවට පරිසරය පුරුදුවනු පිණිස තැන තැන ඇවිදිමින් ගෙවා දැමීමු.

මම ගෙදරටත් පාසලේ ගුරුවරුන්ට හා යහළු යෙහළියන් කීප දෙනෙකුටත් කුසුම්ටත් තොරතුරු දන්වා ලියුම් ලියන්නට අදහස් කළෙමි. ඒ හැම දෙනා ම හමු වී කතා බස් කිරීමේ ආශාව මගේ සිතේ වැඩෙන්නට විය. ඔවුන් මුණ ගැසුනු කල කියනු පිණිස ය යි නොයෙකුත් තොරතුරු සිතේ තැන්පත් කර ගතිමි.

ඇත්ත වශයෙන් මා කුසුම්ගේ ලිපිය ලීවේ දෙවැනි දවසේ රාත්‍රියේය.

අම්මාට හෝ තාත්තාට මෙන්ම කුසුම්ටත් මා ඊට කලින් ලිපියක් ලියා නො තිබිණි. ඒ සඳහා අවස්ථාවක් හෝ අවශ්‍යතාවක් හෝ මතු

Buddhika 25

නො වුණු බැවිනි. මම වැඩි දුර කල්පනා නො කරමි "ආදරණීය ඇ... වෙත" ලිපියක් ලියා ගතිමි. හා තාත්තා ඇතුළු පවුලේ සියලු දෙනා වෙත...

මා බෙහෙවින් චංචලත්වයකට පත් වූයේ කුසුම් සම්බන්ධව ය.

ඇයට ලියන්නට තරම් දෙයක් නොතිබුණු නිසා නොවේ. ලියන්නේ කුමක් දැයි නිරාකරණය කර ගැනීම අතිශයින් දුෂ්කරය බවක් පෙනුණු නිසාය.

එක අතකට සිතට දනුණු මේ නො සන්සුන්කම අලුත් දෙයකුත් නො විණි. කුසුම්ට කියා ගත යුතු ඉතා වැදගත් කරුණු රැසක බරෙන් මා පෙළමින් සිටියේ සති ගණන් තිස්සේය. මෙහි එන්නට කලින් විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල නිකුත් වී මා පාසල අත්හැර දැමූ මුල දවස්වල ම මම එහි අත්දැකීම් ලැබීමි.

වෙන් ව යන්නට කලින් කුසුම්ට කිවයුතු බොහෝ දේ ඇතැයි හැඟීමක් මගේ සිතට පීඩනයක් තරම් දැඩි ලෙස දනෙනන්නට විය. මේ කරුණු සම්බන්ධ ව මගේ චිත්ත ස්වභාවය පිළිබඳ දුරාවබෝධයක් මට තිබිණැයි මම කල්පනා නො කරමි. අඩු තරමින් සිත මතු පිටින් නම් පැවැති මුහුණුවර මම නොදත්තෙමි.

මා මුලින් ම හැඳින ගත්තේ ඇය කෙරෙහි උපන් දැඩි සංවේගයක් හා වේදනාවකි. ඒ වියෝගයේ දුකම නොවේ. මා පේරාදෙණිය යන්නේ කුසුම් පාසලේ අසරණ අනාථ තත්ත්වයකට පත්කර දමා නොවේ ද යන ප්‍රශ්නය මා තුළ මතු කළේ වේදනාවක මෙන්ම මට විරුද්ධ ව එල්ල වුණු චෝදනාවක ස්වරූපය කි.

මා නැති කල කුසුම්ගේ ආරක්ෂාවට කෙනෙකු නැතැයි මතක් වීමෙන් මගේ සිතට අනතුරුව බියක් හැඟිණි. මා තැති ගත්තේ එය මුළු ස්ත්‍රී වර්ගයාගේ ම ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයේදී මට ඇති වන අර පොදු බිය ම බව තේරුම් යන්නට වීමෙනි.

මගේ හැඟීම් එකින් එක නියත මුහුණුවරක් ගනිත්ම මේ සියල්ල ඇයට කිව යුතුව යන තීරණයක් ද සිතට නැඟිණි. පවිත්‍රත්වයේ ප්‍රතිමූර්තියක් ලෙස මා සලකන යුවතියක විදිහට හැඩ ගැසීමේ දී ක්‍රියා කළ යුතු හැසිරිය යුතු සියලු ආකාරයන් ඇයට කියා දිය යුතුය යි මම සිතමි.

විභාගයෙන් සමත් වී සරසවියට ඇතුළු වන තුරු නිවාඩු පිට ගෙදර සිටි කාලයේ මේ අදහසින් සියල්ල ඇයට කියන අදහසින්, මම නොයෙක් දින පාසලට ගියෙමි. විවේක වේලාවක් අසු වුණේ නම් මම



එහි ඉගෙන ගත්තා කාලයේ දී මෙන් ම යෙහෙළියන් සමඟ තේ බොන්නට ගියෙමි. පුස්තකාලයට වී පුවත්පතක් සඟරාවක් බලමින් සිටියෙමි. ගුරුවරයකු සමඟ ටිකක් කතා බහට වැටී සිටියෙමි.

කුසුම් ද කලින් මෙන් ම අප සමඟ තේ බොන්නට ගියාය. මා විසින් දෙන ලද ටොෆි කීපය මිට මොළවා ගත්තාය.

සීනුව නාද වූ පසු "ලොකයියෙ හෙටත් එනව නෙ" යි අසා මගෙන් සිනාවක් මිස අන් පිළිතුරක් නොලද කල "හෙටත් එන්න" යි කියාගෙන පංතියට දිව්වාය.

ඇය හා කතා කරන්නට අවස්ථාවක් ලබා ගැනීමේ කිසිම දුෂ්කර භාවයක් නොවිණි. ඇත්ත වශයෙන්ම මා ගමින් පිට වන තුරු හැම සති අන්තයක ම ගෙදර ගත කරන්නට ඇයට ඕනෑ වූ විට විරුද්ධ වුණේ මම ය.

කියන්නට බොහෝ දේවල් තිබිණැයි සිතාගෙන ගිය නමුත් ඇය ඉදිරියේ මට හැම දෙයක් ම අමතක වී ගියා මෙන්ය. හැමදා ම මා ආපසු ආවේ හෙටත් කියන්නට වැදගත් කිසිවක් ඉතිරි වූ බවට හැඟීමකිනි.

පේරාදෙණිය බලා පිටත් වන්නට නියමිතව තිබුණු දට කලින් සිකුරාද මට වේදනාත්මක දවසක් වූ බව අමුතුවෙන් කිව යුතු ද ? පාසලෙන් අස් වූ ඊටත් වඩා උචිත ලෙස කියතොත් වෙන් වුණු දවස වශයෙන් සැලකිය හැකි මෙදින මම ගුරුවරුනට ද යහළු යෙහෙළියනට ද ආයුබෝවන්. කියන්නට ගියෙමි.

"කුසුම් මම අනිද්ද උදේ යන්නෙ" මම අන්තිමට ඇයට කීවේ ඇය ද පාසලේ ම කොටසක් - ඒකකයක් වූ බැවිනි.

"යන කතාවක් මට දන්නම කියන්න එපා." යයි මගෙ පිටට මිට මොළවා පහර කීපයක් ගසමින් වුව ද කුසුම් කීවේ තර්ජනයක නොව බැගෑපත් ඉල්ලීමක හඬිනි.

ඇයගේ සිනාව තුනී වෙමින් ගියේය. කිවයුතු දෙයක් සඳහා අවස්ථාව එළැඹී ඇතැයි මම මොහොතට සිතීමි. මගෙන් ඉවතට හැරී තිබුණු ඇයගේ මුහුණ දෙස මම කතාවක් නැතිව බලා සිටියෙමි.

දූරියක ළමා විය ගෙවා අවසානය යි කිසියම් අවස්ථාවක දී කොබා අහම තීරණයක් කරයි. ඒ තීරණයෙන් ම ඕ යුවතියක් වන්නීද? කුසුම් තුළ මා තවමත් දකින්නේ දූරියකගේ අහිංසක මුහුණක් විනා

Free E-Pusthakalaya
Buddhika 23

For E-Pusthakalaya

යුවතියකගේ සුන්දර මුහුණක් නොවේ. දෙවියනි, මම මෙ ... බලාගෙන මොනව නම් කියන්නද ?

"කුසුමෙ මම ගියාට පස්සෙ කුසුම් හොඳට හැසිරෙන්න ඕනෑ" යි මා කිව යුතුද ?

"ලොකයියෙ මම වැරැද්දක් කරල තියනවද ?" යි ඇසූ අසනු ඇත.

" නෑ කුසුම් මම කිව්වෙ පරිස්සමින් බලාගෙන වැඩ කරන්න"

"කාගෙන් ද ? මොකකින්ද ? ඇය ඇසුවොත් මම කුමක් කියන්නෙම්ද ?

කතාවක් බහක් නොමැතිව ගත වුණු විනාඩියකින් දෙකකින් පසුව ඇය නැවත මා දෙස බැලුවේ සුපුරුදු සිනාවත් ඇතිව ය. මම ඒ ඇස්වල කඳුළු බලාපොරොත්තු වුණෙමි. ඇය ධෛර්යය සම්පන්න එකියකැ යි ක්ෂණික හැඟීමක් මට ඇති විය. එහෙත් ඒ සිනාව පුරුද්දට නැගුණු එකකැ යි ද මම සිතමි.

"මම අද ගෙදර යන්න අවසර අරගෙන ඉන්න ..........
ලොකකයියත් මාත් එක්කල යන්න ඉන්නව නේද ?"

"මට තව වැඩ ටිකකුත් තියනව කර ගන්න"

"කමක් නෑ. මම........ හෙට එහෙ එන්නම්"

" අනිද්ද උදෙන්ම යි මට......" "යන කතාවක් කියන්න එපයි කියලයි කිව්වෙ" යි කී ඈ ආපසු නො බලා ම පංතියක් දෙසට දුවගෙන ගියාය.

ඇය එහි ඇතුළු වන තුරුත් මම බලාගෙන සිටියෙමි.

මගෙන් දිග සුසුමක් පිට විය.

පසුවද අනුලාත් සමඟ කුසුම් අපේ ගෙදරට පැමිණි කල මම යළිත් නො සන්සුන් වීමි. මා කොහොමටත් සිටියේ එකලස් කර ගත නොහැකි සිතකිනි. අලුත් ඉරණමක් සොයාගෙන පසුවද යන්නට නියමිතව තිබුණු ගමන සඳහා සූදානම් වීමේ දී ස්වභාවෙන්ම එබඳු තත්වයන් යටතේ ඇති විය හැකි චිත්ත වික්ෂිප්ත භාවයකින් මම මැඩෙමින් සිටියෙමි. ඒ අතර කුසුම්ට කුමක් කියම්දෝ සිතමින් යළි අමතක කරමින් ගෙයි එහා මෙහා ඇවිද්දේ එබැවිනි.

ඇය නම් හැසුරුණේ සාමාන්‍ය අන්දමිනි. වෙන්වීම ඇයට



ගණනක් නැතිව ඇතැයි සිතුණාදැයි මට මතක නැත. එහෙත් පසු කාලයේ සිද්ධීන්ට මුහුණ පුන් ආකාරය ගැන කල්පනා කරන විට එද සුසුම් දඩි චිත්ත වේගයන් මැඩගෙන සිරිත් පරිදි සිනාවෙන් ම ගත කිරීම කිසිසේත් පුදුමයට කරුණක් නොවේ.

ඇය මගේ සපත්තු මැද දුන්නේත් අම්මාගේ කිම පිට බතක් පිස දුන්නේත් අන් ඕනෑ ම දවසක තමාට නියමිත වැඩ කොටස ඉටු කිරීමේ දී දක්වන සන්සුන්කමින් හා තැන්පත්කමින් යුක්තව ය.

සරසවි නිවාසයේ මගේ කාමරයට වී තනිව කල්පනා කරන කල කුසුම්ට කීමට කොතරම් දේවල් තිබුනා දැයි දැන් මට නැවත සිතෙයි. ඉතා පහසුවෙන් අරමුණක් ඉටු කර ගත හැකිව තිබුණු මාහැඟි අවස්ථාවක් ප්‍රවම්භාවෙන් හා නොසැලකිල්ලෙන් පැහැර හැරීමෙන් මම අතිශය කනස්සල්ලට හා පසුතැවිල්ලට පත් වීමි. කඳු පෙළ වට කරගෙන සිටින සැටි අඩ සඳ එළියෙන් දකින කල කුසුම් වෙත මගේ අදහස් පළ කරන්නට තවත් අවස්ථාවක් නො ලැබෙන පරිදි අප දෙදෙනා එකිනෙකාගෙන් ඈත් වුණු බවට බියකින් මගේ සිත තැති ගත්තේය.

එහෙත් ඇය වෙත පළ කළ යුතු යයි මට දැනෙන මේ අදහස්, පැතුම් , අරමුණු කුමක් දැයි මම තවමත් දනිම් ද?

## 5

අන්තිමට ඔව්හු පැමිණියහ.පැරැන්නන් ආවේ ඇත තියා ම පරිසරය දෙවනත් වන අන්දමට කෑ ගසමින් හා සිනාසෙමිනි. බියපත් බලු පැටවුන් මෙන් අපි බැල්කනියට වී ඔවුන් එන සැටි බලා සිටියෙමු.

එක පොදියට ආ පිරිසක් පාත මාලයේ ඉස්තෝප්පුවට ගොඩ වුණේ කන් බිහිරි කරවන තරම් හූවක් නංවාගෙන ය. ඒ හූවෙන් ම ඔවුන් උඩුමහලට නැගුණේ මාරයන් පිරිසක් ලෙසිනැ යි මට සිතිණි. ඔවුන් අඩිය තැබුවේ ප්‍රවම්භාවෙන් ම සපත්තුවලින් හඬක් නැගෙන ලෙසිනි.

අප ශාලාවේ පදිංචි වීමට අයිතියක් නැති තාවකාලික නවාතැන් කාරයන් බවත් එහි නියම උරුමක්කාරයන් තමන් බවත් ඔවුන්ගේ උද්දාම ගමනින් ද බැල්මෙන්ද පළ විය. සරත් විජේනායක නම් කෙනෙකු ඒ අතර සිටිතැයි බියක් මට ඇති විය. එසේ නම් ඔහු මා කාමරයෙන් ඇද

Buddhi...

For E Pusthakalaya

එළියට දමනු ඇත.

බැගෑපත්කම රැගත් අපේ [illegible] තෙත් වෙනුවෙන් [illegible] තෙත් ගතියක් දක්නට නොවිණි.

"උඹල ආව ද?" එකෙක් ඇසීය.

"වරෙල්ල. වරෙල්ල"

"හරමානිස්ල වරෙල්ල"

එකම බැවුමක අපගේ ශාලාවට ටිකක් ඉහලින් පිහිටි මාකස් ප්‍රනාන්දු ශාලාව දෙසින් එවැනි ම හූ හඬක් ඇසෙමින් තිබිණි. එහෙත් අනුන් ගැන සිතන්නට තරම් ඉස්පාසුවක් අපට නැත. අප දහ දොළොස් දෙනෙකු සිටි තැනට පැමිණි එකෙක්,

"ඒයි ලැස්ති වෙයල්ලා. ලැස්ති වෙයල්ලා." යි විධානයක් කළේය.

කෙනෙකු වෙන් කර දුන් නියමයක් නොවූ බැවින්, අපි කුමක් සඳහා සූදනම් වන්නදැ යි නො දැන තුස්නිම්භූත ව සිටියෙමු.

"උගුඩුවො වගෙ බලා ඉන්න ලැස්ති වෙයල්ලා දන්තධාතුන් වහන්සේ වන්දවල එක්ක එන්න."

"සුදු කලිසම්! සුදු කමිස!" තව එකෙක් හැම දෙනාටම ඇසෙන පරිදි හඬ නගා කීය.

"ඒයි සපත්තු සෙරෙප්පු දාගෙන මාළිගාවට යන්නෙ නෑ. ඒවා නැතුවට කමක් නෑ."

මෙය විහිළුවකැ යි සිතා සිනාසීමට මම උත්සාහ කළෙමි. සිනාසිය නො හැකිය. පාවහන් නොමැතිව නුවරට යන්නේ කෙසේ ද? අසීකරු වුවහොත් කරදර විය හැකිද? මේ ආදී නොයෙකුත් ප්‍රශ්න මතු කරමින් මම සුදු ඇඳුමින් සැරසුණෙමි.

"බැහැපල්ල පහලට සේරම! පලයල්ල පිට්ටනියට"

අපි එකිනෙකාගෙන් ඉස්සර වන්නට ඉඩ දෙමින් පහළට ගියෙමු.

"උඹල අඳින හැටිත් උගන්වන්න වෙලා තියෙන්නේ"

ඇඳුමෙ කුමන අඩුවක් ඇද්දැයි අපි දෙස ම බලන්නට වීමු.

"ඒයි සේරම කලිසම් කකුල් නවා ගනිල්ලා - දණට"

ඔවුන්ගේ නියෝගයන් අනුව ක්‍රියා නොකරම බැරි බව මේ

Buddhika 15



විකට අප හැමට තේරුම් නොස් තිබුණා විය හැකිය. අපි කෙඳිරිමක් නැති ව කී දෙය කළෙමු.

එකෙක් අප ඉදිරියට විත් කය සෘජුව සිටින ලෙස සිට ගත්තේය.

"දෙදෙනා බැගින් - පෙළ ගැසෙන් !"

අපි පෙළ ගැසුණෙමු.

"වම - දකුණ වම දකුණ - වම..... වම.... වම.... ගමනේ යා...."

අපි කණ්ඩායම පිට්ටනිය දිගේ ඉදිරියට ගියෙමු.

"වමට හැරෙන්...... වම...... වම......"

මේ කණ්ඩායමට අපි විස්සක් තිහක් අසුව් සිටියෙමු. අපට විධාන දීමට පස් දෙනෙකි.

"වම දකුණ - වම...... වම......"

මෙතැන් සිට දළඳ මාලිගයට සැතපුම් කීයක් ඇද්දැයි සිතන්නට මම උත්සාහ කළෙමි. දෙ දිනකට කලින් රෝහණ හා ආතරයියා සමග මා දළඳ වඳින්නට ගියේ මොන තරම් බලාපොරොත්තු සහගත සිතින් ද? මට දුකක් ඇති විය.

මහනුවර වීදි මැදින් යන්නට වෙන්නේත් මේ ගමනින් ම ද?

"වම - දකුණ වම...... වමට හැරෙන්"

හිල්ඩා ඔබේසේකර උයන අසලදී වමට හැරුණු අපට ලවර්ස් ලේන් ඔස්සේ යන්නට නියම විය. ඇත්ත වශයෙන් අප මෙහෙයවනු ලැබුවේ දළඳ මාලිගාවට නොව සරසවි උයන දුම්රිය පහළට ය. එහි තිබුණු සූට්කේස් ඇතුළු පැරැන්නන්ගෙ බඩු බාහිරාදිය හිස තබාගෙන ඒමට අපට සිදු විය. දණට කලිසම් නවාගෙන බඩු පොදි හිස තබාගෙන අපි පේළියට ආපසු ආවෙමු.

"උඹලට මාන්සි ඇති දූන්........ මාන්සි නේද ?"

"ඔව් හෝ නැත" යන කුමක් ඔව්හු අපෙන් බලාපොරොත්තු වෙත් ද?

"මහන්සි නම් වරෙල්ල නාන්න යන්න."

නාන කාමරයට ගිය අපට ඒ ඇඳුම් පිටින් ම වතුර මලට හිස ඇල්ලීමට නියම විය.

For E-Pusthakalaya



සියල්ල මෙතැනින් අවසාන ය යි සිත හද ගන්නට උත්සාහ කරමින් මම කාමරයේ සිටියෙමි.

තට්ටු ක[illegible] හඬක් ඇසී මම දොර ඇරියෙමි.

"මොකද බං දොරවල් වහ ගෙන? ගෑනු ළමිස්සියො වගේ" යි [illegible] කරමින් ඇතුළු වූ තැනැත්තා මහින්ද බව මම ඒ වන විට දැන සිටියෙමි. අප [illegible] පළ කරාගෙන ගිය කණ්ඩායමේ නායකයා ද ඔහු විය. [illegible] යුත් මේ මුහුණ මට එවලේ පෙනුණේ මිනිස්කමින් තැති රකුසකුගේ ලෙසිනි. මම සිනාසෙන්නට උත්සාහ කළෙමි. ඔහුට මගේ සිනාවක් අවශ්‍ය නො වුණා විය හැකිය. [illegible] යන බැල්මෙන් මොහොතක් සිටි ඔහු,

"මොකට ද උඹ ළඟ කත්ත තියෙන්නෙ?" යි කාරුණික හඬින් ඇසීය. මට රාක්ෂයන් සහ [illegible] කතාව සිහිපත් වන්නට ඇත. මොහු ආවේ මගේ ඔළු ගෙඩිය කන්නදැයි ඇසිය යුතුය.

"කත්ත මොකුත් නොවෙ නැද්ද යකෝ?"

"නෑ"

"උඹල [illegible] දන්නෙ නැද්ද? අත් දෙක වහ වනා ආපු අපට විකක්. [illegible] විකක් කාපිය හදගෙන ආවනම් හරකයි—"

මම කතා නො කෙළෙමි.

"ඇයි උඹලගෙ ගෙදර නැද්ද කවුරුත් එහෙම එකක් [illegible] ගන්න කෙනෙක්"

අම්මා සිය කෝප්ප කඩයේ මිත ළඟ වාඩි වී තැවුම් බදිනා [illegible] මගේ සිතේ මැවී ගියේය. ඒ සමඟ සිත පුරා පැතිර ගියේ ශෝකයකි.

කඳුළු එන්නට කලින් ශෝකය ලගින්ම පිටුපසින් ආ කෝපය [illegible] මහුගේ [illegible] ප්‍රශ්නයෙනි.

"උඹට තාම කෙනෙක්වත් නැද්ද මිනිහෝ?"

කුසුම්. [illegible] කුසුම්.

"කහා කරන්නෙ?"

"නෑ"



"ඇත්තද"

"ඇත්තමයි"

"ෂි ! උඹෙන් වැඩක් නෑ"

මහින්ද එසේ කියමින් කාමරයෙන් පිටව ගියේය. මට සිනාසෙන්නට සිතිණි. සිනාසිය නොහැකිය.

ඔහු ලද අරුංචිය හැම දෙනා අතර ම පැතිර ගියොත් මට නිවිහැනහිල්ලේ සිටින්නට හැකි වෙතැදැයි සැහැසුම් දයක හැඟීමක් සිතට නැගිණි. එවැන්නක් වුණේ නැත. තවත් අවස්ථාවෙක කාමරයට පැමිණි මහින්ද කුසුම් විසින් තෑගි දෙන ලදුව මේසය මත තිබුණු චිත්‍රය රැගෙන සියල්ලටම පෙන්වා උසුළු - විසුළු කර රැගෙන ගියේය.

අපේ කාමර පේළියේ පැරණි ශිෂ්‍යයන් සියලු දෙනාගේම සපත්තු මැදීමට නවක වදයේ කොටසක් වශයෙන් මටත් තවත් දෙ දෙනෙකුටත් නියම විය.

අනෙක් දෙදෙනා කීර්තිසේන හෙට්ටිආරච්චි හා ජයන්ත වනිගසේකර ය. කීර්තිසේන නවක වධය නිසා ඒ වන විටත් සරසවිය එපා වී තිබිණි. ජයන්ත සියල්ල බාර ගත්තේ සැහැල්ලු සිතිනි. ජයන්තගේ වචන මටත් ධෛර්යයක් විය.

නවක වධය ගැන පුවත් ද ඊට විරුද්ධ ව ලිපි ද පුවත්පත්වල පළ වී තිබිණි. එමගින් වන් සහනයක් ලැබෙතැ යි තමා විශ්වාස කරන බව කීර්තිසේනගේ කතාවෙන් පැහැදිලි විය.

අපි හැම දෙනෙක් ම පාහේ මෙහි එන්නට කලින් උගත් පාසල්වලදී කාගේත් ගරුසැලකිලි හා සංග්‍රහයන් ඇතිව ශිෂ්‍ය නායක තත්වයේ පසු වූ අය වූයෙමු. මහත් බලාපොරොත්තු ඇති ව සරසවියට ඇතුළු වුණු විගස පැරණි ශිෂ්‍යයනට බියෙන් යටහත් පහත්කමින් ද බැගෑපත්කමින් ද ගත කරන්නට වීම විශේෂයෙන් ලොකු මානසික වධයක් විය.

කෙසේ වුව ද කීර්තිසේන වැනි අකලොස්සක් හැරුණු විට අපි කවුරුත් සති දෙකක් යන කල එන ඕනෑම දේකට මුහුණ දීමට තරම් මානසික ශක්තියක් ඇති ව පදම් වී සිටියෙමු. එහෙත් නවක වධය අවසන් කිරීමට ශිෂ්‍ය නායකයන් තීරණය කර ඇතැයි පුවත අප බාර ගත්තේ සැනසීමකින් හා සතුටකින් පිරී හදවතිනි.

Buddhika

# 6

හ න්තාන කඳු පිටුපසින් හිරු උදා වී ආවේ අලුත් දවසකට ය. අමුතු ම සුන්දරත්වයක් මවා පාමින් බටහිර කඳුකරය ළහිරු රැසින් විරාජමාන වන්නට විය. මේ නම් නව ජීවිතයක උදවකි. රමණීය පරිසරය මීහට ආස්වාදයක් ප්‍රබෝධයක් හා ධෛර්යයක් ලබා දෙයි.

කලින් ද රාත්‍රියේ නවක වධය අවසන් විය. මැදියම් රැයෙහි ශාලාව කසල ගසන් යට පැවැති රැස්වීමේදී විරාගත ප්‍රතිඥාවනට අත්සන් තිබීමෙන් නවක වධය නිමායට පත් වූ බව ප්‍රකාශයට පත් වීමෙන් පසු ව මහින්ද ගුණරත්න අත් විහිදගෙන අප අතරට පැමිණියේය.

අපි මහ හඬින් සිනාසෙමින් ඔවුනොවුන් බද ගතිමු.

"අපි හැමෝම මීට පස්සෙ එක පවුලෙ. කිසි වෙනසක් නෑ. සහෝදරයො වගෙ. සේරම ඉවරයි."

ඒ එනාගි අතිශයින්ම උද්වේගකර අවස්ථාවකි. හදවත් උතුරා ගිය හැඟීම් කඳුළු වෙසින් සමහරකුගේ දෙ නෙත්වලින් වැගිරෙන්නට විය.

පැරැන්නෝ පිරිස අතර යමින් තමන් අතින් වධයට පත් නවකයන් තෝර තෝරා අතින් අල්ලා කරට අත් යවා බදගෙන සහෝදරත්වයත් සමානාත්මතාවයත් ප්‍රකාශ කළහ. මහින්ද ගුණරත්න පැමිණ මා වැලඳ ගත්තේ ය.

සිනුණු නැහැයෙන්, දුඹු ඇහිබැමෙන් හා බුද්ධිමත් දෙ නෙතින් යුත් ඒ පියකරු මුහුණ කරුණා බර හදවතක පිළිබිඹුවක් වැන්න. මෙතෙක් මනු බැඳගෙන සිටියේ වෙස් මුහුණකි. පැරණි ශිෂ්‍යයන් හැම දෙනාම බැඳ සිටියේ වෙස් මුහුණුය. ඔවුහු ඒවා ගලවා ඉවත දමා තමන්ගේ නියම ස්වභාවයෙන් මිනිස්කමින් හා සහෝදරත්වයෙන් අප තමන්ගේ සමාජයට බාර ගත්හ.

මිදුලේ, ගස්යට, විවේකාගාරයේ, බැල්කනිවල හා කාමරවල හත් අට දෙනා - දහ දොළොස් දෙනා රංචු ගැසී ගත වූ දෙ සතිය ගැන කතා කරන්නට වූහ. වරින්වර මතු වුනු සිනාවෙන් හා හූවෙන් ද යුක් ඒ කතාව මෙදී සිටි දෙ පිරිසක් එක තැන් වූ කල නැගෙන සුහදතාවයේ සෝෂාවක් විය.

"නාමින් ඔයද ?"



"නෑ නෑ ඉතින් බයක් නෑ"

"බයක් සැකයක් නැතුව ආපහු බලන කොට මොකක් ද හිතන්නෙ?"

"හැම දෙයක් ගැන ම හිනා යනව මිසක් වෙන මොනව හිතන්නද?"

"හිනාවකට වැඩිය අර්ථයක් ඒකෙ තියෙනව."

" කල්පනා කරන කොට රැග් එක නැතුව බැරි දෙයක්."

"පිටින් එන කෙනෙක් ශ්‍රෝත්‍රයකට ඇතුළු කරගන්නට කලින් කරන මිලේච්ඡ චාරිත්‍රයක් වගෙ කෙනෙකුට හිතෙන්න පුළුවනි. නමුත් රැග් එක හොඳ අත්දැකීමක්. ජීවිතයට මුහුණ දෙන්න හොඳ අවස්ථාවක්."

"ඔව් ඔව් දුන්නම් හිතෙනව ඕනෑ ම දේකට මුහුණ දෙන්න පුළුවන් කියල"

"නවන් එකක් නවක වධය වගෙ එකක් නැත්නම් මෙතැන ජීවිතයට පරිසරයට පුරුදු වෙන්න අවුරුද්දක් යයි. තැන පුරුදු වෙන්න අවුරුද්දක් යයි. තැන පුරුදු වෙන්න ම අවුරුද්දක් අපතෙ යවන එක අපරාධයක්. ඉවසන්න අමාරුයි සමහරකට. නමුත් මේ සුමාන දෙක ඉවසුව නම් ඒ අනුව එයා සම්පූර්ණ මිනිහෙක්."

"මෙතැනදි විතරයි ඒ අත්දැකීම ලබා ගන්න අවස්ථාව තියෙන්නෙ."

පැරැන්නන් හා නවකයන් මෙසේ එකට වෙලී අල්ලාප සල්ලාපයේ යෙදී සිටියදීත් කීර්තිසේන පැත්තකට වී කුළුණකට හේත්තු වී දෙම්නස් ගතියකින් සිටිනු මම දුටුවෙමි.

"සේරම ඉවරයි ! එන්න" මම ඔහුගෙ අතින් අල්ලාගෙන කීමි.

"මොනාව ඉවර වුණත් මුන්ගෙ අමනුස්සකම්වලට මොකද වුණේ? ඒව එහෙම ම යි" කියමින් ඔහු මගේ අත ගසා දැම්මේය.

මම රාත්‍රියේ ම රට හුණුකැල්ලක් සොයාගෙන සරත් විජේනායක යන්න මකා දමා දොර පිට පැත්තේ නිමල් හතුරුසිංහ යනුවෙන් ලිව්වෙමි.

වකිතයක් බියක් සැකයක් නැතිව සති දෙකක අතීතය දෙස එමෙන් නොව යුත් අවුරුදු අනාගතය දෙස ද බැලිය හැකිය. අපි විශ්ව විද්‍යාලයය නමැති සමාජයේ සමාන අයිතියක් හා උරුමයක් ඇති සාමාජිකයෝ වෙමු. රටේ අන් කිසිම අධ්‍යාපනික ආයතනයක

For E-Pusthakalaya

හැකි පහසුකම් හා වරප්‍රසාද සියල්ල භුක්ති විඳීමේ බලය දුන් අපටත් ඇත.

ශිෂ්‍ය නිවාසය, දේශන ශාලා, පුස්තකාලය, ක්‍රීඩා පිටිය සියල්ල අපේ ය. ඒ සියල්ලෙහි ව්‍යසනාවන්ත හා පොඩි උරුමක්කාරයෝ අපි වෙමු. විභාගයක් වත් අසතේ නොයවා සියලු පහසුකම්වලින් උපරිම ලාභ ප්‍රයෝජනයන් ලබාගෙන ඉගෙනුම් අතින් පමණක් නොව ඉන් බාහිර හැම අංශයෙන්ම පිරිපුන් මිනිසුන් කොටසක් ලෙස ජීවිතයටත් ලෝකයටත් පා තැබීමට තිබේ. ඒ ලෝකයෙහි - ජීවිතයෙහි කිසියම් ප්‍රමුඛ තැනක් අප වෙනුවෙන් සූදානම් ව ඇත. එතැන මුල් පියවර පමණි. තවත් බොහෝ ඉහළට නැගීමේ පහසුකම් ඇත.

අපගේ දෙමාපියන් පමණක් නොව මුළු රට ම ජාතියම අප කෙරෙහි තබන බලාපොරොත්තු නිෂ්ඵල නොකිරීමට, අප සඳහා කරන පවිත්‍රතායන් අපතේ නොදැමීමට අධිෂ්ඨාන කර ගන්නා අප තුළ - ජීවයෙන් හා උද්යෝගයෙන් පිරි අපගේ යොවුන් සිත් තුළ - තෙවසරක් ඇතුළත මෙහි දී ලබා ගන්නා දෙය අපට ද උපන් රටට ද යහපතක් පිණිස ම යෙදවිය යුතුය යන උදාර උතුම් සිතුවිලි පහළ වීම පුදුමයක්ද ?

අපට කලින් මෙහි පැමිණියවුන් සිතන්නට ඇතතේ ද අද අප සිතන ආකාරයෙන් ම විය යුතුය. නවක වධය මෙන්ම එහි අවසන පහළ වන මේ සිතුවිලි පරම්පරාවක් උරුමයක් මෙන්ම සම්ප්‍රදායක් ද වුණා විය හැකිය.

අලුත් හා පරණ වෙනසකින් තොරව උස් පහත් භේදයක් නොමැතිව සරසවි සමාජයට ඇතුළු වීමත් සමඟ පහළ වන මේ සිතුවිලි වල මහත් තවත් පැත්තකට කල්පනා කරගෙන යන කල ඇති වන්නේ අභිමානයකි.

මහා විද්‍යාලයෙන් ආ ශිෂ්‍යයා උපාධි අපේක්ෂකයකු බවට පත් වූයේ පුබ්බරුවකු පිහාටු ඉදී කුරුල්ලකු බවට පත්වන ආකාරයෙන් නොවේ. දළඹුවකු හරාගෙන සමනළයකු පිට වන්නාක් මෙනි. මේ පරිවර්තනයේ දී අපට ලෝකයෙන් වෙන් කර අප වටා අපූරුත් මෙන් වැඩෙන්නට වූයේ දෙවියනි, මේ අභිමානය ම නොවූයේද?

කොහොමවු උපාධියක් සඳහා සූදානමින් දෙවන වසර ගත කරමින් සිටි මහින්ද ගුණරත්න හා අතරත් ජනප්‍රිය ශිෂ්‍යයෙක් විය. වැඩි කල් යන්නට මත්තෙන් එවැන්නෙකු හා ළඟ ඇසුරක් ඇති කර ගත හැකි



වීම අපගේ සතුටට හා සැනසීමට හේතුවක් විය.

සරසවිය ගැන මෙන්ම බාහිර ලෝකය හා ජීවිතය ගැනත් බොහෝ දේ අපි ඔහුගෙන් දැන ගතිමු. අප ඔහු දෙස බැලුවේ පස් වැනි හය වැනි පංතිවල ළමයින් පාසලේ ක්‍රීඩාවට දක්ෂ ජනප්‍රිය වැඩිහිටි ශිෂ්‍යයකු දෙස බලන ඇසිනි.

අපේ ලෝකය වැඩිහිටියන්ගෙන් ද ගුරුවරුන්ගෙන් ද වෙන් වූ අපේ ම එකකි. කථිකාචාර්යවරුන් සිටියත් මාස කීපයකට උඩදී ගත කළ පාසලේ පැවැති ගුරු ගෝල සබඳතාවයක් නොවීණි. වයින් දමා මේසය මත තැබූ කල අත්පුඩි ගස ගසා නටන බෝනික්කන් මෙන් දේශනයක් කර ඉවත් ව යන ඔවුන් අපගේ ජීවිතවලට කිසිසේත් සම්බන්ධ කර සිතා ගැනීම පවා දුෂ්කර විය. අනෙක් අතට පාසලේ දී මෙන් නොව නිදහසක් පිළිබඳ කිසි ම බැම්මකට අසු නොවූ අපි හරි දෙය යයි සිතා වරදට සුමඟ ය යි සිතා නොමඟට ද වැටෙන තරමේ අසරණ තත්ත්වයකට පත් වූයෙමු. එවැනි අතරමංවීමක දී අධ්‍යාපනික කරුණකදී පමණක් නොව පෞද්ගලික ගැටළුවක දී අප පිහිට පතා ගියේ මහින්ද වෙතය.

දේශපාලනය ගැන උනන්දුවක් දක් වූ ඔහු තමාගේ මත බලෙන් අනුන් පිට පැටවීමට ගිය කෙනෙක් නොවේ. දේශපාලනය ගැන වැඩිපුර සැලකීමක් නො දක් වූ මට මහින්ද ළඟින් ඇසුරු කරන්නට පුළුවන් වුයේත් ප්‍රති විරුද්ධ අදහස් උදාසී ඉවසන්නට ඔහු තුළ පැවැති ගුණය නිසා ම විය යුතුය. ඔහු මේ සියලු අවබෝධය ලබා ගන්නට ඇත්තේ පේරාදෙණියේ ගත කළ වසර ඇතුළත දී පමණක් ම දැයි අප තුළ සැකයක් පවා පහළ වන්නට වූයේ අනෙක් එවැනි අය හා ඔහු සසඳා බලන කල්හි ය.

මෙහිදී විශේෂයෙන් අප යනුවෙන් සඳහන් වන්නේ ජයන්ත, ප්‍රේමසිරි හා මමත්ය.

මා මුලින් කුළුපගව කතා බස් කරන්නට පටන් ගත් දෙදෙනා ජයන්ත හා කීර්තිසේන බව මම කලින් ද කියා ඇත්තෙමි.

නවක වධය අවසන් වීමෙන් පසු වත් කීර්තිසේන කිසිවකු හා ළඟ ඇසුරක වැටුණේ නැත. ඔහු මුල සති කීපය ඇතුළත හෝ තරමක් වත් කතාබස් කළේ මා සමඟ පමණකි. ඒ සම්බන්ධය පවා මගේ පැත්තෙනුත් ඇති වුණු එකකි. ප්‍රේමසිරි වෙතට මෙන්ම මුලින් දැන ගත් හැඳින්නකු වශයෙන් මම ඔහු වෙතද ඇදුණෙමි.

Siddhika 15

For E-Pusthakalaya



ඔහු භූත ලෝක හා ග්‍රහලෝක ගැන උනන්දුවකින් කරුණු සොයන බවත්, අත බලා පලාඵල කීම විනෝදාංශයක් වශයෙන් කරන බවත් මම ඒ වන කලට දැන ගතිමි. ඔහු මේ විෂයන් ගැන කතා කළේ මහත් ආශාවෙනි. ඒ මිස උපාධිය සඳහා හැදෑරූ විෂයන් හැර අන් කිසිවක් ඔහුගේ ලෝකයේ නොවීය.

"මිස්ටර්, ඔය ක්ලික්ස්වලට වැටිල නම් කවදාවත් හරියන්නෙ නෑ" ඔහු සිප දවසක් මට කීය.

"මිස්ටර්" යනුවෙන් අනුන් අමතන්නට පුරුදු ව සිටි කීර්තිසේන අප විසින් හඳුන්වනු ලැබුවේ ද ඒ නමිනි.

"මචං", "උඹ", "බං", යනුවෙන් කතා කිරීම ඔහුගේ කෝපයට හේතුවක් විය. "මචං කීර්ති " යයි කී තරමින් ඔහුගේ මුහුණ තරහෙන් ලේ පැහැ ගත්තේය.

ග්‍රහ ලෝක, භූත ලෝක ගැන කතා කරන්නට හෝ අත බලවා ගන්නට හෝ කිසිවකු තමා වෙත පැමිණීම ඔහු දැඩි සොම්නසට පත් කළ කරුණක් විය. එසේ යා යුත්තේ තුන් වැන්නකුට නො පෙනෙන පරිදි හොර රහසේය.

එහෙත් යුවතියක තනි ව පැමිණ අත දිගු කළොත් ඔහු කිසි විටෙක පලාඵල කීවේ නැත. "දන් බෑ" නැතහොත් "මම දන්නෙ නෑ" යි කීම එකල ඔහුගේ ගතියයි. ඔවුන් යා යුත්තේ රංචුවක් වශයෙනි. අත් බලා අනාගතය ඔහු රංචුවම ම තේ බීම සඳහා කැන්ටීමට කැඳවාගෙන ගියේය.

නවක වධය අස්සෙන් ම දැන කියා ගත් ප්‍රේමසිරි මා සරසවියේ දී ලද ප්‍රථම මිතුරා විය. ඔහුගේ මාර්ගයෙන් මම ජයන්ත වීරසිංහ හඳුනා ගතිමි. ප්‍රේමසිරි හා ජයන්ත සරසවියට එන්නට කලින් ම මිත්‍රයෝය. වැඩිකල් යන්නට මත්තෙන් අපි තිදෙනාත් මහින්දත් කණ්ඩායමක් වශයෙන් ඉතා ළඟ ඇසුරක බැඳුණෙමු. මහනුවර පේරාදෙණිය හිඳගල හෝ අන් ඕනෑ ම තැනක අප ඇවිදි ගියේ එකට ම ය.

නවක වධය අවසාන වී සතියකට හමාරකට පසු ව කාමරයේ මා නැති වෙලාවක් බලා මහින්ද වරක් තමා විසින් ගලවාගෙන යනු ලැබූ කුසුම්ගේ චිත්‍රය මගේ ඇඳ අසල බිත්තියේ අලවා තැබීය.

මිතුරන් සිතුවේ මේ චිත්‍රය තෑගි කළ කුසුම් මගේ පෙම්වතිය ලෙසිනි. මා නැතැයි කී නමුත් ඔවුහු එය නො පිළිගත්හ. මම එයින් කෝපයට පත් නොවීමි. ඒ වෙනුවට ඔවුන් කුසුම්ගේ නම මැදිකර



කළ විහිළු තහළුවලින් මගේ සිත කිසියම් රසයක් වින්දේය. එය තහනම් එකකැයි මම සිතිමි. තහනම් වුව ද මම අලුත් ආස්වාදයක නිමග්න වීමට ලොබ කළෙමි.

මුල් වාරයේ ම අපි කුලී බසයකින් සීගිරියට එක් දිනෙක විනෝද ගමනක් ගියෙමු. ප්‍රේමසිරි අයිරා හා හාද වූයේද ඒ ගමනේදීය. එදා රෑ ආපසු පැමිණි අපි ප්‍රේමසිරි වතුර ටැංකියේ ඔබා පෙම්වතකු ලෙස බව්තීස්ම කළෙමු. සංඝමිත්තාවේ සිය යෙහෙළියන් ද එසේම අයිරා වතුර බාල්දියකින් නාවන්නට ඇත.

මේ කියන අවුරුද්දේ පොසොන් මාසය නිම වන්නට ළං වන තුරුත් සරසවි බිමෙහි හා අවට කඳුකරයෙහි වසන්ත සිරිය නො අඩුව ඉතිරී වී තිබිණි.

මනස්කාන්ත කඳු පෙළ, ඒ පිසගෙන එන සිසිල් සුළඟ, සුළඟින් පැද්දෙන මල් පොකුරු සහිත තුරු ලිය, යුවතියකගේ සුන්දර මුහුණ, ඔවුන්ගේ නෙතඟ බැල්ම, සියල්ල කැටි වීමෙන් මැවුණු චමත්කාරය හා නිදහස!

පේරාදෙණි පැමිණි මුල් සතියක දෙකක කාලයේ පැවැති චංචලත්වය අවිනිශ්චිතකම හා බිය සැක පහව යෑමෙන් සන්සුන් වුණු සිත ආනන්ද ජනක අවට පරිසරයේ චමත්කාරයන් තුල්මත් වන්නට පටන් ගැනීම පුදුමයක් ද?

සවස් වරුවේ දේශනයක් නොවුණෙන් මම කෑමෙන් පසු ව පැයක් හමාරක් නිදා ගතිමි. දවල් කාලයේ නිදා ගැනීමෙන් ඇති වූ මුසල ගතිය දිය නෑමෙන් පහ ව ගියා පමණක් නොව ගතටත් සිතටත් අමුතු ප්‍රබෝධයක් දැනෙන්නට විය. ශාලාවේ දී තේ බී මා පුස්තකාලය වෙත පිටත් වුණේ රෑ වන තුරු ම පාඩම් කරන අදහස ඇතිව ය.

අපේ පාසලේ පංති කාමර හතක් අටක් එක් තැන් වූ තරම් විශාල කියවීම් ශාලාවේ, දොරටුවෙන් ඇතුළ වුණු විගස ම වුවද වාඩි වීමට තැනක් ලබාගත හැකි ව තිබිණි. එහෙත් මම අසුන් පේළි දහයක් පහළොවක් ම පසුකර එහා පැත්තට පිය නැගීමි. දැඩි නිහඬතාව රැකීමට කෙතරම් පරිස්සමින් අඩිය තැබුවත් මගේ සපත්තු වලින් සුළු ශබ්දයක් මතුවීම වලකනු නො හැකි විය. ශිෂ්‍ය ශිෂ්‍යාවෝ තනි තනිවත් ජෝඩු ජෝඩු වශයෙනුත් තැන තැන වාඩි වී සිටියහ. කීප දෙනෙකු හිස ඔසවා මා දෙස බැලූ සැටියෙන් මට සිතුණේ බොරුවට පොත් දෙස යොමා ගත් දෑ නෙත් ඇතිව වුවද ඔවුන් විසිරී ගිය අවධානයෙන් යුතුව සිටින්නට ඇත යනුවෙනි.

For E-Pusthakalaya



අන්තිමට මම වාඩි වුණෙමි.

පුටු දහයක් පමණ ඇති ඒ මේසයේ ම වූයේ එහා කෙළවර වාඩිගෙන සිටි ශිෂ්‍යාවෝ දෙ දෙනෙකි. ඔව්හු පෙරළා ගත් පොත් ඇති ව කුටු කුටු ගෑහ.

රහස් කතා කරන්නට අන් තැනක් නැද්දැයි මට සිතිණි.

සමහර විට මා පැය බාගයක් පමණ පාඩම් කරන්නට ඇත. ඉක්බිති මා අසලට ම පැමිණ වාඩි වුණේ යුවතියක බව මා දැන ගත්තේ මිදු පාවට යන්නම් සෙවණැල්ලක් මෙන් නෙත් කොනට අසු වුණු පාවියෙනි. ඇයගේ මුහුණ බැලීමේ කුතුලක් එහා මට ඇති විය.

ඇය පැමිණි සිටියේ ආස්වාද ජනක විලවුන් සුවඳක් ද කැටිවය. අප අවට වායුවට මුසු වුණු ඒ සුවඳ මා සිත නොසන්සුන් කිරීමට වන්නේය.

මම කියවමින් සිටි ඡේදය යළි මුල සිට පටන් ගතිමි.

ඉතා සියුම් සුසුම් හඬක් ඇය දෙසින් ඇසිණි. දැඩි නිශ්ශබ්දතාවය තුළ ඒ සුසුම් හඬ රිංගාගෙන ගියේ මගේ සිත ද අතරිනි.

දිය නැමෙන් උද නැවුම් ගතිය ගතත් සිතත් නව දුරටත් පුබෝධමත් කරමින් පවති.

කියවීම් ශාලාවේ දිග ලෑලි බැස්කුව මත තබා ගත් පොත දෙස යොමා තත් ඇස් ඇතත් මගේ සිත අවට ලෝකය වෙත ඇදෙන්නට වන්නේය. මෙහි එද්දී මේ වෙලාවට සරසවි තිබෙම් සාමාන්‍ය දර්ශනය මා ඉදිරියේ ඇඳිගෙන ගියේය.

මම හිස ඔසවා බැලිමි. මා අසල වාඩි වී සිටියේ ශිරෝමි ය. සියතට සමාන තිගැස්මක් මා තුළ ඇති විය. ශිරෝමි මනුරත්න මා මුලින් ම හැඳින ගත්තේ අපේ ශාලා උත්සවය පැවැති රාත්‍රියේය.

විනෝද ගමන මෙන්ම ශාලා උත්සවය ද පැරැන්නන් දැන හැඳින ගැනීමට නවකවරය ලැබුණු හොඳ අවස්ථාවකි. අයිරාත් සමග ඈ පැමිණ සිටියේ කවරකුගේ ආරාධනාවක් පිට දැයි මම විමසිලිමත් නො වීමි. ඇය අප හැම දෙනෙකු ම සමග නො පැකිළ කතා බස් කළාය. ශිරෝමි එදා මා සමග කතා කළේ කෙසේ ද මොනවාදැයි සිතන්නට මම උත්සාහ ගතිමි.

ශාලාංගණයේ ගස්වල හිය පාට පාට විදුලි බුබුළු වැල්වලින්



නික්මුණු මිශ්‍ර එළිය පතිත ව තිබුණෙන් ඇයගේ සාරිය මොන වර්ණයකින් යුක්තදැයි මට දැන් නිශ්චිතව කිව නොහැකිය. අහම්බෙන් මෙන්ම අප තැම පාර්සල් ගන්නට ගියේ එකටය.

ටිකකට කලින් ගායනය වුණු ගීතයක් ඇද ගනිමින් ශිරෝමි කතාව පටන් ගත්තාය. වැඩි වෙලාවක් යන්නට මත්තෙන් සිනමාව මාතෘකාවට අසු විය. ඈ සත්‍යජිත් රායි ගැන කතා කරන්නට වූයේ බෙංගලි සිනමාව ගැන පළල් දැනුමක් ඇති ව පමණක් නොවේ පොදුවේ තමාගේ විශාරදකම ගැන හැඟීමක් ද ජනිත කරවමිනි.ඇය පළ කළ අදහස් සියල්ල සඟරාවක වූ ලිපියක අඩංගු ව තිබුණු ඒවා බව මා දැන ගත්තේ කලකට පසුවය.

ඇයගේ කතාවට හවුල් වීමට තරම් දැනීමක් හෝ මුඛරිකමක් හෝ නවකයන් වූ අපට නොවිණි. අප සවන් දීගෙන සිටියේ කිසියම් පැහැදීමකින් ද යුතුය.

ශිරෝමි තනිකඩ එකියකැයි මට එදා ම සිතිණි.

දෙවැනි වසරේ එකියක හුදකලාව සිටින්නී කිසියම් හේතුවක් නිසා විය බව මම දැන් දනිමි. බොහෝ විට නවක ශිෂ්‍යාවන් වැටෙන්නේ දෙ වැනි තුන් වසරේ උපාධි අපේක්ෂකයන් සමග ය. ඒ අනුව ඇයගේ හිතවතා ගිය වාරය අවසන විභාගය සම්පූර්ණ කර පිටව ගියා වන්නට ඇත. එසේ නැතත් සමකාලීනයකු සමගම ඇසුකින් සිටියත් ඔහු විසින් ඇය හෝ ඇය විසින් ඔහු හෝ අත් හරිනු ලැබුවා වන්නට බැරිද ?

අනුන්ගේ මගුල් ජෝඩු මට මොටදැයි මම තරහෙන් යුතුව සිතිමි.

මගේ පයේ යමක් යන්තමින් ගැටිණි. මම පය මෑත් කර ගතිමි. මම අවසාන ජේළිය දක්වා නොකියවා ම පොත් ඊළඟ පිටුව පෙරළීමි.

ඇයගෙන් තවත් දිග සුසුමක්! මා දෙවැනි වරට හිස ඔසවා බැලූ කල අපගේ ඇස් මුණ ගැසිණි. ඈ සිණාසුණාය. කිසිවක් කීමේ වුවමනාවක් ඇයගේ මුහුණේ විය. උත්සාහයෙන් සිනාසෙමින් ම මම නැවත පොත දෙසට නෙත් යොමා ගතිමි.

මට සෝමා මතක් විය. සෝමා හා ශිරෝමි අතර සමානකමක් දකින්නට මගේ සිත ආශා කළේය. මෙතැනින් පිට ව යා යුතු යයි මට සිතිණි. එසේ ගියොත් මා බිය ගුල්ලකු ලෙස ඇය සලකනු ඇත. මා ගැන ඇතිකර ගන්නා ඒ අදහස මුළු සංසමිත්තාව පුරා ව්‍යාප්ත වනු නිසැක.

Buddhika 13

For E-Pusthakalaya



ගැහැනු ළමයින් සිය ගණනක් යෙහෙළියන් ලෙස ඇසුරු කර ඇති මා ඇය අසලදී මෙසේ කලබල වන්නේ ඇයි? අනවශ්‍ය කරදරයකට පත් විණැයි මම පසුතැවිලි වීමි.

මෙතැනින් ඉවත් විය යුතු යයි තීරණය කර ගැනීමෙන් පසු ව නැගිට යන්නට හිත හදාගත නොහැකි ව මම තවත් විනාඩි හතරක් පහක් එහි ගත කළෙමි. ඒ කාලය ඇතුළත මා ඇය දෙස එක් වරක් වත් නො බැලුවේ ඇයගේ බැල්මෙන් මගේ තීරණය වෙනස් වේතැ යි බියෙනි.

කියවීම් ශාලාවෙන් පිටව යා යුතු අන් තැනක් ගැන අදහස් මා තුළ නො විණි. මා පුස්තකාලයේ පියගැට පෙළ නැංගේ හැඟීමකින් තොරවය. මම තුන්වැනි මාලය තෙක් ගියෙමි.

පොත්. පොත්. පොත්.

රාක්ක පුරා පොත්.

දකුණට හැරී ඉතිහාස අංශයට ඇතුළු වූ මා රාක්ක දෙ පෙළියක් අතර පිය නැඟුවේ මේ සියල්ලෙන් හැකි ඉහළම ප්‍රයෝජනය ගැනීම සඳහා විනාඩියක් වත් අපතේ නො දැමිය යුතුය යන තීරණය අලුත් කර ගනිමිනි. සත්තු වත්තේ කුඩු පසුකරගෙන යන දරුවකුගේ සුන්දර සිතිවිලි මා තුළ ද පහළ වෙමින් තිබෙන්නට ඇත.

මම වීදුරු ජනේල් පෙළ අසල ඩෙස්කුවක් වෙත යද්දී එහායින් වාඩි වී සිටි තැනැත්තා කීර්තිසේන හෙට්ටිආරච්චි බව හඳුනා ගතිමි. පෙරළා ගත් පොතක් ඉදිරියේ තබාගෙන ඔහු යම්කිසි සටහනක් ලියමින් සිටියේය. ඔහු හිස ඔසවා මා දෙස බැලුවේ වත් නැත. අවට ලෝකයක් ගැන කිසි අදහසක් ඔහු තුළ නැතිවා විය හැකිය. ඒ වෙලාවේදීවත් මම ශාලාවේ දී කීර්තිසේන නො දුටුවෙමි.

මම කීර්තිසේනට ඩෙස් දෙකක් පමණ ඉස්සරහින් වාඩි වී අතේ තිබුණු පොත ඩෙස්කුව මත තැබීමි.

මම වීදුරු ජනේලයෙන් ඈත බැලීමි. ගිරෝම් ඇඳ සිටි සාරියේ වර්ණය අහස් කලය සීරු තැනක තැවරී තිබිණි. කඳු දෙස බලා සිටීමේ ආසාව තවමත් මා වෙතින් අග වී ගොස් නැත. අසිරිමත් සිදුවීමක් මගේ දෙනෙතට අසු විය. ඈත කඳු බෑවුමක් හරහා පොසොන් ඩැස්සක් දුවගෙන ගියේය. තවත් පැත්තකින් ආ හිරු රැසට අසුවුණු වැහි කුරු දේදුනු පාටින් බබලන්නට විය. විනාඩියකින් හෝ දෙකකින් පොදය නතර විය. කඳුකරයේ වැස්ස, වළාකුළු හා හිරුරැස් යන හැම දෙයක



ම ක්‍රියාකාරීත්වය ප්‍රාතිහාර්යයකින් මෙන් මොහොතින් මොහොත වෙනස් වෙයි.

තවත් වැස්සක් එන තුරු මම බලා සිටියෙමි. දුවන වැස්සක් ආවේය. එහෙත් ඒ වන විට හිරු මුවා වී තිබිණි.

සුදු වළා පෙළක් එක කන්දට සිට තවත් කන්දකට මාරුවෙමින් ගියේය. ගිරිමුදුනක් පිටුපස අහසේ වර්ණය බලා සිටියදී වෙනස් වන්නට විය.

අවට ලෝකයෙන් මා වෙන්වනු ලැබුවේ වැසුණු වීදුරු ජනෙල් පෙළිණි. මම පහත බැලීමි. සනාතන ශාලාවට මුවා වී තිබීම නිසා මට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් පිරුණු සරසවි බිම නොපෙනේ.

මම එතැනින් පිටවීමි. කීර්තිසේන හෙට්ටිආරච්චි ඒ වරත් මා දෙස බැලුවේ වත් නැත.

පිය ගැට පෙළ බට මා පුස්තකාලයෙන් පිටවෙත්ම වසින්නට විය. මේ වැස්ස වැඩි වේලාවක් නො පවතින බව දන දනත් මම කනස්සල්ලට පත් වීමි. පොත් ගුලක් කලා අංශයත් එකතු කළ වහළ යට ගල් කුළුණු අතර වූ තීනක හතලිහක පිරිස, වැස්ස නිසා එහෙන් මෙහෙන් දුවගෙන ආ අය ද නිසා තවත් වැඩි වූහ. මම ඔවුනතර දෙ නෙත් සිසාරා යැවීමි. දන්නා හඳුනන කීප දෙනෙක් මා හා සිනාසුණ හ. කිසිවකු හා කතා කරන සිතක් මට නො විණි.මා ළඟ ම වූ යුවළක වෙත මගේ බැල්ම යොමු විය. පොත් කීපයක් පපුවට තුරුළු කරගෙන කුළුණට පිට දී වූන් යුවතිය හා මට පිටුපා සිටි තරුණයා, අවට මහා පිරිසක් සිටින බවවත් නොදන්නා මෙන් මූහුණ බලාගෙන මොනවදෝ මුමුනති. ඇයගේ දෙනෙත් මා තුළ අලුත් සසල කිරීමක් ඇති කළේය. මම වුවමනාවටත් වඩා වැඩි වෙලාවක් ඇය දෙස බලා සිටි බව හදිසියෙන් තේරුම් ගෙන ලැජ්ජාවට පත් වීමි. ආදරයෙන් වෙළී ගිය දෙ දෙනකුට සමූහයක් මැද වුව ද හුදකලා වූ ලෙසින් හැසිරීමේ නිදහස මෙහි තිබිය යුතු ය. පෙම්වතුන් දෙස විපරමින් බැලීම අශීලාචාර කමකි.

මම ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් දත්වීම පුවරුව තෙක් ඇදුණෙමි. එතැන නතර වන අදහස ද මගේ සිතින් ගිලිහී ගියේය. මම කලා අංශය මැදින් ඉදිරියට ගමන් කළෙමි. තනි තනි ව, දෙ දෙනා හා කණ්ඩායම් වශයෙන් එහා මෙහා යන සියයක් හමාරක් මට ඒ විකට හමුවන්නට ඇත. මා යන තැනක් ගැන නියත සටහනක් නො මැතිව ගමන් කරමින් කලාගාරය අසල දෙරටුවෙන් පිට වන කල වැස්ස නතර

For E-Pusthakalaya

වී තිබුණි. මිටි නාප්පය උඩ පෙළට වාඩි වී, කවටකමකට සුදුසු දෙයක් හෝ කෙනෙක් හෝ අසු වන තුරු සම්ප්‍රජල්ලාපයේ යෙදී වෙන ද මේ වේලාවට සිටින පිරිස දක්නට නොවූහ.

ස්කූටරයක නැගුණු තරුණයෙක් පා ගමනට සරිලන තරමට වේගය අඩුකර, ක්‍රීඩා පිටියට යන තරුණියන් සතර දෙනෙකු සමග කතා කරමින් ගියේය. තනි සුදු බෙදුණු සායෙන් හා කමිසයෙන් සැරසුණු ඔවුන් අතක ටැනිස් පිත්තක් හා අනෙක් අතේ හෝ කරේ හෝ තද පාට පුලෝවරය බැගින් විය. ඉන් තිදෙනෙක් ම කොණ්ඩය කපලාය.

සමාන පිහාටු ඇති කුරුල්ලෝ එකට රංචු ගැසෙතැ යි බටහිර කියමනක් ඇත. තම තමන් අයත් වන්නේ කුමන පංති පදනමට දැයි ඉවතින් මෙන් ඔවුනොවුන් දන හඳුනා ගැනීමට මෙහි පැමිණි වැඩි කලක් ගත වන්නේ නැත. සමහරකු - මා හිතන විදිහට ශිෂ්‍යාවන් වැඩි දෙනකු - එකට කාණ්ඩ ගැසෙන්නේ ඒ පදනම අනුවය.

දිරාපත් ආර්ථික විද්‍යා අංශය ක්‍රමවත් ආර්ථික සංවර්ධනයක් ගැන ජාතිය දක්වන උදාසීනකමේ සංකේතයකැ යි ශිෂ්‍යයකු කලින් දවසක කී කතාව, පිය ගැට පෙළ නගින මට හදිසියේ නිකමට මතක් විය.

කැන්ටිමේ එක මේසයක් වත් හිස් ව නො තිබුණා තරම්. කතාවත් සිනාවත් එකතු වූ ඝෝෂාව හැම දෙයක්ම අර්ථ ශූන්‍ය කරමින් තැතිණි. මේසවලින් නැගුණු දුම් රොටු කිසියම් තැනකට ගොනු වීමට මෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හිස් ඉහළ එක පැත්තකට පාවෙමින් තිබිණි.

"ඒයි නිමල් මෙරෙන්"

මම මහින්දගේ කටහඬ හඳුනාගතිමි. ඔහු සමග රණසෝමත් ප්‍රේමසිරි හා අයිරාත් වූහ.

අත්තිම වසර ගත කළ රණසෝම දල්පතාදු අප දූත ගත්තේ මහින්ද මගිනි. මේස අතරින් ඔවුන් වෙත ගිය මම අයිරාගේ පුටුව ඇන්දට අත තබාගෙන නතර වී,

"තේ බිව්වද?" යි ඇසීමි.

"අපි බිව්ව"

"තමත් නෑ. තවත් හතරක් ගෙනෙන්" රණසෝම කීය.

මා කවුන්ටරය වෙත ගිය නාගත කල,

Buddhika 55



"තේ එපා නිමල් මට වොපියක්" ය යි අයිරා කියනු ඇසිණි.

"ඒයි අපට සිගරැට්ටුත් ඕනෑ" යි මහින්ද කෑ ගැසේය.

තේ කෝප්ප හතරක් හා වොපි පැකට්ද රැගෙන මා ආපසු ආ කල අයිරා ගෙල හරවා බලා, ළඟ මේසයේ සිටියකුට "එක්ස්කියුස්" ය යි කියාගෙන ම, එහි හිස්ව තිබුණු පුටුවක් මා වෙතට හැරෙව්වාය. ඊට ඉඩ සැලසීමට මහින්ද ටිකක් එහාට විය. මම කමිස සාක්කුවෙන් සිගරැට් දෙක එකවර ම එළියට නො ගත්තෙමි. ටිකක් පෙරැත්ත කරවීමට මට වුවමනා විය. මා එන්නට කලින් ඔවුන් කතා කරමින් සිටින්නට ඇත්තේ ළඟ එන මැතිවරණය ගැන ය. මහින්ද මහ ශිෂ්‍ය සංගමය සභාපතිකමට තරග කළේය.

"ඒයි නිමල් අපි උඹ ගැන කතා කර කර හිටියෙ"ප්‍රේමසිරි කීය.

"මට ඇහුණා"

"විහිළු නෙවි. උඹ අර ගිරාත් එක්ක යාළුවෙයන්. එතකොට මහින්දට සංඝමිත්තාවේ ඡන්ද ටික ගත්තැකි"

"සංඝමිත්තාවෙන් මේ ඉන්නෙ මම අයිරා දෙස නිකට උල්කර කීමි."

අපි හිටියට ඉතින් සේරම දෙනා දන්නවයැ නාම? ඒවගෙ යැ ගිරා?"

මගේ සිත උත්සාහ කළේ ටිකකට කලින් කියවීම් ශාලාවේ දී දුටු තරුණිය නැවත මතක් කර ගන්නට ද මතකින් පිටු දක ගන්නට දැ යි හරිහැටි මම ම නො දනිමි.

"ගිරා මා එක්ක ඊයෙත් කතා කළා ඔයා ගැන"

අයිරා දෙස රවා බලන්නට තරම් තරහක් මට ඇති විය. එය අසාධාරණ තරහකි.

"ඉලෙක්ෂන් එකෙන් මාව පරද්දදෙන්. උගෙ ඔළුවට නොමනා දේවල් නොද ඉන්න." මහින්ද කීවේ තලන්තැති ලතාවකිනි.

"ඒයි නිමල් මම උඹට පොඩි අවවාදයක්......"

"දිරව්ව ලණුවක්"

"හිටපල්ලකො කියන කල්. අල්ල ගනින් ෆයිනලිය කෙල්ලෙක්" රණසෝම විහිළුවක ගතියකින් තොර ව කීය.

For E-Pusthakalaya

"අනේ ඉතින් ඒ ළමය හිට වුණාම ඊළඟට අවුරුදු දෙකක් ම පාළුවනෙ"

" ඔය? ඔය ඉතින් දන්න හැටි"

අයිරා තමාගේ මෝඩකමක් හෙළි විණැ යි ඔවුන් දෙස මුකුළු බැල්මක් හෙළුවා ය. ඇයගේ බැල්ම සරසවි ශිෂ්‍යාවකට නොහොබී ය යි මට හැඟිණි.

"තුන්වෙනි අවුරුද්දෙ කෙල්ලෙක් අල්ල ගත්තම අවුරුද්දකින් ඒකි රක්ෂාවක. එතකොට උඹට පුළුවනි ඊළඟ අවුරුදු දෙකම කැම්පස් එකේ ඉන්න ඒකිගෙ වියදමින්"

අයිරා වැඩිපුර අපි තරමකටත් සිණාසෙමු.

"ඒක ලව් එකක් නෙවි. බිස්නස් එකක් ඔයා කළෙත් එහෙද?"

"අපි මුලින් ආ දවස්වල අපිට ඕව කියල දෙන්න එකෙක් මෙහෙ හිටිය යැ? ඒකයි මම මේ යන්න කලින් මේව මේ ගොල්ලට කියල දෙන්න හදන්නෙ."

"ඔව් ඉතින් වැරදීම් තුළින් ඉගෙන ගන්න අත්දැකීම් අනුන්ට පාඩම්" මහින්ද කීය.

"අලුත් කොල්ලන් සේරම ම මම දෙන පාඩම ඕකයි"

"හැබැයි ඒක පිළිගන්න අය අඩු ඇති"

"අයිර හිතන්නෙ ප්‍රේමසිරි වගෙ අනෙක් සේරම මෝඩයා කියල ද?"

"ඒ මෝඩකම මට හොඳා" ඈ කට උල්කර ප්‍රේමසිරිගේ බාහුවට අත තබා කීවා ය.

"ඒවයින් වැඩක් නෑ බං යමු යන්න"

"කොහොමද යන්නෙ?"

"මට යන්න තියනව බං කටුගස්තොට පැත්තෙ" රණසෝම කිය.

තමාගේ අත තිබුණු මොනිටර් එක්සයිස් පොතකින් අයිරාට මුහුණ මුවාකර ගත් මහින්ද රණසෝමගේ කණට කිව්වු වී,

"පලයල්ල කටුගස්තොට පැත්තෙ. හැබැයි මෙහෙට ගෙල්ක්තෙනෝ



පැත්තෙත් පලයන් මතක ඇතුව" යයි කීය.

" අපි යන තැන්වල නෑඩෝ ඒව" යි කියමින් රණසෝම ඔහුට වැරෙන් පහරක් ගැසීය.

"නෑ උඹලට එහෙ තියනව...."

රණසෝම පිටව ගියාට පසු වත් අපි තවත් ටික වේලාවක් කතා කරමින් සිටියෙමු.

"නිමල් උඹට තව තේ එකක් ඕනෑද?"

අයිරා අයා ගත් මුව අතකින් වසාගෙන මහින්ද දෙස මවිතයෙන් බලා සිටියාය.

"රස්සාවට තේ බොන එකයි වැඩේ"

"උඹ තේ බීල දියවැඩියාව හදගනින්. මම යනව යන්න."

මා ශාලාව වෙත ගමන් කලේ ද කිසි අරමුණක් ඇතිව නොවේ. දවස නිෂ්ඵල ලෙස අවසාන වේගෙන යතැයි සිතිවිල්ලක් රිංගන්නට පටන්ගෙන තිබිණි. තරමක තරහ ගතියක් දැනෙන්නට විය.

දෑත ම අතහැර බයිසිකලයකින් මට ඉස්සර වූ තරුණයා ආඩම්බරකාරයෙකැ යි මම සිතීමි. ඔහු ඒ විදිහට "කිසිං බෙන්ඩ්" වංගුව ගන්නේ කෙසේ දැයි බලා ගැනීමේ කුහුලක් මට ඇති විය. පාලමට ළං වෙත් ම ඔහු දෑතින් ම හැඬලය අල්ලා ගනු දුටු මට සතුටක් ඇති විය.

ශාලාව මිදුලේ: බැවුම අයිනේ, ගස් සෙවණේ මහ වැඩකට මෙන් කණ්ඩායම් වාඩි වී වුන්හ. පඩි පෙළ නැග ගත් මම, මගේ කාමරයට යන හැකි අතුරු තරප්පුව මඟ හැර ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වන්නට ගියෙමි. මිදුලෙන් නැගුණු හුව ගලහ පාරේ යමින් සිටි ශිෂ්‍යාවන් පිරිසකට විය යුතුය.

ගුවන් විදුලිය නො කඩවා හඬ දෙමින් තිබිණි. කිසිවකු සංගීතයට කන් නුදුන්නා වන්නට ඇත. ඒ හඬ අතරින් විවේකාගාරයේ කැරම් ලෑල්ලකින් ආ ටක් ටක් ශබ්දය ඇසිණි.

මම උඩු මහලට නැංගෙමි. නාන කාමරය පසු කරද්දී වතුර වැටෙන ඌරුහන් බාන ශබ්ද ඇසෙන්නට විය.

තුවායක් ඔතාගෙන, බුරුසුවකින් දත් මදිමින් අලස ගමනින් ඉදිරියට ආ ශිෂ්‍යයෙක් මට මුණ ගැසුණේය. මාරුවෙද්දී මම ඔහු දෙසට හදිසියේ අත දිගු කළෙමි. ඔහු නිරායාසයෙන් ම බඳ අල්ලාගෙන

Buddhika 25

For E-Pusthakalaya

වහා පස්සට පැන්නේය.ආපසු හැරී බලා අපි එකිනෙකා සමඟ සිනාසුණෙමු.

උඩුමහල පුරා පැතිර තිබුණේ පාළු ස්භාවයකි. මේ වේලාවට වැඩි දෙනෙක් පිටත ය. කවුරුත් තවමත් අලුත් අරමුණු අලුත් අද්දැකීම් සොයාගෙන යති. මේ තරම් ක්‍රියාශීලි පරිසරයක් මැද උකටලී ව මුළු ගැන්වීමට යෑම අපරාධයක් ලෙස මට සිතිණි.

කාමරයට ඇතුළු වුණු මම ඇඳේ වාඩි වී කමිසයත් සපත්තු දෙකත් ගලවා කොට්ටය පිටට තබා බිත්තියට හිස වදින ලෙස හරහට වැතිර ගත්තෙමි.

පාළු ස්භාවය කාමරය තුළ වඩාත් වැඩිය. කලින් ගත සිත ප්‍රබෝධමත් කල ගතිය තවමත් යන්තම් හෝ මා තුළ ඉතිරි වී පවතී. කාලය අපතේ යන්නට වීම ගැන තරහක් මෙන් ම කණගාටුවක් උපදින්නට විය. විසිර යන කඩි කුඹි මෙන් නොයෙක් දේ පිළිබඳ මතක අරමුණක් නො මැතිව සිතේ හලියන්නට විය.

"කබර ගොයා උගේ මනාලි - සොයා ඇඳේ නගා දියරැලී" යා බද කාමරයෙන් හෙන්රිගේ ගොරෝසු කට හඬ ඇසිණි.

දඩබ්බරකමක් පළ කළත් හෙන්රි ජයවීර සැහැල්ලු සිතින් දවස ගෙවූ. ප්‍රිය මනාප එකෙක් නොවේ ද යි මම කල්පනා කළෙමි.

"තිමල් මොකෝ මචං සයිකෝ ද?" මම තිගැස්සී බැලිමි. අඩක් විවෘත ව තිබුණු දොරෙන් කාමරයට හිස ඔබාගෙන සිටි හෙන්රි පිළිතුරක් දෙන්නට කලින් ඉවතට ගියේ දොර ද වසාගෙනය.

"අපෝ උඹ හවසටත් රැවුල කපන්නෙ අර ලංසි අම්මණ්ඩි දිහාට යන්නද?" විනාඩියක දෙකකට පසුව හෙන්රි කෑ ගසා ඇසිය. "අනේ බං උඹ නටන්න අල්ල ගන්නෙ කැරම් බෝඩ් එකක්නෙ."

ඔහු එසේ කියන්නට ඇත්තේ විජිත ගුණසේකරට විය යුතුය. විජිත දවසට දෙවරක් රැවුල බෑවේය.ඔහු මහය්යාවේ බර්ගර් කාන්තාවකගෙන් බටහිර නැටුම් ඉගෙන ගන්නට යන බවට කතාවක් ශාලාවේ පැතිර තිබිණි.

පුස්තකාලයේ හෝ කැන්ටිමේ හෝ තවත් ටික වේලාවක් රැඳී නො සිටීමෙන් කළේ මෝඩකමකි.ප්‍රේමසිරි හෝ මහින්ද හෝ දැන් ම ආපසු නොඑනු ඇත.

දේශපාලනය ගැන උනන්දුවක් දක්වන වැඩි දෙනා සම සමාජ



පක්ෂයට අයත් වුණත් කොමියුනිස්ට් පක්ෂයේ මහින්ද ජය ගනීතැයි සිතන්නට ද ඉඩ තිබේ. පෞද්ගලික ජනප්‍රියත්වය උඩ පක්ෂයට නැති වැඩි දෙනාගේ කැමැත්ත ඔහුට ලැබීමට පුළුවන. මහින්දට සරසවියේ හෝ ඉන් පිටතට හෝ පෙම්වතියක් නො සිටියාය. ඔහු ගැහැනුන් ගැන උනන්දුවක් නො දක්වා සිටීමට සමත් වී ඇත්තේ දේශපාලනය නිසා ය යි මම සිතුවෙමි.

ශිරෝමි මුනුරත්න ශිෂ්‍යාවන් අතර ජනප්‍රිය ය. කියවීම් ශාලාවේ තවත් ටික වේලාවක් ගත කළා නම් නිසැකයෙන්ම ඇය මා හා කතා කරන්නට ඉඩ තිබිණි. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත යුතු ව තිබුණේ මගේ වුවමනාවකට නොව මහින්දගේ යහපතටය. ඇයගේ මාර්ගයෙන් සංගමින්තාවේ ඡන්ද සෑහෙන ගණනක් ලබාගත හැකි ව තිබුණු බව කල්පනා වන විට යහළුවා වෙනුවෙන් යුතුකමක් පැහැර හැරී බවට පසුතැවිල්ලක් මට ඇති වෙයි.

ටික වේලාවක් කතා කරමින් සිටියා නම්, ඇගේ හැපි නැපී දෙඩමින් ම, අප එතැන සිට කැන්ටිම වෙත යා යුතුව තිබිණි.

මහින්ද, රණසෝම, ප්‍රේමසිරි හා අයිරා තමන්ගේ මේසය වෙත එමින් සිටි අප අත්පුඩි ගසා පිළිගන්නට ඉඩ තිබුණි.

"උඹත් හිච්චුනා ! හොඳයි වරෙන්කෝ"

"නෑ බං මම මේ ඉලෙක්ෂන් එකට...."

"ඔව් ඔව් එහෙම තමයි"

"තේ නම් බෑ. අපට කූල් ඩ්‍රින්ක්ස්"

ඊ කෑමෙන් පසු ඔවුන් මා වතුර ටැංකියේ ඔබනු ඇත. මගේ මුළු ගත සීතලෙන් හිරි වැටී ගියේය. මම ඇඳෙන් නැගිට, පිටුපස බැල්කනි කෑල්ලට ගියෙමි. මම අරමුණක් නැති කල්පනාවක වැටුණෙමි.

අම්මා විසින් දින කිහිපයකට උඩ දී එවන ලද ලිපිය ගැන මට මතක් විය. එය ලියා තිබුණේ කුසුම්ගේ අත් අකුරිනි. අම්මා අකුරු නො දන්නවා නොවේ. එක තැනක වාඩි වී කල්පනා කර ලිපියක් ගලපන්නට තරම් විවේකයත් වත් පුරුද්දක් වත් ඇයට නොවිණි.

සති අන්තයේ කුසුම් අපේ ගෙදර එන්නට ඇත.

මට අම්මාගේ වචන ඇසෙයි. ඇය කතා කරන විලාසය පෙනෙයි. අම්මා පමණක් නොව ඇයගේ කඩයත් අපගේ ගෙයත් මා

Buddhika 15

ඉදිරියේ මැවී යන්නට විය. මා දන් සිටින කාමරය වැනි දෙකක් තුනක් එකතු වූ කල අපේ ගෙය හා කඩය යන දෙකම ගිල ගත හැකි තරම් ය.

ගෙදර සිහිවෙත් ම කුසුම් මතකින් මොහොතට ගිලිහී ගොස් මල්ලිලා මනැසට අසුවෙති. සරසවියට ඇතුළු වීමෙන් පසු ව මුලින්ම ගෙදර ගියද ඔවුන් මා වටකර ගත්තේ ආදරයත් භක්තියත් මුසු ව ජීවයෙන් පිරුණු මුහුණු ඇතිවය. ඊ බෝවෙන තුරුත් එද, ඔව්හු ආසාවෙන්, මගේ නව ජීවිතය ගැන තොරතුරු හාර හාර අසන්නට වූහ. උඩඟුකමත් තරමට නොමේරූ ගතියක ආඩම්බරයක් ඔවුන්ගේ ඇස්වල නළියමින් තිබිණි.

"ලොකයිය නැති වුණා ම හරි ම පාළුයි." තිස්ස කීය. අනෙක් අය එය අනුමත කළහ.

"පාළුයි කියන්නෙ ඉන්න හිතෙන්නෙ නෑ." කීවේ රෝහණ ය.

"පාළුවක් දනෙන්න තමුසෙ දවල් දවසෙ ගෙදර ඉන්නව යැ?" මම සිනාසෙමින් කීමි.

"මම කොහේ හිටියත් ඉතින් සර් ගෙදර ඉන්නව කියල හිතුවමත් ඇතිනෙ." ඔහුගේ දෙනෙත් වල වේදනාවක් විය.

මා ගෙදර ගිය ඒ සෙනසුරාද තාත්තාට රෑ වැඩ යෙදී තිබිණි. මින් මතු එන දවස කල් තියා තැපැල් පතකින් වත් දන්වන ලෙස තාත්තා මට තරයේ කීය.

"තාත්තා ඔහොම කියන්නෙ ලොකු පුතේ උඹ එන දට නිවාඩු දලා ගෙදර ඉන්න." ය යි අම්මා කීවේ මවකගේ හුරතලයත් බිරිඳකගේ තොදෙල්කමත් මුසු හඬකින් හා ලතාවකිනි.

පවුලේ අප අතර මින් පෙර නොවුණු, නැතහොත් මෙතෙක් ප්‍රකාශයට පත් නොවුණු දැඩි සෙනෙහසක්, බැඳීමක් හා එකමුතුකමක් පිවතට පැමිණ අප සියලු දෙනා ඔවුනොවුනට තව තවත් ළංකර ගත් බවක් මට එහි දී අවබෝධ විය.

ඒ සති අන්තයේ කුසුම්ද ගෙදර පැමිණ ඇතැයි මම උදක් ම බලාපොරොත්තු වුණෙමි. ඇය හමු නොවීම ගැන මා පසුතැවිල්ලට පත් වූ නමුත් මා පිට ගියාට පසුව ඇය එක දවසක් වත් අපේ නිවසට නො පැමිණි බව ඇසීම මගේ සිතට සැනසීමක් ගෙන දුන්නේ ය.

අම්මාගේ ලිපිය සොයන අතර කුසුම් විසින් එවන ලද එකේ



හසුන ද මට අසු විය. මුල දී නො දුටු අලුත් දෙයක් සොයන අදහසින් මම කුසුම්ගේ ලිපිය යළි කියවීමි.

සිත කිසියම් තෘප්තියක් ඉල්ලන්නට විය. "එද ලා රෝස පැහැයකින් යුත් අහස ඉතා පැහැදිලිව තිබුණා" තරමක් හෝ විශේෂත්වයකින් ලියැවී තිබුණු මේ එක ම වැකිය මම නැවත නැවතත් සිතට කාවද්දා ගතිමි.

කෑ කෝ ගැසීමකින්, සිනාවකින් හෝ හුවකින් බස් රියෙක, දුම් රියෙක හෝ මෝටර් රියෙක හඬකින් වරින් වර බිඳෙමින් තිබුණු නිශ්චලත්වය තුළින් මතු වුණු බරක් මගේ සිතට ඇතුළු වන්නට විය.

ලියුම් දෙක ම සාක්කුවේ ඔබා ගත් මම කොරිඩෝවට බැස එහි කෙළවර දක්වා පිය නැගීමි. ඇඟට දනෙන තරමට සීතල දැඩිය. මම දෑත් පොරවා ගතිමි.

හිල්ඩා උයනේ මුළු ගසක්ම වසාගෙන වැඩුණු වැලක් ලා රෝස පැහැයෙන් යුත් මලින් පිරී තිබෙනු අතු පතර අස්සෙන් දකිය හැකිය. පරිසරයෙහි ජීවයක් ඇති බව හඟවන්නට මෙන් ශීඝ්‍ර ශීඝ්‍රයාවෝ එහා මෙහා යනු දක්නට ලැබෙත්.

යෝධ පක්ෂියෙකුට ගිලිහී විසිර ගිය පාට පාට පිහාටු මෙන් පැළ දිග අහස් තලය වෛවර්ණ වලා පෙළින් යුක්ත විය. වලා කැටිවල වර්ණයත් හැඩයත් පෙනී පෙනී වෙනස් වන අන්දම බලා සිටීම විනෝද ජනක ය. ටිකකට පසු ව ගුවන්තලය දුර්වර්ණ වෙත් ම කිසියම් බියකින් මෙන් මිදුම් කැරලි කඳු බෑවුම් ඔස්සේ පහළට දිග හැරෙන්නට පටන් ගති.

පෙර දිගින් පටන් ගත් අඳුරක් මුළු කඳුකරය වසාගෙන පැතිර යන්නට වන්නේ අනියත ශෝකී හැඟීමක් සිතේ ඇතිකරවමිනි. කුඩා තරුවක් දෙකක් විද්‍යාමාන වන්නට විය.

හිල්ඩා ඔබේසේකර ශාලාවේ අතරින් පතර කාමර කීපයක එළිය නැගිණි. යුවළක් සංඝමිත්තාව දෙසට ඇදෙමින් වූහ. එළිය කරා ළං වෙත් ම අවරින් ගලා එන අඳුරිරෙහි දිගට ම නිමග්න වීමට ලොබ කළවුන් මෙන් ඔවුන්ගේ ගමන තව තවත් බාල විණැයි මට සිතිණි.

මගේ සිතේ ශෝකයට බරව ඉපිදෙමින් පැවැති හැඟීම් බියක් බවට පරිවර්තන ය වන්නට විය.

For E-Pusthakalaya

මම ඔවුන් දෙස තරමක් ඕනෑකමින් බැලීමි. මේ ස්ථානයට පැමිණි පසු නුසුදුසුය යි මට සිතෙන වේලාවක, නුසුදුසු යයි සිතෙන වේලාවක, නුසුදුසු ය යි සිතෙන තැනක නුසුදුසු ය යි සිතෙන ඉරියව්වකින් තරුණයකු හා තරුණියක දකින අන් හැම අවස්ථාවක දී මෙන් මෙහි දී ද මගේ සිත තදින් සසල විය.

වේලාව, ස්නානය හා ඉරියව්ව පිළිබඳ ව සුදුසු නුසුදුසුකම් තීරණය කිරීමේ දී මා මෙහෙයවනු ලබන්නේ විශ්ව විද්‍යාල චාරිත්‍ර හා සම්ප්‍රදාය නොව සියලු වනිතාවෝ සීතාවෝ විය යුත්තෝ ය යි මා ස්ත්‍රිය ගැන දරන හැඟීම විසිනි.ඒ බිය කවරකු සඳහාද ?

ආලෝකයට නො කැමැති අන්ධකාරයේම නිමග්න වීමට තැත් දරණ අර යුවතිය හඳුනා ගැනීමට මගේ සිත උත්සාහයක යෙදිණි. හන්තාන කඳු පාමුල මහවැලි ගඟ බඩ මේ නිම්නයට පැමිණි ද සිට දක්නට ලැබුණු සියලුම ස්ත්‍රී මුහුණු මතක් කර ගන්නට මම වෑයම් කළෙමි. පැයකට හමාරකට කලින් පුස්තකාලයේ සිට පිටතට පැමිණි අවස්ථාවේ, කළු ගල් කුළුණකට පිට දී හිස ද පස්සට බර කරගෙන තරුණයෙකුගේ වත දෙස ප්‍රේමාවන්ධ ව බලා සිටි යුවතිය මතක් කර ගන්නට මම උත්සාහ කළෙමි. ඒ වේලාවේ දී ඇයගේ දෙනෙත් ශී උතුරමින් පැවතියේ. ප්‍රේමය ද? අද්‍රියානා ජීනෝ දෙස බලන්නට ඇත්තේත් ඒ ඇසින් ම නො වන්නේ ද?

වැස්ස අවසාන වූ පසු ඒ යුවළ එතැනින් බැස කොහි යන්නට ඇද්දැයි මට කල්පනා වූයේ සිතෙහි චකිතය වැඩි කරවමිනි.

පෙම්වතා සමඟ මා සිටින දෙසට පිටුපා තවමත් යමින් සිටින යුවතියගේ මුහුණ හඳුනා ගන්නට මගේ සිත නැවතත් උත්සාහ කරයි. කුසුම් හැර මා මෙතෙක් දක ඇති සියලුම ස්ත්‍රී මුහුණු මවා ගන්නට මම උත්සාහ කරමි.

ස්ත්‍රිය පිළිබඳ ඇති වූ පොදු බියේ දී මට මෙතෙක් කුසුම් මතක් වුණේ ම නැත. මා ඇය මීට කලින් දුටුවේ ළමා වියේ සීමාව නො ඉක්මවා, සදාකාලීන ව ම දැරියක ව සිට, මගේ පිවිතුරු ආදරය පමණක් භුක්ති විඳින්නට සිටින - අධ්‍යාත්මික තත්වයකට ළං වූ රූපයක් ලෙස පමණක් නොවේ ද?

දැන් මට මතක් කර ගත හැක්කේ එක ම මුහුණකි.

දෙවියනි, ඒ කුසුම්ගේ ය.

එතැනින් නතර නො විණි. මැදි මහ විදුහලේ සිටි පිරිමි



ළමයින්ගේ මුහුණු එකින් එක මගේ සිතෙහි ඇඳී යන්නට විය. මාරුවෙන් මාරුවට ඒ එක එක මුහුණ කුසුම්ගේ මුහුණට ළංව අඳුරේ ඇඳී යන්නාක් මෙන් මට පෙණිනි

## 7

දෙ සතියකට පමණක් සීමා වුණු කෙටි අගෝස්තු නිවාඩුව ලැබ මා ගෙදර යන විට ගොයම් කපා අස්වනු ගෙට ගෙන, නැවත වේලා අටුවේ තබන්නට කලින්, වී ගෝනි සාලයේ ගොඩ ගසා තිබිණි.

පාසල්වල නිවාඩුව ඇරඹුණේ ඊටත් දින කිහිපයකට පසුවය. ශිෂ්‍ය නිවාසයෙන් ගෙදර පැමිණි දට පසුවද උදේ ම කුසුම් අපේ නිවසට එන බව මම දැන සිටියෙමි.

පිනිබිඳු සහිත ඉපනෙලි හිරු රැසින් බැබළෙමින් තිබිණි. ගොයමින් තොර වුවද පාළුකම නිසාම පහළ වූ අමුතු කළ එළියක් වෙල් යායේ පැතිර ගියේය.

කුසුම්, පාරේ එහා කෙළවරින් මතු වූයේ මේ කළඑළිය පසු තල කරගෙනය. ඇය ඇස ගැසීමේ දී කිසි කලෙක ඇති නොවුණු තිගැස්මක් මට වහා දැනෙන්නට විය. මම අභ්‍යන්තරයෙන් දැඩි ලෙස නො සන්සුන් වීමි.

වෙල පසු කරන්නට ඇයට විනාඩි පහක් හයක් ගත වනු ඇත. මෙවැනි අවස්ථාවන්හි දී කාලය ගෙවී යන්නේ ඉතා සෙමින් බව කිව යුතුද? කාලයේ ගමන පිළිබඳ මේ ප්‍රමාදය පිරිමසා ගන්නට මෙන් ඇත දී ම මා දකින්නම කුසුම් අඩිය ඉක්මන් කළා ය.

මට සිනා ගියේ ය.

කඩියට ගොඩ නොවී එහි මිදුල මැදින් පිය නැගූ කුසුම් අම්මාට අසුවන්නට ගියාය. අම්මා කී දෙය මට ඇසුණේ නැත. "අනේ අනේ කුසුමේ උඹ දකින්න තියෙන අමාරුවක්" වැනි දෙයක් ඇයගෙන් පැවසෙන්නට ඇත.

"ඒක තේන්නම් නැත්දෙ මම මේ ආව නෙ" යි කියාගෙන ඇ එතැන් සිට ගෙය දක්වා දුවන්නට වූවාය.

Buddhika 25

For E-Pusthakalaya

අප මුණ නො ගැසී ගත වුණු මාස කීපය ඇතුළත කැපී පෙනෙන වෙනසක් ඇති කරවමින් ඈ උසින් මහතින් වැඩී සිටියාය. තාරුණ්‍යයේ ජීවයෙන් පමණක් නොව උතුරන සොම්නසකින් ද ඇයගේ මුහුණ පිරී තිබිණ. සතුට නිසා ඇයට එක වර කතා කර ගන්නට බැරි වුණා තරම්.

"ඇති යාන්තම් ආව"

"යන්තම් නෙවි. දුවල දුවල ආවෙ. යන්තම් ගස් අස්සෙන් ලොකයිය දක්ක විතරයි. මට ඉවසිල්ලක් නැති වුණා."

"දෙතුන් පළකින් වාඩි වෙන්න. කාලයකට පස්සෙ. දැන් මේ පැත්තේ එන්නෙ ම නැතිලු නෙ"

"අනේ කියන හැටි ! මම ඊයෙ ආවෙ වෙලාවෙ ඉඳල එළිවෙන්නෙ කොයි වෙලාවෙද කියල ආසාවෙන් බලා හිටියෙ..... කොයි තරම් ගොඩක් ජාති කතා කරන්න හිතේ තියාගෙන හිටියෙ ද?"

ඇය මගේ පා අසල පඩිය උඩ වාඩි වුණාය.

"හිතේ තියාගෙන හිටියනම් ඇති"

"හරි තරකයි. ආව ගමන්ම රන්ඩුවක් අල්ල ගන්න..... අනේ අපි ඉස්සර කාලෙ හරිම බයේ හිටියෙ. ජේරම වගෙ ගෑනු ළමයි අයියට මොකව වුණාද කියල ම යි කතා කළේ."

තවක වයස ගැන ඇයට තවම මතක තිබුණත් මට ඒ සියල්ල දැන් අතීතයට සම්බන්ධ නො වැදගත් සිදුවීම්ය.

"ඉතින් මොකාද කුසුම් ඉස්කෝලෙ පැත්ත ආරංචි මෙහෙ....."

"ඔන්න මට වෙලාවට තරහයිත්. හොඳද? ජේරම දෙනා මගෙන් ම යි අහන්නෙ නිමල් අයිය ගෙදර ආව ද? දැන් මහතද? උසද? ඔවගෙ ජාති"

තරහක් ගැන සඳහන් වුණත් ඇය නො නවත්වා කතා කරන්නේ දැඩි සොම්නසකින් හා සෙනෙහසකින් යුක්තව ය.

"ලොකයියගෙ ලියුමක් ආනම් තේද? මට බේරිල්ලක් නෑ. මුළු කැරේට යන්තම් බලා ගත්තොත් එච්චරයි. මල් වට්ටිය අතින් අනට යන ගානයි. අන්තිමට මගේ අතට එන්නෙ රැල්වෙලා....... ඇස්වහ ගන්නෙ නෑ මම කිව්වට. ලොකයියගෙ මූණ පාට වැටිල. ටිකක් මහතුත් වෙලා."



"මම නෙවෙයි කියන එක්කෙනා නම් උස ගිහිල්ල වෙනස් වෙලා ඉන්නව"

" ඔය ටිකට මම වෙනස් වෙලා ? එහෙනම් ඇහේ වැරැද්දක්."

"කුසුමෙ වරෙන් තේ වතුර ටිකක් බීල ඉන්න" කඩය පිටුපසට පැමිණි අම්මා කෑ ගැසුවාය.

"මට තේ වතුර නම් එපා නැත්දෙ. ටික ටික කතා කරල මදි ලොකයියෙ. මම වී ටික වනල ඉවර කරල ම ඉන්නම්."

"ඉවර කරන්න එපා. වේළල ගෙට ගන්න."

"මට පේනව වෙනස් වෙලා ඉන්නෙ කව්ද කියල" යි වාඩි වී වුන් තැනින් නැගිටිමින් කී ඇය මගේ පිටට පහරක් ගසාගෙන ගෙට ගොස් ආ පසු ආවේ මාගල් මිටියත් ද රැගෙනය. ඇය මිදුලේත් පසෙක තණ බිමේත් මාගල් එළන කල අම්මා පැමිණියාය.

"කුසුම් ලොකු අයියත් ඉන්න නිසා උඹට පාඩුවකුත් නැනේ. මේ ටිකේ දවස ගානෙම ඇවිත් මේ වී ටික වේළල අටුවෙ තියාදියන්...... හාලුත් ඉවරයි බං පරණ වී වලින් කල්දේරම් දෙක තුනක්වත් තිවාඩුව ඉවරවෙන්න කලින් තම්බල වේල ගත්තොත් සල්ලිවලට හාල් ගේන්න වෙයි."

අම්මා වී ගෝනි පිටතට ගන්නට කුසුම්ට උදව් වුවා ය. මම ද ඔවුන්ගේ සහයට ඉදිරිපත් වන්නට ගියෙමි.

"අනේ ලොකයියෙ මේ අලුත් වී වල කාටුව. ඇඟේ ගාගන්නෙ නැතුව එහාට වෙලා ඉන්න."

"උඹට බෑ. ලොකු පුතේ ඔය වැඩ."

අම්මා කවදත් මා ගැන සිතුවේ ඒ ලෙසටය. මා කුසුම්ටත් වඩා බාලයකු හා දුබලයකු ලෙසය.

අම්මා ආ පසු කඩයට ගියාය. කුසුම් වී ගෝනිය මාගල මත පෙරළා, කට ලිහා මුළු දෙකින් අල්ලාගෙන පස්සෙන් පස්සට ගොස් අනතුරුව, එසේ මාගල දිගේ වැගුරුණු වී පාර දෙපයින් තුනී කළාය.

මම ඇයට විශ්ව විද්‍යාලය ගැන දිගින් දිගට තොරතුරු කීමි. පඩිය උඩ වාඩි වී මට සවන් දෙන අතර ද වරින් වර ගොස් වී මාගල් වල පය ගෑමට ඇයට සිදු විය.

බොහෝ වේලාවක් අව්වේ සිටීම නිසා ඇගේ මුහුණ ද කරා හා

Buddhika 25

For E-Pusthakalaya

අත් මගාබ ද තවත් රන් පැහැ ගැන්වී තිබිණි. මට වුවමනා කළේ කතාවක් බහක් නො මැතිව ඒ මුහුණ දෙස බලා සිටින්නටය.

නිවස පුරා පැතිර ඇති නිශ්ශබ්දතාවය බියකට සමාන බියක් සිත තුළ ජනිත කරවී ය. අම්මාගෙන් කියැවුණු එක් දෙයක් නිතර නිතර මතක් වුණේ හදවත තැති ගැන්මක් ද ඇති කරමිනි.

"ලොකු අයියත් ඉන්න නිසා උඹට පාළුවක් නැහෙ කුසුමෙ"

ඇය කී කරුණ මම අද කුමක් නිසා වෙසෙසින් මතක් කර ගන්නෙම් ද? කුසුම් හා මා ගෙදර මෙලෙස තනි වූ පළමු වැනි දවස අද නොවේ. එහෙත් දැන් කිසි අවස්ථාවෙක නො දුනුණු නො සන්සුන් කමක් කැලැඹීමක් මා තුළ පවතී. චිත්ත ස්භාවය අසංවර ය යි කිලුටක් මට ම දැනෙයි. හුදකලා ගතිය තුළ බියක් දැනී යන්නේ එබැවින් විය යුතුය.

තිස්ස කොහෙදෝ සිට පැමිණ ඇය ළඟ ම කැරකෙන්නට විය.

"එක් කෙනෙක් අද මගෙ පස්සෙන් ම වැටිල ඉන්න කාරණාව ලොකයිය දන්නවද?" කුසුම් ඇසුවාය.

"ඔන්න කියන්නෙපා. කිව්වොත් අක්ක එක්කල මම තරහයි"

"කියන්න දෙයක් යැ? කිරිහොද්ද ගැන කවුද නො දන්නෙ"

තිස්ස මං වෙත ගල් කැටයක් දමා ගැසීය.

කුසුම් තවත් සිප දවසක් ම අපේ ගෙදර ආවාය. බෙහෙවින් බාහිර වශයෙන් සාමාන්‍ය ලෙස නිවාඩුව ගෙවී ගියේය. එහෙත් මම අභ්‍යන්තර කැලැඹීමකට පත් ව සිටියෙමි. ඇය ඉදිරිපිට එවැන්නක් නො පෙන්වා හැසිරීමට ආයාසයක් ගැනීමට මට සිදුවිය. අනෙක් අතට මා තුළ අමුත්තක් ඇති බවක් ඇයට වත් නො පෙනීම මගේ නො සතුටට හේතු විය.

මේ තත්වය කාලයක් යත තුරු මා කෙරෙහි බලපාන්නට වන්නේය. කිසියම් තීරණයක් ගැන දැඩි විශ්වාසයක් හා බලාපොරොත්තුවක් ඇති ව සති අන්තයක ගෙදර එන මා ආපසු ගියේ කිසිවක් සිදු නොවී වහාත් අවුල් සහිත බවට පත් සිතිනි. කුසුම් ද ගෙදර පැමිණ සිටි දවසේ මගේ සිත වඩ වඩාත් නො සන්සුන් වන්නට විය.

මා නැවත ගෙදර එන කල අලුත් ගෙයක් සඳහා අත්තිවාරම කපා තිබිණි. රෝහණ පාසලෙන් අස්ව වත්තක රක්ෂාවක ගොස් සිටියේය.



මා සරසවියෙන් පිට වන්නට කලින් ගෙයක වැඩක් පටන් ගැනීම උහුලන්නට බැරි බරකට කරදීමක් නො වන්නේ දැයි මේ ප්‍රශ්නය මතු වුණු සීප විටෙක මම අම්මාව මතක් කළෙමි. තවද මල්ලිලාත්, වසරින් වසර තරුණ විය වෙතටත් ඉහළ පංතිවලටත් යන බැවින් ඇඳුම් පැළඳුම් හා පොත පත ඇතුළු අනෙකුත් අවශ්‍යතාවන් සඳහා වියදම ද වැඩි වෙයි.

"ඒ වුණත් දැන් උඹට ය කියල යාළුවෙක් හෙම එක්ක එන්න හුළුවන් ද මේ ගෙට..... දැන් ඉතින් තාත්තත් ඒ තරම් නාස්ති කරන්නෙ නැනේ." යි අම්මා නො සැලී කීවාය.

අම්මා සිතන්නී විශ්ව විද්‍යාලයයේ මා හැර අන් හැම දෙනා ම ධනවත් ළමයින් බව ය. ඒ කවුරුත් මගේ මිත්‍රයෝ විය යුතුය.

රෝහණ ද මා මෙන් ම ඉහළට ඉගෙනුම ගනු දැකීම මගේ ආශාව විය. ඔහු ගැන අම්මා ගෙන ඇති තීරණයත් පවුල සම්බන්ධ ව මගේ සැලැස්මෙන් බැහැරය. එබැවින් මගේ සිත රිදුණේය.

රෝහණ හදිසියේ ගමෙන් පිට කිරීමට තුඩු දුන් කරුණ මට මුළු මනින් ම දැන ගන්නට ලැබුණේ නැත. ඔහු චාලට් නම් විවාහක කාන්තාවකගේ ගෙදරට යන එන බව අම්මා මට කලින් කියා තිබිණි. තරුණියන් සම්බන්ධ ව මලණුවන්ගේ හැසිරීම සැක කටයුතු ව තිබුණත් ඔහු හා චාලට් අතර කවර බැඳීමක් ඇති විය හැකි දැයි මට ප්‍රහේලිකාවක් වී තිබිණි. චාලට් මුදල් කඩා වඩා ගන්නට රෝහණ රවටාගෙන ඇතැයි සිතන්නට මම උත්සාහය කළෙමි.

කොටසක් තාත්තාගෙන් ද කොටසක් මල්ලිලාගෙන්ද කොටසක් අම්මාගෙන් ද වශයෙන් දැන ගත් සියල්ල එකතු කර ගත් කල පවා කතාව සම්පූර්ණ නොවීය.

මෙහි සාරාංශය ලෙස කිව හැක්කේ චාලට් හා හාදවී සිටි මර්සෙලිස් ද රෝහණ ද අතර විශාල ගැටුමක් වන්නට ගිය බවකි.

"ඒකෙන් මේකෙන් ඉගනීමත් නැති වුණා" මම අම්මා ඉදිරියේ කීමි.

"ඒකෙන් කමක් නෑ. දෙවෙනි සීනියර් පාස්කර ගත්ත එක මට ඇති. මම බයේ හිටිය ඒකවත් කර ගනී ද කියල"

ඇත්ත වශයෙන් රෝහණ මේ තරම් දුරටවත් ඉගෙන ගනී දැයි මා තුළ ද එකළ විශ්වාසයක් නොවීය. ඔහු රක්ෂාවකට යැවීමෙන්

For E-Pusthakalaya

අම්මා ගත් පියවර බුද්ධිමත් එකකැයි පසු ව මටත් ප්‍රත්‍යක්ෂ විය.

පළමු වැනි වසරේ විභාගයට පෙනී සිට සිංහල අවුරුද්දට මා ගෙදර යන විට අලුත් නිවසේ බිත්ති ජනෙල් මට්ටමට ඉදි වී තිබිණි. ඊ පිටු පසින් ගොස් දනට පදිංචි ගෙට ඇතුළු වෙත් ම දෙ නෙතට එකවර අසුවන තරම් වෙනසකට මා දුටුවේ අලුත් ගොඩනැගිල්ලට මුවාවීම නිසා පරණ එක අඳුරට අසු වී ඇති බවය. බිත්ති තවත් ඉහල ගොස් වහළ ද එ වන විට මේ අඳුර තව තවත් වැඩි වනු ඇත.

අලුත් ගෙට උචිත වන පරිදි එහි කුස්සි කාමර ලෙස භාවිතයට ගනු පිණිස පරණ ගෘහයේ වෙනස්කම් වගයක් කරන්නට ඇති බවක් කී අම්මා.

"ලොකු පුතේ උඹ එනකල් මම හිටියෙ. එහෙම හොඳද ?" යි ඇසුවාය.

මෙහි දී මගේ මතය විමසීම ගැන වූවද තෘප්තියට පත් මම අම්මාගේ අදහස අනුමත කළෙමි.

රෝහණ ආවේ නො නගතයට දවස් තුනකට කලිනි. රක්ෂාවේ වගකීමත් පරිසරයත් විසින් ලබාදෙන ලද තලතුනාකමක් ඔහු වෙත එක වර ම දක්නට ලැබිණි.

ඔහු අලුත් ජීවිතය ගැන සෑහීමකින් හා ආශාවකින් කතා කිරීම අම්මාගේ සතුටට හේතු විය.

"ඒ වත්ත බොහොම කරදර තිබුණු තැනක්" ඔහු අපට කීය. "වටේ ගම්වල මිනිස්සු හොරකම් කරනව. කම්කරුවො කලබල කරනව. ඔව මේව. මම ගියාට පස්සෙ නේද? කිසි දෙයක් නෑ. දැන් මුළු වත්ත මීයට පිම්බ වගේ"

"ඒ වුණාට දෙවනිට වෙන රක්ෂාවක් හොයන්න බලන්න එපා ඉන්න එපා"

"මම නම් රුපියල් දහක් ලැබුණත් වෙන තැනකට යන්නෙ නෑ.... ඇරත් වත්ත අයිති මහත්තයා මට යන්න දෙන්නෙත් නෑ. සුපිරින්ටැන්ඩන්ට් නමට ඉන්නෙ. මම තමයි සේරම බලාගෙන ඉන්නෙ. සර් එන්නෙතො දවසක ඒ පැත්තෙ"

ඔහු මට කතා කළේ තමා යටතේ පවත්නා මහා පරිපාලනය ගැන හැඟීමක් මා තුළ ඇති කරවීමේ ආශාවෙන් මෙනි.



"බලමුකෝ පස්සෙ" යි මම ගණනකට නැති ව කීමි.

රෝහණ සිංහල අවුරුද්දට අප හැම දෙනාට ම රෙදිපිළි ගෙනාවේ ය. තාත්තා ගෙදර සිටියේ නැත. එද යී රෝහණ කඩදාසිවලින් හා මලුවලින් එළියට ගත් රෙදි ඇඳ මත ගොඩ ගසා එකින් එක අම්මාට පෙන්නුවේ ය. අපි වට වී මිල ගණන් ද මෝස්තර ද ගැන එකිනෙකාගේ අදහස් පළ කරන්නට වීමු.

ඒවා තේරීමේ දී අපගේ රුචි අරුචිකම් පිලිබඳ ව වෙන වෙනම මතක් කරගෙන තිබුණු ආකාරය ගැන කල්පනා කරන කල මට පෙනී ගියේ ඔහු චාරිත්‍රයක් විදිහටම සලකාගෙන නොව ආශාවකින් හා හිතවත්කමකින් තෑගි ගෙනැවිත් ඇති බවකි.

අම්මා සුදු පසුතලය මත දම් පැහැති පුංචි මල් ඉහිරුණු පොප්ලින් කෑල්ලක් ගෙන දෙ අත් දෙ පසට විහිදෙන ලෙස දිග හරිමින්, "මොකක් ද දෙවෙනි මේක?" ය යි ඇසුවේ කුහුලකි.

"ගවුම් රෙද්දක් ඇයි?"

"කාටද?"

"වෙන කාටද ඉතින් අපේ අයියගෙ නගාට මිසක්" රෝහණ මා දෙස බලා කීය. ඔහුගේ බැල්ම අර්ථවත් එකක් ලෙස මා තෙරුම් ගත්තේ සිතෙහි චංචලවීමක් ද ඇති ව ය.

"ඕක කුසුම්ට අම්මෙ. හොඳයි නේ ද?"

"කුසුමෙ නංගී වුණේ අයියට විතරක්ද? ඒකි උඹට කවුද කියපන් ඊට කලින්"

"අපි කාටත් නංගි අම්මෙ. අයියත් එක්කල වැඩිය එකතුයි. ඒකයි මම එහෙම කිව්වෙ."

"ඒක මිසක්"

"ඒක නෙවෙයි අම්මෙ කියන්න කුසුම්ට මේ රෙදි කෑල්ල නරකද කියල..... ඒ ළමයගෙ නෑනෙ වැඩිය මෝස්තර හෙම. ඒකයි මම ඕක තෝරල ගත්තෙ"

"ඒකි මෝස්තරකාරියෙකුත් නෙවෙයි. විසේකාරියෙකුත් නෙවෙයි." මාතෘකාවට හෝ අවස්ථාවට හෝ කිසි ලෙසකින් වත් උචිත නොවූ කටුක ස්වරයකින් අම්මා කීවා ය. "............................කෙල්ලො ඉන්න තැනක් වෙලත් මම බයක් නැතුව මේ බයක් මේ ගෙදරට ඒකි

For E-Pusthakalaya

ගෙන්න ගන්නෙ ඒකයි. උඹ ඒ ටික හිතේ තියා ගනින් දෙවෙනි"

"මම ඒ ටික හිතල හුඟක් කල් අම්මෙ"

"මොකක් ද දෙවෙනි උඹ හිතල තියෙන්නෙ?" සැකයකින් සසල වූ හඬකින් අම්මා ඇසුවාය.

"කුසුම් කොයි තරම් මේ ගෙදරට ආවත් වැඩ්ඩක් වෙන්නෙ ඉඩක් නෑ කියලි."

"හොඳට ම ඇති! උඹ ඒ ටික තේරුම් අරගෙන තියෙනව නම් පුතේ මට හොඳටම ඇති!"

රෝහණ හොරැසින් මා දෙස බලයි. මම ඔහුගේ ඇස් මඟ හරිමි.

අපි සහෝදරයෝ හය දෙනෙක් මෙහි සිටිමු. තිදෙනෙක් ම තරුණයෝය. අඩු තරමින් මම, රෝහණ හා විජය යන තිදෙනා ම කුසුම්ට වඩා වැඩිමල් ය. එහෙත් අම්මා දිගට ම කතා කළේ ඒක වචන ආමන්ත්‍රණයෙනි. යන්තමින් හෝ ඇය වෙත සැකයක් බියක් පවතින්නේ රෝහණ ගැන පමණකි. ගැහැනු ළමයින් සම්බන්ධ ව රෝහණගේ හැසිරීම සැකයට බියට භාජනය වීම පුදුමයක් නොවේ. කුසුම් ගැන නම් ඔහු පවා අහිංසකය යනු මට ස්ථිර ය. දෙවෙනි සහෝදරයා කෙරෙහි මා තුළ උපන්නේ අනුකම්පාවකි. තරමක වේදනාවකි, නිර්දෝෂත්වය - මගේ නොව රෝහණගේ නිර්දෝෂත්වය ප්‍රකාශ කරනු පිණිස කිසිවක් කතා කිරීමේ වුවමනාව මගේ සිතට තදින් දැනෙන්නට විය. එහෙත් කතා කරන්නට තරම් ධෛර්යයක් වත් අවංකකමක් වත් මට තිබේද?

"බලා ඉන්දැද්දී වගෙ ටිකක් උස ගියාට මහත් වුණාට කුසුම් තාම පුංචි කෙල්ලෙක්. ඉගෙන ගන්න ම හදනව මිසක් ළමිස්සියෙක් කියල මනමාලකමක් හෙම ඒකිගෙ හිතකවත් නෑ. ජේන් අක්කට වුණත් කවද හරි පිහිටක් වෙන්න ඉන්නෙ ඒකි විතරයි. " අම්මා වැඩි දුරටත් කීවේ රෝහණගේ සහතිකයෙන් සිය සැකබිය මුළුමනින් ම පහ නොවුණු ලෙසිනි.

මේවා සියල්ල මෙතැනට උචිත ද අවශ්‍ය ද යි මම කල්පනා කළෙමි. සමහර විට අම්මා කාලයක් තිස්සේ මේ අදහස් පළ කරන්නට වුවමනාවෙන් සිටියා විය හැකිය. කුසුම් තාමත් දැරියක බවත් යුවතියකැයි හැඟීමක් වත් ඇය තුළනො මැති බවත් අපට ඒත්තු ගැන්වීමට අම්මා වුවමනා කළා විය හැකිය. ඇය අන්තිම වචන පිට කළේ සැකයත්



බියත් මුසු වූ ස්වරයෙනි. සැකය හා බිය උසින් මනතින් වැඩි ගියත් කුසුම් තාමත් යුවතියක නොවේ යයි අපට අමතක වී ඇද්දැයි හැඟීමකින් පහළ වුණා වන්නට ඇත. ඇය තුළ තරුණකමක් ගැන හිතක වත් නැති බව මතක් කිරීමෙන් අම්මා බැගෑපත් ලෙස කරන්නට ඇත්තේ " අනේ පුතේ ඒකිගෙ ඔළුවට නොමනා අදහස් දමා මේ සියල්ල විනාශ කර දමන්න එපා" යන ආයාචනය විය යුතු ය.

"ඒකි මට නම් දරුවෙක් වගෙ"

"කුසුම් සහෝදරියක් නෙවෙයි, කියල වෙනසක් අපෙත් නෑ අම්මෙ" යි රෝහණ අප සියලු දෙනා වෙනුවෙන් කීවේ දැඩි හැඟීමකින් බර වූ හඬිනි.

සහෝදරයා උදාර පුද්ගලයෙකැ යි මට සිතිණි. අනෙක් අතට මා ගැන ම මට හැඟුණේ බෙලහීන ආත්ම වංචනිකයකු ලෙසිනි.

"කීයක් විතර ගියා ද දෙවෙනි මේ රෙදි ටිකට ?"

විනාඩියක දෙකක නිශ්ශබ්දතාවයකින් පසු අම්මා ඇසුවාය. රෝහණ සිණාසුනා මිස කිසිවක් කීවේ නැත. ඇත්ත වශයෙන් කතාව අන් මගක යොමු කළ යුතු ව තිබුණු නිසා නිකමට ඇසුවා මිස ඒ ප්‍රශ්නයට පිළිතුරක් අම්මා වුවද බලාපොරොත්තු නොවන්නට ඇත. ඈ කතා නැතිව ම, ඇඳ මත විසිර තිබුණු රෙදි ටික එකතු කර අල්මාරියේ තැබුවා ය.

අම්මා ඉර හඳ තරමට මා විශ්වාස කළාය. ඇයට රෝහණ ගැන මිස මා ගැන සැකයක් වත් නැත. එහෙත් ඇයගේ සැකයට භාජනය වන රෝහණ මේ කරුණු ගැන කල්පනා කර ඇත්තේ කලකට උඩදී ය. අනෙක් දැරියන් ගැන පිළිවෙත කුමක් වුව ද කුසුම් සම්බන්ධ ව සහෝදරියක නොවන බවක් ඔහු කල්පනා නො කරයි. හෘද සාක්ෂිය විසින් මට විරුද්ධ ව චෝදනා ගණනාවක්ම එල්ල කරන ලදී. සියල්ල පිළිගැනීම මිස ඒවායින් නිදහස් වීමට තරම් අහිංසක කමක් මා වෙත නැත.

ඊළඟ දවසෙක අපේ ගෙදර පැමිණි කුසුම් මඟ හරින්නට මට වුවමනා වුණා තරම්. මම ඇයට කෙසේ නම් මුහුණ දෙන්නෙම්ද?

අතීතය දෙස සිත යොමු කරවන්නට - අතීතය දෙස සිත යොමු කරවා එහිම රැඳෙන්නට - මම උත්සාහ කළෙමි. ළමා කාලයේ විවිධ අවස්ථාවන් සිහිපත් කර ගන්නට මම උත්සාහ කළෙමි. කුඩා තිස්ස උකුලේ රඳවාගෙන මා සමඟ වෙල් තීරයේ ඇවිදින්නට ගිය

For E-Pusthakalaya



දුරිය අනෙකකු නොව මේ කුසුම්ම නොවේදැයි සිතට ඒත්තු ගන්නට ගැනීමට මම මහන්සි ගතිමි.

මගේ ඒ උත්සාහයෙන් තීරණයක් වළංගු වූයේ කී දවසකට ද?

රෝහණ විසින් සිංහල අවුරුද්දට තෑගි කරන ලද රෙද්දෙක් මසන ලද ගවුමක්ද ඊට උඩින් අම්මාගේ චීත්ත රෙද්දක් ද ඇඳගෙන කුසුම් තඩය පිටු පසට එතු ඉස්තෝප්පුවේ සිටි මම එක උදයක දිටිමි. ඇයගේ එක අතක ලොකු පොල්කටු හැන්දක් ද අනෙක් අතේ කුල්ලක් ද විය.

එළිමහනේ ලිපයක තැම්බෙමින් තිබුණු වී කල්දේරම බාන්නට ආ ඈ සිය කටයුත්ත පටන් ගන්නට කලින් ගෙය දෙස බැලුවාය. අපේ ඇස් හමු විය. කුසුම් එතැන සිටගෙන ම සිනාසුණාය.

"ලොකයියෙ මම වී ටික වනල එන්නම්"

මා දුටු මේ කුසුම් තවදුරටත් දරියක නොවේ. චීත්ත රෙද්ද නිසා ඈ යුවතියක ලෙසින් උසට මහතට වඩාත් කැපී පෙණුනාය.

ඇය ගෙට එන තුරු මම නො ඉසිල්ලෙන් වීමි. මේ වයසේදී මානවයෙකුගේ හෝ මානවිකාවකගේ හෝ ගත වැඩෙන්නේ තනිව නොවේ. සිතත් සමග ය. කුසුම් ද මේ සොබාවික නීතියට අසුවන්නී ය. මේ බාහිර වෙනස ඇයගේ අභ්‍යයන්තර කෙරෙහි කෙතරම් දුරට බලපා තිබේ ද යි තීරණය කර ගැනීමේ කුහුලක් - නැති ගැන්මක් හා බියක් ද සමග මට ඇති විය. ඒ අරමුණ ඇති ව මම ඇයගේ හැම සිනාවල්ලක් ම, හැම වචනයක් ම, ඉරියව්වක් ම හැසිරීමක් ම ගැන වෙන වෙනම කැලකිලිමත් වෙමි.

මේ සියල්ල එකතු වන්නේ කුසුම් නව යොවුන් තරුණියක ය යන හැඟීම තව තවත් තහවුරු කිරීමට ය. ඇය උසින් මහතින් මෙන් ම බුද්ධියෙන් ද අවබෝධයෙන් ද වැඩී සිටින්නී ය.

ගතවූ අවුරුද්දක් පමණ කාලය ඇතුළත හැම නිවාඩුවක ම අපි මුණ ගැහුණෙමු. වෙනදා මෙන් කතා කළෙමු. එහෙත් මේ අතරතුර කුසුම් මෙසේ ටිකින් ටික වෙනස් වෙමින් පරණ ලෝකයක සිට අලුත් ලෝකයක් කරා ගමන් කරන බව මා තේරුම් ගත්තේ බියෙන් සසල වන සිතිනි.

බාහිර වෙනස අභ්‍යන්තරය කෙරෙහි කෙතරම් දුරට බල පා ඇද්දැයි අවබෝධ කරගත හැක්කේ ඇයගේ හදවතට එබී බැලීමෙනි.

Bodhika



එසේ ඇයගේ හද ගැඹුරට එබී බලන කවුළුව කුමක් ද?

අනාගතය කෙරෙහි ඇයගේ සිත යොමු කරවීමට මට නොයෙක් විට ඕනෑ විය. එය කළ හැක්කේ අධ්‍යාපනය ගැන කතා කිරීමෙන් පමණි.

නුපුදුසු ක්‍රියාවකැ යි චකිතය ඇතිව ම මම ඉගැනුම පිළිබඳ තොරතුරු ඔස්සේ ඇයගේ සිත අනාගතය කරාගෙන යන්නට උත්සාහ කරමි. චකිතය මැඩ ගන්නේ මම ඇයගේ ම යහපත සඳහා මේවා කතා කරමි යි නැවත මතක් කර ගැනීමෙනි.

කුසුම් සෙල්ලමට වැටී ඉගෙනුම අතපසු කැර ඇද්දැයි කල්පනා කරන්නට කිසි ම හේතුවක් හෝ පදනමක් හෝ නැත ද එබඳු සැකයක් සිතට නගා ගන්නට මම වෙහෙසුණෙමි.

ඉගෙනුම ගැන කතා කරගෙන ගොස් එක තැනකදී කල්පනාවට වැටුණු කුසුම්, හඬක් නැගෙන තරමේ දිග හුස්මක් පිට කර අනතුරුව මා දෙසට හැරී නැවත මුව පුරා සිනාසුණා ය.

"බය වෙන්න එපා. කුසුමටත් යන්න පුළුවනි වාසිටි"

"ඊට කලින් එස්. එස්. සී. අරගෙන ඉන්න එපා යැ."

"කුසුම්ට මහ දෙයක් යැ ඕක?"

"අයිය නම් කියයි. මට නම් හිතන කොටත් බයයි"

"හරි වැඩක්නෙ. මොනවටද ඔය තරම් බරට හිතන්නෙ?"

"හිතන්න දේවල් නැද්ද අයියෙ අපිට? අයියලට වගේ යැ"

මම ඇයගේ මුහුණින් නැවත සිනාව පලා යන හැටි බලා සිටියෙමි.හසරැලි ඇය වෙත මත හැංගිමුත්තන් කෙළින්නාක් මෙනි. මේ මතු වෙයි. මේ යට යයි. සිනාව ඇතත් නැතත් වෙනසක් නැත. ඇගේ වත පියකරු ය.

"මම ජීවිතයෙන් ගොඩාක් දේවල් බලාපොරොත්තු වෙන්නෙ නෑ අයියෙ........" කුසුම් බිම බලාගෙන කියන්නට පටන් ගනී.

"ඇත්ත කිව්වොත් මා ගැන නම් මම හිතන්නෙත් නැති තරම්. මට ලොකු සැප සම්පත් ගැන ආශාවක් නෑ. එහෙම ලොකු දේවල් ගැන ආසාවල් තියාගන්න අපට අයිතියකුත් නෑ. නංගීලට උගන්නගෙන අන්තිම කාලෙ හරි තාත්තටයි අම්මටයි නිවී හැනසිල්ලෙ ජීවත් වෙන්න තත්ත්වයක් හදා ගන්න පුළුවන් වුනොත් මට හොඳටම ඇති."

For E-Pusthakalaya



ඇය තමාගේ වයසට ඔරොත්තු නොදෙන තරම් බරක් සිතින් මවාගෙන පීඩා විඳිනැයි හැඟීමෙන් මා තුළ නො රිස්සුම් සහගත ස්වභාවයක් හට ගත්තේය.

සිතුම් පැතුම් බලාපොරොත්තු හා අපේක්ෂාවන් අතින් කුසුම් හා මා අතර සමානකම් සීපයක් ම විය. පවුලේ වැඩිමලා වශයෙන් අප දෙදෙනා වෙත ම පැවරී තිබුණේ එක ම වගකීමකි. අපි දෙදෙනා ම මේ බව තේරුම්ගෙන සිටියෙමු. එහෙත් ඇය තුළ නිතර පැවැතියේ මේ වගකීම් හා යුතුකම් ඉටු කරන්නට ශක්තියක් ඇද්දැයි චකිතයකිනි.

අපි දෙ දෙනා කිසියම් පොදු ඉලක්කයක් ඇතිව මහත් බලාපොරොත්තු ඇති ව එක ම ගමනක් පටන් ගතිමු. දැන් ඇය දහර මග දමා යන්නට මට සිදු ව ඇත. එබඳු චිත්ත පීඩනයකින් මගේ සිතට බරක් දැනෙන්නට විය.

මම අවල හදවතක පිළිබිඹුවක් බඳු ඇයගේ මුහුණ දෙස බලා සිටියෙමි. ම සිත්හි ජනිත අනුකම්පාව සෙනෙහසත් බවට වෙනස් වන්නට විය.

ජීවිත මගෙහි කුසුම් අතරමං වන්නට කිසි දිනෙක ඉඩ නො තබමියි මට සිතිණි. මගේ හැඟීම් ඇයට හෙළි කළ යුතුය. මේ ඒ සඳහා උචිත ම අවස්ථාවයි. මම සිතැඟි පිට කරනු පිණිස වචන සොයන්නට වීමි.

"මම ජීවිතය ගැන අනාගතය ගැන ඕනෑවට වැඩිය ලොකුවට හිතනව කියල ලොකයියට තරහයි ද?" ඈ හිස ඇළ කර අහිංසක ලෙස ඇසුවා ය.

"නෑ"

"එහෙනම් ඔය මූණ? නපුරුකමක් වගෙ මොකක්දෝ මූණෙ තියෙන්නෙ?"

"නෑ කුසුම් මම මේ කල්පනා කළේ......."

"බලන්නත් ඔය ගතියක් වගෙ එකක් අයියගෙ මූණෙ තියෙන්නෙ."

ඒ කතා කළේ අර දූරිය යි. මම නැති ගතිමි.

සිනාවෙන් පිරි ඇයගේ මුහුණ පුරා අකලංක හදවතක සෙවණැල්ල දිගටම වැටී තිබේ. යුවතියක වෙත තවමත් ඇදී සිටින



දූරිය දෙස මම කිලිටි සිතින් කෙසේ නම් බලම් ද? මම තවමත් කුසුම්ට සහෝදරයෙක්මි. ඉදින් මම කෙසේ නම් ඇය වෙනස් ආකාරයකින් දකිම් ද? කුසුම් පිළිබඳ ව මගේ හද තුළ කිසියම් රූපයක් ඇඳී තිබේ ද එහි අබමල් රේණුවක තරම් වත් වෙනසක් ඇති වන අන්දමින් ඇය ගැන සිතීම පවා පාපයක් තරමට බරපතළ වරදකි.

"කුසුමෙ ලොකු අයියත් ඉන්න [illegible] පාළුවකුත් නැතෙ. හැමදාම ඇවිත් මේ වැඩ ටික කරලා [redacted] අම්මාගේ වචන හදිසියේ මට මතක් විය.

## 8

වසරකට වරක් සංචාරක [illegible] නැට්ටුක්කාරියක ලෙසින් වසන්තය නැවතත් කඳුකරය චමත්කාරයට ගත් කරන්නට පැමිණ සිටියාය.

අපි දොළොස් මසකට උඩ දී තම තමන් තුළ පැවැති සිතුම් පැතුම් හෝ හැඟීම් හෝ අලුත් කරගන්නට කල්පනා නො කර ම චාරිත්‍රානුකූල ව නවකයන් පිළිගතිමු. වරදක් පිළිබඳ හැඟීමක් මොහොතෙකට මතු වුණත් ඔවුනට කරන්නේ යහපතක් ම ය යන සිතින් අපි චකිතයක් නැති ව නවකවධයට මෙහෙයවීමු.

කලබලකාරී මුල් සති දෙක තුන ගෙවී යෑමෙන් අනතුරුව එක් සවසෙක පේරාදෙණි පැත්තේ රවුමක් යනු පිණිස මහින්ද සහ මම ජයන්ත එන තුරු කැන්ටීමට වී සිටියෙමු.

සහබන්ධු හා හෙන්රි ද තේ බොන්නට ආවේ අප සමඟ ම ය.

"ඒයි මිස්ටර් " ය යි හෙන්රි කෑ ගැහුවේය.

එහා මේසයක යුවතියන් හතර පස් දෙනෙකුට මැදී වී සිටි කීර්තිසේන අපේ දෙනෙතට ලක් විය.

"කෙල්ලො ටික අද මිස්ටර් මරාගෙන වගෙ" සහබන්ධු කීය.

තරුණියන් වරින් වර නැගු සිනාව අතර කීර්තිසේනගේ කටහඬ යට වී ගියේ ය.

Buddhika 15

For E-Pusthakalaya

"මචං කීර්ති අපටත් කියපන්කෝ සාස්තරයක්." ය යි හෙන්රි කෑ ගැහුවේ ය.

එක යුවතියක ගෙල හරවා බලා හෙන්රිට රැව්වේ, ඔහු කෑ ද්‍රරවත් කට්ටකම් කරන්නට ගියොත් කීර්තිසේන නැගිට යතැ යි බියෙන් විය යුතු ය.

අන්තිමට ජයන්ත ආවේය. එහෙත් තනිව නොව අලුත් ශිෂ්‍යාවකද සමඟය.

ඔහු යමුනා දංගෙදර යනුවෙන් ඇය අපට හඳුන්වා දුන්නේය. මගේ සිතේ එක වර හට ගත්තේ කැළැඹිලි සහගත ස්භාවයකි. එහි මුහුණුවර හඳුනා ගන්නට මම අසමත් වීමි.

රූමතියක ම නො වුණත් යමුනා දංගෙදර ප්‍රිය මනාප පෙනුමකින් යුක්ත වූවාය. ඇයගේ සිහින් සිරුර එහි තිබුණේ සීගිරි අප්සරාවන්ගේ රූ සටහන්වලින් මුද්‍රිත රතු සාරියකි. ඈ පාටින් තලඑළළු ය. සිනාසෙන කල නිකටේ පුළියක් නැගෙන මුහුණ පියකරුය. මේ කිසිවකින් මම එක වර ම ඇය ගැන පැහැදීමකට පත් නො වුණෙමි. ඇත්ත කියතොත් යමුනා මා තුළ ජනිත කළ ක්ෂණික හැඟීම ප්‍රසන්න ජනක එකක් නොවීය.

"ඔයා මොනව ද කරන්නෙ?" යි මූලික කතා බහෙන් අනතුරුව හෙන්රි ප්‍රශ්න කළේය. ඈ කාලයකට මෙන් තමාගේ විෂයයන් කියාගෙන ගියාය. ඇයගේ පුල මුල සියල්ල දන්නා බවක් හඟවමින් කතා කළ ජයන්ත.

"මෙයා ශිරෝමි හෙම හොඳට අඳුරනව" යි කීවේ සහබන්දු එල්ල කරගෙන විය යුතුය.

සහබන්දුගේ මුහුණේ මතු වූ ඇඹුල් ගතිය තේරුම් නොගත් යමුනා, ඔහු කියන්නට ගිය කිසිවක බාධා කරමින් ම,

"ශිරා විසාකාවෙ නිවියෙ අපේ අක්කලත් එක්කල එක පතිංයෙ." යි තෙපලාය.

"අක්ක කොහෙද ඉන්නෙ?"

"අක්ක බැඳල බං. උඹ නිකා හිටිං" මම හෙන්රිට කීමි.

යමුනා සිනාසුණාය.

"ඇත්තමයි බැඳල. ඔයා කොහොම ද දන්නෙ?"



"ඇයි අපි නො දන්නෙ?"

සබකෝලය හා නවක ගතිය යටපත් කර ගන්නට ඈ අසමත් වූවාය. ඇය අප හා කතා කරන අතර පවා වට පිට බැලුවේ ප්‍රින්සිපල් දුන් දුන් එතැයි බියපත් ව සිටි පාසල් ශිෂ්‍යාවක ලෙසිනි.

ජයන්ත හැසිරුණේ උඩඟු බවක් ආරූඪකර ගෙනැ යි මට හැඟිණි. මගේ සිතේ කහට ගතිය වැඩෙන්නට විය.

"එහෙනම් උඹ දැන් පේරාදෙණි යන්න එන්නෙ නැතෙ" යි කී මහින්ද තේ කෝප්පය හිස් කළේය.

ජයන්ත කට උල්කර එක දිගට දුම් වළළු කීපයක් පිට කර සිනාවකින් මහින්දගේ කීම අනුමත කළේ ය.

යමුනා හෙන්රිගේ ඔළුවට ඉහළින් දුම් වළළු කෙමෙන් විශාල වෙවී යන හැටි ආශ්චර්යයක් ය යි සිතාගෙන මෙන් බලා සිටියාය.

කරුණු පැහැදිලි කිරීමක් - සමාව ගැනීමක් - වශයෙන් ජයන්තගෙන් කිසිවක් කියවෙතැයි මම බලා සිටියෙමි.

"පේරාදෙණි යමු වෙන දවසක"

"මමත් ගාඩින්ස්වලට ගිහිල්ල ම නෑ" යි නෙත් කොනින් ජයන්ත දෙස බලාගෙන යමුනා කීවා ය.

"බය වෙන්න එපා. තව කල් තියෙනව" හෙන්රි කීය.

"ඉස්සර වෙලා මේ ළඟපාත හරිය පුරුදු වෙමුකො" යි ජයන්ත කීවේ ඇය කැඳවාගෙන යා යුතු තැන් සම්බන්ධ ව දැනටමත් සිතේ ඇති සටහනක් ගැන ඉඟි කරන ලෙසිනි.

ජයන්ත හා යමුනා අපට කලින් කැන්ටිමෙන් පිට වූහ.

"ඌත් එහෙනම් කරත්තෙ බැඳ ගත්ත" යි පාලනය කරගත නොහැකි තරම් කලකිරුණු හඬකින් මට කියැවිණ.

"මොකද උඹට ඉරිසියද? ඔය ඉන්න ඕනෑ තරම්"සහබන්දු කීය.

"මම මෙහෙ ආවෙ ඒකට නෙවෙයි බං"

"ඒකටය කියල කැම්පස් ආව එකෙක් නෑ බං"

මහින්ද හා මා එතැනින් පිටවුණේ පේරාදෙණි යනු පිණිස කලාගාරය ඉදිරිපිට බස් නවත්තන තැනට ය යි මම සිතීමි.

Buddhika 23

FreeE-Pusthakalaya

"ඔන්න ඔහෙ පේරාදෙණි නොගිහින් ඉඳිමු ද නිමල්?" ආර්ථික විද්‍යා ශාලාව අසල දී මහින්ද කීවේය.

"ඕනෑ එකක්" ය යි මා කීවේ බිඳුණු හඬිනි.

"එම රවුමක් යන්නම්. ඉලැක්ෂන් එකටත් ලෑස්තිවෙන්න එපායැ?"

මම කතා නැතිව පඩි පෙළ බැස පාර පසු කළෙමි. මහින්ද මා සමග තාප්පය තෙක් ආවේය. සිරිත් පරිදි එතැන වැඩි වී සිටි පිරිස අතරින් කීප දෙනෙක් ඔහු හා කතාවට ආහ.

පුස්තකාලයට යන බවක් මා කීවේ අන් තැනක් ගැන කටට ආවේ නැති බැවිනි. තනිකමක් පිළිබඳ හැඟීම් උත්සන්න වන්නට විය. ඉතා හදිසියේ ශිරෝමි මගේ සිතේ මතු වුණාය. මම ඇය දක ගැනීමේ ආශාවකින් වට පිට බැලීමි. ගණන් කර බැලුවොත් සරසවි බිමේ තැන තැන තනිවද රැවු හා ජෝඩු පිටින් විසිර සිටින පිරිස දහසකට ළං වනු ඇත. මේ දහසක් දෙනා අතර මම හුදකලා වී සිටිමි. මුල් කාලයේ සතියක් දෙකක් යන තුරු ශිරෝමි මඳ සිනාවක් හා කතාවට වැටීමේ වුවමනාවක් ඇති ව එහෙන් මෙහෙන් මා මුණ ගැසෙන්නට ආවාය. මම ඇය මග හැරියෙමි. අන්තිමට ඇ ඇතක සිට මා දුටුවත් ඉවත බලා යන්නට පටන් ගත්තා ය. ඇය ගත වූ වසර ඇතුළත කාලයෙන් කාලයට කීප දෙනෙකුගේ ඇසුරෙහි ගත කරන බව මම දුටුවෙමි. සහබන්ධු එයින් එකෙකි. ටිකකට කලින් ජයන්ත සහබන්ධු දෙස අමුතු විදිහට බලා ශිරෝමි ගැන මතක් කළේ එබැවිනි.

අප පේරාදෙණි යන්නට සිටියේ වැදගත් කටයුත්තක් සඳහා ම නොවේ. මහින්ද දන්නා හිතවත් පවුලක් ගම්පල පාරේ පදිංචි සිටියහ. මසකට වරක් දෙකක් කාන්සිය ගෙවීමට එහි ගිය කල ඔවුහු අප කරුණාවෙන් පිළිගත්හ. ඇතැම් ඉරිදාවක උදේ ගිය අප දෙළ පාරකින් දිය නා පෙරළා ආවේ දවල් කෑමෙන් හා සවස තේ බීමෙන් ද පසුවය. ගෙදරින් බැහැරව සිටි අපට මේ ඇත්තන්ගේ ආගන්තුක සත්කාර මෙහෙවින් ප්‍රිය මනාප විය.

දින ගණනක් තිස්සේ සිතාගෙන සිටි යමක් නො ලැබී ගියායි කලකිරුණු පුත් වූ ගතියක් මට ඇති විය. සමහර විට ඒ හැඟීම පෙරහැරක්, කණකෙළියක් වැනි තැනක් වැරදී යැමේදී දරුවකුට ඇති වන දුකක් තරම් ළාමක වන්නට ඇත.

මම ශාලාව දෙසට පිටත් වීමි. මට දැනුණේ කිසියම් මලක නියමිත සුවඳක් නොවේ. අතුපතර වසා ගත් වර්ග සිය ගණනකට



අයත් විවිධ කුසුම් කැනිත් තිස්ම තුරු සෙවණ යට සිසිල් වායුගෝලයේ දී සංකලනය වුණු අමුතුම සුවඳකි. තාරුණ්‍යයේ සුවඳය.

අපාරමඟ දී මෙන් ම නවාතැනේ දීද මුණ ගැසුණු පුද්ගලයන් අතර කිසි අමුත්තක් හෝ විශේෂතාවයක් හෝ දක්නට නොවීය. කංඩිය උඩ වාඩි වී සිටින පිරිස, රේඩියෝව, කැරම්ලෑල්ල සියල්ල අන් ඕනෑම කැන්දැවක මෙනි. මේ අතරින් නැඟුණු කතාව හා සිනාව ඊට හවුල් වුවනට මිස අන් කිසිවකුට වැදගත්කමක් ඇද්ද?

ඇඳපැලඳගෙන පහළට ඇදෙන කීප දෙනෙක්, නාන කාමරයට ඇතුළු වන හෝ ඉන් පිට වන කෙනෙක්, ඌරුහන්බාමින් කොරිඩෝව දිගේ හදිසි කටයුත්තකට මෙන් ළඟි ළඟියේ ගමන් කරන කෙනෙක්. මේ හැමෝම - පරණ අය මෙන් නවකයන් ද මට පෙණුණේ උපන් ද සිට උදේ හවස දක පුරුදු මුහුණු ඇත්තන් මෙනි.

මා කාමරයට ඇතුළු වුණේ ද පුරුද්ද අනුව ම ය.

ජයන්ත යුවතියක සමඟ අපවෙත එනු දුටු මා තුළ ඇති වුණේ, ඇතුළත පිටත කිසිවක් නො සැඟවූ මිත්‍රයකු එක් වැදගත් කරුණක් පමණක් රහසිගතව තබාගෙන සිටි බව පිට කෙනෙකුගෙන් දැන ගත් කල උපදින වේදනාව නො වන්නේ ද?

අද දවල් ආහාරය ගෙන දේශන සඳහා නැවත ශාලාවෙන් පිට ව යන විටත් යමුනා දංගෙදර කෙනෙකු ගැන ජයන්ත දැන නොසිටි බව මට සහතික ය.

මා කලින් අනුමාන කරගෙන සිටියේ ඔහු ගෝතමී වීරකෝන් නම් අන් එකියක පිළිබඳ සිතින් පසු වුණු බවකි. ඔහු ගිය වාරයේ කීප වරක් ඇය ගැන වුවමනාවට වැඩියෙන් කතා කළේය.

"ජීවිතය පාළුවක් දැනෙන්නෙ නැද්ද ?" යි ජයන්ත මගෙන් ප්‍රශ්න කළේය. ඔහු ගෝතමී ගැනත් පාළුව ගැනත් සඳහන් කළේ ළඟ ළඟ ය. ජයන්ත යමුනා වෙත ඇදුනේ මේ පාළුවෙන්. අනට අසුවන තරම් දැඩි ලෙස මා අවට ද පැතිර පවතින මේ ඒකාකාරී ගතියෙන්, බේරී රැකවරණක් සොයාගෙන ද?

යුවතියක පිළිබඳ සිතක් පහළ වී පසු ව ඇය හාද කර ගැනීම වෙන ම ප්‍රශ්නයකි. ජයන්ත සවස තේ බොන්නට ආවේ දවල් කෑම ගනිද්දි වත් නොදැන සිටි එකියක සහකාරිය වශයෙන් තෝරාගෙන ය. ජීවිතාන්තය දක්වා රැකිය යුතු බැඳීමක් කෙසේ නම් මේ අන්දමින් පමණ ගත හැකි දැයි තේරුම් ගැනීමට මම අපොහොසත් වෙමි.

Pusthakalaya

යමුනා අංගෙදර මෙහි එන්නට කලින් කිසිවකුට පෙම් බැඳ නො තිබුණා ද යි කුහුලක් මගේ සිතට නැඟිණි. ඈ විශාඛා විද්‍යාලය ගැනත් සඳහන් කළාය. බාලිකා පාසලක උගත් නිසා සමහර විට ඈ පිරිමින් ඇසුරට නොවැටුණා වන්නට ඇත.

අනුන්ගේ මඟුල් ජෝඩු ගැන සොයන්නේ කුමට දැ යි අහන අනට මට මතක් විය. එය අශිෂ්ටකමකි. මෙතැන එබඳු තරඟ ගතියක් ඇත්තේම නැත. දෙමාපියන්ගේන් ද වැඩිහිටියන්ගෙන් ද ඈත් වූ සරසවිය අමුතු ම ලෝකයකි. කථිකාචාර්යවරුන් වෙසින් ගුරුවරුන් ඇතත් ඔවුන් ද අපගේ අධ්‍යාපනයෙහි - ජීවිතයෙහි - කොටසක් ය. ප්‍රශ්නය එත් නැගෙන්නේ මෙසේ පැත්තට වී කල්පනා කළොත් පමණි. සම්ප්‍රදාය විසින් බඳිනු ලැබූ අප අතර සමූහයක් වශයෙන් පොදු ගතියක් මෙන්ම එකිනෙකාගෙන් වෙන්වුණු පෞද්ගලිකත්වයක් ද වෙන ම ම පවතී. දෙ දෙනක එකතු වීම ඒ පොදු බවේ මෙන් ම පෞද්ගලිකත්වයේ ද ලක්ෂණයකි.

හත් අට දෙනා - හතර පස් දෙනා කාණ්ඩ ගැසී එහා මෙහා යන්නට පුරුදුව සිටි පිරිසක් අතර එකියක දින කිහිපයකට පසුව නිදිසියේ රංචුවෙන් ඉවත් ව තරුණයකු හා ඈගේ හැපී හැපී හිමින් දොඩමින් පාරක් දිගේ ඇදෙනු දක්නට ලැබෙයි. ඈ ඔහු අතට කුඩය දෙන්නීය. ඔහු එය දිග හැර ඇයටත් සෙවණ වන්නට අල්ලා ගන්නේය. බාහිර ලෝකයේ මුද්ද හා මාලය මෙන් මෙතැන කුඩය සංකේතයකි. අද දෙනෙකු එකතු වීම පිළිබඳ ලාංඡනයකි.

ජයන්ත හා යමුනා තවත් ජෝඩුවකි. අද්භූත ජනක අසාමාන්‍ය කිසිවක් ඔවුන්තර සිදු වී නැත. හැම වාරයක ම මෙබඳු එකතු වීම සිය ගණනක් මෙතැන සිදු වෙයි. එපමණයි. මා පෙළනු ලබන්නේ ජයන්තගේ ඇසුර අහිමි වීණැයි ඊර්ෂ්‍යාවකින් මිස අන් කිසිවක් විසින් නොවේ. මහින්ද ද මෙලෙසින් ම සිතනවා ඇද්ද? සැක සහිතයි.

“උඹ එහෙනම් පේරාදෙණි යන්න එන්නෙ නැද්ද?” යි ඔහු ඇසුවේ සන්සුන් ලෙසිනි. ඊටත් වඩා තමා මැතිවරණයට තරග නො කරන බවට අනුමානයක් කැන්වීමේ දී ජයන්ත වෙතින් යන්තමින් වත් පිට වුණේ නැත.

ඇත්ත වශයෙන් කලකිරීමට පත් විය යුතුව තිබුණේ මහින්දය. මේ වර මහ සිසු සංගමයේ තනතුරකට තරඟ කිරීමට ජයන්ත කැමැත්ත පළ කර සිටියේ මහින්දගේ ඉල්ලීමක් උඩ ය.



මහින්ද මාර්ස් ශාලාවට යන්නට ඇත්තේ තම සගයන් කතා බස් කර අනෙක් අපේක්ෂකයකු සොයා ගනු පිණිස විය යුතුය. තමා සමඟ එන්නැ යි ඔහු මට ද කතා නොකිරීම ගැන එවේලේ මා තුළ ඇති වූ විදීම අසාධාරණය. මා සංගම් කටයුතු ගැන කටයුතු ගැන උනන්දුවක් නො ගන්නා බව මහින්ද දැන සිටියේය. මෙතෙක් මා මැතිවරණ ගැන කතා බස් කළේ ජයන්ත තරග කිරීමට සිටි බැවිනි.

මහින්ද සසල වීමක් නැති ව ඕනෑම හැටළුවකට මුහුණ දුන්නේත් පාළුකමකින් හා හුදකලා ගතියකින් පීඩා විඳීමක් නොවුණේත් දේශපාලනයට ඇප කැප වී කටයුතු කළ නිසාද?

මා එකල දේශපාලනය දුටුවේ අනුන් හැඳීමට ගන්නා උත්සාහයක් ලෙසිනි. අප හැම දෙනා ම තම තමන් හැදෙන්නට උත්සාහ කළොත් දේශපාලනයක් ඕනෑ නැතැයි මම අදහස් කළෙමි. තමන් හැදීම අනුන් වෙනුවෙන් කළ හැකි උසස් ම දෙය වශයෙන් මම කල්පනා කළෙමි.

මම බැල්කනිය දෙසට ගියෙමි. මොහොතින් මොහොත සිය හැඩය වෙනස් කර ගනිමින් බටහිර අහස පුරා පැතිර යමින් තිබුණු රෝස පාට වලා කැටියක් දෙස මම බලා සිටියෙමි.

අතීතයට සම්බන්ධ සියල්ල බොඳ වී ඒ යටින් මගේ සිතේ අන්තිමට මතු වන්නේ, රෝහණ විසින් තෑගි කරන ලද, සුදු පසුතලය මත දම් පාට මල් වැටුණු රෙද්දෙන් මැසුණු ගවුමක් ඇඳගෙන අවුරුදු නිවාඩුව අග දී මා දුටු කුසුම්ය.

කුසුමින් බර වැලෙන් වෙලා ගනු ලැබූ රුක්ස ගස්. ඒවායේ සිසිල ගෙන දෙන සෙවණ. ලිය ගොමු අස්සේ - මාවත් මස්සේ ඇසෙන මිහිරි සිනා හඬ. නිසසල ව ගලා යන මහවැලිය සුදු වැල්ලෙන් පිරී නදී තෙර හා එහි කෙලවර සුළඟ බදාගන්නට ඒ මේ අත පැද්දෙන උණ පඳුරු. මේ හැම එකක්ම අලුත් කුසුම් ගැන සිතන්නට ඇය දෙස බලන්නට මා පොළඹවයි.

හන්තාන කඳු පාමුල සුන්දර භූමි භාගයක මේ ස්ථානය සැලසුම් කළ නිර්මාණ ශිල්පියා සියල්ල සකස් කළේ අපේ සිත් කල්තියා ම දැනගෙන ද?

ධෛර්යය, තීරණය, අධිෂ්ඨානය පිළිබඳ සියලු රූහන් පවවල් එකින් එක සිඳී බිඳී යන්නට වන්නේ ය. පාලනය කර ගත නො හැකි සිත ක්‍රියා කරන්නේ මගේ ම හතුරකු ලෙසිනි. එකල මනෝ තලය පුරා හැම තැන ම කුසුම් මතු වන්නට වූවාය.

Buddhika

For E-Pusthakalaya

ජයන්ත මුණ ගැසීමේ නො ඉවසිලිමත්කමක් මට දැනෙන්නට විය.

රෑ බෝවෙන විට සිරිත් විරිත් පරිදි මහින්දගේ කාමරයෙන් කීප දෙනෙකුගේ කට හඬ ඇසෙන්නට විය.

විශ්ව විද්‍යාලයේ උත්සවයන්හි දී බාල් නැටීමට විරුද්ධ ව උද්ඝෝෂණයක් මේ කාලයේ ශිෂ්‍යයන් අතරින් නැගෙමින් තිබිණි. ඇත්ත වශයෙන් මේ ව්‍යාපාරය මුලින් ම පටන්ගෙන තිබුණේ අප එහි යන්නට කලින් වසරේ ය. වැඩි දෙනෙකුගේ විරුද්ධතාව මැද එය අසාර්ථකවූ බව පැරණි ශිෂ්‍යයන්ගේ කතාබස්වලින් දැන ගන්නට ලැබිණි.

"එදා කැම්පස් එක නෙවෙයි අද. අද සෙන්ට්‍රල් වලින් ආව කොල්ලො කෙල්ලො සැහෙන ගණනක් ඉන්නව"

"ඕව නටන්න බැරි එවුන් ඕවට විරුද්ධයි"

"ඉන්නව නම් උඹෙ කවුරු හරි අරං වරෙන් බලන්න නටන්න පුළුවන් ද බැරිද කියල පෙන්නන්න"

"බොරු සදාචාරෙ නෙ බං ඕක"

"කුහක කම"

"තමන්ගෙ රටක් ජාතියක් සංස්කෘතියක් ගැන කතා කරන එක කුහකකමද ඩෝ?"

"උඹලගෙ නවකතාවලින් දෙන දර්ශනය නෙ ඕක"

අපි ඒ කතාවෙන් ම කෑම මේසයට ආවෙමු. ජයන්ත හමු වූණේ එහි දී ය.

"ඊයි ජයා නරඹ කරන්නෙ නෑ යි කියන්නෙ මහින්ද?" සිරිමෙවන් කීය.

"උඹ දන් ද දන්නෙ" යි මහින්ද ජයන්තගේ මුහුණවත් නො බලා කීය.

ජයන්ත වෙනුවට වෙනත් අපේක්ෂකයකු සොයා ගත යුතු ය යි ඔහු සවස කී දෙය මට මතක් විය. මහින්ද තුළ වූයේ දුර දක්නා නුවණක් ද මිනිස් සිත හඳුනා ගැනීමේ දක්ෂකමක් දැයි තේරුම් ගැනීමට මම අසමත් වීමි.



"ඔව් උං එන එකක් නෑ. මම දක්ක හවස කරත්තයක් දක්කගෙන යනව ගඟ පැත්තෙ" යි පද්මසිරි කීය.

"නෑ බං මුල ඉඳලම මගෙ කැමැත්තක් තිබුණේ නෑ. මහින්දගෙ කීමට......."

"මහින්ද අල්ල ගන්න එපා ඕකට. උඹ ඉලෙක්ෂන් එකට එන්න හිතුවෙත් ඕකටමයි. ඊට කලින් හිච් වුණා"

"හොඳයි උඹල ඔහොම කියනව නම් මම එන්නම්"

"අනේ එපා. උඹ නැවතියන්. උඹල වගෙ එවුන් යූනියන් වැඩ වලින් ගිය තරමට හොඳයි"

"හොඳයි අහපන් මහින්දගෙන් මම මුලදීත් බෑ කිව්වෙ නැද්ද කියල?

"මහින්දගෙන් අහන්න දෙයක් නෑ ජයන්ත. මේක මගෙ ෆෝත් ඉයරෙක. මේ අවුරුදු හතරට උඹල වගෙ එව්වො ඕනෑ තරම් දැකල තියෙනව."

ජයන්ත වාදයට ගියේ නැත. කෑමෙන් පසු ව ඔහු අනෙක් අයගෙන් මිදී මා සමග මිදුලට බැස්සේය.

ඔවුන් දේශපාලනය ගැන ම අලුතෙන් තව දුරටත් කතාව පටන් ගනිද්දී අපි ගස් සෙවණක අඳුර සොයා ඇදුණෙමු.

# 9

---

බස් රියෙන් බැස ගුරු පාර දිගේ පයින් ගමන් කරමින් වුන් මම වෙල අසලට පැමිණෙත් ම දුටු දර්ශනය නිසා සොම්නසින් තො සන්සුන් වීමි. වෙට්ලේ මේ පැත්තෙන් ඇතට අපේ අලුත් ගෙය කොහොම පෙනෙනු ඇද්දැයි මට කලින් කල්පනා වී තිබුණේ නැත. ඉදිවේගෙනඑන කාලයේදී මෙන් 'තොාව නිමාවට බක් ව ඇති අංග සම්පූර්ණ ගොඩනැගිල්ල වෙල ඉස්මත්තට පෙනෙන්නේ අපේ ම ගෙය විදිහට තොාව කොහේ දෝ අන් විසිතුරු තැනක් ලෙසිනි.

අපට වඩා ධනවත් පවුල් කීපයක් ගමේ ඇතත් ඒ කිසිවකුට මේ තරම් අලුත නවීන පන්නයේ ලොකු ගෙයක් ඇත. දුන් බලන කල බඹ

Buddhika-25

කීපයක් ඉදිරිපසින් පාර අයිනේ ම වූ අම්මාගේ පේ කඩයේ පුංචිකමත් පරණකමත් ලොකු වී පෙනෙයි.

මම දැඩි ආශාවකින් ගමන ඉක්මන් කළෙමි. මම අම්මා ගැන දුටුවෙමි. ඇය ගැන විමසන්නට තරම් ඉවසීමක් නොවිණි.

කඩය පසුකර මඳ දුරක් ගිය තැන මහත මැසිමක හඬ ඇසෙද්දී ම කුසුම් අපේ ගෙදර සිටින බව මට මතක් විය.

විනාඩි කීපයකට කලින් අතරමඟ දී ජේන් නැන්දලගෙ නිවස ළඟින් එද්දී,

"කෝ අක්කා?" යි මම මිදුලේ සිටි අනුලගෙන් ඇසීමි.

"ලොකු අක්ක එගෙ ගියා" ය යි අනුලාත්,

"බය වෙන්න එපා. නංගි පොඩ්ඩ එහෙදී මූණ ගැහෙයි." යනුවෙන් සෝමාත් කීවේ එකට ය.

මා ඉස්තෝප්පුවට ගොඩ වූණේ මුවග සිනාවක් ඇතිව ය. පෙනෙන තෙක් මානයේ කිසිවකු නොවූහ. අමුතුවෙන් පරිස්සම් වීමේ වුවමනාවක් තිබුණේ නැත. මම සපත්තු ශබ්දය යට පත් කරගෙන නැඟුණු මැසින් හඬ ඔස්සේ පියවර නැගීමි. මම උළුවස්ස ළඟ නතර වීමි. කුසුම් දොරට පිටුපා ජනේලය අසල මැසිම තබාගෙන වාඩි වී දොර රෙදි මසමින් සිටියාය. සාලයේත් කාමරයේත් පාළු ගතිය ගෙයි විශාලත්වය තවත් වැඩි කර මවා පෑවේය. මම කුසුම් දෙස මඳ වේලාවක් බලා සිටියෙමි. කාලය පිළිබඳ අදහසක් මට නො විණි. ගොදුරකට ඇඟෙන කපුරු සතකු තුළ පවා ආත්මාරක්ෂාව සඳහා තිබිය යුතු බිය හා සමාන වූ ගතියක් ඇති ව මා ඇයගේ ඇස් වසනු පිණිස ගිමින් ළං වූයේ කලින් තීරණය කරගෙන තිබුණු සැලැස්මක් උඩ ක්‍රියා කළ එකකු ලෙසිනි.

කුසුම් පුටුවත් පෙරළාගෙන ඉවතට පනින්න මහත මැෂිම වහා නතර වූයෙන් ඇසුණා නම් ඇසෙන්නට ඇත්තේ අප දෙ දෙනාගේ හදවත් සැලෙන හඬ පමණක් වන්නට ඇත. ඒ තාල දෙකකට නැඟුණු හඬක් විය යුතුය.

දැඩි බියකින් මෙන් ම වෛරයකින් - ද්වේෂයකින් දුර්වර්ණ වූ ඇයගේ මුහුණ මා කැතිගැන්වීමේ සමත් විය.

ආත්මාරක්ෂාවේ දී,මවගේ දුවට වශයෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුමයක් ලෙස මුළු මහත් ස්ත්‍රී සංහතිය ම සතු වූ



එඩිතරකමක් බඳු පෙනීමක් සියල්ල අතරින් මම හඳුනා ගතිමි.

වරදක් කළා නොවෙමි දැ යි පසුතැවිල්ලක් ඇයගේ දැස් දකිත්ම මොහොතකට මා තුළ පහළ විය. පිටුපසින් පැමිණ තමාගේ ඇස් වැසූ නැකැත්තා විජය නොව මා බව තේරුම් ගොස් නිමේෂ කීපයක් යන තුරුත් ඇයගේ මුහුණේ එම ගැහැනු පෙනීම ඉවතට ගියේ නැත.

"කුසුම් බය වුණා ද?" යන ප්‍රශ්නය නගා ගන්නට මම යන්තම් සමත්වීමි. ඇත්ත වශයෙන් වඩා බියපත් ව සිටින්නට ඇත්තේ ඇය නොව මම ය.

"මම..... මම..... හිතුව පුංචි අයිය කියල"

අනතුරුව සාමාන්‍ය ලෙසින් කතාබස් වුණත් අසාමාන්‍ය දෙයක් සිදු වූ බවට නො සන්සුන්කමින් මිදෙන්නට අප දෙ දෙනා ම අසමත් වන්නට ඇත. අප දෙදෙනාට ම මින් මතු සිසි දවසෙක සාමාන්‍ය තත්වයට - කලින් සිටි තත්වයට - පත්වන්නට නො ලැබුණු ඇත. ඒ අවබෝධයෙන් මගේ සිත තරමක් දුරට සැහැල්ලු විය. මම සැහෙන තරමට ධෛර්යවත් වීමි.


පසුබිම සකස් වී තිබේ. තවත් අවස්ථාවක් නො ලැබුණු ඇත. පිළිතුර කුමක් වුවත් මම ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතු වන්නෙමි.

කාමරයෙන් පිට වී ටික වේලාවකින් මා තේ කෝප්පයක් ර ගෙන කුසුම් වෙත ආපසු ගියේ තීරණයකට බැසගෙනය.

"කුසුමගේ හිතට බලෙන් රිංගන්න මං උත්සාහ කරන්නෑ" යි මා පටන් ගත්තේ සැහැල්ලු සිනිනි. "......... මම අහන ප්‍රශ්නයට විතරක් කෙලින් උත්තර දෙන්න. මම අවුරුදු ගාණක් ඉන්නම්. මම කුසුම් ගැන බලාපොරොත්තු තියා ගන්නද ?"

බරක් නැතිව පටන් ගත් නමුත් මට ඒ වචන ගිල ගන්නට අවංකව ම සිතුණේ ඇයගේ දෙනෙත් කඳුලින් තෙත් වන්නට පටන් ගත් කලය. ජීවිතය විසින් එල්ල කරන කල අභියෝගයක් ඉදිරියට පත් ව අසරණ වූ යුවතියකගේ නෙතට එක කඳුලක් ගුළි ගැසෙන්නට කොපමණ වේලාවක් ගත වෙන්නේදැයි සිතාගන්නට මෙන් මම ඇය දෙස බලා සිටියෙමි.

"හා ද? එපා ද? ඒක විතරක් කියන්න" යන ප්‍රශ්නය මොළයට හොරෙන් මගේ හදවතින් පිටවිය.



"මම දන්නෙ නෑ"

For E-Pusthakalaya

කුසුම්ගෙන් ඒ පිටවුණේ දුප්පත්කමේ,නෑතිබෑරිකමේ අසරණකමේ දුබල හඬ බව ඊට පසු වත් මම තේරුම් නො ගතිමි.

"කුසුම් කල්පනා කරල උත්තරයක් දෙන්න" යි කියාගෙන [illegible] කාමරයෙන් පිට වුණේ සියල්ල සාර්ථක ය යන නිගමනය නිසා [illegible] තෘප්තියෙන් පිනා ගිය සිත් ඇතිවය. තෘප්තියට අමතර ව කලක් උසුලාගෙන සිටි බරක් ඉවත් වුණු ගතියක් මගේ හදවතට දැනෙන්නට විය.

ඊට දෙ දිනකට පසු ව මට තිබුණේ තීරණය ස්ථිර කරවීමේ පමණකි.

එහෙත් එදත් ඇය හඬන කල - ඉකි බිඳ බිඳ හඬන කල, [illegible] ප්‍රමාද වුණා වැඩි ද යන සැකය වහා මට ඇති විය. මා ජීවත් වුණු ඉතාම දුෂ්කර අමාරු මොහොත එය යයි මම සිතමි.

"මම දන්නේ නෑ. නැන්දට මාව හරි විශ්වාසයි. මේ පිරිමි ළමයි ඉන්න ගෙදර මට මෙහෙම ඉන්න නිදහස දීල බය නැතුව ඉන්නෙ ඒකයි මට ඒ විශ්වාසය කඩන්න බෑ."

"ආදරය කරන එක විශ්වාසය කඩ කිරීමක් නෙවි කුසුම්. අපි ඒ ගොල්ලට දැන් ම කියන්න ඕනැ නෑ."

"මම දන්නෙ නෑ මට කරදරේක වැටෙන්න......."

"කුසුම්ට මාව අවිශ්වාසද.........? ඇයි කුසුම් ඉතින් අඬන්නෙ? ඔච් තියල විතරක් කියන්න."

"මම දන්නෙ නෑ. ඔයා කියන ඕන එකක්. අනිත්ව ඔයා බලා ගන්න..... මට බය නැන්දල........."

"ඒව මට බාර කරන්න. මම බලා ගන්නම්. ඕකට අඬන්න දෙයක් නෑ? "

ඈ එම වචනවලින් තමාගේ මුළු අනාගතය මුළු ඉරණම මා අත තැබුවාය. ඇය කතා කළේ මා කෙරෙහි මොන තරම් විශ්වාසයක් බලාපොරොත්තුවක් ඇතිව ද? මගේ පිළිතුර ද ප්‍රතිඥාවකි.

සියල්ල අමතක කළ හැකි වූ පසුත් සියලු චෝදනාවන්ගෙන් නිදහස් විය හැකි බව පෙනී ගිය පසුත් ඉදිරි කාලයේ දී මගේ [illegible] කළේ කුසුම්ගේ මේ ඉරණම සහගත [illegible] දුන් පිළිතුරකි.



තවත් ජීවිතයක වගකීමක් කරට ගත්තෙමැ යි බරක් වෙනුවට මට ඇති වුණේ ආත්මාභිමානයකි. කුසුම් පිළිබඳ වගකීම මට කෙසේ නම් බරක් විය හැකිද? මම කාලයක් තිස්සේ ගත කළ අවිනිශ්චිත තත්වය පහව සැකයෙන් බියෙන් තොර ව අනාගතය දෙස බලන්නට සමත් වීමි.

තුසුරුදු අත් දැකීමකට මුහුණ දීමේ දී හටගත් දැඩි චිත්ත වේගයෙන් පහව අප දෙදෙනාගේ ම සිත් තරමක් සන්සුන් වූ පසු ව, දෙමාපියන්ගේ කැමැත්ත ලබා ගැනීමේ ප්‍රශ්නය ගැන මගේ අවධානය යොමු කර වන්නට ඇයට වුවමනා විය.

"නැන්දල කැමති වෙන එකක් නෑ." යි ඇය වරක් කීවේ අදහස් වෙනස් කර ගැනීමට දැන් වුණත් ඉඩ ඇති බවක් මට හඟවන ආකාරයෙනි.

"ඒ ගොල්ල විරුද්ධ වෙන එකක් නෑ කුසුම්." ය යි කියන්නට තරම් ධෛර්යයක් හෝ පැහැදිලිකමක් හෝ මට නො විණි.

ඒ වෙනුවට එබඳු ප්‍රශ්නයක් මතුවන්නේ තව කාලයකින් දැ යි මා කියා ගත්තේ දුබල ලෙසිනි. මගේ දුබලකම ගැන මට ම තරහක් ඇති විය.

"කවද හරි මතුවෙනව නෙ"

"ඒක එදාට බලා ගනිමුකො."

"මම දන්නෙ නෑ. අම්මල කැමැත්ත ගන්න වෙයි."

මට වුවමනා කළේ අනාගතයේ විය හැකි අසුබ දේවල් සොයා බිය වීමට - තැති ගැනීමට නොව ප්‍රීතිමත් වර්තමානය මුසල කර නොගෙන එහිම ජීවත් වීමට ය.

"අම්මගෙ කැමැත්ත ගන්න බැරි වුණොත් ?"යන ප්‍රශ්නය මා ඇයගෙන් ඇසුවේ පිළිතුරු බලාගෙන නොවේ. "කව්රු විරුද්ධ වුණත් මට ඔයා නැතුව බෑ" යනුවෙන් ඇය කියනු ඇතැයි විශ්වාසයෙනි.

"අම්මගෙ හිතට ගින්දරක් දීල පව්කාරියක් වෙන්න මට බෑ" යි ඈ කීවාය.

මම කරුණු දෙකක් ගැන කල්පනා කර ඇයගේ මේ වචනවල බලපෑම යටපත් කර ගන්නට මහන්සි ගතිමි.

Buddhika 15

මුල දී විරුද්ධ වුවත් අප එක්සිත් ව සිටියොත් අම්මාගේ කැමැත්ත

ලබාගෙන ඇති ය යි මම විශ්වාස කළෙමි. ඒ නිසා දෙමාපියන්ට නින්දා දීමේ අවස්ථාවකට මඟ නොවෙනු ඇත. අනෙක් අතට ඇය මේ [illegible] කතා කළත් ප්‍රේමය වැඩී දෙ දෙනාට ම දෙදෙනා ඇති ව බැරි [illegible] අපේ ගෙදරත් තව තවත් ළං වූ කල්හි කුසුම් තනි කැමැත්තකින් [illegible] විවාහ වෙනු යි මා කරන යෝජනාවකට අන්තිමට එකඟ වනු ඇත.

මා දිගට ම තීරණ ගත්තේත් ක්‍රියා කළේත් මෙබඳු ආත්මාර්ථකාමී හැඟීම් අනුවය.

ගෙට ගෙවදීමේ උත්සවය කලින් ම කුසුම්ගෙන් වචනයක් ගන්නට පුළුවන්වීම වාසනාවකැ යි මම සිතුවෙමි. මගේ සතුට අංග සම්පූර්ණ විය.

පනහකට හැටකට නො අඩු ස්ත්‍රී පුරුෂයන් එකතු වී පිරිස් මණ්ඩපය බඳින, සැරසිලි කරන, පිටි කොටන, කැවුම් පුළුස්සන ගෙදර හදිස්සියේ දුවගෙන එන කෙනෙක් අම්මාගෙන් හා තාත්තාගෙන් මෙන් ම මගෙන් ද කිසිවක් ගැන උපදෙසක් අදහසක් විමසති.

"ඔය ලොකු පුතාගෙනුත් අහල කරන්න ඕනෑ." යි තාත්තා තවත් කෙනෙකුට කියනු ඇසෙයි.

අහංකාරකමට ළං වූ හැඟීමකින් මම උදම් වීමි.

"කතුර කොහෙද කියල මගෙන් අහන්න එපා මහතුන්. මට පිහියවත් නෑ. අර කුසුමක්කගෙන් ඉල්ල ගනින්." ය යි අම්මා නිස්සට කෑ කළාය.

"පලයන් කුසුමෙ පලයන් අර කුස්සිය දිහාවට. උඹ ගිහින් ඒකෙ බලා ගනින්." ඇය තවත් වරෙක විධානය කරනු ඇසිණි.

"කුසුමක්කෙ අතෙන්ට යකඩ ඇණ මදිලු"

"කුසුම් මෙගෙ හැද්ද පුවක් කපන ගිරයක් හෙම?"

"බලපන් දුවේ බලපන් ඔය සේරම තේ වතුර බීල ද කියල"

මගේ හදවත, හැම පැත්තෙන් ම මෙසේ කුසුම්ගේ නම කියැවෙන හඬ බාර ගත්තේ අනාගතය කෙරෙහි තැබුණු විශ්වාසය හා බලාපොරොත්තු තව තවත් තහවුරු කරමිනි.

උත්සවය වැඩට පමණක් නොව ඇ සොම්නසින් හා සතුටටත් හවුල්කාරියකි. මතුවට එහි වෙනසක් විය නොහැකිය. අම්මා විරුද්ධ වනු ඇද්දැයි බිය පදනම් රහිතය.



පිරිසට පැමිණි ජයන්තත් ප්‍රේමසිරිත් කුසුම් ගැන අතිශයෙන් පැහැදුණු බව ඔවුන් ඊට පසු වත් ඇය මතක් කර කළ කතාබහෙන් පැහැදිලි විය. කවුරු නම් කුසුම් ගැන නො පැහැදෙයි ද?

ජීවිතයෙන් මා ඉල්ලා සිටි සීමාසහිත බලාපොරොත්තු හා ප්‍රාර්ථනා ඉටු කිරීමේ දී සහකාරියක වශයෙන් මීට වඩා තවත් සුදුසු අන් තරුණියක ගැන සිතන්නටවත් බැරිය. මා පසන්නේ හුදකලා පැවැත්මක් නොවේ. විවාහයෙන් පසුව අම්මා හා තාත්තාත් මල්ලිලාත් අද මෙන්ම ජීවිතයේ කොටසක් වශයෙන් සිටිය යුතුය. එසේ කළ හැක්කේ යහපත් බිරිඳක සොයා ගතහොත් පමණි. අප සියලු දෙනා ම කුසුම් ගැන දනිමු. කුසුම් අප සියලු දෙනා ගැනම දනී. අපේ ගතිගුණ, පුරුදු රුචි අරුචිකම්, කන බොන දේ කිසිවක් ගැන ඇයට අලුතින් සොයා දැන ගන්නට දෙයක් නැත. ඇ කරුණාවන්තය. පරිත්‍යාගශීලිය. ලෝකය ගැන අවබෝධයක් ලබා ගැනීමට තරම් උගත්කමක් හා බුද්ධියක් ඇයට ඇත. ඉවුම් පිහුම් ඇතුළු ගෙදර දොර සියලු වැඩ කටයුතු ගැන දක්ෂ කමක් හා නිපුණත්වයක් ඇයට තිබේ. ගැහැණියක වෙත මීට වඩා තව කුමක් නම් බලාපොරොත්තු විය හැකිද?

විවාහය හා සම්බන්ධ ප්‍රශ්න ගැන කල්පනා කරන කල මගේ සිත උනන්දු වූ අන් කරුණක් විය. කාලයක් තිස්සේ දවසට පැය දහ අට බැගින් වැඩ කරගෙන එන අපේ අම්මා තුටු පහටු කරවීමේ සමත් ගැහැණියක සොයා ගැනීම පහසු නො වනු ඇත. හැඩවැඩ වී පුටු පිට වාඩි වී සිටින බෝනික්කන් වැනි ගැහැනුන් ගැන අම්මා සතුටු නොවනු ඇත. ඒ අතින් ද ගෙදරට හොඳින් ම ගැලපෙන්නේ කුසුම්ය.

ඇයගේ එක ම නුසුදුසුකම දුප්පත්කම පමණි. ඇයගේ අනෙක් ගුණාංගයන්ගෙන් නිසැකයෙන් ම ඒ පාඩුව නැති වනු ඇත. එකවර විරුද්ධ වුණත්, කරුණු කියා දීමෙන් අම්මා සතුටු කරවා ගැනීමට බැරි නොවනු ඇත.

මේ අනුව අනාගතය ගැන සුබ සිහින දකිමින් මම ඊළඟ මාස කීපය ගත කළෙමි.

අවුරුදු උත්සවය දවසේ කඩයේ වැඩවල නියුක්ත ව සිටි අම්මාට අවුරුදු කන්නට ගෙට ආ අමුත්තන් ගැනබලන්නට කරම්වත් වේලාවක් නොවිණි. සංග්‍රහ කිරීම් සියල්ල බාර වුණේ කුසුම්ටය. අප කළේ ඇයට සහාය වීම පමණකි.

අනාගතයක් ගැන මාස කීපයකට කලින් පැවැති බියක් එයින් හට ගත් දුක් දොම්නස් ආදියත් සියල්ල මට නම් අමතක ව තිබිණි.

For E-Pusthakalaya

සිත් සේ කතා කරන්නට අවස්ථාවක් ඉන් පසු ව ලැබී තො තිබුණෙ. ඇය හැසිරුණේ ද අභ්‍යන්තර අවුලක කිසිදු ලකුණක් පළ නොකරමින්.

"කුසුමක්කෙ කැට ගහමු." යි තිස්ස යෝජනා කරනු මට ඇසිණ.

"ලොකයියටත් කතා කරමු." යි ඇ කීවාය.

ගාමිණී එහි ආවේ මා එළියට එන්නටත් කලිනි.

"මුන්න මල්ලියෙ කලින්ම කිව්ව හොර කරන්න විතරක් බෑ" කුසුම් තර්ජනයක හඬින් පැවසුවාය. "......... හොර කළොත් ලොකයියගෙන් වොක්කක් ඉල්ලල දෙනව"

"ටොකු ලොකයියගෙ සාක්කුවෙ දාගෙන ඉන්නවද ඉල්ලල දෙන්න" යි ගාමිණී ඇසී ය.

"ඒක මම බලාගන්නම්කෝ ඒ වෙලාවට"

ඇය ඉඟි කළේ ජීවිතයේ හැම දෙයකට හවුල් කර ගන්නට, හැම දුක් ගැනවිල්ලක්ම ඉදිරිපත් කරන්නට තමාට සිටින එක ම නෑනැත්තා මා පමණක් ම බව නොවේ ද?

අපි සල්ලි මට්ටුවට කැට ගසන්නට පටන් ගතිමු. සහෝදරයන් අතරටම වැදී වුණු ඇය අපේ ම කෙනෙකු මෙන් ක්‍රීඩා කරන්නට වූයේ කුඩා දැරියකගේ සොම්නසින් හා කෙළිලොල් ගතියකින් ඉපිලීගෙන ය.

අපේම ජීවිතවල කොටසක් විදිහට ස්ථිර වනු මිස, සදාකාලික වනු මිස අපෙන් ඈත් වන්නට කුසුම්ට අයිතියක් වත් යුතුකමක්වත් නැත.

ටික වේලාවක් කැට ගසා මල්ලිලා පන්දු ගසන්නට ගිය තැන මා පේර ගස මුලදී කුසුම් කතාවට අල්ලා ගත්තේ අනාගතය ගැන සිහින සිය ගැන තනාව තොස් සොම්නසින් පිරුණු සිතකිනි.

අම්මාගේ සිත රිදවන්නට බැරි ය යි ඇ පටන් ගත් තැනම් කියන්නට වූයෙන් මගේ සිත එහෙම පිටින්ම මූසල වී ගියේය.

අම්මා පතන්නේ මගේ ප්‍රීතිය නම්, කුසුම්ගෙන් තොර ව ඒ ප්‍රීතිය මගේ ජීවිතයට ලඟා කරවා ගන්නට බැරිය. ඒ නිසා ඇයගේ විරුද්ධතා නොතකා ක්‍රියා කිරීම පාපයක් නොවේ. කුසුමට ඒන්න ඇන්වීමට මට වුවමනා වූයේ එයයි. කුසුම් ඒ කිසිවකින් බුරුලක් දක්වන්නේ නැත.



නිවි සැනසිල්ලේ කතාබස් කරන අවස්ථාවක් ලදොත් ඇයට තරුණු පහදා දිය හැකි යැයි මම විශ්වාස කළෙමි. අන්තිමට රූ රැජින තරගයට ඉදිරිපත් වල සෝමා සමග කොළඹ ගිය කල මුණ ගැසීමට මා ඇය කැමති කරවා ගත්තේ ඒ අවස්ථාව ලබා ගන්නා අටියෙනි.

කුසුම් හඳුනා ගත් මම එතැන ම නතර වීමි. මහ හෝටලයේ දෙවෙනි මාලයේ මා බමත් ගත් කොරිඩෝවේ දකුණු පසින් වූ කොටසේ රූප රැජිනිය තේරීමේ තරගය පිළිබඳ උස මහත මැනීම ආදි මූලික පරීක්ෂණ පැවැත්වෙමින් තිබිණි. තිරයක් පිටුපසින් සිටින්නට ඇත්තේ තරගයට ඉදිරිපත් වූ තරුණියන් බවත් පිටත ආසනවල වාඩි වී සිටියේ අවුන්ගේ දෙමාපියන් හා භාරකාරයන් බවත් මම නිකමට සිතා ගතිමි. තිරයට එහා සිදුවන දේ ගැන විපරමින් එහි බලාගෙන සිටි කාන්තාවන් හා දැරියන් කීප දෙනෙකු අතර අතුලා ද විය. ඇය වෙත යන්නට සිතමින් ම නැවත වටපිට බැලූ මම, මා සිටි කොරිඩෝවේ වම් පස වූ විශාල ශාලාවේ එහා ම කෙළවර ජනේලයක් අසලට වී, පිටත බලාගෙන තනිව ම වුන් කුසුම්, විදුරු දොරවල් පෙළ අතරින් හදිසියේ දිටිමි.මගේ මුවගට සිනාවක් නැගිණි.

දොරක් තල්ලු කර එහි ඇතුළු වූ මම යළි එතැන ම නතර වීමි. හත් අට සියයක් සහභාගි වන උත්සවයකට සෑහෙන මේ විශාල ශාලාව තුන් පැත්තකින් ම වට වූයේ උස විදුරු ජනෙල් පෙළකිනි. එක කෙළවරක පිළිවෙළට ගොඩ ගසන ලද පුටු ගොඩක් ද ශාලාවේ පාළු ගතිය තවත් වැඩි කළේය. තව තැනක වූ සැටිය කොතරම් ලොකු වුවත් ශාලාවේ දිග පළල නිසා මට දුනුණේ කෙළි බඩුවක් මෙනි. විදුලි පංකා නිශ්චල ව තිබිණි.

මම මෙහා කෙළවරේ සිට, මේ විශාලත්වයත් පාළු ගතියත් අතරින් එහා ම මුල්ලක සිටි කුසුම් දෙස මඳ වේලාවක් බලා සිටියෙමි. මීට පෙර එක් අවස්ථාවෙක, කුසුම් අපේ ගෙදර දොර රෙදි මසමින් සිටිය දී දොර ළඟ සිට මා ඇයට හොරෙන් බලා සිටියේ ද එසේ වන්නට ඇත.

අම්මා තුළ සැකයක් ඇති වේ ය යි බියෙන් කලින්දා ම කොළඹ පැමිණ මිත්‍රයකුගේ ගෙදර නතර වී මා පසුදා උදේ මහ හෝටලය බලා පිටත් වුණේ, මුළු ජීවිතයම කෙරෙහි බලපාන ගැටළු සහගත ප්‍රශ්නයක් ගැන ඇය සමග කතා කරගන්නට ඇති බවට හට ගත් බරත් දොම්නස් හා අවිනිශ්චිත ගතියත් විසින් අවුල් කරන ලද සිතින් ය. එහෙත් මා මෙහි සිටින බවක් වත් නො දැන, මට පිටු පා මුහුද දෙස යොමා ගත් දෙනෙත් ඇතිව හුදකලා වී වුන් කුසුම් දකින්ම මට

Buddhika 23

For E-Pusthakalaya

සියල්ල අමතක විය. සෙනෙහසින් ද සැහැල්ලුකමින් ද පිරි සිතින් මා ඇය වෙත ගමන් කළේ අර්බුදයක් ගැන කිසි ම හැඟීමක් නො මැතිව ය.

"මෙතනින් බිමට පනින්න එපා" මට ඇයට ඉතා ම සමීපව වෙනස් කර ගත් කට හඬකින් කීමි.

ඇය තිගැස්සී හැරී බලන කල මම තවත් සිනාසුණෙමි.

"මම බයවුණු තරමක්"

ඇයගේ මුහුණ අප දෙදෙනාගේ ම හදවත්වල කැටපත ය යි මම සිතිමි. මට දුනුණු හැම දෙයක්ම ඇයටත් දැනෙන බව, දුක් දොම්නසින් තොර කුසුම්ගේ වත පැහැදිලි ලෙස කියා පෑවේය. මම කුසුම්ගේ අතගෙන එහායින් වූ සෝපාව වෙත ගමන් කළේ. අයිතියක් පිළිබඳ හැඟීමෙනි.

"රූප සුන්දරය තෝරනව නම් මුලට එන්න ඔයාට පුළුවනි "

"මට? මම ලස්සන මිනිහෙක් යැ ?"

"හරි හැඩයි. අද හරි හැඩයි."

මට තෙරපෙන තරමට ළං ව අසුනේ වාඩිවෙමින් ඇය විසින් මා වෙත හෙළන ලද බැල්මෙහි වූයේ ආත්ම ගණනාවක බැඳීමකි. ඒ බැඳීම කඩා දමා මා අමතක කරන්නට ඇය අසමත්ය. බාහිර බලපෑමකින් ද එය ව්‍යසනයක් විපතක් නොවනු ඇත. අනාගතය ගැන බියකට කනස්සල්ලකට පත්වීමට හේතුවක් හෝ කරුණක් නොමැත.කොටින් කියතොත් අනාගතයක් ගැන සිතන්නට වුවමනාවක් නොමැත.

මා ඇයගේ අතින් අල්ලාගෙන හෝටලයේ සිට මුහුදු වෙරළට යන කල, සතුටකට වඩා බලාපොරොත්තු අලුත් වීමකට වඩා ඇත්ත වශයෙන් වූයේ ඇය කෙරෙහි අසීමිත ආශාවක් හා අනුකම්පාවක් පැතිර යෑමයි.

කුසුම් එහි දී අම්මාගේ විරුද්ධත්වය නොතකා විවාහ වීමට බැරි බවට තම තීරණය නැවත නැවතත් මතක් කළා පමණක් නොව අන්තිම මොහොත වන තුරු බලා නොසිට හිත හද ගැනීමට කල් ලැබෙන පරිදි දන්න ම වෙන් වෙමු ය යි යෝජනා කළ ද මම වෙන ද මෙන් කෝපයට පත් නොවුණෙමි. අවංක ආදරයක් ඇත්නම් ඇය මගෙන් තොර අනාගතයක් ගැන කතා කරන්නේ කෙසේ ද යන වේදනාව හා සැකය මා අසලටත් ආවේ නැත. ඒ වෙනුවට විටෙකට



කලින් හෝටලයේ දී ද අතර මඟදී ද උපන් හැඟීම තව තවත් මෝරන්නට විය.

මට තුරුළු ව, මගේ උකුලත මුහුණ ඔබාගෙන තමා අමතක කරන්නට ය යි කුසුම් යදින්නේ මට පමණක් නොව මගේ අම්මාටත් සහෝදරයනටත් ඇති ආදරය නිසාම බව ඇයගේ කඳුළු විසින් මුල් වරට මගේ හදවතට ඒත්තු ගන්වන ලදී.

"අඬ අඬ හිනා වෙන එක මට හොඳට පුරුදුයි නිමල්. මට මුළු ජීවිතේම කළේ කඳුළු අතරින් හිනා වෙන එකයි.

ඒ වචන මගේ ළය මඬල කම්පා කළේ ය.

කිසි දවසක අපේ විවාහයට අම්මලාගේ කැමැත්ත නො ලැබෙතැයි ඇය නගන තර්කය බිඳිය නො හැකිය. අම්මාගේ දරුවකු ලෙස කුඩා දවස සිට ඇති දැඩි වී ඇයගේ හිතට ආලය නිසා ගින්දරක් දීමට බැරිය යි කුසුමට ඇති දුෂ්කරතාව පිළිගත යුතුය.

ඇයගේ තත්ත්වය පැහැදිලිය. දෙමාපියන්ගේ විරුද්ධත්වය අසාධාරණය ය යි සිතෙන්නේ අපේ ඇසින් බලන කලය. දෙමාපියනට අප වෙනුවෙන් සියලු දුක් වේදනා විඳිය හැකි වුණා නම් ඔවුන්ගේ සතුට වෙනුවෙන් අපේ ප්‍රේමය පරිත්‍යාග කිරීමේ යුතුකමක් අපට ඇත.

"කුසුම් ඔයා කියන සේරම ඇත්ත." ය යි මගේ උර තලයේ එල්ලී හඬන,ඇයට කණට කොඳුරා කිව යුතුව තිබිණි. ඒ වෙනුවට මා කීවේ අනෙකකි.

"කුසුම් අපි වෙනුවෙන් අම්මල දුක් වින්ද. ඒ දුක අපේ දරුවන් වෙනුවෙන් අපි විඳවනව. ලෝක ස්වභාවය ඒකයි." යනුවෙන් මා කීවේ මගේ සතුට සිහිනෙන් වත් පතාගෙන නොවේ. ඇයගේ හිත වෙනස් කරවාගෙන ඇය පත්ව සිටින, පත් වන්නට යන අසරණකමින් මුදා ගන්නා අවසාන ප්‍රයත්නයක් වශයෙනි.

එසේ නම් මෙහි අවසානය කුමක්දැයි මා ඇසුවේ කිසිවක් ඇසිය යුතු වූ බැවින් විනා මුහුණ පා ඇති තත්වය වෙනස් කළ හැකි මගක් සොයන විශ්වාසයක් වූ බැවින් නොවේ.

"මේක අපේ ඉරණමය කියල හිත හද ගනිමු. සහෝදර සහෝදරියො වාගෙ....."

"එහෙනම් අපි යමු"

එහෙත් ඇය මගේ තුරුළෙන් ඉවත් නොවුණේ ඇයි?

Buddhika 15

For E-Pusthakalaya



"අපිට මෙහෙම ඉන්න ලැබෙන අන්තිම දවස ලොකයියෙ, අපි තව ටිකක් මෙහෙ ඉඳිමු. තව ටිකක්......"

"තව ටිකක් නොවී කුසුම් සඳහටම - මැරෙන තුරුම" යයි කෑ ගසා කියන්නට මට සිතැ විය. ජීවිතයේ පළමු හා අන්තිම වරට මා ඇය සිත ගත්තේ එසේ කෑ ගසන්නට බැරි වූ බැවිනි.

ඇත්ත වශයෙන්ම මට කුසුම් අහිමි වූයේ එදාය. මුහුදු වෙරළේ දී ය.

එහෙත් ඉන් ඉදිරියටත් මා මුළු දවස ගත කළේ ඉමහත් සැනසිල්ලකිනි, සන්තෝෂයකිනි. ඇය මට අහිමි වේතැයි බියක් හෝ දුකක් හෝ නොමැතිව, තරහක් නැති ව ඇය මා කීමට අවනත වනු යි සැකයක් නැති ව ඇය මගේ නොවෙතැයි මතකයක් නොමැතිව මම සවස් වරුවේ රූප සුන්දරී තරගයේ දී ශාලාවේ අසුන්ගෙන ඇයගේ අත අල්ලාගෙන උත්සවය නැරඹුවෙමි.

සෝබා රූප සුන්දරිය ලෙස තේරුණු කල මම කුසුම් ද අනෙක් අය සමග අත්පුඩි ගැසීමු.

අතරමග දී අප අතර සිත් රිදෙන කිසිත් ම කියැවුණේ නැත. මිහිරි හෝ අමිහිරි හෝ කිසිවක් කතා කරන්නට බැරි තරමට අපේ හදවත් විඩාවට පත්ව තිබෙන්නට ඇත. මැලැවී ගිය ඇය බස් රියේ දී මගේ උරහිසට හිස තබාගෙන දෙනෙත් පියා කතා නැතිව සිටියත් නින්ද නොගිය බව මම දැන සිටියෙමි.

එසේ එන අතර මග මම ඇය දෙස බැලිමි. ඒ පියකරු මුහුණේ එබඳු අසරණකමක් ඇඳී තිබෙනු ඊට කලින් හෝ පසුව හෝ ම විසින් දක්නා ලද බවක් මට මතක නැත.

කොළඹ දී කෑම කා පැමිණි බවට මම අම්මාට බොරුවක් කීවෙමි.

"තේ එකක් හද දෙන්න ද?" යි අම්මා ඇසුවාය.

තේ එකක අවශ්‍යතාවය ලොකුවට දැනෙමින් තිබුණත් මම "එපා" යි කීවෙමි.

ඇත්ත වශයෙන් සිත් තැවුලක් නිසා ම නොව, කෑම කන්නට බැරි තරම් වෙහෙස ගතියක් මට දැනෙන්නට වූ බැවිනි. ගතින් සිතින් විඩාවට පත් ව සිටියත් මට බොහෝ වේලා යන තුරු නින්ද ගියේ නැත. මම අපේ සම්බන්ධයේ මුලම වරට ආත්මාවලෝකනයෙන් ඒ



ප්‍රශ්නය දෙස බලන්නට උත්සාහ කළෙමි.

පසුවද උදේ කල්පනා කරන කල මගේ සිත කලින් දවසට වඩා අමුතු ආකාරයකින් ක්‍රියා කරන්නට විය. දෙමාපියන්ගේ කැමැත්ත නැති ව විවාහ වීමට බැරිය යි ඇය කියන්නේ මට ඇති ආදරයේ අඩුවක් නිසා යැයි කලින් මම සිතා සිටියෙමි. සැබෑ තත්වය ඉඳුරා වෙනස් ය. බාහිර ලෙසින් පළ නො කළත් කුසුම් සිතින් දැඩි දුකක් පීඩාවක් වින්දය. මා නො මැති වීමෙන් ඇයගේ අනාගතය නියත අසරණකමකට පත්වනු ඇතැයි මට මුහුදු වෙරළේ දී සිතුණේ එබැවිනි.

අම්මාගේ කැමැත්ත ලබා ගැනීමේ ඉඩක් ඇද්දැයි හෝ තනි කැමැත්තට විවාහයක් සඳහා කුසුම්ගේ සිත වෙනස් කරවා ගැනීමට ඉඩක් ඇද්දැයි හෝ සිතන්නට කල්පනා නො කරම ඇය අත් හරින්නට වීම නියත සත්‍යයක් ලෙස බාර ගත් මම ඒ අනුව අනාගතය දෙස බලන්නට උත්සහ කළෙමි. නියත අසරණකමට පත්වනු ඇතැයි මට මුහුදු වෙරළේ දී සිතුණේ එබැවිනි.

අම්මාගේ කැමැත්ත ලබා ගැනීමේ ඉඩක් ඇද්ද යි හෝ තනි කැමැත්තට විවාහයක් සඳහා කුසුම්ගේ සිත වෙනස් කරවා ගැනීමට ඉඩක් ඇද්දැයි හෝ සිතන්නට කල්පනා නො කරම ඇය අත් හරින්නට වීම නියත සත්‍යයක් ලෙස බාර ගත් මම ඒ අනුව අනාගතය දෙස බලන්නට උත්සාහ කළෙමි.

මුළු අනාගතය පුරා වැටී තිබුණේ බස්රියේ දී කුසුම්ගේ මුහුණ මත රැඳුණු අර අසරණකම ය.

ප්‍රේමය පිළිබඳ ප්‍රශ්නය දී ඇයටත් මටත් ඇත්තේ එකම වේදනාවකි. එහි වෙනස්කමක් නොමැත. එහෙත් ජීවිතය ඉදිරියේ දී ඇයත් මාත් අතර ඇත්තේ ලොකු පරතරයකි.

තව ටික කලකින් මා විශ්ව විද්‍යාලයෙන් පිට වන්නේ ජීවිතයට මුහුණ දීමේ සියලු සුදුසුකම් ඇතිවය. අඩු වශයෙන් සෑහෙන පඩියක් හා තත්ත්වයක් ඇති රක්ෂාවක් ලබාගෙන මිනිසකු ලෙස කල දවස ගෙවීමේ අවශ්‍යතාවය ගැන ප්‍රශ්නයක් මට නැත.

අපේ පවුලේ රෝහණ ද රක්ෂාවක් කරයි. විජය දෙවු පෙළ සමත් ය. මගෙන් උදවුවක් ඇති ව හෝ නැතිව හෝ අනෙක් අය ගැන බලා ගන්නට අම්මා සමත්ය. උසස් වීම කෙසේ වුවද අඩු තරමින් ජීවත්වීමේ මූලික පහසුකම් අප සියලු දෙනා වෙත ම සැලසී තිබේ.

කුසුම්ගේ තත්ත්වය ඊට වඩා හාත්පසින් වෙනස්ය. අහිමි වූ

Buddhika 17

For E-Pusthakalaya

ප්‍රේමයක් පිළිබඳ වේදනා මැද ඇයට යන්නට ඇත්තේ [illegible] ඇගේ පියා දනටමත් ඔත්පල ව සිටී. කුසුම්ගේ හදවතට [illegible] ආදරය ගැන භාර භාරා ප්‍රශ්න කළා මිස. "තාත්තාට දුන් [illegible] කුසුම්" යනුවෙන් අසන්නට තරම් වත් මා කාරුණික නොවූ [illegible] මනක් වී මට ඇති වූයේ පසුතැවිල්ලක් හා ලැජ්ජාවකි.

ඇති නැති වෙනස පිළිබඳ ද්වේෂයකින් මගේ සිත පිරී යන්[illegible] විය. සමාජ විෂමතාවක් උඩ හට ගත් අයුක්තියක් අසාධාරණයක් [illegible] කුසුම් සිඩා විඳින බවට දයානුකම්පාවක් මගේ හද තුළ මෝරන්[illegible] විය.

කුසුම් මගෙන් පිහිටක් ලබන්නට බැරි තරම් අවාසනාවන්ත[illegible] යි හැඟීමෙන් වේදනාවකට පත්වීමට මගේ සිත නැඹුරු වූයේ කිසි[illegible] පරිත්‍යාගයක් කිරීමට බැරි නිවටකමක් විසින් පොළඹවනු ලැබීමෙන් [illegible] යි මම නො දනිමි.

කුසුම් මට එද අත්තිමේ ද ඊට කලින් මේ ප්‍රශ්නය මතු [illegible] අවස්ථාවන්හි දී ද බොහෝ දේ කීවාය. ඉන් සමහරක් මට මතක නැත. තවත් ඇතැම් කරුණකදී වචන මතක නැතත් ඒ වායින් පළ [illegible] අර්ථය හා හරය මගේ සිතේ ඉතිරි වී ඇතැයි මම සිතමි.

"ඔය ගොල්ල දන්නෙ නෑ. නංගි කෙනෙක් හිටිය නම් ඔයා[illegible] තියයි අම්මල දරුවො වෙනුවෙන් විඳින දුක. ඒක දන්නෙ...... ඒ[illegible] තේරෙන්නෙ නැතු ළමයින්ට. මට ඔක කියන්න එපා නිමල්. තරහ [illegible] මාව වරල අර මුදට විසි කරන්න. මට බෑ. මට බෑ. මට අම්මා කෙනෙකු[illegible] ගින්දරක් දෙන්න බෑ." යි කුසුම් බැගෑපත් ලෙස කීවාය.

නැගණියක නො මැති වීම ගැන මම බාල කාලයේ සොවින් [illegible] තැවුණෙමි. ඒ පාළුව තරමක් දුරට හෝ නැති වූයේ කුසුම් නිසා ය [illegible] වෙළී - වෙළී වී ගෙදර එන තාත්තා කුසුම් දරුවකු මෙන් හද ගනි[illegible] යි අම්මාට යෝජනා කරනු මා ඇදට වී සවන් දීගෙන සිටියේ සතුටෙන් හා බලාපොරොත්තුවෙනි. කුසුම් අපේ ම සහෝදරියක ලෙස හැදෙන වැඩෙන හැටි සිතින් මවාගෙන මම මොහොතක ආස්වාදයක් [illegible] අස්වැසිල්ලක් ලැබීමි.

පසු කලෙක ඒ කුසුම්ට ම මා ආලය කළේ ඇයි යන ප්‍රශ්න[illegible] හද සාක්ෂිය විසින් මගෙන් අසනු ලබන්නේ නිදෙස් විය නො හැකි වේදනාවක් නගමිනි.

යොවුන් වියේදී කුසුම් කෙරෙහි අන් ආදරයක් විඳිනට නැ[illegible]

Buddhika 15



මතු වූයේ ඇය අපේම පවුලේ කෙනෙකු වශයෙන් අපේ ම ජීවිතවල කොටසක් බවට පත්වනු දකිමට ළමා කාලයේ මා තුළ බල පා සුන් වී ගිය ආශාව ම ද?

සහෝදරියක ලෙස සිටි කුසුම්ට ආදරය කිරීම ගැන මම නැවත නැවතත් අතිශයින් පසුතැවිල්ලට පත් වීමි.

ඇයගේ අසරණකම මෙන් ම ඇය සියලු ගුණාංගයන් මට දෙගුණ තෙගුණ වී මතක් විය. ඒවා යුවතියන් දහසක් අතරින් සොයන්නට බැරි තරම් වටනේය.

මම කුසුම්ට ප්‍රේම කළේ කරුණා පිඩක් බඳු මේ විනීත යුවතියගේ දයාව හා කරුණාව මට පමණක් නොව මුළු පවුලටම ලබා දීමේ අවංක සිතින් ය යි සැනසෙන්නට මම උත්සාහ ගතිමි. ඒ පැත්තෙන් බලන කළ ගෘහණියක වශයෙන්, අපගේ වැනි පවුලකට කුසුම් කෙතරම් ගැලපේ ද යි මට පුදුම සිතෙයි. ජීවිතයේ සහකාරියකගෙන් ඔබ පතන්නේ කුමක්ද? ආදරය, දයාව, කරුණාව, විනීතකම, වාම් බව, නිරහංකාර ගතිය, මේ සියල්ල ඇය වෙත නො අඩුව පවතී.

තව තවත් කල්පනා කරගෙන යෑමේ දී මා තුළ කවදත් ප්‍රසාදය ද ඇති කළ කුසුම්ගේ මේ චරිත ලක්ෂණයන් මතක් වීමෙන් හටගත් සිහිවිලි පරම්පරාව, ඇය අහිමි කර ගත නො හැකි තරම් වේදනාවක් මා තුළ ඇති කළේ ය. ඇ නැවත නැවතත් මගේ හදවතට පිංගන්නට වූවාය.

අම්මාගේත් සිත නොරිදවා කුසුම් සිනා ගැනීමේ මගක් නැද්දැයි සිතන්නට ඒ බැඳීම හා ආශාවන් නිතැතින් ම මා පෙළැඹවීය. පැය විසි ගණනකට කලින් කුසුම් කී සියල්ල සත්‍යය යි පිළිගෙන සිටි නමුත්, අම්මා කුසුම්ට නො කැමති වෙතොත් අසාධාරණය යන හැඟීම යළි මගේ සිතට ඇතුළු වන්නට විය.

අපගේ ජීවිත සැපවත් කිරීමට පමණක් නොව අද සිටින තත්වයනට වඩා ඉහළ තැනක් අපට ලබා දෙනු පිණිස අම්මා තවමත් දවසකට පැය දහ අටක් වෙහෙසෙන බව දනිමි. ඒ සියලු පරිත්‍යාගයන්ගෙන් ඇය සිතන පතන කිසිවකට කුසුම් බාධාවක් නොවේ. මිනිසාගේ හැම ව්‍යායාමයක ම අරමුණ සතුට නම් - උගත්කම, රක්ෂාව, ධනය තනත්වය ආදී ඒනෑම අතකින් ලබන දියුණුව කෙළවර ප්‍රාර්ථනය සතුට නම් - ඇය කළ යුත්තේ මටත් කුසුම්ටත් ආශිර්වාදය දීම පමණකි.

මා කාමරයෙන් පිටව මිදුලට ගියේ අලුත් බලාපොරොත්තු හා

For E-Pusthakalaya

මැදීම් ඇතිවය.

කොළඹ දී කුසුම් මුණ ගැසුණු බව ආරංචි වී ඇත්නම් හොඳ යි මට පසුද සිතිණි. අම්මා එද ඒ ගැන ප්‍රශ්න කළා නම්, මගේ ජීවිතය මීට වඩා හාත්පසින් වෙනස් - අමුතු ම මඟෙක වැටෙන්නට ඉඩ තිබිණැ යි අද මට සිතෙයි.

# 10

මේ වර නිවාඩු කාලයේත් නතර වී පාඩම් කරන සිසුන් සඳහා වෙන් ව තිබුණේ ජයතිලක ශාලාවය. මහින්ද ගෙදර ගියේ නැත. කලින් කරන ලද කිසි සඳහනක් නො මැතිව මා හදිසියේ ම නිවාඩුව මැද ආපසු පේරාදෙණි ආවේ ඇයි දැයි ඔහු එක වර මගෙන් ප්‍රශ්න කළේ නැත. මා කිසියම් සිත් තැවුලකින් පසු වන බව ඔහු දැන ගත් බව නිසැක ය. ඔහු නිශ්ශබ්ද වූයේ සිත සන්සුන් කර ගන්නට මට කල් දීමක් වශයෙන් විය යුතුය.

මහින්ද කාමරයේ පාඩම් කරන අතර මම බැල්කනියට වී අවට බලා සිටියෙමි. හත්තල් කාලයට සරසවි බිම මේ තරම් ම පාළු හා මුසල බවක් මම කලින් දැන නො සිටියෙමි. වසන්ත සමයේ මෙහි පැතිර පැවැති සිරියාව හා සුන්දරත්වය හොරැත් ගෙන පියා වැත්ත. එම බලාත්කාරකමේ දී සිදු වූ සිරීම් හා තුවාල මෙන් තණ බිම් වියැළී අතු පතර මැලැවී ගොස් ඇත. මම ඇසට පෙනී පෙනී ආලෝකය තුනී වෙමින යන හැටි බලා සිටියෙමි. සිය සෙවනැල්ලෙන්, පුංචි කඳු ගැටයක් මත අඳුරක් මැවෙන පරිදි එක් උස් කන්දක් අහස දෙසට නැඟී සිටියේ අහංකාරකමිනි. රෑ බෝවෙත් ම අවට බැලු බැලූ තැන ගිනි ජාලාවන් මතු වන්නට විය. දෙසැම්බර් ඉවෝරයේ දී මිනිස්සු කඳුවල පතන් ගිනි තබති. පළමු වැනි වසරේ දී අප මුලින්ම පතන් ගිනිගෙන තිබෙනු දුටුවේ ද චමත්කාරයක් ලෙසිනි. ගිනි වළල්ල මැදි වී -තනි වී - සිටින මා තුළ දන් ඇති වන්නට සංවේගයක් බියක් බඳු වේදනාකාරී හැඟීමකි.

"නිමල් වරෙන් තේ එකක් බොන්න යන්න." කම්සයේ බොත්තම් දමමින් මා වෙත පැමිණි මහින්ද කීය.

"කෑම කන්න තියෙද්දී මොන තේ ද බං?" යනුවෙන් අසන්නට

Buddhika 15



සිතුණත් මම කතා නොකළෙමි.

නිදි මැරීමෙන් හා පාඩම් කිරීමෙන් ඔහුගේ ඇස් රතු වී තරමක් ඉදිමී - මුහුණ වැහැරී තිබිණි. අප ශාලාව පිටුපස කුඩා කැන්ටිමට ගොස් තේ බිව්වේද වැඩි කතා බහක් නැතිවය.

"ඉතින් කියාපන් බලන්න උඹ පිස්සා වගෙ හදිස්සියෙ ආව මොකද කියල...." අතරමඟ දී ඔහු මගේ පිටට අත තබා කීය.

"කම්මැලියි මචං ගෙදර ඉන්න. පාළුයි මම සිනා සී කීමි.

මගේ අතින් අල්ලා එතැන ම නතර කරවා ගත් මහින්ද මා දෙස රවාගෙන මෙත් ටික වේලාවක් බලා සිටියේය.

"අඩෝ මේ, උඹ මම බබෙක් කියල හිතනවද? එහෙනම් උඹ මට කොළේ වහන්න එනවද?

"උඹට වහන්න දෙයක් නැතෙ බං"

"ඉතින්"

"උඹ ගිහින් පාඩම් කරපන්. මගෙ වැඩක් ඕනෑ නෑ"

"කියපන් බලන්න ඉතින් මොකද වුණේ කියල." ඔහු මා ඇදගෙන ගසක් යටට ගොස් වාඩි වෙමින් කීය.

"ඔන්න ඊයෙ ආව කුසුම් අපේ ගෙදර"

මම නවත් පෙරැත්ත කරන්නට ඉඩ නොදී පටන් ගතිමි. "..........පන්සලට දනෙ උයන්න හෙම තිබුණා. ඉතින් එතනදී විබාගෙ ගැන හෙම කතා කළා - එයා සීනියර් ගන්න නෙ..........."

"කොල්ල පාස් වෙයි ද?"

"පාස් වෙයි උඩින් . ඒකට නම් මට බයක් නෑ. ඒක නෙවෙනෙ ප්‍රශ්නෙ. විභාගෙ පාස් වුණත් යූ ඊ කරන්න බෑ ජොබ් එකක් හොයල දෙනව ද ඇහුව. උඹ දන්වනෙ මම ඒකට කැමති නැති බව. මට ඒකට ඉතින් කරහ ගිය බව පෙන්නන්නෙ නැතුව කිව්ව කුසුම් රස්සාවක් කරනවට මම කැමති නෑ කියල. ඒ පාර එයා කියනව ඔයාගෙ කැමැත්ත විදිහට වැඩ කරන්න පුළුවන්නම් ඒක වාසනාවක් තමුන් අපේ අදහස් හිතා හිටියට හරියන්නෑ කියල. මම ඉතින් ඇයි එහෙම කියන්නෙ කියල ඇහුව. ඉතින් නව වල් පල් හැලි ගොඩක් කියවලා -ඒව උඹට අවශ්‍ය නැහෙ. අන්තිමට කිව්ව අම්මා එයාට කියපු කතාවක්........."

For E-Pusthakalaya

"අම්මට ආරංචි වෙලා ද?"

"අපේ වගේ ආරංචි වෙලා නෑ. අර අපේ මාමගෙ දුවෙක් ඉන්නවනෙ මධුරි කියල. මම උඹලට කියල ඇති ඔය ගැන. ඉතින් ඒ නැන්දට ඕනෑ කරල තියෙනව ඒ හොල්මන මගේ ඇගේ ගහන්න අම්ම ඕක ගැන කුසුම් එක්ක ගිය නිවාඩු කාලෙ කතා කරද්දී කිව්වා මගේ අනාගතය ගැන අම්මගෙ තියෙන බලාපොරොත්තු. ඒව දිහා බැලුවම අම්ම එයාට කවරදාවත් කැමති වේය කියලා හිතන්න බැරිලු. නව අම්ම කියල තියෙනව මම ඉර හඳ වගෙ විශ්වාසයි කියල. ඒ විශ්වාසය කඩන එක අපරාධයක්ලු. ඉතින් එයා කියනව ඔබයින් මෙවයින් දන්වම ඕක ඉවරයක් කරල අම්මට ආරංචි වෙන්න කලින් හිත හද ගනිමු කියල."

ටික වේලාවක් කතා නැති ව සිටි මහින්ද,

"උඹට ෂුවර් ද නිමල් උඹලගෙ අම්ම ඕකට විරුද්ධ නොවෙයි කියල?"යි ඇසිය.

"විරුද්ධ වෙයි මහින්ද මුලදී. නමුත් මම කුසුම් ගැන තදින් හිටියොත් අම්ම කවදවත් මගෙ කැමැත්තට එකඟ නොවී ඉන්න නෑ. මට ඒ ගැන බයක් නෑ."

"ඒ උඹ හිතන විදිහ. නමුත් කුසුම්ට ඒ තරම් ෂුවර් නෑ?"

"හරි බං ඉතිං අපි කියමුකො අපිට විරුද්ධ වුනාය කියලා විරුද්ධ වෙලා එදාට ගෙණ ගහල ගියත් ඒක එකක්. මට ඉවසන්න බැරි අම්මල දන්නෙත් නැතුව ඇම්ම ම ඉවරයක් කරලා දාමු කියන්නේ මොන හිතකින්ද? එයාට ඒක ගාණක් වත් නෑ"

"උඹට සැකයි ඒකි උඹට ආදරේ නෑ කියල"

මම කතා නො කළෙමි.

"ඒකිට ආදරයක් විතරක් නෙවි බං මොළේකුත් තියනව උඹට වැඩිය. තොපා නොවී නිමල් බලපන් ප්‍රශ්නය දිහා කුසුම්ගෙ ඇහෙනුත්. ඒ කෙල්ල දුප් ඉඳල ම කිව්ව අම්මල කැමති කරව ගන්න හරිද? ඉතින් කුසුම්ට පේනව නම් කවදවත් ඒක හරියන්නෑ කියල දැන්ම ම ඉවරයක් කරල දාමු කිව්වම ඇති වැරැද්ද මොකක්ද?"

"එහෙනම් උඹ කියන්නෙත්..........?"

"මම කියන්නෙත් ඉවරයක් කරල දාන්න නෙවි බං. මම කියන්නේ



කුසුම්ගෙ පැත්තෙන් ඒක අසාධාරණ නෑ. උඹ ඒ පැත්තෙන් හිතපන් ගොනා නොවී"

අපි යළි නිහඬතාවයකට වැටුණෙමු. ඔහු කී කිසිවකට මම එකඟ නොවීමි.

"නිමල් මම උඹට එකක් කියන්නම්. ගෑනුන්ව ඔය තරම් සැක නම් අවිශ්වාස නම් එහෙනම් උඹ ලව් කරන්න එපා."

"මොකක්ද බං බයක් සැකක්"

"නිමල් උඹට මම කියන්නෙ කෝච්චියෙ බස් එකේ තෙරපෙන වෙලාවක් බලල මාලයක් කඩා ගන්න වගේ නැත්නම් පර්ස් එකකට ගහන්න වගෙ කෙල්ලන්ගෙ කන්‍යාභාවය කියන එක පික් පොකට් ගහල ගෙනියන්න බෑ කාටවත්. කෙල්ලෙක් ජොබ් එකකට ගියාය කියල තමන් හොඳනම් හානියක් වෙන්නෙ නෑ. ඒකි යූ ටී කරන්න බෑ කියනව නම් හොයල දීපන් ජොබ් එකක්."

"මම එයා ගැන බලා ගන්නව නම් දවසක මොනවටද කියාපන් එයාට ජොබ් එකක්"

"ඒ දවසකනෙ! ඇරත් නිමල් උඹ තරහ ගන්න එපා. නො හිතන දේවල් වෙනව ලෝකෙ. බැරි වෙලා හරි උඹට කුසුම් එපා වුණොත්......."

"මගෙ පණ තියෙද්දී නම් මගෙ හිත වෙනස් වෙන්නෙ නෑ. මහින්ද. එහෙම වෙන්න ඉතින් මම මැරෙන්න ඕනෑ."

"හොඳයි උඹ මලොත්? ඒ දුප්පත් කෙල්ලත් උඹේ දර සෑයට පනින්න ඕනෑද? ඒකි ජීවත් වෙන්න ඕනෑ නේද? උඹ ම කියල තියනවනෙ ඒ පවුලෙ තත්ත්වය.ඒ පවුලෙ හැටියට ඒකි රස්සාවකට ගිහින් කීයක් හරි හම්බ කළාම මොන තරම් දෙයක් ද? කුසුම් හිතනව ඇති හැම පැත්තක්ම. එයින් අදහස් කරන්නෑ කුසුම් උඹට ආදරේ නෑ කියල. උඹත් අර සීනියර් එකේ කොල්ලො වගෙ හිතන්න නියම ප්‍රේමයක් තියනව නම් ඔහොම කියන්නෙ කොහොමද ඉවරයක් කරමු කියල. ඒකනෙ?"

එතැන දී මහින්දගේ තර්කයට මම හිත යටින් එකඟ වීමි. එහෙත් මම ඒ බව නොපිළිගතිමි.

"හොඳයි උඹ අද ආවෙ මොකද? ඒ දුප්පත් කෙල්ලගෙ හිත රිදවල ඒකිගෙන් පළි ගන්නනෙ? ඇත්ත කියපන්"

"ඒක ඇත්ත"

"මේ කනත්තෙ මුදුරුවො තල තල තොබිද පලයන් සීලල ගෙට ගෙදර"

එහෙත් වහා ආපසු යන අසහසක් මගේ සිතට ආවේ නැත. මහින්ද විසින් ඉදිරිපත් කරන ලද කරුණුවලින් බලපෑමකට යටත් නොවුණු මම, මගේ වේදනා සවිස්තර ලෙස ඇතුළත් කර බොළඳ ලෙස ලියැවුණු ලිපියක් කුසුම්ට යැවීමි.

ඊට කුසුම්ගේ පිළිතුරු එන විට ඇය විසින් ද මිත්‍රයා විසින් ද කියන ලද සියලු කරුණු සත්‍යයයි යි මම පිළිගෙන සිටියෙමි.

කුසුම්ට ආලය කිරීමෙන් මා කළේ මෝඩකමකයැ යි වරෙක මට සිතෙන්නට විය. එහෙත් මට දැන් ඇය එය ආපසු ගත නොහැකිය. එසේ නම් මට කුසුම් අහිමි වන්නේ අම්මාගේ විරුද්ධතාව නිසා නොවේද යන කතට මගේ සිතේ මෝරන්නට විය. එතැන් සිට දින කීපයක් සරසවියේ ම රැඳීමට මා සිතා ගත්තේ කුසුමට නොව අම්මාට විදවන ද්වේශ සහගත චේතනාවෙනි.

එහෙත් මාගේ සිත මෙල්ල වූයේ මොනවා වුණත් කුසුම්ගේ ආදරයේ අඩුවක් හෝ ඇදක් හෝ නැති බව ඇගේ ලිපියෙන් ම ජත්තු ගැන්ම නිසා පමණක් නොවේ. එහි සඳහන් වූ පහත සඳහන් ඡේදයෙනි.

මා වරදක් කර තිබේ නම් මට ඕනෑම දඩුවමක් දෙන්න. ඕනෑම දෙයක් ඔයා වෙනුවෙන් විඳින්න මම සූදානම්. නමුත් මා සමග තරහට ගෙදරින් පළිගන්න හිතන්න එපා. මාමාත් නැන්දත් ඔයා ගෙදර එන තුරු බලා සිටින්නේ කො තරම් ආශාවෙන්ද? නිවාඩු කාලයේ දීත් කැම්පස් එකට ම වී කල් ගෙවීම කොයි තරම් වරදක් ද යි ඔයා ම හිතල බලන්න. ඇරත් ඔයා ඔහොම ඉන්නේ මා නිසා ය යි සිතෙන විට......"

මම වහාම ගෙදර ආවෙමි.

"ලොකු පුතේ, තාත්ත මඟ බල බලා හිටියෙ." ය අම්මා නිවේ තමාගේ හැඟීම් ද ගැබ් කළ හැඟීම් ද ගැබ් කල හඬකිනි.

ඒ වන විටත් කුසුම්ගේ පාසල පටන්ගෙන තිබිණි.

ඊළඟ මාස දෙක තුන ඇතුළත ඇය දෙවරක් මුණ ගැසුණු නමුත් හුදකලා ව කතා බස් කිරීම් අවසරයක් නොලද්දෙමි.එහෙත් මිය යන්නට ගිය මගේ බලාපොරොත්තු ඇයගේ මන්මත් කරවන සිනාවෙන්



නැවත පණ ලැබෙන්නට විය.

කරවුණු පොලොවේ තෙම් නැවුම් සුවඳ හංවමින් මාර්තු මුල හරියේ දී හඳ වැසි ඇරඹිණි. මැලැවී ගිය තුරුලතාවෝ යළි ප්‍රබෝධමත් වන්නට පටන් ගත්හ. ඒවායේ මල් පොහොට්ටු මතු වන්නට වූයේ එක පැත්තක සිට බලා සිටිය හැකි තරම් ඉක්මනිනි. කඳු බෑවුම්වල පිළිස්සුණු පතන්වලින් ලා පාට මොරෙයියන් ඇදෙන්නට විය.

" සෝමෙට හරි ප්‍රසිද්ධියක් තියෙනව නෙ දැන්" මම අම්මාට කීවෙමි.

අම්මා මා කී දෙය නෑසුනාක් මෙන් කර බාගෙන වුන්නා ය.

"මේ අදත් පත්තරේ තිබුණෙ පින්තූරයක්"

"ඔය තියෙන්නෙ" යි ඇය කීවේ ඕනෑවට එපාවට මෙනි.

"චිත්‍රපටිවලට ගියාට පස්සෙ සෝමෙ ගෙදර එන්නෙම නැද්ද?"

"කවුරු හොයනවද හැබෑටම කොහේ මකබෑවෙලා ද කියල"

"මම දැක්ක මේ ළඟදී ස්ටේෂන් වැගන් එකක එනව. තව පිරිමි කට්ටියකුත්......"

"ගාමිණි!" යි අම්මා ගැන කතා කරන්නට ගිය මලණුවන් ඇමතුවේ සැරෙනි. "උඹලට කතා කරන්න දෙයක් නැද්ද වෙන?"

අම්මා කිසි දිනෙක සෝමා ප්‍රිය නො කළාය. එහෙත් ඇයට මේ තරම්මත් කේන්ති ගියේ ඇයි දැයි කුහුලක් හා මවිතයත් මා තුළ ඇති විය. මම එවර දින කීපයක් ගෙදර ගත කළෙමි. තිවස වසා ගත් මූසලකමක් ඇතැයි මගේ හදවතට දැනෙන්නට වූයේ අර කුහුල හා මවිතය නැවතත් වැඩි කරමිනි.

සාධක වශයෙන් ඔප්පු කිරීමට තරම් ලකුණක් සොයා ගත නො හැකි වුව ද මා කෙරෙහි අම්මාගේත් මල්ලිලාගේත් හැසිරීමේ කිසියම් වෙනසක් ඇතයි මට නිකමට සිතෙන්නට විය. කට වැරදී අනිසි දෙයක් කියවේ දැයි බියකින් මෙන් හැමෝම මා සමග කතා කළේ පරිස්සමිනි. කිසිවකු කෙළින් නො කීවත් මාස ගණනකින් කුසුම් අපේ ගෙදර පැමිණ නැති බව තීරණය කර ගත හැකි විය.

"මඩුවෙ දර කෑල්ලක් නෑ. වහින්න පටන් ගත්තම කඩදාසි තමයි ළිපේ දාන්න වෙන්නෙ" යි අම්මා වරක් කීවාය. "ගේ හරියෙ හාල් ඇටයක් නැතුව ඇති. වී කල්දේරමක් තම්බ ගන්නත් බැරි වුණා" යි ඇ

For E-Pusthakalaya

අසතුටින් මෙන් කීවාය. අම්මා කතා කළේ තරහෙනි. "මේව තල ගන්න කුසුමෙටත් ආවෙ නැතෙ" යි ඇයගෙන් නිකමටවත් කියැවුණේ නැත. තාත්තා හෝ මල්ලිලා හෝ කිසිවෙක් වත් ඇය ගැන මතක් නොකළහ.

මේ අපේ ගෙදර ස්වභාව නොවේ. මහත ඇති කාලෙක සිට කරුණක් ඇතිව හෝ නැතිව හෝ කුසුම්ගේ නම නොකියැවී ගෙවුණු දවසක් පවා නැති තරම්. අද හැම දෙනා ම හැසිරෙන්නේ ඇය අපේ ජීවිතවලට හවුල් වී සිටි බවක් වත් නො දන්නා ලෙසිනි. අම්මාත් තාත්තාත් මල්ලිලාත් එකතු වී කුසුම්ට විරුද්ධ බරපතළ වරදක් ද්‍රෝහීකමක් කර ඇතත් වේදනාවක් මා පෙළෙන්නට විය. ඇයට අසාධාරණයක් කර ඇති බවක් සිතන කල, මිනිස්කම කෙරෙහි තටගත් විශ්වාසය හීන වී යන්නට විය. එහෙත් කුසුම් වෙත පහළ වන අනුකම්පාව නිතර ම සිතේ නොරඳයි. දෙමව්පියන් අපගේ සම්බන්ධය දැන ගන්නට කලින් ඉවරයක් කර හිත හද ගනිමුයි කුසුම් කළ යෝජනාව තවමත් එහෙම මය. ඇයගේ අදහස් වෙනස් කරනු පිණිස ම විසින් ලියන ලද ලිපි ගණනාවකට අනුව, "හසුන ලැබුණා. ඔබගේ විභාගය ළඟ නිසා දිග ලියුම් ලියා කරදර නො කරමි." යන කරුණට වැඩි යමක් තවමත් ඇයගෙන් ලැබී නැත. මගෙන් සඟවා තබන්නට දෙයක් ඇය තුළ ද ඇතැයි හට ගත් සැකය තවත් මෝරයි.

මේ සියල්ල එකතු කර බලන කල කිසිවක් සිදු වූ බව සිතා ගන්නට මම සමත් වීමි. සිදු වූ යමක් ඇත්නම් එය මා හැර හැම දෙනා ම දනිති. කුසුම් පවා දන්නීය. මා මේ මුළාවෙන් මුදවනු වෙනුවට ඇය ද දිගට ම රහසක් රැකගෙන ඉන්නවා විය යුතුය. එසේ නම් කුමන්ත්‍රණයක් සිදු වී ඇත්තේ මට විරුද්ධ වය. කුසුම් ද එයට හවුල්කාරියෙකි.

සියලු ආදරණීයයන්ගෙන් හා හිතවතුන්ගෙන් පවා පිටුදක්නා ලදුව තනිකමට අනාථ අසරණකමට පත් වූයෙමැයි ආත්මානුකම්පාවකින් හා කලකිරීමකින් මගේ සිත වේදනාවට යට විය. ඒ වේදනාවෙන් මා මිදුණේ සකල ලෝකයා කෙරෙහි උපන් කෝපයකිනි. අඩු තරමින් කුසුම් හෝ මා සමග ඇත්නම් මුළු ලෝකය ම එක ම එක පැත්තක වුණත් හිතට වත් තනිකමක් නැත පාඩම් කරන්නට තිබුණු නිසා නොව මේ තනිකමෙන් මිදෙනු පිණිස ද මා අන්තිම කාලය ගෙදර නෑවිත් සරසවියේ ම ගත කළෙමි.

සිතෙහි එක පැත්තක් උද්දාමයකින් පිබිදෙන අතර අනෙක් පැත්ත උදාසීනකමින් හැකිළී යන තත්ත්වයක් එකවර ඇති විය හැකි ද



වූ බව නො දනිමි. මා අවසාන උපාධි පරීක්ෂණයට පෙනී සිටියේ පරස්පර විරෝධී හැඟීම් දෙකකින් ගුලු වතු අවිනිශ්චිත චිත්ත ස්වභාවක සිටගෙන ය.

නිමාවට පත්වීමට යන අතීතයක එල්ලී සිටීමට වඩා උදාවීමට යන අනාගතයක් කරා දුවගෙන යාමේ වුවමනාව හා ආශාව අපට ඇත. තෙවසක් තිස්සේ ඇඳුණු සිහින හැබෑවීමට යන දවස අත ළඟ ය. අපට මෙතැනින් කෙළින් ම පිටවීමට සිදුවන්නේ ලෝකයටය. එහි ඒ ලෝකයේ, කිසියම් තැනක් අප වෙනුවෙන් දහගෙන සූදානම් ව ඇත. අපට ඇත්තේ තමතමාට නියම තැන තෝරා ගැනීම පමණකි.

අනාගතය සකස් කර ගැනීමේදීත් මගේ තැන කුමක් දැයි තීරණය කර ගැනීමේ දීත් මම කවදත් මා ගැන පමණක් ම කල්පනා නො කළෙමි. මම නිතර ම පවුල ගැනත් කුසුම් ගැනත් සිතුවෙමි. එහෙත් දැන් මට ඒ කිසිවෙක් නොවෙත්. ඒ නිසා අනාගතයක් ගැන සිතන්නට තරම් දෙයක් නැතැයි උදාසීන ගතියක් මා තුළ ඇති විය. කලකිරෙන තරමට උදාසීනකම දරුණු වූ කල, මගේ යහපතට සියල්ල කළ අම්මා වෙනුවෙනුත් ඉටුවිය යුතු යුතුකමක් ඇති බව නිතර මතක් කර ගනිමි. තවත් අතකින් උපාධි පරීක්ෂණයට සූදානම් වන අතර මා තුළ මලානික ජයග්‍රහණයක් ඇති කර ගැනීමේ ආශාවට වඩා, පටන්ගෙන තිබුණු කටයුත්තක කෙළවරක් දකීමේ වුවමනාව හා නො ඉවසිල්ලයි.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ගුරු තනතුරු සඳහා උපාධිධාරීන් අවශ්‍ය බවට දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිවේදනය කර තිබුණේ අප විභාගය සඳහා සූදානම් වන කාලයේය. දැන්වීම දුටුවාවේ මේ නිවේදනය දුටු මා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයට ගොස් ඉල්ලුම් පත්‍ර පෝරමයක් ලබා ගත්තේ නිකමට මෙනි.

"ටීචිං වලට ගිහිල්ල වැඩක් නෑ නිමල්. පබ්ලික් සර්විස් එක ට වඩා හොඳයි" කැන්ටිමේ දී ජයන්ත කීවේය.

"මමත් ඇප්ලිකේෂන් එකක් දැනට දැම්ම ම. මමත් ආසයි ටීචිංවලට" යමුනා කීවාය.

"ඇතු ඉතින් වෙන කෙහෙල්මලක් කරන්නයෑ. ඉස්කෝලෙ හාම්නේ කෙනෙක් වෙන්න නැතුව" ඔයා ඇප්ලිකේෂන් දැන්න. මම කිව්වේ නිමල්ට."

"එන්න පුතා නැතු පල් කරන්න. අපිට ඕනෑ එකක් වුවමනි"

"අපි දන්නව"

Buddhika 13

"නෑ ජයන්ත මමත් ඔත්ත මගේ ඉල්ලුම් පත්තරයක් දැන [illegible] මම ගණනකට නැතුව මෙන් කීවෙමි.

ජයන්ත හා ප්‍රේමසිරි දෙ දෙනාම කීවේ ගුරුකම උසස් [illegible] නො හැකි රැකියාවක් බැවින් පරිපාලන සේවය තෝරා ගැනීම [illegible] නුවණට හුරු බවයි. මම ඔවුන් හා ඉන් ඉදිරියට තර්ක කරන්නට නොගියෙමි.

මා සරසවියෙන් පියවුණේ ද ඒ අවිනිශ්චිත විස්ත ස්වභාවයෙන් ම ය.

## II

ඒ උදේ වරුවේ ගෙදර සිටියේ තාත්තාත් මාත් පමණකි. තාත්තාට වැඩ යෙදී තිබුණේ රාත්‍රියට ය. දහයට පමණ අම්මා අප දෙදෙනාට ම තේ රැගෙන කඩයේ සිට ගෙට ආවාය. අම්මා ළඟට ගෙනැවිත් දෙන තුරු නො සිට තේ කෝප්පය ගන්නට මම ගේ ඇතුළට ගියෙමි.

"අර නැම්බි බයිස්කෝප් නටන්න ගිහිල්ල වැඩ වරද්ද ගෙනය කියන්නෙ" අම්මා කීවාය.

දන්නා කෙනෙකු හා නො දන්නා කෙනෙකු අතර කිසිවකු ගැන සඳහන් වීමේ දී ඇති වන අවිනිශ්චිත ගතියක් මගේ සිතට නැගිණි. තාත්තා ඇත්තද කවුදැයි අසන්නට තත්පර කීපයක් ප්‍රමාද වුණේ අම්මාගෙන් ලද පුවත් නිසා හටගත් කම්පනයෙන් විය යුතුය.

"සෝමෙ ?"

"වෙන කව්ද ?"

"ජේන් අක්ක ඔහෙට කිව්වද?

"අම්ම කෙනෙක් කොහොමද හැබෑටම කටක් ඇරල ඔහොම එකක් කියන්නෙ? දහදුරාවී මොනව කර ගත්තත්. ජේන් අක්ක නො කිව්වට අද ඔය උදේ ඉඳලම කඩේට ආව සේරම කතා වුණේ"

"රාජ් අපරාදෙ නේද ජේන් අක්කට වුණේ......." යි තාත්තා ඇගෙන පණ නැතුව ගිය ලෙසින් පුටුවක හාන්සි විය. [illegible]



වුණේ ඇත්ත වශයෙන් සෝමා ද කුසුම් දැයි තෝරා ගත නොහැකි ගතියකින් මගේ සිත නාඳුනන වේදනාවකින් මිරිකෙන්නට විය.

"ඔකි ඔය විපැත්තිය කර ගනී කියල ම තමි හැමදමත් හිතුව"තාත්තා නැවතත් කීය. "...........එක අතකට ඒකිට හෙණ හන ගහල ගියත් කමක් නෑ අන්න අර කුසුමෙට තමා ඕකෙනුත් පාඩුව. අරහෙන් කරෝලිස් අය්යට අංග බාගෙ"

කුසුමෙට තමා මේකෙනුත් පාඩුව ය යි තාත්තා කීවේ ඇයට දැනටමත් ව්‍යසන සිදු වී ඇති කලෙක මෙනි.

කුස්සියේ සිට අම්මාත් තාත්තාත් අතර කෙරුණු මේ කතාවට හවුල් වන අවස්ථාවක් බලමින් සිටි මම කුසුම්ගේ නම සඳහන් වෙත් ම මඳක් පසු බැවෙමි. සාලයට පැමිණි මම ඔවුන් කියන දෙයක් ඇසෙන තැනක වාඩි වුණෙමි.

"වැඩිමල් එකීට නේන්නම් පාඩුව! දහයකින් හොයන්න බැරි තරම් සීලාචාර ගුණ යහපත් එකී"

මඳ නිශ්ශබ්දතිවයකින් පසුව, වෙනස් වූ ස්වරයකින් කතා කළ අම්මා මා තුළ වඩාත් උනන්දුවක් ද කුතුලක් ද ඇති කරමින් මෙසේ කීවාය.

"..........වෙන එකක් ඕනෑ නෑ. අපි බේරුනේ කුසුම්ගෙ ගුණ යහපත්කම නිසාවෙන් නේද? දත් කාලෙ වෙන ගෑණු ළමස්සියෙක් නම් මෙතන මොනවද වෙන්න තිබුණෙ ?"

"මොකුත් වුනේ නැනෙ"

තාත්තා ඒ වචනපිට කළේ උදසීන ගතියකිනි. උදසීනකම අම්මා කෝපයට පත් කළා මෙනි.

"මොකුත් වුණේ නෑ නේන්නම් කුසුමෙගෙ හොඳකමට.වෙන එකියෙක් නම් ඕවගෙ බුරුලක් දැක්ක ගමන් කරේ එල්ලෙනවා නේ ද? ..........අපරාදෙ කියන්න බෑ ඒකිට මල් තියල වඳින්න වටිනව අපි"

අම්මා කෙමෙන් වේගවත් වන හඩින් කතා කරන්නේ මා මෙහි සිටි බවක් අමතක වීමෙන් ද නැතහොත් මා ඇසෙන තෙක් මානයේ සිටින නිසා ම ද යි සිතාගන්නට මම අසමත් වීමි.

"...........ගිය තැනක හතර වරම් දෙයියෝ පීනට පිහිට වෙලා අම්මාවරුන් හත්දෙනා කිරි උතුර වන්න ඕනෑ කුසුමෙට. දරුවෙක් වගෙ මම හිඩිබ විශ්වාසය ඒකි කැඩුවෙ නෑ. නමුත් මගෙ දරුව ඒ

For E-Pusthakalaya
Buddhika 55

For E-Pusthakalaya

විග්වාසෙ නැතුව. ඒකයි මට දුක."

මිදුල දෙසට හැරී වාඩි වී සිටි මට අම්මාගේ මුහුණ පෙණුනේ නැතත් ඇය අන්තිම වචන පිට කළේ කඳුළු සලමින් බව හඬ අනුව සිතා ගත හැකි විය.

"ඔහේට දුක් වෙන්න දෙයක් වුණේ නැතෙ?"

"දුක් වෙන්න නෙවෙයි මට පැලිල මැරෙන්නයි තිබුණේ. අර කුසුමෙ ඇවිත් සේරම මට කීවයින් බෙරුණා......."

"අර ඒකිගෙ සීලාචාර කමට මිසක් මම දීල තිබුණු නිදහසේ හැටියට වෙන ගෑණු ළමිස්සියෙන් නම් මොකක්ද මෙතන වෙන්නෙ තිබුණෙ?"

"උන් ඉලන්දරී ළමිස්සියෝ බව දුන් ද ඔහේ දන්නෙ?" යි තාත්තා ඇසුවේ සාවඥ සිනාවක් ද ඇති ව ය.

පසුතැවිලි වන කෙනෙකු මෙන් අම්මා මඳකට කතා නැතිව වුන්නා ය.

"මම හිතුව ඩැයිවර් උන්නැහෙ උගත්කමකුත් තියෙනව නේද කල්පනාවෙන් වැඩ කරයි නේ ද කියල"

"උගත් වුණත් නූගත් වුණත් ඔය වයසෙ හැටි. මොකද අපිය කියල මතක නැතුව යෑ?"

සැහැල්ලු හඬකින් ම කතා කළ තාත්තා එවර සිණාසුණේ රසබර අතීතයක් මතක් වූ ලෙසිනි.

"ඒ නිසා තමයි හරියට බඩට කන්නෙ නැතුව ඉණට අඳින්නේ නැතුව මෙතුවක් කලක් තහින්න වුණේ?" අම්මා ද්වේෂයක් බඳු හඬකින් කීවාය.

හිතුවක්කාර විවාහයකට ඇතුළත් වීම නිසා මේ දුක විඳින්නට විණැ යි පසුතැවිල්ලක් - කලකිරීමක් අම්මා තුළ ඇතැයි මම සිහිනෙන්වත් නො සිතමි. අම්මා ඇනුම් පදයකින් මෙන් කතා කළේ ප්‍රශ්නය ගැන තාත්තා දක්වන උදාසීන ගතිය නිසා හටගත් කෝපය උඩ ඔහුගේ සිත රිදවනු පිණිස වන්නට ඇත.

"අපි වින්ද දුක් අපේ දරුවන්ට විඳින්න ඉඩ තියෙන්නෙ නෑ කියල එක හිත් හිතාගෙන ඩැයිවර් උන්නැහෙ මම එදා ඉඳල මේ සේරම කළේ. ඔහේ ඒව දන්නෙ නෑ. ඔහෙට ඒව මතකත් නෑ. ඔහේ

Buddhika J.S.



උණොත් යන්නම් ඇස් ඇරුණ නම් පිංය පෙරේද"

"හරි හරි. මම නෑ කියනවය කවදාවත් ? මගෙන් දරුවකුට දෙයක් වුණේ නෑ"

මගේ දෙනෙත් තෙත් වී උගුර හිර වී යන්නට වඩාත් හේතු වූයේ අම්මාගේ වචන ද තාත්තාගේ වචන දයි වෙන් කර ගැනීමට පුළුවන්කමක් නොවිණි.

"........මම ඔහෙට කියන්නෙ මේකයි. ඔහේ තනියම මාන්සි වුණා. දුක් වින්ද. ඒව අපතෙ ගියෙ නැතෙ? ඔහෙට සතුටු වුණෑකි ඒ සේරම ගැන හිතල. මම මොකුත් නො කළත් ඔහෙට පින් සිද්ධ වෙන්න දූන් මේ දරුවන්ට දේව කරුණාවෙන් අනුන්ට අත නොපා පොළොවෙ පය ගහල ඉන්න පුළුවන් නෙ....... දූන් අපිට තියෙන්නෙ ඒ ගොල්ලන්ගෙ අදහසක් තියෙනවනම් ඒවට ඉඩ දීල....."

"හැබෑටම? ඒ ගොල්ලන්ගෙ අදහස්වලට ඉඩ දෙන්න?" යි කියාගෙන අම්මා වහා තාත්තා දෙසට තවත් ළං වූවාය. "නොකා නොබී නිදි මරා මරා සේරම කරල ඇති දඩි කළේ - ඉගැන්නුවෙ - ගෙවල් හදල දුන්නෙ - අන්තිමට ඒ ගොල්ලන්ට හිතුවක්කාරකම් කර ගන්න ඉඩ දීල අපි පැත්තකට වෙන්නද?"

"දෙන්නෙකුගෙ අදහසක් උඩ දෙන්නෙක් තීන්දුවක් ඇති කර ගන්න එක හිතුවක්කාරමක් ද? අපේ කාලෙ වගෙ නෙවෙයි දූන්. ඉගෙනගෙන තියෙනව නම්, කාසිය බාගෙන් ටිකක් එක තැනක් එහා මෙහා වුණත්, දෙන්නෙකුට එකට ලෝකෙ රටේ ජීවත්වෙන්න තේරුමක් තියනව නම් ආදර කරුණාවක් උඩ ඒ දෙන්න ගිවිසුමකට ආවම ඕක හිතුවක්කාරකමක්ද?"

තාත්තා මේ කියන්නේ අපගේ සම්බන්ධයට ඔහු විරුද්ධ නැති බව නොවේද?

අම්මාගේ පිළිතුර ලැබෙන තුරු ගෙවුණු මොහොත ඇතුළත බලාපොරොත්තුව මගේ සිත අරක් ගත්තේය.

"ඔහේ කතා කරන්නෙ මොකුත් නො දනනෙ. දෙපැත්තෙම කැමැත්තෙන් සිද්ධ වුණු එකක් නම් මට එහෙම වත් හිතල හිත හදා ගන්න නො තිබුණ යෑ. ඔය වයසට ඔවගෙ දේවල් වෙනව නේ ද කියල. මෙතන දෙන්නෙකුගෙ අදහසක් නෑ ඩැයිවර් උන්නැහේ"

තාත්තාගේ විරුද්ධත්වයක් නැති වා පමණක් නොවේ. යම්

හෙයකින් කුසුම් ද එක් සිත් ව ක්‍රියා කළා නම් අම්මා පවා අත්හැර සිය විරුද්ධතාවය යටපත් කර ගැනීමට ඉඩ තිබිණි යි ඇයගේ ඒ වචන අනුව මට සිතිණි. ජීවිතය ඇඟිලි තුඩුවලට ගැවෙන තරම් සංවේදී අසාර අසු නොවී පැන ගියා වැනි සංවේගයක් හා පසුතැවිල්ලක් නිසා මගේ හදවත මිරිකී ගියේය.

"..........මුලින් ම දවසෙ කුසුම් ට මේ අදහස දැම්ම වෙලාවෙම ඒකි කියල තියෙනව නෙ නැත්ද මා ගැන තියන විශ්වාසය කඩන්න මට බැ මං මෙහෙම කැමති නෑ කියල. ඒ කියන්නෙ පිට එකී අරගෙන කියද්දී මගෙ දරුව, මගෙ බඩෙන් වදපු දරුව නේද කියල තියෙන්නෙ අම්මා තිබ්බ විශ්වාසෙ කැඩුවට කමක් නෑ කියල..........?"

"ඔය තරම් හයියෙන් කෑ ගහන්න එපා. පාරට ඇහෙයි."

අම්මා කතා කරන්නේ මේවා බොරු නම් පුතේ පුළුවන් නම් ඔප්පු කරපන් යන අභියෝගය රැගත් හඬකිනි. කිසිවක් බොරු නැත.එහෙත් මේ සියල්ල අම්මා කෙසේ නම් දනිත් ද?

"..............කුසුමෙ කියල තියෙනව නෙ. හැමදාමත් මුල පටන් ගැන්මෙ අදල ම. දෙමව්පියො විරුද්ධ දෙයක් මම කරන්නෑ කියල. ඒ විතරක් ද? ඒකි කියල තියනවනෙ නැත්ද කවදාවත් ඕකට කැමති වෙන්නෙ නෑ කියල. විශ්ව විද්‍යාලෙ නොගියට බී.ඒ. පාස් නොකළාට කෙල්ලෙක් වෙලා - ගෑනියෙක් වෙලා ඒකිට තිබුණ නේද ඒ පොඩ්ඩ තේරුම් ගන්න මොළයක්........? මමත් ඉගැන්නුවා දරුවන්ට මොළේ පාදු වන්න කියල. තාත්තණ්ඩි කතා කරනව දෙන්නෙකුගෙ අදහසට ඉඩ දෙන්න. කොහෙ ද මෙතන දෙන්නෙකුගෙ අදහසක්? ඒකිට හංගගෙන ඉන්න නොතිබුණා ද? ඒකිගෙ අදහසක් නැති නිසා නේ ද නැත්දෙ මම කවදාවත් මීට පස්සෙ මේ ගෙදර පස් පා ගන්නෙ නෑ මීට පස්සේ ඒවිසේට ලොකු අයිය එක්ක කථා කරන්නෙ නෑ කියල දිවුරල ගියේ.....?"

එසේ නම් කුසුම් මගෙන් සඟවා ගන්නට උත්සාහ කරන රහස මෙ යයි. ඇය සියල්ලම අම්මට කියල.

"........ඒකි මී හරකි වගෙ අඬල අඬල මේ ගෙදරින් පිටවෙලා ගියා. මට ඒකිව නැති කළා.ඒකිට මාව නැති කළා." යි අවසන් කර ගත් අම්මා ද ඉකි බිඳ අඬන්න පටන් ගත්තාය.

අම්මා වෙත ගැහැනුන්ගේ බොළඳ ගති පිහිටා නැත. මීට පෙර මතක ඇති කාලයක මා අම්මාගේ ඇසක කඳුළු දුක ඇත්තේ එක් අවස්ථාවක පමණි. එනම් මා විශ්ව විද්‍යාලයයට ඇතුළු වනු පිණිස



ගෙදරින් පිට වුණු දිය.

"ඕනෑ එකක් ඕනෑ එකක්. මම කතා කරන්නෙ නෑ මීට පස්සෙ ඔය ගැන"යි බිඳුණු ස්වරයෙන් කී තාත්තා, මා සසු කරගෙන, එහෙත් මා දෙස නො බලා මිදුලට බැස පාර පැත්තට පිය නැගුවේ මවගේ කඳුළු බලන්නට බැරිකමට ම ය යි මම නොසිතිමි. මෙතෙක් දුර කතා කරන්නට තමාට ආස්වාදයක් ධෛර්යය හා ශක්තියක් ගෙන දුන් බලවේගයක් අම්මාගේ කතාවෙන් හදිසියේ විසිරී වී ගිය බවක් තාත්තාට හැගෙන්නට ඇත.

අම්මාත් තාත්තාත් අතර ඒ අන්දමින් කතා වුණේ මගේ ඉරණම තීරණය වූ ආකාරය ගැනය. දෛවය වෙනස් කරවීමට හෝ එහි ඇති අසාධාරණත්වය පෙන්වා දීමට හෝ වචනයකින් වත් හවුලක් වීමට සවන් දී සිටියෙමි.

චපලකම ගැහැණිය සඳහා ම පිහිටි උරුමයක් ය යන නිගමනයකට බැස නිගමනයට බැස ගන්නට ජීවිතයේ මුල් වරට මට එද සිදු විය. දෙමව්පියනට ආරංචි වන්නට කලින් ඉවරයක් කර හිත හද ගනිමු යි කළ යෝජනාවට මගෙන් බුරුලක් නැති තැන ඇය කර ඇත්තේ අම්මා වෙත ගොස් සියල්ල අනාවරණය කර මා අමතක කරන බවට දිවුරා, අපේ ගෙදරින් පිට වී යෑමය. මෙය චපලකමටත් වඩා අවලක්ෂණ පාවාදීමකි.ඇයට මා අමතක කිරීමේ අයිතියක් ඇතත් මොන හිතකින් ඇය මෙබඳු පියවරක් ගත්තේ ද? මගේ හිත වෙනස් කරවීමේ මඟක් පමණක් නොව තම හොඳ නම රැක ගැනීමත් සඳහා ඇය ආත්මාර්ථකාමී සිතින් ක්‍රියා කර ඇත.

කාලයට අනු වී තුනී වන්නට ගිය මගේ කෝපය, කුසුම්ට යවන ලද ලියුම් හතරකට ම පිළිතුරක් පවා නො ලැබුණු කල වරින් වර අලුත් වන්නට විය. කෝපය මැඩගෙන දැඩි ශෝකයකින් ද ආත්මානුකම්පාවකින් ද මම බොහෝ ලෙස පීඩා විඳින්නට වීමි.

ආත්මාර්ථකාමය මගේ සිත ජය ගත්තේය. ඇයගේ පැත්ත නොසිතූ සිතන්නට ආයාසයක් බවා නො ගත් - මම ඇය විසින් මට කරන ලද ද්‍රෝහීකම ගැන ඇති වූ හැඟීම් වඩ වඩා ජීවාධින් වෙහෙස වින්දෙමි. මා වඩාත් තැවුණේ ඇය මා ගණින් නොගෙන නො සලකා හැරියා ය යන අදහස මතු වීම නිසාය.

අන්තිමට මගේ හිතේ ඉතිරි වූයේ කුසුම් නිසා කිසි කලෙක ඇති නො වුණු කෝපයකි. කරුණු විමසා ඇය වෙත ලියන ලද තවත් ලියුම් කීපයකට ද පිළිතුරු නොලද තැන මව්පියන් නැති වෙලාවක්

Free E-Pusthakalaya

කිලා මා ඇයගේ නිවසට ගියේ ද ඒ කෝපය ඉවසිය නොහැකි තරම් උත්සන්න වූ අවස්ථාවකය.

ඇය මා හා කතා කරන්නට තාගේත් මට මුහුණ දීමට තරම් අවංකකමක් නැති නිසා යයි මම තරයේ සිතීමි. එහි දී කෝපයට පිළිකුලක් බඳු අමිහිරි ලක්ෂණයක් ද එකතු විය.

ප්‍රේමසිරි හා ජයන්ත අපේ ගෙදර පැමිණි දවසෙක, ගුරුකමට යැමෙන් මා වළකනු පිණිස අම්මා නවදූරටත් උත්සාහ කළේ මල්ලිලා ඉදිරිපිට දීය. ඔවුන්ගේ තර්ක ණයට ගත් විජය, ගාමිණී හා සෙනරත් යන තිදෙනා ම පරිපාලන සේවයේ උසස් විය හැකි අන් රක්ෂාවක් සොයා ගන්නා ලෙස මට කරුණු කියන්නට වූහ. අම්මාටත් මේ තියමන් අල්ලාගෙන මගේ අදහස වෙනස් කරවීමට මහන්සි ගත්තාය.

"ඉස්කෝලෙ මහත්තයෙක් වෙන්න ඔය තරම් ඉහළට ඉගෙන ගන්න ඕනෑ ද ලොකු පුතේ ?" යි ඇය කීවේ සාවඥ ලෙස සිනාසෙමිනි.

මා කලින් ඉගෙන ගත් මධ්‍ය මහා විද්‍යාලයය ම තෝරා ගැනීම ගැන අම්මා විශේෂයෙන් නො කැමති වුණාය.

මා මැදි මහ විදුහලට ඉගැන්වීමට යැම දී නිතර කුසුම් දකිමෙන් හා මුණ ගැසීමෙන් සම්බන්ධය නැවත පටන් ගැනීමට ඉඩ ඇති බවට බියක් හා සැකයක් විසැකයෙන් ම අම්මා තුළ පහළ වන්නට ඇත. එහෙත් ඇය මගේ මුණට කීවේ,

"ගමේ ම හිටියම ලොකු පුතේ අගයක් නෑ" යනුවෙනි.

මා ගෙදර නතර වීම ගැන තාත්තා කැමති විය. රෝහණ ද එසේ ම ය.

වෘත්තියක් වශයෙන් ගුරුකම ගැන කවදත් මගේ තද ඇල්මක් විය. ඒ අතර ම ඉගෙනගත් පාසලට සේවයක් සැලසීමේ පරාර්ථකාමී අගාවක් ද මා තුළ තිබිණි. ගෙදර ම නතර වීමෙන් මා බලාපොරොත්තු වූ තවත් කරුණක් නම් මල්ලිලාගේ ඉගෙනීම ගැන වැඩි උනන්දුවක් දක්වීමයි.

මේ අතර, නැවත ළඟ ඇසුරකට පත්වීමේදී, කුසුම්ගේ අදහස් වෙනස් කරවා ගැනීමට වඩාත් පහසුවන අවස්ථාවක් ලැබෙනු ඇති යි නිරන්තර බලාපොරොත්තුවක් මගේ සිතේ නොවිණැයි කීම ද බොරුවකි. මන්ද යත්, තවමත් මගේ හදවත කුසුම් පතාගෙන සිටින බැවිනි. සියල්ල අම්මාට හෙළි කළැයි මාස කීපයකට උඩ දී කුසුම් කෙරෙහි



උපන් ද්වේෂ සහගත හැඟීම් මේ වන විට තරමක් දුරට තුනී වී ගොස් තිබිණි.

ඒ අතරට කුසුම්ලා දෙ දෙනෙක් මගේ සිතෙහි මැවෙන්නට වූහ. බාල කාලයේ සිට ඉතා සමීපව ඇසුරු කර, පසුව ම විසින් පෙම් බැඳි මගේ කුසුම් හා අම්මා ඉදිරියේ මා පාවා දුන් කුසුමිය. එකියක කෙරෙහි හටගත් කහට නිසා අනෙක් එකිය අමතක කර ගන්නට මම කිසිසේත් අසමත් වීමි. කෝපය වඩ වඩාත් සංසිඳෙත් ම පරණ කුසුම් නැවත නැවතත් මගේ හදවත සැරිසරන්නට වූවාය. එහි දී හට ගත්තේ දැඩි වේදනාවකි. සිත, වේදනාව පහකර සැනසුමක් ඉල්ලා කෑ ගසන්නට විය.

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සිත් දිනා ගැනීම ගුරු වෘත්තිය සාර්ථක වීමට බෙහෙවින් හේතුවන කරුණක් බවට හැඟීමක් මා තුළ විය. ළමයින් අතර ජනප්‍රිය වීමට ය යි අමුතු උත්සාහයක් ගැනීමේ අවශ්‍යතාවක් මට නොවිණි. මගෙන් ඉගෙන ගත් අයගෙන් වැඩි දෙනා අවුරුදු කීපයකට උඩ දී මා හා එකට පාසලේ ම සිටි අය ය. උසින් මහතින් වැඩී.ගත වූ වසර කීපයක කාලය විසින් ඇති කරන ලද වෙනස්කම් තිබුණත් මේ එදා පුංචියට සිටි අසවලා ය අසවලාය යි මුළු පාසලේම හැම ළමයෙකුගේ ම වාගේ මුහුණත් නම් ගම් ආදියත් මතක් කර ගන්නට මට වැඩි දවසක් ගත වුණේ නැත.මේ හිතවත් මුහුණු ද සුන්දර යොවුන් වියට පසුතල වුණු පාසල් පරිසරය ද රසබර මතකයන් නිරතුරු ව අලුත් කරන්නට විය. ඒ නිසා ගුරුවරයනට වඩා මා තව දුරටත් ළං වූයේ ශිෂ්‍යයනට ය. ඔවුනට ඉගැන්වීමෙන් ද ඔවුන් හා ඇසුරින් ද ඔවුන් හා ගැටීමෙන් ද මම තෘප්තියක් ලැදිමි.

ගුරු වෘත්තිය තෝරාගෙන ආපසු මැදි මහ විදුහලට පැමිණීමේදී කුසුම් පිළිබඳ බලාපොරොත්තු හා පැතුම් මගේ යටි සිතෙහි දිගට ම පැවතියත් ආචාර්යවරයකු ලෙස මගේ වගකීම් හා යුතුකම් මැඩගෙන හැඟීම් මතු නොවන තැනට වග බලා ගත යුතු ය යන අධිෂ්ඨානය මුල සිට ම මා වෙත පැවැතිණි. එහෙත් ඒ සඳහා දැඩි ආයාසයක් ගන්නට සිදු වූ බව මුල් සතියේ ම මට අවබෝධ විය.

දහසකට අධික ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමූහයක් මැද මගේ නෙතටත් සිතටත් නිරතුරු ව ඇය ඉස්මතු වී පෙනෙන කල මම කෙසේ නම් හැඟීම් මැඩ ගන්නෙම් ද? පංතියේ දී ඇය දෙස නො බලන්නට කෙතරම් දැඩි ලෙස සිතට ගත් නමුත් මගේ නෙත් තිස් ගණනක් අතර ඒ මුහුණ ම නැවත නැවතත් සොය සොයා යැමෙන් වැළැක්වීම පහසු නොවිය.

For E-Pustakalaya

මගේ සිත අවුල් වීමට වැඩි දවසක් ගත වුණේ නැත. මට පාසල ම වාගෙ මගේ යහළු යෙහෙළියන් ලෙස කුළුපග වෙද්දී - කුසුම් පමණක් මා නො දන්නා ළෙන්ගතුකමකින් මට ළං වෙද්දී - කුසුම් පමණක් මා නො දන්නා නාඳුනන එකියෙක ලෙසින් හැසිරෙන්නට වූවාය.

පංතියේදීත් පිටතදීත් මගේ ඇස් මඟ හරින්නට ඇය දක්ෂ ලෙස පරිස්සම් වූවාය. ඇය මගේ පාඩමකට සවන් දීගෙන සිටියේ බැස්තුව වෙත යොමා ගත් ඇද නෙතිනි. ඉන් පිටත යෙහෙළියන් පිරිසක් මැදට වී අල්ලාප සල්ලාපයේ යෙදී සිටින තැනකින් මා පිය නගිනු දකින්ම ඈ කතාව නතර කළාය. සිනාව සඟවා ගත්තාය. දෙනෙත් බිමට බර කර ගත්තාය. ඇයගේ මේ හැසිරීම මා කෙරෙහි ප්‍රිය නො සතුට, අප්‍රසාදය හා විරුද්ධත්වය පළ කිරීමක් ලෙස මම විදුණු සිතින් තීරණය කළෙමි. කුසුම් දිනපතා ම මගේ සිතට පීඩනයක් ගෙන දුන්නේ මේ ආකාරයෙන් පමණක් නොවේ.

කුසුම් කවදත් ඉගෙනීමට දක්ෂකමක් හා ආශාවක් දැක්වූවා ය. බාල කාලයේ සිට මම ගෙදර දී ඇයට පාඩම් කියා දී ඇත්තෙමි. විෂය හා මාතෘකාව කුමක් වුවත් ඇය කියා දෙන දෙයක් අසාගෙන සිටීමේ ලොකු කැමැත්තක් හා උනන්දුවක් ඇතිවය.

ඉතිහාසය සඳහා අන් පංති කාමරයට යන්නට ඔවුනට සිදු විය. කතාවක් බහක් සිනාවක් නොමැති ව බිම බලාගෙන අලස ගමනින් අන්තිමට එන ඇය ගැහැණු ළමයින්ගේ පේළියේ කෙළවරින් ම වාඩි ගත්තේ අප්‍රසන්න ජනක කටයුත්තකට සූදානම් වන එකියෙක මෙනැයි මා සිතුවේ තරහෙනි. මා කියාදෙන

කිසිවක් සිතෙහි දරා ගැනීමට හෝ ලියා ගැනීමට හෝ වුවමනාවක් උනන්දුවක් ඇති බවක් ඒ මුහුණින් සිතාගෙන නො හැකි විය. මා යමක් කියා දෙන කල, කෙස් කරලත් ඉදිරියට දමා ගත් ඇය එහි අග ගැට ගැසුණු රිබන් පටිය අත පත ගගා ඔහේ බලා සිටියේය. යමක් ලියන්නට නියම වුණු කල ඇය පොතත් පැන්සලත් වෙත අත යැව්වේ මහත් උදාසීනකමින් නොකර ම බැරි දෙයක් කරන ආකාරයෙනි. සිතුව නාඳ වෙන්ම මා පාඩම නතර කළත් නැතත් ඈ පොතත් පැන්සලත් අතට ගෙන ගමනට සැරසුණාය.

සියල්ලට ම කලින් පංතියෙන් පිට වන ඈ සිය ප්‍රාන මිතුරිය වන පද්මිනී සේනාරත්න එන තුරු රැඳුණේ කොරිඩෝවේ බාගයක් දුරට ගියාට පසුව ය.

ශිෂ්‍ය ශිෂ්‍යාවනට වැඩිපුර දැනීමක් හා අවබෝධයක් ලබා දෙනු



ප්‍රිනිස ම විසින් පිහිටුවන ලද ඉතිහාස සංගමය මගින් හවස් වරුවේ පැවැති සාකච්ඡාවලට ඇය ආවේ නැත. ආවත් ප්‍රශ්නයකට හෝ හවුල් නොවී බලා ගත් පැත්ත බලාගෙන වූන්නාය.

ඉතිහාස සංගමයේ කාරක සභාවට නො පැමිණීම ගැන වරක් පුස්තකාලයේ දී ඇයගෙන් නො මනාපයෙන් ප්‍රශ්න කළේ ගුරුවරයකු වශයෙන් මගේ යුතුකමක් ලෙස සිතාගෙන විනා අප අතර පැවැති හැඟීම් ඉස්මතු කරගෙන නොවේ. එහි දී ඇය ද, "නෑ සර් මට ඔළුවෙ කැක්කුම හැදිල එද කලින් ගියා." ය යි වරදක් කර බියපත් ශිෂ්‍යාවක ලෙසින් ම මා ඉදිරියේ හැසිරෙනු දකින් ම මම වේදනාවට පත් වුණෙමි, මගේ යටි සිත පතාගෙන සිටියේ කුසුම් විස ශිෂ්‍යාවක දකින්නට නොවූ බැවිනි.

ඉගැන්වීමෙන් තෘප්තියක් සතුටක් හා විනෝදයක් ලබන අතරම කුසුම් නිසා පැවැති නිරන්තර කනස්සලු ගතියකින් පාසලේ ගත කර හවස දෙකහමාරට ගෙදර ආ මා ඉන් ඉදිරියට කාලය ගෙවා දැමුවේ ද අලස - උදසීන ලෙසිනි. ප්‍රමාද වී ගත් දිවා ආහාරයෙන් පසු ව මම ටික වේලාවක් නින්දට පුරුදු වීමි. සවස අවදි වූ තැන ගෙය පුරා පැතිර ගත් පාළුව, නිසංසලකම හා මුසල ගතිය ඉළ ඇට කුඩුව පළාගෙන මගේ හදවත තුළට රිංගා ගන්නට වෑයම් කළා වැන්න.

නගරයේ ම අන් පාසලක උගත් විජය, සෙනරත් හා ගාමිණී, ගෙදර එන නියම වේලාවක් නොවිණි. වේලාපහ ආවත් ඉක්මණින් පිට ව යන ඔවුන් ආපසු ගෙදරට ආවේ ඇඳිරි වැටුණාටත් පසුවය. මැදිමහ විදුහලේ ඉගෙනීම කළ තිස්ස වැඩිපුර ගෙව්වේ කඩයේ ය. පුංචි අම්මාගේ දියණිය වන කාන්ති අපේ ගෙදර නතර වී මැදි මහ විදුහලේ ඉගෙන ගන්නට ආවේ ද මේ කාලයේය. ඒ අනුව මේ වෙලාවට ගෙදර රැඳුණේ කාන්ති පමණකි.

හවස නින්දෙන් අවදි වී ඇඳේ ම සිට අරමුණක් නැති ව කල්පනාවේ වැටී වූන් මට කඩය පිටුපස අවුත් කාන්ති අමතන අම්මාගේ කටහඬ ඇසෙයි.

"කාන්ති බලපන් ලොකු අයිය ඇහැරල ද කියල. නැගිටල නම් මේ තේ ටික ගෙනියපන්" යනුවෙන් ඇය කීවාය.

අවුරුදු ගණනක් තිස්සේ නොයෙක් වයස් සීමාවන්හි දී කුසුම් කඩයේ සිට කන්නට යමක් ද සමඟ තේ ගෙන අන්දම මට මතක් වෙයි.

Buddhika25

For E-Pusthakalaya

කාන්ති තුළින් මට කුසුම සිහිපත් වනිනේ මේ අවස්ථාවේ දී පමණක් නොවේ.

පිරිමින්ගේ පමණක් යුත් අපේ ගෙදර මීට කලින් නිතර ගැවසුණු එක ම ගැහැනු ළමයා කුසුම්ය. ගෙයි එහා මෙහා යන කාන්ති දක්නා නොයෙක් විට මගේ සිතට නැගෙන්නේ කුසුම්ය. කාන්ති වෙනුවට මගේ සිත දකින්නට පතන්නේ කුසුම්ය.

ඒ කන්නයේ ගොයම් කපා ගෙට ගන්නා ලදී. වී අටුවේ තබන්නට කලින් වේළා තබනු පිණිස අම්මා තෝරා ගත්තේ සෙනසුරාද දවසක් ය. කටයුත්ත පටන් ගත් තැන් සිට ම ඇය වැඩට උදවු නොවී මග හරිනැයි කාන්තිට බැන වදිනු මට ඇසිණි.පවුලක අතබාලයා ලෙස හුරතලයට හැදී ළිපක ගිනි මොළවන තරම්වත් වැඩක් නොදත් කාන්තිට අම්මා නිතර දෙස් කීම ගණන් ගත යුත්තක් නොවුණත් කාමරයේ පොතක් බලමින් සිටි මගේ අවධානය මෙදින වහා අම්මා වෙත යොමු වුණේ ඇයගෙන් හදිසියේ ම කුසුම් ගැන සඳහන් වූ බැවිනි.

"උඹලගෙ ආඩම්බර බලන්නෙ නෑ මම අර කුසුමෙ හිටිය නම් ඒකි කඩිය වගෙ දුවල පැනල මේ සේරම කරල දෙනව මට. ඒකි වගෙ කෙල්ලෙක් ආයි හම්බවෙන්නෙ නෑ මට......." ඈ කීවාය.

"ඉතින් ඒකි ගෙදර නවත්ත ගන්න හැදුවම විරුද්ධ වුනේ?" යි විහිළුවට කියන්නට තරම් බොළඳ සිතක් වහා මට ඇති විය. ඒ වෙනුවට අම්මා ඊළඟට කී දෙයින් මම නො සන්සුන් වීමි.

"ඒකිගෙන් වැඩක් පළක් කරවගෙන හිටිය මම. ඒක නැති කළා. මට කළ උදවුව ඒකයි."

අම්මා කතා කරන්නී මා ඇසෙන තෙක් මානයක සිටින බව නො දුන ද යි මට මුලින් ම සැකයක් බවා ඇති විය. ඇය කිසි දිනෙක මට මෙබඳු ඇනුම් පද කියා නැත. මගේ සිත ඒ අතීත් ද රිදෙයි.

මෙය අම්මා තුළ මා කෙරෙහි ඇති වූ විශාල වෙනසක් වෙයි. එක අතකින් කුසුම් මා නාඳුනන එකියක ලෙසින් පාසලේ දී හැසිරෙද්දී අනෙක් අතින් අම්මා ඇය ගැන මතක් කර දුනුත් මට මෙසේ දෙස් කීම මගේ වේදනාව වැඩි වීමට හේතු විය.

"ඒකිට මේ ගෙදරට එන්න ඉඩක් නැති කරල මට කරපු අපරාදෙ"

"කවුද අම්ම ඒ අපරාදෙ කළේ?" කෑ ගසා අසන්නට තරම් වේගයක් මගේ සිතට ආවේය. මම සිත දමනය කර ගතිමි. අම්මා



මගේ නමක් නො කියා වුව ද මේවා කියන්නේ මේ කතාව ඇදගෙන ගියෝ පැසවන තවත් දේවල් පිට කර ගන්නට දවිය යුතුය. මම දිගටම නිහඬ වීමි. එහෙත් අම්මා නිහඬ වූයේ නැත.

ඉන් පසුවත් කාන්තිගේ වරදක් අල්ලා ගන්නා බොහෝ දවසක අම්මාගෙන් කුසුම් ගැන සඳහන් විය. කුසුම්ගෙන් වැඩක් ගන්නට තිබුණු අවස්ථාව නැති කළැයි ඈ නමක් නැතිව කිසිවකුට දෙස් කීවාය.

යුතුකමක් වශයෙන් මගෙන් ම කියාවුණා මිස මා ආ ගිය තැන් ගැන නිතර නිතර අසන සිරිතක් අම්මා තුළ නොවිණි.එහෙත් අලුතක සිට ඇය මා යන එන තැන් විපරම් කරන්නට පටන්ගෙන සිටින බව ද මට හැඟිණි. බාහිර වැඩක් සඳහා හවස් වරුවේ ටිකක් පාසලේ නතර වී ගෙදර පැමිණි දට.

"මොකද ලොකු පුතේ අද මේ තරම් පරක්කු වුණේ?" යි ඈ ඇසුවාය.

"වැඩ වගයක් තිබුණා" ය යි මම කීමි.

"මේ තරම් වෙලා? ඒක හොඳයි නා ගන්නවත් වෙලාවක් නැනෙ?"

මා කිසිත් නොකියා කර බා ගත්තේ කතාව එතැනින් නතර වේ යයි සිතමිනි.

"මම අහල තිබුණෙ නම් ගුරුවරුන්ට වැඩ තියෙන්නෙ පැය පහය කියල දවසට. මේක පුදුම ඉස්කෝලයක් නෙ" යි කියාගෙන අම්මා ඉවතට ගියා ය.

ශෝකය, කෝපය, සැකය හා අවිශ්වාසය රැගත් අම්මාගේ ස්වරයෙහි, ''මේක නාඩගම් මඩුවක් නෙ" යන අර්ථය ගැබ් වී තිබිණැයි මට සිතිණි.

මා පාසලේ වැඩි වේලාවක් රැඳෙන්නේ කුසුම් එහි සිටින නිසාය යි අම්මා සැක කරනු ඇත. මේ නිසා අප අතර නැවත ඇසුරක් ඇති වෙතැයි ඇය බිය වනු ඇත. අම්මාගේ සැකය හා බිය සාධාරණය ය යි කල්පනා කරනු වෙනුවට නැවත ඇසුරක් ඇති කර ගන්නට තරම් බුරුලක් කුසුම්ගෙන් නො ලැබෙනු දුටු මම කෝපය ඇය වෙත යොමු කර ගතිමි.

මේ අතර කුසුම් කෙරෙහි මා තුළ මුදු මොළොක් හැඟීම් පහළ නො වුණාම යයි කිව නොහැකිය. වරෙක එය අනුකම්පාවකි. තවත්

Buddhika

For E-Pusthakalaya

වගේක කලින් මෙන් ම සෙනෙහසකි.

මගේ පංතියේ දී මුහුණට මුහුණ හමුවීමෙන් වැළැකී සිටීමට අප දෙ දෙනා ම උත්සාහ ගත් නමුත් මා ඉවතට හැරී සිටින මුළු කාලය තිස්සේ ඇයගේ දෙනෙත් යොමු වී තිබුණේ මා දෙසට බව මගේ හදවතට රහසක් නොවිණි. කලාතුරකින්, හදිසි අවස්ථාවෙක, බැරිවීමකින් මෙන් අපේ දෙනෙත් ගැටී, කිසියම් ආකර්ෂණයකින් බැඳී මොහොතක් රැඳී සිටියේය. ඒ මොහොතක සුළු වේලාව ඇතුළත ජීවිත කාලයක් තිස්සේ ලග ඇසුරකින් හට ගත් බැඳීමක්, වියෝගයක වේදනාවක්, අනාගතයක් පිළිබඳ අහිංසක ප්‍රාර්ථනයක් හා බැගෑපත් ආයාචනයක් කුසුම්ගේ සෙනෙහසින් පමණක් නොව කරුණාවෙන් ආශාවෙන් හා භක්තියෙන් ද පිරුණු ඒ දෙනෙත් තුළ මම දිටිමි.

එවැනි සිදුවීමක දී ඉදිරියට මුළු කාලය ගෙවුණේ අතිශයින් සසල වූ සිතිනි.

නව පණක් ලද බලාපොරොත්තු හා අපේක්ෂාවන් ඇය හා ගැටෙන්නට අවස්ථාවක් සොයන්නට විය.

මම කවදත් කුසුම්ගේ යහපත ගැන ඇයගේ අධ්‍යාපනයේ දියුණුව ගැන උනන්දුවක් දක්වූවෙමි. ඇය ද මගේ උපදෙස් හා උපකාරයන් සොයාගෙන ආවේත් ඒ අනුව නිතරම ක්‍රියා කලේත් කැමැත්තෙන් හා ආශාවෙනි. අද එළැඹී ඇත්තේ අන් කවරදකටත් වඩා කුසුගේ ඉගෙනීම මගේ උදවු අවශ්‍ය වූ ද එසේ ම වඩාත් පහසුවෙන් උදවු කළ හැකි වූ ද අවස්ථාවකි. ඇය වැඩ අතපසු කරමින් උදසීන තත්ත්වයකට පත්ව සිටිනු දක දක මේ අවස්ථාව අපතේ යන්නට ඉඩ හැරීම වැරදි යයි සිතන්නට මම මහන්සි ගතිමි.

ඒ අදහස උඩ මා විසින් දෙන ලද ඉතිහාස සටහන් සිනාමුසු මුහුණින් ස්තුති පූර්වක ව බාර ගත් කුසුම් ඊළඟ ද හදිසියේ දුව අවුත් කිසි කතාවක් බහක් නැතිව ආපසු දී ගස්සාගෙන ඉවතට ගිය කල මම අන්දුන් කුන්දුන් වීමි. මඩිතයට හා කෝපයට පත් මම කෝපය නිසාම ඇයගෙන් කිසිවක් ප්‍රශ්න කරන්නට නො ගියෙමි.

"මොනවටද ලොකු පුතේ උඹ කුසුම්ට පොත්පත් දෙන්න යන්නේ?" යි අම්මා මගෙන් ඇසුවේ දෙ දිනකට පසුවය.

"මොන පොතක් ද" යි කියැවෙන්නට ගොස් "ඉතින් පොතක් දුන්නම ඇති වැරැද්ද මොකද?" යි මට අසන්නට සිතිණි.

"උගතුන්ට අකුරු වරදින වෙලාවල් තියනව ලොකු පුතේ



අම්මාට පිළිතුරක් දෙනු වෙනුවට, මේ පුවත ඇයට දැන ගන්නට ලැබුණේ කෙසේ ද යි මගේ සිත අවන්නට විය.

"මේ තරම් ලෝකෙ ඉස්කෝලෙ තියෙද්දී ලොකු පුතත් ගියා මේකට ම රිංගන්න. ඒ කෙල්ල දුප්පත්කමට ඉගෙන ගන්න හදනව. ඒකත් නැති කරන පොටක් මේක"

"ඉතින් පොතක් දුන්නම ඉගෙන ගන්න බැරි වෙනවද?"

"මම වැඩිය කියන්න යන්නෙ නැ පුතේ. තවමත් ඕක හිතේ තියෙනව නම් ඒ එක්කම හිතේ තියා ගනින් උඹට අම්ම කෙනෙක් නැත කියල එච්චරයි"

දින කීපයක් යන තුරු මම අම්මාට කෙළින් මුහුණ නොදුන්නෙමි. ඇය සමඟ මොනවා හෝ වචන කීපයක් කතා නොකර සිටීම මට සිත් වේදනාවක් ද විය. මෙය අප අතර පැවැත්මෙහි අමුතු ම තත්වයකි. මම මල්ලිලා සමඟ පවා කතා බහට නො ගියෙමි. මා කාමරයෙන් එළියට ආවේ රෑ කෑම වේලාවට පමණක් ය යි කිව හැකි තරම්.

මා කාමරයට වී සිටින අතර අම්මා කාන්තිට බැන වදිනු මට ඇසිණි. හය අමුත්තක් නො වුණත් මගේ සවන් කිසිවක් අල්ලා ගන්නට උත්සුක වූයේ මෙදිනත් කුසුම්ගේ නම සඳහන් වූ බැවිනි.

ගේ ඇතුළේ ඉකි බිඳිමින් කතා කළ කාන්ති කී කිසිවක් මට ඇසුනේ නැත. එහෙත් මෙහෙන් ඇසුණු අන්දමින් කාන්ති හා කුසුම් අතර පාසලේදී වචන හරඹයක් සිදු වී ඇත.

"මීට පස්සේ හෙම ඒකිට මොකුත් කියන්න ගියොත් බලා ගනින්කො" යි අම්මා සැරෙන් කීවාය.

කාන්ති දුන් පිළිතුර මට ඇසුණේ නැත.

"කවදවත් වෙන්න බැරි දෙයක්නෙ. කුසුමෙ උඹ වගෙ සණ්ඩුවට යන කෙල්ලෙක් නෙවෙයි නෙ. මොනව කිව්වත් ඒකි ශීලාචාර ගැනු ළමයෙක්."

"මහතුන් මල්ලි තමයි ඔය කේලම් කියන්නෙ. ඔය මල්ලිගෙ බොරු"

"කාන්ති අක්කෙ මගෙන් ගුටියක් කන්න ඕන වෙලාද?" යි තිස්ස කීය.

"අනෙක කුසුම් එන්කල මොනව හරි තියෙනව නම් අපි වග

Buddhika 95

For E-Pusthakalaya

බලා ගන්නම්. උඹල ඒ කතාවල් වලට යන්න ඕනැ නෑ. වැඩිහිටියො ඉන්නව ඒවට"

මා ඉස්තෝප්පුව දෙසට ඒත් ම අම්මා කතාව නතර කළාය.

"මොකක්ද ඔය කතාව?"

"මොකුත් නෑ මේ කෙල්ලන්ගෙ කතාවක්" ය යි අම්මා කීවේ, ඒක උඹට ඕනැ එකක් නොවෙයි යන ලකාවෙනි.

කාන්ති හා විජයලතා පාසලේදී ළඟින් ඇසුරු කරන බව මට මතක් විය. කුසුම් ගැන මෙහි දී ද මා තුළ අනුකම්පාවක් ඇති නොවිණි. ඉතිහාස සටහන් ආපසු දීමෙන් පසුව ඇය හැසුරුණේ තව තවත් මුරන්ඩු ගතියකිනි.ඇය ඊට පසු පංතියේ දී හිස එසවූයේ ම නැත.

යමක් සිදු වී ඇත්නම් එය කෙල්ලන්ගේ බොළඳ කතාවක් ලෙසට ම සිතා මම කුහුල මැඩ ගතිමි.

## 12

හැඩ තල, ගමන බිමන, කතා බහ හා ඇඳුම පැළඳුම ආදී සියල්ල අතින් පද්මිනී සේනාරත්න අනෙක් දූරියන් අතර කැපී පෙනුණාය. එසේ ම ඇය හා මැදි මහ විදුහලට ඇතුළු වන්නට ඇත්තේ මා එහි ඉගෙනීම අවසන් කර පිටව ගියාට පසු ව බව මුල දී මට වැටහිණ. මගේ සිතෙහි ඇය විශේෂයෙන් සටහන් වූයේ මේ කරුණ නිසා ම නොවේ.

පද්මිනී කුසුම්ගේ හොඳම මිතුරිය බව තේරුම් ගැනීමට මට වැඩි දවසක් ගත වූයේ නැත. එපමණක් ද නොවේ. කුසුම් හා මා අතර සියල්ල පද්මිනීට රහසක් නොවන බව ඇය හැසිරුණු හා මා දෙස බැලූ ආකාරයෙන් ම මම සිතා ගතිමි.

ඇය කෙරෙහි මා තුළ මිතුරිය වෙත උපදින අන්දමේ තරමක සුහද හැඟීමක් ඇතිව තිබුණේ එබැවිනි. ඒ නිසාම බාහිර වශයෙන් ඇය ගැන විශේෂත්වයක් නො පෙන්වීමට මම පරිස්සම් වීමි.

එදා සවස නියමිත පාසල් වේලාවන් පසුව, ළමයින් පිට්ටනියේ ක්‍රීඩා කරන අතර මම පාළු පංති කාමරයකට වී ඉතිහාස අභ්‍යා



පොත් වගයක හරි වැරැදි බලමින් සිටියෙමි. කිසිවකු මා වෙතට පැමිණි බව ඇස් කොනට යන්තම් අසු වී ගියෙන් මම එක් පොතක් අවසන් කර පැත්තක තබා අනෙකක් ගන්නව අත යවමින් හිස ඔසවා බැලීමි.

මා ඉදිරිපිට වූයේ පද්මිනී සේනාරත්න ය. ඇයගේ අඩි ශබ්දයක් මට නො ඇසුනේ රබර් පතුල සහිත සුදු ටෙනිස් සපත්තු නිසා පමණක් නොව නිශ්ශබ්ද ව පිය තගන්නට ඇය ආයාසයක් ගෙන ගමන් කළ නිසා යැ යි මා සිතුවේ පසුව ය.

"බය වුණාද?"

දඟකාරකමකින් යුත් ඇයගේ නෙත් කෙලින්ම මා වෙත යොමු වී තිබිණි.මා මුවගට සිනාවක් නගා ගත්තේ වෑයෙමිනි. මම අලුතින් අතට ගත් අභ්‍යාස පොත දෙස බැලීමි.

"ඔය තරම් බය තිබුණාම ඇති" යි කියාගෙන ඉතිරි අඩි කීපය ඉදිරියට ආ ඈ මගේ ඩෙස්කුවට හේත්තු වුණාය. ගමනින් හා කතාවෙන් ඇය මට ළං වුනා වැඩිය යයි මට වහා සිතිණි. මගේ මුහුණින් සිනාව පලා ගියේය.

"මූණ නපුරු කර ගන්න ඕන්න! මම ආවෙ සර්ගෙ වැඩට බාධා කරන්න හෙම නෙවි"

"මම හිතන්නෙ නෑ මගේ වැඩට බාධා කරන්න සේනාරත්නට පුළුවන්ය කියලා." මම සන්සුන් ලෙස කියා ගතිමි. මා වචන පිට කළේ ගුරුවරයකුගේ පෙනීම ආරූඪ කර ගන්නට හිත යටින් තැත් කරමිනි.

"අන්න අන්න. ක්ලාස් එකේ දි වගෙ ඒ විදිහට කතා කරන්න ආවොත් මම යන්න යනව. මම ආවෙ යාළුවෙක් විදිහට"

මම තරමක් මවිත වී ඇය දෙස බැලීමි.

"සේනාරත්න සේනාරත්න නෙවි. මට පද්මිනී කියන්න. යාළුකමට කතා කරන්නෙ එහෙමයි."

"හොඳයි පද්මිනී. පද්මිනී මොකද ආවෙ? පද්මිනීට මගෙන් කෙරෙන්න තියෙන උදව්ව මොකක්ද පද්මිනී? කියන්න පද්මිනී"

"බොහොම ස්තුතියි" ඈ සිනාව මැඩ ගනිමින් කීවාය. උදව්වක් ඕනෑ වුනු දවසක මම ඇවිත් කියන්නම්. අද ආවෙ උදව්වක් ඉල්ලන්න නෙවි. උදව්වක් කරන්න."

"මේ මට?"

Buddhika 25

For E-Pusthakalaya

"සර්ටයි තවත් කෙනෙකුටයි දෙන්නෙකුට"

"සර්ටයි තවත් කෙනෙකුටයි දෙන්නෙකුට" වගේ ඇය කිව්වේ ඔහු ගැන දැන්ම දන්නා නිසාදෝ මම

විහිළුවක් ලෙස සලකා තවදුරටත් සැහැල්ලු ලෙස කතා කරන්නට බැරි බව මට සිතිණි. මම එතවර කිසිත් නොකීමි. මගේ සිතට කෝපයක් නැගෙන්නට විය.

"ඇයි සර් අර ගැහැණු ළමයට ඔය තරම් දුක් දෙන්නෙ?"

"මොන ගැහැණු ළමයට ද පද්මිනී?"

"කුසුම් මොන තරම් වේදනාවකින් ද ඉන්නෙ කියල මම දන්නව"

මා "මොන ගැහැණු ළමය ද පද්මිනී?" යි ඇසුවේ තරහෙනි. එහෙත් මා ප්‍රශ්නයක් ඇසූ බවවත් ගණන් නොගෙන ඇය කතා කළේ සන්සුන් ලෙසිනි. කෝපයට පත් පිරිමියෙකු - ගුරුවරයකු - ඉදිරිපිට එසේ හැසිරීම ඇය මට අභියෝගයක් යි මට හැඟිණි.

මා මේසය මත වූ පොත දෙස ද ඇය කෙලින් ම මා දෙස ද යොමා ගත් ඇස් ඇති ව විනාඩියක් පමණ ගත විය.

"මට කියන්න පුළුවනි පද්මිනී - පද්මිනී මේ ගැන දන්න කෙහෙල් මලක් නෑ. මගෙ පුද්ගලික කටයුතු වලට ඇඟිලි ගහන්නෙ නැතුව පැත්තකට වෙලා තමන්ගෙ වැඩක් බලා ගන්න කියල. නමුත් මම....."

"සර් එහෙම නො කියන බව දන්න නිසයි මම ආවෙ"

"මොකක්ද පද්මිනීට තියෙන සහතිකය මම එහෙම......"

"ඔය ඇස්. වේදනාවෙන් පෙළෙන ඔය ඇස්" ඈ ඉංග්‍රීසියෙන් කීවාය.

තිගැස්මක් බඳු දෙයක් මගේ සිතට නැගිණි.

වේදනාවෙන් පිරි ඒ ඇස්වල පත්ලට කිමිදෙන්නට මෙන් පද්මිනී සේනාරත්න කෙලින් ම මා දෙස බලා සිටියාය. මා යටපත් කර ගත් ආකර්ෂණයක් වැනි ස්වභාවයක් ඇයගෙන් නික්මිණි. මා බිය ගත් කළ ගතියක් මෙන් ම හිතවත්කම සේයාවක් ද එහි විය. එකිනෙකා වෙත යොමා ගත් බැල්ම ඇති ව ටික වේලාවක් සිට අනතුරු ව කලින් ඉවතට හැරුණේ මම ය.

"මම දන්නව සර් ඉන්නෙත් වේදනාවෙන්" ඈ නැවත සිංහලෙන් කියන්නට පටන් ගත්තාය. " ඒ ළමයත් වේදනාවෙන්. දෙන්න දෙන්නට ඉස්සර වගේ ම ආදරෙයි. දෙන්නම දුක් විඳිනව. ඇයි ඔය විඳින්නේ දුක් විඳින්නෙ?"

Buddhika 15



ආත්මානුකම්පාවකින් පිරුණු සිත දුබල වීගෙන යන්නට විය. යුවතියක වගේ ම ශිෂ්‍යාවක ඉදිරිපිට අසරණයකු වීම මදිකමක් ලෙස එසේ දුබල වූ සිතට දැනුණේ නැත."පද්මිනීට මේ කතා ඕනෑ නැතැ" යි කිව හැකි තැන මා පසු කර ආවේ ටිකකට කලිනි. දැන් ඇත්තේ ඇය හිතවතියක ලෙස සලකා කතාව කරගෙන යෑම පමණකි.

අනෙක් අතට දෙපැත්ත ගැනම කරුණු දන්නා හිතවත්කමක් ද දක්වන කිසිවකු සමඟ මේ ප්‍රශ්නය ගැන කතා කිරීමේ වුවමනාවක් කාලයක් තිස්සේ මගේ සිතේ තිබෙන්නට ඇත.

"මොනවද පද්මිනී මට කරන්න කියන්නෙ? ඒ වේදනාවලින් මිදෙන්න කතා කළා ම අහන්නේ නැත්නම් මම මොනව කරන්නද පද්මිනී?"

"තව උත්සාහ කරන්න සර්"

"ලියුමකට උත්තර ලියන්න නැත්නම්, කතා කරන්නෙ නැත්නම්, මම මොනව ද කරන්නෙ?"

"ගොඩක් දේවල් තියෙනව සර් කරන්න" යි පද්මිනී නෝක්කාඩුවකට මෙන් සුසුමක් පිට කළාය.

"පද්මිනී ඔය කතා කරන්නෙ මොකුත් නොදන මම හිතන්නෙ" යි මා කීවේ නො මනාපයෙනි.

"මම සේරම දන්නෙ නෑ සර්. නමුත් මම හිතන්නෙ මම ටිකක් දන්නව."

"වෙන එකක් තියා මගෙන් පළි ගන්න වෙන්නැති දැන් පංතියෙ වැඩක් අතපසු කරනව"

"පව් සර්. ටිකක් හිතල බලන්න ඒ ළමයට තියෙන කරදරවලට හිත හදගෙන පාඩම් කරන්නෙ කොහොම ද කියල?"

"මම නෝට්ස් ටිකක් දුන්න පාඩම් කරන්න කියල" මම පද්මිනී කී කරුණු යටපත් කරමින් කීමි. "........සර්ගෙන් විජයලතා නෝට්ස් ඉල්ලුවද?"

පද්මිණී සිනාසුනාය. මම ඇය දෙස අමුතුවෙන් බැලීමි.

"ඒකනෙ කියන්නෙ සර් දන්නෙ නෑ කියලා"

"මොකද මම නොදන්නෙ? මුරණ්ඩුකමට නෙ. වෙන මොකක්ද?"

Pusthakalaya

"ඒක කොයි තරම් දුර ගියා ද කිව්වොත් මම වැඩියත් ම සර් කථා කරන්න හිතුවෙත් ඒ නිසා........සර්ගෙන් විජයලතා නෝට්ස් ඉල්ලුවා ද?"

"මොන විජයලතෙක් ද?"

"ගිනි තියල ඉවර වෙලා දන්නෙත් නෑ! බබා වගෙ අහනවා මොන විජයලතෙක් ද කියල!" ඈ තවත් සිණාසුණා ය. "........විජයලතා කාරියප්පෙරුම. අර සර් ගෙ ඇගේ නිතරම එල්ලෙන්න එන්නෙ."

"ඉතින් මොකද වුණේ?"

"කුසුම් ළඟ නෝට්ස් ටික තියෙනව දැකල විජයලතා කිව්ව එව්ව ගෙනාවෙ එයාට ය කියල. ඒ ටික ඉල්ලුව. කුසුම් කිව්ව මම ඉල්ල ගත්තෙ සර්ගෙන්. කියවල ඉවර වෙලා සර්ට දෙන්නම් සර්ගෙන් ගන්නය කියල. ඉතින් මොනවද විජයලතා දුවගෙන ගිහිල්ල අර සර්ගෙ නංගි කෙනෙක් ඉන්නෙ කාන්ති. කාන්තිත් එක්ක ඇවිත් කුසුම්ගෙ ඩෙස්ක් එක ඇරල නෝට්ස් ටික ගන්න ගියා. ඒ පාර මම හරස් වුණාම......"

"කුසුම් කාන්තිත් එක්ක කතාවට ගියෙ එතැන්දිද?"

"කුසුම් කිසි කතාවක් කළේ නෑ සර්. හිඟන්නී වගෙ පැත්තකට වෙලා හිටිය. කතාවට ගියේ මම යි. මම යි කිව්වෙ ඔය ගොල්ලන්ගෙ අයියගෙ නෝට්ස් ගෙදර ගිහිල්ල බලා ගන්න. අපේ පංතියෙ ඩෙස්ක් එකකට අත තියන්න එපා කියල. කාන්තියි කතාවට ආවෙ. කාන්තියි කිව්වෙ අපේ අයියට ඕනෑ නැහැ වට්ටි අම්මල ගෙ දූල. එයාගෙ නංගිට වුණු දේවල් තමයි අක්කට වෙන්නෙත්. ඔන්න ඕවගෙ හරි නරක ජාති කිව්ව......"

මගේ කෝපය තවමත් කුසුම් වෙත ද ඉතිරි වී ඇත්තේ ඇය මට මේ කිසිවක් නො කී බව මතක් වීමෙනි. කෙල්ලන්ගේ බොළඳ කතාවක් ලෙස පිටු දක්නට බැරි තරම් බරපතළකමක් මෙහි ඇත. අනෙක් අතට මා එය ලොකුවට බාර ගත් බවක් පද්මිනී ඉදිරියේ පෙන්වීමට ද මට වුවමනා නොවිණි.

"ඔය විතරක් නෙවි තව ගොඩක් නරක දේවල් කෙල්ලෝ එක්කල කියනව සර් කාන්ති." මඳ නිහඬතාවයකින් පසු ඈ යළි කීවා ය."කුසුම් සර් ගෙ ඇඟේ එල්ලෙන්න ගියාලු. සර්ලගෙ අම්ම කුසුමට ගෙදරටත් එන්න එපා කියල එළව ගත්තලු. සර් බඳින්න ඉන්නවලු මධුරි කියල නැන කෙනෙක්. ඔන්න ඕවගෙ දේවල්."



"කුසුම් කාන්තිත් එක්කල කතාවට ගියේ නැද්ද පද්මිනී?"

ඇය අන්තිමට කියාගෙන ආ දෙයින් වූ අප්‍රසන්න ජනක හැඟීම පිටු දක්නා සිත්න් මම ඇසීමි.

"මම සේරම බලාගෙන. සේරම අහගෙන. කුසුම් කාන්තිට කිව්වෙ මම ඔයාට වරදක් කරල නැනෙ කියල විතරයි. වෙන හුස්මක් පිට කළේ නෑ"

මම මහත් පසුතැවිල්ලකට වීමි.

"කුසුම් නිසා ඔහොම ඉවසුව. මම නම් කියන්නෙම කුසුම් ගෙ වැරැද්ද එක අතකට. කුසුම්ගෙ හිත හොඳයි. අපි වගෙ නෙවි"

"ඒ කියන්නෙ පද්මිනීගෙ හිත හොඳ නෑ කියල?" යි මට කියැවුණේ විහිළුවක් කරන්නට තරම් කුළුපගකමක් මේ වන විට ඇය කෙරෙහි මගේ සිතේ වැඩී තිබුණු නිසා වන්නට ඇත. මා ඒ විහිළුව කළේ ඉරණම සමඟ බව මට සිහිපත් වූයේ කලකට පසුවය.

"පස්සෙ බැරියැ මගෙ හිත බලන්න. දැන් කුසුම්ගෙ හිත හදගන්න බලන්නකො" යි ඈ සිනාසී කිසි පැකිළීමක් නැති ව කියා මා දෙස බලා ගත්තාය. යුවතියකගේ සිනාවෙන් වැසුණු ඒ ගැහැනු ඇස් මා බියපත් කළේය. බිය මා තුළ තැන්පත් වීමට කල්දීමක් ලෙසින් පද්මිනී විනාඩියක් පමණ නිශ්ශබ්ද ව වූන්නාය.

"සර් මම කියන එකත් අහන්න ටිකක්. කුසුම්ගෙ වෙනසක් වෙන්නෙ නෑ. කොහොම හරි සර්ලගෙ අම්මට කතා කරල......"

"අම්මට කතා කරල පිළිවෙළක් කර ගන්න ඉඩක් තිබ්බෙ නැනෙ පද්මිනී" මම මගේ හිස කැසීමි. "............මෙයා පණ්ඩිතකමට ගිහිල්ල අම්මට සේරම කිව්ව නෙ"

"ඒක නෙ සර් මම මේ කියන්නෙ කුසුම්ගෙ හිත හොඳ වැඩියි කියල. කුසුම් අවංකයි. ඉතින් සර්ගෙ අම්මට ආරංචිවෙලා ඇහුවම අම්මගෙ මූණ බලාගෙන බොරුවක් කියන්න කුසුමට බැරි වුණා"

මම මවිත වී ඈ දෙස බැලීමි.

"අම්මට ආරංචිවෙලා තියෙනවද. නැත්නම් එයා ම අම්මට ගිහිල්ල සේරම කිව්වද?"

ඇය දඟකාර සිනාවක් ඇති ව මඳක් මා දෙස බලා සිට, පිටවනිය දෙසට අත දිගු කරමින්,

Buddhika 23

For E-Pusthakalaya

"අර ඉන්නෙ, අහගන්නකො මොකද වුනේ කියල" යි කීවා ය.

මම මෝඩ සිනාවක් පෑමට උත්සාහ කළෙමි. මුළාවක වැටී සිටි බව මතක් වීමේ පසුතැවිල්ල අකරින් මෑතක දී අත් නොදුටු සැහැල්ලුවක් දැනෙන්නට විය.

"සර් කුසුම් ඉන්නව කතා කරන්නද? දූන්ම ම විසඳුමක් කර ගන්න"

"නෑ මං පස්සෙ කතා කරන්නම්"

"කිච්චත් වගෙ අපි ඕනැයෑ ඕකට. අපි කපුකම් කරලැයි මේව පටන් ගත්තේ. නේද?"

මම කතාව අතර මැද දී මගේ අතින් ඩැස්කුවේ පීල්ල මතට වැටී තිබුණු රතු පැන්සල නැවත ගතිමි.

"ගොඩාක් කාලෙකින් නො දක්ක - මම හිතන්නෙ සර් සෙන්ට්‍රල් එකට ආවටම පස්සෙ කවදවත් නො දක්ක - එළියක් අද මූණෙ තියෙන්නෙ." යි පංති කාමරයෙන් පිට වන්නට හැරෙමින් ඈ කීවාය.

දෙරටුව වෙත ගිය පද්මිනී සේනාරත්න මඳක් නතර වී ජයග්‍රාහී සිනාවක් රැගත් අඩ බැල්මෙන් තත්පර ගණනක් මා දෙස බලා සිට මිදුල හරහා කෙළි බිම දෙසට දුවන්නට වූවාය.

ඇයගේ සිනාවේ වූයේ, වේදනාවෙන් පීඩා විඳින පෙම්වතුන් යුවළක නැවත යා කිරීමේ දී ඇති වන පරාර්ථකාමී සන්තෝෂය නොව ගුප්ත ජයග්‍රහණයක් ගැන උපන් ආත්මාර්ථකාමී තෘප්තියක් බව මම එවේලේ නො දුටුවෙමි.

ජීවිතයේ මින් පෙර කිසි ම සිද්ධියක දී කිසිම අවස්ථාවක දී අම්මා ගැන ඇති නොවුණු අම්හිරි හැඟීමක් ශෝකයක් හා පසුතැවිල්ලක් එදා මට ඇති විය. අම්මා කර ඇත්තේ කුරුළු කූඩුවක් කඩා බිඳ දැමීම වැනි කුරිරු වැඩකැ යි මට සිතිණි. මා වඩාත් කිපුණේ ඒ පාපය අම්මා අතින් ම වුණු බැවිනි.

මම මගේ මුළු කෝපය ම කාන්තිගෙන් නිවා ගන්නට සමත් වීමි.

"කුසුම් ගැන වචනයක්වත් කතාකරල තිබුණොත් කට තළනව" යි මා තර්ජනය කළේ "..........අර මධුරිටත් කියන්න එයාට ගැළපෙන කෙනෙක් හොයා ගන්න කියල" යි කෑගාමිනි.



මුලදී අග මුල නො දන මඳ වේලාවක් බලා සිටි අම්මා ද අන්තිමට කතාවට හවුල් වුණාය. කාන්තිගේ ක්‍රියාව පිළිබඳ ලද තොරතුරුවලින් මට වුවමනා කරන කොටසක් පමණක් මම අම්මාට කීමි.

මෙහිදී කුසුම්ගේ පැත්ත නොගෙන ඉන්නට අම්මාට පුළුවන් කමක් නැත.

"මහතුන් මට කිව්ව කාන්ති ඔත්ත ඔහොම නොහොබිනා කතාවක් කියල තියෙනව කියල කුසුම් ගැන ඉස්කෝලෙදි. මමත් කාන්තිට ඒකට දෙස් කිව්ව."

"දෙස් කියනව නෙවෙයි මීට පස්සෙ. වචනයක් හෙම කියල තිබුණොත් කට තළනව. හොඳට මතක තියා ගන්න ඕනැ"

"අනික කුසුම් ගැන යමක් ඇත්නම් අපි බලා ගන්නම් ඒක. ඔය මඟුල් පරස්තා ගැන කතා කරන්න.........ඒව වෙනම දේවල්. ඒකිට අපහාස කරන්න ඕනැ නෑ උඹ. ඒකිගෙ කෙස් ගහක වටිනාකමක් නෑ උඹලගෙ"

"අම්ම ඔහොම කතා කළාට මම හිතන්නෙ මෙයාව එවල තියෙන්නෙ මේ මඟුල් ජෝඩු හරි ගස්සන්න. මාමගෙ දුව මගේ කරේ එල්ලන්න. ගෑනියෙක් හොයා ගන්න බැරි වුනොත් නිකම් ඉන්නව නෙ ගලක් බැඳගෙන මූදෙ පනින්න ඕනැ යැ?"

"මම නංගිට කියන්නම් කො"

කාමරයෙන් ඇසුනු කාන්තිගේ ඉකි බිඳීමක් හැරුණු විට ටික වෙලාවක් යන තුරු ගෙය පුරා නිශ්ශබ්දතාවයක් පැතිර ගියේය. ඒ තුළින් මා වේගයෙන් පිට කළ වචනවල දෝංකාරය ඇසෙන්නට විය. කෙල්ලෙක්ගේ කතාවක් අල්ලාගෙන මේ තරම් කෝපයට පත්වීම මගේ වැඩිහිටිකමට මදිකමක් දැයි සැකයක් සන්සුන් වේගෙන යන සිතට නැගිණි. මට වැඩි වේලාවක් ඒ ගැන කල්පනා කරන්නට වුණේ නැත.

"මම හැමදම කියන්නෙ ලොකු පුතාටත් තිබුණ නේද කල්පනා කරන්න ගුරුකම කරන්නම ඕනැ නම් නො තිබුණා ද වෙන ඉස්කොලයක් හොයා ගන්න.

අර ඒකි ඉන්නෙ තැනටම ම රිංගන්න ගියේ. එහෙම නැත්නම් ඔය කකන්දර හැදෙනවද?" අම්මා කියාගෙන ගියාය.

Buddhika 1.5

සංසිඳීගෙන ගිය මගේ කෝපය වහා මතු විය. සියල්ලට මුල

For E-Pusthakalaya

අම්මාය යන හැඟීමකින් මගේ සිත කිලිටි වීගෙන ගියේය.

"......තව තව මොන කතන්දර හැදෙයි ද දන්නෑ. ඉස්සරහට දූන්වත් වෙන තැනකට මාරුවක් ගන්න බලනව මිසක්"

කුසුම් කෙරෙහි අලුතින් උපන් අනුකම්පාව ඔස්සේ සිතන විට බලාපොරොත්තු ද ආශාවන් ද අලුත් වන්නට විය. මා සමඟ එතා කියන දේ නිසැකයෙන් ම ඇය පද්මිනී සමඟ කියන්නට ඇත. පද්මිනීගේ කතාවෙන් පැහැදිලි වූයේද කුසුම් මට මොනවා කියා ඇතත් අදහස් අත් හැර නැති බවයි.

"සර් අපි මාක්ස් ලිස්ට් එක හදල දෙන්නම්" යනුවෙන් වාර විභාගය අවසානයේ ලකුණු ලැයිස්තුව සකස් කර දීමට පද්මිනී සිය කැමැත්තෙන් ම ඉදිරිපත් වූවාය. මට කතා කරන්නට පද්මිනී ආශේ තනිවම ය. එහෙත් "අපි" යන්නෙන් අදහස් කරන්නේ කවුරුන් වුවත් ප්‍රශ්න නොකරම මම කටයුත්ත ඇයට බාර කළෙමි.

පද්මිනී හා කුසුම් පුස්තකාලයට වී ලකුණු ලැයිස්තුව සකස් කරන තැනට මා ගියේ ස්ථිර ගතියකින් ශක්තිමත් වූ සිතක් ඇති ව ය. විසඳුමක සාර්ථකත්වය ගැන සැකයක් මා තුළ තිබුනේ නැත.

පද්මිනී මදකට ඉවතට ගිය පසු සියලු ප්‍රශ්න විසඳාගෙන තීරණයකට එළැඹීමට අවස්ථාව පැමිණියා ය යි මම සිතීමි. ගුරුවරයකු බව මට ම මතක් කරගන්නට මෙන් ආරූඪ කර ගත් දරදඬුකමක් ඇති ව,

"මොකද මේ පාර ඉතිහාසයට ඔය තරම් ලකුණු අඩු?" යි මා ඇසුවේ දිග කතාවකට මුල පිරීමක් වශයෙන් පමණි.

"මට සර් ලකුණු අඩු කරල"

"තව හිනාත් වෙනව. මගෙන් පළි ගන්න නෙ?"

"හරියට කතා කරන්නෙ මම කාටවත් රිදවන්න ඕනෑවට වැඩ අනපනු කළා වගෙ. මගෙ හිතේ අමාරු කව්රුත් දන්නෙ නෑනෙ"

ඒ කුසුම් ය. මා ඉදිරියේ එසේ කතා කළ හැක්කේ ඇයට පමණි. මගේ සිත අනුකම්පාවකින් මොලොක් විය. වේදනා ඇයට පමණක් සීමා වූ ඒවා නොවේ.

"ඕනෑ කමින් කරදර මවාගෙන හිතේ අමාරු විඳිනවට මොනව කරන්නද?"



ඇයගේ දෙනෙත් තෙත් වන සැටි මා බලා සිටියේ සංවේගයෙනි. ඇයට සහනය ගෙන දෙන කිසිවක් කළ යුතුය.

"ඇයි මට නොකියන්නෙ අම්මත් එක්කල මේ සේරම කිව්වෙ මොකද කියල? කොහොම ද ඔය කතාව ඇති වුණේ?"

"මට දැන් ඕව මතක නැහැ"

"මතක් කර ගන්නම බැරි දැ?" යි මා ඇසුවේ ඇයගේ හදවතින් මට සඟවන රහස උදුරා ගන්නට අන් මඟක් නොවූ බැවිනි.

රූ රැජින තරඟය ද එකට කොළඹ ගිය බව කෙනකුගෙන් දැන ගත් අම්මා ප්‍රශ්න කළ පසු ඇයගේ මුහුණ බලාගෙන බොරුවක් කියන්නට බැරිකම නිසා සියල්ල හෙළි කල බව කුසුම්ගෙන් අන්තිමට කියැවෙත් ම මට සිතුණේ අවංකකම මෝඩකමක් වන අවස්ථා ජීවිතයේ හමු වන බව ය. ඈ අවංක වූ නමුත් අම්මා අවංක නො වුණා ය. සියල්ල කුසුම්ගේ ම කැමැත්තෙන් හෙළි කළ බවක් ඒත්තු යන පරිදි අම්මා තාත්තාට කීවේ විකෘති කරන ලද පුවතකි. අම්මාට කුසුම් දුන් පොරොන්දු කඩ කිරීම මේ නිසා ම වරදක් නොවේ ය යි මම සිතින් තර්ක කළෙමි.

මේ තර්කයන් ඇයටත් ඉදිරිපත් කරන්නට කලින් මගේ ලියුම්වලට පිළිතුරක් නො එව්වේ ඇයි දැයි මම ඇසීමි. ඈ ඒවා සමහරක් නො කියවා ම පුළුස්වා දැමූ බව ඇසුණු කල, ඇයට තව දුරටත් කතා කිරීම නිෂ්ඵල නොවේ දැ යි මට වහා සිතිණි.

"මම හිතුවෙ නෑ ගෑනු හිත් ඔය තරම් තදය කියල. විශේෂයෙන් කුසුම්ගෙ"

මගේ කට හඬ චෝදනාවක් විය. එහෙත් එයින් මිදෙන්නට නිදෙස් වන්නට ඈ කිසිත් නොකීවාය. ඒ වෙනුවට ඈ කෙළ බිඳක් ගිල යටි තොල විකා ගත්තාය. වචන සියයකින් කළ නොහැකි බලපෑමක් ඒ ක්‍රියාව විසින් මා කෙරෙහි ඇති කරන ලදී.

මා ඇයගේ සිත වෙනස් කරවා ගත යුතු ය යි සිතුවේ මට ඇය නැති ව බැරි නිසා පමණක් නොවේ. ඇයට ද මා නැති ව බැරි නිසා ය. මට ඒ බව ප්‍රත්‍යක්ෂ විණැයි මම සිතීමි. මා වෙනුවෙන් පමණක් නොව කුසුම් වෙනුවෙන් ද කුසුම් බේරා ගත යුතුය. නිවාඩු කාලයේ දී පාසලෙන් පිටත තැනකදී කතාකර ගැනීමට මා යෝජනා කළේ එබැවිනි. තවත් ශිෂ්‍යාවකගේ ගෙදරක දී මුණ ගැසෙන්නට නො හැකි බව කීවත් ඇය අවුරුද්දට අපේ ගෙදර එතැයි මම සිතීමි. එසේ සිතන්නට කිසිම

Buddhika 23

ඉඩක් හෝ හේතුවක් හෝ නොවුණත් ඇයගේ ඇස්වල කාන්සිය මම ඇය අපේ ගෙදර එනැයි සිතීමි. එනැනින් සියලු ප්‍රශ්න විසඳෙනු ඇත.

"එන්න බලන්න. අර නෝට්ස් ටික ගෙනිහිල්ල නිවාඩු කාලෙ කියවන්න. මගෙන් එක්ක තරහට පාඩම් නොකර ඉන්න එපා."

ඇ යටි තොල පෙරළාගෙන මා දෙස බලා සිටියා ය. මට සිනා ගියේය. ඇය සියල්ලට එකඟ වෙතැයි මම සිතීමි. අනාගතය හා ජීවිතය ගැනත් මා කියන හැම දෙයකට ම ඇය එකඟ වනු ඇත.

කලෙකින් අත් නොදුටු සැහැල්ලු ගතියක් මට දනෙන්නට විය. සැහැල්ලු වූ සිත බලාපොරොත්තුවකින් හා විශ්වාසයකින් පිරී යන්නට විය. මෙතැන් සිට වන් ප්‍රිය මනාප කතා බහකට මුල පිරීමක් ලෙස " ඉනින් කුසුම්" ය යි මා කීවේ සෙනෙහසිනි.

ඇයගේ මුහුණ වෙනස් වන හැටි මම බලා සිටියෙමි.

"මේ මොහොඩා වුණත් මම එකක් කියන්නම්. මම මේහෙම කතා බස් කළාට බැරි වෙලාවත් බලාපොරොත්තු හෙම තියාගන්න එපා...... පස්සෙ මට දොස් කියන්න එපා."

ගෙදර ජීවිතය ද බෙහෙවින් ම අමිහිරි වන්නට විය. ඇනුම් පද කිම වෙනුවට අම්මා කෙළින්ම මට දොස් තබන්නට වූවාය. ඇය කතා කළේ මා කුසුම් හා විවාහ වීමට යැම ස්ථිර ය යි සිතාගෙන මෙනි. ඇයගේ මේ පිළිවෙත තීව්‍ර ආකාරයකින් මා වේදනාවට පත් කළේය.

කුඩා දවස සිට අම්මාත් මාත් අතර පැවැති බැඳීම ලිහිල් වී ගියා ය යි මම සිත් රිදුණු දරුවකු මෙන් නොයෙක් විට අවංකවම වේදනාවට පත් වීමි. අනෙක් අතට කුසුම් ගැන මකු බලාපොරොත්තුවක් තබා ගන්නට ඉඩක් නැතැයි කෙළින්ම කියා අම්මාගෙන් නිකරුණේ දොස් අසමින් පවුලේ අප්‍රසන්න ජනක තත්වයක් ඇති වීමට ඉඩ දෙන්නේ කුමටදැ යි මම සිතීමි. එහෙත් කුසුම් නිසා බිය වීමට ඉඩක් නැතැයි කෙළින්ම කියා අම්මාගේ සිය සැක ද ගෙදර වසා ගත් මේ මූසලකම ද පහ කිරීමට තරම් ධෛර්යයක් වත් පුළුවන්කමක් වත් මට නොවිණි.

නිවසේ ම නතර වී කළ හැකි රක්ෂාවක් සොයා ගැනීමේදී මා තුළ පැවැති එක අරමුණක් නම් මල්ලිලාගේ අධ්‍යාපන කටයුතු ගැන උනන්දුවක් දැක්වීම ය යි මම සිතාගෙන සිටියෙමි. පාඩමක වැඩක දී උපදෙසක් උපකාරයක් දුන් නමුත් බලාපොරොත්තු වූ පරිදි මගේ ප්‍රශ්න ඉටු වීණැයි කිව නොහැකි ය. ඊට එක ම හේතුව මා නිසා



තනස්සල්ලෙන් පසුවීම ම නොවේ.

විශ්ව විද්‍යාලයයට ඇතුළු වනු පිණිස නිවසින් බැහැර වූ පසු සහෝදරයන් හා මා අතර කලින් නො වුණු බැඳීමක් ඇති වූ බව සැබෑවි.එක පැත්තකින් එසේ ඇති වූ අලුත් බැඳීමට අමතර ව නැත හොත් සමාන්තර ව මා පවුලෙන් ඈත් ව සිටි වසර කීපය ඇතුළත ඔවුන් හා මා අතර කිසියම් පරතරයක් ද ඇති වී තිබුණු බවත් නැවත ගෙදර පදිංචියට පැමිණි පසු මට අවබෝධ වන්නට විය.

රෝහණ කලිනුත් වැඩිහිටියෙකි. දැන් විජය තරුණයෙකි. සෙනරත් හා ගාමිණී ගැටවරයෝ ය. තවමත් ළමයෙකැයි සැලකිය හැකි වුවද තිස්ස පවා උස යන්නේ ඇසට පෙනී පෙනීය.

ඔවුන් වැඩී සිටින්නේ උසින් මහතින් පමණක් නොවේ. යොවුන් වියේ දී අවුරුදු තුනක හතරක කාලය විශාල වෙනස්කම් ඇති වීමට හොඳට ම සෑහේ. මසකට වරක් දෙකක් මුණ ගැසුණත් මා පේරාදෙණියේ සිටිය දී බාල සහෝදරයන් කාලයේ වෙනසට අසුවී ඇත්තේ මා නොදැනුවත්ම ය යි මට දැන් සිතෙයි.

පෞද්ගලික හෝ පොදු හෝ කරුණක් ගැන ගෙදර කතා වෙන කල ඔවුහු තව දුරටත් පැත්තකට වී වැඩිහිටියන්ගේ කට දෙස බලාගෙන නිහඬ ව නොසිටිති. ඕනෑ ම කරුණක දී ඔවුහු තමන්ගේ අදහස් පළ කරති. ඔවුන් එකිනෙකාට තමන් හා අනුන් ගැනත් ලෝකය හා ජීවිතය ගැනත් නිදහස් මතයක්, හැඟීමක් හා තීරණයක් තිබේ. ඔවුහු වෙන වෙනම - ස්වාධීන ව සකස් වී සිටිති. ඔවුන්ට වෙන ම මිතුරෝ සිටිති. වෙන ම නිතර යන එන තැන් ඇත.

ඔවුන්ගේ ජීවිතවල එක පැත්තක් විවෘත ය. අනෙක් පැත්ත මට - වැඩිහිටියනට - වැසී තිබේ.

ළමයකු ව සිට මිනිසකු කරා ගිය ගමනේ දී මම ද වරක් මේ ගැටවර විය පසු කළෙමි. ඒ අවදියේ දී මුහුණ දුන් ගැටළු හා ප්‍රශ්න මගේ සහෝදරයන් අද අත්දකිත් දැ යි සොයා බලන්නට යුතුකමක් ලෙස මට සිතෙන අවස්ථා ඇත. උපකාරයක් කළ හැක්කේ ඔවුන්ගේ හද ගැබට එබී බැලීමෙන් පමණි. මම ඒ අරමුණු ඇතිව සහෝදරයන්ගේ ජීවිතවලට මොහොතකට එබී බැලීමි. එකල මා දුටුවේ එහි වැඩිහිටියනට වැසුණු පැත්තයි. අනාථ වූ ගතියක් දැනුණේ මටය.

මා සහෝදරයන්ගෙන් ඈත් වන්නට වූයේ ඒ අන්දමිනි.

මේ නිසා ගෙදර හාළ ගතිය තව තවත් ඉවසිය නො හැකි වූ

For E-Pusthakalaya

තැන මම හැකි තරම් වෙලා පාසලේ ගත කරන්නට වීමි.

මේ තත්ත්වය යටතේ වුව ද මම ඉගැන්වීමෙන් තවදුරටත් තෘප්තියක් හා සැනසීමක් ලදිමි. ළමයින් අතර මුළු කාලය ගෙවීම මා සතුටක් හා විනෝදයක් විය. උගත් පාසලට සේවයක් කළ යුතුය යන ආශාව මා වෙත මේ වන විටත් ඉතිරි වී තිබිණි. මා සතියකට දෙදහන් දවසක් සවස පංතියක් පටන් ගත්තේ මගේත් ළමයින්ගේත් දෙපැත්තේ ම යහපත පතාගෙනය.

මේ නිසා අම්මා තව කවත් තිපෙන්නට වුණා ය. මෙහි දී මා බොහෝ විට අම්මාගේ හැඟීම් නො තකා කර බාගෙන සිටියෙමි.

අම්මා කෙරෙහි කවදත් මා තුළ පැවැති ආදරය, භක්තිය හැඩගෙන කෝපය මතු වූ ඇතැම් අවස්ථාවක පමණක් මම ඇය සමඟ එකවෙක කියන්නට ගියෙමි.මොහොතකින් මම නැවත කණගාටුවටත් කහස්සල්ලටත් පත්වීමි.

මට ගෙදර එපා ම වූයේ එලෙසිනි. ඒ අනුව මම දවාලට පාසල අසල තැනකින් කෑම කන්නට පිළියෙළ කරගෙන පංතිය නැතත් ළමයින් සමඟ සෙල්ලම් කරමින් හෝ කළුවර වැටෙන තුරු රැඳෙන්නට පෙලැඹුනෙමි.

පාසලේ ගත කළ කාලය වේදනාවක්, බරක් හෝ තැවුලක් නො මැතිව ම ගෙවී ගිය බවක් මෙයින් අදහස් නොවේ.

කුසුම් නැවතත් මගේ සිත රිදවන්නට වූවාය.

ඒ මදිවාට, විභාගය අත ළඟ තිබියදීත් ඇය හැම සති අන්තයක ම ගෙදර යන්නට පටන් ගැනීම මගේ කෝපය වැඩි කිරීමේ හේතු විය. ඇය ගෙදර ගියේ පියාට අසනීප නිසා ම නොව සෝමාගේ දරුවාට ඇති ආදරය නිසා ය යි මම සිතුවෙමි.

කුසුම්ගේ ගෙය පසු කරගෙන යන අවස්ථාවන්හි ඇය මගත් සෙනෙහසින් දරුවා හදවතට තුරුළු කරගෙන සිටිනු මෙන් ම, පඩිය උඩට වී තාත්තාගේ දෙපා සෝදනු හෝ බෙහෙත් ගල්වනු හෝ මම දක ඇත්තෙමි.

විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය ළංව තිබියදී ඉගෙන ගන්නා ශිෂ්‍යාවකට අධ්‍යාපන කටයුතුවලට වඩා ලෙඩ වී සිටින පියාත් නැගණියගේ අවජාතක දරුවාත් ලොකු වුණේ කෙසේ දැයි තේරුම් ගැනීමට මම අසමත් වීමි.



මේ කාලයේ ද මා ජීවිතය දෙස බැලුවේ එහෙම පිටින්ම ආත්මාර්ථකාමී සිතිනි. එහෙත් මටත් දිගට ම කුසුම් දෙස දරදඬු සිතින් ම බලන්නට පුළුවන්කමක් නොවිණි. ඉතාම කලාතුරකින් මොහොතකටවත් ඇයගේ ඉදෙනත් හි මා දකින දෙයක් ඇය මා තුළ බලාපොරොත්තු අලුත් කරයි. ඒ ඇස්වල නටන සෙනෙහස තව දුරටත් විශ්වාස කරන ලෙස මගේ සිත මට බල කරයි.

කුසුම් වැඩුණේ මගේම සහෝදරියක ලෙසිනි. මගේ කීකරුකම, හික්මීම, උගත්කම හා බුද්ධිය යන සියලු ලක්ෂණයන් අනුව තරුණ වියේ දී වුව ද ඒ හැඟීම් වෙනත් මුහුණුවරක් ගන්නට ඉඩක් ඇති බවක් අම්මා සිහිනෙන්වත් නො සිතුවාය. කුසුම් සහෝදරියක බව මතක තබා ගන්නට ය යි මට නැති ව රෝහණට පමණක් ඇය කීවේ එබැවිනි. මටත් කුසුම්ටත් නිදහසේ හැසිරෙන්නට ඉඩ දුන්නේ එහෙයිනි.

කුසුම් අනෙක් අතට තමාත් මාත් දෙදෙනා කෙරෙහි ම අම්මා විසින් තබන ලද ඒ විශ්වාසය කඩන්න බැරි බව මුල දී ම කීවාය. අම්මාගේ හදවත ගිනි තබා මා හා විවාහ වන්නට බැරි බව පමණක් නොව අම්මා කිසි විටෙක තමා ලේලිය කර ගන්නට කැමති නොවන බවත් මට පෙන්වා දුන්නාය. අම්මාගේ සිත ක්‍රියා කලේ ඇය සිතූ පරිදි ම ය.

ඒ පැත්තෙන් සිතන කල අම්මාට හෝ කුසුම්ට හෝ දෙස් කීමට ඉඩක් ඇද්දැයි මම කල්පනා කරමි. කුසුම් අත වරදක් නැතැයි පිළිගන්නා මගේ සිත අම්මා නිදහස් කරන්නට සූදානම් නැත. අම්මා මා කෙරෙහි විශ්වාසයක් තැබුවාය. මම ද අම්මා කෙරෙහි විශ්වාසයක් තැබුවෙමි. මම අම්මාගේ සිතුම් පැතුම් හා ඉහළට යන බලාපොරොත්තු ගැන දන සිටියෙමි. අම්මා අපේ යහපත සඳහා අප ඉහළින් තැබීම සඳහා බොහෝ දේ පරිත්‍යාග කළාය. ඇය මගේ යහපතත් මා ප්‍රීතිය යයි සිතෙන පතන දෙයක් වෙනුවෙන් තමාගේ සිතුම් පැතුම්වලින් කොටසක් හෝ පරිත්‍යාග කරන්නට එකඟ වනු ඇතැයි මම විශ්වාස කළෙමි. මුල දී විරුද්ධ වුණත් අන්තිමට හෝ මා කුසුම්ගේ අත ගැනීම ගැන අම්මා කැමති කරවා ගත හැකි වනු ඇතැයි මම විශ්වාස කළෙමි.

අම්මා කෙරෙහි මා තැබූ ඒ විශ්වාසය සිඳී ගියේය.

මෙහි විපාකය කුමක් ද?

අම්මා මා කුසුම් විවාහ කර ගැනීමට විරුද්ධ වන්නේ මගේ යහපත වෙනුවෙනැයි සිතාගෙන වුව ද ඇය මගෙන් වෙන් කිරීමෙන් මට අයහපතක් විනා යහපතක් නැත. එසේ නම් අම්මාගේ විරුද්ධත්වය

Buddhika

For E-Pusthakalaya

නොතකා විවාහවීම අපරාධයක් ලෙස මට නො පෙනෙයි.

මේ සියල්ල කුසුම්ට ඒත්තු ගැන්විය හැකි නම් ප්‍රශ්නයක් නොමැත. අපේ අනාගතය අඳුරු නොවන එකම මග එයයි. විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය අවසානයේ මා කුසුම් තනිව හමුවීමට තීරණය කර ගත්තේ ඒ අන්තිම පලාපොරොත්තු ඇතිව ය.

"මම අද ඉඳල මේ ඉස්කෝලෙ ළමයෙක් නෙවි. ඔයා මගෙ ගුරුවරයෙක් නෙවි. ඒකයි මම කතා කරන්න ආවෙ" ඈ සිනාසී කීවාය.

" ඒ ඇයි?"

"මම මේ ඉස්කෝලෙ එන අන්තිම දවස" ඈ කීවාය. ඇයගේ මුහුණේ සිනාව තුනී වෙමින යන සැටි මම බලා සිටියෙමි. ඒ අසරණ මුහුණ මා තුළ ඇති කළේ අනුකම්පාවයි. " නිමල් අපි හිත නැළෙන දේවල් කතා නො කර සතුටෙන් යමු. හොඳේ."

කලින් කියැවුණු දේ නැවත නැවත කීමටත් ඇසීමටත් සූදානම් නැතැයි මුලදී ම මා කී නමුත් අලුතින් කියන්නට කිසිවක් මට නොවිණි.

ඇය තම තීරණය ගත්තේ මගේ යහපතට නම් එයින් වැඩක් නොවන බව - ඇය නැති ජීවිතය සැපවත් නොවන - බව කී මම,

"බැරිද කුසුම්ට ඔය තීරණය වෙනස් කරන්නම?" ය යි ඇසුවෙමි. තවමත් මා කෙරෙහි එද මෙන් පවතින ආදරයක සේයාව ඇයගේ දෙනෙත් තුළ දැකීමෙන් ඇති කර ගත් දැඩි විශ්වාසය ඇතිවය.

"මට බෑ බෑ බෑ බෑ. කියන්නත් එපා. මම ජීවිතයම නොබැඳ ඉන්නම්. මම ඔයාට ඇර වෙන කිසිම පිරිමියෙකුට කිසිම කාලෙක ආලය නො කර ඉන්නම්. අම්ම කෙනෙකුට ගින්දරක් දීල එක දවසකටවත් සැප විඳින්න මට බෑ."

ඈ හඬන්නට පටන් ගත්තා ය. ඇයගේ කඳුළු අවංක ය.

මාද ආත්මාර්ථකාමයේ ගිලී අවංක නොවී සිටීම මිනිස්කමක් නොවන බව ඒ පැත්ත ගැන කල්පනා නො කරම මට අවබෝධ විය. කුසුම් දැඩි ලෙස මට ආදරය කළා පමණක් නොව අදත් එලෙස ම ආදරය කරයි. මෙතෙක් ඇය ගැන මා සිතූ බොහෝ දේවල් - සියල්ල දේවල් - වැරදි ය.



## 13

ප ද්මිනී සේනාරත්න දකින හැම මොහොතකම කුසුම් ගැන මතක් වී උපදින පාළුව හා සාංකාව අලුත් වන්නට විය. ගත වූ කාලය තිස්සේ දිගටම මට කුසුම් දක්නට ලැබුණේ සෙවනැල්ලක් මෙන් පද්මිනී සමග එකටය.

ඔවුන් පංතියේ වාඩි වී සිටියේ එක ම ළගමය.ඉන් පිටත ඇවිද්දේ, ක්‍රීඩා කළේ, තැන තැන මුලු ගැසී උකුළුමුකුළු කළේ එකටම ය.

දැන් පද්මිනී සිටින්නී හුදකලාව ය. කුසුම් වෙනුවට ඈ නවත් මිතුරියක සොයා ගත් බවක් දක්නට නොවිණි. එසේම ඇය සිනාව, කතාව හා උකුළුමුකුළුව බොහෝ දුරට අඩු කර හදිස්සියේ ම නැත්පත් බවකට පත්ව සිටින බවක් පැහැදිලි විය. ටක්ෂොප් එකට. හෝ ළිඳ ළගට හෝ යන කල නව කෙනෙකු කැඳවා ගත් නමුත් ඇය කිසි විටෙක එකියක දෙවරක් එසේ තනි හොතහියට යොදා ගත් බවක් මම නුදුටුවෙමි.

වැඩක් නැති අවස්ථාවන්හි කාලය ගෙවා දැමීමට ගුරු කාමරයට නොව පුස්තකාලයට යෑම මම දිගටම කරගෙන ගියෙමි. එහි දී අනෙක් දැරියන් දෙතුන් දෙනා එක් වී පෙරළා ගත් පොත් මේසය මත තබාගෙන පහත් හඬින් කතාවේ වැටී සිටි අතර පද්මිනී පැත්තකට වී පොතක් කියවමින් සිටියාය. ඇය පංතියේ දී නියම කළ අවස්ථාවක දී හැර පොතක් කියවනු ඉන් පෙර මා දැක තිබුණු බවක් මට මතක නැත.

"හරි පාළුයි නේද සර්" මුල් සතියේම ඉතිහාස පාඩමක් අවසන් කර විසිර යමින් මගේ ඩැස්කුව පසු කරන්නට ආ පද්මිනී රහසින් මෙන් කීවාය. "........බලන බලන පැත්තෙන් කුසුම් ඉන්නව වගෙ මට පේන්නෙ"

ඇයගේ බැල්මෙහි ද හඬෙහි ද වූයේ අවංකකමකි. දෙ දෙනෙකුට වූපොදු වූ විපතක දී එකිනෙකා කෙරෙහි හට ගන්නා අන්‍යෝන්‍ය අනුකම්පාවක් හා බැඳීමක් මිශ්‍ර හිතවත්කමක් මා තුළ ඇති කරවීමට පද්මිනීගේ ඒ වචන කීපය හේතු විය.

කියවීම සඳහා පොත් කීපයක් සොයා දෙන ලෙස ඊළඟ දක පද්මිනී කීවාය. පුස්තකාලයේ පොත් ඇති බව මම ඇයට මතක් කර දුනිමි. එහි ඇති සීමිත ඉංග්‍රීසි නවකතා සියල්ල තමා කියවා ඇතැයි ඈ කීවාය

Buddhika15

For E-Pusthakalaya

"පද්මිනී දන් හරියට කියවනවා. ඒක හොඳයි"

"හරි ඒ පාළුයි සර් තුසුම් නැතුව. මට මෙහෙන් අස්වෙලා යන්නත් හිතයි."

මම සිනාසෙන්නට උත්සාහ කළෙමි. නැතහොත් තුනී වෙමින් යන සිනාව මුහුණේ දිගට ම රඳවා ගන්නට උත්සාහ කළෙමි.

"මට වෙලාවකට හිතෙනවා මෙහෙන් අස්වෙලා යන්න......සර්ටත් දන් මුළු සෙන්ට්‍රල් එක ම එපා වෙලා ඇති. නේද?"

සිනාව මගේ මුහුණේ අසලකවත් ඉතිරි වුණේ නැත.

"අපි යමුද සර් මෙහෙන් අස්වෙලා?"

ඇයගේ වචන මා තුළ ඇති කළ කෝපය වහා වෙනස් කිරීමට සමත් වූ යමක් ඇයගේ ඇස්වලින් පළ විය. මම ඉවත බලා ගතිමි.

නිශ්ශබ්දතාව මට අවාසි දයකැ යි සිතූ මම යමක් කියන්නට කල්පනා කළෙමි.

"පොත් කියවනය කියල ඔය ඩිටෙක්ටිව්ස් නම් කියවල වැඩක් නෑ"

"මම එව්ව කියවන්නෙ වෙන කියවන්න දෙයක් නැති නිසා" යි ඇය කීවේ ආරූඪ කරගත් අසරණකමත් මුහුණට නගාගෙන ය.

".................මම පොත් කීපයක් ඉල්ලුවෙ ඒකයි. පුස්තකාලයේ පොත් කියනව කිව්වෙ ඒක මග අරින්න"

"මම මතක් වුණොත් පොතක් දෙකක් හෙට ගෙනත් දෙන්නම්කො"

උත්සාහයෙන් කටහඬ සැහැල්ලු කර ගත් මම කීමි.

"මතක් නොවෙන්නෙ කිසිම හේතුවක් නෑ. හෙට පොතක් නො ගෙනාවොත් ඒ හිතල ම මතක් කරල ම අතපසු කළා කියන එකයි." ඇ ඉංග්‍රිසියෙන් කීවාය.

"මගෙ හිත වැඩ කරන හැටි මට වඩා හොඳින් එහෙනම් පද්මිනී දන්නව නෙ"

"මම ඔයාගෙ හිත ගැන විශේෂයෙන් ඒ තරම් දන්න නිසා නෙවි. මම කතා කරන්නෙ පොදුවෙ පිරිමින්ගෙ හිත් ගැන දන්න තරමින්........." ය යි ඇය කීවේ ද ඉංග්‍රීසියෙන් ය.



"අත් දැකීමෙන්?" මම ද ඇයගේ බසින් ම ඇසීමි.

"තරමක් දුරට!"

මගෙ මුහුණේ කිසියම් වෙනසක් ඇතිවිය. ද්වේෂයකට සමාන ගතියකින් දීප්තිමත් වූ ඇස්වලින් ඈ මොහොතක් මා දෙස බලා සිටියාය.

"ඒත් පිරිමින් ගෙ කැත හිත. ගැනියෙක් පිරිමින් ගැන අත්දැකීමෙන් දන්නව කිව්ව ම හිතෙන්නෙ නිදන කාමරවල හැසිරීමෙන් ලබා ගත් අත්දැකීම් ගැන විතරයි කියල."

"මම එහෙම කිව්වෙ නෑ"

"එහෙම කිව්වය කියල මම කිව්වෙත් නෑ. මෙතනදි මම අදහස් කළේ පිරිමින් කියන අදහස් කළේ පිරිමින් කියන දෙයක් නෙවි හිතන විදිය"

මා වාදයකට ඇද ගැනීමේ වුවමනාවෙන් වුවද ඇය ඉංග්‍රිසියෙන් ම කතා කළේ වාදයත් සඳහා තැකීමක් ද නොකොට මෙනි. මගේ දුෂ්කරතාව වූයේත් එය යි. වචන සෙවීමට ගත් උත්සාහයේ දී මම තව තවත් ගොළු වීමි.

"හැම පිරිමියෙක් ම එක විදිහට හිතනව ය කියල කියන්නත් බෑ"

"එහෙම නම් ඒක ඔයා ඔප්පු කරල පෙන්නන්න මට - ඔයාට ඕන නම්"

හැම පිරිමියකු ම ඒකාකාරයෙන් නොසිතන බව කුමක් සඳහා ඇයට ඔප්පු කරන්නෙම් ද? කෙසේ නම් මම ඔප්පු කරන්නෙම් ද? යන ප්‍රශ්න දෙක ම මගේ සිතට නැඟිණි.

පාසල් දැරියකගේ යුනිෆෝමයෙන් සැරසී මා ඉදිරියේ සිටියේ ජීවිතය ගැන අවබෝධයකින් හා අත්දැකීමකින් ආඪ්‍ය පැසුණු බුද්ධියෙන් යුත් කාන්තාවක ය යන හැඟීමක් නිසා එක අතකින් මා මවිතයට පත් වූ අතර අනෙක් අතින් කතා කළ යුතු දේ ගැන පරිස්සම් වීමට මට සිදු විය.

"ඇයි ඔයා මොකුත් නොකියන්නෙ?" අන්තිමට ඈ ඇසුවාය.

"කියන්න දෙයක් නෑ"

මම ඇය දෙස බලා සිණාසුණෙමි. මගේ සිනාව වාදයකින්

Buddhika 15

For E-Pusthakalaya

තර්කයකින් තොර දෙසිලකට වී එහෙත් සුහද ලෙස කළ කැරලි ක්‍රියාවකින් ලද පරාජයකට මුහුණ දීමට කළ සූදානමක් මෙනි.

මදක් මා දෙස බලා සිට, "එහෙනම් මම යනවා" යි කියාගෙන ඈ යන්නට ගියා ය.

මට සිදු වූ හා යන ඇය දෙසින් නෙත් ඉවතට ගැනීමට මා අසමත් වුණා ද අමතක වුණා ද යි මම නො දනිමි.

පද්මිනී සේනාරත්න ගමන් කරන්නේ තාලයකට උකුළ නැවෙන ආකාරයෙනැ යි ඊට කලින් දැන හෝ දැක හෝ සිටි බවක් මට මතක නැත.

සිදුවුණු - කියැවුණු සියල්ල සිහිනයක් මෙන් මගේ සිතේ දිගට ම නලියන්නට - දෝංකාරය නංවන්නට - විය.

පිරිමින්ගේ සිත ක්‍රියා කරන ආකාරය ගැන තමා අත්දැකීමෙන් දනිතැ යි ගැහැණියක කියන කල ඇය ඒ දැනීම ලබාගෙන ඇත්තේ පිරිමින් සමග පැවැත් වූ ලිංගික සබඳතාවයන්ගෙන් පමණක් විය යුතුය යි සිතීම වරදක් බව සැබවි. විශේෂයෙන් සියලු වනිතාවන් සිතාවත් විය යුතු ය යි ආකල්පයකින් ගැහැණිය දෙස බලන්නට පුරුදු වී සිටි මට පද්මිනී වැනි යුවතියක ගැන එබඳු සිතිවිල්ලක් පහළ කර ගත නො හැකිය.

එක් සැන්දෑවක පේරාදෙණියේ දී ආලෝකයට ළං වෙන් ම තව දුරටත් අඳුරේ ම නිමග්න ව සිටීමට ලොබ කල එකියක මෙන් සිය පෙම්වතාත් සමග අලස ගමනින් සංඝමිත්තාවේ දෙසට ඇදුණු නම් නාඳුනන තරුණිය දුටු අවස්ථාවේ දී මෙන් මුළු ස්ත්‍රී වර්ගයා කෙරෙහි ම උපන් අද්භූත බියකින් මගෙ සිත සසල වූයේ පද්මිනීත් පිරිමින් ගැන තේරුම්ගෙන ඇත්තේ ලිංගික අත්දැකීමෙන් පමණක් ම විය යුතුය යි කල්පනා කිරීමෙන් නොවේ. මෙබඳු කතාවක් කියන්නට තරම් ජීවිතය ගැන අවබෝධයක් පද්මිනී සේනාරත්නගේ වයසේ යුවතියකට ලැබුණේ කෙසේ දැයි කල්පනා කිරීමෙනි.

මේ අතර ඇයගේ ඇස් ද සිනාව ද කතාවද ගමන ද නිරන්තර ව මට මතක් වන්නට විය.

මීට අමතර ව ඊලඟ ද ඇයට පොත් කිහිපයක් ගෙන යා යුතු ද නැද්ද යන ප්‍රශ්නය පිටු දක්නට මම අසමත් වීමි. මා නිශ්ශබ්ද ව සිටියහොත් ඇය හා අද වූ කතාව මා බරට ගත් බවක් ඇය සිතා ඇතැයි කල්පනා කරන්නට තරම් බරපතල දෙයක් නොවුණු [illegible]

Buddhika 25



ඒත්තු ගැන්විය හැක්කේ ශිෂ්‍යාවක් ගුරුවරයෙකුගෙන් කළ ඉල්ලීමක් විතරක් ලෙස සලකා පොත් කීපයක් දීමෙන් පමණකැයි ද මම සිතුවෙමි.

එහෙත් ඇයට නවකතා පොත් කීපයක් තෝරා ගැනීමේදී සියයක් පමණ වූ මගේ පොත් ගොඩ ම අතපත ගෑමට සිදු විය. එහි දී මා තුළ ඇති වූයේ ගෝලයකුට දිය යුතු පොතක් තේරීමේ දී ගුරුවරයකු තුළ ඇති වන හැඟීමක් නොව තරුණියකට දෙන මේ තෑග්ග ගැළපේ ද නො ගැළපේ ද යනුවෙන් තරුණයකු තුළ ඇති වන අවිනිශ්චිත හැඟීමයි. මම එයින් කලක දී නො ලද ආස්වාදයක් ලදිමි.

විවේක වේලාවක දී හිසින් සංඥකර ඇත සිටි පද්මිනීට කතා කළ මම, කිසිත් නො කියා පොත් දුනිමි. ඈ සිනාවක් සහිත "බොහොම ස්තුතියෙන්" ඒවා බාර ගත්තාය.

ඇය දිගටම හැසුරුණේ අප අතර කිසි වෙනසක් නොවුණු ලෙසිනි. පාළු ගතිය පහව ගිය මගේ සිත දවස තිස්සේ ප්‍රබෝධයකින් පිරී තිබිණි.

පද්මිනී මවිසින් දෙන ලද කතා පොත් ගැන කිසිත් අදහසක් පළ නොකිරීම මගේ දෙම්නසට හේතු විය. එම කෘතීන් පිළිබඳ ඇයගේ හැඟීම් හා මතය දැන ගැනීම මගේ ආශාවක් ව තිබුණු බැවිනි. මා ඒවා ගැන ප්‍රශ්න කරන්නට ගියේ නැත. එසේ කිරීම ඇගේ හද ගැබට එබී බලන්නට ගන්නා වෑයමක් ලෙස ඇය විසින් සිතනු ලබතැ යි බිය නිසාය.

එහෙත් ඇය වෙනින් කරුණු ගැන මා හා ගැඹුරු ලෙස සාකච්ඡා කළ අවස්ථා විය. ඈ මා සමග ඉංග්‍රීසියෙන් ම කතා කිරීම පුරුද්දක් ලෙස කරගෙන ගියාය. පුස්තකාලයේ දී පුවත්පතක හෝ පොතක හෝ හාස්‍ය රසයෙන් යුත් තැනක් අසු වූ කල,

"සර් මේ අහන්න" යි පටන්ගෙන මටත් ඇසෙන්නට කියැවූ ඈ මා ද හවුල් කරගෙන හඬ නගා සිනාසුණාය. අප කියන කිසිවක් තේරුම් ගත නොහැකි වූ අනෙක් දරු දැරියන් කට අයාගෙන බලා සිට යන්තමින් එකතු වූහ.

ඔවුන් වෙනුවෙන් අනුකම්පාවක් ද ගුරුවරයකු වශයෙන් යුතුකමක් පැහැර හැරි බවට හැඟීමක් ද මට ඇති විය. අප කියන දෙයක් කාටත් තේරුම් යන පරිදි සිංහලෙන් කතා කරන්නට මම උත්සාහ කළෙමි. එහෙත් එය නිතර ම සාර්ථක වුණේ නැත.

පිරිසක් මැද වුව ද මා හා සමාගමයත් සංවාදයක් තමාට

For E-Pusthakalaya

පමණක් සීමා කර ගන්නට ඈ මෙසේ භාෂා මාධ්‍යය දක්ෂ ලෙසක් උපයෝගී කර ගත්තාය.

පද්මිනී නවකතා කිපය ආපසු ගෙනැවිත් දුන්නේ දෙසතියකට පමණ පසුවය.

"මාමත් කියෙව්ව. ඒකයි පරක්කු වුණේ"

මට වුවමනා කළේ ප්‍රමාදයට හේතුව නොව එම කතා පුවත් ගැන ඇයගේ අදහස් උදහස් දැන ගැනීම ය. ඇය මතකයන් පළ නො කළාය.

"තව පොත් කීපයක් ගෙනත් දෙන්න කරුණාකරල"

"මගෙ පුස්තකාලය දුප්පත් එකක්. ඒ තරම් පොත් නෑ ඇරත් පද්මිනීගෙ රුචිකත්වයට කොයික හොඳ ද කොයික නරකද කියල මම දන්නෙ කොහොමද?"

මා එසේ කීවේ කලින් ඒවා ගැන මෙතෙක් පළ නො කළ අදහස් පිට කර ගැනීමේ අවස්ථාව ඇයට ලබා දෙන අදහසින් විය යුතුය. ඒ වෙනුවට වූයේ අනෙකකි.

"එහෙනම් මම දවසක ගෙදරට එන්නම්. එතකොට මට ගැළපෙන කීපයක් තෝරා ගන්නැකි" යි ඈ හිස පසෙකට ඇළකර කීවාය.

ඒ වචන වැඩි ය යි මට හදිසියේ මතක් විය. එතෙක් ඇය ගැන ඇති වූ මුළු පිළිවෙත ම වැරදි ය යි පසුතැවිල්ලක් මට ඇති විය. මෝඩකමක් කළ බවට අවබෝධයක් මගේ සිතට නැගෙන්නට පටන් ගත්තේය.

මගේ මුහුණෙහි හට ගත් වෙනස නිසැකයෙන් ම ඇය තේරුම් ගන්නට ඇත. එහෙත් ඈ ඒ බවක් මට නො පෙන්වූවාය. ඒ වෙනුවට ඇයගේ දෙ නෙත් මා බලා සිටියදී ම තෙතමනයක් බඳු ගතියකින් පිරී යන්නට විය.

"මම එහේ ආවොත් මට මොනවද දෙන්නෙ?" පද්මිනී රහසින් ඇසුවේ සිංහලයෙනි.

එවර මට ඇතිවුණේ කෝපයක් හා ඇය පතන්නේ එකම දෙයක් ය යන හැඟීමකින් ජනිත පිළිකුලකි.

ඇය තව දුරටත් හැසිරුණේ, තමා විසින් මා වෙත ඇති කර



ලද බලපෑම නො දුටු එකියක ලෙසිනි.

"දෙයි තමයි! අම්ම ගනී තඩි පොල්ලක්"

"ඒව කියන්න බෑ තමයි" මවකගේ සැර පරුෂකම ගැන උදම්වන පොඩි ළමයකුගේ ලතාවෙන් මගෙන් කියැවිණි.

"මේ! මම කුසුම් නෙවි. තේරුණාද?" පද්මිනී සේනාරත්න සිනාසෙමින් වුව ද කීවේ දබරැඟිල්ල උරුක්කරගෙන ය.

විහිළුවකට වැඩි දෙයක් ඇයගේ කියමනෙහි නොවිණැ යි බැලූ බැල්ලමට පෙණිනි. එහෙත් කෙමෙන් සිනාව තුනීවේගෙන යන ඇයගේ ඇස් දුටු මම මොහොතකට කලින් පැවති සියලු හැඟීම් යටපත් කරගෙන, නැති ගතිමි.

ගැහැණියකට විරුද්ධ ව තවත් ගැහැණියක තුළ නොව, පරම්පරාවකට විරුද්ධ ව තවත් පරම්පරාවක් තුළ වැඩෙන වෛරයත් ද්වේෂයත් ඇයගේ තරුණ වත පුරා විසිරී තිබිණි. වයස අතින් මා අයිති වූයේ නැතහොත් වඩා ළං වූයේ පද්මිනී සේනාරත්නට වුව ද මගේ සිත මෙතැන දී ගත්තේ අම්මාගේ පැත්තය.

මගේ කෝපය යළි මතු විය.

අප අතර කතාබහක දී මෙවැනි අවස්ථාවක් මතු වුණු කල, පද්මිනීගේ සමීපයට යෑම නැතහොත් ඇය මගේ සමීපයට ගැනීම නතර කළ යුතු යයි මම තීරණය කර ගතිමි. ඒ අනුව ගුරු ගෝල සම්බන්ධයට අමතරව කිසිම කුළුපගකමක් නො පෙන්වීමට මම සමත් වීමි. රහසේ ඇති කරගත් සම්මුතියක් ඇති ව මෙන් ඇය ඊළඟට දින ගණනක් හැසිරෙන්නට වූයේ ද ඊට අනුකූලවය. ඇයගේ දෙනෙත් පමණක් නොව මුළු දේහයම වැසීපුර මා අමතන්නට වූයේ මෙසේ අප අතර කටින් කතාබස් වීමක් නැති ව ගෙවුණු දවස්වල ය.

සහෝදරත්වයේ නිර්මල හැඟීම ද පිරිවරාගෙන කුසුම් මගේ හදවතට ඇතුළු වූයේ කැකුළු දත් පා සිනාසෙන බාලවියේ දීම ය. අහිංසක සෙනෙහසක් පසු කලෙක ආදරයක - ආලයක මුහුණුවර ගත්තේද සහෝදරියක ලෙසින් කුසුම් අපේ ම පවුලට ළං කර ගැනීමට ළමා වියේ දී මා තුළ මුල් බැස ගත් ආශාව ම පදනම කරගෙන උපදනා බැඳීමක දී දැනුවත් ව හෝ නො දැනුවත් ව පහළ වන අනුරාගී - කායික ආශාවන් අඩු තරමින් මතු පිටින්වත් මගේ සිත්හි කුසුම් නිසා ඇති වී නොතිබිණි.

Buddhika 15

For E-Pusthakalaya

අකලංක හදවතක සෙවණැල්ලක් බඳු කුසුම්ගේ පියකරු වත එහි නිරන්තර ව එළියක් නැංවූ සුන්දර සිනාව, සෙනෙහස, දයාව හා කරුණාව පළ කළ ඇස් මම දිටිමි. ඇයගේ සියලු ගුණාංගයන්ගෙන් මම ඇය කෙරෙහි වඩ වඩාත් පැහැදුණෙමි. එහෙත් සෝමා බඳු රූප සුන්දරියක ම නොවුණත් කුසුම් වෙත පිහිටි නාරිලාලිත්‍යයේ අනෙක් අංගයන් දෙස මම නො බැලුවෙමි.

පද්මිනී සේනාරත්නගේ ඇස් මට කියන්නට වූයේ ස්ත්‍රී කුතුහලය පිළිබඳ ව වඩා වෙනස් කතාන්තරය යි.

ජීවිතයේ ඇතුළු පැත්ත ගැන හරසරක් නො දත් කුසුම වැනි යුවතියකගේ ඇසින් තේජසකට සමාන ගතියකැයි දැකිය හැකි නග්න කාමය පුරවා ගත් දෙනෙත් ඇති ව පද්මිනී මා දෙස බලා සිටියා ය. ඒ ඇස් මා වෙත යොමාගෙන සිටින අතර ම දිවග එක්තරා ලතාවකට ගමන් කරවමින් දෙතොල් තෙමා ගත්තාය. අඩ බැල්ම මගේ වත මත රඳවා ගත හැකි වන තරමට මුහුණ පසෙකට හරවා ගන්නා පද්මිනී සිහින් දිග ඇඟිලි තුඩින් ගෙල හිමින් හිමින් පිරිමදිද්දී කිසියම් කල්පනාවක වැටුණු එකියක ලෙසිනි.

තවත් වරෙක හදිසියේ වාඩි වී වුන් ඉරියව්ව වෙනස් කර ළය මඬල වඩාත් උස්වන පරිදි බඳ හරියෙන් දෑත් බැඳගෙන පුටු ඇන්දට උඩුකය බර කරගෙන, එක එල්ලේ මා දෙස බලා සිටියාය. උපක්‍රමයෙන් මා තනිව සිටින තැනක් සොයගෙන නිතඹ නැටවෙන ගමනින් ගිය ඇය, මඳ දුරක් ගොස් ආපසු හැරී බැලුවේ යහන් ගැබට කෙරෙන ඇරයුමක් බඳු නෙත් කැල්ම ඇතිවය.

මීට උඩ දී කියා ඇති පරිදි පද්මිනී සේනාරත්න මුලින් මා වෙත ළං වූයේ කුසුම්ගේ මෙන් ම මගේ ද මිතුරියක ලෙසින්, අප දෙදෙනා විඳිමින් සිටි වේදනාවට සහනයක් ලබා දෙනු පිණිස ය යි උපකාරයේ කාරුණික හස්තය දිගු කරගෙනය. මගේ සමීපයට පැමිණීමේ දී ඇය කුසුම් හා මා අතර සම්බන්ධය අත් වැලක් කර ගත්තාය. කුසුම් පාසලෙන් අස් වෙත් ම ඇ ඒ අත් වැල අත් හැර දමා ස්වාධීන ලෙස මා වෙත එළඹ ගත්තාය.

මුලින් කියැවුණු අන්දමට, බැල්මකින්, හැසිරීමකින් හෝ වචනයකින් මගේ හදවතට තර්ජනයක් හෝ අභියෝගයක් හෝ එල්ල වුණු කල පද්මිනී පිටු දක්නට මා උත්සාහ කළත් ඊට අනුකූලව දින කීපයක් පැත්තකට වී සිටින පද්මිනී නැවත කතාවට ආවාය. එවැනි අවස්ථාවක දී ඇ මගේ හදවතට ඇඟිලි ගසන්නට තැත් කරන



පෙන්නුවේ නැත. ඇ කලින් කුසුම්ගෙන් සවිස්තර ලෙස ලබාගෙන තිබුණු කරුණු සසුතල කරගෙන එහෙත් කුසුම් ගැන කිසි සඳහනක් නොකර මගේ පවුල ගැන සහෝදරයන් ගැන කතා කළාය. පවුලේ අභ්‍යන්තරය ගැන කිසි සඳහනක් ඉඟියක් නොකළත් දෙමාපියන් ගැන මතක් කරන කළ කිසියම් නොමනාබයක් ඇයගේ මුහුණෙන් පළ විය. වැඩිහිටියන්ගෙන් තමාට වරදක් වුණු බවට ද්වේෂයක් ඇයගේ නෙත්වල මම දිටිමි. ඇයට සිදු වුණු අයුක්තිය කුමක්දැයි දැන ගනු පිණිස ප්‍රශ්න කරන්නට රුකුලක් හෝ අවස්ථාවක් හෝ ලැබෙන තරම් දෙයක් ඇයගෙන් කියැවුණේ නැත. එහෙත් අම්මාගේ විරුද්ධතාවය නිසා කුසුම් අහිමි විණැයි හැඟීමකින් පසු වුණු මම සිය දෙමව්පියන් ගැන සඳහන් වෙත් ම පද්මිනීගේ ඇස්වල දුටු අප්‍රසාදය, නොසතුට හා සමහර විට ද්වේෂයක් සමඟ හදවතින් එකඟ වීමි. මම ඇයට අනුකම්පා කළෙමි.

තවත් සමහර දවසක ඇ චිත්‍රපටියක්, නාට්‍යයක්, විනෝද ගමනක් ගැන කතා කළා පමණක් නොව කලින් ද දුටු සිහිනයක් හෝ බාල කාලයේ සිද්ධියක් ගැන බොළඳ ලෙස සැහැල්ලු ලෙස මා සමඟ කතා කළාය.

එහි දී තවදුරටත් මා දුටුවේ මගේ සියලු දුක් වේදනා මැනවින් දන්නා මට අනුකම්පා කළ යුවතියක ලෙසිනි. අදහස් උදහස්, සිතුම් පැතුම් හා හැඟීම් ආදී නොයෙක් අංගයන්ගෙන් හා නොයෙක් කරුණු අතින් අප අතර නො ගැළපෙන තැන් එමට තිබුණත් මම ඇයගේ සමාගමෙහි ආශාවක් තෘප්තියක් ලැබුවෙමි. විශේෂයෙන් කුසුම් පාසලෙන් අස්වීමෙන් ඇති වූ පාළුව හා තනිකම මඳකට හෝ තුනී වූයේ ඇය නිසා ය. සැනසීමක් සොයන මගේ හදවත ඇයගේ ඇසුර වඩ වඩාත් පතන්නට වූයේ එබැවිනි. ගැහැනියක විනා ගැහැනු ළමයකු නොවූ පද්මිනී මගේ මේ අසරණකම පමණක් නොව තවත් දුබලකම් ද මැනවින් අවබෝධ කරගෙන උන් බව මට තේරුම් ගන්නට තවත් කලක් ගත විය.

# 14

කුසුම් හා මා අතර සබඳකම යළි පණ ගැන්වේය යි අම්මා තුළ පැවති බිය, ඇයගේ පාසල් ගමන නතර වීමෙන් පසු ව තුනී වන්නට

Buddhika S

Pdf-Pusthakalaya

ඇත. අම්මා මට ඇනුම් පද හා දෙස් කීමක් නිතර ම මගේ වරදක් අල්ලා ගන්නට බැලීමක් ටිකින් ටික අඩු කළා ය. ඒ වන විට,

"ලොකු පුතේ ඔය රස්සාව අත් ඇරල දල උසස් වෙන්න පුළුවන් රස්සාවක් සොයාගන්න දූන්වත් බලපන්" යනුවෙන් මට අවවාද කරන්නට ආවේ. විරුද්ධ ව කතා කරන්නට කිසි ඉඩක් නො ලැබෙන පරිදි කරුණාවන්ත හා සන්සුන් ලෙසිනි.

ගෙදර පැවැති මේ සාමකාමී හා සුහද තත්ත්වය, ඒ වසරේ විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල පිට වන විට තව තවත් යහපත් අතට හැරෙමින් වර්ධනය වෙමින් පැවතිණ.

කුසුම්ට විභාගයෙන් අසමත් වීම පිළිබඳ පුවත අපේ මුළු පවුල ම කම්පාවට පත් කිරීමට තරම් බලාපොරොත්තු රහිත - දුක් මුසු එකක් විය. කුසුම්ගේ අසමත් වීම ගැන දැඩි ලෙස සිත් වේදනාවට පත්වීමට මට කරුණු ගණනාවක් විය. ඇත්ත වශයෙන් මා එද ගෙදර ආවේත් කුමන තත්ත්වයකට මුහුණ පාන්නට වේදැ යි සැකයෙනි.

"මම හිතුවෙ කුසුමක්ක පාස්වෙයි ම කියල" රාත්‍රියේ කතාව පටන්ගත්තේ ගාමිණී ය.

"මමත් හිතුවෙ එහෙම ම යි"

"කව්ද ඇත්තට හිතුවෙ කුසුම් ෆේල් වෙයි කියලා"

"සෙන්ට්‍රල් එකේ සේරට ම පුදුමයි" යනා දී ලෙසින් පිළිවෙළින් සෙනරත්, විජය හා තිස්ස සිය මවිතයත් කණගාටුවත් පළ කළහ.

"අපරාදෙ"

"හිතන්න අමාරු වැඩක්. ලොකයියත්........"

"කුසුමක්කට තව සැරයක් විභාගෙ ගන්න බැරියැ. වයසක් යැ?"

"තව සැරයක් ගන්නව කිව්වට"

"පුදුම ඉතිහාසෙත් ම ෆේල් වෙච්ච එක"

මගේ හදවත අලුතින් ඇවිළිණි.

මෙතෙක් නිහඬ ව කතාවට සවන් දීගෙන සිටි අම්මා සිය වේදනා පිට කරන්නට වූයේ හදිසියේ ය.

"ලොකු පුතා ඒ කෙල්ලගෙ ඉගනීම නැති කළා...... පුතා ඒකට වැරදි කාරය........"



"මම මොනව කරන්නද? මම ඒ ළමය අත් හැරල ඉගැන්නුවයැ?"

"අනික් වැඩවලින් පාස් වෙන්නත් පුතා උගන්නපු වැඩෙන් පාස් නොවෙන්නත් කාරණයක් තියෙන්න එප යැ?"

"අර අනුන්ගෙ ළමයෙක් කරේ දාගෙන......හැම සිකුරාදම ගෙදර ආවෙ....... තාත්තා ලෙඩින් කිය කියා"

"ඒව ඇත්ත......... ඒ කරදරයත් තියාගෙන නෙ ඒකි ඔය අනිත් ව පාස් වුණේ?.......... මේ සහෝදරියක් වාගෙ හිටිය කෙල්ලගෙ ඔළුවට ඔන නැති අදහස් දලා......... පුතාට තිබුණ නේද ඔව කල්පනා කරල බලන්න. ගැනු මෝඩ නේද? ඒ මදිවට මෙච්චර රටේ ස්කෝල තියෙද්දි රිංගන්න ගියා ඒකටම........ ඒ කෙල්ලට හිත එකලස් කරගෙන පාඩම් කරන්න පුළුවන් ද? තරුණ හිත් නේද? අර මොනව කිව්වත් ඒකිගෙ ගුණ යහපත් කමට ඔයින් ගියා. පුතා නිසාමයි කුසුමෙට විභාගෙ ගන්න බැරි වුණේ........ ඒ කෙල්ල නැති කළා....... අර පේන් අක්ක තවනින්ද විඳල විඳල වැඩ කළේ ඕකි ගැන බලාගෙන........පුතා ඒ ඔක්-කොම නැති කළා.

"මම ඒව බලාගන්නම්"

"කොහෙම ද?"

"මම කුසුම් බැඳගන්නව........ ඉවරයිනෙ"

"මොනව? බඳින්න? ඒ පවුලත් නැති කරල දන් මගෙ පවුලත් නැති කරන්නද?"

"ඉතින් අම්මනෙ කියන්නෙ මම නිසා ඒ කෙල්ල නැති වුණා කියල.......?"

"ඒ කෙල්ලට දුන්න ගින්දර නිවන්න යන්නෙ මට ගින්දරක් දීල ද? එහෙමද හිතන්නෙ........? වැරදි තියනව පුතේ හරි ගස්සන්න පුළුවන් ඒව....... ඔය වැරදි හරිගස්සන්න බෑ. ඔය විභාග පාස් කරල ඔව ඉගෙන ගන්න බෑ. වැරැද්දක් කරන්න ඉස්සෙල්ල........"

"අම්මගෙ නෙ වැරැද්ද!"

"මගෙ! උඹ වදපු එක. හදපු එක. උගන්නල ඇස් දෙක පාදපු එකත ඒක ද පුතේ වැරැද්ද? එහෙම ද උඹල දූන් හිතන්නෙ?" යි කී අම්මා හඬන්නට පටන් ගත්තාය.

"අම්මට ඔව හිතන්න තිබුණෙ නැද්ද කලින්. දැන් බොරුවට

Buddhika

For E-Pusthakalaya

අඩන්නෙ?" එතෙක් කතා නැතිව සිටි කාන්තා ඇසීය.

ඔහුගේ කටහඬ ඇසුණේ වෙනත් ලෝකයකින් ආ එකක් මෙනි. එබඳු නොරෝසුකමක් තාත්තාගේ ස්වරයෙහි මා ඊට කලින් අසා තිබුණ නම් ඉතා ම කලාතුරකින් පිට කෙනෙකු සමග වූ බහින්බස් වීමක දී පමණි. "..........ගෑනු ළමයි අතරෙ එක වයසක දී ඔවගෙ දේවල් ඇති වෙනව කියල - නිතර දකින කොට ආස්සරේ කරන කොට?"

"ඇයි අම්ම විතරක්? තාත්තට තිබුණෙ නැද්ද ඒව ගැන හිතන්නෙ ?" යි අම්මා ඇසුවේ තරහෙනි.

"මම හිතුවා මොකද නොහිතුවෙ?" මුලදීට වඩා වෙනස් ලෙස - සන්සුන් ලෙස - තාත්තා කීය.

"හිතුව නම් නිකා ඉඳල හරියනවැ? ඇයි කතා නො කළේ? ඇයි නොකිව්වෙ?"

"කතා නොකළෙ මම එහෙම එකකට විරුද්ධ නැති නිසා. කොටින් කියනොත් ලොකු පුතා කුසුම් බැඳ ගන්නවට මගෙ විරුද්ධකමක් නැ"

"එහෙනම් තාත්තණ්ඩිත් කැමතියි? දූන් ඉතින් බයවෙන්න දෙයක් නැ. කර ගනින් ලොකු පුතේ! අම්ම නැතෙයි කියල හිතාගෙන කර ගනින්! මිය සාන්ත ඉන්නෙ. සේරම කරල දෙයි.

"සුද්ද සිංහලෙන් මම කිව්වෙ මම විරුද්ධ නැත කියන එක විතරයි. කරන නොකරන එක ඕහෙගෙ වැඩක් මම නැ ඒවට. මම කියන්නෙ මිනිහෙක් කටයුත්තක් කර ගන්න සමාදානයෙන් සන්තෝෂයෙන් පවුලක් ගෙනියන්න නම් කුසුම් වගෙ ගෑනු ළමිස්සියක් රාජ කුමාරයෙකුට වුණත් ගැලපෙනවා. දහයකින් වත් හොයන්න බැරි තරම් ගුණ යහපත් එකී ගෙදරකට. පවුලකට . දුප්පත් වුණාට මොකද?"

"කුසුම්ගෙ වැරැද්දක් නෙමෙයි ඩැයිවර් උන්නැහෙ මම කියවන්නෙ. ඕහෙට වැඩිය හොඳට කුසුම්ගෙ හැටි දන්නව මම. මම කියන්නෙ ජේන් අක්කලගෙ ගෙදරින් හිර ගතු දෙනු කරන්න නම් ඒ තරම් කාලයක් මගෙ දරුවන් වෙනුවෙන් මේ විදිහට නහින්න ඕනා නැ.ඒකයි මම කියන්නෙ."

"ලොකු පුතාට වුණත් තිබුණ............" තාත්තා අමුතු හඬකින් කීය. "ලොකු පුතාටත් හිතන්න තිබුණ කලින්. අම්මගෙ හැටි දන්න කොට කල් තියා ටිකක් හිතල බලන්න තිබුණ. අම්මා මේ



කටයුත්තකට කැමති වෙයිද කියන කාරණය. කුසුම්ට බහක් දෙන්න කලින් අම්මගෙන් අහන්න තිබුණ."

"මොකටද අම්මගෙන් අහන්නෙ? ඒ ගොල්ලට අම්ම ඕනැ යැ දූන්? අත පය හයි හත්ති වුණා. ඉගෙන ගත්ත. රසසාව තියෙනව. දූන් අම්ම ඕනැ නැ. අම්ම නැතුවට ලෝක පය ගහල ඉන්න පුළුවන් "

"ඉගෙන ගත්තය කියන්නෙ ඕකද? ඒ නැති බැරි අසරණ කෙල්ලගෙ ඔළුවට ඔය අදහස් රිංගවන්න කලින් මොළයක් කියල ඇබිත්තෙක් වත් තිබුණ නම් නිකමටත් අම්මගෙ කැමැත්ත ලැබෙයි ද කියල ටිකක් හිතල බලන්න තිබුණ" යි තාත්තා කීවේ දැඩි පශ්චාත්තාපයෙනි.

"අපි මෙහෙ මරණ පරීක්ෂණ පවත්වනව..........." මා මවිත කරවමින් ගාමිණී කීහ. "............වැරැද්ද කාගෙද කියල අපි හොයනව. කාගෙ වැරැද්දෙන් හරි කුසුමක්කගෙ ඉගනීම නැති වුණ එක විතරයි ඇත්තෙ"

"ඉගනීම නැති කර ගන්න ඕනැ යැ? කුසුම්ට කල් නැද්ද ඉගෙන ගන්න." මම නොමනාපෙන් කීමි.

"මොකද කල් නැත්තෙ? නාකි වෙනකල් මැරෙන කල් ඉගෙන ගන්න බැරියැ?" තාත්තා පැවසුවේ සාවඥ හඬිනි. "අරකි අර දරුව කරේ ගහල ගියා ගියාමයි. කරෝලිස් අයිය අංසබාගෙන් වැටුණා. ඒ මිනිහ ඉතින් ආයි නැගිට්ටන්නෙ නැ. ඔවයින් මේවයින් ඒකිට හිත එකලස් කරගෙන ඉගෙන ගන්න පුළුවන් ද හාබෑටම?"

"ඒවට පලියැ කවුරුවත්? අනුන්ගෙ බර කර ගහන්නෙ?"

"අනුන්ගෙ බරක් නෙවි ලොකයියෙ! තමන්ගෙ නංගිගෙ දරුව! තමන්ගෙ තාත්තා!"

"අයිය කියන්නෙ ගාමිණී එයා හිතන විදිහ. අම්ම තාත්තා සහෝදරයො පිට මිනිස්සු. ඒ ගොල්ලගෙ වගක් ඕනැ නැ. තමන් ගැන බලා ගන්නම ඇති. ඒකනෙ ඒ කතාවෙ තේරුම"

"පොල්කිච්චි වගෙ හිනා වුණාට ඒකිගෙ හිතේ මොන ගින්දරක් තියෙනවද කියල නො දැන අපි මේ කතා කරන්නෙ"

"මම දන්නව තාත්තෙ ඒ සේරම. මගේ අමාරුවත් දන්නව කුසුමගෙ අමාරුවත් දන්නව. ඒකයි මම කියන්නෙ දෙවියන්ගෙ නාමෙන් මේකට විරුද්ධ වෙන්න එපයි කියල." හැඬෙන හඬකින් මට කියැවිණි.

"උඹ හැමෝගෙම අමාරු දන්නව නො දන්නෙ උඹ වැඩි අමාරුව විතරයි. නේද පුතේ? උඹ මගේ අමාරුව නො දැනෙයි කතා කරන්නෙ"

"වැඩක් නෑ. මේ කතාවලින් වැඩක් නෑ." යි කියමින් සිට තාත්තා බිදුලට බැස්සේය.

අම්මා ඊළඟට දිගටම හඬන්නට වූයේ මිය ගිය දරුවා සොහොනට ගෙන ගොස් දවන්නට කලින් ඔහුගේ ගුණ කිය කියා වැළපෙන කලෙක මෙන් මා කෙරෙහි තබා තිබුණු බලාපොරොත්තු හා ප්‍රාර්ථනාවන් විනාශ වූ ආකාරය මතක් කරමිනි.

මා කලින් කල්පනා නො කළ කරුණක් මට මෙදින පැහැදිලි විය. නිතර ගෙදර කතා බහට භාජනය නො වුණත් අම්මා හා තාත්තා පමණක් නොව පවුලේ සියලු දෙනාම කුසුම් හා මා අතර සම්බන්ධය ගැන දිගට කල්පනා කර මෙහි හරි වැරැදි කුමක්දැයි යම් යම් නිගමනයකට බැස සිටි බවයි.එකිනෙකා දුරු මතිමතාන්තර මොනවා වුණත් ඔවුන් හැම දෙනාම පොදු චෝදනාවක ඇඟිල්ල මට විරුද්ධව එල්ල නොකළහ.

රෝහණ කුමක් සිතනු ඇද්දැයි දැන ගැනීමේ ආශාවක් මා තුළ හට ගත්තේය. ඔහු බොහෝ විට සාධාරණ කල්පනා කරනු ඇතැයි මට සිතිණි.

මගේ සිතිවිලි සමහරක් ආත්මාර්ථකාමී බව අම්මා පමණක් නොව මල්ලිලාත් දනිතැ යි ඔවුන්ගේ කතාවෙන් මම තේරුම් ගතිමි. එසේ සිතන්නට වීම ගැන ලජ්ජා වීමි.

ඒ එකකුගේවත් තර්ක බිඳ හෙළිය නො හැකිය යි මට හැඟිණි. තාත්තා කීවේ ඇත්තකි. කුසුම්ට අදහස ඉදිරිපත් කරන්නට කලින් අම්මාගේ හැඟීම් ගැන කල්පනා කළ යුතුව තිබිණි.

මහත් බලාපොරොත්තු හා උතුම් පරමාර්ථ පෙරදැරි කොටගෙන දැඩි ආත්ම ශක්තියක් හා ආත්ම විශ්වාසයක් ඇතිව මුලදී ගුරු වෘත්තියට බට මගේ හිතේ චකිතයක් නො මැතිව ශිෂ්‍ය ශිෂ්‍යාවනට මුහුණ දීමට බැරි තත්ත්වයක් කරුණු කීපයක් ම නිසා උදා විය.

ඉතිහාසය විෂයයෙන් කුසුම් අසමත් වුනේ මගේ ම වරදින් ය යන හැඟීම පිටු දක්නට මම අසමත් වීමි. සිදුවූයේ ශිෂ්‍යාවක එක විෂයකින් අසමත් වීමක් පමණක් නොවේ. තරුණියකගේ මුළු අනාගතයක් ම අඳුරු වී ඇයගෙන් එළිය ලබන්නට සිටි මුළු පවුලක් ම අසරණ අනාථ වීමය.



ජීවිතයේ ශක්තියත් ඇත්තේ මගේ මලණු කෙනෙකු වන ගාමිණිට විතරද? ඔහු තරමට ම නොවෙතත් කුසුම්ගේ හා මගේ සම්බන්ධය ගැන දන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවෝ පාසල් වෙති. කිසිවකු මගේ කණට ඇසෙන්නට යමක් නො කියන නමුදු නිසැකයෙන් ම ඉහළ පංතිවල ළමයින්. අනේ කුසුම් ෆේල් වුණේ අපරාදෙයි කම්පා වෙමින් චෝදනාව මා පිට පටවනවා ඇත.

මෙහි දී මා කියන දෙයකට එකඟ නොවී විහින් නාස්ති වුණා යැ යි කුසුම් වෙත දෙස් පවරා හිත නිදහස් කර ගන්නට මට පුළුවන් වුණේ නැත. අම්මා හා තාත්තා කී පරිදි මා මුල දී මීට වඩා බුද්ධිමත් ලෙස කටයුතු කළ යුතු ව තිබිණි.

මෙසේ සිත නිරන්තර වේදනාවකට පත්විමෙදී ගුරුවරයකු ලෙස මගේ යුතුකම් ටිකින් ටික අතපසු වන්නට විය. ඉතිහාස සංගමයේ සාකච්ඡා හා සවස් වරුවේ පංති වැනි අමතර - බාහිර වැඩ ගැන මගේ උනන්දුවත් නැත්තටම නැති වී ගියේය.පාසල වෙත පැවැති බැඳීමක් ළමයින්ගේ දියුණුව ගැන වූ උනන්දුව හීන වී යැම ගැන මා කලකිරීමටත් පසුතැවිල්ලටත් පත් වූ වාර අනන්ත ය. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ යහපත ගැන මතක් කර නැවතත් ධෛර්යවත් වීමට මම නොයෙක් වර කල්පනා කළෙමි. ධෛර්යය ආපසු නො එන්නට මගෙන් පලා ගොස් ඇත.

මේ අතරත් ලද හැම අවස්ථාවකදීම පද්මිනි මගේ සමාගමය සොයාගෙන ආවාය. වරෙක ඇය පිටු දක්කට මට වුවමනා විය. තවත් වරෙක පාළු ගතියට පත් සිත ඇයගේ ඇසුරෙන් කිසියම් සැනසීමක් ලැබිය.

ඇය කෙරෙහි මගේ හැඟීම් හා ආකල්පයට කුමක් වුවද ඇය සමඟ නිතරම කතාබස් කරන්නට වීම නිසා ද අනෙක් ළමයින් ඉදිරියේ මගේ සිතට වංකකමක් දැනෙන්නට විය.

පද්මිනී දෙමාපියන්ගේ බල කිරීමට විනා ඉගෙනීමේ වුවමනාවක් හෝ ආසාවක් හෝ ඇතිව පාසල් ආ එකියක නො වූවාය. ඇය පංතියේ වැඩ අතපසු කළේ කිසි ගණනකට නැති ව ය. ඇයගේ හැසිරීම අනෙක් ශිෂ්‍ය ශිෂ්‍යාවනට නරක ආදර්ශයක් දෙන සීමාව ද ඉක්මවා ගියේය.

ඒ ගැන දිගටම නිහඬව සිටින්නට මට බැරි විය.

"සේනාරත්න ඔය හිතන විදිහට වැඩ කරල නම් බෑ." යි වැඩක් අතපසු කළ අවස්ථාවක ඇයට තරමක් සැරෙන් මම කීමි.

"මට ද සර් කිව්වෙ?" යි ගණනකට නැති ව ඇ කීවාය.

"සේනාරත්නල තව ඉන්නවද මේ පංතිය?"

ඇ තවත් සේනාරත්න කෙනෙකු ඇද්දැයි සැක හැර ගැනීමට මෙන් වට පිට බැලුවාය.

"මෙහෙම වැඩ කරල නම් බෑ නමයි සර්"

ළමයි සියලු දෙනා ම එක හඬින් සිනාසෙන්නට වූහ.

"මාව විහිළුවකට ගන්නද එන්නෙ?"

"මම නම් සර් හරි සීරියස්"

පංතියෙන් නැවත පටන් ගන්නට ගිය කතාව අතරමඟ ගිලිහී දැඩි නිශ්ශබ්දතාවයක් නැගුණේ මගේ මුහුණ අරක් ගත් කෝපාවිශ්ඨ පෙනීම නිසා විය යුතු ය. ළමයකුගේ වරදක් නිසා කිසි දිනෙක ඇති නොවුණු කෝපයකින් මම ඇය දෙස විනාඩියක් හමාරක් එක එල්ලේ රවාගෙන සිටියෙමි. පද්මිනීගේ පමණක් නොව සියලු දෙනාගේ ම හිසපත් නෙත් බිමට බර විය. එතැන් සිට ඉදිරියට මා පාඩම් කරගෙන ගියේ අමාරුවෙනි.

පංතියෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වුවමනාවට වඩා අකාරුණාවන්ත ලෙස ඉඳ හිට හෝ කතා කරන්නට වුණු අන් ඕනෑ ම අවස්ථාවක මෙන් ම මෙහි දීද මම පසු ව වේදනාවටත් කලකිරීමටත් පත් වීමි. මගේ හැඟීම් ළමයින්ගෙන් වසං කර ගන්නට බැරි වීම දුර්වලකමකැ යි පසුතැවිල්ලක් මට ඇති විය. ළමයකුගේ වරදකදී හට ගන්නා කෝපය අවසන උපදනා අනුකම්පාවක් ඇය ගැන ද මගේ සිතට නැගෙන්නට විය. මෙවැනි තැනකදී සිත නිදෙස් කර ගත හැක්කේ දෝෂාරෝපනයට පත් ළමයාට මා අමනාපයක් නැති බව ඒත්තු ගන්වා ඉගෙනීම ගැන අලුත් උනන්දුවක් ඇති කර ගැනීමට ඔහු හෝ ඇය හෝ යොමු කරවීමෙන් පමණි. එද සවස මා පද්මිනීට කතා කරන්නට අදහස් කළේ ඒ අරමුණ ඇතිව ය.

"අඩු තරමින් ඉස්කෝලෙ එන නිසාවත් උනන්දුවක් ගන්න ඔයිට වැඩිය." ය යි මා කියන්නට පටන් ගත්තා පමණි.

"ආයෙත් රවන්න බැරිද අර උදේ වගේ? රවනකොට නිකම් වෙලාවට නැති පිරිමිකමක් මූණෙ තියෙනව"

මගෙ මුහුණ රෞද්‍රවන්නට ඇත්තේ ඇයගේ ඉල්ලීම නිසා නොවේ.උදේ කෝපය ම නැවත උදේ වහා සිතට ආ බැවිනි.



ඇය සමඟ කතාවට ගොස් කර ගත් මෝඩකමකැ යි මා ගැනම තරහක් ඇති විය.

"උදේ නම් ඔයිට වැඩිය ලස්සනට තිබුණ. තව ටිකක් මදි"

"මම කියන්නද එහෙනම්......" හැකි තරම් සන්සුන් වන්නට ආයාස ගනිමින් මම කියන්නට ගියෙමි."අනෙක් ළමයින්ටවත් ඉගෙන ගන්න දීල අම්මලට කියල ගෙදර නවතින එකයි..."

"අම්මලගෙ ප්‍රශ්න තියෙන්නෙ අනිත් අයට. මට නෑ එව්ව"

ඇයගේ ඇස් යොමු වී ඇත්තේ මා වෙතය. එහෙත් ඇයගේ බැල්මට මුහුණ දීමට හෝ කිසිත් කීමට හෝ අසමත් වීමි. වුවමනාවෙන් ම කරදරයක් මවා ගැනීම ගැන මම යළි පසුතැවිලි වුණෙමි. ඇය මා විහිළුවට බාරගෙන ඇතැයි කෝපයට පත් වීමෙන් යටපත් කර ගත නොහැකි තරමට ඇයගේ වචන බරපතළය.

"ඔය තරම් කල්පනා කරන්න දෙයක් නෑ. තමන්ගෙ අම්මලට කතා කරල බලන එකයි තියෙන්න. මම මගෙ පැත්ත බලා ගන්නම්."

"මෙතනින් මකබෑ වෙලා පලයන්" ය යි කෑ ගසන්නට හෝ ඇයගෙන් ඉවත් ව පැන දුවන්නට හෝ මට වුවමනා විය. ඒ එකක් වත් කිරීමේ ශක්තියක් මට නොවීණි. ඇයගේ වචනත් ද්වේෂ සහගත සිනාවකින් නටන දෙ ඇසත් මගේ කෝපය වැඩි කළ අතර ම සිතෙහි තවත් පැත්තක් මෙසේ කතා කරන්නට ඇය වෙත පැවැති එඩිතරකමක් බඳු මේ ස්වභාවයේ බලපෑමට යට විය. එහිදී මට ඇති වුණේ බියකි.

"තවත් ලේසි විදිහක් තියෙනව. මම අපේ අම්මලට කියල කපුවෙක් එවන්න ද?

# 15

ගුරු සේවයෙන් ඉවත් වී තෙල් සංයුක්ත මංඩලයේ රක්ෂාවක් ලබාගෙන වැල්ලවත්තේ නවාතැනට මාරු වී ගත කළ කාලයේ ද මම ජීවිතය ගැන සෑහෙන දුරකට කලකිරී සිටියෙමි. පරිසරය වෙනස් කිරීමෙන් බලාපොරොත්තු වූ සහනයක් මට ඇති වුනේ නැත. වැඩි දවසක් යන්නට කලින් ම කාර්යාලීය පැවැත්මේ ඒකකාරී ගතිය විසින් මා ගිල ගනු ලැබීමි.

මේ කාලයේ මා ලද ලොකුම සතුට ඉඳහිට හෝ මුණගැසෙන හමුවීමයි. මම හැම හවසක ම වාගේ කම්කරු දෙපාර්තුමේන්තුවේ රාජකාරී කළ ප්‍රේමසිරි හමුවීමට ගියෙමි. මහින්ද මුණ ගැසුනේ කලාතුරකිනි. ඉඩම් සංවර්ධන දෙපාර්තුමේන්තුවට ගිය ඔහු සිටියේ රජරටය. මහනුවර කච්චේරියේ වැඩ කළ ජයන්ත යමුනා බැලීමට සතියට දෙතුනට වරක් කොළඹ ආවේය. නුගේගොඩ නගර ඒ ආ කෝට්ටේ පාසලක ඉගැන්වූවාය.

ටික කලකින් ඔවුන්ගේ විවාහය සිදු විය. ඉන් පසු ව යමුනා ද මහනුවර මහාමායාවට මාරුවක් ලබා ගත්තාය. නිවාඩු දවසක ප්‍රේමසිරි, මහින්ද හා මා තිදෙනාට ම ජයන්තගේ ගෙදරට යන්නට ලැබුණු අවස්ථාවක අප එහි ගත කළේ ඉතා සන්තෝෂයෙනි.

මෙවැනි එක් දවසක අප තුළ තරමක විමතියක් ඇති කළ පුවතක් යමුනාගෙන් දැන ගන්නට ලැබිණි. එනම් ශිරෝමි මතුරත්න කීර්තිසේන හෙට්ටිආරච්චි සමග විවාහ වීමට යන බවයි. අත්තෙන් අත්තට පනින කිරිල්ලියක මෙන් අතින් අතට මාරුවෙමින් ගිය ශිරෝමි හා කීර්තිසේන අතර සබඳකමක් පැවැති බවක් සිහිනෙන් හෝ සිතන්නට පුළුවන්කමක් වත් නොවිණි. ඇය සරසවියෙන් පිටවුණේ ද අපට වසරකට කලිනි.

මෙබඳු කතාවක් මතු වූ කල්හි සුහද යෙහෙළියක ලෙසින් යමුනා අප තිදෙනාගේ තනිකඩ ජීවිත වෙනස් කිරීමට විහිළුවෙන් තහළුවෙන් ම උත්සාහ කළාය. සරසවියෙන් පිට වන්නටත් කලින් අයිරා අතහැර දමූ ප්‍රේමසිරි තවමත් අන් කිසිවකු වෙත සිය බැඳගෙන නැතත් කොළඹ සිප දෙනෙකු එකවර ඔහුගේ ඇසුරට වැටී ඇතැයි මා සමග කළ කතා බහක දී අනාවරණය විය. මහින්ද තුළ ගැහැනුන් ගැන අදත් කල්පනාවක් ඇත්තේ ම නැති තරම්.

මා ගැන එකක් මට පැහැදිලි ය. කිසි දවසෙක කුසුම් මට නො ලැබෙන බවයි. විවාහය පිළිබඳ ප්‍රශ්නයට අදාල අන් සියලු කරුණු ඉදිරියේ මම ඇසක් කණක් පියා ගතිමි. සිත අකර්මන්‍ය කර ගතිමි.

සති අන්තයේ නිවාඩු දවසට ගෙදර ගිය කල අම්මා, මඟුල් කපුවකුගේ පණිවිඩයක් ගැන හෝ පොරොන්දම් බැලීමක් ගැන හෝ මට ඇසෙන්නට කතා කළාය. සමහර විට මම සිත යටින් කෝපයට පත් වීමි. සමහර විට මම උදාසීන ලෙස මග හැර ගියෙමි. කුමක් වුවත් ඇයගේ වචනයට මගෙන් බාධාවක් හෝ රැකුලක් හෝ ලැබුණේ නැත.

මෙසේ අවුරුද්දක් පමණ ගත කිරීමෙන් පසුව පරිපාලන සේවා



ඇතුළු වීමට මා අදහස් කර ගත්තේ උසස් වීමට එහි ඇති ඉඩකඩක නිසා හෝ අනාගතය ගැන සැලැස්මක් මා තුළ සකස් වූ නිසා හෝ නොව එදිනෙද මුහුණ දුන් ඒකාකාරී අලස පැවැත්මෙන් පැන යන චේතනාවෙනි. ආදායම් පාලක නිළධාරී තනතුරකට පත්වීමක් ලද අවස්ථාවේ පවා කිසියම් ජයග්‍රහණයක් ලද බවට නිහතමානී සතුටක් විනා සාර්ථක ජීවිතයක් සඳහා පදනමක් දමා ගතිමියි උදම්වීමක් මට ඇති නොවිණි. එහෙත් මේ හා සම්බන්ධ එක සිද්ධියක දී ජීවිතය කෙරෙහි අලුත් උද්යෝගයක් උනන්දුවක් හා ආශාවක් මට ඇති විය.

කුඩා දවස සිට ම ගමේ අහල පහළ අයගේ කිසියම් සැලකිල්ලක් මා වෙත දක්විණි. ඇල්බට් ඩැයිවර් උන්නැහේගේ හා කමලාවතීගේ ගුණ යහපත් ලොකු පුතා, අඩදබරවලට සෙල්ලමට නොගොස් ගෙදරටම වී පාඩම් කරන තැන්පත් තීකරු දරුවෙක්. කඩ ළඟ, බෝක්කු උඩ, හන්දිවල රස්තියාදු නොවී, කාන්ඩවලට නො වැටී ඉහළට ඉගෙන ගන්නා සීලාචාර තරුණයෙක්. ප්‍රථම උපාධිධාරියා ලෙස ගමටම නම්බුවක් වී ඉහළට යන උගතෙක්. අන්තිමට ඩියාරෝ කෙනෙක්.

දන් හැමෝ ම මට හිස නමති. වාඩි වී සිටි කෙනෙක් මා දක අසුනින් නැගිටිති. හිසෙහි වූ ජටාව අතට ගනිති. මඟතොට දී පැත්තකට වෙති.

දන් කෙරෙන සියල්ල නිමල් හතුරුසිංහට නොව ඩියාරෝට වුණා විය හැකි ය. එහෙත් ඒවා ලබන නැනැත්තා මම වෙමි.

ඩියාරෝ කෙනෙකු වීම නිමිත්තෙන් මා පිළිගනු පිණිස ගම්වාසීන් විසින් පවත්වන උත්කර්ෂවත් උත්සවයේ දී අපේ ගමේ පමණක් නොව අවට ගම්වලින් මුලින් ම සරසවියට ඇතුළු වී - අනතුරුව රජයේ මෙබඳු උසස් තත්වයටකට පත්වූ පළමු වැනියා ලෙස මගෙන් ප්‍රදේශයට ලැබුණු නම්බුව ගැන ආඩම්බර වෙමින් නායක හාමුදුරුවන්, ගම්සභාපති, විදුහල්පති, වෙද මහතා හා තවත් අය මගේ ඇති නැති ගුණාංගයන් වර්ණනා කරමින් කරන කතාවලට මම වේදිකාවේ සිට සවන් දීගෙන සිටියෙමි. කථිකයන්ගේ සමහර කතාවක දී අත්පුඩි ගසමින් රැස්ව සිටි හත් අට සීයයක ගම්වාසීන් ස්ත්‍රී - පුරුෂ, බාල - මහලු පිරිස දෙස බලා සිටියෙමි.

සතුටකින් සොම්නසකින් හා බලාපොරොත්තුවකින් උද්දම වූ ඒ මුහුණුවල අවංකකමක් අව්‍යාජ ගතියක් විය.

මේ ගුණ ගායනා, වර්ණනා හා උපහාර ද මිනිසුන්ගේ විශ්වාස බලාපොරොත්තු හා අවංකකමද බාර ගැනීමට තරම් සුදුසුකමක් මට

For E-Pusthakalaya

තිබේ ද යි තරමක ලැජ්ජාවක් ද ඇති ව මම එක අතකට කල්පනා කළෙමි.

කිසිවකු පලක් නැති කම්බුවක් කීර්තියක් හා ප්‍රසිද්ධියක් ගමට ලබා ගත්තා මිස තම් මගෙන් මෙතෙක් අසල්වාසීන්ට වුණු කිසිදු වැඩක් නැත. "හතුරුසිංහ ඩියාරෝ මහත්තය අපේ ගමේ කෙනෙක්. අපේ නෑයෙක්" ය යන පුරසාරම් දෙඩීමේ ඉඩක් හැර ඔහු අපට අසවල් උදව්වක්කළා ය යි උදම්වීමේ ඉඩක් මගෙන් කිසිවකුට ලැබී නැත.

අනෙක් අතට කල්පනා කිරීමේ දී එසේ මගෙන් මෙතෙක් ඉටු නොවුණ යුතුකමක් ගැන දුන්වත් සිතිය යුතු නොවේ දැයි අදහස තරමේ මිගේ සිතට නැගිණි.

මට ගැමියන් හා ගැටෙන්නට ලැබුණු ප්‍රථම අවස්ථාව මෙයයි. මාත් ගමේ ම කොටසක් ය යන හැඟීමක් මට මුල් වරට ඇති විය. මිනිසුන්ගේ අවංක මුහුනුවලින් ලද ආශිර්වාදයක් ඔස්සේ ගමන් කළ සිත මා වෙත සියලු උපහාරයන් හා ගෞරවයන් වෙනුවෙන් වන්දියක් ගෙවිය යුතු යන අවබෝධය ලබා ගත්තේය.

ගෙවිය හැකි ඉහළම වන්දිය මගේ රාජකාරිය හරිහැටි ඉටු කිරීමයි. එය මේ ගමට හෝ අන් ගමකට හෝ වෙනසක් නැත. කොතැනකදී හෝ මිනිසාට මා වෙත තබා ඇති විශ්වාසය රැකදීමක් වන්නේය.

ඉරු වෘත්තියෙන් අස් වී අවුරුදු එක හමාරක පමණ පසුව ඩියාරෝ කෙනෙකු ලෙස පත් වුණු මා මාතලේ ටික කලක් සේවය කිරීමෙන් අනතුරුව රජරටට අයත් ආදායම් පාලක කොට්ඨාශයක් බාරව ගියේ. උගත් දෙයින් රටටත් ජාතියටත් සේවය කළ යුතු ය යි අප සරසවියට ඇතුළු වුණු ළඟ දී පහළ වුණු උදාර සිතිවිලි අලුත් කරගෙනය.

තව මන්ඩියක් කෙළවර ඩියාරෝ කන්තෝරුව පිහිටි අතර ඉන් සැතපුම් බාගයක් පමණ ඇතින් පාර අයිනේ පිහිටි ගෙයක් මම නිවහන ලෙස තෝරා ගතිමි. සොල්දරයකින් ද යුක්ත මේ ගොඩනැගිල්ල ඇත්ත වශයෙන් සාද තිබුණේ කඩයක් සඳහාය. ටික කලකට උඩ දී එහි මිනිසුන් පදිංචි ව සිටි ලකුනු වශයෙන් මිදුලේ නටබුන් වූ පාත්ති කීපයක් ද ළක්ක පාළු වැල්වලින් වැහුණු දෙඩම් ගසක් ද හරකුන් කා කොඩවෙන පොල් පැළ දෙකක් ද විය.

මම නිදන කාමරය වශයෙන් කුඩා ශාලාවක් වූ උඩ තට්ටුව



පිළියෙළ කර ගතිමි.

ජනේලයෙන් බලන කළ දක්නට ලැබෙන දර්ශනය වනා නෙත් සිත් ඇද ගනී. ගෙය ඉදිරිපිට වූයේ ඈතට විහිද ගිය විශාල වෙල්යායකි. ගෙය පිටුපස වැවක් ද ඉන් ඔබ පරණ ගම්මානයක් ද දක්නට ලැබේ. තවත් පැත්තකින් වන පෙතකි.

මගේ ඉවුම් පිහුම් වැඩවලට අමරසේන නම් ළමයකු මම ගමින් ම ගෙන ගියෙමි. කාර්යාලයෙන් බාහිර කිසිවකු සමග ඇසුරක් ඇති කර ගන්නට කලින් මුල දවස්වල මගේ පාළුව මැකුනේ ඩියාරෝ කන්තෝරුවේ ම සේවය කළ ලිපිකරුවන් කිප දෙනෙකු හැම සවසකම පැමිණ රෑ බෝවෙන තුරු අල්ලාප සල්ලාපයේ යෙදී සිටින්නට පුරුදු වූ බැවිනි.

පළාත් වාරිමාර්ග, ඉඩම් සංවර්ධන, සමූපාකාර හා පොලිස් යන අංශයන්හි නියුක්ත සම තත්වයේ නිළධාරීන් දැන හැඳින ගන්නට වැඩි කලක් ගත වූයේ නැත.

මේ හැර මා කැමැත්තකින් - ආශාවකින් සමාගමය සොයා ගිය දෙ දෙනෙක් වූහ. එයින් කෙනෙක් මහින්ද ය. මහින්දගේ රාජකාරි ස්ථානය වූයේ ඉන් සැතපුම් විසි පහකට පමණ ඈතිනි. මෙවැනි පෙදෙසක එය එතරම් දුරක් නොවේ. අප දෙ දෙනාට ම මෝටර් රිය තිබිණි.සති අන්තය ගත කිරීමට මම මහින්ද සොයාගෙන ගියෙමි. නැතහොත් ඔහු මගේ නවාතැනට ආවේය. සමහර විට අපි දෙදනා එක රියකින් පොළොන්නරුව, අනුරාධපුරය හෝ ත්‍රිකුණාමලය වැනි නගරයකට ගොස් තවත් නිළධාරියකුගේ බංගලාවක රැයක් ගත කළෙමු.

මා ප්‍රිය කළේ අනෙක් නැනැත්තා ජනපද වැසියෙකු වූ සෝමරත්න බණ්ඩා නම් තරුණයෙකි. මගේ සේවක අමරසේන සමග මුලින් හාද වූ සෝමරත්න බණ්ඩා මා නැති වේලාවට පත්තර කියවීම සඳහා එහි ආවේය. ඉඳ හිට මට ද ඔහු මුණ ගැසිණි. පළාත ගැන තොරතුරු සොයනු රිසියෙන් මම සෝමරත්න බණ්ඩා කතාවට අල්ලා ගතිමි. සබකෝළය හා වකිතය මැඩ ගනිමින් ඔහු ටිකෙන් ටික මා හා කුළුපග විය.ජ්‍යෙෂ්ඨය සමත් ව අන් රක්ෂාවක් ලැබෙන තුරු දනට පවුලේ ගොවිතැන් වැඩටද හවුල් වෙමින් ගත කළ සෝමරත්න බණ්ඩා බුද්ධිමත් කරුණාවන්ත තරුණයෙක් විය. මා පිට ගත කළ රැයෙක ඔහු අමරසේනගේ තනි නොතනියට ආවේය.

මා අලුත් පත්වීම ලැබ ගියේ ගොයම් පූදින්නට ආසන්න කාලයේ ය. කුඹුරු කරලින් බරව රජරට සිනා සෙන්නට පටන් ගනිත් ම සියල්ලෝ

Buddhika

සෞභාග්‍යමත් කාලයක උදව් පිළිගැනීමට සූදානම් වන්නට වූහ.

කුඩා නගරයේ කඩ සාප්පු කීපය බඩුවලින් පිරී යන්නට විය. රෙදිපිළි හා ආහාරපාන ආදී එදිනෙදා අවශ්‍ය සාමාන්‍ය දේවලින් පමණක් නොවේ. බයිසිකල්,රේඩියෝ, මහන මැෂින්, පිඟන් බඩු, සෙල්ලම් බඩු, අරුමෝසම් බඩු අවශ්‍ය ද නැද්ද යන ප්‍රශ්නය කුමක් වුවත් විකුණා මිල කර ගත හැකි නෑම දෙයක්ම නගරවලින් එන ලොරි හා වෑන්වලින් ගෙන ලදී.

පරිසරය තව තවත් ක්‍රියාශීලි කරමින් අස්වැන්න කැපෙන්නට විය. ගොයම් කපන පාගන ට්‍රැක්ටර් හඬ නගා එහා මෙහා යන්නට විය. වී ප්‍රවාහ ගත් ටේලර් හා ලොරි නිතරම ගමනේ ය.

ඉලනැල්ලෙන් - මැඩුවමෙන් නික්මුණු සුවඳක් - වනපෙත , වැව හා කුඹුරු යාය පිසගෙන එන සුළඟ හා මුසුවුණ මාතෘ භූමියේ සුවඳක් හදවතට අලුත් ජීවයක් - ප්‍රබෝධයක් ලබා දුන්නේය.

වියාරෝකම හාල් පොත් බෙදා දීමටත්, අසරණාධාර හා තීයං ආධාර අනුමත කිරීමටත් සීමා නොකර පදවියේ උපරිම සේවය මහජනයාට ලබා දී මෙම ක්‍රියාශීලි අවට ලෝකයේ කොටසක් විය යුතුය යි. එබඳු ජීවයකින් හා ප්‍රබෝධයකින් නව පණක් ලද මගේ සිත, මෙහි එන කල ඇති කර ගත් අධිෂ්ඨාන හා තීරණ තව තවත් තහවුරු කර ගැනීමට කැඹුරු වීම පුදුමක් ද?

ජනපද ගොවියෝ පවුල් පිටින් කඩ පළට ඇදෙති. ඇඳුම් පැළඳුම් ගනිති. ඒවායින් සැරසී තව තවත් බඩු ගන්නට එති.

තරුණ ගොවියෙක් අලුත් ම නයිලෝන් කමිසයකින් හා පාට සරමකින් සැරසී ඉස්සරහ කන්ණාඩියක් ද කහපාට ප්ලැනල් රෙදි කඩයකින් වැසුණු බයිනමෝවක් ද සහිත අලුත් ම බයිසිකලයකින් ය යි. අලුත් ම සාරියක් හැඳ අරුමෝසම් කණකරවලින් සැරසුණු බිරිඳ එක අතකින් අලුත් ම ට්‍රාන්සිස්ටර් රේඩියෝවක් තුරුළු කරගෙන බයිසිකලය පිටුපස වාඩි වී සිටී. ඉස්සරහ පොල්ලේ අලුත් ම සාප්පු ඇඳුම් කට්ටලයකින් සැරසුණු දරුවාය. මෙය සුලබ දර්ශනයකි. ටෙහෙර්ලරයේ දරු පවුලත් නංවාගෙන තවත් ගොවියෙක් ට්‍රැක්ටරයක් පදවාගෙන යන්නේ අභිමානවත් ආකාරයෙනි. කුලී කාර්වලින් එහා මෙහා යන පිරිස් අඩුවක් නැත. කුළු නගර සභා පිට්ටනියේ සතියකට කලින් ඉදිවුණු කුඩාරමේ සංචාරක සිවමා ශාලාව අසල හයේ දර්ශනයට සෙනඟ පිරෙන්නේ කුනාට හතරට ය. කඩවලට අමතරව එළිමහනේ ගස් යට සංචාරක වෙළෙන්දෝ ය. කවි කොළ හා සිංදු පොත් ...



බෙත්, පපඩම්, ගුගුළු, බෙල්ලන් කර පටි, මොස්කිටෝ කොයිල්, නැත්තේ මොනවාද? සාස්තරකාරයෝ, විජ්ජාකාරයෝ, සර්කස්කාරයෝ.

සංචාරක වෑන් රථ තම තමන්ගේ භාණ්ඩ වර්ණනා කරන හඬ ශබ්ද විකාශනයෙන් අවල් දවස තිස්සේ ඇසෙයි. ඊට වෙල ඔස්සේ නැගෙන සංගීත රාවය මඟුල් ගෙදරකිනි. සමහර රැයෙක ඇට්හෝම් කීපයකි. හැම පැල්පතක් ම පැට්‍රෝල් ලාම්පුවකින් එළිය වී ඇත. රෑ බෝ වීමෙන් පසු වත් එහා මෙහා යන පිරිස් අඩුවක් නොවේ.

රජරට ගොවි ජනපද ව්‍යාපාරයේ සාර්ථකත්වය හා ජන පද වාසීන්ගේ සෞභාග්‍යමත් ජීවිත ගැන වරින් වර ආණ්ඩුව හා පුවත්පත් මගින් කරන ලද වර්ණණා ප්‍රචාරක කොටස් පමණකැයි ඇත්ත වශයෙන් මම ද කලින් සිතාගෙන සිටියෙමි. මගේ මතය වැරදි බව දැන් මම අත්දැකීමෙන් දනිමි. මා මෙන් ගොවි ජනපද ලබා ඇති දියුණුව ගැන නිවැරදි අවබෝධයක් හා දැනීමක් නැති ලක්ෂ ගණනක් දෙනා තවත් රටේ සිටිති. ඔවුනට මේ තත්ත්වය පහදා දිය යුතුය. ඇඳුම් පැලඳුම් හා කෑම්බීම් ආදී සියලු අත්‍යාවශ්‍ය දේවලට අමතර ව රේඩියෝවක්, මැෂිමක් අත් පිට මුදලට ගත හැකි ගොවියෝ කී දෙනෙක් නම් අපේ පළාත්වල සිටිත් ද? මෙහි එක මිනිහා මේ සියල්ල එක වර ගනී. සමහර පවුලක බයිසිකල් පමණක් හතරක් පහකි. ඒ එක එකට ට්‍රාන්සිස්ටර් රේඩියෝව බැගින් ඇත.සිගරට් දෙසීයේ මීටියක් එකවර මිල දී ගන්නට මගේ තත්ත්වයේ පඩි ලබන කෙනෙකුට වත් බැරි ය.මෙහි සිගරට් බංඩලයක් කිහිල්ලේ ගසාගෙන යන ගොවියා සුලබ දැක්මකි.

මේ හාස්කම් ගැන සෑහෙන ප්‍රචාරයක් කළ යුතුව ඇත. මිනිසුන් ගොවිතැනට පෙළඹවීමට එය පහසු මගක් වනු ඇත. වගා ව්‍යාපාරය සාර්ථක වීමට ද එවැනි පියවරක් අත්‍යාවශ්‍ය වෙයි. මා වැනි නිලධාරින් අතින් මෙතෙක් අනපසු වී ඇති කටයුත්තක් ලෙස මෙය මට පෙණිනි.

මේ කාලයේ එක් දවසක මහින්ද මා හමු වීමට එන විට වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ ගුණරත්න ද මා සමඟ සිටියේය. මාසය අන්තිම බැවින් අප කා අතේත් මුදල් ද තිබිණි. රෑ කෑමට තානායමකට යමු යි මම යෝජනා කළෙමි.

"හපෝ හපෝ! මේ දවස්වල කොහෙද රෙස්ට් හවුස්වල යන්නේ?" යි මහින්ද වහා කීය. "..........කොලනිස්ට්ල පිරිල ඇති"

"අපි ඔන්න ඔහේ බෝතලයක් අරගෙන බන්ට් එකට යමු. ග්‍රාමයට පණිවිඩයක් යවන්න නිමල් කුකුලෙක් හොයල දෙන්න කියල"යි කියාගෙන ගියේ ගුණරත්නටය.

For E-Pusthakalaya

"ඒගොල්ලො බිව්ව ඒව මදි වෙලාද? පෙරෙයිද යී? ඊට එහා දේ බෝතලේ තියෙන්නම ඕනෑ"

අහවල් එක කරන්නද නිමල් ඒක නැතුව. හොඳයි කියන්න බලන්න. මේවගෙ රාජකාරියට එන එකාට වැඩ ඉවර වුණාට පස්සෙ අහවල් එකක් ය කියල දෙයක් තියෙනව ද? හොඳ චිත්‍රපටියක්? මේවගෙ පෙන්නන ඒව හොඳයි මෙහෙ ඉන්න කාලකණ්ණින්ට. නාටකයක්? පොතක් කියවන්න? බෝතලේ නැත්නම් අපි පිස්සු වැටිල"

"කොලනිවල මිනිසුන්ගෙ ජීවිතයයි අපේ ජීවිතයයි අතර වෙනසක් නෑ තමයි"

"නෑ මහින්ද මම කියන්නෙ මේ මොලැසස් ගහන්න හොඳයැ මේ වගෙ? මෙය යී ඇල්. ඩී. ඕ. එස්, අයි. තවත් දෙතුන් දෙනෙකුයි මම බීර බෝතලයක් ඉවර කරන කොට මේ එක් කෙනෙක් මොලැසස් බෝතල් එක එක ඉවරයි"

"අපිත් මුලින් මෙහෙට එනකොට බිව්වෙ බීර විතරයි නිමල්. මේ පේන්නෙ නැද්ද මහින්ද වුණත්. නමුත් ටිකක් දවස් යනකොට හිතෙනවා මොකක්ද මේ ජරාව. බඩ පිරෙනව කරාමෙම අරිනවා. එච්චරයි කියලා.....ඒක නෙවෙයි. මොකක් ද අද ප්‍රෝග්‍රෑම් එක......."

"අපි යමු එහෙනම් වෙන රෙස්ට් හවුස් එකකට. හිගුරක්ගොඩ පොළොන්නරු හරි වෙන කොහේවත්"

"එහෙ මීට අන්තයි"

"හරි ඉතින් අපිත් යමු. ඒ මිනිස්සු හිටියට අපිට මොකද?"

"නිමල් ඔය නො දනනේ. උන් මේ දවස්වල හරියට අර මොන්කුන්ද හඩි ගත්තාම වගෙ. ඕවයෙ ගිහිල්ල වරෝ බරෝ ගහ ගොප් දමා ගෙන......" ගුණරත්න කීවේ පිළිකුලෙන් ඇඹුල් වුණු මුහුණ ඇතිව ය.

"එහෙනම් මොකද අපි කරන්නෙ මහින්ද? සෝමරත්න බණ්ඩාවත් හිටිය නම් අපිට මොනව හරි ගෙන්න ගන්න තිබුණා. අමරසේන.........අමරසේන........."

"සෝමරත්න බණ්ඩල අල්ලන්න බෑ මේ දවස්වල. උන් යන්න ඇති කාරෙකත් කුලියට අරන් අනුරාධපුරේ හෝටලයකින් කාල පින්චර් බලලා එන්න.... නිමල් දන්නව ද මේ කාලෙට මෙහෙ එච්චෙර පින්චර් එකකට ගියාම ශෝස් තුනම බලලයි එන්නෙ"

Buddhika 25



ජන පද ගොවීන්ගේ දියුණුවක් හා රජ රට සෞභාග්‍යයක් ලෙසට ගත වූ සති දෙක ඇතුළත මගේ සිතෙහි දැඩි හැඟීමක් ඇති කළ තත්වයක් අපහාසයට, උපහාසයට හා අවඥවට පත් කර කතා කරනු මට ඇසුණ එක ම පුද්ගලයා ගුණරත්න පමණක් නොවේ. කන්තෝරුවේ දී හා ඉන් පිටත දී නොයෙක් දෙනා - පිටින් ආ නිලධාරීන් "මේ කාලයට මුන්ගෙ හැටි" යන තේමාව උඩ ගුණරත්නගේ ආකල්පයෙන් ම කතා කරනු කීප වරක් අසන්නට ලැබිණ.

එදු සැන්දෑවේ බීර හා අරක්කු බෝතල කීපයක් ද රැගෙන වැව කන්ඩිය මත ගසක් යටට ගිය අප අතර කතාබහේ දී මේ ප්‍රශ්නය ගැන මගේ පටහැනි අදහස් පළ කරමින් මම කතා කළෙමි.

මහින්ද ඉඩම් කට්ටි කඩා ඇති කළ ජනපද ක්‍රමයත් ජනපද වාසීන්ගේ ආර්ථික හා ජීවන රටාවත් දැඩි ලෙස විවේචනය කළේය.

කතාව අවසන් වීමෙන් පසු ව වුව ද මොවුන් විසින් කියන ලද සියල්ල සත්‍ය නොවේ ය යි සිතන්නට මම උත්සාහ කළෙමි. එහෙත් ජනපද ගොවියා, ගැමි ගීයෙන් හා ජන කවියෙන් නිරූපනය වන පුද්ගලයා නොව,ඒට හාත්පසින් ම වෙනස් වූවකැයි යන අදහස මා තුළ ඇති කළේ තරක් කළ නොහැකි තරම් හොඳට සිටි කෙනෙකු දූෂණය වී ඇතැයි ඇසීමේ දී පහළ වන සංවේගය හා කලකිරීමෙනි.

එසේ වූවද දිගට කල්පනා කිරීමේදී මම ධෛර්යයට ගත් නො වුණෙමි. සියල්ල ම බැරි වුණත් මේ තත්වය යටතේ වුවද වැඩක් කළ හැකිය යන ආත්ම විශ්වාසය හා ආත්ම ශක්තිය මා තුළ පැවැති බැවිනි. මහින්ද විසින් කියන ලද අඩුපාඩුකම් රැසකට පිළියම් ඇතැයි මට සිතිණි. අඩු තරමින් මිනිසුන්ගේ සිතුම් පැතුම්වල හා ජීවිත රටාවෙහි වෙනසක් ඇති කළ හැකිය. ඔවුනට අවබෝධයත් අධ්‍යාපනයත් ලබා දිය හැකි ය. විනෝදකාමී මාර්ග සලසා දිය හැකි ය. කලාව, සාහිත්‍යය හා ක්‍රීඩා උපයෝගී කරගෙන සමිති සමාගම් වැනි සංවිධාන තුළින් කුමක් නම් කළ නො හැකිද? ප්‍රශ්නය නිලධාරීන් මේ ගැන නො සිතීමයි. උනන්දු නො වීමයි. මහින්දත් පොළඹවාගෙන තවත් කරුණු ද සොයා කිසියම් වැඩ පිළිවෙළක් සකස් කළ හැකිය. දිස්ත්‍රික්ක සම්බන්ධතා කමිටුවේ දී හෝ අන්තිසි සාකච්ඡා මට්ටමක දී හෝ මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කළ හැකි ය. කරන්නට තිබෙන - කළ හැකි මේ වැඩ ගැන කල්පනා වෙන කල මගේ සිත සතුටකින් හා ආශ්වාදයකින් පිරී ශේෂය නොපිරිහෙළා ඉටු කිරීමේ අධිෂ්ඨානය තව තවත් දැඩි වන්නට විය. අඩු තරමින් මගේ කොට්ඨාශයේ හෝ ඒවා පටන් ගත හැකිය. සාර්ථක වුහොත් මුළු රජරට පුරා ක්‍රියාත්මක වන වැඩ

For E-Pusthakalaya

පිළිවෙළකට පදනම් වනු ඇත්තේ මගේ සැලැස්මයි. සාර්ථක නොවීමට කිසි ම හේතුවක් නො මැත. මේ මගින් ප්‍රසිද්ධ වීමේ හෝ ඉහළට යෑමේ හෝ චේතනාවක් මා තුළ නැතත් මා බලාපොරොත්තු වන පරිදි කටයුතු නරි ගියොත් නිසැකයෙන් ම මා කරා දියුනුව හා පැසසුම ළඟා වන බව නො සිතා සිටින්නට ද මම අසමත් වීමි.

දූෂණ මැඩීම මගේ කාර්යාලයෙන් ම පටන් ගත යුතුය යි අවබෝධ වන්නට වැඩි දවසක් ගියේ නැත. ප්‍රධාන ලිපිකරුවා වන දල්පතාදු හා ගැටෙන්නට මට සිදු වුයේ එහි දිය.

අවුරුදු විසි ගණනක් රාජකාරි කර ඇති, මැදිවියේ සිටි දල්පතාදු නරබාරු සිරුරක් ඇති, පැත්තෙන් බෙදූ හිස පීරූ, තලඑලළු පුද්ගලයෙකි.

මුල සිටම මම හරියට නවයට වැඩට යන්නට පටන් ගතිමි.

"සර් මේ තරම් උදෙන්ම එන්න ඕනෑ නෑ. දවල් වෙලා ඇවිත් ඔය තියන දේකට අත්සන් කරල ගියාම ඇති. මෙතන ඇති වැඩකුත් නෑ සර්. මම සේරම බලාගන්නම්. ඉස්සෙල්ල මහත්තය ඉන්දෙද්දීත් එහෙම තමයි වැඩ කළේ."යි කුළුපග ව කතා කර ගෙන යන අතරෙක ඔහු පළමු සතියේ ම මට කීය.

"නෑ ඉතින් රාජකාරියට වෙලාවක් තියෙනව නෙ මිස්ට දල්පතාදු........ නේද?"

"නෑ මම කිව්වෙ වැඩකුත් නෑ මේවයෙ"

"වැඩ නැත්නම් අපි වැඩ හොයාගන්න ඕනෑ. නේද? පඩියකුත් ගන්නව නෙ"

දල්පදූ කපටි සිනාවක් මුවගට නගා,

"සර් ඉන්න ගමන් කුඹුරක් වී ගහගත්තොත් හොඳ සල්ලි"

"ඩියාරෝකම පැත්තකින් තියල?"

"ඔහෙමයි සර් ඒක කරන්නේ. දැන් අපි කරනව නම් මේ වසමෙන් කරන්න ඕනෑ නෑ"

පවුලේ කෙනෙකු යොදවා කුඹුරක් වැඩ කරන්නෙකුට බාර කරන ලෙස ඔහු මට උපදෙස් දුන්නේය. හිස් අතකින් රජරට ආ තමා දැන් කුඹුරු අක්කර විස්සක් තිහක් වගා කරගෙන සිටින ආකාරය ගැන ජීවිත තොරතුරු ඔහු හෙළි කළේය.



"මිස්ට දල්පතාදු ඉතින් රාජකාරි කරන්න වේලාවක් තියෙන්න නැති ව ඇති......."

"මම කිව්වෙ සර් මේවයෙ වැඩක් නෑ ඒ තරම් කියල. ඇරත් ඉතින් කවුරුත් ඔහොම තමයි."

රාජකාරියට එන මහජනයාට කාරුණික ලෙස කතා බස් කිරීමේ වැදගත්කම ගැන නිතර නිතර දල්පතාදුට මතක් කර දෙන්නට මට සිදු විය.

"මෙකුන්ට කරුණාව පෙන්නල බෑ සර්. ඔකුන් කරේ යනව. ටිකක් සැරෙන් ඉන්න ඕනෑ. අනික මුන් උස්සන් එන්න කරන්න පුළුවන් වැඩක්යැ? දූන් බලන්න අද ම කෙරුණු දේවල්. දූන් අර ඉඩම් බලපත්තර ප්‍රශ්නය. අග ඉඳල මුලට මම දන්න කාරණාව. පුංචි බණ්ඩගෙ ඉඩම් කට්ටිය. ඌ අත යටින් රුපියල් දෙදහක් අරගෙන බොරු නැකමක් දල විල්බට්ට පැවරුව බලපත්‍රය. හරි ද? විල්බට් ඇවිත් ඉඩමට රිංගුව. දෙන්න ම අයිතිය කියනව ඉඩමට. අපි පලිද සර්?"

"නමුත් ප්‍රශ්නය මිස්ට දල්පතාදු..........."

"දූන් සර් සමහර තැනක එක ඉඩමක බලපත්තර පහයි. කච්චේරියට පගා දීල අරගෙන තියෙනව බලපත්තර........ දූන් අර උදේ ආව අනික් කාරණය. වීරසේන ගෙ කුඹුරට එන වතුර ටික සිල්වා උඩ කට්ටියෙදි වේල්ල හාරල පොම්ප ගහල උගෙ කට්ටිය අරගෙන. සිල්ව දිවුරල කියනව මී ගුලකින් වතුර ආව මීසක් මම පයිප්ප ගැහුව එකක් නෑ කියල. ඉතින් සර් අපි ගිහිල්ල ඌ උගෙ වතුර ටික මුර කරන්නද? අනික වතුර ඉරිගේෂන් එකට අයති වැඩක්. ඉඩම් ලෑන්ඩ් එකට"

"ඒ සේරම ඇත්ත මිස්ට දල්පතාදු. නමුත් මිනිහෙක් රාජකාරියකට ආවම ඒ මිනිහට වාඩිවෙන්න පුටුවක් දීල හොඳින් කතා කරල ඒ මිනිහගෙ දුක් ගැනවිල්ල මොකක් ද කියල සවන් දීල........"

"සර් බැරි වැඩ කියාගෙන ආවම?"

"ඉන්න ටිකක්. කරන්න පුළුවන් දෙයක් නම් කරල දෙනව. බැරි දෙයක් නම් අපි ඒ මිනිහට කියනව මේක අපිට කරන්න බෑ. මේ හේතුව නිසා. මේක කරගන්න යන්න අන්න අහවල් තැනට. එහෙම කියන්න ඕනෑ. ඒකට මහන්සියක් වියදමක් යන්නෙ නෑ."

"සර් ඔය කතා කරන්නෙ මුන් ගැන නොදැන. උන්ට කියල තේරුම් කරල දෙන්න බෑ."

Buddhika 35

For E-Pusthakalaya



"තේරුම් යන විදියට කියල දෙන්න ඕනෑ. මෙහාට එන හැමෝම උගත්තු නොවෙයි. ඒ මිනිස්සු හුගක් ගොවියො. අපිට පඩි දෙන්න ඒ මිනිස්සු"

"ඔය ආකාරයෙන් ලීලෙ පෙන්නන්න ගියොත් අනිත් දවසට උන්ගෙ ගෑනියෙක් වෙන මිනිහෙක් එක්ක පැනල ගිය දව, ඒව මෙතෙ වෙනව නිතර. අනෑ එයි සර් ළඟට හාමුදුරුවනේ මගේ ගෑනි හොයල දෙන්නය කියල. එහෙම ජාතියක් සර් මුන්."

එවැනි ම තැනත් ඊට සමාන දුක් ගැනවිල්ලක් ඊට සතියකට පමණ පසු ව මට ඉදිරිපත් විණි.

"මුදියන්සෙ මගෙ පවුලත් එක්කල හාදයි හාමුදුරුවනේ. තමුන්නාන්සෙ ගෙන්නල මුදියන්සෙට තරවටුවක් වත් කලොත්. [illegible] ටිකක් මෙල්ල වෙයි." යනුවෙන් මිනිහෙක් කීය.

"මෙ කිව්වෙ නැද්ද සර්" ය යි දල්පතාදු එද දවස තිස්සේ සතුටින් පිනායමින් සිටියේ ය.

මිනිසුන්ගේ සිතුම් පැතුම්වල ජීවිතවල වෙනසක් ඇති කිරීමට නම් රාජකාරියේ කොටසක් නො වුණත් ඇත්ත වශයෙන් මෙවැනි සිද්ධියක දී තරවටු කිරීම කෙසේ වුවද වරදට සම්බන්ධ බිරිඳ හා හොර සැමියා වෙන වෙන ම ගෙන්වා අවවාද කිරීම යුතුකමක් නොවේද යන ප්‍රශ්නය දින ගණනක් තිස්සේ මගේ සිතේ පැවැතිණි. අනෙක් අතට එහිදී මා දල්පතාදු වැනි අයගේ සරදමට පවා ලක්වීමට ඉඩ ඇතැයි බියක් මට ඇති විය. මා හිත හද ගත්තේ මගේ අදහස් ක්‍රියාත්මක කිරීමට මීට වඩා ලොකු සිද්ධියකින් පටන් ගත යුතු බව කල්පනා කිරීමෙනි.

## 16

අපේ ගමේ ම ජයනේරිස් මුදලාලි නම් ධනවතකුගේ එකම දියණිය ගැන ඉදිරිපත් වුණු විවාහ යෝජනාවකට මගේ අදහස් විමසීමේ නැති වත් අම්මාගේ කැමැත්ත පළ වී තිබිණි. එහෙත් මා ඩියාගේ පදවියට පත්වීමත් සමග ම ඇ ඒ අදහස වෙනස් කර ගත්තාය. එවැනි තවත් යෝජනා කීපයක් අම්මාගෙන් ප්‍රතික්ෂේප වුණා පමණක් නොව ඒවා ගෙනා කපුවන් පවා දැන් ඇයට එපා වී ඇත.



"ඔය මිනිස්සු හොඳ තැන් දන්නෙ නෑ"යි ඇය තාත්තා සමග කපුවන් ගැන කියනු මට ඇසිණි.

"මේ අලුත් පළාතකට අලුත් රක්ෂාවකට ගිය ගමන් ම ඕව කරන්න බෑ අම්මෙ. තව ටිකක් පරක්කු වුනාට කමක් නෑ." යි විවාහ යෝජනා ගැන කතා කරන්නට ආ හැම විට ම මම අම්මාට කීවෙමි.

"උඹ විතරක් නෙවෙයිනෙ. තවත් ඉන්නවනෙ. සේරටම වඩා මට මෙන්න මේ දෙවනිව කටයුත්තක් කරල දෙන කල් හිතට නිදහසක් නෑ."

"ඉතින් දෙවනිට වැඩක් කරල දෙන්න මම හිටියට මොකද?"

"ඒක සිරිතක් ද පුතේ"

මේ කාරණය නිසා ගෙදර ආ හැම දවසකම වාගේ අම්මාගේ සිත රිදවන්නට මට සිදු විය. කුසුම් හා එකතු වන බලාපොරොත්තු අත් හැර කලක් ගත වී ඇතත් විවාහයක් පිළිබඳ කිසි ම අදහසක් තවමත් මට නැත. මේ ප්‍රශ්නය සිතේ මතු වන්නට ආ විගස එය යටපත් කිරීමෙන් මම සැනසීම ලබන්නට උත්සාහ කළෙමි.

කොළඹ සිට ටැලිෆෝනය මගින් ගොරෝසු කටහඬ කින් කතා කළ පුද්ගලයකු, එහි පැමිණි දක, හැකි නම් ප්‍රමාද නොවී, තමා මුණ ගැසිය හැකි දැ යි මගෙන් ඇසුවේ මේ අතර දවසකය. තමා කවරෙක් ද, අවශ්‍ය කාරණය කුමක්දැයි ඇසූ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්නට මැළි වූ ඔහු මගේ නම සැම්සන් කබ්රාල්. කාරණය ආවාම දැනගන්න පුළුවනි. ආ දිනෙක මෙන්න මේ නොම්බරයට කතා කරන්නැයි සිනා පී කියා ටැලිෆෝනය අංකයක් දුන්නේය. මේ අභිරහසක් පුද්ගලයා කවරෙක් ද මොහුට මා හමු වීමට ඇත්තේ කුමන කරුණක් නිසාදැයි දස අතේ කල්පනා කළත් මට මොන විදිහයකින් වත් නිගමනයකට බැසගන්නට නොහැකි විය. නිර්නාමික ලිපියකින් තර්ජනයක් කර තිබ්බෙදී ඇති වන බියක් ද මිශ්‍ර අවිනිශ්චිත අනාථ තත්ත්වයට මම පත් වීමි.

අඩු වශයෙන් ලිපිනයවත් දැන ගනු පිණිස මම සැම්සන් කබ්රාල්ගේ නම ඔස්සේ ටැලිෆෝනය මගින් ඩිරෙක්ටරිය පෙරලා බැලීමි.එහි ඔහුගේ නමට වූයේ අන් අංකයකි. අභිරහස් ගතිය වැඩි විය. කුතුල මැඩ ගනු පිණිස කොළඹ යන තුරු සිටින්නට දින කිහිපයක් ගත වන කල මට ඉවසිල්ලක් නොවිණි. ඔහු දුන් අංකයට දන්ම ම ටැලිෆෝන් කළ යුතු ය යි මම සිතීමි. මා අදහස් කළේ දැන් ම එන්න පුළුවන්කමක් නැතැයි කියන්නට මෙන් කතා කර අනතුරුව සැම්සන් කබ්රාල් කවුද? මා

Suddhika 15

For E-Pusthakalaya

හමුවීමට ඇති වුවමනාව කුමක් ද යි දැන ගැනීමට ය.

කොළඹට කතා කරන්නට පැය හයක් ගත වන්නට තිබුණෙන් මගේ නො ඉවසිල්ල වැඩෙන්නට විය.

අන්තිමට සීනුව නාද විය.

එහා පැත්තෙන් "හලෝ" යි පිළිතුරු දුන් ගැහැණු කටහඬක් "එයා දුන් එළියට ගියා විතරයි" කීවේ.

"සැම්සන් කබ්රාල් ඉන්නවද?" යි තුන් වරක් මා කෑ ගසා ඇසීමෙන් පසු ව ය.

"ඒ මහත්තය ගෙදර එන්නෙ කොයි වෙලාවෙද?"

"හලෝ හලෝ හයියෙන් කතා කරන්න - මට ඇහෙන්නෙ නෑ. ලයින් එකේ මොකක් ද කරුකුරුවක්"

මම ප්‍රශ්නය නැවත ඇසීමි.

"මේ එයාගෙ ගෙදර නෙවි. එයා මෙහෙට නිතර එනව.පණිවිඩයක් තියෙනවනම් කියන්න........ ඔය කව්ද කතා කරන්නෙ?"

"මම මේ කතා කරන්නෙ නිමල් හතුරුසිංහ"

නිශ්ශබ්දතාවයක්. අනතුරුව සිනාවක්.

"මම මේ කතා කරන්නෙ කවුරු කියලද හිතන්නෙ?"

"කොහොමද මම දන්නෙ" යි කියැවෙන්නට ගිය නමුත් එසේ කීම අශිෂ්ටකමක් ය යි හැඟී ගියෙන් මගේ පිළිතුර පමා විය.

"මම මේ කතා කරන්නෙ පද්මිනී. මතකද?"

"පද්මිනී?" මවිතයෙන් මෙන් මගෙන් කියැවිණි.

"පද්මිනී සේනාරත්න. ඔයාගේ ගෝලයෙක්! පණිවිඩය මගෙ. කවදද කොළඹ එන්නෙ ඊළගට........"

"දවසක් කියන්න බෑ හරියට"

කටහඬ පාලනය කිරීමට උත්සාහයක් දැරීමට මට සිදු විය. මගේ වචන සිතා මතා නොව ඉබේට පිට වුණු ඒවාය.

"එන පෝයට එන්න. මම බලාගෙන ඉන්නව"

"කාරණය මොකක්ද?"



"ආවම කියන්නම්"

විනාඩි තුන අවසාන හඟවන සංඥාව ඒ [redacted] ඇසුණෙත් මම, "එක්ස්ටෙන්ෂන් ප්ලීස් එක්ස්ටෙන්ෂන් ප්ලීස්" ය යි දෙ[illegible] ඊශ්වරයට කියා කාලය දික් කර ගතිමි.

පද්මිනී හමුවීමට යා යුතුද නැද්ද යි තීරණය නොකරම ගෙදර කොහේද යි අසන ලද කල කොළඹ ආ දක - මගේ අදහස් නො විමසා ම ඇය ස්ථිරව කී අන්දමට මී ළඟ සති අන්තයේ ම - ටැලිෆෝන් කරන්නට ඇය කීවාය.

පද්මිනී සේනාරත්න මා හමු වීමට ඕනැ ය යි කිය යි. මෙහි අරමුණු කුමක්ද? ඵල විපාක කවරේදැයි නො සිතා ම මා ඊට එකඟ වී හමාරය.

පද්මිනී පිළිබඳ මගේ සිතෙහි ඉතිරි වී ඇත්තේ සුදු යුනිෆෝමයෙන් සැරසුණු පාසල් දැරියකගේ රූ සටහනකි.කෙතරම් උත්සාහ කළත් ඊට වෙනස් ස්ත්‍රී රූපයක් සිතෙහි මවා ගන්නට මම අසමත් වීමි. උත්සාහ කළත් යනුවෙන් මා මෙහි සඳහන් කළේ ඊළඟට ගත වුණු දවස් කීපය ඇතුළත නොයෙක් වර ඇය ගැන කල්පනා කරන්නට මගේ සිත පෙළඹුණු බැවිනි.

සති අන්තයේ කොළඹ ගිය මම කලින් ටැලිෆෝනය කර, දෙවනුව ඇයගේ ම අදහස පරිදි සවස හතරට හෝටලයක දී මුණ ගැසීමට එකඟ විය.

තමා ම රිය පදවාගෙන මා හමු වීමට ආ පද්මිනී සේනාරත්න සුදු යුනිෆෝමයෙන් සැරසී මගේ සිතේ ඇඳී තිබුණු ඒ පාසල් දැරිය ම දැයි සැක සිතෙන තරමට පෙනීමෙන් අමුතු වී සිටියාය.

ඇය අත් රහිත හැට්ටයක් ද බඳින් අඟල් අටක පමණ පෙදෙසක් අනාවරණය වන සාරියක් ද ඇඳ සිටියාය. ඇහි බැමත් පිනාටුත් අඳුනෙන් හා දෙතොල් ළා සායමකින් සැරසී තිබිණි.අර පද්මිනීගේ ය යි සිතිය හැකි ලෙස නො වෙනස් ව තිබුණේ නැහැය. නළල හා නග්න පිට පෙදෙස වැලඳ ගැනීමට වැටුණු කෙස් කළඹ පමණකි. ළාබාලකම තරමක් අඩුවී තිබුණත් ඇයගේ මුහුණෙහි මේරූ ගතියක් දක්නට නොවිණි. පොදුවේ ඉස්සරට වඩා තලතුනාවූ බවක් ඇයගේ තුනුසපුවෙන් පළවිය.

එහෙත් ඇඳුම පැළඳුම හා ආලේප නිසා පමණක් නොව ස්වභාවයෙන් ද ඇය පාසල් වියේදීට වඩා සුන්දර ය. රූමත් ය.

Buddhika

For E-Pusthakalaya

විදේශික සංචාරකයන් මුල් කොටගෙන පටන් ගැනුණු මේ හෝටලයේ ප්‍රධාන ශාලාව අප යන විට එහෙම පිටින් ම වාගේ හිස් ව තිබිණි. මුහුද දෙසින් ආ හිරු රැසට අසුනොවුන තැනක් සොයා අපි එහි කෙළවරක මේසයක් වෙත ගියෙමු.

කලිසමක් හා කර පියවු කබායක් වශයෙන් තනි සුදු ඇඳුමින් සැරසී විනීත සිනාවක් ඇති ව පැමිණි තරුණ වේටර් කැන විසින් දිගු කරන ලද කෑම ලැයිස්තුව අතට ගත් පද්මිනී, මට ඉඩක් නොතබා ම කෑමට දේවල් සමඟ තේ සඳහා නියමය කළාය.

"ඔයාට පුදුම හිතෙන්න ඇති" ය යි කියාගෙන පද්මිනී අනතුරු ව කතාව පටන් ගත්තේ ඉංග්‍රීසියෙනි.

"කබ්රාල් තාත්තගෙ මැනේජර් වගෙ වැඩ කරන කෙනෙක්. ඒ වුණාට පවුලෙ හිතවතෙක්. අපි පුද්ගලික ප්‍රශ්නයක් ගැටළුවක් කියන්නෙත් එයාට. මම කාරණේ කෙටියෙන් කිව්ව ම කබ්රාල් යෝජනා කළා ඔයා මුණ ගැහෙන්නම් කියල"

මගේ සිතේ පැවැති බරක් සැහැල්ලු වෙන බවක් හැඟී යන්නට විය.

"මම හීන විදියක් හිතුව. ඔයාට ලියන්නත කල්පනා කළා කෙලින් ම. මම ඉස්සර වෙලා නතරවෙලා හිටිය ගෙදර මාම ලව්ව කියවන්න හිතුව. නමුත් මට මතක් වුණා අනෙක් අතට ඒ ගොල්ල ඔයාලට පදිංචිය අතින් ලඟ වැඩිය කියල. මට බැරිකමක් තිබුණේ නෑ කබ්රාල් ඇද ගන්නෙ නැතුව ඔයා මේවගෙ මුණ ගැහෙන්න කෙලින් ම. වැඩිහිටියනුත් ඇඳෙන කාරණයක් නිසා එයාට කිව්ව. ඒ පැත්තෙන් ප්‍රශ්නයක් ආවොත් ඒක හදගන්න පුළුවන් එයාට ලේසියෙන්. මම හිතන්නෙ නෑ ඒ වගෙ ප්‍රශ්නයක් එයි කියල."

පද්මිනී ගැන මගේ පැවති - අදත් පැවතින හා අලුතින් මේ වෙලේ ඇති වුණු හැඟීම මොනවා වුණත් ඇයගේ කතාවේ වූ සෘජුකම ගැන මා තුළ ඇති වුණේ පැහැදීමකි. ඇය ක්‍රියා කර ඇත්තේ බුද්ධිමත් ලෙස ය යි මට ඒත්තු ගියේය.

"........මට තවත් තිබුණ අම්මට කතා කරන්න. නමුත් ඊට කලින් ඔයාගෙ අදහස දැන ගන්න ඕනෑ. ඔයාට දැන් අමුතුවෙන් කියන්න ඕනෑ නෑ මම අදහස් කරන්නෙ මොකක්ද කියල. ඔයා මොකද කියන්නේ"

පද්මිණී ඒ දීප්තිමත් ඇස්වලින් මා දෙස බලා සිටියාය. ආදරයක් ප්‍රකාශ කර විවාහයක් යෝජනා කිරීමට වඩා මෙතැන ඇත්තේ ගනු



දෙනුවක් පිළිබඳ කතාවකැයි හැඟීමක් මට ඇති විය. කේවල් කිරීමට පසුබට කරවන ගතියක් ඇයගේ ඇස් වල ඇත.

"විවාහයක් ගැන මගේ අදහසක් නෑ නාම, පළමු වැනි කාරණය. දෙවනිව අවංකව කිව්වොත් අපි දෙන්න අහසට පොළොව වගෙ"

"මොන අතින් ද?"

"ප්‍රධාන වශයෙන් - මූලික වශයෙන් වත් පොහොසත්කම, සමාජ තත්ත්වය."

"නමුත් ගැනියෙක් පිරිමියෙක් විදිහට අපි දෙන්න ගැළපෙනව නම්? එකඟ වෙන්න පුළුවන් නම්?"

පද්මිනී ගැහැනුකම නො අඩුව පුරවා ගත් ඇස් මා වෙතට යොමාගෙන මොහොතක් වූන්නාය.

"........මම හිතන්නෙ නෑ එහෙම නම්. ඔයා මුලින් කී කරුණු දෙකින් එකක්වත් ගැටළුවක් කියල. බාධාවක් කියල......."

එහෙම එකඟ වෙන්නට පුළුවන් ද බැරිද යි ප්‍රශ්නයට පිළිතුරු බල කෙරෙන කිසිවක් ඇයගෙන් නො කියැවීම එක අතකින් සැහැල්ලුවක් මෙන් ම තවත් අතකට බරක් විය.

"සමාවෙන්න පද්මිනී අහනවට. මම දැන ගන්න කැමතියි ඔයාට හදිසියේ මෙහෙම මාව මතක් වුණේ ඇයි කියල"

"හදිසියේ නෙවී නිමල්" ඈ කේක් තසිම මා වෙතට දිගු කරමින් කීවා ය.

"..........ඔයාට මතක ඇති ඒ කාලෙත් ඒ කියන්නෙ අන්තිම කාලෙ ඔයාට මම ආදරය කළා"

මගේ සිත අතීතයට ගියේ ය. පාසල, කොරිඩෝව, පිට්ටනිය පද්මිනී, දෙවියනි කුසුම්!

කතාවක් බහක් නැති ව කොපමණ වේලාවක් ගතවුණා දැයි කීමට මම නො දනිමි. පද්මිනී ගැරුප්පුවත් පිහියත් තසිම මත තබනු යන්තමින් මට ඇසිණි.

ඉදිරිපස බිත්තිය දිගට සීගිරි චිත්‍රයක්. උඩරට නැට්ටුවෙක්, වෙහෙරක්, මුහුදු වෙරළක් පෙන්වන විශාල ප්‍රචාරක පෝස්ටර් පෙළක් ද වෙස් මුහුණු කීපයක් ද තිබුණු බවක් මතක නමුත් ඒවා දුටු බවක් මට මතක නැත.

Saadhika

පද්මිනී මගේ අත්ල මත සිය අත්ලතබා එහි පසග විද ගත්තා ඉඩ දීමට මෙන් මොහොතක් සිට මිරිකා ගෙන.

නිමල් ඔයාගෙ හැඟීම රිදෙව්වට මට සමාවෙන්න" යි මා දෙසට ටිකක් හැඹුරු වෙමින් කීවාය. "... .......ජීවිතයෙ නොයෙක් දේවල වෙනව. නො හිතුව දේවල් වෙනව.මම දන්නව ඔයා වේදනා වින්ද කෙනෙක්. මමත් වේදනා වින්ද කෙනෙක් කියල කිව්වොත් ඔයා හැබෑ ගන්න එකක් නෑ. ස්භාවය වෙනස් වෙන්න පුළුවනි. නමුත් හැම වේදනාවකම පීඩනය එකයි. මොන ආයුධයෙන් කැපුවත් එක විදිහටයි රිදෙන්නෙ."

පද්මිනීගේ සිය අත ඉවතට ගත් පසු වළලු හඬක් නැගිණි.මම ඇය දෙස බැලීමි.

ඇය කෝප්පයට කහට වත් කර සීනි හැඳි දෙකක් දමා කිරි ජෝගුවත් සමග මගේ අතට දුන්නාය.

"දෙන්නෙක් වෙන් වෙන්න උපන්නොත් නිමල් ඒ දෙන්නට කවදාවත් කොහොමවත් එකතු වෙන්න බෑ. අනෙක් පැත්තෙන් ඒ වගෙ. මිනිස්සු ඒකට කියනව ඉරණම කියල"

ඇයගේ කතාව අර්ථවත් එකකැයි හැඟීමක් ඇති වුණු අතර ම ඒ කිසි එකක අර්ථයක් තිබේද යන සැකයක් මට පහළ විය.එසේම ඇය මෙහි දී කුසුම් ගැන නමින් සඳහන් නොකිරීම මගේ සැනසීමටත් වේදනාවටත් දෙකට ම හේතු විය.

මම කිසිත් නොකීමි. පද්මිනී ද කතා කළේ නැත. ඒ වෙනුවට ඇය මා දෙස ඇස් කොනින් බලාගෙන ම තේ කෝප්පය මුවට ළං කළාය. ඇයගේ අනුරාගී දෙනෙත් කඳුලින් පිරිණි. ගැහැණියකගේ ඇසක අනුරාගය හා ශෝකය - මා ශෝකය ය යි එවේලේ සිතූ දෙය - එක් තැන් වූ කල පිරිමියෙකු කෙරෙහි ඇති කළ හැකි බලපෑම කුමක් ද යි මම එදින දැන ගතිමි.

"ඔයා ඉන්න පළාත හරි පාළු ඇති" කටහඬ වෙනස් කරගත් ඈ හදිසියේ ඇසුවා ය. සුහද සිනාවක් ඇයගේ ඇස් හා තොල් මත නටමින් තිබිණි.

මෙහි දී රජරට ගොවි - නිලධාරී ජීවිත ගැන විස්තරයක් මගෙන් කෙරිණි. ඇය කතාවට හවුල් වුණේ රටේ සිදුවන එදිනෙදා සිදුවීම් ගැන පුවත්පත් කියවීමෙන් ලද අවබෝධයක් ඇති ව සිය සාමාන්‍ය දැනීම හා බුද්ධිය ගැන මා තුළ පැහැදීමක් ඇති කරවමිනි.



එහෙත් සංවාදයේ මේ කොටස මුළුමනින් ම මට සිතුණේ - පසු ව සිතුණේ - තමා විසින් මට කවන ලද දෙයක් දිරවීම පිණිස කල් ගැනීමක් ලෙස යෙදුණු ව්‍යායාමයක් අන්දමිනි.

තවත් පැයකින් පසුව අ එතැනින් පිට වුණේ කිසි ම තීරනයක් නිගමනයක් නැතිව ය. මේ ගැන අදහස කුමක්දැයි ඇසුවා මිස ඇත්ත වශයෙන් අන්තිමට වත් ඈ මගෙන් උත්තරයක් - වචනයක් ඉල්ලා සිටියේ නැත.

කොටින් කියතොත් "ඔයා අද ගෙදර යනවද? කවද ද ආපසු යන්නෙ? ආයෙත් මුණ ගැහෙන්න කවද ද? කොහොමද? කොහේදිද?" ආදී නියත ප්‍රශ්නයක් වත් ඇය ඇසුවේ නැත. ඒ වෙනුවට නිශ්චල කතාවෙන් ම හෝටලයෙන් පිට ව අංගනයට බට අප මෝටර් රථ දෙක බලා වෙන් වන්නට කලින් ඈ මට අත දිගු කළාය. මම අත දුනිමි.

"මම හිතුවෙ නෑ නිමල් මම මේ තරම් වාසනාවන්තයි කියල" මගේ ඇස් දෙස බලාගෙන - අත මිරිකාගෙන මොහොතක් සිටි පද්මිනී කිවා ය. ඇයගේ ඒ පහසින් ද බැල්මෙන් ද මම තිගැස්සී ගියෙමි.

අපි වෙන් ව රථවලට නැග ඇන්ජිම ක්‍රියා කළෙමු. මා දෙස බලා සිනාසුණු පද්මිනී ඉස්සර වෙන්නැ යි අතින් කීවාය.

"ඔයා ඉස්සර වෙන්නැ" යි මම සංඥා කළෙමි.

තවත් සිනාසුණු ඈ රිය පස්සට කර නැවත හරවා ගාලු පාර ඔස්සේ දකුණට හැරී ගියාය.

අවිනිශ්චිත ගතියෙන් තත්පරයක් දෙකක් ගත කළ මම වමට හැරුණෙමි.

පද්මිනී සේනාරත්න එතැන් සිට මගේ සිතෙහි රඟන්නට වූයේ අද්භූත ජනක තැනැත්තියක ලෙසිනි.

ඇය මුණ ගැසීමේ සිද්ධිය පිළිබඳ මතක සිහිනයක ස්භාවය ගති. මා කලින් දැන සිටි ශිෂ්‍යාව හා මේ තරුණිය එකියක විදිහට දකින්නට පුළුවන්කමක් තිබුණේ ම නැත. මේ තත්ත්වයේ යුවතියක බිරිය කර ගැනීමේ වුවමනාවක් වත් එවැන්නක් සිදුවීමට ඉඩ ඇතැයි සිතන්නට පුළුවන්කමක් වත් මට නොවිණි. එහෙත් ඇය නිප අතකින් මා කෙරෙහි බලපෑමක් ඇති කළාය. ඇයගේ රූ සපුව මගේ සිතෙහි එක් පැත්තක් බැඳ ගත්තාය. එයින් ජනිතවුණේ ඇය හා විවාහ වීමේ

For E-Pusthakalaya

සිතකට වඩා ඇය හිමි කර ගන්නට ඇත්තම යන තෘෂ්ණාව ලා බූ හැඟීමකි. ඇයාගේ ගමන බිමන, කතාව, සිනාව, අංග චලනය - ඈය පිහිය ගැරුප්පුව හා ගේ කෝප්පය අතට ගැනීම අරමුණු කොටගෙන එක්තරා ලතාවකට, තාලයකට සකස් කර ගත් ඒවා බව මට සිතිණි. ඈ ඒ හැම එකක ම නිපුණත්වයක් පූර්ණත්වයක් පළ කළාය.

රෝහණ මා හමු වීමට රජරට ආවේ තවත් දින කිහිපයකට පසු ව ය. ගමනෙහි අරමුණ ගැන කිසිත් එක වර නොකී නමුත් ඔහුගේ මුහුණ අවුල් වුණු - වේදනාවට පත් සිතක් පිළිඹිබු කළේය.

"බොන්න මොකුත් හොයා ගත්තොත් හොඳා" ය යි ඔහු ඇඳිරි වැටිගෙන එද් දී කීවේය.

"ඔතැනම් අරක්කු බෝතලයක් ඇතැ" යි මම කීමි.

"සර් අරක්කුත් බොනවද?" යි ඔහු ඇසීය.

"මම කලාතුරකින් මිසක් අරක්කු බොන්නෙ නෑ ඒ වුණාට ඔය තොල් කාරයො හෙම වැටෙනව නෙ" යි කී මම වීදුරු දෙකක් හා සෝඩා බෝතලයක් ද රැගෙන ඔහුත් සමග උඩ තට්ටුවට ගියේ බීමට මෙන් ම කතා කිරීමට ද වඩා උචිත තැන ලෙස සිතාගෙනය.

කාරණය නොකීවත් රෝහණ ආවේ මගේ විවාහ යෝජනාව ගැන කතා කරන්නට බව මට රහසක් නොවිණි.

"සෝඩා මොටද?" යි සිනාසී කී ඔහු කාලකට ළංවූ ප්‍රමාණයක් වත් කරගෙන එක හුස්මට වීදුරුව හිස් කළේය.

"මම මුල එක ගන්නෙ එහෙමයි." කී ඔහු සිගරැට්ටුවක් දල්වාගෙන ජනේලය අසල පුටුවක වාඩි වුණේය.

"දෙවනිය කවදය කිව්ව ගෙදර ආවේ?"

"පෙරෙයි ද..........අද මම ආවෙ අම්මගෙ පණිවිඩේකට. අයියට ආව යෝජනාවක් ගැන ඉක්මනට වචනයක් දීල තීන්දු කර ගන්නය කියල"

"කොහෙන් ද?" මම කුහුලින් යුතුව ඇසීමි.

"අයිය මේ ළඟදී මුණ ගැහුණු ගෑනු ළමය ගැන"

"අම්ම කොහොමද දන්නෙ ඒ ගැන"

"කව්රු හරි කෙනෙක් ඒ ගෙදරින් එවල තියෙනව ගිය සුමානෙ



තැයෙක් ද කව්ද මම දන්නෑ. ගාමිණී කිව්ව ඒ මිනිහගෙ නම මට මතක නෑ"

"කබ්රාල්"

"අන්න ඒ වගෙ නමක්. කව්රු හරි ඒ මිනිහ කියන විදිහට මෙකයි තත්ත්වය. ඔය කියන ගෑනු ළමය තදින් ම කියනවලු වෙන එකක් කරන්නෙ නෑ කියල. ඒ නිසා දෙමව්පියො කැමති වෙලා අහන්නෙ. අම්ම කියන්නෙ හිතන්නවත් බැරි තැනක් නිසා බුරුලක් ලැබුණු වෙලාවෙ ඉක්මනට තීන්දුවක් කර ගන්න කියල"

"ඔව ඔය තරම් ඉක්මනට කරන්න බෑ දෙවෙනි. ඇරත් ඔය තරම් පෝසත් පවුල්වලින් කටයුතු කරන එක නුවණට හුරු නෑ. ගෑනියෙක් ගන්න ඕනෑ අත පොව්වන තරම් මට්ටමකින්."

"ඒ කියන්නෙ අයිය තාම ඒක ගැන තීරණයක් අරගෙන නෑ?"

"නෑ"

රෝහණ එවර වත් කර ගත් මත්පැන් ටිකට සෝඩා මිශ්‍ර කර ගත්තේය.

"අම්මත් අද එන්න හිටියෙ. මම නතර කළේ. මම කිව්ව තනියෙන් ගිහිල්ල කතා කරල අයියට කරුණු කියන්නම් කියල. නමුත් මම ඇත්ත-වශයෙන් අද ආවෙ - මොකක්ද ඒ ළමයගෙ නම?"

"පද්මිනී පද්මිනී සේනාරත්න"

"පද්මිනී ගැන කතා කරන්න නෙවි. අයියගෙ මුල් අදහස වෙනස් වෙලා නැත්නම් අපි ගිහිල්ලා අම්මාට කතා කරමු. පද්මිනී ගැන නෙවෙයි කුසුම් ගැන "

"අම්මගෙ අදහස් වෙනස් කරන්න පුළුවන් වෙයි ද දෙවනි. විශේෂයෙන් මේ වගෙ දෙයකුත් කතා වෙද්දී?" යි මම දුබල ලෙස ඇසීම.

"අපි දෙන්නම ගිහිල්ල කතා කරමු. තාත්තත් අපේ පැත්ත ගනී"

"දෙවෙනි ළඟදී එහෙ ගියා ද?" කුසුම් දැක ගැනීටම දැඩි ආශාවක් ඇති ව මම ඇසීමි.

"මේ පාර ගියේ නෑ"

එතැන් පටන් අපි සිතෙහි බරක් ඇති ව ම එහෙන් එකිනෙකාට

Buddhika-13

Pusthakalaya

සැහැල්ලු බවක් පෙන්වීමේ උත්සාහය ඇති ව පවුලේ සාමාන්‍ය තොරතුරු ගැන පැය බාගයක් හමාරක් කතා කරගෙන ගියෙමු. අනතුරුව ඇති වූ දැඩි නිශ්ශබ්දතාවක් බිඳිමින් කතා කළ රෝහණ,

"සෝමෙ කොහේ ඇද්දුයි?" යි ඇසී ය.

සවනතට පැහැදිලිව ම තේරුම් තේරුම් ගිය රෝහණගේ ප්‍රශ්නය ගැන හදවතට සැකයක් ඇති වුණෙත් මම,

"කව්රුය කිව්ව?" යි අසා ඔහු දෙස මවිතයෙන් බලා සිටියෙමි.

"සෝමෙට මොනව වුණාද හැබෑට ම?"

"මොකද දෙවනිට හදිස්දියේ සෝමෙ මතක් වුණේ?"

"හදිසියෙ නෙවෙයි. මට සෝමෙ මතක් නො වෙන එක දවසක් නෑ. පහු ගිය අවුරුදු දෙක තුනේ සෝමෙ මතක් නොවී නින්ද ගිය එක රැක් නෑ."

සහෝදරයාගේ කතාව බොළඳ එකක් ලෙස සලකා විහිළුවක් කර සිනා සෙන්නට මට වුවමනා විය.

"මම පහුණු කාලෙ සෝමෙව දන්න තරම් හෙච්ච"

ඇත්ත වශයෙන් සෝමාට කුමක් නම් වුණාද යි දැන ගැනීමේ වුවමනාවක් මගෙ සිතට ද නැගෙන්නට විය.

"ජීවතුන් අතර නැතුව ඇති. හිටියත් සෝමෙ ඇති මහ මග.........."

"ඒකි මිනිස්සු දහක් එක්ක නිදා ගත්තත් මට කමක් නෑ." මෙනෙත් මගේ ඇස් මග හැර සිටි රෝහණ කෙළින් ම මා දෙස බලා මා හා වාදයකට සැරසෙන හඩින් කීය. "..........ඒකි ළමයි කී දෙනෙක් වදගෙන හිටියත් මට කමක් නෑ. ජීවතුන් අතර - අවිවාහක ඉන්නව නම් ඉන්න නම් තැනකින් හොයාගෙන ඇවිත් මම සෝමෙව කසාද බඳිනවා."

අරක්කු බෝතලයෙන් අඩකටත් වඩා හිස්ය. මා තවමත් තොල ගාන්නේ මුලින් ම වීදුරුවට වත් කර ගත් ටික ය. රෝහණ වෙරි වී පිස්සු දෙඩවනැයි සිතන්නට මම උත්සාහ කළෙමි.

"සෝමා? කසාද බඳින්න ."

"ඔව් සෝමා!"

වීදුරුව විපෝව උඩ තබමින් නැගිට ගත් රෝහණ ජනේලය අසලට ගියේ ය. ඔහු අත් බැඳගෙන විනාඩියක් හමාරක් බලා සිටියේය.

Buddhika



"සෝමෙ පාපයට ඇඳල දැම්මෙ මම! සෝමෙ මුලින් ම කෙලෙසුණේ මගෙ අතින් අයියෙ!" රෝහණ හැඟීම්වලින් බර පහත් හඬකින්, ජනේලයෙන් පිටත - පාරෙන් එහා - වෙල්යාය වසාගත් අඳුරට කීය.

ඒ වචන ඇසෙත් ම මගේ හදවතට ඉදිකටු අනික චේතනාවක් දැනිණි. මගේ උගුර හිරවී දෙනෙත් කඳුලින් තෙත් විය. මුළු ළැම වෙළා ගත් මේ ශෝකය කවුරුන් වෙනුවෙන්ද? ශෝකයේ නිධානය රෝහණද? සෝමා ද? නැතහොත් සෝමා හා කුසුම් ඇතුළු මුළු ස්ත්‍රී සංහතිය ද? නිවෙන - පත්තුවෙන විදුලි බුබුලක් ලෙසින් අතීත සිද්ධියක මතක පිළිබඳ එළිය මගේ සිතේ නැගෙන්නට විය. අවුරුදු හත අටකට උඩ දී සෝමා අපේ ගෙදර පැමිණි අවස්ථාවන්හි මෙ දෙදෙනා මුල්ලකට වී ඇගේ ගෑවෙන තරම් සමීප ව එකිනෙකාගේ මුහුණ බලාගෙන සිටි ආකාරය මට වහා සිහිපත් විය.

ජිනෝ අද්‍රියානා දෙස බලන්නට ඇත්තේ ද එලෙසින් ම ය යි මම එද තරමෙහන් සිතුවෙමි. එහෙත් විවාහකයෙකු බව නොදන ජිනෝව අවංක ව ආලය කළ අද්‍රියානාගේ ඇස් කුමක් කියන්නට ඇද්ද යි මම එද කල්පනා නො කළෙමි. සෝමාගේ දෙනෙත් කියන දේ - ඉල්ලන දේ දැන් මට පෙනෙයි.

"ඔයා මට ඇත්තටම ආදරේ නේද? දෙවනියිය මාව අනාථ කරන්නෑ නෑ නේද?"

ජනේලය වෙතින් මෑත් වුණු රෝහණ තවත් අරක්කු වඩියක් වත් කර ගත්තේ ය.

"දෙවෙනි ඔය ගිනි වතුර ඔය තරම් බොන්න එපා" යි කෑ ගසන්නට මට වුවමනා විය. ඒ ටිකත් එක උගුරට බී ගත් ඔහු නැවත පුටුවේ වාඩි විය.

මඳ සුළඟක් හමාගෙන ආවත් රෝහණගේ මුහුණ දහඩිය ගතියකින් තෙත් වී තිබිණි. වේදනාවෙන් හා මත් ගතියෙන් පිරුණු ඔහුගේ තියුණු ඇස් ලාම්පුවේ දුබල එළිය දෙස යොමුවූ ගමන් ම ය. ජීවිතයේ පළමු වන වරට සෝමා ගැන මොහොතකට කලින් සිට නැගෙමින් පැවැති අනුකම්පාව, සංවේගය හා සෙනෙහසත් බඳු මුදු මොලොක් හැඟීමක් අතරින් රෝහණ ගැන දුක ඉස්මතු විය.

"ඔය යට ගිය දේවල් ගැන දැන් කල්පනා කරල වැඩක් නෑ දෙවනි. තරුණ කාලෙට ඔවගෙ වැරදි වෙන්න මිනිස්සු අතින්........ඇරත්

Free E-Pusthakalaya

දෙවනි නැතත් සෝමා කා අතින් හරි ඔය මගට වැටෙන්න තිබුණා........

"අපූරුයි ! අපූරුයි අයියෙ ඒ කතාව" රෝහණ සිනාසෙන්නට හත් උත්සාහයක් ඇති ව මා දෙස බලාගෙන කීය. "........මිනිහෙක් මරල දල මල් පෙරෙන පිහියක් අතේ තියාගෙන ම මලම්ණියට කියනව. යාළුව මට කරන්න දෙයක් නෑ. මගෙන් වැරැද්දක් වුණේ නෑ. මගෙන් වැරැද්දක් වුණේ නෑ. මා අතින් නැතත් කවුරු අතින් හරි අද ඒක මැරෙන්න තිබ්බ. මට සමාවෙයන්. එහෙම කිව්වැකිද අයියෙ?"

බඩු පැටවූ දුවැන්ත ලොරියක් නිසංසල පරිසරය දෙවනත් කරමින් නිවස පසු කරත්ම සොල්දරය ද තරප්පු පෙළ ද දෙදරුම් කන්නට විය. බොහෝ ඈතට යන තුරු ලොරියේ හඬ තුනී වෙමින් යනු ඇසෙයි. මැඩියන්ගේ හොඳකන්කවු සෝෂාව යළි ඇසෙන්නට පටන් ගනී. කණට පුරුදු වී ඇති බැවින් සිතට දැනෙන්නේ නිශ්චලතාවයේ බර පමණි.

".........අපට මතක ඇති කාලෙ ඉඳල කකුලකුත් සොට්ට ගහ ගහ කුලී වැඩ කරල කරල අන්තිමට අංසබාගෙ හැදිල වැටිල කරෝලිස් මාම මැරිල ගියා. අපි ඒ මළගමටවත් ගියේ නෑ.දැක්ක ද ඉඳල ජේන් නැන්ද වට්ටිය ඔළුව තියාගෙන මහ මගට දිර දීරා යනව."

පියාගේ මරණය ආරංචි වී මම කුසුම්ට සංවේගය පළ කර ලිපියක් යැව්මි.ඊට පිළිතුරු අවශ්‍ය නැත. එහෙත් කුසුම් ලිපියක් එවනැයි මම සති ගණනක් බලා සිටියෙමි. මා හා අනාගතය ගැන තමාගේ අදහස් වෙනස් කරගෙන තිබුණා නම් ඒ බව මට දන්වීමට එය ඇයට හොඳ අවස්ථාවක් විය. එතැනදීත් මගේ සිත ක්‍රියා කළේ ආත්මාර්ථකාමී ලෙසින් නොවේ ද?

ජේන් නැන්ද අන්තිමට දුටුවේ මා පිළිගැනීමට පැවැති උත්සවය ද ය. පෙරහැර ගමන් කරද්දී ගෙදර කිසිවකු නොදුටු කල නිසැකයෙන්ම කුසුම් ද උත්සවයට ගොස් ඇතැයි මම සිතිමි. වේදිකාවේ සිට මම කුසුම් දකින බලාපොරොත්තුව ඇතුව උත්සව සභාව සිසාර දෙනෙත් යැවීමි.

සෝමාගේ දරුවා වඩා ගත් අතුලා දකිත්ම මගේ සිත දුවී ගියේ ය. කුසුම් ද ඒ අසල ම ඇතැයි මම තවත් ඕනෑකමින් ඇයගේ මුහුණ සෙව්මි. පැමිණ සිටි පිරිසට කෑමෙන් බීමෙන් සංග්‍රහ කරන්නට තිබුණු බැවින් ඇය අපේ ගෙය ඇතුලේ වැඩක යෙදී ඇතැයි කල්පනා කරන්නට උත්සාහ ගතිමි.



මම ජේන් නැන්ද දුටුවෙමි. එද අම්මාගේ මුහුණට වඩා වෙනසක් තිබුනා නම් උතුරන සොම්නසක් හා සෙනෙහසක් මිස ආඩම්බර කමක් ජේන් නැන්දගේ මුහුණේ නොවීමයි.

"සෝමෙ මම නිසා නැති වුණා. ඒ විදිහට නැතත් කුසුම් අයිය නිසා නැති වුණා." රෝහණගේ වචන මට යන්තම් ඇසිණි.

ජේන් නැන්දගේ දුප්පත්කමින් වියැළුණු එහෙත් අවංකකමින් දුප්පත් නොවුණු දෙනෙත් අඳුරේ සිට ජනෙල් පොලු අතරින් මා වෙත යොමු වී තිබෙන බවක් මට හැඟිණි.

"අනේ පුතේ කුසුමෙගෙ ඔළුවට නො මනා අදහස් දමල මේ සේරම විනාස කරල දන්න එපා" යි අම්මා අපෙන් කළ ඉල්ලීමක හඬ ඈත - ඈත බෝහෝ ඈත තැනකින් ඇසෙයි.

නිහඬතාව බිඳිමින් ඇසුණු ශබ්දයක් තරප්පු පෙළ දිගේ ඉහළට ආවේය. කපොල්ලෙන් මතුවුණු අමරසේන.

"මහත්තය කෑම අරින්න දැ"යි මදක් අප දෙස බලා ඇසිය. එද රෑ අපට ඕනෑ කළ කෑමක් නොවිණි.

මම රෝහණත් සමඟ පසුව ද ම ගෙදර ආවෙමි. අම්මාගෙන් නො ඉවසිලිමත්කමක් පළවුණේ රෝහණගේ දූත මෙහෙය ගැන කරුණු දැන ගැනීමට විය යුතුය. තාත්තා ගෙදර එන්නට තරමක් ප්‍රමාද විය. ඔහු සමඟ මල්ලී කලින් කිසිවක් කතා කරගෙන තිබුණා ද යි මම නො දනිමි. රෑ කෑමෙන් පසු ව අප තිදෙනා ඉදිරිපිට.

"දැන් ඉතින් මොකද ලොකු පුතේ උඹ මේකට කියන්නේ ?" යි කතාවට පොටක් පාදන ලද්දේ අම්මා විසින් ම ය. ඉරණම පිළිබඳ විසඳුමක් කොතැනින් හෝ මතු වෙතැයි සිතාගෙන මෙන් මම කතා නැති ව පොළොව දෙස බලා සිටියෙමි.

"පුරුවෙ පිනකට වගෙ ඒ මිනිස්සුම අහගෙන ආව මිසක් අපට හිතන්නවත් පුළුවන් එකක් නෙවෙයි මේ කටයුත්ත. මම උඹට........"

"මම කියන්නෙත් ඒකමයි තාත්තෙ" තාත්තාගේ සහයෝගයක් ලබා ගන්නා උත්සාහයෙන් ඔහු අමතා. එහෙත් අම්මාට කිය යුතු දෙය කියන්නට මම පටන් ගත්තෙමි. " ඔය තරම් ඉහළ මට්ටමකින් කටයුතු කරගෙන බෑ. අපි තේරුම් ගන්න එපා යැ? ලක්ෂපතිගැනියෙක් කසාද බැඳ ගත්තම........"

"හරි ඉතින්, ඒ ලක්ෂපති ගෑනි උඹට කැමති නම්?"

Buddhika 15

"ඒ වුණාට අම්මේ......."

"උඹ ඔය කතා කරන්නෙ උඹ කව්ද කියන එකත් මතක නැතුව නෙ ලොකු පුතේ. ඒ මිනිස්සු ලක්ෂපතියො බව ඇත්ත. ඒ තරම් පෝසත් නැතත් උඹත් පොඩි මිනිහෙක් ද? උඹ ඩියාරෝ කෙනෙක් නේද?"

"දැන් කාලෙ ඩියාරෝ කිව්වම මොකක්ද අම්මෙ. ලොකු වැඩක් ද ඕක." මම සිනාසෙන්නට තැත් කරමින් කීමි.

"මම කවදාවත් උඹට තදින් කතා කළේ නෑ. නමුත් මම අද කතා කරනවා. මෙතුවක් කල් - දැන් අවුරුද්දක් දෙකක් විතර ඇති - එන එන කටයුත්තට උඹ කර ඇරියා. උඹට මේක කර අරින්න මම ඉඩ දෙන්නෙ නෑ." අම්මා තරවටු කරමින් කීවා ය.

"පොඩ්ඩක් ඉන්න අම්මෙ. තවත් කාරණයක් තියෙනව" යි රෝහණ අම්මාගේ මුහුණ බලාගෙන ම කීය. "..............මේ කටයුත්ත අපට හිතන්නවත් බැරි තරම් ඉහළ එකක්. ඒ වගේම අයියා කසාදයක් කල්දාන එකෙන් කිසි තේරුමක් නෑ. නමුත් අපි මෙතනදී අයියා කියන දේකටත් කන් දෙන්න ඕනෑ නෙ අම්මෙ. අපි අහල බලමු අයියගෙන් තමන්ගෙ හිතේ මොකවත් වෙන දෙයක් ගැන හෙම අදහසක් තියෙනවද කියල."

"එහෙම මොකුත් දෙයක් තියෙන්න බෑ"

"අපි දන්නෙ නෑ අම්මෙ. රහසක් නෙවෙයි. අයියගෙ පොඩි කාලෙ ඉඳල කුසුම් ගැන අදහසක් තිබුණ"

ඒ යට ගිය දේවල් ඕනෑ නෑ දෙවෙනි දැන්. ඒව ඉවරයි."

"ඒ අපිට නෙ අම්මෙ ඉවර. නමුත් අයියට......"

අම්මා රෝහණගෙන් ඉවතට ගත් බැල්ම මොහොතකට මා වෙත රඳවාගෙන හුන්නාය. මලණුවන්ගේ වචනවලින් ඇයගේ අධිෂ්ඨානය මඳකුදු නො සැලී ගිය බව දුටු මම තැති ගතිමි.

"කියපන් ලොකු පුතේ බලන්න උඹේ තවමත් ඒ අදහසවත් තියෙනවද කියල." අම්මා මෘදු හඬින් - එහෙත් සාවඥ ගතියකින් ඇසුවාය.

මම රෝහණ ද අනතුරුව තාත්තා ද දෙස බැලීමි. මගේ බැල්ම පිළිගට පැතීමක් විය. එතෙක් වචනයකුදු කතා නොකර හිටි තාත්තා මුහුණ ඉවතට හරවා ගත්තේය. අනාථ හැඟීමක් මට ඇති විය.



"මගෙ නාමත් ඒ ගැන අදහසක් තියෙනව නම් අම්මා මොකද ඒ ගැන කියන්නෙ?" මම බැගෑපත් ලෙස ඇසීමි.

"මම කියන්නෙ උඹ ඒ අදහස අත් හරින්න ඕනෑ කියල විතරක් නෙවෙයි! උඹ දැන් දිවුරන්න ඕනෑ. තාත්තත් ඉස්සරහ පිට මගෙ ඔළුවෙ අත තියල ඒක හිතින් අයින් කරල මේ කටයුත්ත කරනව කියල දිවුරන්න ඕනෑ!"

මගෙ මුළු ගත වෙව්ලාගෙන ගියේය.

"කෙහෙල්මලද දැන් දිවුරන්න කියන්නෙ?" තාත්තා සන්ධුවකට මෙන් කෑ ගැසේය. "........ඔහේගේ වැඩ ඔහේට ඕන විදිහට කරනව මිසක් කෝං ගෙඩිය දිවුරන්න ද? මේක උසාවියක් ද?"

"කිව්වත් වගෙ දිවුරන්න දෙයක් ඉතුරු වෙලා නෑ අම්මෙ"

"දිවුරපන්! උඹ ඒක හිතෙන් අස්කර ගන්නව කියල දිවුරපන්!"අඩියක් දෙකක් පෙරට තැබූ අම්මා ගිනි පුපුරු වැනි ඇස් මා වෙත යොමාගෙන කීවා ය.

මම වැඩී වී වුන් අසුනෙන් පිට ගතිමි.

"මොනවද අම්මෙ දැන් දිවුරන්න දෙයක් ඉතුරු වෙලා තියෙන්නෙ?" මම ඉවත බලාගෙන නැවත ඇසීමි.

"නැහැ! ඕක තාම උඹේ හිතේ තියෙනව"

"විශ්වාස කරන්න අම්මෙ......... මට........"

"විශ්වාස කළා ලොකු පුතේ මම උඹව. ඉර හඳ වගෙ විශ්වාස කළා. උඹ ඒක කැඩුව. මම උඹව විශ්වාස කරන්න නම්, දිවුරපන් මගෙ ඔළුව අත ගහල"

බියකින්, තැති ගැන්මකින් මගේ මුළු ගතම සීතල වීගෙන ගියේ ය. ජීවිතය මා වෙතින් ගිලිහෙන්නට යන බවක් මොහොතකට මට හැඟිණි.

මම විශාල භීතියකින් අප්‍රාණික ව ගියෙමි. සකල දේශයන්හි සකල භාෂාවන්හි කතා කරන සකල මිනිස් වර්ගයා ලෝකාරම්භයේ සිට විපතකදී අනතුරකදී ආපදාවකදී පිහිට පතා නිතැතින්ම කියන්නට පුරුදුව සිටින "අම්මේ" යන වචනය පිට කර ගන්නට පුළුවන්කමක් මට මෙහි දී නොවිණි. "තාත්තේ" යි කෑ ගසා කියා ගන්නට මට නුවමනා විය. "මල්ලියේ" යි කෑ ගසන්නට මට නුවමනා විය. එහෙත්

දෙවියනි. තාත්තා හා රෝහණ දෙ දෙනා ම නිහඬය. මේ බෙද්වාදකයට නිහඬ සාක්ෂිකරුවන් වීමට මෙන් ඔවුහු කතා නැතිව බිම බලාගෙන සිටිති. එසේ කෑ ගැම සුදුසු ද? නැද්දැයි තීරණය කර ගත නොහැකිව ගෙවෙමින් ගිය මොහොතක අම්මා මගේ අත සිඹින අල්ලා ගත්තාය. ඒ අත් - අප වෙනුවෙන් අදත් පැය දහ අටක් වෙහෙසෙන අම්මාගේ ඒ අත් - මළ මිනියක මෙන් සීතලය. අම්මා මගේ අත සිය හිස මත තබා ගත්තාය. ඇයගේ හිස ගිනි කබලකි. එතැන් සිට ඇඟිලි තුඩුවලින් පටන් ගත් ගින්දරක් දැත් දිගේ දුවගොස් මගේ හදවතට ඇතුළු විය.

ඒ ගින්දරෙන් මගේ ආත්මය දැවී අළුවී ගියේය.

"දිවුරපන්"

"මම දිවුරන්නම් අම්මේ! මම කුසුම් ගැන අදහස් අත් අරිනවා. මම පද්මිනී බඳිනවා"

අම්මාගේ මුහුණෙහි මතු වූයේ ඇඬීමක් ද සිනාවක් ද තෘප්තියක් ද පසුතැවිල්ලක් දැයි කීමට මම නො දනිමි. කිසිවක් බැලීමට කතා නොවුණු මම වහා සාලෙන් පිට ව දොර වසා ගනිමින් ම කාමරයට වැදී ඇඳේ වැතිර හඬන්නට පටන් ගතිමි.

මතක ඇති කාලයක නො හැඬූ ලෙසින් මම හැඬීමි. ටිකකට කලින් ගින්දරකින් දැවී ගිය ආත්මයේ භෂ්මාවශේෂ ඒ කඳුළුවලින් දිය වී සේදී ගියේය. ආත්මය දැවී,දියවී සේදී යෑමෙන් හිස් මිනිසකු බවට පත්වුණු මම මගේ හතුරකු ලෙස ක්‍රියා කරන්නට ඉඩ දී දෙනෙත් පියා ගතිමි.

## 17

රුක්ස ගස් දෙපලින් සෙවණ ලද ග්‍රෙගරි මාවතේ නිසංසල පෙදෙසක පිහිටි, වටිනා ගෘහභාණ්ඩයන් ඇතුළු මෙවැනි [illegible] අවශ්‍ය සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විත දෙමහල් ගොඩනැගිල්ලක් වූ "සේනානි" නිවස වෙත මගේ යෑම් ඊම් පටන් ගැනීමෙන් සති පමණ පසු ව එක රැයෙක එහි සාදයක් විය.



පවුලේ කිට්ටුවර හිත මිතුරන් කීප දෙනෙකු පමණක් අමුත්තන් ලෙස සහභාගී වුණු ඒ සාදයට පද්මිනී මටත් එන්නට ය යි කීවේ ඔවුන් දැනහැඳින ගැනීමේ අවස්ථාව සලසනු පිණිස විය යුතුය. නැතහොත් සුළුවෙන් හෝ ගෙදර පැවැති එබඳු උත්සවයක් සඳහා මා සහභාගී කරවා ගැනීමට ලද පළමු අවස්ථාව මෙය වූ නිසා විය හැකි ය. ඒ හැර මෙහි කිසි විශේෂයක් නොවිණි. එවැනි සාදයක් නිතර ඔවුන්ගේ නිවසෙහි පැවතිණි.

කුසුම් ගැන කතා කරන්නට ය යි රෝහණත් සමග ගෙදර පැමිණ අම්මාගේ හිසෙහි අත ගසා දිවුරා නින්දට ගිය මම, මගේ ඉරණම පද්මිනී සේනාරත්නගේ දෙපා මුල තබනු පිණිස පසුව දා උදේ ම කොළඹ ආවෙමි. මා අවදිවන විටත් රෝහණ වත්තට ගොස් සිටියේ ය.

ටැලිෆෝන් මගින් කතා කර එදාත් මා ඇය මුණ ගැසුණේ නිවසින් පිටතදීය. එහි දී තීරණය කර ගත් පරිදි මම ඊළඟ සති අන්තයේ නැවත පැමිණි සේනානි නිවසට ගියෙමි.ඒ වන විට වැඩිහිටියන් මුණ ගැසී කතා බස් කර ගන්නට - තීන්දු කර ගන්නට - තරම් දෙයක් ඉතිරි වී තිබුණේ නැත. සැම්සන් කබරාල් සහාය ඇති ව පද්මිනී දෙමාපියනට සියල්ල කියා පසු බිම සකස් කරගෙන තිබිණි. කොටින් කියතොත් විවාහය ගැන දිනය ගැන ප්‍රශ්නයක් විනා ඇයගේ දෙමාපියෝ මගෙන් වත ගොත කිසිවක් විමසන්නටවත් ඉදිරිපත් නො වූහ. පද්මිනීගේ පියා වරක් කීවේ, "අපිට නම් හෙට වුණත් ප්‍රශ්නයක් නෑ. නමුත් දිනයක් තීන්දු කරගෙන - ඊට කලින් එමහත් මව්පියෝ මෙහාට එන්න ඕනෑ. අපිත් යන්න එපා යෑ. ඒව චාරිත්තර නෙ" යන්න පමණකි.

දෙපක්ෂයේ දෙමව්පියන් යන එන දවස ගැන ඔවුන්ගේන් ඊට පසු සඳහනක් නොවුණු අතර පද්මිනීත් මමත් ඒ ප්‍රශ්නය නිවී සැනසිල්ලේ මතු වන්නට ඉඩ දුන්නෙමු. ඒ වෙනුවට මා හැම සති අන්තයේදී ම කොළඹ පැමිණියෙමි. අපට සිත් සේ කතාබස් කරන්නට හෝ ගමන් බිමන් යන්නට හෝ කිසි බාධාවක් නො විණි.

නිසැකයෙන් ම තරුණ තරුණියන් අතර ඇති වන සම්බන්ධයක මේ අවදියේ දී අන් ඕනෑම යුවළක් කරන්නාක් මෙන් අපිත් චිත්‍රපටි බැලීමට, හෝටලයක කෑමට, මුහුදු වෙරළට හා විනෝදවිය හැකි තවත් එවැනි ස්ථානයනට ගියෙමු.

ආත්මය දැවී යෑමෙන් හිස් මිනිසකු වූ තැනැත්තකුට, තමාගේ ම හතුරකු බවට පත් වුණු තමාගේ හිත ක්‍රියා කරන ආකාරයෙහි හරි වැර

Fm Fm Pusthakalaya

ද්ද හෝ සෙවීමට අවස්ථාව වත් ඕනෑකමක් වත් පුළුවන්කමක් මට තිබෙන්නට බැරි ය. එසේ ආත්මයකින් තොර හිස් මිනිසකු ලෙසින් පද්මිනී සේනාරත්නගේ ඇසුරට පත් මම, අන් තත්ත්වයක් යටතේ අප දෙදෙනා නම් කල්පනා කරන නොයෙක් දේවල් වෙත සිත යොමු නො කළෙමි. මැදි විදුහලේ ගත කළ අවසාන කාලයේ තමා මට ප්‍රේම කළ බවත් ගත වූ මුළු කාලය තිස්සේ මා ගැන සිහින මවමින් සිටි බවත් අඳුරු සිනමා ශාලාවක මට තුරුළු වී සිටි පද්මිනී මගේ කණට කර තොතෙදොල් බසින් කීවා ය. මෙතරම් නිදහසක් ඇති තරුණියක, අවුරුද්දක් දෙකක් තිස්සේ වේදනා තමා ම රහසක් කරගෙන සිටියා මිස සිය ප්‍රේමය මුව පළ කරන්නට උත්සහ නො ගත්තේ මන්දැ යි ප්‍රශ්න කරන්නට සිතන්නට නොගිය මම විලවුන් සුවඳ වහනය වන ඇගේ තුනුසපුවෙහි උණුසුමෙන් ආස්වාදය ලැබීමි.

"යෝජනා ගණනක් ආවත් මම ඔයා ගැන තදින් කියා හිටියා" යි ඇය කී වචන විශ්වාස කළ මම සේනාරත්න වැනි ව්‍යාපාරිකයකු මා වැන්නකුට කුමක් නිසා කැමති වීණි ද යි සිතන්නට නො ගියෙමි.

වසර දෙකකට කලින් පාසලේ දී එකිනෙකා කතාබස් නො කර ගත වුණු දවස්වල පද්මිනී සිය තුනු සපුවෙන් කළ ඇමතීම්වලට මෙහි දී මම ද හවුල් වීමි. කුසුම් වෙත තුඩුවූ, කුසුම් නිසා නො සිතූ ස්ත්‍රියගේ කතාන්තරයේ අනෙක් පැත්තට සවන් දීමට මම පෙලැඹුණෙමි.

අප තනිව ගිය ගමන් බිමන්වලට අමතර ව පද්මිනීගේ පවුලේ කෙනෙකු එකතු වූ අවස්ථා ද නො වුණා ම නොවේ. චිත්‍රපටියක් බලන්නට නම් වැඩිපුර ගියේ ඇයගේ නැගණිය වන නාලිනී හා මලණුවන් වන වසන්ත සමඟ ය.

පද්මිනීගේ අක්කා කල්‍යාණී ය. ඇය පියසිරි රාජසේකර නම් වෙළඳ ව්‍යාපාරිකයකු සමඟ විවාහ වී කොල්ලුපිටියේ පදිංචි ව සිටියා ය. දිනක් මමත් පද්මිනීත් වසන්ත හා නාලිනිත් එහි රෑ කෑමට ගියෙමු. තවත් දවසෙක ඇයගේ අයියා වන විපුල සේනාරත්න ද ඔහුගේ බිරිඳ වන ඉවෝන් ද සමඟ චිත්‍රපටයක් බලන්නට ගියෙමු.

මේ අන්දමින් එකී සාදය වන විට මා බැඳෙන්නට සිටි මුරගේ දොන් සේනාරත්නගේ පවුලේ ඇත්තන් හා මා අතර සැහෙන ඇසුරක් ඇති වී තිබිණි.

මුරගේ යන්න නමක් ලෙස යොදා ගැන්මට [illegible] වාසගමක් නොවූ නිසා පියාගේ දෙවන නම උරුම කොට [illegible] දරුවන් ද සේනාරත්නලා ම වුණා විය හැකිය.



අවුරුදු හැටක් පමණ වයස පෙන්වන සේනාරත්න සුදු සිල්ක් සරමක් හා ඒ රෙද්දෙන් ම මැසුණු ජාතික බැනියමක් ඇඳ රන් වළල්ලක් ද සහිත ඔරලෝසුවක් බැඳ ගල් ඇල්ලූ මුදු පැළඳ සිටියේය. රන් දම්වැලකින් කරේ එල්ලුණු තනි කුණ්ඩුවේ සුරය යටට ඇදී මේස් බැනියමින් වැසී තිබිණි. කතාවේ යෙදෙමින් වරින් වර බැනියම් අත් වැළමිට තෙක් ඉහළට කරන කල සේනාරත්නගේ අත් දඬුවල කොටන ලද නග්න ස්ත්‍රී රූප දෙකක් අනාවරණය විය. පිට පැත්තෙන් මොල්ලියක් මතු වුණු ඔහුගේ මහත බෙල්ල දෙපස ද මලක රූ සටහන් පච්ච කොටනු ලැබ තිබිණි. පපුවේ වෙහෙරක් හා බුදු සසුන බැබළේවා යන අකුරු පෙළ කොටා තිබුණු බව දැක ගන්නට මට කලක් ගත විය.

අත පය, කන්, නාසය හා ඇස් ආදිය මෙන්ම දූන් ශරීරයේ අවයවයන් ව පවත්නා මේ රූ සටහන් සේනාරත්නගේ යටි ගියාව කියා පාන සංකේත නොවෙත් ද?

සැමියාට වඩා අවුරුදු දහයක පහළොවක ළාබාලකමකින් ද වැදගත් ය යි සම්මත පෙනුමකින් ද යුත් මෙරායා සේනාරත්න මේ උකුළ ය, මේ බඩය, මේ ළැම ය යි වෙනසක් නැති තරමට පුෂ්ටිමත් වූ සිරුරක් ඇත්තී ය. ඈ ඒ දේහය දූලාටත් වඩා මෝස්තරවලින් හා විලාසිතාවෙන් යුත් ඇඳුම් පැළඳුම්වලින් සරසාගෙන සිටියා ය.

උප්පැන්න සහතිකයේ විපුලසේන යන නම ඇති වැඩිමහල් පුතා දූත් හැඳින්වෙන්නේ විපුල යනුවෙනි. වෙළෙන්දන්ගේ කෛරාටික කමට මිශ්‍ර වූ උගතකුගේ බුද්ධිමත් පෙනීමක් විපුල සේනාරත්න වෙත විය. ඔහු පියාගේ ව්‍යාපාරයන්හි කොටස්කරුවෙකි.

ඔහුගේ බිරිඳ ඉවෝන්ය. ඉතා කොටට කොණ්ඩය කැපූ පුංචි රවුම් මුහුණක් හා සිහින් සිරුරක් ඇති ඉවෝන් පාටින් තලඑළලුය. ඈ ඕජස් ගුණයෙන් තොර දර කෝටුවක් බඳු ඒ සිහින් සිරුර එතැන කිසිවකුට නොතිබුණු තරම් වටිනා සාරියකින් ඔතාගෙන රන් ආභරණ පොරවාගෙන වුන්නා ය. පිපාසයක් සාගින්නක් වැනි අසහනයකින් පීඩනයකින් ඇයගේ පුංචි ඇස් නිරතුරුවම නළියමින් තිබිණි.

අන්ධ ප්‍රේමයකින් බැඳී නො සිටියා නම්, විපුල වැනි මහා කඩවසමින් යුත් තරුණයකු ඊවා බැඳ ගන්නට ඇත්තේ හිතන්නටත් බැරි ලොකු දෑවැද්දක් නිසා ම ය යි දෙ දෙනා එක තැන සිටිනු දකින ඕනෑම කෙනෙකුට හැඟී යනු ඇත.

Bodhika 15

මුහුණුවරින් පද්මිනීට බෙහෙවින් සමාන වූ නමුත් රූ සපුවෙන් කල්‍යාණී වෙත සිසියම් අඩුවක් දක්නට විය. මේ අඩුව පිරිමසා ගන්නට

For E-Pusthakalaya

මෙන් තැගණියටත් වඩා අගර දගර පාමින් කතා කරන්නටත් මෙතරම් ශිඝ්‍ර කරන්නටත් ගිය ඇය වයස නිසා ලද ජොෂ්ඨත්වය ද ඇගේ හැම තැනදීම හැම කරුණක දී ම ප්‍රමුඛත්වයක් පළ කළාය.

ඇයගේ සැමියා වන පියසිරි රාජසේකර ද වෙළෙන්දෙකි. තරමක පුද්ගලයෙක් වූ ඔහු සිය බිරිඳගේ සහය නැතිව ස්වාධීන ව සිට ගන්නට තරම් ආත්ම ශක්තියක් හා ආත්ම විශ්වාසයක් නැත්තකු මෙන්, මොනවා ගැන කතා කළේ "ඔන්න අහල බලන්න කල්‍යාණිගෙන්, එතැන එයා දන්නව ඇති" යනාදී කියමනකිනි.

තවමත් පාසල් යතත් කිසි විටෙක ඉගනුමට සම්බන්ධ කිසිවක් කතා නොකර නාලිනී හා වසන්ත ජීවත් වූයේ චිත්‍රපටි, නැටුම්, ක්‍රීඩා තරග, මෝස්තර ආදියට සීමා වුණු සිහින ලොවකටය.

පවුලේ කෙනෙකු නොවුණත් මේ හැම දෙනාටම වඩා ඉස්මතු වී කැපී පෙනුණු බලසම්පන්න පුද්ගලයෙක් විය. ඔහු අනෙකකු නොව දවසක් මා විමතියට පත් කරමින් ටැලිෆෝනයෙන් කතා කළ සැමසන් කබ්රාල් ය. ඔහුට පළල් උර හිස් හා ශක්තිමත් අතපය ඇති උස සිරුරක් විය. තව්ටය වයස පණහකට වැඩි යි කියන්නට බැරිය. බොරු දත් කුට්ටමකින් සැරසුණු මුව පළල් ය. ඔහු තරුණයකු මෙන් හැසිරුණේය. කතා බස් කළේය. බැලුවේය.

සේනාරත්න ඔහු හැඳින්වූයේ ලියන මහත්තයා යනුවෙනි. බිරිඳ සැම් ය යි ද දරුවෝ කබ්රාල් අංකල්ද යැයි ද ඔහු ඇමතූහ. නැති තැන දී පද්මිනීලා අම්මාට නැසෙන්නට ඔහු ගැන සඳහන් කළේ කබරයා යනුවෙනි.

පවුල හා පවුලට අයත් ව්‍යාපාර සම්බන්ධ සඳහන් වන හැම තැනකදීම අනෙක් අයට අමතක වන කරුණු මතු කරමින් වැඩි පුර කට දමගන ඇවේ කබ්රාල්ය. ඒ තත්ත්වය ගැනීමට ඔහුට පුළුසක් තිබිණි.

සේනාරත්නලාගේ වෙළඳ ව්‍යාපාරවල හා ඉඩ කඩම්වල ගණන් හිලව් තැබීම හා ආදායම් බදු ගෙවීම කෙරුණේ කබ්රාල්ගේ උපදෙස් හා පරීක්ෂාව යටතේ ය. ගෙදරත් පිටත ව්‍යාපාරවලින් හාම්පුතාට හිතවත් සේවකයෝ කව්රුද අහිතවත් වූවෝ කව්රු දැ යි දත සිටියේ ඔහුය. සේවකයන් බඳවා ගැනීම, අස්කිරීම, මාරුකිරීම, දඬුවම් කිරීම පඩි වැඩි කිරීම ආදියේ දී ඔහු නැති ව තීරණයක් නොවා පත්වේ.

වෙළඳ පළට එන අලුත් කාර්, ටේප් රෙකෝඩර්, ගීතකරණ ආදී

Buddhika 25



උපකරණ ගැන මුලින් ම තොරතුරු ගෙන එන ඔහුට ගෙදරට අයත් එවැනි උපකරණයක ප්‍රිණු කල අලුත් වැඩියා කිරීම වගකීම ද පැවරිණි.

මල් ගොමුවෙන් හා තුරුලියෙන් ගහණ විශාල අංගනයෙන් තණ බිමක් සාදයට අසුන් සනවා තිබිණි. පිරිස සියකට හතළිහකට වඩා නොවුණත් කෑම බීම ද සංග්‍රහ කිරීමට වේටර් වරුන් තිදෙනෙකු ද හෝටලයකින් ගෙන්වාගෙන තිබිණි.

බිරියන් හා දරුවන් - වැඩිපුර තරුණ දූ වරුන් - සමග සිටි අමුත්තන්ගෙන් දෙතුන් දෙනෙක් සේනාරත්න වැනි ම ව්‍යාපාරිකයෝ ය. අනෙක් සියල්ලෝ රේගු, ආදායම් හා කර්මාන්ත වැනි දෙපාර්තුමේන්තුවල නිළධාරීහු ය. පෙරේරා කෙනෙකු, ප්‍රනාන්දු කෙනෙකු, සිල්වා කෙනෙකු, සොයිසා කෙනෙකු හා රත්නායක කෙනෙකු එහි සිටි බව පමණක් නොව ඒ පිරිස නිතර නිතර මෙවැනි සාදවල දී මුණ ගැසෙන කණ්ඩායමක් බව කතා බහ වැඩි දුර යන්නට කලින් ම මට වැටහිණි. මේ නිළධාරී - ව්‍යාපාරික හාදකමට පදනම කුමක් දැයි මට එක වර වැටහුණේ නැත.

"අයියා රවුමක් එක්කගෙන ගිහිල්ල මෙයාව අඳුන්වල දෙන්නකෝ" යි පද්මිනී විපුලට කීවාය. මම පස්සට ගියෙමි.

"එන්න නිමලය්යෙ එන්න" ය යි නාලනී මගේ අතින් අදින්නට වූවාය.

මෙහිදී ළඟ වුන් අයගේ අවධානය අප වෙත යොමු විය.

"අරයද?" යි මයික්‍රෝ මිනි ගවුමකින් සැරසී එහා පුටුවක වාඩි වී සිටි යුවතියක් මා පෙන්වා කල්‍යාණිගෙන් ඇසුවාය.

නිරායාසයෙන් ම මගේ දෙනෙත් ඇය වෙත යොමු විය. මා තමා දෙස බලන බව දුටු තරුණිය ගණනකට නැති ව නග්න වටොර මත වටොරක් වැටෙන සේ කකුල් පටළවා ගත්තේ ඇඳුමින් ආවරණය නොවන සිය ගැහැණුකම කෙනෙකුට නොපෙනෙන පරිදි වසා ගත යුතුය යි ලජ්ජාවකින් හා බියකින් නොව ගැහැණුකම වසාගත් යට ඇඳුම පෙනෙන පිරිසක් මැද වැඩිවී සිටීම සමාජ සිරිතක් පටහැණි ය යි සිතාගෙන මෙනි.

වටේ ගෙන ගොස් හඳුන්වා දීමක් නොමැතිව එහි සිටි ගැහැනු මා පද්මිනීගේ අත ගන්නට සිටින නැනැත්තා බව දැන ගත්හ.

මුල රවුමේ විස්කි බන්දේසිය රැගත් සේවකයා ළං වෙත්ම මම සේනාරත්න දෙස බැලීමි.

Free E-Pusthakalaya

"කමක් නෑ, යි පද්මිනී පිටු පසින් මගේ ඇලපත කොනින්නා කීවාය.

මා සේනාරත්නගේ පවුලට ලංවූ මේ කාලය වන විට ඔවුන්ගේ ව්‍යාපාරික හා ඒ අනුව පෞද්ගලික ජීවිත වේගයෙන් වෙනස් වන්නට පටන්ගෙන අවුරුද්දක් හමාරක් ගත වී තිබිණි. ඒ වනාහී වෙළඳාම හා කර්මාන්තවලට කලින් පනවා තිබුණු නොයෙකුත් සීමාවන් රජය විසින් ඉවත් කරනු ලැබීමේ ප්‍රතිඵල වශයෙන් ව්‍යාපාරික ලෝකයේ බලාපොරොත්තු අලුත් වී පැවති අවදියකි.

රෙදි සාප්පු දෙකක අයිතිකායකු වූ සේනාරත්න ජපන් කොම්පැනියක් හා පවුලක් හා හවුලට රත්මලානේ කෘතිම රෙදි කම්හලක් පටන්ගෙන තිබිණි.

සුද්දකුට අයිති ව තිබී අතින් අත ගිය මේ නිවසත් ඔහු විසින් මිල දී ගනු ලැබ ඇත්තේ මීට වසරකට කලිනි.

මිත්‍රයන් වට කර ගත් සේනාරත්න විස්කි වීදුරුව ද ඇතැතිව ඇඟ පුරා කොටා ඇති අර පච්ච සටහන්වලින් කියා පාන අතීතය යටපත් කර උත්සාහයකින් මෙන් අතරට දන්නා තරම් ඉංග්‍රීසි වචන යොද ලොකු වැඩ ද ලොකු තැන් ද ලොකු මිනිසුන් ද ගැන කතා කරන්නට වන්නේ ය. ඔහු බොහෝ කරුණක් බටන් ගත්තේ,

"ඔය ගැන මම මිනිස්ටර්ටත් කිව්ව" නැත්නම් "මිනිස්ටර් එක්කල පේ බොද්දී මම කිව්ව....." ආදී ලෙසින් කිසියම් ඇමතිවරයකු ඇදගෙන ය.

"ඇයි මතකද මේ මහත්තයගෙ ප්‍රමෝෂන් එකේදි. මම මිනිස්ටර්ට කිව්ව විතරයි."වරක් ඔහු ළඟ සිටි නිළධාරියකු දෙසට විස්කි වීදුරුව පා කීය.

බුද්ධාගම, සංස්කෘතිය, ශිෂ්ඨාචාරය, සිංහලකම හා ගුණ වගාව රැකීමට ඇති අවශ්‍යතාවය ගැන ඔහු ටික වේලාවක් කතා කළේය.

"ජැපැන් එකේ ඉස්සන් හදනව මහත්තය, මම කාලත් නෑ ඒ වගෙ කෑමක්." වේටර් විසින් ගෙනෙන ලද ඉස්සන් බදුනට අත යවමින් සේනාරත්න වරක් කීය.

"ඇයි අර ජැපැනීස් එන්ජිනියර් ආ වෙලාවෙ අපිත් හැදුවෙ" කෑම් කෝකියෙක් ගෙනල්ල." මෙරායා සේනාරත්නට වරක් කීය.

තමාටත් සැමියාටත් ජපානය නුහුරුදු තැනක් නොවේ ය යි



හැඟවීමට මෙන් ඉවෝන් මාමණ්ඩියගේ ඉස්සන් කතාවට සමාන්තරව වෝකියෝවේ යෙදුණු සාප්පු සවාරියක් ගැන කියන්නට පටන් ගත්තා ය. කාන්තාවන් කීප දෙනෙකු ඇයට නැඹුරු වූයේ පිරිස කණ්ඩායම් දෙකට බෙදෙමිනි.

ජපන් රට ගැන වෙන ම තව දුරටත් කතා කරගෙන ගිය සේනාරත්න එහි ජනයාගේ කාර්යක්ෂම භාවය, කාර්ය ශූරකම හා අවංකකම ගැන විස්තර කරගෙන යද්දී,

"එහෙනම් සිංහලය වගෙම තමයි ජපනත්" ය යි කෙනෙක් කීය.

"සිංහලය වැඩ කරන්න ඕනෑ නෑ නෙ මුදලාලි. නිකම් කන්න ටික දෙනවනම්. උගන්වනව නම්, බෙහෙත් හේත් දෙනව නම්. මොටද උන් වැඩ කරන්නෙ?"

"සහතික ඇත්ත"

"ජපැන් එකේ මිනිස්සු පුදුම වෙනව මහත්තය මේව ඇහුවම. අපට පිට රටකින් උදව්වක් වත් නොලැබෙන්න ඕකනෙ"

"නාස්ති කරන්න උදව් කරායැ පිට රටවල්"

"ජපන් එකේ මිනිස්සු පුදුම වෙනව මහත්තය මේව ඇහුවම. අපට පිට රටකින් උදවුවක් වත් නොලැබෙන්න ඕකනෙ"

"නාස්ති කරන්නෙ උදව් කරියැ පිට රටවල්"

"ජපන් එක, ජර්මනිය, ඇමරිකන්ස්ල ඒ රටවල් ලැස්තියි අපිට උදව් කරන්න. රුසියන්කාරය චීන වගෙ අපේ රටවල් ගිල ගන්න නෙවෙයි. අපේ දියුණුවට, නමුත් ඒ මිනිස්සු කොහොමද උදවු කරන්නෙ?"

"මම හිතනව මිස්ට සේනාරත්න මේ පාර නම් රට ටිකක් හරිය යි හාල් සේරුව කැපුවයින්"

"ඒකෙන් වැඩක් නෑ මහත්තයා. අනික නිකම් දෙනකොට. මම කියන්නද? හාල් සේරු දෙක ම කපන්න ඕනෑ. වෘත්තීය සමිති තහනම් කරන්න ඕනෑ. ෆ්‍රී එඩියුකේෂන් නවත්තන්න ඕනෑ. විශ්ව විද්‍යාල එකක් ඇති. ඔය වගෙ කරන්න ඕනෑ. විශ්ව විද්‍යාල එකක් ඇති. ඔය වගෙ කරන්න ඕන ටික කරල අපිට ඉඩ දුන්නොත් මහත්තය, පිට රටවල් වලින් උදව් අරගෙන අවුරුද්දෙන් බබුළුවනව. අවුරුද්දෙන් ජපන් එකේ එක කොම්පැනිය අපිට ඕනෑ සේරම ෆැක්ටරිය ටික දලා දෙයි" යනුවෙන් කී සේනාරත්න සරම දෙ දණ ඔසවා ගත්තේය.

For E-Pusthakalaya

ජපානය මුල් කරගෙන පියාගේත් බිරිඳගේත් ප්‍රධානත්වයෙන් වෙන වෙන ම පටන් ගැනුණු සාකච්ඡා දෙකටම මාරුවෙන් මාරුවට හැරී හැරී සහභාගී වෙමින් සිටි විපුල, පියාගේ අන්තිම ක්‍රියාව දැක මහා සතුට නගා ගත් මුහුණ ඉවතට හරවා ගත්තේ ය.

"නමුත් මේ පාර අස්වැන්න බොහෙම හොඳයි. අපේ රටේ" ආදායම් බදු නිළධාරියා කීය.

පරිසරයේත් පුද්ගලයන්ගේත් නුහුරුකම නිසා කතා නොකර, ගොළුවකු ලෙස සිටීම මදි කමකැයි නුසුදුසු ය යි නිරන්තර හැඟීමකින් කතාවට හවුල් වීමේ අවස්ථාවක් එන තුරු බලා සිටි මම මෙතැන දී ධෛර්යයවත් වීමි.

"කවදවත් නැති තරම් මේ පාර අස්වැන්න තියනව. ඒක ඇත්ත" මම කීමි.

කීප දෙනෙක් මා දෙස අලුතින් බැලූහ.

"කතාවට අස්සෙම මට මතක නැති වුණා. අඳුනනව ද මේ කව්ද කියල?" සේනාරත්න මා දෙසත් සිය වෙළෙඳ හා නිළධාරී මිත්‍රයන් දෙසත් බලා ඇසී ය.

විස්කිවලින් මිලාන වූ ඇස් මා වෙත යොමු විය. මම සබකෝලයෙන් බිම බලා ගතිමි.

"මේ පද්මි ගෙ මේ......."

"හා හා........!"

"සන්තෝසයි. සන්තෝසයි"

"මම හිතුව නිකම් දක්ක ගමන්ම"

"කෝ පද්මිනී? කතා කරන්නකො. කන්ග්‍රැජුලේට් කරන්න.........." මම නිතැතින්ම වට පිට බැලීමි. පද්මිනී තවත් තැනෙක තරුණියන් පිරිසක් මැදට වී සිටින්නී ය.

"නම මොකක්ද කිව්වේ?"

"මම හතුරුසිංහ. නිමල් හතුරුසිංහ"

"මෙයා ඒ පලාතෙ ඩියාරෝ"

"එහෙමද?"



"ඒක මුදලාලි දෙන්නගෙ අදහසක් නෙ. අපේ දෙවෙනි දූ
මස්සිනාලගෙ ගෙදර ඉඳගෙන ටික කලක් ඉස්කෝලෙ ගියා නෙ. ඒ කාලෙ මේ ළමය එයාගෙ මාස්ටර්"

සිය දියණිය හා මා අතර සබඳකම පටන් ගත් ආකාරය ගැන තමාට සැකයක් නැති බව ඒත්තු ගැන්වීමට මෙන් දඹරැගිල්ල පා ඔහු කීය.

"හරි හරි එහෙනම් ටීච-පියුපිල්" ළඟ ම අසුනේ සිටි තැනැත්තා මගේ පිටට අත තබා කීය.

මම ලජ්ජාවෙන් සිණාසුණෙමි. ඔහුගේ අත දිගට ම මගේ පිට මතය.

"පරණ සම්බන්ධයක්"

"දෙන්නගෙ අදහස තිබිල තියෙනව. හංගගෙන හිටිය. ඉතින් ලියන මහත්තය ලව්ව පද්මි මට කියෙව්ව. මම කිසි කතාවක් නැ දෙන්නගෙ කැමැත්තට ඉඩ දුන්න."

"වෙන මොනවද මුදලාලි. ඒවට ඉඩ දෙන්න ඕනැ"

"මහත්තය දන්නව මම සල්ලි හම්බ කළා. ඒ හම්බ කළේ දරුවන්ට. ඒ ගොල්ල සන්තෝසෙන් ඉන්නව නම් මට එච්චරයි. ඒ ගොල්ලගෙ සතුට." සේනාරත්නගේ මුහුණ ව්‍යාපාරිකයා යට කරගෙන පියා මතු විය. ප්‍රථම වරට ඔහු මා තුළ සෙනෙහසක් ඇති කර ගත්තේ ය. ඒ ළමය ඩියාරෝ කෙනෙක්. මට ඒ හොඳටම ඇති"

විපුල යළි නො සතුටු ගතියකින් පියා දෙස බැලුවේ බීමෙන් වඩාත් දෙඩමළු ව සිටින ඔහු මගේ වතගොත ගැන නුවුවමනා ලෙස අනාවරණය කරතැයි බියෙන් මෙනි.

"මොනවද මුදලාලිට ඕන නම් ටෙලිෆෝන් එකෙන් මිනිස්ටර්ට කියල ඉහළ තැනකින් තියන්න වුණත් බැරුවයැ?"

"ඒව සුළු වැඩ............. නැතත් මට මේ ඇති"

අප අතර තරමක නිශ්ශබ්දතාවයක් ඇති විය. මේ වන විට වයස, ස්ත්‍රී පුරුෂකම හා වෘත්තිය ආදී වශයෙන් පිරිස කණ්ඩායම් තුන - හතරකට බෙදී සිටියහ. පටන් ගැන්මේදීට වඩා උස් හඬින් නැගුනු කතාවක් සිනාවත් යටින් රේඩියෝග්‍රෑමයකින් නික්මුණු බටහිර නැටුම් සංගීතය සියුම් හඬ ඇසෙන්නට විය.

Buddhika JT

For E-Pusthakalaya

"ඒක නෙවි මිස්ට හතුරුසිංහ. කොහොමද ඒ පළාතෙ ගොවිරාළලාට වී මිල උස්සපු එකෙන් වෙනසක් වෙලා තියෙනවද?" නිලධාරියෙක් ඇසීය.

"ඇත්ත වශයෙන් ඒක තේරුම් ගන්න එහාට යන්න ඕනැ." එඩාත් ධෛර්යවත් වූ මම කීමි.

"හැබෑ-ටම?" ඔහු නළල රැලි ගන්වා ඇසී ය.

"මම වුණත් හිතුවෙ නෑ. ඒක ඇහැට දකින කල්"

මහින්ද හා අනෙකුත් නිලධාරීන් විසින් කරන ලද විස්තර ඉදිරියේ වුව ද නවමින් නො සෙල්වුණු විශ්වාසකින් පසු වුණු මම, රජරට සෞභාග්‍යයක් හා දියුණුවක් ලෙස ඇති කර ගත් මුල් හැඟීම පදනම් කරගෙන එහි ගොවියාගේ සරුසාර ජීවිතය ගැන විස්තර කියන්නට ගියෙමි.

ඔවුන් මට සවන් දීගෙන සිටියේ මවිතයෙනි. සියලු දෙනාගේ ම අවධානය මට ම යොමුව තිබුණෙත් මෙහි පැමිණි මුල දී පීඩා විඳිමින් තිබුණු හීනමානයට හා සබකෝලයට ලංවූ හැඟීම් මැඩගෙන - සේනාරත්න විසින් වරින් වර නගන ලද බාද කිරීම් ද මැද - දිගට ම කතා කරගෙන ගියෙමි.

"අන්න බලන්න මහත්තය මගෙ පොයින්ට් එක මෙතෙන්දි ඔප්පු වුණා. මේ ළමය කියන්නෙ බොරුවක් නෙවෙයි. එයා එහෙ ඩියාරෝ. ඔය පිරිසිදු ඇත්ත කිව්වෙ. ඒක හාල් සේරුව කපලයි ඔය ගොවිය අද රේඩියෝ ගන්නෙ. ඒක පවුලට බයිසිකල් දෙක තුන ගන්නෙ. අර මම කිව්ව අනිත් ඒක කළ දට කොහොම හිටී ද?"

සේනාරත්න රට හැදීමට තමා යෝජනා කරන කරුණු ලැයිස්තුව නැවත කියන්නට පටන් ගත්තේ ය. ඊට බාද කරමින් කීප දෙනෙක් අනෙක් දේවල් අදින්නට වූහ.

"ඒක නෙවෙයි මුදලාලි. මේ අහන්න පොඩ්ඩක්. මම මේ මිස්ට හතුරුසිංහ ගෙ කතාවෙන් තේරුම් ගත්ත එකක්. ආණ්ඩුව රටට කරන සේවය ගැන කරන ප්‍රචාරය නම් හොඳටම මදි. එහෙම නේද මිස්ට සිල්වා?"

"ඇත්ත තමයි. කොටින් කියනොත් අපිවත් දන්නෙ නෑ මේ තරම් වගක්."

Buddhika

"කොහොමද ප්‍රනාන්දු මහත්තය හරියන්නෙ? ආණ්ඩුව පුරා



කඩාකප්පල්කාරයො නෙ. හතුරො නෙ. අපේ මිනිස්ටර්ලට කිව්වට අහනව යැ?" යි තරහෙන් කීවේ ද සේනාරත්න ය.

"තවත් කාරණයක්. කියන අඩු පාඩු මග අරින්න ඕනැ." යි කී මම, රජරට සංවර්ධනය කිරීමට මා තුළ ඇති අදහස් ගැන කතාව පටන් ගන්නට ගියෙමි. එය හරි ගියේ නැත. අනෙකකුගේ කතාවකට සාවධානව සවන් දී ඉවසා සිටීමට බැරි තරමට මේ වන විට හැම දෙනා ම මත් පැනින් දෙඩමළු වී සිටියහ.

"බලන්නකෝ මුදලාලි මේ ළමය කියන කාරණේ ඇත්තනෙ. මෙව මිනිස්ටර්ට කියන්න එපායැ." යි තවත් වෙළෙන්දෙක් කීය.

"කියනව නෙවෙයි මම වෙලාවක ඒ ළමය මිනිස්ටර් ළඟට එක්ක යනව" යි සේනාරත්න පයක් පුටුව උඩට ගනිමින් කීවේය.

එළිමහනේ අසුන්වලින් නැගිට කෑම සඳහා එන අඟර දඟර නැටුමක යෙදී වුන් තරුණ හා බාල පිරිසගේ හඬ ඇසිණි. සාලයේ ලොකු කෑම මේසයට මෙහා හරියක නැටුම විය. බිත්තිය අයිනේ තැන ඔවුන්ගේ පාවහන් පෙළට තබා තිබිණි. වැඩිහිටියෙක් ද නටන්නට ගොස් බොරුවක් කර තමා වට කර ගන්නට ආ කොල්ලන්ගෙන් කෙල්ලන්ගෙන් බේරී හඬ නගා සිනාසෙමින් ඉවතට පැන ගත්තේය.

මේසයට වටා දහයක් පහළොවක් රැස් වී සිටියහ. මම එකවර ම එහි නොගොස් දොරටුවක් ළඟ රැඳී නටන පිරිස දෙස බලා සිටියෙමි. වනගත අප්‍රිකාව පසුබිම් කොටගෙන සුද්දන් විසින් නිපදවන චිත්‍රපටියක, ඒකල අප පහත්ය, ම්ලේච්ඡ ය, අශිෂ්ට ය යි නිගමනය කළ වනචාරී නැටුම් දක්මක් පිලිබඳ මතක වහා මගේ සිතට නැගිණි.

මේ සාදයේ දී බාලයන්ට මත් පැනින් සංග්‍රහ කෙරෙනු මම නුදුටිමි. එහෙත් නටන හැම එකෙකුගේ එකියෙකුගේම දෙනෙත් මිලාන වී තිබුණේ නැටුමෙන් නැගුණු රාගයෙන් පමණක් නොව අමතරව ලද මත්පැනින් ය යිද සිතා ගැනීම දුෂ්කර නො විණි. නැටුමෙන් ම ලද රාගයක් ගැන මා මෙහි සඳහන් කළේ ඔවුන්ගේ දෙනෙතින්, මුවෙන්, දෙවුරෙන්, දෑතින් - ළැමෙන්, බඳෙන්, උකුළෙන්,දෙවටොරින් ජනනය කළේ එකම දෙයක් බැවිනි. ඔවුන් නැටුවේ "ඇඳට යමල්ලා ඇඳට යමල්ලා" යන රිද්මයෙනි.

තරුණයන් හා තරුණියන් පමණක් නොව අඟ පසඟ නො මෙරූ ළාබාලයන් -වයස අටේ දහයේ දරුවන් හා දූවියන් - ද "ඇඳට යමල්ලා ඇඳට යමල්ලා" යන රිද්මය අනුව මෙසේ නටද්දී උන්ගේ

For E-Pusthakalaya

අම්මලාත් තාත්තලාත් සොම්නසින් හා උඩඟු කමින් පිරුණු ඇස් ඇති ව බලා සිටියහ.එක අම්මා කෙනෙක් තවත් අම්මලා ඇඟිල්ලෙන් ඇඟ "අර මගෙ දූ ය" "අර මගෙ පුතා ය" යි අභිමානයෙන් කියත කල "එහායින් ඉන්නෙ මගෙ එකා ය" යි පිළිතුරු ලැබිණි.

නැටුමට හවුල් නො වුණත් සංගීතයටත් ඇ රිද්මෙටත් ගැලපෙන ගමනින් පිය නගා පැමිණි පද්මිනී.

"බඩගිනි නැද්ද?" යි මගෙන් ඇසුවා ය.

"මට තව විස්කි එකක් ඇත්නම් හොඳයි" කියන්නට සිතුණත්

"එහෙනම් කමු" යි මම කීමි.

"එන්න"

මම ඇය සමග මේසයට ගියෙමි.

"කැමති නම් අතින් ම කන්න" ය යි කියමින් ඇ මා අතට පිඟානක් දුන්නාය.

මේසයට ගොස් බෙදාගෙන කැමති තැනෙක වාඩි වී කන්නට තිබිණි.

"මේ ළමයින්ට හැබෑටම මහන්සි නැද්ද?" යි පද්මිනීගේ මව කීවාය.

"එළිවෙන කල් නටයි ඉඩ දුන්නොත්. ගිය පෝයට අපේ කාණ්ඩෙ ලීට්ල් හට් හිගිල්ල ආවෙ පාන්දර"

"අද පද්මිනී සිල් අරගෙන ද?"

"එයාට දුන් පර්මනන්ට් පාටින කෙනෙක් ඉන්නවනෙ. කොයි වෙලාවේ නටන්න බැරිද?"

"දූන් ඉතින් කෑම කන්න" ය යි සේනාරත්න කෑ ගැහුවේ ය.

නැටුම නතර විය.

රාජසේකරත් මාත් සිරිවර්ධන නම් වෙළෙන්දෙකුත් පෙරේරා නම් නිලධාරියකුත් කෑම ගත්තේ එක ළඟ අසුන්වල ය.

පෙරේරා කතා කර ගන්නට බැරි තරම් මත් වී සිටියේය. ඔහු කෑම පිඟාන අතේ තියාගෙන සිටියා මිස කෑවේ නැති තරම්.

මා හිතන විදියට අඩුවෙන් අඩුවෙන් ම බොන්නට ඇත්තේ



විස්කි දෙකකින් නතර වුණු මා පමණි. අප කෑම කන අතර වේටර්වරු දිසි අතින් ගෙන පිරිස මැදින් යමින් අඩු පාඩු පිරවූහ.

"නාම නෑ නෙ කල්‍යාණි මගෙ වැඩේ හරි ගියේ." යි පෙරේරා එහා සිටි කල්‍යාණිට කතා කර කීවේ හෝක්කාඩුවක හඬිනි. ඇය කෑම කන්නට පටන්ගෙන සිටියේ නැත.

"මොකක්ද මිස්ට පෙරේරා?"

"අනේ අනේ මතකත් නෑ. මගෙ පුතාගෙ අර වැඩේ ගැන කතා කළේ නැතෙ"

පෙරේරාගේ පුතා ගැනවත් ඔහුගේ රක්ෂාවක ගැනවත් සිහියට නගා ගන්නට තවමත් අසමත් වූ එකියෙක ලෙසින් බලා සිටි කල්‍යාණි වෙනුවෙන් වහා පිහිටට ඉදිරිපත් වූයේ ඇයගේ සැමියාය.

"කොහොමද මිස්ට පෙරේරා කල්‍යාණි කියල මතක තියා ගන්නෙ. එකක් ද? කාගෙ හරි ප්‍රමෝෂන් එකක් ට්‍රාන්සර් එකක් අයෙ ඉන්ටවිව් එකක්.ළමයි ගැනවත් බලන්න වෙලාවක් නෑ. ඔවට ඇවිදින එක තමයි" රාජසේකර කීවේ දුක් ගැනවිල්ලක ලෙසින් මා දෙස ද බලාගෙන ය.

"ඇවිදින්න දෙයක් නෙවෙයි මේක. කල්‍යාණිට සුළු වැඩක්. ටැලිෆෝන් කරන එක විතරයි.

"එහෙම තමයි හිතන්නෙ. වැඩක් කරව ගන්න හරි අමාරුයි මිස්ට පෙරේරා මේ මිනිසුන් ගෙන්. මම කතා කරන්නම්කො කොහොම වුණත් වෙයාමන්ට"

"ඇත්තමයි මුදලාලි" සිය බිරිඳ ඉවතට ගිය පසු රාජසේකර කීය. "අපි ආණ්ඩුවෙයි සංස්ථාවලයි ඔය යමක් කමක් කරන්න පුළුවන් කීප දෙනෙක් දන්න අඳුනන නිසා හරිම කරදරයක් වෙලා තියෙන්නෙ. කල්‍යාණිට නෑ බේරිල්ලක්. මම නම් ඔව බාර ගන්නෙ නෑ. එයා එහෙම නෙවෙයි. කවුරු මොනව කිව්වත් එයාගෙ හිත හොඳනෙ. සේරම ලෙඩ බාර ගන්නව. අන්තිමට හොඳකුත් නෑ"

"දූන් කාලෙ කොහෙද මහත්තය උදව්වක් කරල හොඳ නමක් ගන්නෙ"

"අපිටත් ඒකම කොහෙද මහත්තය උදව්වක් කරල හොඳ නමක් ගන්නෙ"

"අපිටත් ඒකම නෙ මිස්ට රාජසේකර වෙලා තියෙන්නෙ"පෙරේරා

Buddhika 15

සාවඥ හඬකින් කීය. "........අපිත් අපේ රාජකාරිය විතරක් කරගෙන ඉන්නව නම් කිසි කරදරයක් නෑ. අපිත් මේ යාළුකමට රෙගුලාසියාත් පිටින් වැඩ කරනව. යාළු කමට. දැන් ගිය සුමානෙ අර රෙදි තොගය ආව වෙලාවෙදි? වෙලාවට ගන්න ද මම දුවල පැනල........"

"ඒක තේන්නම් මිස්ට පෙරේරා මමත් මේ කියන්නෙ හියේ. කලානාණි මේ රටේ නැති හැමෝට ම උදව් කරන්න යනවයින් මිස්ට පෙරේරල වගෙ හිතවත් ප්‍රයෝජනවත් කෙනෙකුට වත් උදවුවක් කර ගන්න වෙලාවක් නැති එක නෙ. ඒක නෙ මම කියන්නෙ"

"නෑ රජා ඉදරේ අඬයි අනිකෙ අඬයි අපිට තේරෙනව. අපි වැඩක් කිව්වම ඒක මතකත් නෑ. ඒව හරි නෑ. මගෙ පුතාටත් ජොබ් එක ගන්න තිබුණ රුපියල් දහක් අතේ තිබ්බ නම්"

"මොකක්ද මිස්ට පෙරේර ඒ කැත කතාවෙ තේරුම?" රාජසේකර ඇසුවේ කෝපයෙනි.

"කැත කතාව! ඉතුරු ටික මම කියන්නෙ නෑ" යි කියමින් රාජසේකර ඇසුවේ කෝපයෙනි.

"ඒ ඒ මහත්තය කැව නම් බිව්ව නම් අපි ඒ විදිහට.........."

"කැත කතාවෙන් බාගයයි මම කිව්වෙ. අනිත් ටිකත් අහගන්න ද ඕනෑ"

"මහත්තය වාඩි වෙන්න"

අසල වූ කනපුටුවක් මත අවසන් නුවූ පිඟාන තැබූ පෙරේරා හැන්දක් ගෑරුප්පුවත් ඒ මත දැමීය. පිඟන් ගැටිටේ වැදී ගෑරුප්පුව පළසටත් හැන්ද ලැල්ලටත් විසී විණි.

"මිනිස්සුන්ට හිතිය පළියට සේරම කරගන්න බෑ. තේරුණා ද? අපිත් ඕනෑ. ඩිපාට්මන්ට්ස්වල වැඩ කෙරෙන්න අපි අතින්. අපේ උදව් නැතුව ඒ ගොල්ලට"

"හරි හරි. නෑ කිවුවයෑ? වාඩි වෙන්නකෝ "

ඔම් වන විට පෙරේරාගේ හඬ තව තවත් උස්සන්න විය.

සාලයේ තැන තැන වැඩි වී සිටි අයගේත් කෑම දිසි රැගෙන ඔවුන් වෙත යමින් අඩුපාඩු පුරවමින් සිටි සේවකයන්ගේත් අවධානය අප සිටි සේවකයන්ගේත් අවධානය අප සිටි තැනට යොමු විය.

"මොක ද මොක ද?"



"කවුද?"

"ඇයි කතාව?"

පෙරේරා නිහඬ නොවීය. අසල කෑම කමින් සිටි අනෙක් අය ද මුලදී කර ඔසවා බලා, පසුව කීප දෙනා බැගින් අප සිටි තැනට ළං වූහ. සිදු වූයේ කුමක් දැයි හැමෝම එක වර ප්‍රශ්න කරන්නටත් කතා කරන්නටත් ගියෙන් සාදය නැවත ගාලගෝට්ටියක් බවට පත් විය.

අන්තිමට පිරිස සන්සුන් වූයේ පෙරේරා බිරිඳත් දූවරු දෙදෙනාත් සමග පිට ව ගියායින් පසුව ය. මේ අප්‍රසන්න ජනක සිද්ධියේ බරෙන් නිශ්ශබ්ද වූ අය සිදු වූ දෙයක අග මුල සොයන්නට යළි රහසින් කතා කරන්නට පටන් ගත්හ.

ඉතිරි අමුත්තෝ ද බලාපොරොත්තු වුණාට කලින් පිටත් ව ගියහ සමහරෙක් ගියේ කෝපි බීමටවත් නො සිට ය. තවත් ටික වෙලාවක් එහි රැඳෙන්නට මට සිදු විය. පිට උදවිය ඉවත් වෙත්ම ගෙදර අය නැවතත් කතා කරන්නට පටන් ගත්තේ පෙරේරාගේ සිද්ධිය ගැන ම ය.

"මට දුක අරුමැක්කෙ මේ ළමයත් හාපුරා කියලා ආව දවසෙම......." පද්මිනීගේ මව මා දෙස බලා කීවාය.

"කමක් නෑ දැන ගන්නත් එක්කල හොඳයි" පද්මිනී මට වඩාත් ළං වී කීවාය.

"මොක ද මේ අමුත්තක් යෑ?" යි තරහෙන් මෙන් කීවේ විපුල ය."හැමදාම ඔහොමනෙ. පාටියක් ඉවර වෙන්නෙම බකට් එකකින් ඇයි. ඉතින් තාත්තට තියනවනෙ නටන සල්ලි"

"එහෙම යෑ ළමය. උදවුවක් ගන්න ඉන්න මිනිස්සු. ඉඳල හිටල සංග්‍රහයක් කරල........"

"හරි තාත්ත. අපි නිකම් පිනට උදවු ගන්නෙ නෑ නෙ උන්ගෙන්. අපි ඔය මොන වැඩක් කළත් ගාන දීල ඇති තරියට. තව උන්ට බොන්නත් දීපල්ල. අන්තිමට බැනුනුත් අහනව"

මොකක්ද ඔය අද කතාවෙ මුල?"

"නෑ මමයි නිමලුයි පෙරේරයි අතන කෑම කන කොට........" රාජසේකරට කියා ගත හැකි වූයේ එපමණකි.

"නෑ තාත්තා එයයිගෙ පුතා ජොබ් එකක් ඉල්ලල තියෙනව. මට

Pot E-Pusthakalaya
Buddhika

For E-Pusthakalaya

ඒ ගැන බලන්න කිව්ව. මම ඒ ගැන වෙයාමන්ට ටැලිෆෝන් කරන්න ඉන්න කොට කබ්රාල් අංකල් කිව්ව ඒ කොල්ල අනෙක් පැත්තෙ එකෙක්ලු. පෙරේර දන්නෙ නෑ පුතා ගැන"

"පෙරේර නොදන්නවට සැම් කිව්වම නම් ඇත්ත වෙන්න ඇති" යි කීවේ මව ය.

"මෙකෙදි විතරක් නෙවෙයි හොඳට මතක තියා ගන්න ඕනෑ. විරුද්ධවාදියකුට විතරක් උදවුවක් කරන්න එපා. අන්තිමට කාගෙවත් ඇඟට නෙවෙයි මගෙ ඇඟට මිනිස්ටර්ල එන්නෙ"

"ඒක තේන්කම් අර සැම් දෙවියෙක් වගෙ නොහිටින්න ලොකු දූ ඔකත් කරල දෙනව"

"කබරය නොහිටින්න ලොකු අක්ක ගස්" ය යි නාලිනී කිවේ ඕය මවට නො ඇසෙන තරම් පහත් හඬිනි.

"පෙරේරගෙ නෝන" මෙරාය සේනාරත්න නැවත පටන් ගත්තාය."......ආව වෙලාව ඉඳල කණක් ඇහිල ඉන්න නෑ මගෙ ළඟම කැරකි කැරකි අනේ කල්‍යාණිට මතක් කරන්න මේ වැඩේ ගැන කිය කියා......"

"අනේඅර දූල දෙන්නගෙ තියන ආඩම්බර. නටන්නත් ආව නව. ස්ටෙප් එකක් ගන්න දන්නෑ......" නාලිනී, පෙරේරගෙ දූල දෙදෙනාගෙන් පටන් ගත් මේ කතාවය අක්කලාත් අම්මාත් එකතු වී වේලාසන පැමිණ සිටි අනෙක් කාන්තාවන් ද යුවතියන්ද ඇදගෙන උන්ගේ ඇද කුද විවේචනයෙහි යෙදී විනාඩි කීපයක් ගත විය.

"පෙරේරා කිව්ව කට කැඩිච්ච කතාවක්. මම මේ ගෙදර නිසා ඉවසුව...."

"මොකක්ද රාජ ඒ?"

"නෑ මේ......"

"උං කියනව. උං කියනව...... මේ රුපියල් දහක් අතට දුන්නනම්......"

"මොන්මොනව?" කල්‍යාණි තමා ළඟ සිටි නැගණියකගේ උර හිසට අත තබා පසෙක කරගෙන සැමියා වෙත ඉදිරියට එමින් ඇසුවාය. ඇයගේ බැල්ම හා ගමනම අභියෝගයකි. "මොකක්ද උං කිව්වෙ? ආයෙත් කියන්න බලන්න"



"නෑ ඉතින් මම ඒ වෙලාවට........" රාජසේකර සිය බිරිඳගේ කෝපයෙන් දැවෙන දෙනෙත් මඟ හරිමින් කීය.

සැමියාට තවත් ළංවූ කල්‍යාණි බිමට නැඹුරුව තිබුණු ඔහුගේ මුහුණ පොඩි ළමයකුගේ මෙන් නිකටින් අල්ලා තමා වෙත හරවා ගත්තාය.

"උං මූණටම ඔයාට ඔහොම කිව්වම ඔයා කරබාගෙන අහගෙන හිටියා! නේද? බලන්නකො අයිය මෙයත් පිරිමියෙක්ද ?"

කල්‍යාණිගේ අත සැමියාගේ නිකටින් ගිලිහුණේ පිළිකුලෙනි.

"නංගි දන්නෙ නැද්ද රාජගෙ හැටි හැබෑටම? ඔළුවට අත තේද්දුවත් රාජ කරන්නෙ ඉවසන එක. ගෙදරදිය කියල බලන්නෙ නැතුව අරූට කණට දෙකක් දුන්න නම්"

"අනේ මොනාටද මට ඇහුණ නම්"

"නෑ දූව ඕව මොනවද. ඒ මිනිහ බිල"

"බිව්ව නම් උං බිව්ව විදිහට ඉන්න ඕන නේද? යි දැතින් ම සරම දණ තෙක් ඔසවා ගනිමින් පුටුවෙන් නැගිට ගත් සේනාරත්න බිරිඳ දෙසට හැරී කීවේ කලින් සිටම පැවැති තරහක් ඇත්තකු ලෙසිනි. "නිකම් ලැබුණු පළියට කණමොද වාගෙ බිල පුළුවන්ද මගෙ ගෙදරදී මගේ දරුවන්ට අපහාස කරලා යන්න? පරබල්ලා මිනිස්ටර්ට ටැලිෆෝන් කරලා මම ඕකව හෙටම යවනවා කන්කසන්තුරේට"

"ඕකව අරින්න තියෙන්නේ ගෙදර"

"තාත්ත උං කන්කසන්තුරේ යවන්න ඕනැත් නෑ. අයිය ගෙදර යවන්න ඕනැත් නෑ. පෙරේරට කරන දේ මම බලාගන්නම්. ඔය දෙන්නත් කථා කරන්නෙ සිහියෙන් නෙවි. දැන් කිව්වට හෙට වෙනකොට දෙන්නටම මතක නෑ ඔය මුකුත්. හැබැයි මම එහෙම නෙවෙයි" කී කල්‍යාණි සිය සැමියා දෙසට නැවත හැරී මඳක් රවාගෙන සිටියේ. 'හොඳයි උඹත් යමන්කො ගෙදර' යි යන තරවටුව ඇති ව ය යි මට සිතිණි.

"අද රාජයියට ගෙදර ගියාම දෙහි කැපිල්ල ලැබෙයි." ය යි නාලිනී මගේ සිහිවිල්ල නිවැදී බව ඔප්පු කරමින් උරහිස් නටව නටව කීවාය.

Suddhika 15

# 18

නෙමිසක පමණ ඇසුරකින් පසුව පද්මිනීගේත් මගේත් විවාහය සඳහා දින නියම විය. ඇය මේ මුළු කාලය දිගටම හැසිරුණේ අප දෙදෙනා මෙම ආත්මයේ දී ද අඹු සැමියන් වශයෙන් නැවත එකතු වීමට සංසාරය දිගටම පතාගෙන පැමිණි බවට හැඟීමක් මගේ සිතෙහි තහවුරු වන අන්දමට ය.

සමාජ තත්ත්වය හා වත්පොහොසත්කම අතින් කවර පරතරයක් තිබුණත් සිතුම් පැතුම්, අදහස් උදහස්, රුචි අරුචිකම් හා හරයන් අතින් අප දෙදෙනා අතර විරල විදියේ සමානකමක් ඇතැයි ඇයගේ හැම වචනයකින් ම බැල්මකින් ම ක්‍රියාවකින්ම මට දිගට ම ඒත්තු යන්නට විය.

මගෙන් ඉගෙන ගත් ශිෂ්‍යාවක ව සිටිය දී ඇය මා තුළ පැවැති හැඟීම් ආපසු මතක් කර ගත නොහැකි තරමට අතීතය තුළ වැළලී යන්නට විය. අතීතය නගන සත්‍යයෙයන් යුතුව මා ඉදිරිපිට මැවුණේ එක් මොහොතට පමණි. එද පද්මිනී නොව කුසුම් සම්බන්ධව කරගෙනය.

උත්සව කටයුතු සිදු විය යුතු ආකාරය ගැන මගේ ස්වාධීන මතයක් ඉදිරිපත් කරන නිදහසක් ලබා ගැනීමට වුවමනාවක් පවා මට නොවිණි. මම ඒ අංශ ගැන නො තැවුණෙමි. මට ම හතුරකු ව සිටි සිත කුරුල්ලකු මෙන් නිදැල්ලේ යමින් තිබුණු ඒ මාස කීපය ඇතුළත මම එක පැත්තකින් අම්මාත් අනෙක් පැත්තෙන් පද්මිණී හා ඇයගේ වැඩිහිටියනුත් කරන හැම යෝජනාවකට ම හදවත් නැත්තකු සේ එකග වීම්.වඩාත් නිවැදිව කියතොත් යටත් වුණෙමි.

පෝරුවේ සිරිත් විරිත් හා මධු සමය ආදී හැම දෙයක් ම සේනාරත්නලාගේ සිතුම් අනුව සංවිධානය විය. හෝටලයේ උත්සවයට කලින් දවසේ ගමේ අසල් වාසීන් හා සමහර නෑයන් ගෙදර කැඳවා සංග්‍රහයක් කළ යුතු බව අම්මාගේ පමණක් නොව තාත්තාගේත් ආශාව විය. නියම "මගුල් ගෙදර"වශයෙන් ඔවුන් අගය කළේත් එය යි. දින ගණනක් තිස්සේ වී තම්බා වේළා කොටා, දර පළා, මඩු සාද, කැබිලි පෙට්ටි සකස් කර මහත් ව්‍යායාමක යෙදීම අම්මාට විශාල සතුටක් විය.

කිසියම් අවශ්‍යතාවයකට කොළඹ ගොස් මා සවස ගෙදර පැමිණියේ මෙසේ මහත් කලබල ස්වාභාවකින් අසල්වාසීන් ද සමග



අම්මා කැබිලි පෙට්ටි සුදනම් කිරීමට යොදගෙන තිබුණු දවසක සවස් කාලයේ ය. ගෙමාලයා මා වුව ද මේ කිසිවකට මගෙන් ඉටුවිය යුතු වැඩ කොටසක් නොවුණ අතර අම්මා මගෙන් එවැන්නක් බලාපොරොත්තු වූයේ ද නැත. ඇත්ත වශයෙන් උත්සවයේ මෙම අංශය මගේ නොව අම්මාගේ ය.

මා කාමරයේ ඇඳුම් මාරු කරමින් සිටින අතර, පිටු පස බරාදය දෙසින්, සෙතරත් හෝ ගාමිණී හෝ පවුලේ වෙනත් කෙනෙකු හෝ සමඟ කතාබහේ යෙදෙමින් ඇය නැගූ සිනා හඬ මට ඇසුණේ මගේ සිත වහා දවමිනි. අවුරුදු ගණනකින් මගේ සවනත වැටී නැති ඇයගේ සිනා හඬ අන්තයවත් එහා තැනෙක සිට පැමිණි එකක් ලෙස හැඟෙන්නට විය. එහෙත් හදවතට එය කෙතරම් සුපුරුදු ද? දෙවියනි. මේ සිනාසෙන්නී කුසුම්ය.

එතැන් සිට මා දිගට ම හැසිරුණේ ආත්මයකින් තොර එකකු මෙනි. පද්මිනීත් ඇය හා තවත් දින කිහිපයකින් සිදු වීමට යන විවාහයත් හැම එතැනින් ඇරඹෙන සමස්ත අනාගතයත් යන සියල්ල කුසුම්ගේ සිනා හඬ විසින් සිතෙහි නගන ලද ප්‍රීති දල්වලින් මොහොතකදී දවා හරිනු ලැබිය. මිය ගිය බවට ම විසින් සිතන ලද අතීතය ඒ ගින්නෙන්ම නැවත ප්‍රාණය ලැබී ය. අපගේ නිවසට ගෙවැදීම නිමිත්තෙන් පැවැති උත්සවය සඳහා සූදනම් වෙමින් සිටි දවස් කීපය මට වහා සිහිපත් විය. නිවසෙහි අද පරිසරය එම අවස්ථාව හා කෙතරම් සමීප ද? කුසුම් පැමිණ නො සිටියත් වටපිටාවේ මෙම ස්භාවය විසින්ම වුව ද මට යටගියාව මතක් කර දිය යුතුව තිබිණි.

අන්තිමට මම ඇය දුටුවෙමි. මා ළිඳ ළඟට ගොස් මුහුණ සෝදගෙන එන විට ඇය රෝහණ සමග කථා කරමින් බරාදයේ සිටියාය. ඇය නිසා මගේ සිත දස දහස් වර දැවී ඇත. එහෙත් - එහෙත් කලකට පසු මෙසේ ඇය දකින්නට ලැබුණු අවස්ථාවේ මගේ සර්වාංගය වෙළා ගත් අන්දමේ ගින්දරක් මට ජීවිතයේ ඉන් පෙර හෝ පසු ව හෝ කිසි විටෙක දැනී නැත.

රෝහණ හා කතාව වහා නතර කළ කුසුම් ඇසිපිය නො හෙළා මා දෙස බලා වුන්නාය. නෙත් ගතියකින් යුත් ඒ දෙනෙත් විෂ ධූමයක් මෙන් මා වෙත වෛරයක්, ද්වේශයක් හෝ ක්‍රෝධයක් පිට කළේ නම් මට ඇයය සමාව දිය හැකි ව තිබිණි. ඒ වෙනුවට ඇයගේ නිර්මල නුවන් පුරා පිරී තිබුණේ අපගේ සම්බන්ධයේ ඉතාම සුන්දර අවදියේ දී වත් දක්නට නො ලැබුණු තරම් දැඩි සෙනෙහසකි. දයාවකි. ආදරයකි

For E Pusthakalaya

හා කරුණාවකි. සියල්ලට වඩා කුසුම් හදවත් වඩා සුන්දර ය. රුමත්ය

මම අප්‍රාණික ව කාමරයට වැදුණෙමි. හදවත දවන අග්නිය නිවස ස එහි වූ සජීවී - අජීවී සියලු වස්තූන් ද භෂ්ම වන ලෙස පිට කර ගැනීමේ වුවමනාව දැඩි පීඩනයක් මෙන් මට දැනෙන්නට විය.

කුසුම් හා ඇයගේ පවුලේ උදවිය ඊ කෑමට ද නාභර වූහ. ඇය, ළමා වියේ සිට අවුරුදු ගණනක් හුරුපුරුදු තැනක් වන අප නිවසෙහි ඉවුම්පිහුම් ඇඳි කටයුතුවල තමන්ගේ කමකින් යුතුව යෙදී සිටිනු වැඩිපුර එළිපෙහෙළියට නො පැමිණියත් මම දුටුවෙමි. අන්තිමට මා ඇය කාමරයට කැඳවා ගත්තේ කුමක් කියන්නට දැයි පැහැදිලිකමක් මා තුළ නො විණි. මට වුවමනා කළේ ඇයට දෙඩන්න වය. ඇයට යමක් පැහැදිලි පැහැදිලිකමක් මා තුළ නොවිණි. මට වුවමනා කලේ ඇය හා දෙඩන්නටය. ඇයට යමක් පැහැදිලි කර දෙන්නටය. මාත් පද්මිනීත් අතර විවාහය මඟ පෑදුණේ කෙසේ ද යි ඇයට විමතියක් ඇති බවට කිසිදු සැකයක් නැත. ඇය පාසලෙන් අස් වූ විගස පද්මිනීත් මාත් අතර ඇසුරක් අලුත් මුහුණුවරකින් හටගෙන එහි ප්‍රතිඵලය හැටියට මෙම විවාහය තීරණය වන්නට ඇතැයි හැඟීම ඇය තුළ පවතින්නට ඉඩ ඇත. සිදු වූයේ කුමක් දැයි ඇයට කිව යුතුව ඇත. ඇයට සැනසිමක් ලබා දීමට හොවේ. මගේ ආත්මාර්ථකාමී සිත බරකින් නිදහස් කර ගනු පිණිස ය.

කියන්නට බොහෝ දේ තිබුණත් මට කිසිත් කියා ගත නොහැකි විය. මට කුසුම් අහිමි වූවා ය. ඒ අම්මාගේ බලපෑමෙනි. එහෙත් මා පද්මිනීගේ ඇසුරට වැටුණේ වැඩිහිටියන්ගේ වුවමනාවක් උඩ නොවේ. මා කුසුම්ට අහිමි වුණේ තමාගේ ම වරදිනැ යි ඇයට කීමේ අයිතියක් දන් මට නැත.

ඒ අන්තිම මොහොතේත් ඇය හැසුරුණේත් කතා කළේත් දෙමාපියන්ගේ මතය නොතකා විවාහ වෙමු යි මා නැවත නැවතත් කළ යෝජනාව ප්‍රතික්ෂේප කිරීමෙන් තවමත් පසුතැවිලි නොවන - දැඩි ආත්ම විශ්වාසකින් යුත් එකියක ලෙසිනි.

"කුසුම්ට කියන්න බොහෝ දේවල් තියෙනවා" යි මා දුබල ලෙස කියන විට " මම ආවෙ ඒව අහන්න නෙවි" යි ඇය ස්ථිර සාර හඬින් කීවේ මුළු අතීතය ම ඇ පයින් පාගාගෙන ය යි මට හැඟිණි.

"මම ආවේ ඔයාට සුභ පතල යන්න....... මගෙ ගමන නිරපරාදේ වුණාය කියල හැඟීමකින් මට ආපහු යන්න ඉඩ තියන්න එපා... විශ්වාස කරන්න! මම ඔයාට සුබ පතන්නෙ බොහොම පිරිසිදු සිතින් අවංකවමයි"



අවංකව! අවංකකමට සීමා පැනවිය හැකි විණි නම් කොපමණ හොඳද? අපගේ සම්බන්ධයේ කිසියම් අවස්ථාවක දී අවංකකමට සීමා බන්ධන දැමීමට කුසුම් සමත් වුණා නම් අපේ ඉරණම මුළුමනින් ම වෙනස් කළ හැකි ව නොතිබිණි ද?

"මම එදුට එන්න ඕනෑ ද?"

"මම ඒක කොහොමද කුසුම්ට කියන්නෙ?"

"මම දන්නෙ නෑ. ඔයා කියනවනම් මම එන්නම්"

"ඔයාට එන්න පුළුවන් ද?"

"ඇයි බැරි? මට පුළුවනි"

"එහෙනම් ඒක මට ලොකු සතුටක් කුසුම්"

"මට ලොකුත් ඒකයි. ඔයාගෙ සතුට, ඔයාගෙ යහපත.......... මම හෙට එන්නම්"

ස්ත්‍රී භාවයේ ඒ උදාරත්වය ඉදිරියේ මම තව තවත් වෙල හීන වීමි.

පද්මිනී සේනාරත්න විවාහ කර ගත් මම මධු සමය ගෙවා, ඇයගේ නෑයන් ද පිරිවරා එක් පෝය දක අපේ නිවසට පැමිණියෙමි. චාරිත්‍රයක් ද හැටියට මගේ පවුලේ උදවියත් සමග ඊළග දා ඇයගේ දෙමාපියන් බැලීමට යන්නට අපට සිදු විය.

ඒ. අම්මාත් තාත්තාත් "සේනාති" නිවසට ගිය දෙ වන අවස්ථාවය. මුලින් පද්මිනීගේ පියා කියා සිටි පරිදි සිරිතක් හා සම්මතයක් වශයෙන් විවාහයට කලින් එක් වරක් මගේ දෙමාපියන් ඔවුනට මුණ ගැස්වීමට මට සිදු විය. සවස් වරුවක ගිය අපි ඒ අවස්ථාවේ පැයකට වඩා එහි ගත නො කළෙමු.

"හිතන්න බැරි තරම් ඉහළ තැනක් ය." යන හැඟීම විනා සේනාරත්න පවුල මෙතරම් තත්ත්වයක වන්නට ඇතැයි ඔවුන්ගේ සමාජ මට්ටම හා ධනවත්තම ගැන ප්‍රමාණයක් සිතින් තක්සේරු කර ගැනීමට තරම් ධනවතුන්ගේ ලෝකය හා ජීවිතය ගැන අවබෝධයක් වත් අත්දැකීමක් වත් අපේ මව්පියනට නොවිණි. දෙවොලකට මෙන් ඒ සුවිසල් මැදුරට ඔවුන් ඇතුළු වූයේ භක්තියත් බිය හා චකිතයත් මිශ්‍ර හැඟීමෙන් කැළැඹුණු සිත් ඇති ව බව මුහුණුවලින් ම පළ විය.

විවාහ වූ ද සිට මෑතක් වන තුරු අවුරුදු ගණනක් තිස්සේ

Sadhika 23

For E-Pusthakalaya

තමාගේ කුඩා කඩයේ එහාටත් මෙහාටත් දිකෙට සැතපුම් ගණනක් වන්නට ඇවිදීමෙන් ගොරෝසු වුණු දෙපා, සුවපහසු ගෙන දෙන පළස මත හැරෙන ලෙස පරිස්සමින් තබමින්, අම්මා ඔවුන්ගේ විශාල විසිත්ත කාමරයට ඇතුළු වුණේ බයාදුකමින් හා පරිස්සමිනි. සේනාරත්න යුවළ වෙනසක් නො පෙන්වා සාදරයෙන් ඔවුන් පිළිගත්ත, එහෙත් මගේ දෙමාපියන් කතාබහට හවුල් වුණේ තමන්ගෙන් පිට වන කවර හෝ වචනයක් අනුචිත වේ දැයි බියෙන්, සැකයෙන් හා ප්‍රවේශමිනි.

දෙපක්ෂයේ වැඩිහිටියන්ගේ සමඟ වෙන - වෙන ම සාකච්ඡා කර, ඒ වන විට විවාහය පිළිබඳ දින හා නැකැත් ඇතුළු සියලු කටයුතු මෙදිනට තිබුණේ ඒවාට පොදු එකඟත්වයක් පළ කිරීමත් ඔවුනොවුන් දැන - හැඳින ගැනීමත් පමණි.

මධු සමයෙන් පසු ව ගිය අවස්ථාවේ දවල් කෑමට නතර නොවී බැරි විය. අපේ පවුලේ අය අසරණ තත්ත්වයකට වැටීම වලකනු පිණිස - නැතහොත් අසරණ ව ගෙවෙන කාලය හැකි තරම් කෙටි කරනු පිණිස මා සිතා මතා එහි ගියේ හරියට දවල් කෑම වෙලාව ආසන්නට ය. පද්මිණී එද අම්මා හා තාත්තාත් තම මල්ලිලත් තම නිවස පුරා හැම තැන ම කැඳවාගෙන ගියා ය.

ඔවුන් එහි විසිතුරු බලමින් ගියේ කෞතුකාගාරයක් - පැරණි පන්සලක් පළමු වරට නරඹන පිරිසකගේ කුහුලත් විස්මයත් ඇති ව ය. පද්මිනී එසේ කළේ නැදිමයිලනට හා මස්සිනාලාට ස්ථානය හුරුපුරුදු කර වීමට ද නැතහොත් තම ජීවිතයේ ශ්‍රී විභූතිය ගැන හැඟීමක් ඔවුන් තුළ ඇති කරවීමට ද යි මම නො දනිමි.

අප එද ආපසු එන්න කලින් කොල්ලුපිටියේ කල්‍යාණිගේ නිවසට ගියෙමු.

විළඟ දින කිහිපය ඇතුළත නෑගම් වශයෙන් යන්නට තැන් ගණනක් තිබිණි. අපට වැඩිපුර නෑයන් නො සිටියත් මංගල්‍යය අවස්ථාවේ තොරණ බැඳ මහ ඉහළින් අප පිළිගැනීමට හා තත් අයුරින් ආධාර කිරීමට මූලික වූවන්ගේ නිවෙස්වලට හෝ යා යුතුම විය. සමහර තැනකට අප ගියේ කෑමකටය.

එසේ ආ ගිය තැන්වල දී පද්මිනී කිසිවකු සමඟ වැඩිපුර කතා බහකට නො යෑම එක අතකට ගණන් ගත යුත්තක් නො විණි. ඒ කාලයට මනමාලියන්ගේ ගතිය යි කෙනෙකුට සිතන්නට පුළුවන් වූ බැවිනි.එහෙත් ඇය ගෙදර දී හැසිරුණු අකාරයෙහි ද ... නොවිණි. මා හා කාමරයට වී කාලයෙන් වැඩි කොටස ගත

Buddhika 25



ඉන් පිටතදීත් කාලයේ ඉස්තෝප්පුවේ හෝ කෑම මේසයේ දී අනෙක් අය අප සමඟ සිටියදීත් කතා කළේ මා සමඟ පමණි. පාසලේ දී අනෙක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉදිරිපිට දී වුවත් ඇසුරත් සංවාදයත් තමාට පමණක් සීමා කර ගැනීමට ඉංග්‍රීසිය උපයෝගී කර ගත් විදියට ම ගෙදරදීත් ඇය කතා කළේ ඉංග්‍රීසියෙනි. අම්මාගේ හා තාත්තාගේත් මල්ලිලාගේත් යහපත සඳහා පමණක් නොව ඔවුන් බිරිඳ වෙත ළං කරන්නට නැතහොත් ඔවුන් ඇයගෙන් ඈත් වීම වැළැක්වීම අප දෙදෙනාට පමණක් සීමා නොවුණු මාතෘකාවක දී මම සිතාමතා ම හැම තැනදී ම සිංහලෙන් කතා කරන්නට ගියත් ඇය මා සිංහලෙන් කියන දෙයටත් හවුල් වුණේ ඉංග්‍රීසියෙනි. දෙපක්ෂය එක තැන් කර තබා ගැනීමේ ප්‍රයත්නයක් වශයෙන් එක ම දෙය දෙබසින් ම කියන්නට නොයෙක් විට මට සිදු විය.

"ඒ ළමයට සිංහල කතා කරල පුරුද්දක් නෑ" යි කියා සැනසෙන්නට හෝ ආඩම්බර වන්නට හෝ අම්මලා සමත් වුණා විය හැකිය.එහෙත් ඇය ගෙදර දී ඉංග්‍රීසි නොදන්නා සිය දෙමාපියන් සමඟ අපූරුවට මව්බසින් දොඩන සැටි මතක් වන කල මගේ සිත වේදනාවකට පත්වීම නො වැළැක්විය හැකි කරුණක් විය.

ඒ වේදනාව ආරම්භයක් වුණා පමණකි.

සිය භාෂා මාධ්‍යය වෙනස් කර ගන්නා ලෙස පද්මිනීට අවවාද කරනු වෙනුවට තත්ත්වය මග හැර යන්නට මම පෙලැඹුණෙමි.

ගෙදරට පැමිණ සතියක් ගත වන්නටත් කලින්, නිවාඩුව අවසන් වීමට තිබුණු ඉතිරි දින කීපය කොළඹ බිරිඳගේ නිවසෙහි ගෙවා දමන්නට මා සිතා ගත්තේ ඒ අනුවය.

"ඒක හොඳයි" අම්මා මගේ අදහස අනුමත කළාය. "......අර මාළිගා වගෙ ගෙවල්වල ඉඳල කොහොමද හැබැට ම ඒ ළමය මේ වගෙ තැන්වලට පුරුදු වෙන්නෙ එක පාරට ම. ලයිට් නෑ. නාන කාමර නෑ.මොකුත් නෑ නෙ. කුමාරියො වගෙ හිටිය ළමයි නෙ"

අම්මාගේ වචන ඇය කෙරෙහිත් බිරිඳ කෙරෙහිත් දෙවරකට දෙව්දියක අනුකම්පාවක් මා තුළ ඇති කළේය.

"මෙවැනි ගෙදරක ඉන්නෙ කොහොමද?" යි පද්මිනී දුක් ගැනවිල්ලක් නැගුවේ හෝ කෙඳිරි ගෑවේ හෝ නැත. එහෙත් ඇය අපේ නිවසේ දී හැසිරුණේ බිරිඳක විදිහට මිස ලේලියක හෝ නෑනා කෙනෙකු හෝ වශයෙන් නොවේ.

For E-Pusthakalaya

සේනාරත්නලා කතා කරන්නේ මැති ඇමතිවරුන් හා රජයේ උසස් නිලධාරීන් තමන්ගේ සාක්කුවේ නැතහොත් තමන් ඔවුන්ගේ සාක්කුවල ය යි අහගෙන ඉන්නා කෙනෙකුට සිතා ගත හැකි වන අන්දමිනි. ඒ පවුලේ බලතල අනුව මට නාගරාසන්න පෙදෙසකට මාරුවක් ලබාගැනීම පහසුවෙන් කර ගත හැකි ව තිබිණි. ඇත්ත වශයෙන්.

"ලොකු දූ නිමල්ව මය මය කාට හරි කියල ළඟ තැනකට ද ගන්න බලන්නකෝ" යි මට කීවේ විවාහයටත් කලිනි.

"හදිසියක් නැහැ. පද්මිනීත් ඒ පළාතෙත් ඇවිදල හෙම ආවට පස්සෙ බලමුකෝ." යි මා කීවේ පද්මිනීගේ මුහුණ බලාගෙනය. කතාවක් නැතිව පෑ සිනාව මගේ අදහස අනුමත කිරීමකැ යි සිතන්නට මම වෑයම් කළෙමි.

දේශපාලන හිතවත්කම් උඩ පත්වීම, උසස් වීම් හා පහසු තැන්වලට මාරුවීම් ලබා ගත් රජයේ සේවකයනට මැතිවරණයකින් පසුව අත්වන ඉරණම පිළිබඳ කතාන්තර රජ රට වැනි දුෂ්කර පළාතකදී ඕනෑ තරම් මට අසන්නට ලැබී තිබිණි. කුමන ආණ්ඩුවක් යටතේ වුවද බාධාවක් නැති ව සේවය කල හැකි වන පරිදි රජයේ නිළධාරියා දේශපාලන සබඳකම් වලින් මිදී සිටිය යුතුය යනු මේ වන විටත් මගේ හැඟීම ව තිබිණි. ඒ නිසා මම ඔවුන් ලවා මාරුවක් ගන්නට පසුබට වීමි.

එක වර ම කොළඹ කිට්ටුවට නො එන්නට මා අදහස් කළේ තවත් කරුණු කීපයක් ද උඩය.

ආත්මය මිය ගොස් තිබුණත් අඩු තරමින් එහි අවතාරය සිතෙහි හොල්මන් කරන අවස්ථාවක දී හෝ පද්මිනීගේ තත්ත්වයට පැවැත්මට හා සුවපහසුවට සරිලන පරිදි මා තැන් මාරු කරන්නට හෝ වෙනස් වන්නට හෝ යෑම් අවසානයක් නො පෙනෙන - කොයි මොහොතේ අතරමං විය හැකි දුයි කිය නොහැකි - මඟකට පිවිසීමකැ යි මට පෙනී ගියේය.

සේනාරත්නලාගේ ලෝකයෙන් පද්මිනී ඉවත් කර ගන්නට එහි මාස කීපයක් හැසිරීමේ පළපුරුද්ද හා අත්දැකීම් ඇති මට වුවමනා විය. මුල දී එය අධ්‍යාත්මික හා මානසික වුවමනාවකට වඩා භෞතික හා ආර්ථික වුවමනාවක් විය.

මනාලයා වශයෙන් මා සහභාගී වූයේ සුළු පටු මඟුලකට නොවේ



මනාලියට හා සහෝදරියනටත් ඇයගේ යෙහෙළියක් ලෙස පෙනී සිටි තරුණියන්ටත් ඇඳුම් ද සුවඳ ද විලවුන් ද ගෙන්වා ගනු ලැබුවේ එංගලන්තයෙනි. ඇඳුම් මෙන් ම ශීතකරණයක්, ටේප් රෙකෝඩරයක්, ඕනෑ නම් මෝටර් රියක් වුවද පිටරටින් ගෙන්වා ගැනීම ඔවුනට අපහසු කාරියක් නොවිණි. කල්‍යාණි සාරි තොගයක් ගෙන ඒමට සිංගප්පූරුවට හෝ බොම්බායට හෝ යන්නට කතා කරන්නේ අපේ අම්මලා සිකුරාද පොළට යමු යි කියන තරම් සැහැල්ලුවෙනි. විනිමය හෝ රේගු නීති රීති හෝ ඔවුන් ඉදිරියේ බාධක නොවිණි.

මේ තත්වයට ගැලැපෙන පරිදි වැඩ කළ යුතුය යි තරගයක් පිළිබඳ හැඟීමක් සිතට ගන්නට පවා අයිතියක් වත් පුළුවන්කමක් වත් මට නො වුණත් යන්තමින් හෝ ගැලපෙතැයි සිතුණු විදිහට වැඩ කිරිමේදී විවාහය සඳහා ඔරොත්තු නොදෙන තරම් මුදලක් මගෙන් වැය විය.

ඒ විවාහය යි.

ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතයත් ඊට වෙනස් නොවිණි.මසකට වරක් පිටින් කැම බීම ද සංග්‍රහ කිරිමට සේවකයන් ද ගෙන්වා විස්කි ද ඇතිව පවැත්වෙන සාදයකි.

සතියකට වරක් කොළඹ හෝටලයක රෑ කෑමට යා යුතුය. සති කීපයක් ඇර දවසක මීගමුවේ, අලුත්ගම, බෙන්තොට හෝ උස්වැටකෙයියාවේ මුහුදේ නා සංචාරක හෝටලයක කා බී නටා දවසක් ගත කළ යුතුය. කොලඹට එන හැම පින්තූරයක් ම නො බැලීම මදිකමකි.

විපුල හෝ කල්‍යාණි හෝ අද මටත් පද්මිනීටත් පිට තැනක දී කෑමකට ආරාධනා කළොත් මා එතැනින් පිට විය යුත්තේ ඊළඟ සතියේ මගේ ගණනේ දිනය නියම කරගෙනය.

දයාදය සඳහා සෑහෙන දෙයක් මට ලැබිණි. මුදලින් දෙන කොටස තැන්පත් වූයේ පද්මිනී නමිනි. දේපලින් ආදායම් එක වර අප අතට ආවේ නැත. මා නමින් ලැබුණේ අලුත් ම ඔස්ටින් රථයකි.මේ හැර ගෙදර දෙර වියදම් සඳහා මසකට මුදලක් පද්මිනී අතට එන්නට පියා කටයුතු යොදා තිබුණේය.

ඉස්සර නම් මෙය මට ලොකු මුදලකි!

මේ හේතුන් නිසා මට මගේ බිරිඳ ද රැගෙන ඔවුන්ගේ ලෝකයෙන් ඈත් වීමට අවශ්‍ය වී තිබිණි.

Buddhika

For E-Pusthakalaya

තමාගේ පැවැත්මට නැති ව ම බැරි පහසුකම්වලින් තොර දුෂ්කර පෙදෙසක පදිංචියට යෑමේ දී නිසැකයෙන්ම මතුවිය හැකි නැටළු හා අමාරුකම් ගැන විවාහයට කලින් කිසි විටෙක පද්මිනී සමඟ මම සාකච්ඡා නො කළෙමි. කොටින් කියතොත් දෑස් පියාගෙන අන්ධයකු ලෙස ඉරණමය බාර ගත් මා අහසට පොළොව මෙන් වෙනස් ය යි ම විසින් කියන ලද අප දෙදෙනා එකතුව කෙසේ නම් කල දැවන ගෙවන්නෙම් දැයි අනාගතය ගැන කල්පනා කළේ වත්, පද්මිනී කී පරිදි වත්පොහොසත්කම් හා සමාජ තත්ත්වය කුමක් වුවත් පිරිමියකු හා ගැහැණියකු විදිහට ගැලපීමක් එකඟත්වයක් ඇති කර ගන්නේ කෙසේ දැයි ඇය සමඟ කතාබස් කරන්නට ගියේ වත් නැත. එහෙත් කාලයකට පසුව මුලින් ම හෝටලයේ දී හමු වූ අවස්ථාවේ සිට නොයෙක් විට රජ රට ගොවි ජනපද හා එහි මගේ රාජකාරී වැඩ, නවාතැන විවේකය ගෙවන අන්දම් ආදී වශයෙන් ම විසින් සවිස්තරව ලෙස සපයන ලද තොරතුරු අනුව, එහි තමාට ඇති කර ගන්නට ඇතැයි ගැඹුරට කල්පනා නො කර මම සිතා ගතිමි. ඊටත් වඩා පද්මිනී සිය ආලය මට පළ කරන්නට ඇත්තේ මා පිළිබඳ සියලු දේ දැනගෙන විය යුතු ය යි මා තුළ අදහසක් විය.

මා රාජකාරී කළ පෙදෙසේ පදිංචිය ගැනත් ඇය කිසි නො සතුටක් පෙන් වූයේ නැත. ලේලියක හා නෑනා කෙනෙකු වශයෙන් පසේ වුවද බිරිඳක වශයෙන් මගේ ආර්ථික හා සමාජ තත්ත්වයට ගැළපෙන පරිදි හැඩ ගැසෙන්නට ඇය තුළ අවංක වුවමනාවක් ඇති බවත් ඇය මේ සියලු පරිත්‍යාගයන් කරන්නේ කාලයක් තිස්සේ පැවැති ආදරයක් ද ඒ අනුව සකස් කර ගත් බලාපොරොත්තු හා සැලැස්මක් ද ඇති ව බවත් මෙහි දී මට අවංක ව හැඟිණි. එකල ඇය කෙරෙහි කලින් නොවුණු ආදරයක් හා අනුකම්පාවක් ඇතිවීම පුදුම ද?

විවාහයෙන් මා රජරට ගියේ බිරිඳ වේ ඒ අන්දමින් වැඩුණු හැඟීම් ඇති ව ය.

මගේ පරණ නවාතැන මෙන් නොව ගෙයක් ය යි කිව හැකි රජයේ බංගලාවක් අසලින් ම සොයා ගැනීමට මට පුළුවන් විය. කතිකඩයකු වශයෙන් ජීවත් ව සිටි මට අලුත් පදිංචියේ දී මිල දී ගත යුතු බොහෝ දේ වූ බව කිව යුතුද? පද්මිනීගේ තත්ත්වයට කිසිසේත් නො ගැළපුණත් ඩියාරෝ කෙනෙකුටත් ඔහුගේ පතිනියටත් ඒ ... විදිහට මේ නිවස හොඳට ම සැහිණි. අමරසේනට අමතර ව ... පිහුම් දත් අම්මා කෙනෙකු අපි කැඳවාගෙන ගියෙමු. ඇය ... නිවසේ දිගු කලක් සේවයේ කළ මැදි වියේ කාන්තාවකි. ඇය ...



පද්මිනී හඳුන්වන්නී පුංචි බේබි යනුවෙනි.

මුල් මාසය දෙක පද්මිනීට වුව ද පාළුවක් නො දැනෙන්ට ඇත. ගමේ දී හා කොළඹ දී මෙන් ම මෙහි දී ද අලුත විවාහ වූ යුවළක් ලෙස යා යුතු තැන් සෑහෙන ගණනක් විය. රාජකාරියෙන් දන හැඳින පසුව ඇසුරට පත් සහෝදර නිලධාරීන්ගේ ගෙවල සංග්‍රහ සඳහා අපට හැම දියෙක ම වගේ ඇරයුම් යෙදී තිබිණි.

වන්දනාවට හා විනෝදයට ගිය ගමනකදී දුටු දෙයකට අමතරව පද්මිනී දක බලා ගන්නට බොහෝ අලුත් දේ ගැන රජ රටෙහි දී කල්පනා කර ගත හැකි විය. අපි නිවාඩු දවසක පොළොන්නරු, අනුරාධපුරය,සීගිරිය, වැනි තැනක නටබුන් බලමින් ඇවිද හාහායමින් කෑම කා රාත්‍රියේ නිසංසල වනපෙත් හා කුඹුරු යාය මැදින් ආපසු පැමිණියෙමු. සවස් කාලයන් හි ජනපද ඇතුළට ගණන් නොස් පාළු තැනෙක රිය නවතා ගසක් යටට වී ඔහේ විනෝද සුව වින්දෙමු.

නාගරයත් එයින් ඈත් වීමේ පාළුවත් අමතක කරවා සතුටින් හා විනෝදයෙන් කල දවස ගෙවනු පිණිස පද්මිනී වෙනුවෙන් ම විසින් යොදා ගන්නා ලද මෙවැනි ගමන් බිමන්වල දී ලද ආස්වාදයටත් වඩා දැඩි තෘප්තියක් මේ පරිසරයෙන් ලබා ගන්නට නොයෙක් විට ඇය ම සමත් වුණා ය. උදහරණයක් වශයෙන් සඳ එළිය ඇති දක සොබා දහම විසින් දෙන ලද දෙයක් හැර අන් සියලු බැඳීමෙන් මිදී මැදියම වන තුරු වැව් ඉවුරේ ගත කිරීමට ඈ ආශා කළාය. මිනිස් වාසයෙන් ඈත්වුණු වෙලාවක හා තැනෙක චමත්කාරයෙන් මෝහණය වුණු පද්මිනී වැවට පැන්නාය. දිය කිඳුරියක මෙන් කිරි බැබළෙන හඳ එළියේ දියෙන් හිස එස වූ මගේ බිරිඳගේ දර්ශනයම ඇය හා සමඟ හවුල් වන්නට මට කළ ඇරයුමක් මෙන්ම අනු බලයක් විය.

මෙය පසුව අපට පුරුද්දක් වුණා තරම්. මේ නිර්මාතෘවරයා අපෙන් බලාපොරොත්තු වූ පරිදිම ජීවත් වීමට අප උත්සාහ කළ එක් අවස්ථාවක් පමණකි.

මහින්ද හා අලුතින් දන හැඳින ගත් මිත්‍රයන් සමඟ හිතවත් කමේ අඩුවක් වුණා හෝ ඔවුනට සංග්‍රහ කිරීමට පද්මිනී අසමත් වුණා හෝ නො වුණත් ඔවුන් ඉස්සර කළ යෑම් ඊම ටිකින් ටික අඩු විය. මහින්ද මා සමඟ රැයක් ගත කළේ මා බිරිඳත් සමඟ ඔහුගේ නවා තැනට ගිය රාත්‍රියේත් මගේ ඇරයුමක් පරිදි ප්‍රේමසිරිත් එකතු කර ගෙන ජයන්ත හා යමුනා සති අන්තයකට අපේ නිවසට පැමිණි අවස්ථාවේදීත් ය.

For E-Pusthakalaya

කෙසේ වුවද විවාහ ජීවිතයට ඇතුළු වූ නිසා මිත්‍රයන්ගේ ඇසුරු අඩු වණැයි පාඩුවක් දනෙන්නට ඉඩක් නොවිණි.

## 19

පද්මිනීගේ ඇසෙක දෙම්නසක් දක්නට පටන් ගැනුණේ මාස තුනක් පමණ ගතවීමෙන් පසුවය.එකල ප්‍රත්‍යන්තයේ පාළුව ගැන ඇ කෙලින්ම දුක් ගැනවිල්ල ඉදිරිපත් කරන්නට ආවේ නැත. එහෙත් ඇය තමාගේ නාගරික ජීවිතයට සම්බන්ධ ව පුවත් පතක පළවී තිබුණු රේඩියෝවෙන් ඇසුණු හැම දෙයක් ගැනම සඳහන් කරන්නට වූයේ මහත් ආශාවකිනි. කැදර කමකිනි. ගෙවී ගිය රසබර අතීතයක් සිහිපත් වීමේ පසුතැවිල්ලක් සංවේගයක් වෙනුවට ඇය ඒවා ගැන කතා කළේ නැති ඉක්මනින් නැවත ඒ සුපුරුදු ලෝකයට යන බලාපොරොත්තුවෙන් සතුටින් හා අරමුණකින් හළියන ඇස් ඇතිවය.

කොළඹ ගොස් ආපසු එන අවස්ථාවකදී නම් වේදනාව වසං කර ගන්නට ඇ අසමත් වූවාය. විවාහයට කලින් මාස තුනක් හා පසුව මාස තුනක් පමණද එක දිගට හැම සති අන්තයකම මට කොළඹ යන්නට සිදු විය.

ගමන් ගාස්තුව වශයෙන් පමණක් මට සැහෙන මුදලක් තත්ත්වයට ඕරොත්තු නොදෙන තරම් මුදලක් වියදම් විය.ඊට අමතරව රාජකාරී කටයුතු සිතූ පරිදි කර ගත නො හැකි විය. ජනපද වාසීන්ගේ යහපත සඳහා මවිසින් කරන්නට අදහස් කරන ලද වැඩ පිළිවෙළ ගැන කවමත් ගොනුවක් කර ගත නොහැකි විය. පද්මිනී මුණ ගැසීමත් සමග දවසින් දවස ඒ අදහස ක්‍රියාත්මක කිරීම කල් යන්නට විය.

මුදල් අතින් පැවැති දුෂ්කරතාවයන් ගැන පද්මිනී නො දත සිටියා නොවේ. ඒ නිසා ඇවිදීම අඩු කරනු වෙනුවට. "නිමල් ඔයාට පුළුවන්නෙ නුවරඑළියට වැඩක් දාගන්න. අපිට රවුමක් ගිහිල්ල එන්න පුළුවනි නෙ" නැතහොත් "නිමල් කොළඹ වැඩක් දාගන්න බැරිද? අපිට ගෙදරත් ගිහිල්ල එන්න පුළුවනි නෙ" යි ඇ කීවාය.

මා හිතින් වේදනා වින්දේ ගස්වය සඳහා ලැබෙන ගමන් ගාස්තු අහිමි ලෙස පාවිච්චි කිරීම මගේ පිළිවෙත නොවන බව ඇය නො දනිතැයි හෙළි වූ නිසාම නොවේ. මේ කරුණු ගැන ඇය නො දනී



නම් තොදුවේ මගේ සිතුම්පැතුම් හා හැඟීම් ගැන අවබෝධයක් නැතැ යි දුයි කල්පනා වීමෙනි.

"නිමල් අපි එන සුමානෙ කොළඹ යමු" යි කලක් යන විට ඇය යෝජනා කළේ කලාතුරකිනි. ඒ වෙනුවට ඉංග්‍රීසි පුවත් පතක සිනමා දැන්වීම් තීරය කියවමින් එහි තමා ප්‍රියතම නිළියක රගන හෝ චිත්‍රපටියක් ගැන මා ද එකතු කරගෙන කතාව පටන් ගත්තාය. ඒ ගැන මගේ උනන්දුවක් තිබුණත් නැතත්,"කලබල වෙන්න දෙයක් නෑ සුදු. මට සහතිකයි මේක තව සුමානයක් දිග් ගැස්සෙයි" යනුවෙන් කීවාය. මා මෙහි "සුදු" යයි යෙදුවේ ඉංග්‍රීසියෙන් කතා කරන ඇය "ඩාලිං" යනුවෙන් කළ ඇමතීමයි.

රගර් ක්‍රීඩා තරගයක් තරඟන තරුණියන් පිරිසකගේ අලුත් මෝස්තර පෙන්වන පින්තූරයක් පුවත් පතක පළවී තිබෙනු දැක, දකුණත ඇඟිලි තුඩින් කීප වරක් නළලට තට්ටු කර ගත් ඇ,"හා හා හා මම හිතුවෙ මේක තියෙන්නෙ ලබන සුමානෙ කියලයි" පවසා මා දෙස බලා අසරණ ලෙස සිණාසුණා ය.

රගර් මැච් එක කවදා තිබුණත් චිත්‍රපටිය දිග්ගැස්සුවත් නැතත් මට කමක් නැත.

වියහියදම්. මහන්සිය හා වැඩ අතපසුවීම් ගැන නොතකා නිතරම කොළඹ යන්නට අදහස් කිරීම ගැන මා තුළ ඇතිවුණේ නොමනාපයෙනි. සමහරවිට ඇත්තටම කෝපයකි. අනෙක් අතට ඇයගේ තත්ත්වය ගැන ආත්මාර්ථකාමී නොවී කල්පනා කිරීමේ යුතුකමත් ඇතැයි තවත් අතැම් විටෙක මට මතක් විය. මොන තත්ත්වයන් යටතේ - මොන හේතුවක් උඩ හෝ පද්මිනීත් මමත් දුන් එක ජීවිතයක් බවට පත්ව සිටිමුත දුන් භුක්ති විඳින ප්‍රීතිය හීන වීමට ඉඩ නොදී අපි මේ ජීවිතය දිගටම ගෙන යා යුතු වෙමු. රැක ගත යුතු වෙමු. නගරයේ කළඑළියෙන්, අලංකාරයෙන් හා සුවපහසුවෙන් ඈත්ව මෙ වැනි පෙදෙසක කත් කෙදිරියෙන් තොරව කල දවස ගෙවීමට වචනයෙන් නොව ක්‍රියාවෙන් ම ඇය එකගතාවය පළ කර ඇත.

ඒ සඳහා තමාගේ සූදානම ඇය විසින් ඔප්පු කර ඇත.

පුරුදු එක වර වෙනස් කළ නොහැකිය. ඉදින් ඇයට හුරුපුරුදු වූ ඒ නාගරික ලෝකයක් එළිය බැලීමට යන්නට ඇති වන ආශාවකට ඉඩ නොදීම මිනිස් කමක් නොවේ.

පද්මිනී ගැන අවංක අනුකම්පාවකට වැටෙන මගේ සිත හැකි

Buddhika 15

For E-Pusthakalaya

ඉක්මනින් කොළඹ යා යුතුයයි තීරණය කර ගනී. පද්මිනී නිසා නොඉවසාපයක් ලෙසින් පටන් ගෙන කෝපයක් බවට ගැනීමේ දී බොහෝ විට උත්සාහයක් ගැනීමට තුඩුවමනා වන අවස්ථා ද එළැඹිණි.

තමාගේ බැල්මක්, වදනක්, ක්‍රියාවක් හා හැසිරීමක් උඩ මා තුළ ඇති වන සුළු හෝ වෙනසක් තේරුම් ගැනීමේ ඉඩක් ඇයට තිබිණි. නො මනාපයට පත්වුණේ තමාගේ බැල්මෙන් නම් පද්මිනී කලේ මා දෙස සිය අනුරාගී නෙතින් ප්‍රේමාවනද්ධ ලෙස බලා සිටීමයි. එවැනිම ඇසකින් පිළිතුරු දීමෙන් සෑහීමට නොපත් මට ඇය වැළඳ ගන්නට සිදු විය. තමා අතින් වරදු වූයේ වචනයෙන් නම් ඇ මුදු මොළොක් වදනින් දෙඩුවාය. එවැනි බසකින් මා පිළිතුරු දෙන්නේ ඒ වචන පිට කළ දෙතොල් සිප ගනිමිනි. ක්‍රියාවකදී ක්‍රියාවකින් ද හැසිරීමකදී හැසිරීමකින් ද ඇය සියල්ල අමතක කරවා මා තමාවෙත නතුකර ගත්තේ මැවුම්කාරයා විසින් ස්ත්‍රියක ලෙස තමා වෙත පිරිනමන ලද සියලු දයාදයන්ගේ ආධාරය ඇතිවය.තමාගෙන් වුණු වැරැද්ද හා එයින් මා තුළ ඇති වූ බලපෑම් පිළිබඳ ප්‍රමාණය අනුව ඇයගේ ප්‍රතික්‍රියාවන්ගේ තරම ද විවිධ විය.

තවත් සමහර අවස්ථාවක පද්මිනී තුළ පැවැති අදහසක් ගැන මට දැන ගන්නට ලැබුණේ ඇයගේ සේවිකාවගෙනි.

කොළඹ යෑම ගැන තීරණයක් තබා අප අතර සඳහනක් වත් නොවුණු එක් සතියක් මැද සවස් කාලයේ පද්මිනීත් මාත් සාලයේ තේ බී අවසානයේ කතා කරමින් සිටි තැනට හිස් කෝප්ප ඉවත් කරන්නට මෙන් ආ සේවිකාව,

"පුංචි බේබි කට්ටෙට මුට්ටෙට ඉන්නෙ නැතුව, දැන් ගෙදර යනකොට ගෙනියන දේවල් දන්නම කියන්න, ලෑස්ති කරල තියන්න, අන්තිමට ඇවිදින් බනින්න එපා, අම්මි අරක සූට් කේස් එකට දලා නෑ. මේක නෑ කියල" යි කීවා ය.

"මොකක්ද ඒ කිව්වෙ?" යි පද්මිනී ඇසුවේ මවා ගත් බොරු තරහෙනි.

"කිව්වේ මට කලින් ම සූට්කේස් පැක් කරල......"

නෑ අම්මී අර මොකක්ද අර කට්ටට කට්ටට?" ඇය දඟකාර ලෙස හිස ගස්සා ඇසුවා ය.

"ඒකද? කට්ටෙට මුට්ටෙට. ඒ කියන්නෙ අන්තිම වෙන කන් නොසිද කල් තියල........"



"ඉතින් ඒම කියන්නකො. අංඩර දෙමළ නැතුව......නිමල් ඔයා දන්නවද ඒ වචනෙ තේරුම......?"

පද්මිනී මගෙන් ප්‍රශ්නය නැගුවේ ඉංග්‍රීසියෙන් වුවද කාන්තාව මා වෙනුවට සිංහලෙන් පිළිතුරු දුන්නා ය.

"ඩියාරෝ මහත්තය මොකද ඕව නො දන්නෙ. ගමේ උපන් කෙනෙක් වෙලත්?"

මා තුළ මේ වන විටත් නැගෙමින් තිබුණු කෝපය පටන් ගත්තේ තමා මගේ සුල මුල සියල්ල දන්නා බවක් හඟවමින් සේවිකාව පිට කළ ඒ වචන නිසා ය යි මට මොහොතකට සිතිණි.

නැත. කෝපය පමණක් නොව ඊට සමාන්තරව, හොඳ චිත්ත රෙද්දකින් හා රේන්ද ඇල්ලූ - කර පළල් සුදු කබාරැත්තු හැට්ටයකින් සැරසී සිටින මේ මැදි වියේ කාන්තාව කෙරෙහි ඊර්ෂ්‍යාවක් ද හට ගනී. නැතහොත් හට ගැනෙමින් තිබිණි.

ඊර්ෂ්‍යාවක් අලුත් හා පරණ වශයෙන් ද මා හා තවත් කෙනෙකු වෙනුවෙන් ද උපන් දෙයාකාරයකි.

මීන්නේරි දෙවියනි. ඒ අනෙක් තැනැත්තී මගේ අම්මා ය.

මවා ගත් බොරු තරහකින් වුවද පද්මිනී සිය මෙහෙකාරිය දෙස බැලුවේ මවක දෙස බලන දියණියකගේ සොම්නස ද ඇතිවය.

තේ මේසයෙන් නැගිට සාලයේ සැටියේ වාඩි වී ටීපෝව මත වූ සිගරැට්ටුවක් අතට ගනිමින් මා කල්පනා කලේ ඇය ගැන පද්මිනීගේ සෙනෙහස, දයාව, කරුණාව හා හිතවත්කම මෙතැනට පමණක් සීමා නොවුණු බවයි.

අපෙන් පසුව ගෙදර සේවකයාටත් සේවිකාවටත් කෑම කන්නට කිසිවකුගේ නියමයක්, අවසරයක් හෝ විධානයක් අවශ්‍ය නොවිණි. එහෙත් හැම වේලකම කෑමෙන් පසුව ඇ"අම් ඊ ඊ, අපි ඉවරයි. මේව අස්කරල කන්න" යයි කරුණාබර හඬකින් හා ලතාවකින් තාලයකට මෙන් කීවාය.

කෑම මේසයේ ම ඈදී දිගටම කතාවේ යෙදෙන්නට සිය හැම විටෙක ම,"අපි කෝපි එකක් අරගෙන යමු නිමල් සාලෙට. අම්මිලට පරක්කු වුණා නෙ. ඕව අස් කරල කෑම කන්න" යනුවෙන් කීවාය.

බොහෝ විට පද්මිනී ඇයට සැලකුවේ මෙහෙකාරියක නොව මිතුරියක හෝ නෑන්ද කෙනෙකු වැනි නෑයෙකු ලෙසිනි. ඔවුහු වරෙක

Buddhika IS

එකිනෙකාට දොස් පවරාගෙන බොරුවට අමනාප වූහ. අන්තිමට ඔවුහු නෑදෑ වූයේ යෙහෙළියන් මෙනි.

මේ මගේ ඊර්ෂ්‍යාවේ එක පැත්තකි. අනෙක් පැත්තෙන් කුඩා දවස සිට රැක බලා ගැනීමේ හා ආවතේව කම් කළ වැඩකාරිය පද්මිනීගේ සියලු වහලගොත දනී. ළමා වියේ සිට ඇය කෑමට අගය කළ දේ හා අනෙක් රුචිඅරුචිකම්, එදා කළ හපන්කම්, හිතුවක්කාරකම් දඟකාරකම් ආදි නොයෙක් දේ - කොටින් කියතොත් මගේ බිරිඳ ගැන මා නොදන්නා හැම දේ ඇය දනී.

සතියකට පමණ කෙටි කාලයකට සීමා වුණත් පද්මිනී අපගේ නිවසේ ගත කළ ගත කළ අවස්ථාවේ කිසි විටෙක, අපේ මවට,

"එන්න අම්මත් එක්කල කෑම කන්න" යයි නො කීවාය. මෙසයට නො එන බව දන දනම වුවද ඇයට කතා කළේ මා ය.

"දැන් ඉතින් අම්මලත් කෑම කන්නකෝ. රෑ වුණානෙ" යි මේසයෙන් නැගිටිමින් වත් මගේ බිරිඳ ගෙන් නිකමට වත් කියාවුණේ නැත. මේ මෙහෙකාරිය දෙස බලන කරුණාබර, දයාබර, සෙනෙහෙබර බැල්මකින් ඇය අපේ අම්මා දෙස ඇසිපිය හෙළන මොහොතකට බලනු මා දැක නැත.

අධ්‍යාපනයක් ලබා නැතත් ඉංග්‍රිසි කතා කරන පිරිසක් අතර කාලයක් හැසිරීම නිසා කියන දෙයක් තේරුම් ගැනීමේ ශක්තියක් වැඩකාරියයට ඇත. පද්මිනීත් මාත් අතර කතා වෙන හැම දෙයක් වාගේ තේරුම් ගැනීමට ඇයට පුළුවන. අවශ්‍ය වූ විටෙක අප හා අපේ කතාවට සිංහලෙන් හවුල් වීමේ පුළුවන් කමත් ඉඩකඩත් ඇයට ඇත.

අපේ අම්මාට මේ තත්ත්වයක් වත් නැත.

කොටින් කියතොත් පද්මිනීගේ වැඩකාරිය ලබන දයාව, කරුණාව, සෙනෙහස, සැලකිල්ල හා හිතවත් කම අපේ අම්මා තවමත් ලබා නැත. ඇය භුක්ති විඳින කිසිම වරප්‍රසාදයක් අම්මාට හිමි වී නැත.

"හෙටම ගෙදර යන්නට ඇත්නම්" යයි සිතුණු තරම් ශෝකයක් අම්මා මතක් වී මා තුළ මතුවිය. ශෝකය වැඩුණේ අර ඊර්ෂ්‍යාවත් සමඟ ය. සියලු හැඟීම් එකතු වී කිසිවකු පස්සේ ලුහු බඳින කෝපයක් මෙන් මෙරයි.

මෙසේ මෝරණ කෝපය පිළිඹිබු කර ගත් මගේ මුහුණ දෙස පද්මිනි අසල පුටුවේ වාඩි වී නෙත් රඳාගෙන උන් බවක් සහරා



ඇසින් ගෙන සිටි මම නො දත්තෙමි. ඇය සැටිය කරා පැමිණ ඇඟට නොරපෙන තරම් මට ළංව වාඩි වුණාය. මම දිගට ම කියවන බවක් ම හැඟවීමි. ඈ ඇඟිලි කරු අතරට අඟිලි වැටෙන සේ සිය වමතින් මගේ දකුණත වෙළාගෙන තවත් මඳ වෙලාවක් ගත විය. ඈ මගෙන් සඟරාව ඉවතට ගෙන ටීපෝවට විසි කළාය.මම ඇය දෙස බැලිමි. අපේ ඇස් අතර පරතරය අඟල් දෙක තුනකට වඩා නොවීණි. ඇය ගෙන් පළවුණේ ආදරයත් භක්තියත් ය. නළලට නළල තබා ගත් ඈ පරෙවි දෙනක මෙන් උගුරෙන් හඬක් නැඟුවාය.

"නිමල් දේබල් ලෑස්ති කරල තියෙන්න කියල අම්මිට කියන්නද එහෙනම්?" ඈ කොඳුළාය.

"කියන්න මතක ඇතුව පුංචි බේබිගෙ සුප්පුවයි බෝතලෙයි දෙකත් ද ගන්න කියල"

"උරන්න ඕනෑ වුණා ම මට මේ තියෙන්නෙ - සුප්පු නැතුවට" යි මුවට මුව තබා බිරිඳ කීවේ සිංහලයෙනි.

තුන් හාර මාසයක කාලයක් ඇතුළත කෙතෙක් කොළඹ ගියත් අපට මගේ නිවසට යන්නට ලැබුණේ දෙවරක් පමණි. ඒ දෙවතාවේ ම බත් වේලක් වත් නොකා කඩිමුඩියේ ආපසු එන්නට අපට සිදු විය.

මගේ පැත්තෙන් මේ වර කොළඹ ගමනේ විශේෂ අරමුණ වූයේ අම්මලා බැලීමට ගෙදර යෑ මයි. ඒ බව පද්මිනි ද මැනැවින් දන සිටියාය. ඇයත් එනවා ද නැද්දැයි අසන්නට වුවමනාවක් නොවීණි. ඒ ප්‍රශ්නය මගේ සිතට නැගුණේ වත් නැත. කජු,අඹ, හකුරු හා දිවුල් ආදි ලෙසින් අතර මඟ දී හැම දෙයක්ම ගත්තේ අම්මලාත් මතක් කර ගෙන ය.

වරුදට කලින් දවසේ මගේ කාර්යාලීය වැඩ නිමකර පිටත් වුණු අප නගරයට එන විට රෑ බෝ විය.

එහිදී ඇඳට වැටුණු මම, නිදිමත එනතුරු, නැතහොත් පද්මිනී නින්දට සූදානම් වන තුරු සැන්දෑ පුවත් පත බලන්නට ගතිමි.

ඈ සබන් හා විලවුන් සුවඳ නික්මවන නානකාමරයේ සිට එළියට ආ බව හිස ඔසවා නො බලාම මම සිතා ගතිමි. ඇයගේ ඊළඟ ක්‍රියාව කුමක් වන්නේ දැයි මම දනිමි. ඒ සඳහා ඇයට විනාඩි දහයක් හෝ පහළොවක් හෝ ගතවනු ඇත. දැස් පියාගෙන වුවද කීමට තරම් ඒ සියල්ල දැන් මට හුරුපුරුදුය.

For E-Pusthakalaya
Buddhika 15

For E-Pusthakalaya

පද්මිනී කණ්නාඩිය වෙත ගොස් මට පිටු පා, මට අසුන ඉදි වාඩි වන්නට ඇත. ආත්මාදරයක් යයි කිව හැකි හැඟීමක් පුරවා ගත් ඇසින් සිය පිළිරුව දෙස බලාගෙනම ඇ මේසය වෙත පුරුද්දෙන්ම අත යවා ලෝෂන් බෝතලය ගත්තාය. වම් අත ගොටුවක් කර ගෙන එයින් නියම ප්‍රමාණය වත් කර ගත්තා ඇය දකුණත ඇඟිලි තුඩින් ටික ටික ගෙන නළලෙන් පටන්ගෙන. නැහැය, කම්මුල්, කන්පෙති, නිකට, ගෙළ, ළැම, උරහිස්, පිටිකර, අත්ගොබ, පිටි අත්ල, හා අත්තිමට ඇඟිලි පත් හැම තැනම තවරා ගත්තාය. වම් අත්ලෙහි ඉතිරි වූ ටික දකුණු අතෙහි ගා ගෙන නැවත නළලෙන් පටන් ගෙන ආලේපය කැවැරුණු සියලු තැන් පිරිමදින්නට වන්නීය. පද්මිනී ලතාවකට පිළිවෙළකට මේ සාත්තු සප්පායම් කර ගන්නී තමාගේ රූපයත් ඇඳුම් පැළඳුමත් සම්බන්ධ අත් හැම දෛනික කටයුත්තකදීම මෙන්ම පරිස්සමිනි. එහෙත් එක්තරා පළපුරුද්දකින් හා නිපුණත්වයකිනි. කැරකෙන පංකාව "හ්ම්" හඬක් නංවයි. එය මගේ පැත්තට හැරෙන හැම වරෙකදී ම පුවත්පත සෙලවෙයි.ඒ හැරුණු විට නිදන කාමරය නිහඬය. නිශ්චලය.

"නිමල් හෙට කොයි වෙලාවෙද ගෙදර යන්නෙ?"

"උදේන්ම.......... අටට නමයට" මම පත්තරය දෙස බලා ගෙන ම කීමි.

තවත් විනාඩි බාගයක් පමණ ගත වන්නට ඇත.

"ඒක හොඳයි. නංගිටයි මටයි ඒ අතරෙ සාප්පු ටිකක් ගිහිල්ල එන්නැකි. හෙට හාෆ් ඩේන්"

මම පුවත්පත පහළට ගනිමින් බිරිඳ දෙස බැලීමි. එය නිරායාසයෙන් ම වූ ක්‍රියාවකි. ඒ වන විට ඈ උඩ බලා ගෙන බෙල්ල දෙපැත්ත පිරිමදිමින් උන්නාය. කණ්ණාඩියෙන් මගේ නෙත් මුණ ගැසෙන්නට නම් ආයාසයෙන් බලන්නට ඇයට සිදු වනු ඇත. ආයාසයෙන් බලන්නට ඇයට සිදු යනු ඇත. ආයාසයක් ගැනීමෙ වුවමනාවක් ඇයට නැති වුනා විය හැකි ය. මොහොතකට කලින් ඇසුණු වචන නිසා හටගත් කහට ගතිය කෝපයක් බවට මෝදු වන්නේ ඇය ගෙළ පිරිමැදීමට වෙනදට වඩා කාලයක් ගන්නා බවක් පෙනුණු නිසා යයි සිතන්නට මට වුවමනා විය.

"හෙට ගෙදර යන්නේ කීයටද" පහසුවෙන් ම සිංහලෙන් ඇසිය හැකිය. ඇය ඉංග්‍රිසියෙන් කතා කළා නම් "හෙට අපි ගෙදර යන්නේ කීයට ද?"නැතහොත් "ඔයා ගෙදර යන්නෙ කීයටද" යි ඇසිය යුතු තිබිණි.



බෙල්ල ගැන පමණක් නොව අනෙක් හැම තැනක් ගැනම ඇය අද වැඩිපුර කාලයක් ගනී. ඒ අනුව මගේ කෝපයද වැඩෙයි.

ඈ තමාගේම රූපයෙන් නෙත් ඉවතට ගන්නට ලෝබයෙන් මෙන් නැඩපත දෙස බලාගෙනම, අත් ගොබ, කර හා ළැම ආදී තැන්හි අන්තිමටම ඇඟිලි අද්දවා ගෙන යමින් අසුනෙන් නැගිට සිටියාය. ඈ කණ්ණාඩියෙන් ම මා දක ගත්තේ - මා දෙස බැලුවේ එවිදිය.

යහන් ගැබට කෙරෙන ඇරයුමක් වැනියි වරන් මා තරගෙන් සිතූ බැල්මද සහිත මඳ සිනාවක් මුවගට නගා ගෙන ඈ තත්පර ගණනක් සිටියාය.

"එළිය නිවන්නද? නිදිමතයි"

පිළිතුරක් නො දුන් පද්මිනී ජෝඩු ඇඳේ මා වැතිර සිටි පැත්තෙන් ආවාය. ඇය මුහුණට පාත් වෙමින් මා අසළ වාඩි වූයේ දරුවකුට කිරි පොවන්නට සූදනම් මවක ගේ ඉරියව්වෙන් කෙළින් ම මගේ දෙනෙත් වෙත යොමා ගත් අර බැල්ම ඇතිව ය.

ඈ මගේ තොල් මත ඇඟිල්ල තුඩ තබා මොහොතක් සිය නිකට ඔස්සේ බෙල්ල දෙස ඉරක් ඇඳ ගෙන ගියාය.

"ඔයා සාප්පු යන්න කැමති නැනෙ සුදූ" එවර ඇය ඉංග්‍රිසියෙන් කීවේ ගමනක් යන්නට බැරිවුණු ළමයකුගේ සිත හැළවීමේ හොඳෙල් ලතාවකිනි.

"නිද ගනිමු. නිදිමතයි"

පිළිතුරක් දෙනු වෙනුවට ඈ නෙත් ගතියකින් පිරුණු ඇසින් මා දෙස බලා ගෙන ම මගේ අතක් ගෙන සිය උරතලය මත තබා ගත්තාය. මම අනෙක් අතින් ඇයගේ බැහුවක් පිරිමදින්නට වීමි.

බැල්මකින් කර ගන්නට ඇති වැඩ කොටස නිමාවට පත්කර ගනිමියි සහතිකවූ එකියක ලෙසින් "එළිය නැ නේද" යි ඈ ඇසුවාය. ඇය අඳුරෙහි මට තුරුලු වූයේ "නිමල් සුදු, හෙට පරක්කු වෙන්න එපා වැඩිය. දවල් කෑමට එන්න. මම බලා ඉන්නව" කියා ගෙනය.

අවසානයේ දී,අනෙක් ඇඳට පැනගත් ඇය ඉක්මනින් නින්දට වැටුණු බව තාලයකට හුස්ම වැටෙන නඩින්ම සිතා ගත හැකි විය. එහෙත් මා බොහෝ වේලාවක් යන තුරු ගත කළේ අවදියෙනි.

අලුත් මානසික අත්දැකීමක් එ ද එ තැනින් ඇරඹිනි.

Buddhika 25

For E-Pusthakalaya

ත්ලේයෙන් සංසිඳෙන්ම මගේ සිත අසහනයකින් පිරී යන්නට විය.එය අස්වාභාවික කාන්සියකින් අනාතුරුව ඇතිවන දුඩි කලකිරීමක් මෙනි. බිරිඳගේ කතාවෙන් උපන් කෝපය තව දුරටත් රැක ගත හැකි වන පරිදි ඉඳුරන් දමනය කර ගන්නට අසමත් වීණැයි දුඩි පසු තැවිල්ලක් මට ඇති විය. ඒ චිත්ත ස්වභාවය ශාරීරික දුබලතාවයක් නිසා හට ගන්නා ආත්ම පරාජය පිළිබඳ පීඩනයේ ම අනෙක් පැත්ත ය.

සැහෙන වේලාවක් කල්පනා කරගෙන යැමේදී කෝපය නැවත ගොඩ නැගිණි. එවර ඇය ගැන නොවේ. මා ගැනමය.

මා යන විට ගෙදර ඉදිරිපස දෙරවල් ද ජනෙල් ද වසා තිබිණි.මෝටර් රියේ හඬ ඇසී අම්මා පිටුපස්ස පැත්තෙන් එළියට ආවාය. මා දකින්ම අම්මාගේ මුහුණ සොම්නස් සිනාවෙන් පිරී ගිය ආකාරය ගැන අනුකම්පාවක් දුකක් මට ඇති විය. රාජකාරි කටයුත්තක් සඳහා මෙවර ආවේ තනියමයි කියන්නට පුළුවන් කම තිබුණත් අනෙක් අතට බොරුවක් කීම නොහොබී යයි මට සිතුණේ ද අම්මාගේ මුහුණ දකීමෙන් ය. ගෙදර වසා ගත් පාළුව නෙතටත් සිතටත් මෙන්ම අතටත් අප්‍ර වන තරම් දැඩිය.

"බඩු වගයක් ගන්නය කියල සාප්පු ගියා. අද වරු දවසක් නෙ" මම අම්මා පද්මිනි ගැන අසන්නට කලින්ම කීමි.

"කිච්චත් වගෙ හෙටත් වහල නෙ කඩ සාප්පු අහන්න දෙයක් යැ ඉතින්? ඒ ළමයට කොළඹ ආවම ගන්න දේවල් නැතුවය? රාජ කුමාරියො වගෙ හැදුණු ළමයිනෙ"අම්මා දෙරවල් කීපයක් හැර දැම්මා ය. අම්මා දහසක් ප්‍රශ්න ඇසුවා ය. පද්මිනි නො පැමිණීමේ හේතුවේදී මෙන්ම අනෙක් කරුණු වලදී ද අම්මා දක්වූයේ ඔරුවේ පෙරළුණු මේ පැත්ත හොඳය යන පිළිවෙතය. ඇතැම් තැනකදී වංකකමක් යටපත් කර ගන්නට අපේ ඇස් අසමත් විය.එකල අප කතා කළේ මුහුණ මග හරිමිනි.

"ලොකු පුතාට ඉක්මනට යන්න ඕනැත් ඇති මම දන්නෙ නැ හැබැයි ආවය කිච්චම තාත්ත නම් හැපෙයි"

අම්මට තාත්ත එක්ක එහෙ ටික දවසක් ඉඳල එන්න පුළුවන්නෙ" මම රිදුණු සිත සනසා ගන්නා තැනකින් කීමි.

"කොහොමද පුතේ මම ගියාම මහතුන් කන්නෙවත් කොහොමද? ඇරත් මේව වහල දල"

"නිවාඩුවක් අල්ලල මල්ලිත් එක්කම එන්න බැරිය. [illegible] කෙනෙක් ගෙදර නවත්තල"

Bodhika



දවල් කෑමට මා එනතුරු සිටිමියි බිරිඳ කී බවක් මතක් කර නොගෙන ම මම ගෙදර බතට නවතින්නට සිතා ගතිමි.

අම්මා කුස්සියට වී වහා කෑම පිසින්න ට පටන් ගත්තා ය.

ඇඳුම් මාරු කර සරමක් දමා ගත් මම, කුස්සියට ගොස් එළිපත්ත උඩට වී, අම්මා කෑම පිසින අතර කතාවට වැටුණෙමි.

අවුරුදු ගණනකින් නොදැණුණු සැහැල්ලු ගතියක් මට දැනෙන්නට විය.

රෝහණ වෙන රක්ෂාවක් සොයයි. වත්තේ කම්කරුවන්ගෙන්ද අවට ගම්වාසීන්ගෙන් ද කරදර මැඩීමට මුලදී වතු අයිතිකාරයන්ගේ ආයුධයක් වීම නිසා රෝහණට ඒ දෙපක්ෂයම විරුද්ධ වූහ. දැන් හාමු පුතුන් ගෙන් ද ඔහුට වෙනස් කම් ඇති වෙයි. ලොක්කන්ගෙ පැත්ත ගන්නට වීම ගැන ද අද ඔහු පසුතැවිලි වෙයි.

සෙනරත් ගාල්ලේ මහජන බැංකුවෙන් කළුතරට මාරු වී සිටී.කොළඹ කච්චේරියේ වැඩ කරන විජයට හා කාර්මික පාසලේ ඉගෙන ගන්නා ගාමිණිට පෑලියගොඩ තැනක බෝඩිමක් ලැබී තිබේ. විජය නුගේගොඩ තරුණියක හා හාදවී සිටී. සැහෙන කටයුත්තකැයි පෙණුණත් අම්මා තවම කැමැත්ත පළ කර නැත.

හිතට බොරු කර ගැනීමක් නැතිව, ඇස්වල වංක කමක් නැතිව අපි පවුලේ තොරතුරු කතා කරගන ගියෙමු.

සේනාරත්නලාට ආණ්ඩුවේ ඉහළ තැන්වලින් ඕනැදෙයක් කර ගත හැකි බවක් දන්නා අය - අපේ ගමේද සිටිත්. සමහරකුට මා හමුවීමට ඕනැකර තිබේ. වැඩි වශයෙන් රක්ෂාවල් ලබා ගැනීම සඳහා ය. මා ගම අමතක කර ඇතැයි සිතන අයත් වෙයි.

"ඩීයාරෝ කෙනෙකුට කිච්චම පුළුපටු වැඩද? තාම සමහරෙකුට තේරෙන්නෙ නෑ" යි අම්මා කීවාය.

තාත්තා වියැදුරු කමත් අම්මා කඩ රස්සාවත් අත් හැර දැම්මේ මා ආදයම් පාලක නිලධාරියකු ලෙස පත්වූ අලුතමය. තාත්තා දැනුත් දින පතාම වාගේ නගරය පැත්තේ ඇවිදින්නට යයි.

මම වත්ත පහළ කුඹුක් ගස යට වූ පොකුණ කරා ගොස් දිය නා ගතිමි. මොන තරම් සනීපයක් ද? මොන තරම් සැහැල්ලුවක්ද? පියාඹන්නට පුළුවනැයි මට සිතිණි. මේ අතර ගෙදර පැමිණි සිටි තාත්තා මා සොයාගෙන එනු අතර මගදී දක්නට විය. තාත්තාගේ

For E-Pusthakalaya

සිනාව සතුට වඩාත් අවංක ය. විවෘත ය.

අපි එකට කෑම ගතිමු. වචන පහක් දහයක් අතරට නැගෙන නාන්නාගේ ඒ සැහැල්ලු - සුපුරුදු සිනාව පාළු ගතිය සා ගෙන දෙරකාරය නංවමින් සංගීතයක් ලෙස පැතිර ගියේය.

සුහද හැඟීම් තුලින් මල්ලිලා ගැන මතක සිතට නැගිණි. ඔවුන් නැති පාළුව ශෝකයක් තරමට ගැඹුරුය. නගරයට ගියොත් පැතියකට වන තිස්ස දුක ගත නැකිය. සවස වත් කොළඹ දී විජය හා ගාමිණි හමු වන්නට සිතා ගතිමි.

කොතැනක දී හෝ ඔවුන් සමග කෑම වේලක් කන්නට ඇත්නම් යයි මට සිතිණි. පද්මිනී සවසට මොන වැඩ යොද ගෙන ඇද්දැයි කවුරු දනිත් ද?

මා ගෙදර පැමිණි බව ආරංචි වී කීප දෙනෙක් පැමිණියහ. සමහරෙක් තවමත් මා කෙරෙහි පවතින හිතවත්කම හා විශ්වාසය ඇති ව,මා දුක වචනයක් කතා කර යන්නට ආ අයයි.සමහරෙක් මා ලවා නොයෙකුත් වැඩ කරවා ගන්නට පැමිණි අයයි.

"ඔය දෙපාර්තුමේන්තුවෙන් ලොක්කයි සර් ගෙ මැතිනියගෙ අක්කල යි බොහොම විශ්වාසලු. එහෙත් ලියුමක් ගත්තොත් කොල්ලට රස්සාව අතේ සර්" එයින් එක ගැමියෙක් කීය.

"කොහොමද දන්නෙ ඒ නෝනල........."

"අපිත් සර් ඉතින් වැඩක් කරව ගන්න කොයි මාර්ගයෙන් පුළුවන් ද කියල වලිකාල හොයනව නෙ"

"හොදයි මම එහෙනම් ඒ මස්සිනාලට කතා කරන්නම් කෝ"මම ඔහුගේ ඇස් මග හරිමින් කීමි.

ගැමියා කතා කළේ කෙලින්ම මා දෙස බලාගෙනය.

"සමාවෙන්න සර් මට ඔය හෝඩුවාව දුන්න නැනැත්තා කිව්වෙ නම් ඒ නෝනා මහත්තයගෙන් ම ලියුමක් ගන්නය කියල"

ඔහුගේ දෙනෙතෙහි වංචාවක් නොවිණි.

මා ගෙදරින් පිටත් වුණේ එහි ගිය තැන් වල වැඩෙමින් පැවති අර සැහැල්ලු ගතිය සුන් වී ගිය සිතිනි.

පද්මිනී කොළඹ නතර කර රාජකාරිය සඳහා තනිවම රජ රට බලා යන්නට මට සිදු වූයේ තවත් මාස කීපයකට පසුවය.



ඉඩෝර කාලය ළං වෙත්ම, කෙඳිරිල්ලක් වශයෙන් නො වුණත් දුෂ්කරතාවයන් ගැන කතා නො කර සිටින්නට ඇය අසමත් වුණා වන්නට ඇත.

දුඩි අව් රස්නයෙන් කම වියළී යනු දුක, හර කෙස් ගසක් ලුදු නබා දේව රජු මෙන් කළකිරුණේ නැතත් මගේ බිරිඳ ජවි කලාණියට අනතුරක් වෙතැයි බිය වූවා ය.

"බලන්න නිමල්. පිච්චිලා ගිහිල්ල රැළි වැටිල" කණ්ණාඩිය වෙත ගොස් කම්මුල, කර හා අත් ගොඩ අත ගාමින් සංවේගයෙන් පිරුණු ඇස් මා වෙත යොමු කර ගෙන ඈ කීවාය.එක අතකට ඇයගේ මේ දුක්ගැවිල්ල සාධාරණ යයි මට ද සිතිණි.

මේ වන විට ජීවිතයෙහි කර්කශ කම ගැන වඩාත් කතා කරන්නට වූයේ පද්මිනීගේ සේවිකාව ය. දෙදිනකින් ආපසු යන සිතින් එවර අප කොළඹ ආවේ ඇයත් සමඟය. එදා අප එන විට නවස හයට පමණ ඇත.

"පද්මි නිකම් කළු වෙලා. මොකද දූ වේලිලා ගිහිල්ල?" අප රියෙන් බසිත්ම මැණියෝ කීහ.

"කිච්චත් වගේ අක්ක ගෙ හැටි. ඇයි අක්ක?" අසාගෙන ආවේ නාලිනී ය.

පිළිතුරක් නො දුන් පද්මිනී මුවගට උත්සාහයෙන් නගාගත් සිනාව අසරණ ය. "සියල්ල වුණේ මෙන්න මෙයා මාව ඒ පාළු කාන්තාරෙට අරන් ගිය නිසා ය" යි නො කියා ඇය එසේ මවත් නැගණියත් දෙස බලා අසරණ ලෙස සිනාසුණේ මා ආරක්ෂා කර ගැනීමේ උත්සාහයෙනැයි හැඟීම තුළ බිරිඳ කෙරෙහි අලුත දයාවක් අනුකම්පාවක් උපන්නේ ය.

පද්මිනී ගේ පිළිවෙත මෙසේ වුවත් ඇයගේ මෙහෙකාරිය ගොළුවක රැක්කේ නැත.

"වේලිලා නෙවෙයි පිච්චිලා නොගිය එකයි පුදුම. කාස්ටක අව්ව. එහෙම ඉඩෝරයක්. අමු කැලෑ ගිනි ගන්නව. නාන්න යන්න ඕනෑ හැතැප්ම විස්සක් තිසිපහක්. ඒත් මඩ වතුර. ඒව නාල ඔළුවෙ කෙස් ගහක් ඉතුරු වෙන්නෙ නෑ. මේ මගෙ සේරම කෙස් ටික යනවා. පිරන කොට අහුරු පිටින් යන්නේ. මාළු ටිකක්? මස් ටිකක්? ඒව කොහෙද කුණු මාළු හරක් මසට මී හරක් මසට මීහරක් මස්. වල්ලෑරු මස් කියනව. ඒත් කව්රු දන්නවද මොන ජරාවල් ද කියල. ඒව කෑව ගමන්

Buddhika 23

For E-Pusthakalaya

පාවගේ. මම මේ තරම්වත් කල් හිටියෙ මෙන්න මේ පුංචි බබ්බි නිසා. මම නම් ආයෙත් යන්නෙ නෑ. දූන් මැලේරියාවලු හැම තැනම අම්. මේ ඒක හැදුණොත් මට බෑ මට බෑ" යි ඈ පිස්සියක මෙන් කියා ගෙන ගියාය.

ඇයගේ මේ වදන් මවගේත් නැගණිය හා ගෙදර අනෙක් මෙහෙකාරියන්ගේත් කඳුළින් තෙත් කර විමට තරම් සමත් විය. ඔවුන් පද්මිනී දෙස බැලුවේ සටන් බිමක කොටු වී නැතහොත් වනචාරීනට අසු වී සිට දිවි ගලවා ගෙන ආ වීරවරියක ලෙසිනි. මා හොව ඇයගේ ගැලවුම් කාරිය සේවිකාවයි.

මෙතෙක් කිසි පැමිණිල්ලක් නොකියා ඉවසා සිටි පද්මිනී අන්තිමට ඉකි ගස ගසා හඬන්නට වූයේ ඒ කඳුළු හා අනුකම්පාව තමා වෙනුවෙන් උපන් බව අවබෝධ වූ පසුව විය යුතුය.

පියා හෝ සහෝදරයා හෝ මේ විස්තරයට සවන් දීමට නොසිටියහ.කවදත් උදයට පිටත්ව යන ඔවුන් දෙදෙනාම ආපසු ආවේ රෑ හතට අටට සමහර විට ඊටත් ප්‍රමාදවය. වේලාසන ආවත්, ඒ සැණෙන් තවත් ගමනක් යනු පිණිස මුහුණ නට සෝදා ගමනේ තත්වය අනුව ඇඳුම් ද මෝටර් රථ ද මාරු කරනු පිණිස ය. පවුලට බෙන්ස්, ෆොක්ස්වාගන්, ඕපල් යන කාර් තුනක්ද මිනිමොක් හා ජීප් රිය දෙකක් ද විය.

ඉස්තෝප්පුව කෙළවර ගොටු චේවැල් පුටුවකට වූ ඉවෝන් " වුමන්" සඟරාව අතැතිව, මේ කිසිවක් නෑසුණු ලෙසින්, මිදුලේ ආයාත් සමග සෙල්ලම් කරමින් සිටින දරු දෙදෙනා දෙස බලා ගෙන උන්නාය. ඇය කොහොමත් අනෙක් අය සමග කතා කළේ අඩුවෙනි.

"කෝ මේ ලොකු පුතා, විපුල දූන් ආව ගමන් කොහෙද ගියේ?" යි මව කීවෙන්,

"එක තැනැක්යැ? යන්න තිප තැනැක්ම තියෙනව. කව්ද දන්නෙ එයින් කොයි තැනට ගියාද කියල" යි ලේලිය කීවාය.

එකල ඇයගේ ඇස්වල සාගින්නකට පිපාසයකට සමාන යයි මා විසින් කලින් කියන ලද අසහනයට ද්වේෂයක් ද එකතු වෙයි.

ද්වේෂයත් වෛරයත් නැතිව අර අනෙක් ස්වභාවයෙන් යුත් ඇයගේ බැල්ම මා වෙත එක දිගට යොමු වී තිබෙනු "සේනානි" නිවසට පැමිණි නොයෙක් අවස්ථාවල මා දැක ඇත. මම බියෙන් හා විලියෙන් ඉවත බලා ගතිමි.



"පිටිම් ඉතින් කුඩුවල දාලා තියා ගන්නද?" යි නැන්දම්මා කීවේ ලේලියට නො ඇසෙන තරම් එහාට ගියාට පසුවය.

ව්‍යාපාරික කටයුතුවල තම වැඩ කොටස ඉටු කිරීමෙන් පසුව ගෙදර හා පවුලේ වගකීම ගැන සොයුම් බැලුම් කරන්නට සැමසත් කබ්රාල් "සේනානි "යට එන්නේ මේ වෙලාවටය. පද්මිනී රජරට ගත කරන දුෂ්කර ජීවිතය ගැන ඔහු දැන ගත්තේ මේ ලෙසිනි. දියණිය ගේ කරදරය ගැන යම් අදහසක් පියාටත් ඔහුගෙන් ලැබී ඇත.

මේ ගැන මා සමඟ මුණ ගැසී කතා කරන්නට තරම් විවේකයක් ඒ සති අන්තයේ පද්මිනීගේ පියාට නොවිණි. එහෙත් වනිතා පක්ෂය එනම් මවත් කල්‍යාණීත් අතර ප්‍රශ්නය සාකච්ඡා වී යෝජනාවක් සකස් වී තිබිණි. එය කොටස් දෙකකින් යුක්ත විය. එක. මා වහාම වෙනත් පළාතකට පත් වීමක් ගත යුතුය. දෙක. එතෙක් පද්මිනී කොළඹ ගෙදර නතර විය යුතුය. පළමු වැනි කාරණය ගැන වචනයක් නො දූන් මම දෙවැන්නට එක හෙළා එකඟ වීමි. මා ආපසු යන්නට කලින් කල්‍යාණි ප්‍රශ්නය ගැන කතා කර මාරුවක් සඳහා කැමති තැනක් නම් කරන ලෙස මට කීවායි.

මහන්සි වී වැඩ කළොත් උසස් වීමකට රජරට ඇති ඉඩකඩ මම ඇයට පෙන්වා දුනිමි.

"ඔය තරම් මැරෙන්න ඕනෑද නිමල් උසස් වෙන්න? කියන්නකෝ ඔයාට කැමති මොකක්ද කියල. අමාත්‍යාංශයට එන්න ඕනෑ ද? වෙන දෙපාර්තුමේන්තුවක් ? නැත්නම් මම හොඳ වැඩක් කියන්නම්. කැමති රටක් කියන්න ශිෂ්‍යත්වයක් හදල දෙන්නම්. කැමති කාලෙකට නංගීත් එක්කලම යන්න"

මම මදක් කතා නැතිව උන්නෙමි. පිටරට යන ඩිකුරකුට සුව පතනු පිණිස කටුනායකට ගිය ගමනක් මට වහා සිහිපත් විය.

"මොනවද නිමල් ආණ්ඩුවෙන් ඕනෑ වැඩක් කරගන්න පුළුවන්කම තියෙද්දී?

"ඒක නම් ඇත්ත අක්ක. හමුත්......." වයසින් මට වඩා බාලද වැඩිමල්ද යි නොදනම මා මුල සිටම කල්‍යාණි ඇමතුවේ එලෙසිනි..... "හමුත් එහෙම උසස් වීමක් අරගෙන බැරි වෙලා හරි මේ ආණ්ඩුව වෙනස් වුණොත්?"

"ඉතින් ? මොකද?"

"මට නවතින්න වෙයි සයිබීරියාවක"

For E-Pusthakalaya

කල්‍යාණි රාජසේකර කොක් හඬලා සිනා සෙන්නට වූවාය. මම ඇයගේ සුරූපී මුහුණ වඩාත් රතු වී ගෙන යන හැටි විමතියෙන් බලා සිටියෙමි.

"ඇයි අක්කලට ඒ තරම් විශ්වාසයි මේ ආණ්ඩුව වෙනස් වෙන්නෙ නෑ කියල. සදාකාලිකව ම?"

"තාත්තල අයියල මොනව හිතාගෙන ඉන්නව ද මම දන්නෑ නිමල්. ඡන්දයක් ළංවෙන කොට එහෙම තත්වයක් පෙනුනොත් මම එක පැත්තක් ගන්නව. රාජ්ට කියනව අනිත් පැත්ත ගන්න. ඉවරයිනෙ "

"හොඳ අදහස"

"ඇරත් ළමය අද කොළඹ හතේ ගෑනුන්ට අල්මාරිවල ඕන පාටක සාරි තියෙනව විතරක් නොවී ඕන සාරිය තෝර ගන්නත් උන්ට පුළුවන්. ආණ්ඩුව වෙනස් වුණොත් මම කරන්නෙ සාරියෙ පාට වෙනස් කර ගෙන රාජ්ට ගැළපෙන පාටක ටයි එකක් හොයල දෙන එක් විතරයි." කල්‍යාණි නැවත සිනාසෙන්නට වූවාය.

ඇය "අපි කොළඹ හතේ ගෑනු" යි තමා ගැන කියා ගත්තේ හත් මුතු පරම්පරාවේ සිටම කුරුඳු වත්තෙන් පැවත එන්නන් ලෙසිනි.

කල්‍යාණි එසේ සහයෝගයේ අත දිගු කරගෙන ආ නමුත් එදා මා පිටත් වීමට කලින් කෑම මේසයේදී මුණ ගැසුණු විපුල සේනාරත්න ආහාරයෙන් පසුව මට කතා කළේ වෙව්ලමිනි.

කිසිදු සැපපහසු කමක් නැති ඈත පිටිසරකට තම නැගණිය කැඳවා ගෙන ගොස් මා ඇයට කරන්නේ බලවත් අසාධාරණයක් සහ අපරාධයක්යැයි ඔහු කෝපයට පත්ව සිටියේය.නාගරයකට මාරුවීමක් නොගෙන මා මෙසේ ක්‍රියා කිරීම හිතුවක්කාරකමක් සහ පවුලට අවනම්බුවක් ද, මගේ පහත් තත්ත්වයට පද්මිනීද ඇද ගැනීමට ගත් වෑයමක්ද යනු ඔහුගේ හැඟීම විය. නැගණියගේ සිත රිදවන්නට බැරි සිත රිදවන්නට බැරි කමට මේ විවාහයට කැමති වුණත් ඇයට මෙසේ වධ හිංසා පැමිණ වීමට තමා ඉඩ දෙන්නේ නැතැයි ඔහු තරවටුවක් ලෙසින් මට කීය.

අනික් පයින් ගහ ගැනීමට සූදානම් නැත්නම් කතාවට නොයා යුතු බව ඔහුගේ කෝපාවිෂ්ට මුහුණ මට අවවාද කළේය.

මැණියන් කිසිවක් නො කිව්වත් ඇයද පුතා කී සියල්ල අනු...



කරන බව සිතා ගත හැකි විය. මෙහිදී පද්මිනීට කරන්නට දෙයක් නොතිබුණත් ඇයගේ නිශ්ශබ්ද භාවයද මගේ දුඹ් වේදනාවටහේතු විය.

"නංගී මෙහෙට වෙලා ඉන්න ගෙදර ඉඩ නැතුව යැයි"කතාව අවසාන කරමින් නැගිට ගත් විපුල "උසස් තැනකට යන්න බැරි නම් ඩී.ආර්. ඕ.කමත් අත්ඇර දාල ලංගම ඩ්‍රයිවර් කෙනෙක් වෙන එකනෙ තියෙන්නෙ" යි කීවේ ඈතට යමිනි.

මා පුදුමෙන් නැගිට්ටේ තවදුරටත් නිශ්ශබ්දව සිටීම නාත්තාට කරන මදිකමක් යැ යි මතක් වීමෙන් උපන් කෝපයෙනි.

"අයියාගෙ හැටි ඔහොම තමා අනේ" කියාගෙන පද්මිනී මගේ අතින් අල්ලා ගත්තාය.

මා එදා සේනානි නිවසෙන් පිටවූයේ කෙසේ හෝ මගේම උත්සාහයෙන් පදවිය උසස් කර ගනිමි යි අධිෂ්ඨානයෙනි.

තරමේ හැටියට මට දූන් දෑවැද්ද වැඩියැයි හැඟීමක් කලින්ද විපුල තුළ පැවැති බව මම දන සිටියෙමි.ඒ ඔස්සේ මට කල්පනා කරන්නට තවත් කරුණක් විය. පවුලට මා එකතු කර ගැනිමට එකඟ වූ තමන් හා සම තත්ත්වයේ දමා මා සලකන්නට ඔවුන් අදහ් කැමති නැත.

ධනය හරිහම්බකර එමගින් ඔවුන් හා සම තතත්වයේ ළං වීමේ සුළුවන්කමක් මට නැත. බිරිඳගේ පවුලත් මාත් අතර ඇති මේ දුරස්තර ගතිය අඩු කර ගැනීමට ඇති එකම ඉඩ මගේ පදවිය අතින් උසස් වීමයි. ඉහළ තනතුර වුවද ඔවුන්ගේ ආධාරයෙන් යෑමෙන් වැඩක් නැත. එමගින් මගේ අරමුණු ඉටු නොවේ. මට වන්නේ තව තවත් ඔවුනට බාල්දු වීමටය. මගේ තත්ත්වය ඊක ගැනීමට නම් ස්වාධීනව නිදහස්ව උසස් විය යුතුය. විශ්ව විද්‍යාලයේ ඉගෙන ගත්තා කාලයේ උසස් වන ආශාවන් නොවීම ගැන මම කෙතරම් පසුතැවිලි වූයෙමි ද?

මා දූන් ගත යුතු හොඳම පියවර, මෙහි පත්ව ආ මුල දවස්වල අදහස් කළ පරිදි රජ රට සංවර්ධනයට ක්‍රමානුකූල සැලැස්මක් පිළියෙළ කර ඒ අනුව ක්‍රියා කිරීමයි. එය සාර්ථක වීමේදී නිරායාසයෙන්ම මා වෙත ඇදී එන්නට ඉඩ ඇතැයි එද සිතුණු ප්‍රසිද්ධිය හා දියුණුව කෙසේ හෝ ලබාගැනීමට මම අධිෂ්ඨාන කර ගතිමි.

Buddhika 23

පද්මිනී කොළඹ නතරවීම නිසා රාජකාරී වේලාවන් පසුව මට

Free E-Pusthakalaya

මේ ගැන සිත යොමු කරන්නට තරම් විවේකයක් ද ලැබිණි. [illegible] වැඩ පිළිවෙළ ගැනම අලුතින් සිතන්නට සිදුවූයේ මුල් අස්වැන්න තුළින් ජනපද ගොවියාගේ දියුණුවක් ලෙස මා දුටු තත්ත්වය සම්බන්ධව මහින්ද ගුණරත්න තවත් අයත් විසින් පෙන්වන ලද චිත්‍රය යථාර්ථයේ පිළිබිඹුව බව කාලයා විසින් ඒත්තු ගන්වා තිබීම නිසාය. කොයම් පැසෙන කාලයට කුඹුරුවල දක්නට තිබුණු සෞභාග්‍යය ගොවියාගේ ජීවිතයේ නොවුණු බව මම අත් දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කර ගතිමි. අත මිට සරු කාලයේ තාවකාලික ලෙස ඔවුන්ගේ ජීවිත හරහා වැටී තිබුණේ අස්වැන්නේ ප්‍රතිඵල වෙළෙල් සිට කඩයට යන අතර මග වැටුණු කෙවතැල්ලක් පමණි. මිත්‍රයන් නී අනෙක් කරුණු ද සැබෑ වන්නට ගෙන තිබිණි.

මාසයක් හමාරක් යන්නටත් කලින් ඔවුන් අත ගැවසුණු මුදල් හදල් වැය වී හමාර විය. අලුතින් එක ගෙදරට සීපය බැගින් ගත් මහන මැෂින් බයිසිකල් හා රේඩියෝ ආදිය පමණක් නොව සමහරක් ගෘහ භාණ්ඩ පවා මුදලට මුදලාලිලාට විකුණන්නට වූහ.

කොළ පිටින් වී විකුණා හමාර වී තිබුණෙන් වැඩි දෙනෙකුට වේල පිරිමසින්නට සිදු වූයේ තාන්වලිනි. ඒ ළඟ කන්නය වපුරා ගැනීමේදී මුදලාලිලාට ණය වීමට සිදු විය.

මේ යථාර්ථයට මුහුණ දීමේදී ගොවියන් ගැන උපන් සංවේගය හා වේදනාව යට පත් කර ගත් මම මේ තත්ත්වය මට මේ තත්ත්වය මට යහපතක් විය හැකි අතකට හරවා ගැනීමේ අපේක්ෂාවක් ඉස්මතු කර ගතිමි. ඒ අනුව වගාවට අදාළ සියලුම දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කෙරෙන නව සංවර්ධන යෝජනා ක්‍රමයක් සකස් කිරීම, නිලධාරීන්ගේ අල්ලස් හා දූෂණ මැඩීම, ගොවීන් ණය බරින් මිදීම හා වාම් - සැකසුරුවම් සහිත ජීවන රටාවකට පුරුදු පුහුණු කරවනු වස් මිනිසුන්ගේ සිතුම් පැතුම්වල වෙනසක් ඇති වන අන්දමේ සංස්කෘතික පුනර්ජවනයක් ඇති කිරීම යනාදී අංශයන් ගෙන් යුත් වැඩපිළිවෙළක් සකස් කිරීමට මම තීරණය කර ගතිමි.

මෙම අදහස් සිතට නැගෙන්ම අලුත් උද්යෝගයකින් හා ජීවයකින් යුත් මගේ සිත අවදි වන්නට විය. නිසැකයෙන්ම මම බලාපොරොත්තු වන අන්දමේ සැලැස්මක් ඉහළ නිලධාරීනට ඉදිරිපත් කළොත් මුළු රාජ්‍ය තන්ත්‍රයේම සැලකිල්ල මා වෙත යොමු වනු ඇත. පුවත්පත්වලින් පවා සන්තසින් ම විශාල ප්‍රචාරයක් ලැබෙනු ඇත. සමස්ත ජනතා ව්‍යාපාරයම අයත් වන අන්දමේ එවැන්නක් "හතුරුසිංහ යෝජනා ක්‍රමය" යනුවෙන් ප්‍රසිද්ධ වීමට වුවද ඉඩ තිබේ.

Buddhika 15



එහිදී විපුලගේ ආඩම්බර බැලීමට හෝ ඉහළ තැනකට යෑම සඳහා කල්‍යාණීගේ පිහිට පැතීමට හෝ සිදු නොවනු ඇත. මට පද්මිනීත් සමග ආත්ම ගෞරවයෙන් යුතුව වෙනම ම පැවැත්මක් ගෙන යෑමට අවස්ථාව පැමිණෙනු ඇත.

## 20

ශ්‍රී තිමත් යැයි ම විසින් සිතන ලද නැතහොත් සිතන්නට උත්සාහ කරන ලද ඒ කාලය ඉතා කෙටි - තාවකාලික එකක් විය. බලාපොරොත්තු හා ප්‍රාර්ථනා සුන්කරමින් සතුට පමණක් නොව සතුටක් යැයි දෙයක් ලබා ගැනීමට තිබුණු සියලු ඉඩ කඩ ද විනාශ කරමින් ඊළඟ අවුරුද්ද ඇතුළත මගේ ජීවිතය වෙනස් වූයේ, ඉතා වේගයෙනි.

මගේ ගෘහ ජීවිතයත් රාජකාරී ජීවිතයත් යන දෙකම ගැන ම විසින් මවන ලද සිහින ලෝකය කැබලිවලට කඩා වැටුණේ එකවර ය. සමාන්තරව ය. එනිසා එක පරාජයක් ගැන සිතා ඇති වන පීඩනය අනෙක් ජයග්‍රහණය ගැන සිතා තුනී කර ගන්නට පුළුවන් කමක් මට නොවිණි.

මා ලියවිල්ලකින් දිසාපතිට ඉදිරිපත් කළ සැලැස්ම හන්ස් පෙට්ටියට ගියේය. එහි අඩංගු සමහර කරුණු සාකච්ඡාවකදී ඉදිරිපත් කරනු ලැබූ විට නිලධාරීන්ගේ සිනාවට භාජනය විය.

මිනිසුන්ගේ සිතුම්පැතුම් වෙනස් කරවීම අරමුණු කොට ගෙන කලා හා සංස්කෘතික ව්‍යාපාරයක් සංවිධානය කිරීමට අවසාන ප්‍රයත්නයක් වශයෙන් මම ආරම්භ කළෙමි. "නැටුම් ගැයුම් නොව අපට වතුර හා ඉඩම් දෙන්න යැ" යි ගොවියෝ කීහ. "අපට රක්ෂාවල් දෙන්න. නටන්න සිංදු කියන්න පස්සෙ පුළුවනැ" යි තරුණයෝ කෑ ගැසූහ. ඒ ව්‍යාපාරයේ ආරම්භය ම එහි අවසානය ද විය.

විපුලගේ අදහස් පමණක් නොව ඔහුගේ තරවටුව ද පියාගෙන් අනුමත වී තිබිණි. ඉන් පසු කිසි දවසක ඔවුන් මා සමඟ කතා කළේ නැත. අනික් අයගේ ආදර සැලකිලි පවා හදිසියේ හීන විය. ඉවෝන් පමණක් අප බැල්මෙන් බලා සිටියාය. පද්මිනී නොවන්නට මම සේනාති

For E-Pusthakalaya

නිවසට කල්ලතෝනියෙක් වීමි.

කලනානි ඉදිරියේ මා පිළිගත් කොන්දේසි අනුව පුවද නැවත රජ රට පදිංචියට පැමිනීමට කතා කිරීමේ අයිතියක් කෙසේ වෙතත් යුතුකමක් මට නොවිණි. මා අධ්‍යයන පැවැති එකම විසඳුම අන් තැනකට මාරුවක් ගැනීමයි. එය බිරිඳගේ තත්ත්වය හා යහපත අනුව මා වෙනස් නොවිය යුතුයැ යි කලින් ඇති කර ගත් අදහසට පටහැනිය. මා මාරුවක් ගන්නට පසුබට වුණු අනෙක් ප්‍රධාන හේතුව මේ යෝජනාව බිරිඳ ගෙන්ම ඉදිරිපත් වනු දැක්ම මගේ ආශාව හා බලාපොරොත්තුව ද විමයි. නො කැමැත්තෙන් හෝ මා සේනානි නිවසට ගියේ ඒ හැඟීම උඩය. එහෙත් දුක් ගැනවිල්ලක් හෝ පැමිණිල්ලක් ලෙසවත් "කවදැ අනේ ඔයා මාරුවක් ගන්නෙ? මෙහෙම දෙන්න දෙපොළෙ ඉන්නෙ පුළුවන් ද?" යන අදහස කිසි දවසක පළ නොකළ පද්මිනී "නිමල් ඔයා දවස් දෙක තුනක් ඉඳල නේද යන්නෙ?" යි මගේ ඇඟේ වෙළෙමින් ඇසුවා ය. අනෙක් අය පද්මිනී කොළඹ සිටියොත් මා කොහේ සිටියත් කමක් නැතැයි මගේ පැත්ත එහෙම පිටින් අමතක කර දමා හැසිරුණු අතර ඇය "එයා එහෙ ඉන්න, මම මෙහේ ඉන්නම්"යන පිළිවෙළ අනුගමනය කිරීම මගේ දැඩි සිත් වේදනාවට හේතුවක් විය.

මගේ වේදනාව පද්මිනීට කිසි සේත් රහසක් වන්නට බැරිය. තමා නිසා මා සිත් තැවුලට පත් අන් හැම අවස්ථාවකදී මෙන්ම මේ තත්ත්වය යටතේ ද ඇය කළේ මිනිස් දුබල කම් ඉදිරියේ ගැහැනියක ලෙස තමා සතු බලපෑම් වාසියට ගැනීමයි. ඒ හැම විටම ඇයගේ බලපෑමට මම යට වීමි. අන්තිමට කළකිරීමෙන් ද ආත්ම පරාජය පිළිබඳ හැඟීමෙන් ද අතිශයින් පීඩා වින්දෙමි.පීඩනයෙන් මිදිය හැකිව තිබුණු එකම මග ඇය මුණ ගැසීමෙන් වැළකී සිටීමයි.

එය කළ යුතු ද නැද්දැයි සිතන්නට හෝ තීරණයක් ගන්නට හෝ ඉඩක් ලැබෙන්නටත් කලින් මා කොළඹ ගිය ගමනකදී ඇය මුණ ගැසීමේ අවස්ථාව මුලුමනින් ම අහිමි විය. ඒ සති අන්තයේ මා ඇය බැලීමට එන බව ඇය විසින් දැන සිටිය යුතුව තිබිණි. එහෙත් මා රෑ අටට පමණ "සේනානි" නිවසට ළඟා වන විට පද්මිනී දක්නට නො වූවාය. මේ වන විට පවුලේ අනෙක් අයත් මාත් අතර සබඳතාවය සකස් වී තිබුණු ආකාරයට, "එළියට ගිහිල්ලා කීයට එයි ද දන්නෙ නැහැ" යි දුන් පිළිතුරකින් තෘප්තිමත් වීමට සිදු විය.

ඇයගේ සමාජ මට්ටමේ ගැහැනියක රෑ අට වන තුරු පිටත ඒ දී සිටීම සිත කලබල කැර ගැනීමට තරම් අයථා හැසිරීමක් ... එහෙත් පිටු දකීමට බැරි අන්දමේ චිත්ත පීඩනයක් මතු කරන

Bodhika



මා ඉදිරියේ නොවුණා ද නොවේ.

"නිමල් අද එයි. මම වුට්ටක් එනව කියන්න" යන විදිහේ පණිවිඩයක් තබා යන්නටවත් ඕනෑ කමක් ඇය වෙත තිබී නැත.

සමහර විට ඇය එසේ කියා යන්නට ඉඩ තිබුණත් ඒ බව මට දැන්වීමටවත් උනන්දුවක් ගෙදර අනෙක් අයට නොතිබෙන්නට පුළුවන.

අනෙක් අතට මගේ බිරිඳ ආ ගිය තැන් ගැන වෙනත් කෙනෙකුගේ හාරා හාරා ප්‍රශ්න කර දැන ගැනීමට ඇති වුවමනාව කුමක් දැයි මම තරමෙහත් සිතුවෙමි.

පද්මිනී ගෙදර එන වේලාව කිසිවකු නොදන සිටිම වෙනම කරුණකි.

"එයා කීයට ආවත් මූණ කට හෝදල මොකුත් බිල ඉන්නකෝ" යි කියන සීමාවේ ශිෂ්ටත්වයක් වත් ඔවුන්ගෙන් නොදක්විණි.

මෙබඳු අකාරුණාවන්ත සංග්‍රහයකින් යුතුව - පද්මිනී ගිය තැනක් හෝ එන වේලාවක් හෝ නො දන "සේනානි" නිවසේ තවත් මොහොතක් රැඳී සිටීම ආත්ම වධකයට වඩා නිවට කමක් ලෙස මට හැඟිණි. සිත්පිත් නැති එකියක සේ මා මෙවන් අසරණ තත්වයකට පත් කිරීම ගැන මා තුළ වැඩෙන්නට වූයේ වෛරයකි, ද්වේෂයකි. පළිගැනීමක් වැනි ක්‍රියාවකින් මෙම කටුක හැඟීම් පිට කිරීමේ අවස්ථාවක් ලබා ගනු වස් ඇය ඉක්මනින් මුණ ගැසීමේ දැඩි නො ඉවසිල්ලකින් මම පිස්සු වැටුණෙමි. සියල්ල යටපත් කර ගෙන අන්තිමට හිස ඔසවන්නේ අවලක්ෂණ ඊර්ෂ්‍යාවකි.

මා ගේට්ටුවෙන් පිටව ග්‍රෙගරි පාරට පිවිසියේ ක්‍රියා කෙරෙන වාහනය මෙන්ම සිතකින් තොරවය. මොහොතකට මගේ හදවත හැඟීමක් නොදැනෙන ගලක් බවට පත් විය. ඒ තත්ත්වය දිගටම පවත්වා ගෙන යෑමට මම උත්සාහ නොකළෙමි. ගෙදර බලා ගමන් කරන බව මට අවබෝධ වූයේ කොළඹ සීමාවෙන් පිට වීමෙන් පසුවය. මම වේගය වැඩි කළෙමි.

රථයේ එළියට අසු වුණු නිවස අමු සොහොනක් ලෙස පෙනෙන්නට විය. ජීවිතයෙන් වැඩි කාලයක් බස් පැදවීමට කැප කළ කාන්තා හඬ අනුව ඇතදීම මගේ වාහනය හඳුනා ගෙන සිටින්නට ඇත. මා එය පෝටිකෝව යට නතර කරත් ම ඔහු ඉස්සරහ දොරෙ විවෘත කළේය.

මා ගෙට ගොඩ වූයේ මිනියක් මරා එන එකකු සේ වකිතයෙනි.

"ලොකු පුතාවත් ද?" යි අම්මා ඇඳේ සිට ම ඇසුවාය.

"ඇවිත් බලමුකෝ" යි කනප්පුවක් මත දල්වෙමින් තිබුණු චිමිනි ලාම්පුවේ එළිය වැඩි කරමින් තාත්තා කීවේ සුපුරුදු සිනාවෙන් යුතුව ය.

යට සායකින් සැරසී - උඩුකය චීත්තයකින් පොරවා ගත් අම්මා කොණ්ඩය බඳිමින් සාලයට ආවාය. ඇයගේ මුහුණ ඉදිමුනු ගතියකින් පෙනුණේ නිදිමත නිසා ය යි නිගමනය කොට වැඩි දුර සිත මෙහෙයවීම වළක්වා ගැනීමට මම සමත් වීමි.

"ලොකු පුතා කොළඹ ඉඳල ද? නැත්නම් කෙළින්ම එන ගමන් ද? යි තාත්තා ඇසුවේ නැත.

"ලොකු පුතා කාලා නැතුව ඇති" අම්මා කීවාය.

"මම කෑම කාලා අම්මෙ ආවෙ" යි කී මම සැටියේ වාඩි වීමි. තාත්තාත් අම්මාත් මවිත වී සිටිතැයි සිතන්නට මට ඕනෑ විය. එහෙත් එබඳු කිසිම ලකුණක් ඔවුන්ගේ මුහුණුවල නොවී ය. තාත්තා ද අසුනක හිඳ ගත්තේය.

"තිස්සට මේ තරම්මත් නින්ද ගිහිල්ල ද?" ඔහු කීය.

"ඔහේ නිදා ගත්තාවෙ" මම පහත් හඬින් කීවෙමි.

අම්මා කුප්පි ලාම්පුවක් දල්වා ගෙන මගේ කාමරයට ගියාය.

"පාළු ගෙදේ මේවයෙ නිදා ගන්නවත් පුළුවන්ද මම දන්නෙ නෑ" යි ඇය ඇඳට අලුතින් රෙද්දක් දමමින් කියනු මට ඇසිණි.

"ලොකු පුතාට කෝපි ටිකක් හදල දෙන්න ද?" නැවත සාලෙට එමින් අම්මා ඇසුවාය.

"අහන්නත් දෙයක්යැ? හදන එකනෙ" යි කීවේ තාත්තා ය.

"නෑ අම්මෙ ඕනෑ නෑ. කෝපි බිව්වොත් නිදිමත යනවා"

"ඔව් මාත්සික් ඇතිනෙ. අන්න මම ඇඳ ලෑස්ති කළා." යි කී නමුදු අම්මාත් ඉදිරිපස පුටුවක වාඩි වී මා දෙස බලා ගත් වනම සිටියාය.

කතා බහක් නැතිව විනාඩි දෙකක් පමණ ගත වන්නට ඇත. ඇසිය යුතු ප්‍රශ්න කොතෙක් තිබිය හැකි ද? අහොක් අ[illegible]



[illegible]නවා අසන්න ද? මා මෙන් සරසවියක අධ්‍යාපනයක් නොලද නමුදු අම්මාත් තාත්තාත් මට වඩා දීර්ඝ කාලයක් ජීවිතය දකීමේ පළපුරුද්ද ඇත්තෝය.

ඔවුන් දෙදෙනා එකට ගෙන සිප ගැනීමේ තරම් ශෝකයක් මට ඇති විය.

"නිදා ගම්මු නිදා ගම්මු" යි පුටුවෙන් නැගිටිමින් තාත්තා කීවේ සමස්ත යථාර්ථයම ගැබ් කර ගත් හඬකිනි. ඔහුගේ වචනවල ඉලක්කය අම්මාත් මාත් දෙදෙනාම ය.

"ඔහේ කර ගත්ත දේවල්. ඔහේගේ තීන්දුව, දැන් ඉතින් සේරම ඉවරයි. දැන් ඕව ගැන තවත් කල්පනා කරල වැඩක් නෑ" යනුවෙන් ඒ වචන මගින් තාත්තා අම්මාට කියන්නට ඇත්තේ.

"උඹේ ඉරණම ලොකු පුතේ, මට ඕවට කරන්න මොකුත් නෑ" යනුවෙනි.

කුමක් ගැන සිතමින් සිටියදී කවර අවස්ථාවක නින්ද ගියේ දැයි මම නොදනිමි. පසුවද අවදි වුනු විගස මට සිතුණේ මා රජ රට නවාතැනෙහි සිටිව බවකි. නොපමාව නිරවුල් වුණු සිතට කලින් ද සිද්ධි මාලාව වහා ඇතුළ වන්නට විය. මම කොළඹ යා යුත්තෙම් ද? පද්මිනී කණගාටුව පළ කරනු ඇද්ද? සමහර විට මා පැමිණි බවවත් අනෙක් කිසිවකු ඇයට නො දන්නවා සිටීමට පවා ඉඩ තිබේ.

මම ඉතා හදිසි තීරණයකට බැස ගතිමි. ඉක්මනින් ඇඳ පැළඳ ගත් මම රජරට බලා පිටත් වීමි.

මම පද්මිනීට දිග ලිපියක් ලීවෙමි. එය නැවත කියවා ගෙන යැමේදී මා ගැනම තරහක් මට ඇති විය. මම එය ඉරා දැමුවෙමි. සති අන්තයෙන් පසුව කාර්යාලයට ගිය තැන ඇය මට ටෙලිෆෝන් කරනු ඇතැයි මම දවස මුලුල්ලේ ම බලාපොරොත්තුව සිටියෙමි. එය නාද වන හැම විටම මා රිසිවරය ගත්තේ තිගැස්සුණු සිතින් යුතුව ය.

නිසැකයෙන් ම මා එහි ගිය බව ගෙදර අය ඇයට දන්වන්නට නැත. එනිසා මම ඇයට ලිපියක් ලිවිය යුතුව ඇත්තෙමි. මා සේනානියට ගිය බවත් ඇය නොසිටි නිසා ආපසු පැමිණි බවත් මම ඒ කෙටි ලිපියේ සඳහන් කළෙමි. ඒ අතර ඇයට රිදවීමේ ද්වේෂ සහගත චේතනාවකින් චේතනාවකින් මම පීඩා වින්දෙමි. මම ද්වේෂ සහගත චේතනාවකින් මම පීඩා වින්දෙමි. මම එම ද්වේෂය පිටකර ගත්තේ "ගෙදර සිටින වේලාවක් හරියටම දන්වන්න. එවිට මට එන හැකියි" යනුවෙන් සඳහන්

For E-Pustakalaya

කිරීමෙනි.

ඇයගෙන් ලිපියක් ආවේය. එහෙත් එය මා යැවූ එකට පිලිතුරක් නොවේ. "සතුට මා වෙත නොඑත් නම් මම සතුට සොයා යා යුත්තෙමි" වැනි අදහසක් ඇය ලියා තිබුණු කරුණුවල සාරාංශය වශයෙන් දක්විය හැකිය.

මගෙන් සැතපුම් එකසිය ගණනක ඈත - කොළඹට වී පද්මිනී සිල් රකින එකක් නැත යන නග්න සත්‍ය මා ඉදිරියේ මැවී ගියේ මෙහිදීය. ඊර්ෂ්‍යාව,ක්‍රෝධය, ශෝකය, ලජ්ජාව ආදී සියලු කර්කශ වේදනාවන් එකතුව ගෙන දුන් පීඩාවෙන් මිදෙනු වස් මම ඇය මුණ ගැසීමට තීරණය කර ගතිමි.

ඇය කලින් දවසේ යහළුවන් පිරිසක් සමග නුවරඑළි ගිය බවක් මා දැන ගත්තේ ඉවෝන්ගෙනි. කා සමගද යි එහි දී නො අසා සිටින්නට මම අසමත් වීමි.

"එක්කෙනෙක් කියල නැහැ" යි කී ඉවෝන් මා දෙස බලා සිටියාය. සාගින්න හා පිපාසය පිළිබඳ අසහනයකට අමතරව ජයග්‍රහණයක හැඟීමක් ඒ අවලක්ෂණ මුහුණ මැද වූ පුංචි වූ ඇස්වල නලියමින් තිබිණි.

ඉංග්‍රීසි භාෂාවෙන් "යහළු"ශබ්දයට ලිංග භේදයක් නැත.

ඊළඟ පෝද පුවත් පතක පළ වී තිබුණු පිංතූරයක් මා කෝපයෙන් ශෝකයෙන් හා ලැජ්ජාවෙන් මුසපත් කළේය. නුවර එළියේ ඉහළ පංතියේ හෝටලයකට සම්බන්ධ රාත්‍රී සමාජ ඉහළ පංතියේ හෝටලයක සම්බන්ධ රාත්‍රී සමාජ ශාලාවක එළි වන තුරු පැවැති නැටුමක දී එහි සිටි කාගේත් වඩාම නෙත් සිත් ඇද ගත්තේ යැයි, විස්තරයක් ද ඇතිව පළ වී තිබුණු ඒ පින්තූරය මගේ බිරිඳගේ ය. මිනි ගවුමෙන් කෙටිම එකෙන් සැරසී "ඇඳට යමල්ලා" යන රිද්මය නැගෙන රැගුමක යෙදුණු පද්මිනී නටමින් සිටියේ කැමරාවට පිටු පා උන් පිරිමියකු වෙත අඩවන් ඇසින් යොමා ගත් බැල්ම ඇතිවය. බැල්මෙන් පිරිමියෙකු වෙත ඇති කළ හැකි හැම බලපෑමක් ම පද්මිනී මා කෙරෙහි ඇති කර තිබිණැයි සිතා සිටි නමුත් ඒ පිංතූරයේ වැනි ඇස් ඇයගෙන් ඊට පෙර මා දැක තිබුනේ නැත. මගේම කාර්යාලයේ දී හා කැවෙඩිරියේ දීත් යන සහ අන් තැන්වල දීත් හැම දෙනාම මග හරින්නට එද මම පෙළැඹුණෙමි. සමාජයෙන් ඈත් වී තනි වීමේ වුවමනාව මගේ සිතට කා වැදුණේ එලෙසිනි.



මාස කීපයකට උඩදී පද්මිනී අන්තිමට කොළඹ ගියේ දෙදිනකින් ආපසු එන බලාපොරොත්තුව ඇතිවය.

ගෙදරක් මේ තරම් පාළු විය හැකි දැයි සිතිය නො හැකි තරම් දැඩි මුසලකමක් නවාතැන පුරා පැතිර ගියේ ය. ඇඳ කන්නාඩි මේසය, සුවඳ විලවුන් සහ ඇඳුම් ආදී පද්මිනී පරිහරණය කළ ඇතැම් බඩුමුට්ටු වලින් තවමත් පිරුණු නිදන කාමරය වසා දමූ මම මගේ ප්‍රයෝජනය සඳහා අන් තැනක් පිළියෙළ කර ගතිමි. කතියන තුවාලයක් ලෙස නිරන්තරව දැවුණු සිත් තැවුලට එය කිසිසේත් පිළිමයක් වූයේ නැත. පාළු ගතියෙන් මුසලකමින් හා චිත්ත පීඩනයෙන් පැන යනු පිණිස මම සවස් කාලයට වැව් තෙරට හෝ වෙල් නීරයක, වන පෙතක, පාළු තැනක හෝ ගොස් හුදකලා වී බලා ගත් අතබලා ගෙන සිටින කල නිරතුරුව මතක් වන්නට වූයේ කලකට උඩ දී පද්මිනී ළං කරගෙන මෙවැනි තණ්හී සැඳෑ සුව විඳි ආකාරයයි. ඒ මතක සටහන් අතරින් හදිසියේ පුවත් පතෙහි පළ වී තිබුණු පද්මිනීගේ ඡායාරූපයක මතු වන්නේ මගේ හදවත කැබලි කරමිනි. මට පිටුපා සිටින පිරිමියෙකු සමග ඇය හැම තැනම නටන හැටි මට පෙනේ. මගේ හදවත කැබලි කරවමිනි. මට පිටුපා සිටින පිරිමියා කවරෙක්දැයි සිතන්නට මම "සේනානී" නිවසට යන එන සියලු දෙනාගේ ම හැඩහීල සිතට නගා ගන්නට මහන්සි ගතිමි. ඒ වැයමේදී වේදනාවෙන් වෙහෙසට ගන්වන සිතෙහි පද්මිණි හතුරුසිංහගේ පමණක් නොව, පද්මිනි සේනාරත්න ගේ ජීවිතයත් මෙමෙහෙම නො වූයේද?

වද විඳින චිත්තය සැනසීමක් ඉල්ලා කෑගසයි. ඒ හඬ නොතකා නිහඬ වූනොත් මා උමතු වනු ඇත.

අමු සොහොනකට - අපායකට වූවත් කමක් නැතැයි සිතා මා අවසන් වරට "සේනානි" නිවසට යන්නට තීරණය කර ගත්තේ සඳ කාලික අමුසොහොනක් අපායක් බවට පත්වන ජීවිතයකට සහනයක් ලද හැකි එකම මඟ ලෙස කළ යුත්තේ එය නම් එවැනි තැනක ලද හැකි එකම මඟ ලෙස කළ යුත්තේ එය නම් එවැනි තැනක තාවකාලික ගින්දරකට අසු වූනත් කමක් නැතැයි හැඟීමෙන්ය. එහෙත් එක් වරුද සැන්දෑවක හතට අටට කොළඹින් පැමිණි මම එක් වර ම පද්මිනී ගේ නිවසට නොගොස් පිටත සිට ටෙලිෆෝන් කළෙමි. උත්තර දෙන්නට ආවේ නාලිනීය.

"අක්කා එළියට ගිහිල්ලා, කොහේ ගියාද කියට එයිද දන්නෙ නෑ" යන්න පිළිතුර විය. ඈ මට කලින් පිළිවරය බිම තැබුවාය. මම අනාර හැඟීමකින් "ගුරු ගුරු" යන හිස් හඬට කන් දී ගෙන තත්පර

Buddhika

කිහිපයක් සිටියෙමි.

බිරිඳක නිසා පිරිමියෙකුට විඳින්න යන දුෂ්ටම වේදනාවන් විඳගු වූ මම පැයක් පමණ කාලයක් කිසි අරමුණක් නොමැතිව අගනුවර මාවත් ඔස්සේ රිය පැදවීමි. ඒ උමතු ගමනේදී මම හෝටල් කීපයක් පසු කර ගෙන ගියෙමි. ඒ හැම තැනකට ම ඇතුළු වන්නට මට සිතිණි. පද්මිනී ඒ හැම හෝටලයකම කිසිවකු සමග නටමින් ඇතැයි මට සිතිණි. වරක් මම ගාලු මුවදෙර පාරට වැටුණෙමි. පිට්ටනිය කෙළවරක සිට අනෙක් කෙළවර දක්වා අඩ අඳුරේ පේළියට නතර කර තිබුණු හැම එකකම කිසිවකු සමග තුරුළු වී පද්මිනී ද ඇතැයි සිතන්නට සිතින් මවා ගන්නට මට ඕනෑ විය.

හදවත වේදනාවෙන් පදම් වී ගොස් සිත තරමක් නැන්පත් වෙත් ම මට හදිස්සියේ මතක් වූයේ කල්‍යාණි ය. මට දැනුණු සැනසීම අප්‍රමාණ විය. කල්‍යාණි තවමත් මට හිතවත්කමක් දක්වයි. එසේ නැත්නම් මට ඇය තවමත් අහිතවත් වී නැත. එහි ද යන්නට කලින් ටෙලිෆෝන් කර බැලිය යුතු දැයි නැද්දැයි කල්පනා කරමින් ම මා විසින් පැදවුණු රිය සිත් පිත් ඇති ලෙසින් ගාලු පාර ඔස්සේ කොල්ලුපිටියේ පටුමගක් දෙසට ඇදිණි. ඇයගෙන් මා පතන පිහිට උපකාරය කුමක්දැයි හැඟීමක් නැතිවම මා ඔවුන්ගේ නිවසෙහි සාලයට ඇතුළු වන විට කල්‍යාණි සිටියේ බැහැරක යන සූදානමිනි. සියල්ල දන්නා බවට සැකයක් මා පිළිගනිමින් ඇය පෑ සිනහ මුසු මුහුණ දුටු මට ඇති විය. අඬන්නට වුවමනාවෙන් මම අසුනක වාඩි ගතිමි.

"නිමල් කෑම කාලා නිදා ගන්න. අපි එන කොට රෑ වෙන්න පුළුවනි. අපි හෙට උදේ කතා කරමු" යි කී කල්‍යාණි මට කළ යුතු ආවතේවයන් ගැන මෙහෙකරුවකුට විධාන කර සැමියාත් සමග පිටත් වූවා ය.

ඔවුනට ජීවිතය මොන තරම් සැහැල්ලුවක්ද? නැතහොත් බාල්දුවක්ද?

අන්තිමට මම උඩුමහලේ මා සඳහා වෙන්වුණු කාමරයේ ඇඳට වැටුණෙමි. මට සිදු වූයේ කුමක්දැයි සිතන්නට මම උත්සාහ ගතිමි.

පද්මිනී මා කැඳවා ගෙන ආවේ කුමන තැනකට ද? මා මේ තැනට පිවිසියේ කෙසේ ද? රජ රට අත හැර පැමිණීමෙන් පසුවත් ඇය මට දක් වූ සෙනෙහස, කරුණාව හා ප්‍රේමය ගැන සිතන විට, ඇය මෙසේ මා අසරණ තත්ත්වයකට පත් කළ වවක් ඇදගිය හැකිද? ඇදහිය නොහැකි වන්නේ අප අතර සම්බන්ධයේ කවර අවස්ථා



අපේ විවාහය, වියදී කලාපයේ ගත කළ ජීවිතය, ඇය ආපසු පැමිණීම, ඉන් පසුවත් අප හමු වූ අවස්ථාවන්හි එකට ගෙවුණු කාලය හා ඇයගේ වර්තමාන හැසිරීම යන කුමක් නම් සත්‍යය ලෙස පිළිගත හැකි ද? සැබෑ පද්මිනී අසුවන්නී මෙයින් කවර නම් අවස්ථාවකට ද යන දහසක් ප්‍රශ්න මගේ සිත වෙලා ගත්තේ ය.

අම්මාත් මමත් හඳ එළියේ බෝක්කුව උඩට වී තාත්තා එනතුරු මගබලා සිටිමු. කුසුම් මට තේ එකක් ගෙනෙයි. මම මැදි මහා විදුහලේ සෙල්ලම් කරමි. ගෙදර හැමට ආයුබෝවන් කියා මම පේරාදෙනියට පිටත් වෙමි. සරසවිය, සනාථන ශාලාව, පුස්තකාලය, ජේම්ස් පීරිස් ශාලාව, සංඝමිත්තාව දෙසට අඳුරේ ඇදෙන යුවළක්, අපේ ගෙදර පිරිත, සරුසාර රජරට, වියැළුණු කුඹුරු යාය, කච්චේරිය.

ජීවන මගෙහි සැතපුම් කනු ලෙස මතු වුණු පුද්ගලයන්, සිද්ධීන් සහ ස්ථානයන් පිළිබඳ මතක පසු කර ගෙන සිත ඒ අතටත්, මේ අතටත්, දුවයි. තැනකදී දෙකකදී වැඩිපුර වෙලා නතර වීමට වුවමනා වේ. මිය ගිය ආත්මය යළි උපදින්නට ඕනෑ ය යි හඬනගා කෑ ගසන්නට වූයේ එතැන්හි දීය. මගේ මංගල්‍යයෙ වැඩට උදව් වනු පිණිස අපේ ගෙදරට කුසුම් ගේ පැමිණීම එවැනි අවස්ථාවකි. අනෙක මගේ මඟුල් ද යි.

අපේ විවාහය සිදු වූයේ සෝමාත් සහභාගි වූ රූ රැජිනා තරගය පැවැත් වුණු හෝටලයේ කුසුම් හා මා හමුවුණු ඒ ශාලාවේ ම ය. පද්මිනීත් සමග පෝරුවේ නැග සිටිය දී පෝරුව ගැන කුසුම් විසින් කියන ලද දෙයක් ජය මංගල ගාථා හඬ අභිබවා අතීතයෙන් ආ හඬක් ලෙසින් මොහොතකට මට ඇසිණි. කුසුම් තනිව ම මුහුද දෙස බලා ගෙන සිටි තැන ජනේලය තවමත් එහෙම ම ඇද්දැයි බලන්නට මට ඕනෑ විය. පද්මිනී ගේ අතින් අල්ලා ගෙන පෝරුවෙන් බට මා වාඩි වුණේ එදා කුසුම් සමග එකට ඇලී ගෙන, වාඩි වී සිටි ඒ සැටියේ ම ද යි මට සහතික නැත.

එහෙත් සම්භාවනීය නෑදෑ පිරිසක් පිරිවරා ගෙන ළඟින් ම වාඩි වී අප වෙත යොමා ගත් දෙනෙත් ඇතිව බලා සිටි අම්මාගේ මුහුණ මට මතකය. ඉතා හොඳින් ම මතකය. ඒ සිනහ රැල්ල දවසකට පැය සහ අට බැගින් අවුරුදු ගණනක් කිස්සේ වුණු වෙහෙස වන්දි වශයෙන් ගෙවා දිනා ගන්නා ලද්දකි. අම්මාට ඒ සිනාව ලබා දෙනු පිණිස කුසුම් ඇඹුවා පමණක් නොව ගැහැණු ළමයකුට කළ හැකි ඉහළම පරිත්‍යාගය කළාය. ඒ දෙ දෙනාම මට ලබා දෙන්නට සිතු පැතූ සතුට මේකදැයි

ඔවුන් ගැන තරහෙන්, වෛරයෙන් සිතීමෙන් වැඩක් නැත. මා මංමුලා වුණු මේ ලෝකය අම්මාගේවත් කුසුම්ගේවත් නිර්මාණයක් නොවේ.

මට ඇසුණේ මෝටර් රියක දොර වැසෙන හඬ පමණි. කිසිවෙක් කතා කරයි. කල්‍යාණිලා පැමිණියා වන්නට ඇත. මෙට උදේ මොන ආකාරයෙන් ප්‍රශ්නය මතු වන්නට ඉඩ ඇද්දැයි කල්පනා කරන්නට මගේ සිත යොමු විය. කිසිවෙක් දොරට තට්ටු කරයි. කල්පනාව නිසා මට අඩි ශබ්දය නෑසුණා වන්නට ඇත. පැමිණියේ කල්‍යාණි නම් දැන්ම ම කිසිවක් ගැන කථා කිරීමට ඉඩ තිබේ. මම මේ සිහිවිලි ඇතිව විදුලි පහන දල්වා දොර හැරියෙමි.

කාමරයට ඇතුළු වූයේ කල්‍යාණි නොව පද්මිනී ය. අවිනිශ්චිත හැඟීමෙන් මම මොහොතක් ඇය දෙස බලා සිටියෙමි. වහා නිරවුල් වන්නට වූ සිතෙහි මුලින්ම හට ගත්තේ කෝපය යි. ඇ අර නටන ඇඳුමෙන් සැරසී සිටියාය. ඇයගේ දෙනෙත් මත් ගතියකින් පිරී ඇත. හිස කෙස් මඳක් අවුල් වී තිබිණි. ඇයගේ මුවගට නැඟුණ තුනී සිනාව අනතුරුව මා බිය පත් කළේය. ඇය අඩියක් දෙකක් කාමරයට තබන කල මට මත්පැන් හා විලවුන් යනුවෙන් මිශ්‍රිත සුවඳක් දැනිණි. සියලු හැඟීම් අතරට පිළිකුලක් එකතු විය.

"කොයි වෙලාවෙද ඔයා ආවෙ?" අසමින් ඇ ඇඳ මත වාඩි වූවාය. මගේ බිය වැඩි විය. පිළිතුරක් නොදී විවෘත ජනේලය වෙත ගොස් ඉවත බලා ගත් මම ඒ බිය පහ කර ගනු පිණිස ආත්ම ධෛර්ය සහ ආත්ම ශක්තිය සොයන්නට වීමි.

"ඔයා අද ආපු එක කොහොමටත් හොඳයි. ඔයත් එක්ක ටිකක් කථා කරන්නමයි මම හිටියෙ"

ධෛර්යය ඒ තරම් අවශ්‍ය දවසක්, ධෛර්ය ගොඩනංවා ගැනීමට එතරම් දුෂ්කර වූ දවසක්, ඉන් පෙර හෝ පසුව හෝ මගේ ජීවිතයේ උදා වී නැත.

"මට කථා කරන්න තියෙන්න එකම දෙයයි" මගේ යැයි මට ම සැක සිතුණු හඬකින් මම ඉවත බලා ගෙනම කියා ගත්තෙමි, "ඇයි ඔයා මේ ටික මට කළේ. මට ඒ ටික විතරක් කියන්න. ඇයි පද්මිනී ඇයි?" මම ඇය දෙසට හැරුණෙමි.

ඒ වන විට ඇය කොට්ටය මතට තබා ඇඳේ හාන්සි වී සිටියාය. ඇය ඒ ඉරියව්ව උඩ වැටුණේ මෙ වැනි අත් අවස්ථාවක දී නම් තරහ අන්දමට සිය දේහයේ බලපෑම මා කෙරෙහි යොමු කරවීමට නොව



වෙහෙස හෝ මත් ගතිය නිසා වන්නට ඇතැයි බිත්තිය දෙසට හැරී තිබුණු මුහුණ දුටු මම සිතා ගතිමි.

එහි අසරණ බවක් විදිහට වැතිර ඇත්තේත් ඒ වෙහෙසෙත් මත් ගතියත් යැයි සිතන්නට මම උත්සාහ කළෙමි.

"හැමදම හංගගෙන ඉන්න ඕනි කමක් නැහැ. ඒ වගේම ඔයාට කියන්න කවදාවත් බැරි කමක් තිබුණෙත් නැහැ. මම අවංකව කළේ පළිගැනීමක්......."

"දෙවියන්ගෙ නාමයෙන් මම ඔයාට මොන වරදක් කළාටද?"

තත්පර කිහිපයක නිහඬතාවයකි.

"නිමල් හතුරුසිංහ නෙවෙයි. පිරිමියෙක් කළ වැරැද්දකට. ඔයත් පිරිමියෙක්. එච්චරයි " කී ඇ මා දෙස බැලුවා ය.

ඇයගේ වචන මෙන් ම බැල්ම ද තවත් පළිගැනීමකි. මගේ දෙපා පණ නැති වී ගෙන යන්නාක් මෙනි. වාඩි වෙන්නට වුවමනා විය. එහි වුණු පුටුවෙහි වාඩි වුණු කල ඇයගේ මුහුණ නොපෙනෙයි. අනෙක් අතට මේ මුහුණේ මම කුමක් දකින්නෙම්ද? අන්තිමට මම පුටුව මට උචිත තැනක තබා ගතිමි.

"ඔයා අහන්න ලැහැස්ති වගෙ. එහෙනම් මම කියන්නම්" යැයි කියා ගෙන පද්මිනී තවත් පහසු විදිහට හරි බරි ගැසුණාය. ඇය කියන්නට යන කතාව කුමක්දැයි මගේ හදවත දැඩි ලෙස සසල වන්නට විය. කිහිප වරක් නිමේෂයක පමණ සුළු වේලාවකට පද්මිනී මට නොපෙනී ගියා ය.

"මේ කතාව මම ඔයාගෙ ගෑනු ළමයට සම්පූර්ණයෙන්ම කියල ඇති" යි පටන් ගත් ඇ යොවුන් වියේදී මිත්‍රයකු වෙසින් ගෙදර ආවතේව කම් කරන්නට ආ තරුණයකු අතින් අනාථ වීමේ සිද්ධිය මුල සිට අගට කීවාය. මත්පැන් ගඳ වහනය කළත් කිසි වෙරි ගතියක් නොමැතිව පද්මිනී කතා කර ගෙන ගියේ ඇය මගේ බිරිඳ හැර අන් ඕනෑම එකියක නම් රෝහණ ගේ පාපොච්චාරණය අසා සෝමා නිසා ඇති වුණු වීඩියේ අනුකම්පාවක් ඇති කරවන අන්දමිනි.

මෙහෙම දෙයක් මට වුණොත් ඉවසන්නෙ කොහොමදැයි. අනුන්ගේ විපතක දී ව්‍යසනයකදී නොයෙක් අඳනා ප්‍රශ්න කරති. මිනිසා තුළ මානසික වශයෙන් ඇති ඔරොත්තු දීමේ ශක්තිය ඇතැම් විට අසීමිත බව අවබෝධ වනුයේ මා මුහුණ දුන් ආකාරයේ අවස්ථාවක්

For E-Pusthakalaya

ගැන අත් දැකීමක් ලද කෙනෙකුට පමණි.

"මම එද - මධුසමය දවසෙ කිව්ව ශස්රම ඔයා හැබෑ ගත්ත. ඔයා විශ්වාස කළා. වෙලාවකට මට ඒ ගැන දුකයි"

ඇය දුකයි යන වචනය ශබ්ද කළේ කෙනෙකුගේ කකුල පෑගුණු කල ඔහු/ඇය ඔහුම කෙනෙකු සොරි යැයි කියන තරම් සැහැල්ලුවෙනි.

"නෑ පද්මිනී නෑ" මම අලුත් අවබෝධයකින් කෑ ගැසුවෙමි. "දැන් බලන කොට - මට මේ මොහොතෙ හිතෙන විදිහට - ඔයාගෙ අතීතය ගැන කිසිම දෙයක් අලුතෙන් ඔයා අද මට කිව්වෙ නෑ. අලුතෙන් දෙයක් තිබුණ නම් පුද්ගලයා කවුද? ඒ කාලෙ ඔයාගෙ වයස කීයද? ඒ වගේ මූලික සිද්ධියට වැදගත් කමක් නැති අනවශ්‍ය සවිස්තර විතරයි. එහෙම නැතිනම් එද දැන ගත්ත තෙවි. මම අද හිතනව අන්තිම කාලෙ ඉස්කෝලෙ ඉන්දෙද්දීම මම සේරම දැනගෙන හිටිය. නමුත් මම ඔයා විශ්වාස කළා නම් විශ්වාස කළේ ස්ත්‍රී වර්ගයාම විශ්වාස කරන්න මට ඕනෑ කළ නිසයි. මම හැම ගැහැනියක් දිහාම බැලුවෙ, හැම ගැහැණියක්ම සීතාවක් කියන දර්ශනය උඩ. මෙතැන දී මගේ ප්‍රශ්නයත් මගෙ ගැටළුවත් ඒ සේරටම වඩා මගේ දුක් ගැනවිල්ලත් මෙකයි. ඇයි? ඔයා මේ පළිගැනීමට මම වගෙම කෙනෙක් තෝර ගත්තෙ ඇයි? ලෝකෙ මේ තරම් මිනිස්සු ඉන්දද්දි ඇයි මමම?"

"මගෙ කතාවෙන් බාගයයි නිමල් මම කිව්වෙ" තමා මට කියන්නට යන්නේ විනෝද ගමනක් පිළිබඳ කතාවක් විදිහට සැහැල්ලු ලෙස ඈ කීවා ය.

"........මට මෙන්න මෙච්චරයි වුණේ. වයස දහහතරයි. යන්තම ලෝකයට අඩිය තියන අවදිය. කෙනෙකුට ආලය කළා. ඔයා දන්නව වයස දහහතරෙදි කෙල්ලෙක් කොහොමද ආලය කරන්නෙ කියල.ඒ පුද්ගලයා දරුවකු දීල යන්න ගියා. අර සිහින ලෝකෙ විනාශ වුණා. එතනදීම පිරිමි සංහතියම එපා වුණා. පස්සෙ දෙමව්පියන් මා ගැන බැලුව නම් මට මෙහෙම විපතක් වෙන්නෙ නෑ කියල ඒ අතරෙ අවබෝධ වුණා. එතැනදි දෙමව්පියන් එපා වුණා. එහෙම නැත්නම් එද මට වුණු සිද්ධිය අද මම ලොකුවට ගණන් ගන්නව නෙවෙයි. අද මට හිතෙනව ඒක මොන තරම් සුළු දෙයක්ද කියලා. අද වගෙ ඉස්කෝලෙ යන කෙල්ලන්ටත් කාටත් හොරෙන් පෙති ගන්න පුළුවන් නම් එද තිබුණ නම් මට හිතෙනව සේරම ඉවරයි නේද කියල. ඒ සිද්ධිය ගැන මම අද බලන්නෙත් එහෙමයි. නමුත් ඒ සිද්ධිය නිසා පිරිමින් ගැන, දෙමව්පියන් ගැන, ලෝකය ගැන මම ඇතිකර ගත්ත ...



තාමත් එහෙමමයි. මම අදත් ඔයා දිහාත් හැම දෙනාම දිහාත් බලන්නෙ ඒ විදිහටයි. මම අදත්......"

"ඔය සේරම හරි. තාමත් මම අහන්නෙ ඇයි මමම?"

"ඉන්න පොඩ්ඩක්. ඒ කාලෙ ඔයාගෙ ගෑනු ළමයයි මමයි හරි යාළුයි. ඒ යාළු කමත් ඒ වයසෙදි ඇතිවුණු අවංක එකක්. එයා අනාථ වුණේ ඔයගොල්ලන්ගෙ අම්ම නිසාය කියල මට හැඟුණ. ඒ විදියෙන් මට ඕනවුණා පළිගන්න ඒ යාළුව වෙනුවෙන්. ඒ අතරම පිරිමින්ට දිරව්ව ලණු දීල රවටල ඒ විදියෙන් පළි ගන්න අතික් ආශාව තිබුණ. එක අතකින් ඉගෙන ගන්න ළමයකුට වඩා ඒ කාලෙදි ගුරුවරයෙක් - තරුණයෙක් රවටන එක ලොකු විනෝදයක් වුණා. ඒ කාලෙ හැටියට ඔයා සම්බන්ධව තව එකක්. පොදුවේ පිරිමින්ට තිබුණු වෛරය යි අර යාළුව වෙනුවෙන් යුතුකමක් කරන හැඟීම යි දෙකම එකතු වුණා."

"ඒ ඒ කාලෙ?" සියලු වේදනා යටපත් කරගෙන ඉස්මතු වූ කුහුල ඇතිව මම ඇසුවෙමි. "ඊට පස්සෙ?" ඇයි ඔයාට මාව හදිසියේ මතක් වුණේ"

පද්මිනී පිළිතුරක් දෙන්නට අසීරුවෙන් මෙන් මඳ වේලාවක් නිහඬව සිට සම්මාව ඉල්ලන ස්වභාවයක වෙනස් කර ගත් කට හඬකින් ඊළඟට කතා කළා ය.

"ඇත්ත කිව්වොත් හේතුවුණු කාරණා හරි වියවුල්. මටම පැහැදිලි නැහැ. එකක් අර පරණ පළිගැනීමේ චේතනාව එහෙමම තිබුණා. පුද්ගලිකව. පොදුවේ දෙපැත්තෙන්ම තරමක් දුරට. අනෙක මම විවාහ වෙන වයසට ආව. මම ගණනාවක් ආශ්‍රය කළා. සමහරෙක් හිතන්න ඇති මම ඒ අයට ප්‍රේම කළා කියල. එහෙම හිතන්න මම අනුබල දුන්න. නමුත් මම ජීවිතයෙන් ප්‍රේම කළේ එක සැරයයි. ඒ අර විනාශකාරී ප්‍රේමය. එකක්, නොදන්න කෙනෙක් විවාහ කර ගන්න මගේ කිසිම අදහසක් තිබුනෙ නෑ. කොහොමටත් හරි මගේ හිත ගිය - මා ගැන නොදන්න මොන විදිහකින් හරි කැමැත්ත ගන්න පුළුවන් තිබුණ එකම එක්කෙනා ඔයයි. ... න්නෙ හිතුවක්කාර වෙන්න මම බය වුණු නිසා නෙවි. පුංචි කාලෙදී වගේ නෙවි. පස්සෙ මට වැටහුණා හිතුවක්කාර වෙලා දේපළවල මගේ කොටස නැතිකර ගන්න එක මෝඩකමක් කියල....."

ශාරීරික ව ඇති වන වේදනාව දැඩි වුණු කල ඉන් එහා කිසිවක් නොදැනෙන ලෙස හිරි වැටෙන තත්ත්වයට සිත ද වැටෙන අවස්ථා ඇත. ඒ හිරි වැටීම ආරක්ෂාව සඳහා සොබා දහම විසින් ඇති කරවන

For E-Pusthakalaya

තත්වයකි. මේ වන විට මගේ සිතද කිසිවක් නොදනෙන එවැනි තත්ත්වයකට පත්ව තිබිණි. මා ඊළඟ ප්‍රශ්නය නැගුවේ හුදු කුතුහලය උඩ පමණක් වන්නට ඇත.

"ඔයා එහෙම නම් දිගටම කළේ රැවටිල්ලද? කවදාවත් මට ආදරයක් කළේ නැද්ද?"

"නෑම කියල කියන්නත් බැහැ" තමා අවංකව ම මට ආලය කළ අවස්ථාවක් සිහි පත් කර ගන්නට මෙන් ඉවත බලා ගෙන මඳ වෙලාවක් සිට පද්මිනී කීවාය.

"මට මතක හැටියට එද මුලින්ම අර හෝටලයේදී මුණ ගැහුණු වෙලාවෙ. අර කාන්තාරේ හිටි සමහර වෙලාවල. නමුත් නිමල් විවාහයෙන් පස්සෙ ඔයා හැඩගැහුණ නම් වෙන විදිහක - මාරුවක් අරගෙන උසස්වීමක් අරගෙන, තත්ත්වය වෙනස් වෙන්න තිබුණු තරමක් දුරට. තරමක් දුරට කියනකොට මම අවංක වෙන්න ඕනෑ. එහෙම පිට්න්ම නොවෙයි. දැන් මිට මතක් වෙනව තව කාරණයක්. මට ඒක තේරුම් ගන්න බැහැ. නමුත් බලාපොරොත්තු වුණු දෙයක්, බලාපොරොත්තු හුණත් වෙන්න ඉඩ තියනව කියල හිතුව දෙයක්, ඒ කියන්නෙ ඔයාට අවංකව ආදරය කරන වෙලාවට........"

පත්වීම් උසස්වීම ගැන ඇය කියන කල.මා එවැන්නකුට එකඟ වුණා නම් යන පසු තැවිල්ලට මා තුළ යන්තමින් වත් ඇති නොවිණි. මට සිතුනේ ඇයගේ තත්ත්වයට ගැළපෙන ලෙස වෙනස් වන්නට නොයැමෙන් මා මෙයින් බේරිණැයි හැඟීමකි.

"කල්‍යාණි. මගේ අක්ක" මදක් උස්වූ හඬින් පද්මිනී කීවේ ද්වේෂයෙන්ද එකඟත්වයක් දැයි වෙන් කරගත නොහැකි ස්භාවයක් මුහුණෙහි රඳවා ගෙන ය.

"ඕනෑම ඉහළ තැනකින්, ඕනෑම වැඩක් කරගන්න ඇයට පුළුවන්. කොහොමද එයා ඒ වැඩ කරගන්නෙ?"

ඇය මගේ පිළිතුරක් බලාපොරොත්තුවෙන්, මදක් නිහඬව සිටියාය. මම [illegible] ගතිමි.

"නෑම හැකියක්ම සීතාවක් විදිහට හිතන ඔයාගෙන් මම ඒ ප්‍රශ්නයට උත්තර බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් රාජා එයාගේ සැමියා - රාජ් දන්නව කොහොමද වැඩ කර ගන්නෙ කියල. ඒ දැනගෙනයි එයා අක්ක ලව්ව තමන්ගෙ වැඩ කරව ගන්නෙ. පිට අය ඕනෑ නැහැ

Buddhika



දිනක් ගෙදර ගිය අවස්ථාවේදී හමුවූ ගැමියාගේ අවංක ඇස්වල පිළිබිඹුව පද්මිනී ගේ ඇස්වල වැටී තිබුණේ යැයි මට හැඟිණි.

"........පිට අය ඕනෑ නැහැ තාත්තා, අයියා, ඒ ගොල්ලන් කල්‍යාණි ලව්ව ඉහළ තැන්වලින් තමන්ට ඕන වැඩ කර ගන්නව. නොදනද? වාසියට. සේරම වාසියට, ඉතින් නිමල්?"

ඇය එසේ මා ඇමතුවේ පිළිතුරක් බලා ගෙනම නොවේ. මේ කැත ජීවිතයට හැඩ ගැහෙන්නට ඔබටම බැරි ඇයි දැයි අසන්නාක් මෙනි. අප අතර පැතිර ගිය නිශ්ශබ්දතාවය තුළින් මුහුදේ අඳෝනාව දිගටම ඇසෙන්නට විය.

මම පද්මිනී දෙස බැලුවෙමි. මේස් බැනියමට වඩා දිග නැතැයි කිව හැකි ඇඳුම උඩට ගුලි වී, ආවරණය වී තිබුණේ ඇයගේ උඩු කය පමණි. මම ජය ගතිමියි හැඟීමක් මට ඇතිවිණි. මැවුම්කාරයා විසින් ඇයට දෙන ලද දයාදයන්ගේ බලපෑමට මම එවේලේ යටත් නොවුණෙමි. ඇය විසින් අනාවරණයකරන ලද ඇයගේ ලෝකය ගැන ද මට ඇතිවුණේ පිළිකුලක් හා කලකිරීමකි.

මියගිය ආත්මයේ තුන් වැනි වරටත් නැවත උපදින්නට උත්සාහ කළේය.

"ඔයා මොකක්ද නිමල් මගෙන් ඉල්ලන්නෙ?"

මම පිළිතුරක් නොදුන්නෙමි.මට මුලින්ම වුවමනා කළේ ඇය තම ජීවිතයට මා ඇදගත්තේ ඇයිද යන්නට පිළිතුර පමණකි.ඒ පිළිතුර ඇයගෙන් ලැබී අවසානය. මට ඇයගෙන් බලාපොරොත්තු වන්නට තවත් කිසිවක් නැත.

ඇය දිගටම කතා කළේ ඉංග්‍රීසියෙනි. මා තේරුම් ගත් පරිදිම ඇය "ඉතින් නිමල්" යයි ඇසුවේ මගෙන් පිළිතුරක් බලාපොරොත්තුව නොවන බව සහතික කරමින් නැවතත් දෙඩන්නට වූවාය.

"මම මේ එකක්වත් ඔයාට යෝජනා කරනව නොවෙයි, [illegible] විදිහට ඉදිරිපත් කරනව විතරයි. හොඳම දෙය ඔයාම තෝරා ගන්න. ඔයාට පුළුවනි උසස්.වීමක් අර ගෙන කොළඹට එන්න. නැත්නම් ශිෂ්‍යත්වයක් ලැබ්බි කර ගෙන කොළඹට එන්න. නැත්නම් ශිෂ්‍යත්වයක් ලැස්ති කර ගෙන පිටරට යන්න. ඕනෑ රටකට, ඔයා කැමති රටකට. කල්‍යාණි ඒ ටික කරල දෙයි. එහෙම නැත්නම් දික්කසාදයක්. මම ඉදිරිපත් නොවී ඉන්නම්. එතකොට ඔයාට පුළුවන් ලේසියෙන් දික්කසාදයක් ගන්න. මව පත්තරවල හෙම වැටෙන්නෙ නෑ. ඒකත්

කල්‍යාණී බලා ගනීවි...... ඔයා වරදවා තේරුම් ගන්න එපා. මම ආත්මාර්ථකාමයෙන් කතා කරනව නෙවෙයි. මම මගේ වාසිය බලල මේ ටික කියනව නෙවෙයි. මට නම් කොහොමත් එකයි. මම මේ කියන්නෙ ඔයාගෙ පැත්තෙන්....... හොඳම විසඳුම දික්කසාද වෙන එක.........ඉල්ලීමක් ම නෙවෙයි. මේකත් අදහසක්.......දික්කසාද වුනොත්........... මම කියන්නෙ දික්කසාද වුණාම ඔයාට පුළුවන් අර ගෑනු ළමය බැඳ ගන්න වුණත්. මට විශ්වාසයි ඒ කෙල්ල තවමත් ඔයාට ආදරෙන් ඇති?"

මිය ගිය ආත්මය අන්තිම වරටත් නැවත උපදින්නට වෑයම් කළේ ය.

"ඔයා තවත් මොනවද නිමල් මගෙන් ඉල්ලන්නෙ?"

මම පිළිතුරක් නුදුන්නෙමි. මට මුලින්ම වුවමනා කළේ ඇය තමා ගේ ජීවිතයට මා ඇද ගත්තේ ඇයිද යන ප්‍රශ්නයට පිළිතුරක් පමණි. ඒ පිළිතුර ඇය ගෙන් ලැබී අවසානය. මට පද්මිනී ගෙන් බලාපොරොත්තු වන්නට තවත් කිසිවක් ඉතිරි වී නැත.

නිමි



For E-Pusthakalaya

# හතුරු හිතක්

## කරුණාසේන ජයලත්

කරුණාසේන ජයලත්ගේ තුන් ඈඳුතු නවකතාවේ අවසන් කොටස ''හතුරු හිතක්'' කතාවයි. මුල් කොටස් දෙක ''ගැහැණු ළමයි'' හා ''පිරුණු සඳක්'' යනුවෙන් හැඳින්වේ. යොවුන් චිත්තාවේගයන් ඉතා සංඝත හා සංවේදී ලෙස චිත්‍රණය කළ මෑත පරපුරේ ලේඛකයන් අතර කරුණාසේන ජයලත් නිසැකවම ප්‍රමුඛස්ථානයක් හිමිකර ගනී. ඔහුගේ සෑම නවකතාවකම යොවුන් සිතට උරුම චිත්ත ධර්මතාවන් ඉතා සියුම් ලෙස විශ්ලේෂණය වෙයි. කරුණාසේන ජයලත් විශිෂ්ට ලේඛකයකු වන්නේ මේ විග්‍රහයන්හිදී, තමා විසින් පනවාගන්නා ලද චර්යාධර්මතාවන්ට අනුගතවීම නිසාය. ජයලත් ප්‍රවීණත්වයට උරුමකම් කියන්නේ ලේඛන කුසලතාව මෙන්ම මේ ශිෂ්ට සම්පන්න පිළිවෙතෙහිද පිහිටීම නිසාය.

